විගණකාධිපති

වාර්ෂික වාර්තාව

2018

ජාතික විගණන කාර්යාලය

ජාතික විගණන ආයතනයේ නිල ලාංඡනය

මෙම නිල ලාංඡනය සඳහා භාවිතා කළ සංකේතවලින් පහත සඳහන් අර්ථයන් පිළිබිඹු කෙරේ.

- ලාංඡනය ඉහළින්ම දක්වා ඇති සිංහයා මගින් ශ්‍රී ලංකාව නිරූපනය කෙරේ.
- එහි මැද ඇති තරාදිය මගින් ස්වාධීනත්වය හා අපක්ෂපාතීත්වය පිළිබිඹු කෙරේ.
- එය වටා ඇති ඔලිව් ඉති ද්විත්වය මගින් සාමය හා සෞභාග්‍යය පිළිබිඹු කෙරේ.
- එය වටා ඇති පලා පෙති රටාව මගින් ජාතික සංස්කෘතිය නිරූපනය කෙරේ.

අපේ දැක්ම

රාජ්‍ය ගණන්දීමේ වගකීම සහ යහපාලනය පෙර දැරි කර ගත් රාජ්‍ය අංශයේ මඟ පෙන්වන්නා වීම.

අපේ මෙහෙවර

තිරසාර සංවර්ධනයක් උදෙසා මනා මූල්‍ය කළමනාකරණ සහ රාජ්‍ය සම්පත් ප්‍රශස්ත ලෙස උපයෝජනය කිරීම තහවුරු කරනු වස්, විගණනය මෙහෙයවීම මගින් යහපාලනය සහ රාජ්‍ය ගණන්දීමේ වගකීම ප්‍රවර්ධනය කිරීම.

අපගේ අරමුණු

1. සම්පත්වල භාරකාරිත්වය පවරනු ලබන ආයතනවල කළමනාකරණයන් හා ඔවුන් හා පවරන ලද ගණන්දීමේ වගකීම ඉටුකර තිබේද යන්න ස්වාධීන පරීක්ෂණයක් සිදුකිරීම සහ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම.
2. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව යන නමින් හඳුන්වන පාර්ලිමේන්තුවේ අධීක්ෂණ කාරක සභා දෙක රාජ්‍ය ආයතනවල සිදුකරන කාර්යසාධනය පරීක්ෂා කිරීමට සහාය වීම.
3. විගණිත ආයතනවලට ඔවුන්ගේ ගිණුම් කටයුතුභාවය වර්ධනය කර ගැනීමට කළමනාකරණ වාර්තා නිකුත් කිරීම මගින් නිර්දේශ සිදුකර සහාය වීම.

අපේ වටිනාකම්

විශිෂ්ඨත්වය
නවෝත්පාදනය
නායකත්වය

විගණකාධිපතිතුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව සතුවන රාජ්‍ය මුල්‍ය පාලනය ඵලදායීව හා කාර්යක්ෂමව පවත්වාගෙන යාම සම්බන්ධව ස්වාධීන පරික්ෂණයන් පැවැත්වීම හා එය පාර්ලිමේන්තුව වෙත වාර්තා කිරීම පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයා වෙත පැවරී ඇති ප්‍රධානතම කාර්යයක් වේ. එම කර්තව්‍යන් ඉටු කිරීම සම්බන්ධව 2018 මුදල් වර්ෂය සඳහා වූ මාගේ වාර්තාව සතුටින් ඉදිරිපත් කරමි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම වාර්ෂික වාර්තාව, හත්වෙනි කාණ්ඩය වශයෙන් ඉදිරිපත් කරනු ලබන අතර අනෙකුත් වාර්තා පහත සඳහන් කාණ්ඩ නවය යටතේ වෙන වෙනම සභාගත කිරීමට කටයුතු යොදා ඇත.

පළමුවන කාණ්ඩය	-	අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු
දෙවන කාණ්ඩය	-	රාජ්‍ය සංස්ථා, අධිකාරී, මණ්ඩල හා ව්‍යවස්ථාපිත අරමුදල්
තුන්වන කාණ්ඩය	-	ව්‍යවස්ථාපිත නොවන අරමුදල්
හතරවන කාණ්ඩය	-	විදේශ ආධාර ව්‍යාපෘති
පස්වන කාණ්ඩය	-	පළාත් සභා
හයවන කාණ්ඩය	-	පළාත් පාලන ආයතන
අටවන කාණ්ඩය	-	කාර්යසාධන විගණන වාර්තා
නවවන කාණ්ඩය	-	රාජ්‍ය සමාගම්
දහවන කාණ්ඩය	-	විශේෂ විගණන වාර්තා

දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ක්‍රියාකාරී අංශයෙන් පමණක් නොව පරිපාලනය හා මූල්‍ය සම්බන්ධයෙන්ද විගණකාධිපතිවරයාගේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා වැඩි බලතල විගණකාධිපතිවරයාට හා ඔහුගේ කාර්යය මණ්ඩලයට ලබාදිය යුතු බව රජය පිළිගෙන තිබුණි. ඒ අනුව 2015 දෙසැම්බර් මාසයේදී ස්ථාපිත කරන ලද විගණන සේවා කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ පත්කිරීම්, උසස් කිරීම්, මාරුකිරීම්, කාර්ය මණ්ඩලය සේවයෙන් පහකිරීම් හා විනය පාලනය සිදු කළ යුතුව තිබුණි. ජාතික විගණන පනත 2018 ජූලි 17 දින 2018 අංක 19 දරන ජාතික විගණන පනත නමින් පාර්ලිමේන්තුවේදී සම්මත කළ අතර, අතිගරු ජනනාධිපතිවරයා විසින් 2018 අගෝස්තු 01 දින සිට එම පනත බලාත්මක වන බව ගැසට් පත්‍රයේ පල කරන ලද නිවේදනයකින් ප්‍රසිද්ධ කරන ලදී. ජාතික විගණන පනත 2018 අගෝස්තු 01 දින සිට ක්‍රියාත්මක වී තිබුණත්, 2019 ඔක්තෝබර් 15 දින වන විටත් ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයක් ස්ථාපිත කිරීමට නොහැකි වී ඇත. ශ්‍රී ලංකා විගණන සේවයේ හා විගණන පරීක්ෂක සේවයේ වටිනා දායකත්වය අමාත්‍ය මණ්ඩලය හඳුනාගෙන තිබීම සහ ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය නමින් අලුත් සේවයක් පිහිටුවීමට අනුමත කර තිබුණි. ඉහත සේවාවන් දෙකෙහි නිලධාරීන් නව ඒකීය සේවාවට අවශෝෂණය කිරීම විගණන සේවා කොමිෂන් සභාවට පැවැරී ඇත.

විගණන සේවා කොමිෂන් සභාවේ බලතල, කාර්ය හා කර්තව්‍ය පිළිබඳ විධිවිධාන සැලැස්වීම සඳහා ද, ජාතික විගණන කාර්යාලය සහ ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය පිහිටුවීම සඳහා ද, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහාද විධිවිධාන සැලැස්වීම පිණිස 2018 අංක 19 දරන ජාතික විගණන පනතින් අපේක්ෂා කර තිබුණි. ගිණුම්කරණ හා විගණන වෘත්තියෙහි කොටසක් ලෙස ගොඩනැගෙන පීඩනය ඇතුළත්ව වඩා අභියෝගකාරී සහ නිරන්තරයෙන් වෙනස්වන පරිසරයකදී ජාතික විගණන කාර්යාලය ස්ථාපිත කිරීම ඉතා වැදගත් වේ. විගණන පනත 2018 අගෝස්තු 01 දින සිට ක්‍රියාත්මක කර තිබුණත්, ජාතික විගණන කාර්යාලයේ කාර්යභාරයන් ඉටු කිරීමට අත්‍යාවශ්‍ය වූ විගණන කාර්ය මණ්ඩලයට අදාළ සේවා ව්‍යවස්ථාව මේ වන විටත් ස්ථාපිත කර ගැනීමට නොහැකි වී ඇත. මේ හේතුව නිසා විගණන කාර්යභාරයන් ඉටු කර ගැනීමට එය බාධාකාරී වී ඇති අතර කාර්ය මණ්ඩලයට උසස්වීම් ලබා ගැනීමට පැවැති අවස්ථා අහිමි වී ඇත. විගණන කාර්යභාරය ඉටු කිරීම සියුම් අධීක්ෂණය හා විමර්ශනය සිදුකිරීමට සහ විගණන විෂය පථය පුළුල් කිරීමට හැකිවන පරිදි අංශ 63 ක් යටතේ විගණන හා සහායක සේවා සංවිධානය කරමින් කාර්යාලයේ සංවිධාන ව්‍යුහය පිළියෙල කර ඇත.

ජාතික විගණන කාර්යාලයේ වැදගත් කාර්යභාරය සැලකිල්ලට භාජනය කිරීම මෙන්ම රාජ්‍ය අංශය මුහුණ දෙන ප්‍රධාන ගැටළු හොඳින් අවබෝධකර ගැනීම සහතික කිරීමට හැකි වන පරිදි ජාතික විගණන කාර්යාලය මුල් පිරීම් රාශියක් ක්‍රියාවට නැංවීමට අපේක්ෂා කරමි. විගණන වාර්තා කාර්යක්ෂමව හා ඵලදායීව බෙදාහැරීම උදෙසා කාර්යාලයේ ක්‍රියාකාරිත්වය අඛණ්ඩව වර්ධනය කිරීමට හා සමාලෝචනය කිරීමට ජාතික විගණන කාර්යාලය බැඳී සිටී. අවසානයේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලබාදී තිබුණු විගණන ස්වාධීනත්වය කාර්යාලයේ ඵලදායීතාවයේ ප්‍රධාන සාධකය ලෙස ඉතා පැහැදිලි ලෙස හඳුනා ගෙන ඇත.

ජාතික විගණන කාර්යාලයේ රාජකාරියට කැපවූ කාර්යය මණ්ඩලය සමඟ වැඩකිරීමට ලැබීම මා ලැබූවා වූ ගෞරවයක් වන අතර ඔවුන්ගේ රාජකාරි කාර්යක්ෂමව තත්ත්වයෙන් ඉටුකිරීමට ඔවුන්ගේ කැපවීම සම්බන්ධයෙන් මම ඔවුන්ට ස්තුතිවන්ත වෙමි. රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේ හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමන්ලා සහ සාමාජිකයන් පොදු වෘත්තීයේ යෙදෙන සහාය විගණනයන් සිදුකළ වරලත් ගණකාධිකාරිවරුන්ගෙන් සමන්විත

ආයතන, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය, විගණිත ආයතන, ජාතික විගණන කාර්යාලයේ පරිපාලන කටයුතුවලදී සහයෝගය ලබාදුන් විගණන සේවා කොමිෂන් සභාවේ සමාජිකතුමන්ලාට හා එහි කාර්යය මණ්ඩලයටත්, ජනාධිපති ලේකම්තුමා හා ඔහුගේ කාර්යය මණ්ඩලය, මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා හා කාර්යය මණ්ඩලය, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව, නිතිපතිවරයා සහ පරිපාලන කටයුතුවලදී සහාය වූ අනෙකුත් රජයේ ආයතන, කාර්යාලයේ භෞතික හා මානව සම්පත් සංවර්ධනයට දායක වූ ජාත්‍යන්තර සංවර්ධන සමායතනයේ සහයෝගිතාවයට ස්තුති කිරීමටද මම මෙම අවස්ථාව යොදාගනිමි.

පොදු මහජනතාවගේ හා පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවයන් උදෙසා පවතින විගණනය පිළිබඳව සහතික වීමට මම දැඩිව උනන්දු වෙමි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

2019 ඔක්තෝබර් දින.

පටුන

	පිටුව		පිටුව
අපේ සංවිධානය	01	මහාමාර්ග	267
නිත්‍යානුකූලව ඉටු කිරීම	04	ආපදා කළමනාකරණය	275
අපගේ සංවිධාන සටහන	12	ක්‍රීඩා කටයුතු	281
කාර්ය මණ්ඩල පුහුණුව	17	කාන්තා හා ළමා කටයුතු	287
සුදුසුකම්ලත් විගණකවරුන් සේවයේ යොදවා ගැනීම	21	සංචාරක කටයුතු	293
		නාගරික සංවර්ධනය	299
පාර්ලිමේන්තුවට සහායවීම	21	කර්මාන්ත හා වාණිජ කටයුතු	307
විගණකාධිපති විසින් පනවනු ලබන අධිභාර	23	නිවාස හා ඉදිකිරීම් කටයුතු	315
		ප්‍රවාහන	319
විගණකාධිපතිවරයා විසින් සිදු කරනු ලබන කාර්යසාධන හා පරිසර විගණනය	25	සමාජ සවිබලගැන්වීම හා සුභසාධනය	329
		විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ	335
විශේෂ විමර්ශන විගණනය හා මහජන නියෝජන පිළිබඳ කටයුතු	49	සන්නිවේදනය	339
		උසස් අධ්‍යාපනය	345
2018 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන	65	විදුලිබල හා පුනර්ජනනීය බලශක්තිය	351
2018 වර්ෂයේදී ප්‍රසිද්ධ කළ විශේෂ විගණන වාර්තා	73	ඛනිජතෙල් සම්පත් සංවර්ධනය	357
		ග්‍රාමීය ආර්ථික කටයුතු	365
ක්ෂේත්‍ර අනුව සාරාංශගත කරන ලද විගණන නිරීක්ෂණ	109	නගර සැලැසුම් හා ජලසම්පාදනය	373
		වාරිමාර්ග හා ජලසම්පත්	379
ඒකාබද්ධ අරමුදල	111	කෘෂිකර්මය	383
රාජ්‍ය ආරක්ෂාව	129	සංස්කෘතික කටයුතු	389
රාජ්‍ය ව්‍යවසාය	137	බන්ධනාගාර,ප්‍රතිසංස්කරණ හා පුනරුත්ථාපනය	393
පළාත් පාලනය	147		
විදේශාධාර ව්‍යාපෘති	155	රජයේ සේවය සඳහා විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ	397
බැංකු අංශය	161		
වැවිලි කර්මාන්තය	183	පළාත් සභාවල ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන	403
ඉඩම් කටයුතු	191		
අධ්‍යාපනය	197	බස්නාහිර පළාත් සභාව	413
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා	205	මධ්‍යම පළාත් සභාව	415
පරිසරය	211	දකුණු පළාත් සභාව	419
විදේශ කටයුතු	215	උතුරු පළාත් සභාව	421
විදේශ සේවා නියුක්තිය	221	වයඹ පළාත් සභාව	425
ධීවර හා ජලජ සම්පත් සංවර්ධනය	225	උතුරු මැද පළාත් සභාව	427
සෞඛ්‍ය හා පෝෂණය	233	ඌව පළාත් සභාව	431
ජවමාධ්‍යය	247	සබරගමුව පළාත් සභාව	435
නීතිය, සාමය හා දක්ෂිණ සංවර්ධනය	253	නැගෙනහිර පළාත් සභාව	441
වරාය හා නාවික කටයුතු	259		

අපගේ ඉතිහාසය

එවකට ලංකාව යනුවෙන් හැඳින්වුන ශ්‍රී ලංකාවේ වත්මන් විගණකාධිපති දෙපාර්තමේන්තුවේ ආරම්භය බ්‍රිතාන්‍ය යුගයේ මුල් කාල සීමාව තරම් ඈතට දිවේ. 1776 වර්ෂයේදී බ්‍රිතාන්‍යයන් විසින් දිවයින අත්පත් කර ගැනීමෙන් වසර 3 කට පසුව එනම්, 1779 වර්ෂයේදී සිසිල් ස්මිත් නමින් ගණකාධිකාරිවරයෙකු හා විගණකාධිපතිවරයෙකුව සිටි බව ලියකියවිලි වලින් සනාථ වේ. එතැන් පටන් ශ්‍රී ලංකාවේ උත්තරීතර විගණන ආයතනය වශයෙන් විගණකාධිපතිවරු 40 දෙනෙකු යටතේ ස්වාධීන ආයතනයක් ලෙස විගණකාධිපති දෙපාර්තමේන්තුව අඛණ්ඩව ක්‍රියාත්මක වේ.

විගණන සම්බන්ධව අපේ අධිකාර බලය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවෙන් රාජ්‍ය අංශයේ ආයතනවල ගිණුම් විගණනය කිරීමට විගණකාධිපතිවරයාට අධිකාර බලය මූලික වශයෙන් ලැබී තිබුණි. එය 2018 අගෝස්තු 01 දින සිට 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධානවලින් වඩා පුළුල් වී ඇත.

සමාගමේ කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනක් විසින් දරනු ලබන සමාගම් පනත යටතේ පිහිටුවා ඇති සමාගම්ද, ආවරණය වන පරිදි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ බලය තවදුරටත් පහත පරිදි පුළුල් කර ඇත.

''විගණකාධිපතිවරයා විසින් ආණ්ඩුවේ සියලු දෙපාර්තමේන්තු, ජනාධිපතිවරයාගේ ලේකම්වරයාගේ කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරුන්ගේ කාර්යාල, අධිකරණ සේවා කොමිෂන් සභාව , ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව, 41 (ආ) ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් කොමිෂන් සභා, පරිපාලනය පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා, පාර්ලිමේන්තු මහ ලේකම්වරයා, පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා, යම් ලිඛිත නීතියක් යටතේ රජය වෙත පවරනු ලැබ ඇති වෙළඳ ව්‍යාපාර, වෙනත් ව්‍යාපාර සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන සහ ස්වකීය කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සමාගමක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් දරනු ලබන සමාගම්ද ඒවායේ ගිණුම් ඇතුළුව විගණනය කරනු ලැබිය යුත්තේය.''

පහත සඳහන් අණපනත් මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් විගණකාධිපති වෙත පවරා ඇති බලය විකාශනය කිරීමක් හෝ ප්‍රසාරණය කිරීමක් හෝ කර තිබේ.

- රාජ්‍ය මූල්‍ය පිළිබඳ විගණකාධිපතිවරයාගේ කාර්යභාරය නිශ්චිතව දැක්වීම සඳහාද, ඒ හා සම්බන්ධ හෝ ඊට අනුෂංගික කරුණු සඳහා විධිවිධාන සළසන 2018 අංක 19 දරන ජාතික විගණන පනත
- රාජ්‍ය සංස්ථා සඳහා විගණන විධිවිධාන සළසන 1971 අංක 38 දරන මුදල් පනතේ II කොටස
- පළාත් සභා සඳහා විගණන විධිවිධාන සලසන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23 වගන්තිය
- මහ නගර සභා සඳහා විගණන විධිවිධාන සලසන මහ නගර සභා ආඥාපනතේ (252 අධිකාරය) 219 වගන්තිය
- නගර සභා සඳහා විගණන විධිවිධාන සලසන නගර සභා ආඥාපනතේ (255 අධිකාරය) 181 වගන්තිය

- ප්‍රදේශීය සභා සඳහා විගණන විධිවිධාන සලසන 1987 අංක 15 දරන ප්‍රදේශීය සභා පනතේ 172 වගන්තිය
- ගොවිජන සංවර්ධන සභා සඳහා විගණන විධිවිධාන සලසන 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන සභා පනතේ 58 වගන්තිය
- ක්‍රීඩා සංගම් සඳහා විගණන විධිවිධාන සලසන 1993 අංක 47 දරන ක්‍රීඩා සංගම් පනතේ 9 වගන්තිය

පාර්ලිමේන්තුව විසින් අවශ්‍යතාවයක් ලෙස සම්මත කරන ලද මොනයම් හෝ නීතියකින් සඳහන් කරන කවර හෝ වෙනත් රාජකාරි කරගෙන යාමට විගණකාධිපතිවරයා සතු බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ද පවරනු ලැබේ. විගණකාධිපතිවරයාගේ කටයුතු හා රාජකාරි ඉටුකිරීමේදී හා පැවරීමේදී ඔහුගේ රාජකාරියට සහායවීමට සුදුසුකම්ලත් විගණකවරුන්ගේ සේවය ලබාගැනිමට විගණකාධිපතිවරයාට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලය දී ඇත. තවද විගණනයට අදාළ වන තාක්ෂණ, වෘත්තීය හා විද්‍යාත්මක ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා විශේෂඥ සහාය ලබාගැනීමට අවශ්‍ය විධිවිධාන සලසා තිබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(5) ව්‍යවස්ථාවෙන් විගණකාධිපතිවරයා ඔහුගේ රාජකාරි කටයුතු සිදුකිරීමේදී හා පැවරීමේදී සියලු පොත්පත් හා වාර්තා ඉහතින් සඳහන් කරන ලද ආයතනවල හෝ රාජ්‍ය ආයතනවල ගබඩා හා වෙනත් දේපලවලට පිවිසීමට විගණනයන් සිදුකිරීම හා අවශ්‍ය විය හැකි තොරතුරු හා කරුණු පැහැදිලි කිරීම ලබාගැනීමට විධිවිධාන සලසා ඇත.

අපගේ සේවා ග්‍රාහකයෝ

විගණකාධිපතිවරයාගේ විෂය පථය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම නිර්වචනය කරන අතර තවදුරටත් එය දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සමාගම් ද ඇතුළත් කරමින් ව්‍යාප්ත කර තිබේ. වර්තමානයේදී අපගේ සේවාලාභී පදනම පහත සඳහන් පරිදි වේ.

අමාත්‍යාංශ	51
දෙපාර්තමේන්තු	96
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	25
සංස්ථා	204
රාජ්‍ය සමාගම් (දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් විගණකාධිපතිවරයාගේ විෂය පථයට යටත් කර ඇති)	141
රාජ්‍ය බැංකු	10
ව්‍යවස්ථාපිත හා අනෙකුත් අරමුදල්	60
විදේශ අරමුදල් ව්‍යාපෘති	164
අනෙකුත් ස්වාධීන ආයතන	23
පළාත් සභා	09
පළාත් පාලන ආයතන	341
ගොවිජන සේවා මධ්‍යස්ථාන	561
ක්‍රීඩා සංගම්	64
පළාත් සභාවල අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා විශේෂ වියදම් ඒකක	253
පළාත් සභා ප්‍රඥප්ති යටතේ පිහිටුවන ලද ආයතන	44
එකතුව	2046

අපගේ විෂය පථය

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ I කොටසේ 3 වන වගන්තියේ සිට 5 වන වගන්තිය දක්වා වගන්තිවලින් විගණකාධිපතිවරයා විසින් සිදු කරනු ලබන විගණනවල විෂය පථය සඳහන් කර ඇත. ඒ අනුව

- විගණකධිපතිවරයා විසින්
  - ඒකාබද්ධ අරමුදල වෙත ලැබෙන සියළුම ආදායම් සහ ඒකාබද්ධ අරමුදලෙන් වන සියළු වියදම් විගණනය කරනු ලැබිය යුතුය.
  - විගණනය කරනු ලබන ආස්ථිත්‍යයන්හි ගිණුම්වල වියපැහැදම් කරනු ලැබ ඇති බවට පෙන්නුම් කරනු ලබන මුදල්, ඒවා අදාළ කරගෙන ඇත්තා වූ හෝ අයකරගෙන ඇත්තා වූ හෝ අයකර ගෙන ඇත්තා වූ සේවා හෝ කාර්ය සඳහා නිත්‍යානුකූලව ලබාගෙන සහ අදාළ කර ගෙන තිබේ ද යන්න පිළිබඳ විමසා දැනගත යුතුය.
  - වියදම්, ඒවා පාලනය කරනු ලබන අධිකාරයට අනුකූල වන්නේ ද යන්න පිළිබඳ තීරණය කළ යුතු ය. සහ
  - එක් එක් විගණනයේ දී, ආදායම්, වියදම්, ගනුදෙනු හා සිද්ධීන් පිළිබඳව පරීක්ෂා කරනු ලැබිය යුතුය.
- විගණකාධිපතිවරයා විසින් සිදු කරන ලද විගණනයක විෂය පථය විගණනය කරනු ලබන ආස්ථිත්‍යයන්හි ගිණුම්, මූල්‍යයන්, මූල්‍ය තත්ත්වය සහ රාජ්‍ය මූල්‍යවල සහ දේපළ විචක්ෂණ කළමනාකරණ පරීක්ෂා කිරිම ඇතුළත් වන්නේය.
- විගණකාධිපතිවරයා මේ පනතේ විධිවිධාන ඉටු කිරිම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට වගකිව යුතුය.
- විගණන පනතේ 3 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, විගණනය කරනු ලබන ආස්ථිත්‍යයට අදාළ ඕනෑම කාරණයක් පිළිබඳව, එම කරුණු සනාථ කිරිමට ප්‍රමාණවත් සාක්ෂි සහිතව මහජනතාව අතරින් යම් අයෙකු විගණකාධිපතිවරයාට ලිඛිතව දැනුවත් කර ඇත්නම්, එම කරුණු විගණකාධිපතිවරයා විසින් පරීක්ෂා කළ හැකි අතර, ඒ පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුය.

විගණකාධිපති විසින් ඔහුගේ අභිමතය පරිදි විගණන විෂය පථය තීරණය කරනු ලබන අතර මේ සම්බන්ධයෙන් 2018 අංක 19

දරන ජාතික විගණන පනතේ 5 වන වගන්තිය ප්‍රකාරව කටයුතු කරනු ලැබේ. ඒ අනුව

- විගණන පනතේ 29 වන වගන්තිය යටතේ පිහිටවන ලද ජාතික විගණන කාර්යාලය විසින් භාරගනු ලබන විගණන සඳහා, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත යටතේ පිහිටුවන ලද විගණන ප්‍රමිති කමිටුව විසින් තීරණය කරන ලද ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් අදාළ විය යුතුය.
- කාර්යසාධන විගණන, පාරිසරික විගණන, තාක්ෂණික විගණන සහ වෙනත් යම් විශේෂ විගණන සඳහා ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවල කිසිම විගණන ප්‍රමිතියක් නිශ්චිතව සඳහන් කර නොමැති අවස්ථාවක දී, එම විගණන සම්බන්ධයෙන් අදාළ විය යුතු බවට උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර සංවිධානය මගින් තීරණය කරන ලද උත්තරීතර විගණන ආයතන සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතිවල ප්‍රතිපාදන, දේශීය අවශ්‍යතාවලට සරිලන පරිදි වූ සංශෝධන සහිතව අදාළ විය යුතු වන පරිදි විගණන සේවා කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් මගින් නිශ්චිතව දක්වනු ලැබිය හැකිය.
- පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව (COPA) සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE) විසින් විගණකාධිපති වෙත මඟ පෙන්වනු ලබයි.

අපගේ ස්වාධීනත්වය

විගණකාධිපතිවරයාගේ ස්වාධීනත්වය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම පුළුල් වශයෙන් සහතික කර ඇත. දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනත මගින් උත්තරීතර විගණන ආයතනයක ස්වාධීනත්වය මත පදනම් වූ උත්තරීතර විගණන ආයතන පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ මූලික මූලධර්මයන් සමග ගැලපීමට මෙය තවදුරටත් විකාශනය කරනු ලැබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ව්‍යවස්ථාව අනුව,

''විගණකාධිපතිවරයෙක් වන්නේය. ඔහු සුදුසුකම්ලත් විගණකවරයෙකු විය යුතු අතර, ජනාධිපතිවරයා විසින් ව්‍යවස්ථා සභාවේ අනුමැතියට යටත්ව පත්කරනු ලබන අතර විගණකාධිපතිවරයා යථා පැවැත්මෙන් සිටිනතාක් ස්වකීය ධුරය දරන්නේය.''

අයහපත් සෞඛ්‍ය තත්ත්වය හෝ ආබාධිත තත්ත්වය මත හෝ ජනාධිපතිවරයා පාර්ලිමේන්තුව ඇමතීමත් යන තත්ත්වයන්හීදී පමණක් ජනාධිපතිවරයා විසින් විගණකාධිපතිවරයා ධුරයෙන් ඉවත් කරනු ලබයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ව්‍යවස්ථාවේ තවදුරටත් දැක්වෙන පරිදි විගණකාධිපතිවරයාගේ වැටුප පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරන අතර, එසේ නිශ්චය කරන ලද වැටුප ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන අතර ඔහුගේ ධුර කාලය තුළ එය අඩු නොකළ යුතුය.

විගණකාධිපති කිසිදු අමාත්‍යවරයෙකුගේ හෝ රජයේ නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතට නොගැනේ.

නීත්‍යානුකූල ඉටු කිරීම

නීත්‍යානුකූල ඉටුකිරීම් සඳහා අවශ්‍යතාවය

විගණකාධිපතිවරයාගේ ක්‍රියාකාරීත්වය පිළිබඳ ස්වාධීනත්වය මෙතාක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් සුරක්ෂිත කර තිබුණද, විගණකාධිපතිවරයාගේ මූල්‍ය හා පරිපාලන ස්වාධීනත්වය පවත්නා ව්‍යවස්ථාව හා නීතිමය විධිවිධාන මත විධායකය විසින් සීමා කිරීම් සිදුකර තිබුණි. නමුත් 2018 අගෝස්තු 01 දින සිට 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධානවලින් එම සීමාකිරීම් ඇහිරී

ඇත. විගණකාධිපතිවරයා කිසිදු පුද්ගලයෙකුගේ හා ආයතනයක සියලු බැඳීම්වලින් නිදහස් විය යුතු අතර අත්තනෝමතික පළිගැනීම්වලින් තොරවිය යුතු නිසා මූල්‍ය හා මිනිස් බලය යන දෙවර්ගයෙන් දැක්වෙන ඔහුගේ සම්පත් සඳහා විගණකාධිපතිවරයා විධායකයේ රදාපැවැත්ම පාර්ලිමේන්තුව වෙනුවෙන් සිදුකරන ලද විගණනයේ ස්වාධීනත්වය සැබවින්ම හානියට ලක්වන බව පිළිගනී. මූල්‍ය පරිපාලන ස්වාධීනත්වය ඇතුළුව විගණකාධිපතිවරයාගේ ස්වාධීනත්වය තහවුරු කිරීම සඳහා නීතිමය විධිවිධාන මඟින් වැඩි ආරක්ෂාවක් පාර්ලිමේන්තුව විසින් සැලසිය යුතු වේ. සමාලෝචිත වර්ෂය දක්වා විගණකාධිපතිවරයා ඔහුගේ වියදම් සඳහා මහා භාණ්ඩාගාරයේ සහයෝගය තුළ යැපීම සිදු වූ අතර දෙපාර්තමේන්තුවට සම්පත් වෙන්කිරීම දෙපාර්තමේන්තුව මුහුණ දුන් අවදානමට ගැලපෙන පරිදි සිදු වී නොතිබුණි. අනෙකුත් උසස් පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල්වල පරිදි ශ්‍රී ලංකාවේ විගණකාධිපති සඳහා වූ අයවැය, ව්‍යවස්ථාදායක සම්පාදක කමිටුවක් විසින් සියුම් පරීක්ෂණයකට යටත්ව අනුමත කර හෝ ඔහුගේ අයවැය පිළිබඳ විධායක පාලනයෙන් බැහැරවන පරිදි 2018 අංක 19 දරන ජාතික විගණන පනතෙන් විධිවිධාන සලසා තිබීම විගණකාධිපතිවරයාගේ කාර්යභාරය ඉටු කිරීමේ ස්වාධිනත්වය තහවුරු කර ඇත.

විගණකාධිපතිවරයාගේ හා ඔහුගේ කාර්ය මණ්ඩලයේ පරිපාලන ස්වාධීනත්වය සුරක්ෂිත කිරීම, කාර්ය මණ්ඩලයේ උසස් කිරීම්, මාරු කිරීම්, විනය ක්‍රියාමාර්ග, වැටුප් සහ කාර්ය මණ්ඩලයේ වෙනත් පරිපාලන කටයුතු සම්බන්ධයෙන් වූ පරිපාලනමය කරුණු පිළිබඳ පාලනය ජාතික විගණන සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ඇත.

තවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පරිදි විගණකාධිපති "රාජ්‍ය නිලධාරීන් පිළිබඳ විශේෂිත ලැයිස්තුවට" ඇතුළත් කර නොතිබුණු අතර, ආයතන සංග්‍රහයේ විස්තර කර ඇති පරිදි රජයේ සියලුම පරිපාලන රෙගුලාසි විගණකාධිපතිට හා ඔහුගේ කාර්ය මණ්ඩලයට අදාළවේ.මෙය තවදුරටත් විගණකාධිපතිගේ පරිපාලන ස්වාධීන්ත්වය සීමා කිරීමක් වේ. ඔහුගේ රාජකාරී පිළිබඳ මෙම පරිපාලනමය පාලන අඩුපාඩුව විගණන කටයුතුවලට සැලැකිය යුතු ලෙස අවහිර කිරීම් කළ අවස්ථා බොහොමයක් විය.

එක්සත් ජාතීන්ගේ උත්තරීතර විගණන ආයතනයන් පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය (INTOSAI) 1977 දී අනුමත කළ "ලීමා ප්‍රකාශනය" මගින් ශිල්ප ක්‍රම හා වෘත්තීමය වශයෙන් රාජ්‍ය විගණනයේ ස්වාධීනත්වය පිළිබඳව මූලධර්ම කෙරෙහි අවධානය යොමු කර ඇත. වසර 30 කට පසුව උත්තරීතර විගණන ආයතන පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ XIX සම්මේලනයේදී (2007 මැක්සිකෝව) "මැක්සිකෝ ප්‍රකාශනය" මගින් රාජ්‍ය අංශයේ මනා විගණනයක් සඳහා උත්තරීතර විගණන ආයතනයන්ගේ ස්වාධීනතාවය පිළිබඳව ස්ථිර වශයෙන් වන පහත සඳහන් පරිදි ප්‍රධාන අත්‍යවශ්‍ය අවශ්‍යතා 8 ක් හඳුනාගෙන ඇත.

1 ප්‍රතිපත්තිය

යෝග්‍ය වූ ද ඵලදායී වූ ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල / ව්‍යවස්ථාපිත / නෛතික කාර්ය රාමුවක් සහ එම කාර්ය රාමුව තුළ තත්ත්වාකාරයෙන් ක්‍රියාත්මක කිරීමේ විධිවිධාන පැවතීම.

උත්තරීතර විගණන ආයතන සතු ස්වාධීනත්වයේ ප්‍රමාණය සවිස්තරව විදහා දැක්වෙන නීති සම්පාදනය කිරීම අවශ්‍ය වේ.

2 ප්‍රතිපත්තිය

උත්තරීතර විගණන ආයතනවල ප්‍රධානීන් සහ (විද්‍යායතනික ආයතනවල) සාමාජිකයන් ස්වකීය රාජකාරී සාමාන්‍ය වශයෙන් ඉටු කිරීමේදී ඔවුන්ගේ ධුරයේ ආරක්ෂාව සහ නෛතික පරිසරයේ ස්වාධීනත්වය

පහත සඳහන් තත්ත්වයන්ට යටත්වන උත්තරීතර විගණන ආයතනවල ප්‍රධානීන්ගේ සහ විද්‍යායතනික ආයතනවල සාමාජිකයන් ගේ පත්වීම්, නැවත පත්වීම්, සේවා නියුක්තිය, සේවයෙන් ඉවත් කිරීම සහ විශ්‍රාම ගැන්වීම පිළිබඳ කොන්දේසි අදාළ නීති සම්පාදනය මගින් විශේෂයෙන් දැක්විය යුතුය.

- ව්‍යවස්ථාදායකයෙන් සහතික කෙරෙන ක්‍රියාවලියක් මගින් ස්වාධීනත්වය තහවුරු කෙරෙන පත්කිරීම්, නැවත පත් කිරීම් හෝ සේවයෙන් ඉවත් කිරීම් (උත්තරීතර විගණන ආයතනවල ස්වාධීනත්වය හා සම්බන්ධ ISSAI II මාර්ගෝපදේශ සහ යහපත් පරිචයන්)

- ස්වකීය නියෝග (Mandate) විරෝධ මත ඉදිරිපත්වීමේ බියකින් තොරව ක්‍රියාත්මක කිරීමට ඉඩ ලැබෙන පරිදි ප්‍රමාණවත් තරම් දීර්ඝ සහ නිශ්චිත කාල සීමාවක් සහිතව කරනු ලබන පත්වීම් ; සහ

- ස්වකීය රාජකාරී නිසියාකාරයෙන් සාමාන්‍ය පරිදි ඉටු කිරීමේදී අතීතයේදී වර්තමානයේදී සිදුකරන ලද කවර හෝ කාර්යයක් හේතු කොට ගෙන සිදු කරනු ලබන පැමිණිල්ලකදී නිර්මුක්ත වීම. (Immune)

3 ප්‍රතිපත්තිය

උත්තරීතර විගණන ආයතනවල කාර්ය ඉටුකිරීමේදී ප්‍රමාණවත් තරම් පුළුල් වූ නියෝගයක් (Mandate) සහ පූර්ණ අභිමතය

පහත සඳහන් කාර්යයන් විගණනය කිරීමේ බලය, උත්තරීතර විගණන ආයතනවලට පැවරිය යුතුය.

- රාජ්‍ය මුදල්, සම්පත් හෝ වත්කම් ලබාගත් අයකු හෝ ප්‍රතිලාභියකු විසින් ඒවා ප්‍රයෝජනයට ගැනීම පිළිබඳව එහි නෛතික ස්වභාවය නොතකා විගණනය කිරීම.
- රජයට හෝ රජයේ ආයතනවලට ලැබියයුතු ආදායම් එකතු කිරීම.
- රජයේ හෝ රජයේ ආයතනවල ගිණුම් පිළිබඳ නීත්‍යානුකූලභාවය සහ නියමානුකූලතා

- මූලා කළමනාකරණයේ සහ වාර්තා කිරීමේ ගුණාත්මකභාවය ; සහ
- රජයේ හෝ රාජ්‍ය ආයතනවල මෙහෙයුම් කටයුතු පිළිබඳ අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව සහ ඵලදායීභාවය.

නීති මඟින් එසේ කරන ලෙස නිශ්චිත වශයෙන් නියම කර ඇති අවස්ථාවලදී විනා, උත්තරීතර විගණන ආයතන විසින් රජයේ හෝ රජයේ ආයතනවල ප්‍රතිපත්තිය විගණනය නොකළ යුතු නමුත් ඔවුන්ගේ විගණනය, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ කාර්යයට පමණක් සීමා කළ යුතුය.

උත්තරීතර විගණන ආයතන විසින් එම ආයතනවලට අදාල වන අයුරින් ව්‍යවස්ථාදායකය පනවන නීතිවලට ගරු කළයුතු අතර, පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ව්‍යවස්ථාදායකය හෝ විධායකය සිදුකරන විධානවලින් හෝ මැදිහත්වීම්වලින් එකී විගණන ආයතන නිදහස් වන්නේය;

- විගණන ගැටළු තෝරාගැනීම ;
- ඔවුන්ගේ විගණන සැලසුම් කිරීම, වැඩසටහන් ගතකිරීම, පැවැත්වීම, වාර්තා කිරීම සහ පසු විපරම් කටයුතු කිරීම ;
- ස්වකීය කාර්යාලය සංවිධානය කිරීම සහ කළමනාකරණය ;
- අනුමත කිරීම් ක්‍රියාත්මක කිරීම ස්වකීය නියෝගයේ (Mandate) කොටසක් වන අවස්ථාවලදී ස්වකීය තීරණ බලාත්මක කිරීම ;

උත්තරීතර විගණන ආයතන විසින් තමන් විගණනය කරනු ලබන සංවිධානවල කළමනාකාරීත්වය තුළ කිසිදු ආකාරයේ මැදිහත්වීමක් හෝ මැදිහත් වන බව පෙනී යන අයුරින් ක්‍රියාකිරීමක් හෝ නොකළ යුතුය.

උත්තරීතර විගණන ආයතන, ස්වකීය විගණිත ආයතන සමඟ වඩා සමීප සම්බන්ධතා ඇති කර නොගන්නා බවට සහතික විය යුතුය. ඒ අනුව ඔවුන් අරමුණුවලට අනුකූලව කටයුතු කරමින් සිටින බව විදහා දැක්විය යුතුය.

ස්වකීය වගකීම් ඉටු කිරීමේදී උත්තරීතර විගණන ආයතනවලට පූර්ණ අභිමතය අනුව ක්‍රියා කළහැකි විය යුතුය. ඔවුන් රාජ්‍ය අරමුදල් භාවිතය සහ කළමනාකරණය වැඩිදියුණු කිරීමට වෙහෙසෙන රාජ්‍ය හෝ රාජ්‍ය ආයතන සමඟ සහයෝගයෙන් ක්‍රියා කළ යුතුය.

උත්තරීතර විගණන ආයතන පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ ද ජාත්‍යන්තර ගණකාධිකාරී සම්මේලනයේ ද අනෙකුත් පිළිගත් ප්‍රමිති නියම කරන ආයතනවලද නිල ලේඛන පදනම් කරගත් යෝග්‍ය වූ වැඩ සහ විගණන ප්‍රමිතීන් ද ආචාර ධර්ම සංග්‍රහයක් ද උත්තරීතර විගණන ආයතන විසින් භාවිත කළ යුතුය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ප්‍රඥප්තිවලින් හෝ නීති සම්පාදනය මඟින් නියම කර ඇති ප්‍රකාර වාර්ෂික කාර්යසාධන වාර්තාවක් උත්තරීතර විගණන ආයතන විසින් ව්‍යවස්ථාදායකයට සහ අනෙකුත් රාජ්‍ය ආයතනවලට ඉදිරිපත් කළ යුතුය. එම ආයතන විසින් එකී වාර්තාව මහජනයා වෙත දැන ගැනීමට සැලැස්විය යුතුය.

4 ප්‍රතිපත්තිය
සීමාවකින් තොරව තොරතුරු ලබා ගතහැකි වීම

උත්තරීතර විගණන ආයතනය සතු ව්‍යවස්ථාපිත වගකීම් නිසියාකාරව ඉටුකිරීම සඳහා අවශ්‍ය සියලු ලේඛන සහ තොරතුරු කලට වේලාවට, වැරදීමකින් තොරව, සෘජුවම සහ නිදහසේ ලබා ගැනීමට ප්‍රමාණවත් බලතල එම ආයතන සතු විය යුතුය.

5 ප්‍රතිපත්තිය

ස්වකීය වැඩ පිළිබඳව වාර්තා කිරීමට ඇති අයිතිය සහ බැඳීම

ස්වකීය විගණන කාර්යයේ ප්‍රතිඵල වාර්තා කිරීම සම්බන්ධයෙන් උත්තරීතර විගණන ආයතනවලට සීමා කිරීම් නොකළ යුතුය. ස්වකීය විගණන කාර්ය ප්‍රතිඵල යටත් පිරිසෙයින් වර්ෂයකට එක් වරක්වත් වාර්තා කිරීමට ඔවුන්ට නීතියෙන් නියම කළ යුතුය.

6 ප්‍රතිපත්තිය

විගණන වාර්තාවල අන්තර්ගතය සහ කාල නියමය තීරණය කිරීමේ නිදහස සහ ඒවා ප්‍රකාශයට පත්කොට බෙදා හැරීම

- ස්වකීය විගණන වාර්තාවල අන්තර්ගතය තීරණය කිරීමේ නිදහස උත්තරීතර විගණන ආයතනවලට තිබේ.
- විගණනය කරනු ලබන ආයතනයේ අදහස් යෝග්‍ය පරිදි සැලකිල්ලට ගනිමින් ස්වකීය විගණන වාර්තාවල නිරීක්ෂණ සහ නිර්දේශ ඇතුළත් කිරීමේ නිදහස උත්තරීතර විගණන ආයතන සතු වේ.
- විගණන වාර්තාවල සඳහන් විය යුතු අවම අවශ්‍යතා නිශ්චිතව දැක්වීමත් යෝග්‍ය අවස්ථාවලදී විධිමත් විගණන මතයකට හෝ සහතික කිරීමකට නිශ්චිත කරුණු දැක්වීමක් නීති මගින් කළ යුතුය.
- වාර්තා කිරීමට අවශ්‍ය කරුණු නිශ්චිත වශයෙන් නීතියෙන් නියම කර ඇති අවස්ථාවලදී හැර ස්වකීය විගණන වාර්තාවල කාල නියමය තීරණය කිරීමේ නිදහස උත්තරීතර විගණන ආයතන සතු වේ.
- සමස්තයක් වශයෙන් ව්‍යවස්ථාදායකය, එහි කොමිෂන් සභාවක්, හෝ රජය විසින් විමර්ශනයක් නැතහොත් විගණනයක් සඳහා විශේෂ ඉල්ලීම් කළ විට උත්තරීතර විගණන ආයතනවලට ඒවා ඉටු කළ හැකිය.
- උත්තරීතර විගණන ආයතනවල වාර්තා නීතියෙන් නියම වී ඇති පරිදි අදාළ බලධාරීන්ට විධිමත්ව ඉදිරිපත් කිරීමෙන් හෝ භාරදීමෙන් පසු ඒවා ප්‍රකාශයට පත්කොට බෙදා හැරිය යුතුය.

7 ප්‍රතිපත්තිය

උත්තරීතර විගණන ආයතනයේ නිර්දේශ පිළිබඳ ඵලදායී පසුවිපරම් යාන්ත්‍රණ පැවතීම

- උත්තරීතර විගණන ආයතන ස්වකීය වාර්තාවල සඳහන් නිශ්චිත නිර්දේශ සමාලෝචනය කොට පසු විපරම් කටයුතු කරමින් විශෝධන පියවරවල් ගැනීම සඳහා අදාළ වන පරිදි ව්‍යවස්ථාදායකය වෙත හෝ එහි කොමිෂන් සභාවක් වෙත හෝ විගණනය කරනු ලැබූ ආයතනයේ පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කරයි.
- උත්තරීතර විගණන ආයතනවල මෙන්ම අදාළ වන පරිදි ව්‍යවස්ථාදායකය, එහි කොමිෂන් සභාවක් හෝ විගණනය කරනු ලැබූ ආයතනයේ පාලක මණ්ඩලය යන මේවායේ නිරීක්ෂණ සහ නිර්දේශ නිසියාකාරව ක්‍රියාත්මක කරන බව තහවුරු කර ගැනීමට එම විගණන ආයතනවලට ස්වකීය වූ අභ්‍යන්තර පසු විපරම් ක්‍රමයක් පවතී.
- පසු විපරම් කටයුතු සහ අනුමත කිරීම සඳහා ස්වකීයම වූ ව්‍යවස්ථාපිත බලතල උත්තරීතර විගණන ආයතන සතුව තිබිය දී පවා එකී විගණන ආයතන ස්වකීය පසු විපරම් වාර්තා අදාළ වන පරිදි ව්‍යවස්ථාදායකය වෙත හෝ එහි කොමිෂන් සභාවක් වෙත හෝ විගණනය කරනු ලැබූ ආයතනයේ පාලක මණ්ඩලය වෙත, සලකා බලා අවශ්‍ය පියවර ගැනීම සඳහා ඉදිරිපත් කරයි.

8 ප්‍රතිපත්තිය

මූල්‍ය සහ කළමනාකරණ / පරිපාලන ස්වායත්තතාව සහ යෝග්‍ය මානව, භෞතික සහ මූල්‍ය සම්පත් පැවතීම

- උත්තරීතර විගණන ආයතනවලට අවශ්‍යකරන සහ සාධාරණ මානව, භෞතික සහ මූල්‍ය සම්පත් තිබිය යුතුය. මෙම සම්පත් ලබා ගැනීම පාලනය කිරීමට හෝ මෙහෙයවීමට විධායකය ඉදිරිපත් නොවිය යුතුය. උත්තරීතර විගණන ආයතන ස්වකීය අය වැය ඔවුන් විසින්ම කළමනාකරණය කරගෙන සුදුසු පරිදි වෙන් කර ගනිති.
- ව්‍යවස්ථාදායකය හෝ එහි එක් කොමිෂන් සභාවක් උත්තරීතර විගණන ආයතනවලට ස්වකීය නියෝගය (Mandate) සපුරාලීමට අවශ්‍ය කරන නිසි සම්පත් ඉඳුරාම ලබාදෙන බවට සහතික වීමේ වගකීම දැරිය යුතුය.
- උත්තරීතර විගණන ආයතනවලට සපයා ඇති සම්පත් ඔවුන්ගේ නියෝගය (Mandate) සපුරාලීමට පියවර ගැනීමට තරම් ප්‍රමාණවත් නොවේ නම් ඒ සම්බන්ධයෙන් කෙළින්ම ව්‍යවස්ථාදායකයට අභියාචනා කිරීමේ අයිතිය එකී විගණන ආයතන සතුවේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වන්නේ විගණකාධිපතිවරයාගේ කාර්ය මණ්ඩලය නොව, විගණකාධිපතිවරයා බැවින් වෙනත් රටවල මෙන්ම වෙනමම විගණන පනතක් මගින් විගණකාධිපති දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ කටයුතු සහ අධිකාරය විස්තර කිරීමට අවශ්‍ය වේ. එම අවශ්‍යතාවය 2018 අගෝස්තු 01 දින සිට 2018 අංක 19 දරන ජාතික විගණන පනත මගින් ලැබී ඇත.

දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ 153 හා 154 ව්‍යවස්ථාවන්ට සිදුකළ සංශෝධන

විගණකාධිපතිවරයා විසින් මුහුණ දුන් පරිපාලන හා මූල්‍ය ස්වාධීනත්වයේ අඩුපාඩු මඟ හැරීම සඳහා පහත සඳහන් සංශෝධනයන් දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සිදු කර ඇත. රාජ්‍ය විගණනය නවීකරණය කරමින් තවදුරටත් ප්‍රතිසංස්කරණයන් විගණන පනත් කෙටුම්පතෙහි ඇතුළත් කර ඇත.

- විගණකාධිපතිවරයා සුදුසුකම්ලත් විගණකවරයෙකු විය යුතු අතර, ජනාධිපතිවරයා විසින් ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව පත්කරනු ලබන්නේය. විගණකාධිපතිවරයා යථා පැවත්මෙන් සිටිනතාක් ස්වකීය ධූරය දරන්නේය.
- විගණකාධිපතිවරයා සභාපතිත්වය දරන විගණන සේවා කොමිෂන් සභාවක් පිහිටවනු ලැබේ. නියෝජ්‍ය විගණකාධිපති හෝ නියෝජ්‍ය විගණකාධිපතිවරයාගේ ශ්‍රේණියට ඉහළින් වූ ධූරයක් උසුලන ලද විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විශ්‍රාමලත් නිලධරයන් දෙදෙනෙකු, ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියාචනාධිකරණයේ හෝ මහාධිකරණයේ විශ්‍රාමලත් විනිශ්චයකාරවරයෙකු සහ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශ්‍රාමලත් I වන පන්තියේ නිලධරයෙකු අනෙකුත් සාමාජිකයන් වනු ඇත. ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශයන්ට යටත්ව වර්ෂ 03 ක ස්ථිර කාලපරිච්ඡේදයකට කොමිෂන් සභාවේ සාමාජිකයන් ජනාධිපතිවරයා විසින් පත්කරයි.
- ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත් සමාජිකයන්ගේ බඳවාගැනීම, උසස්කිරීම, මාරුකිරීම, විනය පාලනය සහ සේවයෙන් පහකිරීමේ බලය කොමිෂන් සභාව වෙත පැවැරීමෙන් විගණකාධිපති දෙපාර්තමේන්තුවේ පරිපාලන ස්වාධිනත්වය ආරක්ෂා කර ගැනිමට කටයුතු කිරිම

- රජය විසින් රාජ්‍ය සමාගමක් විසින් හෝ පළාත් පාලන ආයතනයක් විසින් සමාගම් පනත යටතේ ලියාපදිංචි සමාගමක කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 50 කට වැඩි හිමිකමක් ඇති රාජ්‍ය සමාගම් සියල්ලේ විගණනය විගණකාධිපතිවරයාගේ විෂයය පථය යටතට ගැනේ..
- විගණකාධිපතිවරයාගේ ස්වාධීනත්වය ආරක්ෂා කර ගැනිමට ''රාජ්‍ය නිලධාරියා'' යන නිර්වචනයෙන් ඉවත් කරයි.
- විධායකයේ කිසිදු මැදිහත්වීමකින් තොරව විගණකාධිපතිවරයාගේ කටයුතු සිදුකිරීමට ප්‍රමාණවත් අරමුදල් සපයන බවට සහතික කර ගැනීමට විගණන සේවා කොමිෂන් සභාව විසින් පිළියෙළ කරන ජාතික විගණන ආයතනයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තු පාර්ලිමේන්තුව විසින් නිශ්චය කිරීම

2018 අංක 19 දරන ජාතික විගණන පනත

විගණන සේවා කොමිෂන් සභාවේ බලතල, කාර්ය හා කර්තව්‍ය පිළිබඳ විධිවිධාන සැලැස්වීම සඳහාද, ජාතික විගණන කාර්යාලය සහ ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය පිහිටුවීම සඳහා ද, රාජ්‍ය මූල්‍ය පිළිබඳ විගණකාධිපතිවරයාගේ කාර්යභාරය නිශ්චිතව දැක්වීම සඳහාද, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන 2018 අංක 19 දරන ජාතික විගණන පනතින් සලසා ඇත.

ජාතික විගණන පනතේ සඳහන් ප්‍රධාන ලක්ෂණ පහත පරිදි වේ.

- ගිණුම්, මූල්‍ය, මූල්‍ය තත්ත්වය, රාජ්‍ය අරමුදල්වල මූල්‍ය පාලනය, විගණන ආයතනවල දේපල පරීක්ෂාව සහ කාර්යසාධන විගණනයක්, පාරිසරික විගණනයක්, තාක්ෂණික විගණනයක් සහ වෙනත් විශේෂ විගණනයන් සිදුකිරීමට විගණකාධිපතිවරයාට හැකිවන පරිදි විෂයපථය පුළුල් කර තිබීම.
- විගණනය කරනු ලබන ආයතනයකට අදාළ ඕනෑම කාර්ණයක් පිළිබඳව, එම කරුණු සනාථ කිරිමට ප්‍රමාණවත් සාක්ෂි සහිතව මහජනයා අතරින් යම් අයෙකු විගණකාධිපතිවරයාට ලිඛිතව දැනුවත් කර ඇත්නම්, එම කරුණු විගණකාධිපතිවරයා විසින් පරීක්ෂා කළ හැකි අතර, ඒ පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුය.
- 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත යටතේ පිහිටුවන ලද විගණන ප්‍රමිති කමිටුව විසින් තීරණය කරන ලද ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ජාතික විගණන කාර්යාලය විසින් බාරගනු ලබන අතර එය සියලු විගණනයන්ට අදාළ වේ.
- කාර්යසාධන විගණනය, පාරිසරික විගණනය, තාක්ෂණික විගණනය සහ වෙනත් යම් විශේෂ විගණන සඳහා ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවල කිසිදු විගණන ප්‍රමිතියක් නිශ්චිතව සඳහන් කර නොමැති අවස්ථාවකදී, උත්තරීතර විගණන ආයතන සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතිවල ප්‍රතිපාදන, දේශීය අවශ්‍යතාවයට සරිලන පරිදි වූ සංශෝධන සහිතව අදාළ විය යුතු පරිදි විගණන සේවා කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් මගින් නිශ්චිතව දක්වනු ලැබිය යුතුය.
- රාජ්‍ය සංස්ථා රාජ්‍ය සමාගම් හැර යම් විගණනය කරනු ලබන ආයතනයක් විසින් ඉදිරිපත් කරන ලද යම් මූල්‍ය ප්‍රකාශයක් හෝ යම් ගිණුමක් සම්බන්ධයෙන්, විගණකාධිපතිවරයා විසින්, විගණනය කරනු ලබන ආයතනයට එක් එක් මූල්‍ය වර්ෂය අවසන්වීමෙන් පසු මාස පහක් තුළදී සම්පිණ්ඩන වාර්තාවක් නිකුත් කළ යුතු වීම.

- රාජ්‍ය සංස්ථාවක් වන හෝ රජය විසින් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් දරනු ලබන සමාගමක අනුමත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් අදාළ ලේඛන හා තොරතුරු විගණකාධිපතිවරයා වෙත ලැබී මාස තුනක් ඇතුළත, සිය වාර්ෂික වාර්තාවේ පළකිරිම සඳහා විගණකාධිපතිවරයා විසින් වාර්තාවක් ඉදිරිපත් කළ යුතුවීම.
- අදාළ විගණනය කරනු ලබන ආස්ථිතිය පවරා ඇති අමාත්‍යවරයාට සහ මුදල් විෂය පවරා ඇති අමාත්‍යවරයාට පිටපත් සහිතව එක් එක් මුදල් වර්ෂය අවසන්වීමෙන් මාස පහක් ඇතුළත එක් එක් විගණනය කරනු ලබන ආස්ථිතියන්හි පාලක මණ්ඩලයට විගණකාධිපතිවරයා විසින් වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාවක් ඉදිරිපත් කළ යුතුවීම.
- රජයේ මූල්‍ය ප්‍රකාශන රජයේ එක් එක් මුදල් වර්ෂය අවසන් වී මාස තුනක් ඉකුත්වීමට පෙර භාණ්ඩාගාර ලේකම්වරයා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වීම.
- විගණනය කරනු ලබන රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත අරමුදල් හෝ මණ්ඩල, යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ රජය වෙත පවරනු ලැබ ඇති වෙළෙඳ ව්‍යාපාර හෝ වෙනත් ව්‍යාපාර සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන ස්වකීය කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් විසින් දරනු ලබන යම් සමාගම්වලින් ගාස්තුවක් අය කළ යුතුවීම.
- විගණන සේවා කොමිෂන් සභාව විසින් බඳවා ගනු ලබන ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත් සාමාජිකයන්ගේ පත් කිරීම්, උසස් කිරීම්, මාරු කිරීම්, විනය පාලනය කිරීම සහ සේවයෙන් පහ කිරීම කොමිෂන් සභාව සතු විය යුතුවීම.
- කොමිෂන් සභාව විසින් බඳවා ගනු ලබන තැනැත්තන්ගේ වැටුප් සහ වෙනත් දීමනා සහ වෙනත් යම් ප්‍රතිලාභ, වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසමේ අදහස් ලබා ගැනීමෙන් අනතුරුව කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය යුතු අතර, එකී වැටුප් ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතුය.
- සියළුම විගණනය කරනු ලබන ආස්ථිතියන් විසින් විගණකාධිපතිවරයාට සහ ඔහු විසින් සේවයේ යොදවා ඇති යම් නිලධරයෙකුට සහයෝගය දැක්විය යුතු අතර ඵලදායි විගණනයක් සිදු කිරීමට පහසුකම් සැලැසීම සඳහා වැඩ කිරීමට අවශ්‍ය සුරක්ෂිත සහ රැකවරණ සහිත පරිසරයක් සකස් කර දිය යුතුය.
- මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන කාලසීමාවක් ඇතුළත විගණන කාර්යාලයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුව කොමිෂන් සභාව විසින් සකස් කළ යුතුය. කථානායකවරයා විසින් තීරණය කරනු ලබන දිනයකදී එය කථානායකවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.
- විගණකාධිපතිවරයාට හෝ අධිකාර බලයලත් නිලධාරියෙකුට සහාය නොදැක්වීම වරදක් වන බවට පනතෙහි විධිවිධාන සළසා තිබේ.
- රහස්‍යභාවය නොසළකා, ලිඛිත හෝ ඉලෙක්ට්‍රොනික වාර්තා, පොත්, ලියවිලි හෝ තොරතුරුවලට පිවිසීමේ ඉඩකඩ සළසාලමින් විගණකාධිපතිවරයාගේ බලතල පුළුල් කර ඇත.
- ඕනෑම පුද්ගලයෙකුගේ හෝ ආයතනයක හෝ ගිණුම් විගණනය කර විගණන පිරිවැය අයකර ගැනීමට විගණන ගාස්තුවක් නියම කිරීමට විගණකාධිපතිවරයාට අධිකාර බලය දෙනු ලැබේ.

- විගණකාධිපතිවරයාගේ මතය පරිදි ගනුදෙනුවක් කවර හෝ නීතියකට, රෙගුලාසියකට හෝ රීතියකට පටහැනිව කර තිබීමෙන් එම ගනුදෙනුවට අදාල වුවන්ගේ වංචාව, නොසැලකිල්ල, දූෂණය හෝ විෂමාචාරය හේතුවෙන් අඩුවක් හෝ පාඩුවක් සිදුවන අවස්ථාවකදී හෝ ඇතුළත් කළ යුතු කවර වූ හෝ ගනුදෙනුවක් ගිණුම්වලින් අත්හැර තිබෙන අවස්ථාවකදී එවැනි සියලු ගනුදෙනුවල මූල්‍ය හෝ වෙනත් වටිනාකම, ප්‍රතික්ෂේප කිරීමට විගණකාධිපතිවරයාට හැකි වන්නේය. එවැනි ගනුදෙනුවට අදාල මුළු වටිනාකම අධිභාර කිරීමේ බලතල විගණකාධිපතිවරයාට ලබාදෙනු ලැබේ. එකී ගනුදෙනුවේ වටිනාකම එයට වගකිවයුතු පුද්ගලයන්ගෙන් වෙන් වෙන්ව හෝ සාමූහික වන පරිදි අධිභාර කිරීමට විගණකාධිපතිවරයාට හැකිය.
- අධිභාරයන් පැනවීම සම්බන්ධයෙන් අතෘප්තියට පත් පුද්ගලයෙකුට, එයට එරෙහිව විගණන සේවා කොමිෂන් සභාවට අභියාචනා කිරීමට අයිතිවාසිකම් තිබේ. කොමිෂන් සභාව අවසාන තීරණය ගනු ලැබේ.
- වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා කාලරාමු නියම කිරීම.
- රටේ උත්තරීතර විගණන ආයතනය ලෙස ජාතික විගණන කාර්යාලයක් පිහිටුවනු ලැබේ. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ සියලු විගණන කාර්ය මණ්ඩලය ජාතික විගණන කාර්යාලයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.
- ජාතික විගණන කාර්යාලය විගණනය කිරීමට සුදුසුකම්ලත් ස්වාධීන විගණකවරයෙකු කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන අතර, එම වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.
- මේ පනත මඟින් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම් නියම කරනු ලැබේ.

.

- විගණන හා කළමනාකරණ කමිටුවල පැවැත්ම සහ ඒවායේ සඵල ක්‍රියාකාරීත්වය අවධාරණය කර තිබේ.
- විගණකාධිපතිවරයාට තොරතුරු සපයන පුද්ගලයින්ගේ ආරක්ෂාව තහවුරු කර තිබේ.
- විගණකාධිපතිවරයා විසින් හෝ ඔහුගේ කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකු විසින් අවංක විශ්වාසයෙන් හෝ එකී අදහසින් යුක්තව සිදු කරනු ලබන කිසිදු කටයුත්තකින් හෝ ආඥාපනක්‍රම ව්‍යවස්ථාව යටතේ ඉටු කරනු ලබන පූර්ව නීතිමය කටයුත්තකට එරෙහිව පැනනගින නීතිමය පියවරයන්ගෙන් ඔවුන් නිදහස් කරනු ලැබේ.

අපගේ සංවිධාන සටහන

ජාතික විගණන කාර්යාලයේ ප්‍රධානියා විගණකාධිපතිවරයා වන අතර කාර්යාලයේ මූල්‍යමය කටයුතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියෙකු ලෙසද කටයුතු කරනු ලබයි. ජාතික විගණන කාර්යාලයේ වර්තමාන සංවිධාන ව්‍යුහය මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති කාර්ය මණ්ඩලය හා අනුකූලවන පරිදි එක් එක් මට්ටම්වල රැඳුණු නිශ්චිත නිලධාරීන් සංඛ්‍යාවකින් සැදුම්ලත් ධුරාවලි 4 කින් සමන්විත වේ.

පළමු මට්ටම නියෝජ්‍ය විගණකාධිපතිවරුන් 15 දෙනෙකුගෙන් සමන්විත වන අතර ඔවුන් විසින් රජයේ හා පළාත් සභාවල විගණන කටයුතු සිදු කරනු ලැබේ. දෙවැනි මට්ටම සහකාර විගණකාධිපතිවරුන් 44 දෙනෙකු යටගේ අංශ 44 කින් සමන්විත වේ. එම අංශ 44 භාරව සහකාර විගණකාධිපතිවරුන් 44 දෙනෙකු කටයුතු කරනු ලැබේ. මෙම අංශ ප්‍රධානීන් වෙත පැවරෙන විගණන "ශාඛා" වන්හි ප්‍රධානත්වය "ශාඛා ප්‍රධානී" ලෙස විගණන අධිකාරිවරයෙකු හෝ විගණන පරීක්ෂක සේවයේ ජ්‍යෙෂ්ඨ තම නිලධාරියෙකු විසින් ඉටු කරනු ලබන අතර ඔහුට නිශ්චිත විගණන ආයතන සංඛ්‍යාවක් පවරා ඇත. ඔවුන්

තුන්වන මට්ටමට අයත් වේ. ඒ අනුව නිශ්චිත ලෙස තම අධීක්ෂණයට ගැනෙන විගණන ශාඛා ක්‍රියාත්මක විය යුතු ආකාරය කළමනාකරණය කිරිම හා අධීක්ෂණය පිළිබඳ සම්පූර්ණ වගකීම අංශ ප්‍රධානීන්ට පැවැරේ. ශාඛා ප්‍රධානීන් වෙත අනුයුක්ත කරනු ලැබ ඇති විගණන පරීක්ෂක සේවයේ නිලධාරීන් කාර්යක්ෂව හා ඵලදායිව සේවයේ යොදවා ඔවුන් වෙත පවරා ඇති රාජ්‍ය ආයතනවල විගණනයන් ක්‍රියාත්මක කරවීම අපේක්ෂා කර ඇත.

ඒ අනුව ශාඛා ප්රධානීන්ට සහයවන එම නිලධාරීන් සිව්වන මට්ටමට අයත් වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිති, ව්‍යවස්ථාපිත සහ වෙනත් නීතිමය අවශ්‍යතාවන්ට හා පරිචයන්ට අනුකූල වන පරිදි පරීක්ෂණ, නිරීක්ෂණ සහ ක්ෂේත්‍ර රාජකාරී සිය අනුමත වැඩසටහන්වලට අනුකූල වන පරිදි ඉටු කිරීම මගින් ඔවුන් වෙත පවරා ඇති රාජ්‍ය ආයතනවල ගිණුම් විගණනය ක්‍රියාත්මක කරමින් සිය ශාඛා ප්‍රධානීන්ට සහය වේ. ඉහත සඳහන් දෙවන මට්ටමට අයත්වන අංශ 44 ක අංශ ප්‍රධානීන්ගෙන් අංශ නවයක ප්‍රධානීන් 12 දෙනෙකු පළාත් මට්ටමින් ප්‍රාදේශීය කාර්යාල භාරව කටයුතු කරන අතර ඔවුන්ගේ අධික්ෂණයට නියෝජ්‍ය විගණකාධිපතිවරුන් තිදෙනෙකු කටයුතු කරනු ලබයි.

දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතු අධ්‍යක්ෂ (පාලන) යටතේ වන ආයතන ශාඛාවෙන්ද, මූල්‍ය කටයුතු ප්‍රධාන ගණකාධිකාරී යටතේ ගිණුම් අංශයෙන්ද සිදු කරනු ලබයි.

විගණනය ක්‍රියාත්මක කිරීමට අදාළ සංවිධාන සටහන පහත සඳහන් කර ඇත.


Auditor General
DAG (HUD)
AAG- 5
DAG(TND)
AAG -10
DAG(JPC)
AAG - 5
DAG(MDP)
AAG - 1
DAG(FFP)
AAG - 5
DAG(SIN)
AAG - 2
DAG(CGL)
AAG - 12
DAG(COM)
AAG - 1
DAG(SBE)
AAG- 4
DAG(SOF)
AAG-4
DAG(SPR)
AAG - 3
DAG(ADM)
Chief Accountant
Accountant
MAs
Director (Admin)
AD(Admin)
MAs
DAG(WNS)
AAG - 3
DAG(NNE)
AAG - 3
DAG(USC)
AAG - 3
SAs
AEs

ජාතික විගණන කාර්යාලයේ වගකීම හා කාර්යභාරය පිළිබඳ ඇගැයීමකින් පසු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව 2011 නොවැම්බර් 14 දින අනුමත කර තිබූ කාර්ය මණ්ඩලය අනුව ශ්‍රී ලංකා විගණන සේවයේ මුළු නිලධාරීන් සංඛ්‍යාව 350 ක්ද, විගණන පරීක්ෂක සේවයේ මුළු නිලධාරීන් සංඛ්‍යාව 1200 ක්ද වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහනවවන ව්‍යවස්ථා සංශෝධනය අනුව ස්ථාපිත කළ ශ්‍රී ලංකා විගණන සේවා කොමිෂන් සභාව 2018 ජුලි 27 දින ජාතික විගණන පනත පාර්ලිමේන්තුවේ සම්මත වීමත්, 2018 අගෝස්තු 01 දින අතිගරු ජනාධිපතිතුමා විසින් ගැසට් පත්‍රයේ පළ කළ නිවේදනයකින් ජාතික විගණන පනත බලාත්මක කර තිබුණි. නමුත් ජාතික විගණන කාර්යාලයේ රාජ්‍ය විගණන සේවයක් ස්ථාපිත කිරීමට යෝජිත සේවා ව්‍යවස්ථාව 2019 ඔක්තෝබර් 15 දින වන විටත් නොහැකි වී තිබුණි. ජාතික විගණන කාර්යාලයේ කාර්ය මණ්ඩලය වෙනුවෙන් කෙටුම්පත් කර ඇති සේවා ව්‍යවස්ථාව සම්මත කර ගැනීමට නොහැකි වී ඇති අතර, ඇති වන පුරප්පාඩු පිරවීමට පැරණි සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ද සිදු කර නොතිබුණි.

එම තත්ත්වය යටතේ 2018 වර්ෂය ආරම්භයේ, 2018 වර්ෂය අවසානයට හා 2019 අගෝස්තු 01 දිනට ජාතික විගණන කාර්යාලයේ ඒ ඒ තනතුරුවල පැවැති පුරප්පාඩු සංඛ්‍යාව පහත වගුව 01 හි දැක්වේ.

තනතුර	2018 ජනවාරි 01 දිනට			2018 දෙසැම්බර් 31 දිනට			2019 අගෝස්තු 01 දිනට		
	අනුමත කාර්ය මණ්ඩලය	සත්‍ය කාර්ය මණ්ඩලය	පුරප්පාඩු	අනුමත කාර්ය මණ්ඩලය	සත්‍ය කාර්ය මණ්ඩලය	පුරප්පාඩු	අනුමත කාර්ය මණ්ඩලය	සත්‍ය කාර්ය මණ්ඩලය	පුරප්පාඩු
විගණන කාර්ය මණ්ඩලය									
අතිරේක විගණකාධිපති	3	1	2	3	1	2	3	–	3
නියෝජ්‍ය විගණකාධිපති	15	11	04	15	11	4	15	11	4
සහකාර විගණකාධිපති	44	22	22	44	32	12	44	28	16
විගණන අධිකාරී	288	223	65	288	213	76	288	210	78
විගණන පරීක්ෂක	1200	1137	63	1200	1102	98	1200	1027	173
විගණන නොවන කාර්ය මණ්ඩලය									
අධ්‍යක්ෂ - පරිපාලන	1	1	-	1	1	-	1	1	-
ප්‍රධාන ගණකාධිකාරී	1	1	-	1	1	-	1	1	-
අනෙකුත් මාණ්ඩලික නිලධාරීන්	17	10	7	17	11	6	17	12	5
රාජ්‍ය කළමනාකරණ සහයක සේවාව හා සමාන්තර ශ්‍රේණි	127	98	29	127	115	12	127	115	12
වාර්තා සැකසුම්කරු	48	48	–	42	42	–	42	42	–
කණිෂ්ඨ සේවකයින්	213	184	29	213	185	28	213	204	9
එකතුව	1957	1736	221	1951	1713	238	1951	1651	300

වගුව 01 – කාර්ය මණ්ඩල තත්ත්වය 2018 දෙසැම්බර් 31 දිනට හා 2019 අගෝස්තු 01 දිනට

ඉහත වගුවේ සඳහන් පරිදි 2018 ජනවාරි 01 දින සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ 221 දෙනෙකුගේ සිට 238 ක් දෙනෙකු දක්වා පරාසයක ප්‍රමාණයක කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවැතීම නිසා ජාතික විගණන කාර්යාලය වෙත පැවරි ඇති වගකීම් හා කාර්යභාරය ඉටු කිරීම කෙරෙහි විශාල බාධාවක්ව පැවැතුණි. එසේම 2019 අගෝස්තු 01 දින වන විට එම පුරප්පාඩු සංඛ්‍යාව 300 ක් දක්වා වැඩි වී තිබුණි. තවදුරටත් පුරප්පාඩුව පවතින නියෝජ්‍ය විගණකාධිපති තනතුරු 04 ක්, සහකාර විගණකාධිපති තනතුරු 16 ක් හා විගණන අධිකාරී තනතුරු 78 ක් යෝජිත නව සේවා ව්‍යවස්ථාව සම්මත වීමෙන් පසුව කටයුතු කිරීමට බලාපොරොත්තු වේ. 2018 වර්ෂයේදී විගණන පරීක්ෂකවරුන් බඳවා ගැනීමේ තරඟ විභාගය පවත්වා ඇති අතර, එහි ප්‍රතිඵල 2019 ජූලි 17 දින නිකුත් විය. විගණන සේවා කොමිෂන් සභාවේ බලතල අනුව බඳවා ගැනීම සම්බන්ධයෙන් පැව නැගුණු ගැටළු 2019 ඔක්තෝබර් 15 දින වන විටත් නිරාකරණය වී නොමැත. තාක්ෂණ නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීම සඳහා බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කර විගණන සේවා කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා යොමු කර ඇත. සංචාරක බංගලා භාරකරු තනතුරු පුරප්පාඩු පිරවීමට සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම සඳහා 2019 අගෝස්තු 23 දින විගණන සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇත. අනෙකුත් විගණන නොවන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය දැනුවත් කර ඇත.

සේවා ව්‍යවස්ථාව අනුමත කර ගැනීම

ජාතික විගණන කාර්යාලයේ විගණන කාර්ය මණ්ඩලය ශ්‍රී ලංකා විගණන සේවයේ නිලධාරීන්ගෙන් හා විගණන පරීක්ෂකවරුන්ගෙන් සමන්විත වේ. එවකට පැවති තත්ත්වය අනුව, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 අනුව මෙම සේවාවන් දෙක සඳහා වෙන වෙනම සේවා ව්‍යවස්ථාවන් පිළියෙල කරනු ලැබුවත්, ඒ වෙනුවෙන් කාර්ය මණ්ඩලයෙන් වූ විවිධ යෝජනා හා ඉල්ලීම් පිළිබඳව තවදුරටත් සලකා බැලීම සඳහා ජනාධිපති ලේකම්වරයා විසින් කමිටුවක් පත් කරන ලදී. එම කමිටුව එවකට හිටපු විගණකාධිපතිවරයාගේ සභාපතිත්වයෙන්, හිටපු විගණකාධිපතිවරුන් දෙදෙනෙකු හා ජනාධිපති අතිරේක ලේකම්වරයෙකුගේ සාමාජිකත්වයෙන් සමන්විත විය. එම කමිටුවේ නිර්දේශ සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා විගණන සේවය හා විගණන පරීක්ෂක සේවය යන සේවාවන් දෙක ඒකාබද්ධ කර "ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය" නමින් නව සේවයක් ඇති කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2014 දෙසැම්බර් 23 දින අනුමැතිය ලබාදී තිබුණි.

එම අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ශ්‍රී ලංකා විගණන සේවය හා විගණන පරීක්ෂක සේවය ඒකාබද්ධ කර, ස්ථාපනය කිරීමට යෝජනා කර තිබූ "ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය" පිහිටුවීම රජය ප්‍රතිපත්තියක් ලෙස පිළිගෙන තිබුණි. ඒ අනුව නව සේවාව සඳහා සේවා ව්‍යවස්ථාවක් පිළියෙල කෙරෙමින් පවතින අතර 2018 අංක 19 දරන ජාතික විගණන පනත සම්මතවීමෙන් පසු විගණන සේවා කොමිෂන් සභාව විසින් එය අනුමත කර ගැනිමේ කාර්යයෙහි නියැලී ඇත. නව සේවා ව්‍යවස්ථාව සම්මත කිරීම තුළින් විගණකාධිපතිවරයා වෙත පැවරෙන කාර්යයන් හා කර්තව්‍යන් වඩාත් කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා වඩාත් පුළුල් වෘත්තීය මට්ටමේ කාර්ය මණ්ඩල පවත්වා ගැනීමට අවස්ථාව සැලසෙනු ඇත. එසේම, නව සේවාවේ පත්වීම් හා විනය බලධාරියා විගණන සේවා කොමිෂන් සභාව බැවින් ප්‍රමාදයකින් තොරව එම කටයුතු ඉටු කිරීමට හැකිවීම ජාතික විගණන කාර්යාලයේ කාර්යසාධනය ඉහළ නැංවීමට පිටිවහලක් වනු ඇත.

කාර්ය මණ්ඩල පුහුණුව

රාජ්‍ය සම්පත් ආර්ථිකව, කාර්යක්ෂමව හා ඵලදායි ලෙස භාවිතා කිරීම ශක්තිමත් කිරීමට අවශ්‍ය දායකත්වය හා මගපෙන්වීම ලබාදීම තුළින් ශ්‍රී ලාංකික ජාතියට ගුණාත්මක හා විශ්වාසනීය රාජ්‍ය සේවාවක් සැලසීම තහවුරු කිරීම පිණිස ජාතික විගණන කාර්යාලය විසින් රාජ්‍ය ආයතනවල මූල්‍ය හා කාර්යසාධන කාර්යභාරයන් ඉටුකිරීම පිළිබඳ ගණන්දීමේ වගකීම නිවැරදි ලෙස ඉටුකර තිබේද යන්න පරීක්ෂා කර පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලබයි.

මෙම ව්‍යවස්ථාපිත කාර්යභාරය ඉටු කිරීම උදෙසා විගණන නිලධාරීන් 1,385 ක් හා සහයක සේවාවන්වලට අයත් නිලධාරීන් 355 කින් සමන්විත කාර්ය මණ්ඩලයක දායකත්වය වර්තමානයේ ජාතික විගණන කාර්යාලය විසින් ලබා ගනී.

ව්‍යවස්ථාපිත කාර්යභාරය කාර්යක්ෂමව හා ඵලදායි ලෙස ඉටුකිරීම පිණිස ජාතික විගණන කාර්යාල කාර්ය මණ්ඩලය වර්තමානයට සරිලන ලෙස දැනුමෙන් හා කුසලතාවයෙන් සන්නද්ධ කිරීම අත්‍යවශ්‍ය සාධකයක් වී තිබේ. එම අරමුණ සාක්ෂාත් කර ගැනීමේ අපේක්ෂාවෙන් යුක්තව ජාතික විගණන කාර්යාලයේ සෑම නිලධාරියෙකු විසින්ම අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය (Continuous Professional Development – CPD) සඳහා වර්ෂයකට පැය 80 කට නොඅඩු දේශීය හෝ විදේශීය පුහුණු පාඨමාලා සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කර තිබේ.

ඒ සඳහා නිලධාරීන්ට ඔවුන්ගේ අවශ්‍යතාවයට ගැලපෙන පරිදි දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් ජාතික විගණන කාර්යාලයේ පුහුණු අංශය විසින් සංවිධානය කිරීමටත්, ඒ සඳහා ඔවුන්ට අවශ්‍ය සහාය ලබා දෙමින් ඔවුන්ව දිරිගැන්වීමටත් කටයුතු කරනු ලැබේ. එහිදී සම්පත් දායකයන් ලෙස ජාතික විගණන කාර්යාලයේ සේවයේ යෙදී සිටින සුදුසුකම් සහිත දක්ෂ නිලධාරීන්ගේ සහය මෙන්ම බාහිර දේශකවරුන්ගේ සහයද ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. පුහුණු වැඩසටහන් සඳහා දේශන, සාකච්ඡා, ප්‍රායෝගික පුහුණුව හා ක්ෂේත්‍ර චාරිකා ආදිය යොදා ගැනීම තුළින් පහත සඳහන් අරමුණු සාක්ෂාත් කරගැනීමට අපේක්ෂා කරනු ලැබේ.

- නිලධාරීන්ගේ දැනුම හා තාක්ෂණික කුසලතා සංවර්ධනය
- නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය සහ කාර්යසාධනය ඉහළ නැංවීම
- නිලධාරීන්ගේ කළමණාකරන හැකියාවන් වර්ධනය
- රාජකාරී ඉටුකිරීමෙහිලා අවශ්‍ය වන දැනුම, මෙවලම් හා ශිල්පීය ඥානය ලබාදීම
- මූල්‍යමය සහ සේවා නීති සම්බන්ධ දැනුම ලබාදීම
- කණ්ඩායම් හැඟීම වර්ධනය කිරීම
- නිලධාරීන්ගේ යහපත් ආකල්ප වර්ධනය කිරීම

දේශීය වශයෙන් පුහුණුව ලබා දීම

ඉහත අරමුණු සපුරාගැනීම උදෙසා 2018 වර්ෂයේදී ජාතික විගණන කාර්යාලයේ පුහුණු අංශය මගින් සියළුම විගණන නිලධාරීන් ආවරණය වන පරිදි මාතෘකා 15 ක් යටතේ පුහුණු වැඩසටහන් 51 ක් පවත්වා ඇති අතර විගණන නොවන කාර්යමණ්ඩලයේ නිලධාරීන් සඳහාද පුහුණු පහසුකම් ලබා දී තිබේ.

විදේශීය පුහුණුවීම්

සියළුම විගණන නිලධාරීන් සඳහා කාර්යසාධන විගණනය පිළිබඳව විදේශ පුහුණුව ලබා දීමේ අරමුණින් ආරම්භ කරන ලද මැලේසියානු කාර්යසාධන විගණන පුහුණු වැඩමුළුව සඳහා සමාලෝචිත වර්ෂයේදී ද නිලධාරීන් 462 ක් සහභාගී කරන ලදී.

වෙනත් මාතෘකා 9 ක් ආවරණය වන පරිදි විගණන නිලධාරීන් 24 දෙනෙකු විදේශ පුහුණු වැඩසටහන් 23 කට සහභාගී කර ඇත.

සමාලෝචිත වර්ෂයේදී ජාතික විගණන කාර්යාලයේ නිලධාරීන් සහභාගී වූ දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් පිළිබඳව විස්තර පහත වගුව 02 හි දක්වා ඇත.

	වැඩසටහන් විස්තරය	වැඩසටහන් ගණන	සහභාගී වූ නිලධාරීන්					පුහුණු පැය ගණන
			අංශ ප්‍රධානීන්	විගණන අධිකාරී	විගණන පරීක්ෂක	විගණන නොවන නිලධාරීන්	එකතුව	
	දේශීය පුහුණුවැඩසටහන්							
1	මූල්‍ය විගණන	1	-	8	35	-	43	312
2	කාර්යසාධන විගණන	2	-	0	75		75	2,175
3	පරිසර විගණන	1	-	4	28	-	32	232
4	ප්‍රසම්පාදන සහ ඉදිකිරීම් විගණන	4	11	78	633	-	722	16,858
5	විමර්ශණ විගණන පුහුණුව	2	-	5	71	-	76	2,523
6	විසර්ජන ගිණුම් විගණන	7	12	144	542	-	698	10,121
7	වෝහාරික විගණන	3	4	32	43	-	79	1,871
8	පරිගණක	8	1	14	204	-	219	4,815
9	බදුකරණය	3	43	199	737	-	979	14,196
10	ධනාත්මක චින්තන සංවර්ධනය	13	42	212	1131	-	1,385	84,092
11	විදේශ අරමුදල් ව්‍යාපෘති විගණන	1	-	6	34	-	40	290
12	විදේශ දූතමණ්ඩල පිලිබඳ විගණන	1	10	66	262	-	338	2,450
13	මෝටර් රථ යාන්ත්‍රීකරණ	2	2	17	78	-	97	2,661
14	සංවර්ධන කාර්යයන් සඳහා ඉඩම් අත්පත් කර ගැනීම	1	-	7	38	-	45	326
15	වෙනත්	2	2	3	5	-	10	189
16	විගණන නොවන නිළධාරීන් සඳහා පුහුණු වැඩසටන්	2	-	-	-	374	374	2,712
	එකතුව	55					5,212	145,823
	විදේශිය පුහුණු වැඩසටහන්							
1	කාර්යසාධන විගණන	6	8	80	374		462	40,194
2	තිරසාර සංවර්ධන අරමුණු	2	1	3	1		5	167
3	තොරතුරු තාක්ෂණ පුහුණුව	3	1	1	2		4	508
4	ASSOSAI / SAI පුහුණු වැඩසටහන් සහ වෙනත් රැස්වීම්	8	5	5	1			348
	i. 18th Meeting INTOSAI WGEA -							

	Indonesia						
	ii. 14th ASOSAI - Assembly						
	iii. SAI's - Workshop for Engaging with Stakeholders					11	
	iv. SAI - Peer Review Conference						
	v. Annual Meeting of the WGPD						
	vi. Asian Evaluation Week						
	vii. Integrity Seminar						
	viii. IPSASB Stategy Roundtable & Capacity Building Forum						
5	රාජ්‍ය විගණන කළමණාකරන	2	1	1	1	3	471.75
6	රජයේ ගිණුම්කරණ හා මූල්‍ය කළමණාකරන	3		1	2	3	217.5
7	ඉදිකිරීම් කළමණාකරන	1		1		1	145
8	සංවර්ධනය වන රටවල් සඳහා මූල්‍ය හා ආර්ථික පරිපාලන	4		4		4	348
9	පශ්වාත් උපාධි	1		1		1	
10	පරිසර විගණන	1		1	2	3	65.25
	එකතුව	**31**				**497**	**42,464**



සුදුසුකම්ලත් විගණකවරුන් සේවයේ යොදවා ගැනීම

පවතින පුරප්පාඩු හේතුවෙන් වූ සම්පත්වල පරතරය පියවා ගැනීම සඳහා රාජ්‍ය බැංකු විගණනය වැනි විශේෂ අවස්ථාවලදී මෙන්ම අවශ්‍යවන විශේෂිත සේවා සඳහාද සුදුසුකම්ලත් විගණකවරුන් සේවයෙහි යොදවා ගැනීමට අවශ්‍ය විය. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාව ප්‍රකාරව සුදුසුකම්ලත් විගණකවරුන් සේවයේ යොදා ගැනීමට විගණකාධිපතිවරයාට බලය පවරා ඇත.

මුදල් අමාත්‍යාංශය, විගණිත ආයතනය, අදාළ අමාත්‍යාංශය හා විගණන සමාගමේ නියෝජිතයන්ද ඇතුළත් වන පරිදි දෙපාර්තමේන්තුවේ විගණන ගාස්තු කමිටුවේ අනුමැතිය මත අදාළ විගණිත සමාගම්වලට ඔවුන් සපයන ලද විගණන සේවා වෙනුවෙන් 2018 හා 2017 වර්ෂ වෙනුවෙන් පිළිවෙලින් රු.මිලියන 33.85 ක් හා රු.මිලියන 43.38 ක් වශයෙන් ගෙවීමට නියමිතව ඇත. සුදුසුකම්ලත් විගණකවරුන්ගේ සේවය ලබා ගැනීමේදී ඔවුන් විසින් පෙර සපයා තිබුණු සේවාවන්ගේ තත්ත්වය, සමාගමේ සිටින හවුල්කරුවන් සංඛ්‍යාව සහ ඔවුන් සමඟ සේවයේ යෙදී සිටින විගණන පුහුණුවන්නන් සංඛ්‍යාව යනාදි සාධක සලකා බලන ලදී. මීට අමතරව, සමාගමේ ප්‍රමිතිය දැක්වීමේ කරුණක් වශයෙන් ඔවුන්ගේ ජාත්‍යන්තර සම්බන්ධතාවය හා ඔවුන් සලසන වෘත්තීය සේවාවන්වල තත්ත්වය ආදී කරුණු ඔවුන් තෝරා ගැනීමේ නිර්ණායකයන්ට ඇතුළත් වී තිබුණි.

සාමාන්‍යයෙන් එක් විගණන සමාගමකට උපරිම වර්ෂ 05 ක කාලයක් සඳහා අඛණ්ඩව එක් විගණන කාර්යභාරයක් පවරනු ලැබේ.

ප්‍රධාන රාජ්‍ය වාණිජ බැංකු 02 ක් සහ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් විගණකාධිපතිගේ විෂය පථයට ඇතුළත් වූ සියයට 50 ක් හෝ ඊට වැඩි රාජ්‍ය අයිතිය ඇති සමාගම් ඇතුළත්ව 2018 හා 2017 වර්ෂවලදී පිළිවෙලින් ආයතන 76 ක් හා 72 ක් විගණනය කිරීම සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින විගණන සමාගම් පිළිවෙලින් 23 ක් හා 27 ක් මට සහය විය. නවක විගණන පරීක්ෂකවරුන් බඳවා ගැනීම නිසා දෙපාර්තමේන්තුව විසින් අදාල සමාගම් සෘජු විගණනයට භාජනය කිරීම සහ ප්‍රධාන වාණිජ බැංකු දෙකක ශාඛාවන් විගණනය කිරීම සඳහා සුදුසුකම්ලත් විගණකවරුන් පත් නොකිරීමට ගත් තීරණ හේතුවෙන් 2017 වර්ෂයේ සිට යොදවා ගත් සහය විගණන සමාගම් ප්‍රමාණය අඩු වී තිබුණි.

පාර්ලිමේන්තුවට සහාය වීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය මූල්‍ය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතුය. රාජ්‍ය ගණන්දීමේ වගකීම් පද්ධතිය පිළිබඳ ප්‍රධාන දායකත්වයක් සලසන ජාතික විගණන කාර්යාලය විසින්, මූල්‍ය භාරකාරත්වය හා රාජ්‍ය ආයතනවල මෙහෙයුම්හි ආර්ථිකභාවය, කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය පිළිබඳ සෘජුවම පාර්ලිමේන්තුවට වාර්තා කරන රජයේ බාහිර විගණක ලෙස කටයුතු කරයි. පාර්ලිමේන්තු ස්ථාවර නියෝග 120 හා 121 යටතේ ස්ථාපිත පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව හා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වශයෙන් හඳුන්වන පාර්ලිමේන්තු කාරක සභා මගින් විගණකාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුවේ සභාගත කරන වාර්තා පරීක්ෂා කරනු ලැබේ. මෙම කාරක සභා දෙකෙහි කාර්ය භාරය වනුයේ රාජ්‍ය ගිණුම් පරීක්ෂා කිරීම මඟින් රාජ්‍ය අරමුදල් හා සම්පත් නිසියාකාරව භාවිත කෙරේද යන්න පිළිබඳව පරීක්ෂා කිරීමට ව්‍යවස්ථාදායකයට සහාය වීමයි. එබැවින් රාජ්‍ය අංශයේ ගණන්දීමේ වගකීම හා ඵලදායී පාලනය තහවුරු කර ගැනීම සඳහා ඉතා වැදගත් කාර්ය භාරයක් මෙම කමිටු දෙක මඟින් සිදු කරනු ලැබේ. ඉතා සරලාකාරයෙන් බැලූ විට රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව,

සමාගමක හෝ රාජ්‍ය ව්‍යවසායක ඇති විගණන කමිටුවක සමානතාවයක් දක්වයි.

ස්ථාවර නියෝග 121 ප්‍රකාරව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ කාර්ය වනුයේ රාජ්‍ය වියදම් දැරිම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් වෙන් කරනු ලැබූ මුදල් යෙදවූ ආකාරය දැක්වෙන ගිණුම්, පාර්ලිමේන්තුව ඉදිරියේ තබන ලද අනෙකුත් ගිණුම්වලින් කාරක සභාව සුදුසුයැයි සලකන ගිණුම් සහ ඒ ගිණුම් පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තා ද පරික්ෂාවට ලක් කිරිම වේ.පොදුවේ කිසියම් දෙපාර්තමේන්තුවක හෝ පළාත් පාලන ආයතනයක ගිණුම්, මූල්‍යයනයන්, මූල්‍ය පරිපාටි, කාර්යසාධනය සහ කළමණාකරනය පරීක්ෂා කිරිම හා ඉන් පැන නගින ඕනෑම කරුණක් පිළිබඳව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට කලින් කලට වාර්තා කරනු ලැබේ.

ස්ථාවර නියෝග 120 යටතේ පැත්තා වූ වෙළඳහිටුවන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කාර්යභාරය වනුයේ රාජ්‍ය සංස්ථාවක හෝ කිසියම් ලිඛිත නිතියක් යටතේ ආණ්ඩුවට පැවැරි ඇත්තාවූද වෙළෙඳ හෝ වෙනත් ව්‍යාපාරයක ගිණුම් හා ඒ ගිණුම් පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාද පරීක්ෂා කිරීමය. කවර හෝ රාජ්‍ය සංස්ථාවක හෝ කිසියම් ලිඛිත නීතියක් යටතේ ආණ්ඩුවට පැවරී ඇත්තා වූ වෙළඳ හෝ වෙනත් ව්‍යාපාරයක පරීක්ෂාවට භාජනය කරන ලද ගිණුම්, අයවැය හා වාර්ෂික ඇස්තමේන්තු, මුදල් තත්ත්වයන්, මුදල් කටයුතු පිළිබඳ කාර්ය පරිපාටි හා සාමාන්‍ය කළමනාකාරීත්වය හා ඒ අනුව පැන නගින කවර හෝ කරුණක් පිළිබඳව කාරක සභාව විසින් කලින් කලට පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුය. කාරක සභාවට අවශ්‍ය යැයි හැඟී ගිය විටක කාරක සභාවේම සාමාජිකයන්ගෙන් සමන්විත අනුකාරක සභා පත් කිරීම සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට මෙන්ම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවටද හැකියාව පවතින අතර, කාරක සභාවට මෙන්ම එහි අනුකාරක සභාවලටත් එයට අයත් කාර්යයන් ඉටු කිරීම පිණිස කවර හෝ පුද්ගලයෙකු කැඳවා ප්‍රශ්න කිරීමේ බලයත්, කවර හෝ ලිපියක්, පොතක්, ලේඛනයක් හෝ වෙනයම් ලියවිල්ලක් ගෙන්වා පරීක්ෂා කිරීමේ බලයත්, ගබඩාවලට සහ වෙනත් දේපලවලට පිවිසීමේ බලයත් පවතී.

පාර්ලිමේන්තුවේ පාලක පක්ෂය හා විරුද්ධ පක්ෂය විධිමත්ව නියෝජනය වන පරිදි තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන මන්ත්‍රීන් 16 දෙනෙකුගෙන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සමන්විත වේ. විපක්ෂය නියෝජනය වන මන්ත්‍රීවරයෙකු සභාපති විය යුතුය යන පදනම මත තේරීම් කාරක සභාව විසින් පත්කරනු ලබන සභාපතිවරයෙකු හා මන්ත්‍රිවරුන් 11 දෙනෙකුගෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව සමන්විත වේ. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව යන සභා දෙකෙහි පරීක්ෂා කිරීම්වලින් අනතුරුව ඒවායේ නිර්දේශ විධායකය පිළිගනු ලැබුවේද යන්න පමණක් නොව එම නිර්දේශ ඵලදායීව හා සම්පූර්ණ ලෙස ක්‍රියාත්මක කෙරේ ද, වඩාත් වැදගත් ලෙස මූල්‍ය කාර්යක්ෂමතාවය හා සේවා ගුණාත්මක තත්ත්වය පිළිබඳ ධනාත්මක වෙනසක් සිදු කළේ ද යන්න පරීක්ෂා කිරිම සහ ක්‍රියාත්මක කිරීම් ක්‍රියාවලිය පිළිබඳව කමිටුවලට ආපසු වාර්තා කිරීමද විගණකාධිපතිවරයාගේ කාර්යභාරයට ඇතුළත් වේ.

විගණකාධිපතිවරයා හෝ ඔහුගේ නියෝජිතයින් විසින් විශේෂයෙන් විගණනයන් සඳහා සෘජුවම සම්බන්ධ නිලධාරීන් සමඟ කමිටුවලට සහාය වේ. කමිටුවල කටයුතුවලට සහාය වීම තුළින් විගණකාධිපතිවරයා ඉතා වැදගත් කාර්යභාරයක් සිදු කරන අතර සමාලෝචිත කරුණු පිළිබඳව අවශ්‍ය සියලු තොරතුරු හා මතයන් ප්‍රකාශ කරමින් කමිටු වලට සහාය වේ.

විගණකාධිපතිවරයාගේ කාර්ය භාරය වනුයේ පසුබිම් තොරතුරු සැපයීම හා සලකා බලන විෂය පිළිබඳ අදාළ අදහස් දැක්වීම මඟින් කමිටුවට සහාය වීමයි. කාරක සභා

පරීක්ෂාවේ දී තොරතුරු ලබා දීම හා කමිටුවට අදහස් දැක්වීම හා කමිටු සාමාජිකයන්ගෙන් පැන නගින ප්‍රශ්නවලට පිළිතුරු දැක්වීම ද විගණකාධිපතිවරයාගෙන් අපේක්ෂා කෙරේ. ඇසිය හැකි ප්‍රශ්න කිරීම් පිළිබඳ ක්‍රියාපරිපටියක් හෝ කිසියම් සාකච්ඡා කළ යුතු ගැටළු පිළිබඳ පසුබිම් තොරතුරු විගණකාධිපතිවරයා යෝජනා කරයි.

විගණකාධිපතිවරයාගේ වාර්තාව පදනම් කරගෙන අදාළ රාජ්‍ය ආයතනයේ මෙහෙයුම් පිළිබඳ කාර්ය සාධනය පරීක්ෂා කිරීම සඳහා අදාළ රාජ්‍ය ආයතනයට සාමාන්‍යයෙන් මාසයක කාලයක් කමිටුව විසින් ලබා දේ. කමිටුවේ සාකච්ඡා කිරීම සඳහා කෙටි සාකච්ඡා සටහනක් පිළියෙල කිරීම සඳහා විගණකාධිපතිවරයාට හැකිවන පරිදි ප්‍රතිචාරයක් ලිඛිතව විගණිත ආයතනය විසින් පිළියෙල කළ යුතුය. විගණකාධිපතිවරයාගේ වාර්තාවේ ඇතුළත් නිර්දේශ විගණිත ආයතනය විසින් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳ තොරතුරුවල සාධාරණ බව තහවුරු කර ගැනීම සඳහා විගණිත ආයතනයේ සියලු ලිඛිත ප්‍රතිචාර ජාතික විගණන කාර්යාලය විසින් සමාලෝචනය කෙරේ. සමාලෝචනය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, අදාළ ප්‍රධාන ගණන්දීමේ නිලධාරී, ගණන්දීමේ නිලධාරී හෝ පාලක මණ්ඩලය විසින් සිදු කරන අදහස් දැක්වීම් හා නිරීක්ෂණ සැලකිල්ලට ගෙන විගණන වාර්තාව මඟින් පාර්ලිමේන්තුවට වාර්තා කරන ලද වැදගත් විගණන නිරීක්ෂණ පිළිබඳව කෙටි සාකච්ඡා සටහනක් ජාතික විගණන කාර්යාලය විසින් පිළියෙල කරනු ලබයි. එබැවින් කමිටු සාමාජිකයන්ට එම විගණන නිරීක්ෂණ මගින් විගණිත ආයතනයේ වර්තමාන තත්ත්වය පිළිබඳ මැනවින් අවබෝධයක් ලබා දේ. තවද, පෙර පවත්වන ලද රැස්වීම් වලදී ලබා දී ඇති නියෝග ක්‍රියාත්මක කිරීමේ කාර්යසාධනයත් එම සාකච්ඡා සටහනේ වෙනම ඇතුළත් කෙරේ.

2018 වර්ෂය තුළදී රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ආයතන 20 ක් පරීක්ෂා කිරීම සඳහා කමිටු සභාවාර 22 ක් හා කාර්යසාධන වාර්තා සම්බන්ධයෙන් ආයතන 04 ක් පරීක්ෂා කිරීම සඳහා කමිටු සභාවාර 05 ක් පවත්වා ඇති අතර පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ආයතන 28 ක් පරීක්ෂා කිරීම සඳහා කමිටු සභා වාර 30 ක් පවත්වා ඇත.

විශේෂයෙන් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා පළාත් පාලන ආයතන ඇගයීම සඳහා තොරතුරු තාක්ෂණය පදනම් කරගත් ප්‍රශ්නමාලාවක් පිළියෙල කිරීම සඳහා ජාතික විගණන කාර්යාලයේ නිලධාරින් විසින් රාජ්‍ය ගිණුම් කාරක සභාවට සහාය වී ඇත. එක් එක් හා සියලු ආයතන විසින් තම නිරවද්‍යතාවය තහවුරු කිරීම් සඳහා දෙන ලද පිළිතුරුවල වලංගුභාවය තහවුරු කිරීම මගින් විගණන නිලධාරින් තවදුරටත් කමිටුවට සහාය වේ.

විගණකාධිපති විසින් පනවන ලද අධිභාර

ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන 341 ක් පවතින අතර, මහා නගර සභා 24 ක්, නගර සභා 41 ක් හා ප්‍රාදේශීය සභා 276 ක් ඊට අයත් විය. මෙම පළාත් පාලන ආයතන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා අදාළ ආඥාපනත් සහ පනත්වල විධිවිධාන පරිදි විගණකාධිපති විසින් විගණනය කරනු ලැබේ.

එකී ආඥා පනත් සහ පනත්වලින්, නීතියට පටහැනි ගෙවීම් විෂයයන්, නොසැලකිල්ල හෝ විෂමාචාරය නිසා සිදුවූ පාඩු සහ ගිණුම්වල දැක්විය යුතු නමුත් දක්වා නැති විෂයයන් අධිභාර කිරීම සඳහා විගණකාධිපති වෙත බලය පවරා ඇත.

එකී බලය අනුව 2008 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වර්ෂ 11 ක කාලපරිච්ඡේදය තුළ පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් පාර්ශවකරුවන් 652 ක් වෙනුවෙන් රු.මිලියන 55.56 ක අධිභාර සහතික 90 ක් නිකුත් කර තිබුණි. 2019 අගෝස්තු 25 දින වන විට ඉන් රු.මිලියන 6.21 ක් හෙවත් සියයට 11 ක්

පමණක් අයකර තිබුණි. අදාළ බලධාරීන් විසින් අධිභාර අයකර ගැනීමේ ක්‍රියාවලිය කෙරෙහි නිසි අවධානයක් යොමු කර නොතිබුණි.

කාර්යසාධන විගණනය හා පාරිසරික විගණනය

ප්‍රධාන විගණන නිරීක්ෂණ

සත්වෝද්‍යානයේ සතුන් රෝගාබාධවලට ලක්වීම

එළවළු හා පළතුරු පශු අස්වනු හානිය

පොලිස් ත්‍යාග අරමුදලේ අරමුණු ඉටු නොවීම

කාලගුණ දෙපාර්තමේන්තුවේ රේඩාර් උපකරණ අළුත්වැඩියාව සඳහා කාල පමාවන් සිදු කිරිම

ශිෂ්‍ය සංඛ්‍යාව අවම පාසල්වල කාර්යසාධනය

තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමේ සමස්ථ කාර්යසාධනය අවම වීම.

ලක්විජය බලාගාරයේ මෙහයුම් කටයුතු නිසා පරිසර බලපෑම

කැලණි ගඟේ ජල දූෂණය

විගණකාධිපතිවරයා විසින් සිදු කරනු ලබන කාර්යසාධන හා පරිසර විගණනය

රාජ්‍ය ආයතනයක, වැඩසටහනක, ව්‍යාපෘතියක හා වියදම් ඒකකයක තෝරාගත් ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් රාජ්‍ය ආයතනයන්ගේ කටයුතුවල ආර්ථිකබව, කාර්යක්ෂමබව, ඵලදායීබව හා පාරිසරික බලපෑමද ඇගයීමට ලක්කර අදාළ විගණන නිරීක්ෂණ අනුව සිදු කළ යුතු වැඩිදියුණු කිරීම් සම්බන්ධයෙන් නිර්දේශයන් ඇතුළත්ව වාර්තා කිරීම කාර්යසාධන විගණනය මගින් සිදු කරනු ලැබේ.

රාජ්‍ය ආයතනවල විවිධ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් වෙනත් විගණන ශාඛාවලින් ඉදිරිපත් කරනු ලබන යෝජනා, මෙම කාර්යසාධන හා පරිසර විගණන ඒකකය මගින් තෝරා ගනු ලබන ආර්ථික, සමාජීය හා පාරිසරික බලපෑම් ඇති විශේෂ ක්ෂේත්‍ර ඔස්සේ කාර්යසාධන හා පරිසර විගණනයන් සිදු කරනු ලැබේ. තවද මූල්‍ය විගණන වාර්තාවන්ට අමතරව ඉදිරිපත් කරනු ලබන කාර්යසාධන හා පරිසර විගණන වාර්තාවන්ද පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ. මෙම ක්ෂේත්‍රයට අදාළ ජාතික විගණන කාර්යාලයේ නිලධාරීන් පුහුණු කිරීමද සිදු කරනු ලැබේ.

කාර්යසාධන විගණනය ක්‍රියාත්මක කිරීමෙහිලා කාර්යඵල පදනම් කරගත් අයවැය ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම හා එක් එක් ආයතනය සඳහා ප්‍රධාන කාර්යසාධන දර්ශක (Key Performance Indicators) නිශ්චය කිරීම ඉතා වැදගත් වන නමුත් ශ්‍රී ලංකාවේ දැනට කාර්යඵලය පදනම් කරගත් අයවැය ක්‍රමයක් හා කාර්යසාධන දර්ශක නිශ්චය කර ක්‍රියාත්මක කරනු නොලැබේ. මේ හේතුවෙන් එක් එක් ක්ෂේත්‍රයන්ට අදාළව කාර්යසාධන දර්ශක අප විසින් නිශ්චය කර කාර්යසාධන විගණනය ක්‍රියාත්මක කරනු ලබයි. සමාලෝචිත වර්ෂයේදී සිදුකරන ලද බාහිරින් පැමිණෙන සතුන් කා දැමීම, සැපයුම්කරුවන් විසින් සතුන්ගේ ආහාර

කාර්යසාධන විගණනවලදී අනාවරණය වූ වැදගත් නිරීක්ෂණ සාරාංශ කර පහත දැක්වේ.

කාර්යසාධන විගණනය

සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදල සත්ව සුභසාධනය සඳහා උපයෝජනය කරන්නේද යන්න ඇගයීම

වන සත්ව එකතුවක් ලෙස තබා ගනිමින් 1920 දශකයේ මුල් භාගයේ ආරම්භ කර 1936 ජුලි 01 වන දින රජයට පවරාගන්නා ලද දෙහිවල සත්වෝද්‍යානය 1946 දී ස්වාධීන රාජ්‍ය දෙපාර්තමේන්තුවක් ලෙස ස්ථාපිත කර තිබුණි. ඉන් පසු ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ පාලනය හා කළමණාකරණය 1982 අංක 41 දරන ජාතික සත්වෝද්‍යාන පනතේ විධිවිධාන යටතේ ක්‍රියාත්මක වේ. ආසියාවේ පැරණිතම සත්වෝද්‍යානයක් වන දෙහිවල සත්වෝද්‍යානයට අමතරව පින්නවල අලි අනාථාගාරය, පින්නවල සත්වෝද්‍යානය, හම්බන්තොට සෆාරි උද්‍යානය සහ ගෝනපොල සත්ව ආහාර ගොවිපොළ සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් වේ.

මෙම විගණනයේ අරමුණ වූයේ සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදල සත්ව සුභසාධනය සඳහා උපයෝජනය කරන්නේද යන්න ඇගයීම වේ. මෙම විගණනයේ මූලික නිරීක්ෂණයන් අතර, බොහෝ අවස්ථාවන්හිදී නියමිත වේලාව වනවිට සතුන්ට ආහාර නොලැබීම, සතුන්ට දමන ආහාර

වෙනුවෙන් කොළ අතු සැපයීමේදී ඒවායේ සැලැකිය යුතු ප්‍රමාණයක් ඉපල් ඇතුළත් වීම

නිසා කොළ අතුවල බර අඩුවන අවස්ථා දක්නට ලැබුණි. විස්තර රූපසටහන 01 හි දක්වේ.

රූපසටහන 01 - දෙහිවල සත්වෝද්‍යානයේ සතුන්ට ලබාදීමෙන් පසු ඉතිරි වූ කොළ අතු ඉපල්

හිඟවූ ආහාර ප්‍රමාණය සම්පූර්ණ කර ගැනීම සඳහා ක්‍රමවේදයක් නොතිබුණු අතර අලින් සඳහා ලබාදෙනු ලබන ආහාර ඔවුන්ගේ බරෙහි වෙනස අනුව වෙනස් කළ යුතුව තිබුණත්, ඒ සඳහා වන බර මැනීමක් සිදුකර නොතිබුණි.

2016 හා 2017 වර්ෂ දෙක තුළදී ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් සත්වෝද්‍යානවල සතුන් 328 ක් විවිධ රෝගාබාධවලට ලක්වී මිය ගොස් තිබුණි. ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් සත්වෝද්‍යානවල සතුන්ගේ සෞඛ්‍ය ආරක්ෂාව කෙරෙහි අවධානය යොමු කර නොතිබුණු අවස්ථා කිහිපයක් පහත දක්වා ඇත.

- නිරෝධායන පහසුකම් ප්‍රමාණවත් නොවීම
- සතුන් එක් ස්ථානයකින් තවත් ස්ථානයකට මාරු කිරීමේදී පශු වෛද්‍ය උපදෙස් අනුව කටයුතු කර නොතිබුණු අවස්ථා පැවතීම
- අලින් සහ ඇතුන් සඳහා ප්‍රතිකාර ලබාදීමේදී එම ප්‍රතිකාරයන් අඛණ්ඩව සිදු වී නොතිබීම
- සතුන්ට පහසුවෙන් ප්‍රතිකාර කිරීම සඳහා සතුන් රඳවනයන් (Crush) ප්‍රමාණවත් නොවීම

සතුන්ට ස්වාභාවික හැසිරීම් රටාවන් ප්‍රදර්ශනය කළ හැකි වන පරිදි වාසස්ථානයන් නිර්මාණය විය යුතු වුවද, දෙහිවල සත්වෝද්‍යානයේ ඇතැම් සතුන්ට ප්‍රමාණවත් ඉඩකඩක් නොතිබුණු අතර, ප්‍රමාණවත් සෙවණ කළමනාකරණයක්ද කර නොතිබුණි. එයට අමතරව ඇතැම් සතුන්ට සහකරුවන් හා සහකාරියන් නොමැති අවස්ථාද අනාවරණය විය. දෙහිවල සත්වෝද්‍යානය හා පින්නවල අලි අනාථාගාරයෙහි අපවිත්‍ර ජලය නිසි පරිදි බැහැර වන ආකාරයට ඉදිකිරීම් සිදුකර නොතිබුණි. විස්තර රූපසටහන 02 හා 03 හි දැක්වේ.

දෙහිවල සත්වෝද්‍යානයේ සත්ව කූඩු විශාල ප්‍රමාණයක් දිරාපත්ව තිබුණු අතර ඒවා එදිනෙදා පිළියම් යොදා ගනිමින් භාවිතා කරමින් පැවැතුණි.

රූපසටහන 02- දෙහිවල සත්වෝද්‍යානයේ ගල්වලේ රැස්වී ඇති අප ජලය

රූපසටහන 03 පින්නවල අලි අනාථාගාරයේ අලි මඩු පිරිසිදු කිරීමේදී ජලය කාණු දිගේ ජල මූලාශ්‍රවලට ගලායෑම

සේවක සුභසාධනය සම්බන්ධයෙන් කරන ලද නිරීක්ෂණයන්හිදී සත්වෝද්‍යානය මගින් උපයන මුළු ආදායමෙන් සියයට තුනකට වඩා අඩු ප්‍රතිශතයක් සේවකයන් වෙනුවෙන් වැය කර තිබීම, සතුන්ට ප්‍රතිකාර කරන අවස්ථාවන්හිදී ඔවුන් රඳවා තැබීම සඳහා රඳවනයන් (Crush) නොමැතිවීම හේතුවෙන් සේවකයන් අනතුරට ලක්විය හැකි අවස්ථා පැවතුණු අතර එවැනි අනතුරු වලක්වා ගැනීමට ප්‍රමාණවත් ආරක්ෂාවක්, ප්‍රමාණවත් රක්ෂණාවරණයක් නොතිබීම හා විධිමත් පරිදි පුහුණුවීම් ලබා නොදීම යන හේතු සේවක සුභසාධනය කෙරෙහි බලපා තිබුණි.

සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව සතු සත්වෝද්‍යාන සඳහා සතුන්ගේ සහ සේවකයින්ගේ සියළු සුභසාධන කටයුතු ආවරණය වනසේ විස්තරාත්මක සහ නිශ්චිත මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස්කර යාවත්කාලීනව පවත්වාගෙන යාම, සහකරුවන් නොමැති සතුන් සඳහා සහකරුවන් ලබාදීමට අවශ්‍ය පියවර ගැනීම, සේවකයන්හට වඩාත් කාර්යක්ෂම හා ඵලදායක ලෙස තම සේවය පවත්වාගෙන යාමට හැකි වන පරිදි පුහුණුවීම් ලබාදීම, නියමිත කාලසීමාවකට වරක් වෛද්‍ය කඳවුරු පැවැත්වීම, ප්‍රමාණවත් රක්ෂණ ආවරණයක් ලබාදීම මගින් ඔවුන්ගේ සේවා ඵලදායීතාවය ඉහළ නැංවීම කෙරෙහි අවධානය යොමු කළ යුතුව ඇත.

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව 2017 වර්ෂයේ රු.මිලියන 999 ක පමණ ආදායමක් උපයා ඇති අතර මෙම ආදායමෙන් සතුන්ගේ ආහාර සහ ඖෂධ සඳහා සියයට 27 ක් ද, සේවක සුභසාධනය හා පුහුණු කිරීම් සඳහා සියයට 2.56 ක් ද, ඉදිකිරීම් සඳහා සියයට 16 ක් ද වැය කර තිබුණි. සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව සිය ආදායම් සම්පූර්ණයෙන් උපයනු ලබන්නේ සතුන් ප්‍රදර්ශනය කිරීම මගින් වන අතර හඳුනාගන්නා ලද නිරීක්ෂණ වලට අවධානය යොමු කරමින් සත්ව සුභසාධනය සහ සේවක සුභසාධනය සඳහා තවදුරටත් අවධානය යොමු කළ යුතු බව නිගමනය කරනු ලැබේ.

ශ්‍රී ලංකාවේ එළවළු හා පළතුරු පසු අස්වනු හානිය අවම කිරීම හා සාධාරණ මිලට අලෙවි කිරීම සඳහා අදාළ රාජ්‍ය ආයතනවල මැදිහත්වීම

වර්ෂ 2050 වන විට ලෝක ජනගහනය බිලියන 10.5 ක් පමණ වෙතැයි අපේක්ෂා කරන බැවින් ඒ සඳහා ආහාර සැපයුම සියයට 60 කින් වර්ධනය විය යුතු බවත්, ඒ හා සමගාමීව ආහාර බෙදාහැරීම වැඩිදියුණු කිරීමට අමතරව පසු අස්වනු හානිය අවමකරගැනීම තීරණාත්මක සාධකයක් බව අන්තර්ජාතික පර්යේෂණ මගින්ද තහවුරු කර ඇත. ශ්‍රී ලංකාවේ එළවළු හා පළතුරු ගොවිබිමේ සිට පාරිභෝගිකයා අතට පත්වන තෙක් සියයට 30 ක සිට සියයට 40 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් හෙවත් වර්ෂයකට ටොන් 270,000 ක් පමණ අස්වනු අපතේ යාම හා එමගින් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සිදුවන අවාසිය රු.බිලියනයක් පමණ වන බැවින් ඒ පිළිබඳව විශේෂ අවධානය යොමු කිරීමේ කාලය එළඹ ඇත.

ලාංකික ගොවි ජනතාව අස්වනු නෙළන කාලවලදී බොහෝවිට ඒවා අලෙවි කර ගැනීමට නොහැකිව ඉවත දැමීමට සිදුවන අවස්ථා වාර්තා වී තිබුණි. එසේම අස්වනු සඳහා අවම හෝ සාධාරණ මිලක් නොලැබීම නිසා ගොවීන් විසින් වගාව සඳහා කරනු ලබන වියදම ආවරණය කර ගැනීමට නොහැකිව අසරණ වන අවස්ථාද වාර්තා වී ඇත.

මේ සම්බන්ධව කටයුතු කරන කෘෂිකර්ම අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ පවතින රාජ්‍ය ආයතන පසු අස්වනු තාක්ෂණය සම්බන්ධ පර්යේෂණ සිදුකරනු ලැබේ. මෙහිදී අත්‍යාවශ්‍ය බෝග හා ප්‍රධාන අංශ පිළිබඳ පර්යේෂණ මගින් ප්‍රමාණවත් ලෙස ආවරණය වී නොමැති බවත්, පර්යේෂණ වාර්තාවන්ගේ නිර්දේශ අදාළ රාජ්‍ය ආයතන විසින් ක්‍රියාත්මක කිරීමද ප්‍රමාණවත් වී නොතිබුණු බවත් නිරීක්ෂණය විය.

අස්වනු නෙලීමේ සිට පාරිභෝගිකයා අතට පත්වන තෙක් පසු අස්වනු හානිය පිළිබඳ ක්‍රියාදාමය රූපසටහන 04 හි දැක්වේ.



රූපසටහන 04 - අස්වනු නෙලීමේ සිට පාරිභෝගිකයා අතට පත්වන තෙක් පසු අස්වනු හානිය පිළිබඳ ක්‍රියාදාමය

අස්වනු නෙලීමේ අවස්ථාව බෝගයෙන් බෝගයට වෙනස් වන අතර එම අවස්ථාව නිවැරදිව හඳුනාගෙන අස්වනු නෙලීම මූලිකව කළ යුතු කාර්යයකි.

ඒ සඳහා අස්වනු නෙළීමේ අවස්ථාව (දර්ශක) පිළිබඳව ගොවීන් දැනුවත් නොවීම, අස්වනු නෙලීමේ ක්‍රමවේදය පිළිබඳ අවබෝධයක් නොතිබීම, ඒ පිලිබඳ පුහුණු කිරීම හා අවශ්‍ය උපකරණ බෙදාදීම ප්‍රමාණවත් පරිදි සිදු නොකිරීම, අස්වනු ශ්‍රේණිගත කිරීම් සම්බන්ධ ප්‍රමිතීන් ස්ථාපිත නොකිරීම හා ඒ පිළිබඳ අවබෝධයක් නොතිබීම පසු අස්වනු හානියට මූලිකව බලපා තිබුණි.

තවද, විධිමත් ඇසුරුමකින් තොරව එළවළු හා පළතුරු ගබඩාකිරීම හා ප්‍රවාහනය කිරීම පසු අස්වනු හානිය වැඩිකරවන ප්‍රධාන හේතුකාරකයක් වී තිබුණි. මේ නිසා ඇසුරුම්කරණයේදී සිදුවන පසු අස්වනු හානිය අවම කිරීමේ අරමුණු ඇතිව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් 2011 වර්ෂයේදී හා 2012 වර්ෂයේදී අතිවිශේෂ ගැසට් පත්‍ර 2 ක පල කළ නිවේදන දෙකක් මගින් පිළිවෙළින් දේශියව නිෂ්පාදිත එළවළු හා පළතුරු වර්ග 37 ක් හා 21 ක් රැස් කිරීමේදී, ගබඩා කිරීමේදී හා ප්‍රවාහනය කිරීමේදී ප්ලාස්ටික් හා ඝන කඩදාසි හෝ දැවවලින් සකසා ඇති ඇසුරුම් භාවිතා කළ යුතු බවත්, සියළු දේශිය එළවළු හා පළතුරු ප්‍රවාහනය කරන්නන්, බෙදාහරින්නන් හා වෙළෙන්දන් වෙත විධාන නිකුත් කර තිබුණි. නමුත් දෙවන ගැසට් පත්‍රයේ පල කළ නිවේදනය නිකුත් කිරීමේදී පළමු ගැසට් පත්‍රයේ පල කළ නිවේදනයේ ඇසුරුම් භාවිතා කළ යුතු බවට සඳහන් කර තිබු එළවළු හා පළතුරු වර්ග16 ක් එම අවශ්‍යතාවයෙන් නිදහස් කර ඉවත් කර තිබුණි. නමුත් ඉන් එළවළු වර්ග 8 ක් ප්‍රවාහනයේ දී හා අලෙවිකරණයේ දී සිදුවන අස්වනු හානිය අවමය සියයට 7.68 ක සිට උපරිමය සියයට 77 ක් දක්වා පවතින බව ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය විසින් 2016 හා 2017 යන වර්ෂවල දී සිදුකරන ලද සමීක්ෂණ ප්‍රතිඵල අනුව තහවුරු වී තිබුණි.

රූපසටහන 05- මීගොඩ විශේෂ ආර්ථික මධ්‍යස්ථානය - 2018 ජූනි 26 දින

රූපසටහන 06- දඹුල්ල විශේෂ ආර්ථික මධ්‍යස්ථානය - 2019 මාර්තු 19 දින

පසු අස්වනු හානිය සිදුවන එක් එක් අවස්ථා අතරින් ප්‍රවාහනය අවස්ථාවේදී ගැටළු ගණනාවකට මුහුණ දීමට සිදුවී තිබුණි. අස්වනු ප්‍රවාහනය කිරීමේදී සිදුවන හානිය පිළිබඳව වූ දත්ත හා පර්යේෂණ වාර්තා අනුව සම්ප්‍රදායික ක්‍රම (පොලිසැක් මලු) සහ ප්ලාස්ටික් ඇසුරුම් ක්‍රම යටතේ විවිධ එළවළු වර්ග ප්‍රවාහනය කිරීමේදී

සිදුවන අස්වනු හානිය, ප්ලාස්ටික් ඇසුරුම් මගින් ප්‍රවාහනය කිරීමේදී සියයට 20 ක සිට සියයට 25 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් අඩු කර ගත හැකි බව පෙන්වා දී තිබුණි. එහෙත් වර්තමානයේදී මෙම ප්ලාස්ටික් කූඩ භාවිතය ඉතා අවම මට්ටමක පැවැතුණි.

රූපසටහන -07 තඹුත්තේගම වි.ආ.ම. 2018 ජූලි .20 දින

රූපසටහන 08- මීගොඩ වි.ආ.ම. – 2018 ජූනි 26 දින

එළවළු හා පළතුරුවල අස්වනු හානිය අවම කිරීම සඳහාත්, අතිරික්ත බෝගයන් අලෙවි කරගත නොහැකිව ඉවතට දැමීම තුළින් ගොවියාට වන ආර්ථිකමය අවාසිය පාලනය කළ යුතුව තිබේ. රාජ්‍ය ආයතන කිහිපයක් විසින් නිෂ්පාදන ගණනාවක අගය එකතු කළ නිෂ්පාදන හඳුන්වා දී තිබුණත් අගය එකතු කිරීමේ නිෂ්පාදන වෙළඳපොළ තුළ සුලභ නොවීම නිසා ඒවා වෙළඳපොළ තුළට එක් කිරීම සඳහා ව්‍යවසායකයන් ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුව ඇත.

වගා සැලැස්මක් මත කටයුතු කිරීම හේතුවෙන් එක් එක් වගාවන් තුළින් ලබාගත හැකි ඵලදායිතාව උපරිම මට්ටමට පත්කර ගත හැකි බැවින් වගා සැලැස්මක අවශ්‍යතාවය මෙහි දී වැදගත් වේ. මේ සඳහා එක් එක් කන්නවලදී එක් එක් ප්‍රදේශවල වගා කළ යුතු බෝගය හා ප්‍රමාණ පිළිබඳ සැලැස්මක් පිළියෙල කර එය ක්‍රියාත්මක කිරීම සඳහා පෙළඹවීමක් ගොවීන් තුළ ඇති කළ යුතු වුවත්, එවැනි පෙළඹවීමක් සිදු කිරීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

කෘෂි නිෂ්පාදන වෙළඳ කටයුතු පහසු කරවීම සඳහා ප්‍රාදේශීය අලෙවි මධ්‍යස්ථාන පිහිටුවීම පිළිබඳව 1988 අයවැය කථාව මගින් යෝජනා කර තිබුණි. අනතුරුව 1999 වර්ෂයේදී දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය ආරම්භ කිරීමත් සමග විශේෂයෙන්ම එළවළු අලෙවිය සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශ හවුල් ව්‍යාපාර සංවර්ධනයට හිතකර පරිසරයක් සකස් කර තිබුණි.

1999 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ ආර්ථික මධ්‍යස්ථාන 15 ක් ස්ථාපිත කර ඒවායේ කඩකාමර ඉදිකර ඒවා බදු දී තිබුණි.

2019 ජනවාරි 28 දින වන විටත් පිළියන්දල, රත්මලාන, නුවරඑළිය, කැප්පෙටිපොළ, කුරුඳුවත්ත, මීගොඩ සහ අම්පාර යන ආර්ථික මධ්‍යස්ථානවලට අයත් භූමියෙහි නීත්‍යානුකූල අයිතිය විෂය භාර අමාත්‍යාංශය විසින් පවරා ගෙන නොතිබුණි. ගොවීන් විසින් ආර්ථික මධ්‍යස්ථාන වෙත රැගෙන එන එළවළු හා පළතුරු අලෙවි කරගන්නා තුරු

අව්වෙන් හා වැස්සෙන් ආරක්ෂා කරගැනීම සඳහා කඩ කාමර ඉදිරිපිට භූමිය ආවරණ වන පරිදි වහලයක් ඉදිකිරීම පසු අස්වනු හානිය අවමකර ගැනීමට ඉවහල් වී තිබුණි. දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ එවැනි වහලයක් ඉදිකර තිබුණ ද තඹුත්තේගම, වේයන්ගොඩ සහ නුවරඑළිය ආර්ථික මධ්‍යස්ථානවල එවැනි ආරක්ෂිත වහලයක් නොතිබීම මත අස්වනු හානිය වැඩි වී තිබුණි.

දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ අතිරික්ත වශයෙන් ලැබෙන අස්වනු තොග අනෙකුත් ආර්ථික මධ්‍යස්ථානවලට රැගෙන යාමට ගොවීන් දිරිගැන්වෙන පරිදි අවශ්‍ය තොරතුරු ලබාදීමට සහ ආර්ථික මධ්‍යස්ථාන ජාලයක් ලෙස කටයුතු කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළක් අදාළ අමාත්‍යාංශ හෝ ආර්ථික මධ්‍යස්ථානවල කළමණාකරන භාරයන් විසින් සකස් කර නොතිබුණි.

කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආර්ථික මධ්‍යස්ථානවල වෙළඳසැල්වල මිල ප්‍රදර්ශණ පුවරු හෝ විද්‍යුත් මිල ප්‍රදර්ශණ පුවරු ක්‍රියාත්මක කර නොතිබුණි.

දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ එළවළු අතිරික්ත සැපයුමක් පවතින ඇතැම් කාලවල ඒවා අලෙවිකර ගැනීමට නොහැකි වූ විට එම එළවළු දිගම්පතන ප්‍රදේශයට ඉවත් කරනු ලබයි. එම ප්‍රදේශයේ සැරිසරන වන අලින් විසින් එම ඉවත දමන ලද එළවළු ආහාරයට ගනු ලබයි. අලින් විසින් එම එළවළු ආහාරයට ගන්නා ආකාරය රූප සටහන 09 හි දැක්වේ.

රූපසටහන 09 – දිගම්පතන ප්‍රදේශයේ අලින් විසින් ආර්ථික මධ්‍යස්ථානයෙල් ඉවත දමන ලද එළවළු ආහාරයට ගැනීම – 2018. ඔක්තෝබර් 04 දින

නමුත් මෙම කාලවලදීම දිවයිනේ අනෙක් ප්‍රදේශවල එළවළු මිල ගණන්වල අඩුවීමක් අනාවරණය වී නොතිබුණු බැවින්, දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය තුළ අලෙවි කර ගැනිමට නොහැකි වූ එළවළු වෙනත් ප්‍රදේශවලට බෙදාහරින ජාලයක් ක්‍රියාත්මක කිරිමට අදාළ බලධාරින්ගේ අවධානය යොමු වී නොතිබුණි.

2014 වර්ෂයේදී පසු අස්වනු තාක්ෂණ ආයතනය විසින් කරන ලද සමීක්ෂණයකට අනුව එළවළු වර්ග 11 ක් ජාල 09 ක් යටතේ බෙදාහැරීමේදී එම එළවළුවලින් සියයට 7.68

ක සිට සියයට 66.45 ක් දක්වා පරාසය ප්‍රමාණයකින් එම ඵලවළුවලට හානි සිදුවන බව ප්‍රකාශ කර තිබුණි. මේ අනුව එළවළු යාපනය සිට දඹුල්ලට රැගෙන ඒමේදීත්, නුවරඑළියේ සිට කොළඹට රැගෙන ඒමේදීත්, තඹුත්තේගම සිට කෑගල්ලට රැගෙන ඒමේදීත් ආදී වශයෙන් වැඩි දුරක සිට එළවළු බෙදාහැරීමේ මධ්‍යස්ථාන වෙත පැමිණෙන විට අස්වනු හානිය වැඩිවෙන බව අනාවරණය විය. ඒ අනුව ආර්ථික මධ්‍යස්ථාන දිවයින පුරා ස්ථාපිතවීමේ විෂමතාවය නිසා මිලෙහි විචලනයන්ද වැඩි වී තිබුණි.

නිෂ්පාදන ප්‍රදේශ කේන්ද්‍රකරගත් ආර්ථික මධ්‍යස්ථානවල පැවැති මිල ගණන් හා නාගරික ප්‍ර දේශ කේන්ද්‍ර කරගෙන පිහිටි ආර්ථික මධ්‍යස්ථානවල මිල ගණන් අතර මිල විචලනයන් පැවැතුණි. එම විචලනයන් කෙරෙහි ප්‍රවාහන වියදම හා ගනුදෙනු කිරීමේදි අතරමැදියන් සිටීමද බලපා තිබුණි. එසේම එම මිල විචලනයන් නියාමනය කිරිමට මේ සම්බන්ධයෙන් කටයුතු කරන රාජ්‍ය ආයතන මැදිහත් වී නොතිබුණි.

පොලිස් ත්‍යාග අරමුදල

දිවයිනේ සෑම ප්‍රදේශයකම ආරක්ෂාව තහවුරු කිරීමත්, දවසේ පැය විසිහතර පුරාම ජන ජීවිතයෙහි සුරක්ෂිතතාව තහවුරු කිරීම පිණිස පූර්ණකාලීනව රැකවරණ ලබාදීම පොලිස් දෙපාර්තමේන්තුවේ වගකීම වේ. ඒ වගකිම් සම්භාරය තුළ අපරාධ මර්ධනය, මත්ද්‍රව්‍ය උවදුර මැඩලීම, රථවාහන කළමනාකරණය, පරිසර සංරක්ෂණය හා ආපදා අවස්ථාවලදී ජනතාවට සහන සැලසීම යන සිවිල් ජන ජීවිතයේ විවිධ ගැටළු ඔස්සේ පොලිස් දෙපාර්තමේන්තුව ක්‍රියාකාරී වේ. විස්තර රූපසටහන 10 හා 11හි දැක්වේ.

රූපසටහන10- රථවාහන කළමනාකරණය

රූපසටහන 11. – පරිසර සංරක්ෂණය

මේ සියලු කාර්යයන් ඉටුකරන ශ්‍රී ලංකා පොලිසියේ නිලධාරීන් දිරිගැන්වීම උදෙසා පොලිස් ත්‍යාග අරමුදල පිහිටුවා ක්‍රියාත්මක කර තිබුණි. 1990 මාර්තු 09 දිනැති අංක 600/20 දරන අති විශේෂ තිබුණි. 1865 අංක 16 දරන ශ්‍රී ලංකා පොලීසිය පිහිටුවීම පිළිබඳ ආඥා පනතෙහි 72 හා 73 වන වගන්ති යටතේ ත්‍යාග අරමුදල ස්ථාපිත කර ගැසට් නිවේදනයෙන් ත්‍යාග අරමුදලේ නියෝග සංශෝධනය කර තිබුණි. ඇත. 1974 අගෝස්තු 07 දිනැති හා අංක 116 දරන ගැසට් පත්‍රයේ පල කරන ලද නිවේදනයක් මගින් ශ්‍රී ලංකා පොලිස් ත්‍යාග අරමුදල පොලිස් නිලධාරීන් ඉටුකරන රාජකාරිවලදී රජයට අයවන දඩ මුදලින්

කිසියම් ප්‍රමාණයක් මෙම ඒ අනුව පොලිස් ත්‍යාග අරමුදලට ප්‍රධාන මාර්ග දෙකක් යටතේ ආදායම් බැර කරනු ලැබේ. එනම් උසාවි දඩමුදල් හා රථවාහන දඩමුදල් වශයෙන් හැඳින්විය හැකිය. ඊට අමතරව පොලිස් ත්‍යාග අරමුදලේ වාර්ෂිකව ඇතිවන අතිරික්තය ආයෝජනය කිරීමෙන් ජනිතවන ආයෝජන ආදායම් ද ආදායම් ප්‍රභවයක් ලෙස ගිණුම්ගත කරනු ලැබේ. මෙම ප්‍රධාන ආදායම් ප්‍රභවයන් මගින් උපයන ආදායම් උපයෝගී කරගෙන පොලිස් නිලධාරීන් දිරිගැන්වීම උදෙසා විවිධ චක්‍රලේඛ මගින් නිර්ණායක හඳුන්වා දී ඇත. එම නිර්ණායක යටතේ ත්‍යාග පිරිනැමීම වාර්ෂිකව සිදුකරනු ලබයි. සාමාන්‍ය ත්‍යාග ගෙවීම්, රථවාහන ත්‍යාග ගෙවීම්, විශේෂ ත්‍යාග අරමුදලට බැර කරනු ලැබේ. ගෙවීම්, පොලිස්පති විශේෂ ත්‍යාග ගෙවීම් හා විනෝද ගෙවීම් ලෙස එම ගෙවීම් වර්ග කර ඇත.

2018 වර්ෂයේදී දඩමුදල් ආදායම් ලෙස රු.මිලියන 1,939 ක් පොලිස් ත්‍යාග අරමුදලට බැර කර තිබුණු අතර එම වර්ෂයේ ත්‍යාග ලෙස රු.මිලියන 885 ක් 2018 වර්ෂයේ පොලිස්පතිගේ නියෝග අනුව ත්‍යාල මුදල් ගෙවිය යුතු ප්‍රතිශතය සියයට 70 ක් වුවත්, ගෙවා තිබුණු ප්‍රතිශතය සියයට 54 ක් පමණක් වී තිබුණි. 2018 දෙසැම්බර් 31 දින වන විට ස්ථාවර තැන්පත් ලෙස රු.මිලියන 9,821 ක් ආයෝජනය කර තිබුණි. 2018 වර්ෂයේ පොලිස්පති නියෝග අනුව ආයෝජනය කළ යුතු ප්‍රතිශතය සියයට 10 ක් වුවත්, ආයෝජනය කර තිබුණු ප්‍රතිශතය සියයට 92 ක් වී තිබුණි. පොලිස් නිලධාරීන්ට ත්‍යාග ගෙවීමේ දී වර්තමානයට ගැලපෙන පරිදි ත්‍යාග ගෙවීමේ නිර්ණායකයන් කාලීනව සංශෝධනය නොකිරීම, ත්‍යාග ගෙවීමේ ප්‍රමාදයන් පැවතීම, ත්‍යාග අහිමි පොලිස් නිලධාරීන් සිටීම, ත්‍යාග අරමුදල් ආදායම් හා ගිණුම් තැබීමේදී අනුගමනය කරන ගිණුම් ප්‍රතිපත්ති සම්බන්ධව වූ ගැටළු මෙම අරමුදල සම්බන්ධයෙන්ද පැවැතුණි. මහජනයා සම්බන්ධ වන සෑම කාර්යකදීම ජනතාව සමඟ සමීපව කටයුතු කර තම සේවය නොපිරිහෙළා ඉටුකරන පොලිස් නිලධාරින් දිරිමත් කිරීම සඳහා පිහිටුවා තිබෙන පොලිස් ත්‍යාග අරමුදල කාර්යක්ෂමව හා ඵලදායීව පවත්වා ගත යුතුව ඇත.

කාලගුණ විද්‍යා ශිල්පීය ක්‍රම භාවිතා කිරීම

1948 දී වෙනම දෙපාර්තමේන්තුවක් ලෙස ස්ථාපනය කරනු ලැබූ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, වර්තමානයේදී ආපදා කළමනාකරණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. මෙම දෙපාර්තමේන්තුව කාලගුණ, දේශගුණ විද්‍යාත්මක සේවා මෙන්ම කාලගුණ ව්‍යසන සහ සුනාමි පිළිබඳව පූර්ව අනතුරු ඇඟවීම සඳහා බලයලත් ජාතික ආයතනයද වේ. කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයට අමතරව කටුනායක, මත්තල සහ රත්මලාන ගුවන් තොටුපල්වල්හි පිහිටුවා ඇති කාර්යාල ඇතුළුව බාහිර කාර්යාල 22 ක් දෙපාර්තමේන්තුව යටතේ පවතී. මෙයට අමතරව වෙනත් ස්ථානවල පවතින සහයෝගිතා මධ්‍යස්ථාන 16 කින්ද කාලගුණ අනාවැකි පළකිරීම සඳහා දත්ත ලබාගැනීම සිදුකරනු ලබයි. භූතල නිරීක්ෂණය හා ඉහළ වායුගෝලයේ දත්ත නිරීක්ෂණය සඳහා සම්ප්‍රදායික උපකරණ සහ ස්වයංක්‍රීය කාලගුණ විද්‍යා උපකරණ භාවිතා වේ. අහිතකර කාලගුණික තත්ත්වයන් අනාවරණය කර ගැනීම, ඒවා පිළිබඳව අඛණ්ඩව අවධානයෙන් සිටීමට, අනතුරු ඇඟවීම, කාලගුණික තත්ත්වයන් සමීක්ෂණය සහ වර්ෂාපතන ප්‍රමාණය තක්සේරු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ඩොප්ලර් රේඩාර් පද්ධතියක් ස්ථාපනය කිරීම ශ්‍රී ලංකා රජය විසින් අනුමත කර ඒ සඳහා 2006 හා 2007 වර්ෂවලදී රු.මිලියන 400 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එම අවශ්‍යතාවය ඉටුකිරීම සඳහා 2007 මැයි 24 දින ආපදා

කළමනාකරණ අමාත්‍යාංශය විසින් ලෝක කාලගුණ විද්‍යා සංගමය සමඟ භාරකාර අරමුදල් ගිවිසුමකට එළඹුණි. ලෝක කාලගුණ විද්‍යා සංගමයේ විශේෂඥ උපදෙස් මත රේඩාර් භූමිය ලෙස දෙනියාය ප්‍රදේශයේ වූ ගොන්ගල කඳු මුදුන තෝරා ගෙන තිබූ අතර අදාළ පිහිටීම පිළිබඳව ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර නොතිබුණි. ඩොප්ලර් රේඩාර් පද්ධතිය මීටර් 20 ක් උසැති කුළුණක ස්ථාපිත කළ යුතු බව තීරණය කර තිබුණි. 2010 ජනවාරි 13 දින අමාත්‍ය මණ්ඩල තීරණය අනුව විවෘත ලංසු කැඳවීමෙන් බැහැරව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙත කුළුණ ඉදිකිරීම හා වරායේ සිට ගොන්ගල දක්වා ආනයනය කරන ලද රේඩාර් පද්ධතියේ කොටස් රැගෙන ඒම සඳහා වූ කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. පස් පරීක්ෂාව සිදු නොකිරීම හේතුවෙන් ඉදිකිරීම සඳහා අත්තිවාරම් දැමීමේදී පසෙහි ගැටළු මතුවීම වැනි කරුණු කිහිපයක් මත ඉදිකිරීම් කටයුතු අතරමඟ නවතා දැමීමට සිදු වී තිබුණි. දෙපාර්තමේන්තුව විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12 මාර්ගෝපදේශය ප්‍රකාරව ඉදිකිරීමට අදාළ වැඩ ක්‍රියාත්මක කිරීම, භාණ්ඩ සැපයීම හා සේවා සැලැසීම ප්‍රමාණවත් පරිදි අධීක්ෂණය හා තක්සේරු කිරීම සිදුකර නොතිබුණි. එමෙන්ම ඉදිකිරීම් විධිමත් අනුමැතියකින් තොරව සිදුකර තිබුණි. ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය විසින් නිම කරන ලද කොන්ත්‍රාත්තුවේ වැඩ කොටස් භාර දීමේදී සිදු වී තිබුණු ප්‍රමාදවීම් හා ගුණාත්මයේ අඩුපාඩු පැවැතුණි. ලෝක කාලගුණ විද්‍යා සංගමයේ භාරකාර අරමුදල සමඟ එළඹි තිබුණු ගිවිසුමේ 3.3 උපවගන්තිය පරිදි ශ්‍රී ලංකා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ උපදෙස් මත ඩොප්ලර් රේඩාර් උපකරණ ඇතුළු උපකරණ මිලදී ගැනීම ලෝක කාලගුණ විද්‍යා සංගමයට භාර වී තිබුණි. ඒ අනුව එන්ටර්ප්‍රයිස් ඉලෙක්ට්‍රොනික් කෝපරේෂන් වෙත රේඩාර් උපකරණ ප්‍රසම්පාදනය කිරීමේ කොන්ත්‍රාත්තුව ලෝක කාලගුණ විද්‍යා සංගමය විසින් පිරිනමා තිබුණි. 2012 ඔක්තෝබර් 10 දින වන විට පද්ධතිය ස්ථාපිත කිරීමේ කටයුතු ආරම්භ කර තිබුණි. එය ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය වන දොඹකරය රැගෙන පැමිණි රථය ප්‍රවේශ මාර්ගයෙන් කොටසක් කඩාගෙන එහි රියදුරුට අනතුරුට ලක් වෙමින් කන්දෙන් පහළට වැටී තිබුණි. එම හේතු පදනම් කර ගෙන රේඩාර් පද්ධතිය ස්ථාපිත කිරීමේ කටයුතු අතරමඟ නවතා තිබුණි. 2013 ඔක්තෝබර් 05 දින සැපයුම්කරුගේ කාර්මික ඉංජිනේරුවරයා පැමිණ උපකරණ කොටස් සවිකිරීම සිදුකර තිබුණු අතර 2013 ඔක්තෝබර් 17 දින සැපයුම්කරු ලෝක කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයට ලිපියක් යොමුකරමින් ඉහත රේඩාර් පද්ධතියට විද්‍යුත් සම්බන්ධතාවය ලබා දිය නොහැකි බව ප්‍රකාශ කර තිබුණි. ඊට පසුව සිදුවූ සාකච්ඡාවල ප්‍රතිඵලයක් ලෙස ගොන්ගල වැඩබිමේ වූ රේඩාර් උපකරණ කොටස් අළුත්වැඩියාව සඳහා නැවත නිෂ්පාදනාගාරයට යැවීමට තීරණය විය. ඒ අනුව උපකරණ කොටස් නැවත ඇමරිකාවේ නිෂ්පාදනාගාරයට යැවූවද අළුත්වැඩියා කිරීම සඳහා අධික පිරිවැයක් දැරීමට සිදුවන බවට නිගමනය වී තිබුණි. මෙලෙස එම උපකරණ කොටස් 2013 ඔක්තෝබර් මාසයේදී එකලස් කිරීමෙන් පසු නැවත අළුත්වැඩියා සඳහා සැපයුම්කරු වෙත යැවීමට වර්ෂ 3 ½ කට වඩා වැඩි කාලයක් ප්‍රමාද වී තිබුණි. මේ හේතුවෙන් එම උපකරණ කොටස් හානිවීමට වැඩි ඉඩකඩක් පැවැතුණි.. මේ සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් රු.මිලියන 142.68 ක වටිනාකමකින් යුත් රක්ෂණ ආවරණයක් ලබාගෙන තිබුණද, මෙම රේඩාර් උපකරණ කොටස් ගබඩා කිරීමේදී හා ප්‍රවාහනය කිරීමේදී හානිවීමට ලක් වී තිබුණත්, දෙපාර්තමේන්තුවට ඒ වෙනුවෙන් වූ රක්ෂණ වන්දි ලබාගැනීමට නොහැකි වී තිබුණි. තවද 2018 අප්‍රේල් 25 දින වන විටත් මෙම ලෝක කාලගුණ විද්‍යා සංගමයේ භාරකාර අරමුදලින් එ.ජ.ඩො. මිලියන 1.84 ක් වැය කර තිබුණි. වර්තමානයේ දී අදාළ ස්ථානය අනාරක්ෂිතව පැවති අතර උපකරණවල පැවැත්ම පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි විය. විස්තර රූපසටහන 12, 13 හා 14 හි දැක්වේ.

රූපසටහන. 12 ඕනෑම පුද්ගලයෙකුට පහසුවෙන් ඇතුළුවීමට හැකි වන පරිදි වැඩ බිම ආවරණය වන වැට කපා තිබීම

රූපසටහන 13. - වැසි ජලය කාන්දු වී ඇති ආකාරය



රූපසටහන 14- මත්පැන් බෝතල් දමාගොස් ඇති ආකාරය

ගොන්ගල ඩොප්ලර් රේඩාර් පද්ධතියේ සාර්ථකත්වය පිළිබඳව අවිනිශ්චිතතාවය සහ ශ්‍රී ලංකාවේ පූර්ව අනතුරු ඇඟවීම් සඳහා ඩොප්ලර් රේඩාර් පද්ධතියක අවශ්‍යතාවය මත පුත්තලම හා පොතුවිල් කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන දෙකෙහි කාර්යාල පරිශ්‍රයට ආසන්නයේම ඩොප්ලර් රේඩාර් පද්ධති දෙකක් ස්ථාපනය කිරීම සඳහා 2017 ජුනි 30 දින ජපන් අන්තර්ජාතික සහයෝගිතා මධ්‍යස්ථානය (JAICA) හා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජය ගිවිසුමකට එළඹ තිබුණි. මෙම ව්‍යාපෘතියේදී ප්‍රවේශ මාර්ග, අධීක්ෂණය හා නඩත්තු කිරීමේ හැකියාව කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් හා තරංග බාධකයන් , රේඩාර් නොමඟ යවන අවරෝධකයන් හා පාරිසරික බලපෑම් කෙරෙහි අඩු අවධානයක් යොමු කර මෙම වැඩ භූමි දෙක හඳුනාගෙන තිබුණි. එමෙන්ම මේ සඳහා අවශ්‍ය ඉඩම් ප්‍රමාණය නිශ්චිතව හඳුනාගෙන නොමැති අතර, ඒවාට අදාළව මිනින්දෝරු සැලැසුම් සකස් කර නොතිබුණි. එසේම ඉඩම් පවරාගැනීමේ කටයුතු ඉතා මන්දගාමීව සිදු වෙමින් පැවැතීම හා පුත්තලම වැඩ භූමියට යාබදවම පාසලක් පිහිටා තිබුණි.

කාලගුණ තත්ත්වයන් ස්වයංක්‍රීයව මැනීම (දත්ත රැස් කිරීම), ගබඩා කිරීම හා සන්නිවේදනය ස්වයංක්‍රීය කාලගුණ විද්‍යා පද්ධති 38 ක් ජපන් ප්‍රදානයක් ලෙස 2009 වර්ෂයේදී ලැබී 2012 හා 2013 වර්ෂවලදී එම උපකරණ සවිකර තිබුණි. මේ අනුව මෙම උපකරණ ප්‍රදානයක් ලෙස ලැබී වර්ෂ හතරකට අධික කාලයක් නිෂ්ක්‍රීයව පැවැති තිබුණි. මෙම බොහෝ මධ්‍යස්ථානවලින් ඇතැම් මාස සඳහා වූ දත්ත කිසිම ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි. 2009 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වාම මෙම පද්ධතියේ ක්‍රියාකාරීත්වය වරින්වර බිඳ වැටී තිබුණු අතර එමඟින් නිවැරදි කාලගුණික දත්ත ලබාදීමක් සිදු වී නොතිබුණි. දත්ත සන්නිවේදන පහසුකම් බිඳ වැටී තිබුණු අතර එම උපකරණ නිසි පරිදි නඩත්තු කර නොතිබුණි. ත්‍රිකුණාමලය කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ ස්ථාපිත කිරීමට නියමිත වූ AWS පද්ධතියේ උපකරණ කොටස් ප්‍රධාන කාර්යාලයේ නිෂ්කාර්යව ගබඩා කර තිබුණි. ඒ පිළිබඳ විස්තර රූපසටහන 15,16 හා 17 හි දැක්වේ.

රූපසටහන 15. වාගොල්ලේ පිහිටි AWS පද්ධතිය

රූපසටහන 16 - ගාල්ලේ කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ පිහිටි AWS පද්ධතියේ Data logger හි කෘමි කොටස් රැදී ඇති ආකාරය

රූපසටහන 17 – ත්‍රිකුණාමල කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ ස්ථාපිත කිරීමට නියමිත AWS පද්ධතියේ mounting pole ප්‍රධාන කාර්යාලයේ ගබඩා කර ඇති ආකාරය

තත්කාලීන වර්ෂාපතන තත්ත්වයන් පිළිබඳව අවදානයෙන් සිට ඒවායේ ප්‍රතිඵල මත අනතුරු ඇඟවීම් නිකුත් කිරීම අරමුණු කර ගෙන තෝරාගත් ගංගාවන් 05 ක් ආශ්‍රිතව ස්වයංක්‍රීය වර්ෂාමාන 100 ක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් රු.මිලියන 53 ක ප්‍රතිපාදන සලසා තිබුණි. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් එම ව්‍යාපෘතිය දෙපාර්තමේන්තු නිලධාරීන්ට පුහුණු කිරීම කළ යුතුව තිබුණත්, කොන්ත්‍රාත්කරු විසින් එම කාර්යයන් ඉටු කර නොතිබුණි.

වායු පීඩනය, උෂ්ණත්වය, ආර්ද්‍රතාවය, සුළඟේ වේගය හා සුළඟේ දිශාව පිළිබඳ දත්ත ලබාදීම රේඩියෝ සවුන්ඩ් උපකරණ මඟින් සිදු කරන අතර ලෝක කාලගුණ විද්‍යා සංගමයේ ක්‍රියාත්මක කර තිබුණි. අදාළ ස්ථානයන් තෝරාගැනීම සඳහා වැඩි කාලයක් ගත කර තිබුණු අතර, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් වර්ෂාමාන මිලදී ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කර තිබුණත්, අවශ්‍යතාවය හඳුනා ගැනීමට පෙර කොන්ත්‍රාත් ගිවිසුම්වලට එළඹ තිබුණු අතර එම ගිවිසුම් බලාත්මකවීමට පෙර ගනුදෙනු සිදු කර තිබුණි. එමෙන්ම උපකරණ උපදේශයන් ප්‍රකාරව සියළුම සාමාජික රටවල් දෛනිකව 00 UTC සහ 12 UTC යන විශ්ව වේලාවන්වලදී සිදු කිරීම හෝ අවම ලෙස දෛනිකව එක් වරක් හෝ රේඩියෝසොන්ඩ් ඉහළ වායු නිරීක්ෂණය කිරීම කළ යුතු වුවද, ශ්‍රී ලංකාවේ මෙම නිරීක්ෂණයන් සිදු කරනු ලබන්නේ පෙරවරු 11.30 ට සඳුදා, බදාදා හා සිකුරාදා යන සතියේ දින 03 මිලදී ගැනීමේදී ක්‍රමාංකණ සහතිකයක් පිළිබඳව අවධානය යොමු කර නොතිබුණු අතර ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ සවිකර තිබුණු වර්ෂාමාපයේ හැර අනෙකුත් වර්ෂාමාපනවල දත්තවල නිවැරදිතාවය තහවුරු කර ගැනීමට කටයුතු කර නොතිබුණි. කොන්ත්‍රාත් ගිවිසුමෙහි, කොන්ත්‍රාත්කරු විසින් ඉටු කළ යුතු සේවාවන් යටතේ මෙහෙයුම් සහ නඩත්තු කටයුතු වෙනුවෙන් කදී පමණි. බැලුමක ආයු කාලය මාස 12 ක් බව සැපයුම්කරු විසින් දක්වා තිබුණද, මාස 12 ඉක්ම වූ ආයු කාලයකින් යුත් බැලුම් රේඩියෝසොන්ඩ් නිරීක්ෂණ සඳහා යොදා ගන්නා බවත් බැලුම් තුලට හයිඩ්‍රජන් වායුව පිරවීමේ දී ආරක්ෂිත පියවර ගෙන නොමැති බවත් නිරීක්ෂණය විය.

රූපසටහන 18 ආරක්ෂිත ඇඳුම් නොමැතිව බැලුම් යැවීම

රූපසටහන 19- ආරක්ෂිත ඇඳුම් නොමැතිව බැලුමට හයිඩ්‍රජන් වායුව පිරවීම

සම්ප්‍රදායික කාලගුණ විද්‍යා උපකරණ

දිවයින පුරා පිහිටුවා ඇති මධ්‍යස්ථාන 500 කින් වර්ෂාපතන දත්ත ලබා ගන්නා අතර සෑම මධ්‍යස්ථානයක් විසින්ම එම දත්ත මාසිකව ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණි. 2016 සිට 2018 දක්වා වූ වර්ෂවල වර්ෂාපතන වාර්තා එම මධ්‍යස්ථාන විසින් අඛණ්ඩව ලබා දී නොතිබුණි. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් සෑම මධ්‍යස්ථානයක්ම අවම වශයෙන් වර්ෂ 2 කට වරක් හෝ පරීක්ෂා කර නොතිබුණු අතර, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී පවා මෙම වර්ෂාමාන සමීක්ෂණය කර නොතිබුණි. විගණනය විසින් සිදුකළ භෞතික පරීක්ෂණවලදී එම වර්ෂාමාන අදාළ ප්‍රමිතීන්ට අනුකූල නොවූ අවස්ථා අනාවරණය විය.

දෙපාර්තමේන්තුවේ පුරෝකතන හා තීරණ උපකාරක අංශය යටතේ වූ ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානය විසින් මහජනතාවට, විවිධ කර්මාන්තයන්ට අදාළ ප්‍රජාවට හා විවිධ ආයතනයන්ට ස්වභාවික විපත් පිළිබඳ අහිතකර කාලගුණ තත්ත්වයන් පිළිබඳව පූර්ව අනතුරු ඇඟවීම සිදුකර තිබුණි. 2018 වර්ෂයේදී සිදුවූ ස්වභාවික විපත් හා එම අනතුරු සම්බන්ධයෙන් නිකුත් කර තිබුණු පූර්ව අනතුරු ඇඟැයීම්වල සාර්ථකත්වය පිළිබඳව ඇගැයීම සඳහා 2018 නොවැම්බර් හා දෙසැම්බර් මාසවල ගොඩබිම් ප්‍රදේශවල ඇති වූ ආපදා තත්ත්වයන් පිළිබඳව නියැදියක් ලෙස පරීක්ෂා කරන ලද ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ඉදිරිපත් කරන ලද වාර්තා අනුව එම ආපදා පිළිබඳව පූර්ව අනතුරු ඇඟවීම් මගින් ප්‍රජාව දැනුවත් කර නොතිබුණි.

ශිෂ්‍ය සංඛ්‍යාව අවම රජයේ පාසල්වල කාර්යසාධනය

ශ්‍රී ලංකාවේ පැවති පිරිවෙන් අධ්‍යාපන රටාව ඉංග්‍රීසින් විසින් මිෂනාරි පාසල් ආරම්භ කිරීමත් සමඟ ඉංග්‍රීසි මිෂනාරි පාසල්වලට අමතරව සිංහල බෞද්ධ පාසල්ද, ඉන්පසුව මුස්ලිම් හා හින්දු පාසල්ද බිහිවිය. වර්තමානයේ ජාතික පාසල් හා පළාත් පාසල් ලෙස පරිපාලනමය වශයෙන් බෙදා වෙන් කර ඇති අතර ඊට අමතරව පෞද්ගලික හා ජාත්‍යන්තර පාසල්ද එම ජාලයට එකතු වී ඇත. ඒ අතරතුර ශ්‍රී ලංකාවේ දෙමාපියන්ගේ මූලික අභිලාෂයක් වන්නේ තම දරුවන් සඳහා හොඳ පාසලක් ලබා ගැනීම වේ.

2017 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ පාසල් සංයුතිය, රජයේ පාසල් 10,194 කින් හා රජයේ නොවන පාසල් 859 කින් සමන්විත වී තිබුණි. රජයේ පාසල් පළාත් පාසල් 9,841 කින් හා ජාතික පාසල් 353 කින් සැකැසී තිබුණි. එමෙන්ම ඒවායේ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 4,165,964 ක් වූ අතර මුළු ගුරුවරු සංඛ්‍යාව 241,591 ක් වී තිබුණි. ඒ අනුව ශ්‍රී

ලංකාවේ පාසල්වල ගුරු ශිෂ්‍ය අනුපාතය 1:17 ක් ලෙස ගණනය කර ඇත. මුළු පාසල්වලින් සියයට 3.5 ක් ජාතික පාසල් වී තිබුණු අතර, එම පාසල්වල මුළු ශිෂ්‍ය ප්‍රමාණයෙන් සියයට 19 ක් අධ්‍යාපනය ලබයි. මුළු පාසල් ගණනින් සියයට 40 ක් 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා (3 වර්ගය) අධ්‍යාපනය ලබන සිසුන් සිටින පාසල් වී තිබුණත්, මුළු ශිෂ්‍ය ප්‍රමාණයෙන් සියයට 16 ක් එම පාසල්වල අධ්‍යාපනය ලබයි.

ජනප්‍රිය පාසල් කරා අදාළ ප්‍රදේශයෙන් පරිබාහිර වෙනත් ප්‍රදේශවලින් සිසුන් අධ්‍යයන කටයුතු සඳහා පැමිණෙති. එම තත්ත්වය හේතුවෙන් සමස්ත පාසල් සංඛ්‍යාවෙන් හරි අඩකටත් වඩා එනම් පාසල් 5,161 ක අධ්‍යයන කටයුතු සඳහා පැමිණෙන සිසුන් සංඛ්‍යාව 200 කට වඩා අඩු වී තිබුණි. ශිෂ්‍ය සංඛ්‍යාව අඩු පාසල් වෙත අධ්‍යයන කටයුතු සඳහා තම දරුවන් යැවීමට දෙමාපියන් අකමැති වීම, එම පාසල්වල ඉගැන්වීමට ගුරුවරුන් අකමැති වීම, එවැනි පාසල් පැවැතීම නිසා දෙමාපියන්ට තම දරුවන් ජනප්‍රිය පාසලකට ඇතුළත් කිරිම බාධාකාරී වීම, එම පාසල්වල සිසුන්ගේ විභාග ප්‍රතිඵල උසස් මට්ටමින් නොපැවැතීම, එම පාසල් වැසීයාම නවත්වා ගැනීම සඳහා මහත් වෙහෙසක් ගැනීමට විදුහල්පතිවරුන්ට හා ගුරුවරුන්ට සිදුවීම, ඉතා විශාල භූමි ප්‍රමාණයක්, ගොඩනැගිලි ඇතුළු අනෙකුත් භෞතික සම්පත් මෙන්ම මානව සම්පතද ඌන උපයෝජිතව පැවතීම, එවැනි පාසල් පවත්වාගෙන යාම සඳහා රජයට දැඩි වැය බරක් දැරීමට සිදුවීම යනාදී සුවිශේෂී වූ ගැටළු ශිෂ්‍ය සංඛ්‍යාව අවම වූ පාසල් තුළින් මතු වී තිබුණි.

මෙම ගැටළු අවම කිරීම සඳහා රජය විසින් විවිධ ව්‍යාපෘති හරහා විවිධ භෞතික සම්පත් පාසල් වෙත ලබා දී තිබූ අතර වර්තමානයේදී "හොඳම පාසල ළඟම පාසල" ව්‍යාපෘතිය එම අරමුණ වෙනුවෙන් ක්‍රියාත්මක වූ විශේෂ ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘති මගින් පාසල්වල සංවර්ධනය සඳහා ගොඩනැගිලි, ජල අවශ්‍යතා, සනීපාරක්ෂක අවශ්‍යතා ආදී සම්පත් වර්ධනය කිරීම තුළින් මෙම පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව වර්ධනය කිරීමට බලාපොරොත්තු වී තිබුණි. වර්ෂ ගණනාවක සිට විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මගින් අධ්‍යාපනය සඳහා විශාල වියදමක් කර තිබුණද, මෙම පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව වැඩිවීම හෝ ජනප්‍රිය පාසල්වල පවතින තදබදය අඩු කිරීමට සමත්වී නොතිබුණි. එසේ වුවද, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් හඳුන්වා දී ඇති නිර්නායකවලට පටහැනිව නව පාසල් ආරම්භ කිරීම එම පාසල අවට ඇති අනෙකුත් පාසල් වැසීයාමට හේතුවීම පාසල් වසා දැමීමට අදාළ නිර්ණායක පැවතියද පාසල් වසා දැමීම සඳහා කටයුතු නොකර එම පාසල් වැසී යන තත්වයට ක්‍රියා කිරීම, මෙම පාසැල්වල ගුරු ශිෂ්‍ය අනුපාතය ඉහළ අගයක් ගත්තද විභාග ප්‍රතිඵල සාර්ථක නොවීම, අතිරික්ත ගුරුවරුන් සිටීම, සමහර පාසල්වල ගුරු හිඟය හේතුවෙන් ශිෂ්‍යයන්ගේ කැමැත්ත පරිදි ද්විතියික අංශයේ කාණ්ඩ විෂයන් තෝරා ගැනීමට අවස්ථා නොමැතිවීමෙන් ශිෂ්‍යයන් වෙනත් පාසල්වලට යාම, ප්‍රාථමික අංශයේ එක් ගුරුවරයෙකු පංති කිපයක් එකතු කර ඉගැන්වීම හේතුවෙන් දරුවාට මනා අධ්‍යාපනයක් පාසල් කාල සීමාව තුළ නොලැබීම යන ප්‍රධාන අඩුපාඩු අනාවරණය විය. එමෙන්ම මෙම පාසල්වල කිසිදු ශිෂ්‍යයෙකු නොමැති ශ්‍රේණි සහිත පාසල්ද පැවති අතර ඇතැම් පාසල්වල පෙර පාසල්ද පවත්වා තිබුණි. එමගින් පාසලට ළමුන් ඇතුළත් වීම වැඩි කර ගැනීමට බලාපොරොත්තු වී තිබුණත්, ළමුන් පාසලට ඇතුල්වීමේ වර්ධනයක් ඇති වී නොතිබුණි. එමෙන්ම ඇතැම් පාසැල් වල ගොඩනැගිලි, ක්‍රීඩාපිටි, විද්‍යාගාර ආදී සම්පත් ඌන උපයෝජිතව පැවති අතර

ඇතැම් පාසල්වල නවීන භෞතික සම්පත් නොමැතිවීම ආදී කරුණු මෙහිදී අනාවරණය විය.

ඌන උපයෝජිත ගොඩනැගිලි හා ක්‍රීඩා පිටිය

තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම සඳහා රාජ්‍ය ආයතනවල සූදානම

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල රාජ්‍ය නායකයින්ගේ ප්‍රධානත්වයෙන් 2015 වර්ෂයේදී පැවැත්වූ තිරසර සංවර්ධන සමුළුවේදී තීරණය කරගත් පරිදි 2030 වර්ෂය වන විට සාමාජික රටවල් විසින් ළඟා කර ගත යුතු තිරසර සංවර්ධන අරමුණු 17 ක් හා ඉලක්ක 169 හා දර්ශක 244

ප්‍රකාශයට පත්කර ඇත. මෙම න්‍යාය පත්‍රය මානවයා, මිහිකත හා සෞභාගය වෙනුවෙන් සකස් කල සැලැස්මකි. එක් එක් සාමාජික රටවල්වලට ගැලපෙන පරිදි මෙම අරමුණු හා ඉලක්කයන් සපුරා ගැනීමේ ක්‍රියාවලිය 2016 වර්ෂයේ සිට ආරම්භ කර තිබුණු අතර මෙම වැඩසටහනේ මුල් අදියර ලෙස අදාළ පාර්ශව මේ පිළිබඳව දැනුවත්වීම හා සූදානම් වීම අපේක්ෂා කර තිබුණි. මෙම අරමුණු එකිනෙක බැඳී පවතින අතර රාජ්‍ය සහ පෞද්ගලික සියළු අංශවල සහයෝගීතාව යටතේ එම අරමුණු ලඟා කර ගත යුතුව තිබුණි.

ඒ අනුව 2017 වර්ෂයට අදාළව විගණිත ආයතන විසින් මෙම තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්කයන් ලඟාකර ගැනීමේ සූදානම පිළිබඳ පරීක්ෂා කිරීමේදී පළාත් පාලන ආයතන ඇතුළු රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන කාණ්ඩ 11 ක් යටතේ වර්ගීකරණය කරන ලද මුළු ආයතන 964 කින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පිළිබඳ දැනුවත් වීම, අරමුණු හා ඉලක්ක හඳුනාගැනීම, අරමුණු හා ඉලක්ක ආයතනයේ සැලසුම් වලට ඇතුළත් කිරීම, දර්ශක සකස් කිරීම, දත්ත පවත්වා ගැනීම, සංධිස්ථාන හඳුනාගැනීම යන කාර්යයන් සම්පූර්ණ කරන ලද ආයතන සංඛ්‍යාව පිළිවෙලින් 173, 132, 60, 17, 6, 9 ක් හා ප්‍රගතිය මැනීම ශූන්‍ය අගයන් විය. මෙම වැඩසටහනේ ප්‍රගතිය මැනීම සඳහා සම්පූර්ණ කළ යුතු ඉහත සඳහන් අවශ්‍ය කාර්යයන් ආයතන විසින් සම්පූර්ණ කර නොතිබීම නිසා වැඩසටහනේ ප්‍රගතිය මැනිය නොහැකි විය. ඒ අනුව මෙම වැඩසටහනේ සමස්ත කාර්යසාධනය අවම මට්ටමක පවතී. විස්තර රූපසටහන 20 හි වේ.



රූපසටහන - 20 - ආයතන විසින් තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනිමට ඇති සූදානම

පරිසර විගණනය

ලක්විජය බලාගාරයේ මෙහෙයුම් කටයුතු හා එහි පාරිසරික බලපෑම

වයඹ පළාතේ කල්පිටිය - නොරොච්චෝලේ ප්‍රදේශයේ පිහිටුවා ඇති මෙගාවොට් 900 ක ධාරිතාවයකින් යුත් ලංකා විදුලිබල මණ්ඩලයට අයත් ශ්‍රී ලංකාවේ ප්‍රථම සහ එකම ගල් අඟුරු තාප බලාගාරය ලක්විජය ගල් අතර 2011 හා 2014 වර්ෂයන්හි දී ප්‍රථම හා දෙවන අදියරවලින් මෙගාවොට් 900 ක් ජාතික විදුලිබල පද්ධතියට එකතු වී තිබුණි. ශ්‍රී ලංකාවේ වර්තමාන විදුලිබල උත්පාදනය සඳහා ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය යටතේ ප්‍රධාන බලාගාර 26 ක (පුද්ගලික බලාගාර හැර) දායකත්වයක් හා මුළු උපපොළවල් 247 ක් යටතේ 2017 වර්ෂයේදී නිෂ්පාදනය කරන ලද මුළු නිෂ්පාදනය ගිගාවොට් පැය 14,671.2 ක් වී තිබුණි. මෙම නිෂ්පාදනය සඳහා ලක්විජය බලාගාරයේ දායකත්වය සියයට 34.78 ක් වී තිබුණි. විදුලිබල නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන ප්‍රධාන මූලාශ්‍ර වන ජලය , ඉන්ධන හා ගල් අඟුරු අතරින් ගල් අඟුරු මඟින් විදුලිය නිපදවීම දෙවන අවම සාමාන්‍ය ඒකක පිරිවැය සහිත මූලාශ්‍රය වී තිබුණි.

මෙම බලාගාරය සම්බන්ධයෙන් සිදු කරන ලද පරිසර විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

- පසුගිය වර්ෂ 04 ක විදුලි නිෂ්පාදන දත්ත පරීක්‍ෂාවේදී ලක්විජය බලාගාරයේ දායකත්වයේ සාමාන්‍ය සියයට 32.58 ක් හා ජලවිදුලියෙන්, ඉන්ධනවලින් හා වෙනත් මූලාශ්‍රවලින් විදුලිය නිෂ්පාදනය පිළිවෙලින් සියයට 28.08 ක්, සියයට 13.80 ක් හා සියයට 25.54 ක් වී තිබුණි.
- 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා විදුලි උත්පාදන කාර්යයේදී ජල විදුලි මූලාශ්‍රය (Hydro) මඟින් විදුලිය නිපදවීම මුළු උත්පාදනයෙන් සියයට 37.46 (4,904/13,089*100) ක සිට සියයට 20.85 ක් (3,059/14,671*100) දක්වා අඩුවී තිබුණි. ජල මූලාශ්‍රය (Hydro) අඟුරු තාප බලාගාරය වේ. 2006 වර්ෂයේදී මෙගාවොට් 300 කින් යුතු ප්‍රථම අදියරද, 2010 වර්ෂයේදී මෙගාවොට් 600 කින් යුත් දෙවන අදියරද ආරම්භ කරන ලද

  පමණක් සලකා බැලීමේදී විදුලි උත්පාදනය සියයට 37.62 කින් අඩු වී තිබුණි. මෙම කාලය තුළ වූ විදුලි ඉල්ලුම සපුරාලීම සඳහා ඉන්ධන ප්‍රභවය (Oil) භාවිතා කරමින් විදුලි උත්පාදනය සියයට 140.85 කින් ද, පුද්ගලික අංශයෙන්(IPP) විදුලිය මිලදී ගැනීම සියයට 47.82 කින්ද ඉහළ ගොස් තිබුණි. ලංකා විදුලිබල මණ්ඩලයේ විදුලිබල උත්පාදන මූලාශ්‍ර අතරින් අවම දෙවන ඒකක පිරිවැය සහිත මූලාශ්‍රය වූ ගල් අඟුරු භාවිතා කර මෙම කාලය තුළදී උත්පාදනය කරන ලද විදුලි ඒකක සංඛ්‍යාවේ වර්ධනය සියයට 14.85 ක් පමණක් වී තිබුණි.
- විදුලිබල නිෂ්පාදන ක්‍රියාවලියේදී අවම පිරිවැය සහිත මූලාශ්‍රයන් යොදාගැනීම වෙනුවට ඉහළ පිරිවැයක් සහිත මූලාශ්‍ර කෙරෙහි අවධානය යොමු කර තිබුණි.
- දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ වූ පළාත් සභා බලතල මත 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තියේ I වන කොටසේ 2(1) උප වගන්තිය යටතේ වයඹ පළාත් පාරිසරික අධිකාරිය පිහිටුවා තිබුණි. ප්‍රඥප්තියේ 07(1) උප වගන්තිය ප්‍රකාරව පළාත් පාරිසරික උපදේශක සභාවක් පිහිටවිය යුතු අතර එහි සාමාජිකයන් විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කරන ලද හෝ ඒ අය අතුරින් පත් කරනු ලබන යම් සාමාජික සංඛ්‍යාවකින් යුක්ත විය යුතුව තිබුණි. ප්‍රඥප්තියේ 7(1)(ක) වගන්තිය ප්‍රකාරව මධ්‍යම පරිසර අධිකාරිය නියෝජනය කරන සාමාජිකයකුද එම උපදේශක

සභාවට ඇතුළත් විය යුතුය. 2018 මැයි 10 දින වන විට වයඹ පළාත් පාරිසරික උපදේශක සභාව ක්‍රියාත්මක කර නොතිබුණි.

- පළාත් පරිසර අධිකාරිය විසින් බලාගාරය වෙත නිකුත් කර තිබුණු කොන්දේසි 22 කින් යුත් බලපත්‍රය අලුත් කිරීමේදී (Renewal) එම කොන්දේසිවල අවශ්‍යතා බලාගාරය විසින් සපුරා තිබීමේ නිරවද්‍යතාවය හා පසුවිපරම් කිරීම ප්‍රමාණවත් ආකාරයෙන් සිදු නොකර 2017 ජූනි 29 දින දක්වා එම බලපත්‍රය අලුත් කිරීමට (Renewal) කටයුතු කර තිබුණි. මේ අනුව බලාගාරයේ ක්‍රියාකාරකම් තුළින් ඇතිවිය හැකි පාරිසරික අවධානම් තත්ත්වයන් කෙරෙහි බලධාරීන්ගේ අවධානය යොමු වී නොතිබුණි.
- විදුලි බල නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා ගල් අඟුරු දහනයේදී ප්‍රධාන වශයෙන් අතුරුඵල දෙකක් උත්පාදනය වන අතර එය පියාසර අළු (Fly Ash) සහ යටි අළු (Bottom Ash) වශයෙන් හැඳින්වේ. මෙම අළු බැහැර කරන අංගනය දළ වශයෙන් අක්කර 25 ක පමණ භූමි ප්‍රමාණයකින් යුක්තවේ. බලාගාරයේ ක්‍රියාත්මක වන එක් ඒකකයක අපේක්ෂිත ජීව කාලය වර්ෂ 35 ක් ලෙස සැලැසුම් අදියරේදී හඳුනාගෙන තිබුණි. මේ අනුව 2018 වර්ෂයේ සිට ඉදිරියට එම ඒකක 03 හි සියයට 65 ක කාර්යක්ෂමතාවයකින් ක්‍රියාත්මක වන්නේ යැයි උපකල්පනය මත උත්පාදනය විය හැකි පියාසර අළු හා යටි අළු ප්‍රමාණයන් පිළිවෙලින් මෙට්‍රික්ටොන් 6,405,750 ක් හා මෙට්‍රික්ටොන් 1,281,150 ක් විය හැකිව තිබුණි.
- ඉහත සඳහන් වූ මෙම අතුරු ඵලයන් බැහැර කිරීමේ ක්‍රමවේදයට අදාළව සිදු කරන ලද විගණන පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු අනාවරණය විය.
  - 2015 වර්ෂයේ සිට 2018 මැයි 10 දින දක්වා කාලය තුළ පියාසර අළු (Fly Ash) මෙට්‍රික්ටොන් 425,008 ක් පමණ අලෙවි කර තිබුණි. මෙම කාලපරිච්ඡේදය තුළ ඉතිරි වූ පියාසර අළු (Fly Ash) මෙට්‍රික් ටොන් 443,909 ක් පමණ අළු අංගනයේ තැන්පත් කර තිබුණි. විස්තර රූපසටහන 21 හි දැක්වේ.
  - ලක්විජය බලාගාරය මඟින් විදුලිය නිෂ්පාදන කාර්යයයේදී යොදාගනු ලබන ප්‍රධාන අමුද්‍රව්‍ය වූ ගල් අඟුරුවල පැවතිය යුතු ගුණාත්මකභාවය කෙරෙහි විශේෂ අවධානයක් යොමුකර නොතිබීම නිසා පාරිසරික ගැටළුවලට එය ප්‍රධාන හේතුවක් වී තිබුණි. එසේම ගල් අඟුරු දහනයේදී නිෂ්පාදනය වන පියාසර අළු හා යටි අළු වශයෙන් වූ අතුරු ඵල බැහැර කිරීමේ ක්‍රමවේදය ව්‍යාපෘති සැලැසුම් අදියරේදී හඳුනාගෙන තිබුණද, එම ක්‍රියාවලිය ප්‍රමාණවත් අයුරින් ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් ඇතිවන පාරිසරික ගැටළු පාලනය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමේදී බලාගාරය විසින් දැරිය යුතු පිරිවැය ඉහළයාමක් සිදු විය හැකිව තිබුණි. නමුත් පාරිසරික වශයෙන් ගැටළුවක් වූ පියාසර අළු, අංගනයේ තැන්පත් කිරීම වෙනුවට කඩිනම් ක්‍රියාමාර්ගයකින් අංගනයෙන් ඉවත් කර හඳුනාගත් වෙනත් නිෂ්පාදන සඳහා අමුද්‍රව්‍යයක් වශයෙන් යෙදවීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. පළාත් පරිසර අධිකාරිය විසින් ප්‍රසිද්ධ කරන ලද සංසරණ වායු තත්ත්ව පිළිබඳ ප්‍රමිතවලට අනුකූලව බලාගාරයේ මෙහෙයුම් කටයුතු සිදු කිරීම පිළිබඳව පළාත් පරිසර අධිකාරිය විසින් අඛණ්ඩව අධීක්ෂණය කර නොතිබුණි.
  - ගල් අඟුරු දහනයේදී විමෝචනය වන වායූන් හා බැර ලෝහ පරිසර තත්ත්වයකට හානිකර වේ. එම බැහැර කිරීමේ ක්‍රියාවලිය, බලාගාරයේ මෙහෙයුම් ක්‍රියාකාරීත්වය සඳහා උපයෝගී කරගන්නා මුහුදු ජලය පිරිපහදුවෙන් පසු නැවත මුහුදට

බැහැර කිරීමේ ක්‍රියාවලිය හා භූගත ජලය අඛණ්ඩව අධීක්ෂණය කිරීමේ අවශ්‍යතාවය විගණනයේදී නිරීක්ෂණය විය. තවද විමෝචක වායු සම්බන්ධයෙන් විමෝචක වායු ගෙන්දගම් වියුක්තකයේත් පියාසර අළු සම්බන්ධයෙන් ස්ථිති විද්‍යුත් අවක්ෂේපකයේත් කාර්යක්ෂමතාවය අඛණ්ඩව අධීක්ෂණය කළ යුතුව තිබුණි. බලාගාරයේ නඩත්තු කටයුතු සැලැස්මකට අනුව සිදු කිරීම හා ගල්අඟුරු අංගනයේ ඇති දූවිලි අංශු සුළඟ සමඟ ව්‍යාප්ත වීම වැළැක්වීම සඳහා ගල් අඟුරු අංගනය වටා දැනට පවතින සුළං බාධකය පුළුල් කිරීමත්, දැනට අංගනයේ ගොඩ ගසා ඇති අළු ගම්මානය දෙසට ව්‍යාප්ත වීම වැළැක්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමත් සිදුකළ යුතුය.

– බලාගාරයේ ක්‍රියාකාරකම් තුළින් ධීවර ජනතාවට වන බලපෑම අවම කිරීමටත්, මුහුදු පතුල සමීක්ෂණ කටයුතු සිදුකිරීම මඟින් ගල් අඟුරු තැන්පත් වී ඇති ප්‍රමාණය අවම කිරීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග සැලැසුම් කළ යුතුව තිබුණි. වෙරළ ඛාදනය අවම කිරීම හා වෙරළ තීරයේ ආරක්ෂාවට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම කෙරෙහි අවධානය යොමු කරවන අතර ඉහත සඳහන් සියළු ක්‍රියාමාර්ග ගැනීමෙන් පාරිසරික හානිය අවම කර ගනිමින් පරිසර හිතකාමී කර්මාන්තයක් ලෙස හා ජාතික ආර්ථිකයට එකතු කළ වටිනාකමක් සහිත විදුලිබල නිෂ්පාදන කර්මාන්තයක් වශයෙන් දායකත්වයක් ලබාදීමේ හැකියාව වර්ධනය කළ යුතුව ඇත.

රූපසටහන 21 - ගල්අඟුරු අංගනයේ ඇති දූවිලි අංශු

කැලණි ගඟේ ජල දූෂණය පිළිබඳ ගැටළුව

ශ්‍රී ලංකාවේ පිහිටි දෙවන දිගම ගංගාව හා හතරවන විශාලතම ජල ද්‍රෝණිය වන කැලණි ගංගාව බස්නාහිර පළාතේ ජීවත්වන ජනගහනයෙන් සියයට 80 කට ආසන්න ප්‍රමාණයකට පානීය ජලය සපයන්නා වූ ප්‍රධානතම ජල මූලාශ්‍රය වේ. මෙම ගංගා ද්‍රෝණිය ආශ්‍රිතව කර්මාන්තශාලා 10,511 කට ආසන්න සංඛ්‍යාවක් පිහිටා තිබෙන අතර මෙම කර්මාන්තශාලා හා ගෘහාශ්‍රිත ක්‍රියාකාරකම් නිසා ගංගා ජලය දූෂණය වීමේ ප්‍රවණතාවය වැඩි වෙමින් පැවැතුණි. එසේම කැලණි ගඟ ආශ්‍රිතව පිහිටි ප්‍රධාන ආයෝජන ප්‍රවර්ධන කළාප දෙකෙහි කටයුතු පරීක්ෂාවේදී එම කළාපවල ඇතැම් කර්මාන්ත ශාලාවල ක්‍රියාකාරකම් වලින් බැහැර කරන අප ජලය නියමිත ප්‍රතිකාර වලින් තොරව හා සම්මත පරාමිතීන්වලට අනුකූල නොවන ආකාරයට අභ්‍යන්තර ජල මූලාශ්‍රවලට හා පරිසරයට බැහැර කර

තිබුණි. උපද්‍රවකාරී හා උපද්‍රවකාරී නොවන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රමවේදය නිසි පරිදි කළමනාකරණය නොවීමත්, අපජලය පිරිපහදුවෙන් පසු ඉතිරිවන මඩිති බැහැර කිරීමේ ක්‍රමවේදයන් පරිසර හිතකාමී අන්දමින් සිදු කර නොමැති නිසා එහි බලපෑම අවසන් වශයෙන් ජල මූලාශ්‍රවලට එකතු වී තිබුණි. මිනිසා විසින් කැලණි ගඟ ආශ්‍රයෙන් ලබා ගන්නා ආර්ථික වාසිවල වර්ධනයක් සිදුවී තිබුණද, ගඟේ පාරිසරික අසිරිය හා පාරිසරික වටිනාකම ආරක්ෂා කිරීම සඳහා සියළු පාර්ශවයන්ගේ දායකත්වය අවම වී තිබුණි. ජලයේ දූෂණය හඳුනාගැනීමේ නිර්ණායක පරීක්ෂාවේදී ප්‍රධාන පාලම් සහිත ස්ථාන බොහොමයක ජලයේ ගුණත්වය මධ්‍යම පරිසර අධිකාරියේ සම්මත පරාමිතීන් ඉක්මවා තිබුණි. පිරිසිදු පානීය ජලය ජනතාවට ලබා දීම සඳහා ජල පවිත්‍රාගාරවලට දැරීමට සිදුවන පිරිවැය වැඩි වී තිබුණි. අභ්‍යන්තර ජල මූලාශ්‍රවලට අපජලය බැහැර කිරීමේදී මධ්‍යම පරිසර අධිකාරිය විසින් නියම කරන ලද ක්‍රමවේදය අනුගමනය නොකරන පාර්ශවයන් සඳහා ලබා දෙනු ලබන දණ්ඩනයන් සඳහා ජාතික පාරිසරික පනතේ දක්වා තිබූ ප්‍රතිපාදන ප්‍රමාණවත් වී නොතිබුණි.

කර්මාන්ත ව්‍යාප්තිය හේතුවෙන් කැලණි ගඟේ ජල දූෂණය වැඩි වී තිබුණි. මෙහිදී කැලණි මිටියාවතෙහි පිහිටි ප්‍රධාන කර්මාන්ත පුරයක් ලෙස ක්‍රියාත්මක වන සීතාවක අපනයන සැකසුම් කළාපය වෙත නිකුත් කර තිබුණු පරිසර ආරක්ෂණ බලපත්‍රය වර්ෂ 8 ක සිට කාලය ඉකුත් වී තිබුණි. මෙම කළාපයේ කර්මාන්ත 37ක අපජල පිරිපහදුව සඳහා පවතින පොදු අපජල පිරිපහදු මධ්‍යස්ථාන ධාරිතාවයද ප්‍රමාණවත් වී නොතිබුණි. අපජල පිරිපහදු මධ්‍යස්ථානයේ ක්ෂුද්‍ර ජීවීන් විනාශ කිරීමේ යන්ත්‍රය අක්‍රීය වී තිබීම නිසා ඉන් පාලනය වූ පරිසර හානිය නැවත පාරිසරික බලපෑමක් ලෙස එකතු වී තිබුණි.

තවද සීතාවක සහ බියගම අපනයන සැකසුම් කළාපවල කර්මාන්ත ශාලාවලින් ජනිත වන මඩිති (sludge) ඉවත් කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් යොදා නොතිබුණු බැවින් මඩිති වැසි ජලය සමඟ මිශ්‍රවී ජල මූලාශ්‍ර දූෂණය වීමේ අවදානමක් පැවැතුණි.

කැලණි ගඟ සම්බන්ධයෙන් කරන ලද නිරීක්ෂණ චාරිකාවලදී, ගඟ දෙපස අනවසර ඉදිකිරීම් හේතුවෙන් ගං ඉවුරු ඛාදනය වීමත්, ගඟට මායිම්ව ඉදිකළ හෝටල් සහ අනවසර ලෙස ඉදිකර තිබූ නිවාස වලින් බැහැර කරන ඝන අපද්‍රව්‍ය, මළ අපද්‍රව්‍ය සහ අපජලය ගඟේ ජලයට එකතු වීම, වාහන සේවා කිරීමේ මධ්‍යස්ථානවලින් සහ කර්මාන්තශාලාවලින් බැහැර කරන අපජලය පිරිපහදු කිරීමකින් තොරව බැහැර කිරීම ගංගා ජලය දූෂණයවීමේ ප්‍රධාන හේතු කාරකයන් වී තිබුණි.

රූපසටහන 22- කැලණි ගඟ දෙපස අනවසර ඉදිකිරීම්

පට්ටිවිල ඇළ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව අසලින් ආරම්භ වී ගලා එන අතර ඇළ දෙපස කර්මාන්තශාලා හා නිවාස පිහිටා ඇත. මෙම කර්මාන්තශාලාවලින් බැහැර කරන සියළු දූෂ්‍ය කාරකයන් මෙම ඇළ ඔස්සේ ගලා යාමට සලස්වා තිබුණි. විගණිත අවස්ථා කිහිපයකදීම මෙම ඇලෙහි ජලය අවපැහැයෙන් හා අපිරිසිදු තත්ත්වයෙන් යුක්තව පැවැතුණි. එසේම මෙම ඇළ පට්ටිවිල ජල පවිත්‍රාගාරයට ජලය ලබා ගන්නා ස්ථානයට(Intake) ඉතාමත් ආසන්නයෙන් කැලණි ගඟට එකතු වන ඇළ මාර්ගයක් වී තිබුණි. විස්තර රූපසටහන 23 හි දැක්වේ.

රූපසටහන 23- පට්ටිවිල ඇළ දූෂණය වී ඇති ආකාරය

කැලණි ගඟේ මෝදර සිට අඹතලේ දක්වා ප්‍රදේශ විශාල වශයෙන් පාරිසරික විනාශය ලක් වී තිබුණු අතර මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් මෙම විනාශය සිදු වී තිබුණි. නිසි කළමනාකරණයකින් තොරව කැලි කසල බැහැර කිරීම, ගං ඉවුරු සේදී යාම, ගඟට මායිම්ව අනවසර නිවාස හා ගොඩනැඟිලි ඉදි කිරීම සහ මළ අපද්‍රව්‍ය බැහැර කිරීම වැනි හේතූන් මෙම පරිසර විනාශයට බලපා තිබුණි.

රූපසටහන **24**– මෝදර සිට අඹතලේ දක්වා ප්‍රදේශවල පරිසර හානිය

පසුගිය වර්ෂ **05** ක කාල පරිච්ඡේදය තුළ විශාල වශයෙන් එක්වන අපවිත්‍රකාරකයන් නිසා අඹතලේ හා පට්ටිවිල ජල පවිත්‍රාගාර දෙකේ ජල පවිත්‍ර කිරීම් කටයුතු සඳහා රසායනික ද්‍රව්‍ය වැඩියෙන් යෙදීම නිසා ඒවා පිරිපහදු කිරීමේ සමස්ථ වියදම වැඩි වී තිබුණි. ජලයේ අපවිත්‍රතාවය ඉහළ යාම නිසා රසායනික ද්‍රව්‍ය වැඩි වශයෙන් යොදා ගැනීමට සිදු වී තිබුණි. ඒ අනුව අඹතලේ ජල පවිත්‍රාගාරයේ මුළු පිරිපහදු වියදම **2015** වර්ෂයේදී රු. මිලියන **879** ක සිට **2017** වර්ෂයේදී රු.මිලියන **929** දක්වා වැඩි වී තිබුණි. එසේම පට්ටිවිල ජල පවිත්‍රාගාරයේ භාවිතා කරන රසායනික ද්‍රව්‍ය ප්‍රමාණය පිළිවෙලින් ඇලම් සියයට **17** කින්, ලයිම් සියයට **37** කින් හා ක්ලොරීන් සියයට **74** ක ප්‍රමාණයකින් වැඩි වී තිබුණි. තවද ජලයේ පිරිපහදු කිරීමේ වියදම ක්‍රමයෙන් වැඩිම නිසා පානීය ජලය නිෂ්පාදනයේ පිරිවැය වැඩි වී එය පාරිභෝගිකයා වෙත විතැන්වීම සිදු වේ.

විමර්ශන විගණනය හා මහජන නියෝජිත සුවිශේෂ විගණන කටයුතු

මහවැලි ඉඩම්වල ගල්වලවල් පවත්වා ගෙන යාම

බහුදින යාත්‍රා මිලදී ගැනීමේදී ප්‍රමාද ගාස්තු අයකර නොගැනීම

මූල්‍ය වංචා හා අක්‍රමිකතා සිදු කිරීම

අඩුමිල මත ඉල්මනයිට් තොග අලෙවිකිරීම

අයථා ලෙස දීමනා ලබා ගැනීම

බාහිර පාර්ශවයන් වෙත මුදල් ලබාදීම

විමර්ශන විගණනය හා මහජන නියෝජන පිළිබඳ විගණන කටයුතු

පුද්ගලයෙකු හෝ කණ්ඩායමක් විසින් අසාධාරණව හෝ නීතියට පටහැනි ආකාරයට වාසියක් හෝ ප්‍රතිලාභයක් ලබාගැනීමට ඇති අවදනාම් පිළිබඳව එහි මූලයන් පරීක්ෂා කිරීම විමර්ශන විගණනයකින් අපේක්ෂා කරයි. මෙවැනි අවස්ථාවකදී වංචාවන් සොයා ගැනීම හා ඒවා වැලැක්වීමට පාලන පද්ධතිය ශක්තිමත් කිරීම කෙරෙහි විමර්ශන විගණනයේ සැලකිල්ල යොමු වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහනවවන ව්‍යවස්ථා සංශෝධනය මගින් රාජ්‍ය මූල්‍යණය නිසි පරිදි කළමනාකරණය කිරීම සඳහා රාජ්‍ය විගණනය ශක්තිමත් කර ඇත. විගණිත ආයතනවල රාජකාරි ලිපි ලේඛන පරීක්ෂා කිරීමට අමතරව, විමර්ශනය පුළුල් කිරීම පිණිස මහජන නියෝජන ද, කොමිෂන් සභාවල ඉල්ලීම්, රාජ්‍ය ගිණුම් පිළිබඳ හා පොදු ව්‍යවසාය පිළිබඳ කාරක සභාවල නියෝජන, ආයතන ප්‍රධානීන්ගේ නියෝජන හා මාධ්‍ය මගින් අනාවරණය වන තොරතුරු ලබා ගනිමින් රාජ්‍ය මූල්‍යණය කළමනාකරණය කාර්යක්ෂමව කිරීම කෙරෙහි විමර්ශන විගණනයෙන් කටයුතු කිරීමට අපේක්ෂා කරනු ලැබේ. මෙයට සමගාමීව දෙපාර්තමේන්තුව විසින් නිලධාරීන්ගේ දැනුම හා කුසලතාව වර්ධනය කිරීම සඳහා ක්‍රමවේදයන් වැඩිදියුණු කිරීමත්, අවශ්‍ය පුහුණුවීම් ලබාදීමත්, භෞතික සම්පත් , ක්ෂණික ඇමතුම් අංකයන්, විද්‍යුත් තැපැල යනාදිය වැඩිදියුණු කිරීමට කටයුතු කර ඇත.

විශේෂ විමර්ශන අංශය විසින් සමාලෝචිත වර්ෂයේදි වැදගත් හා ක්ෂණික අවධානය යොමු විය යුතු (නියෝජන) කෙරෙහි අවධානය යොමු කිරීමේදී නියෝජන 23 කට අදාළව රු.මිලියන 5,090.70 ක වියදම් පරීක්ෂා කිරීමේදී රජයට සිදුවී තිබුණු ඇස්තමේන්තුගත අලාභය රු.මිලියන 4,114.20 ක් වී තිබුණි. 2018 වර්ෂයේදී සිදුකළ විමර්ශනයන්ට අදාළ වැදගත් නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

මහවැලි ඉඩම්වල ගල්වලවල් පවත්වාගෙන යාම

හම්බන්තොට දිස්ත්‍රික්කය

කැළෑ ආඥා පනතේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂක ජනරාල්වරයා විසින් නිකුත් කර තිබුණු 2012 නොවැම්බර් 01 දිනැති අංක 03/2012 දරන චක්‍රලේඛය මත පදනම්ව හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගල්වලවල් 49 ක් පවත්වාගෙන යාම සඳහා පෞද්ගලික අංශයට අවසර ලබාදී තිබුණි. කැළෑ ආඥා පනත යටතේ පවරා දී ඇති බලතල මහවැලි ව්‍යාපෘති බලප්‍රදේශයට පමණක් සීමා කර තිබුණත් එම ගල්වලවල්වලින් බහුතරයක් 1981 අප්‍රේල් 16 දිනැති අංක 13 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය යටතේ වලවේ ගංගා ද්‍රෝණිය වලව විශේෂ මහවැලි ප්‍රදේශය ලෙස ප්‍රකාශයට පත්කර තිබූ සීමාවේ පිහිටි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් රක්ෂිත හා වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ප්‍රදේශය තුළ පිහිටා තිබුණි.

පාරිසරික ස්වභාවික සම්පත් අමාත්‍යවරයා විසින් කැළෑ ආඥා පනතේ 20 වැනි වගන්තියේ සඳහන් බලතල යටතේ ප්‍රකාශයට පත්කර ඇති 2009 මැයි 06 දිනැති අංක 1600/8 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද නිවේදනයේ සඳහන් පරිදි "එක් එක් වර්ෂයක් තුළ ඉවත් කරනු ලබන කළුගල් ප්‍රමාණය පදනම් කොටගෙන ගාස්තු අයකළ යුතු බව" සඳහන් වේ. කළුගල් කැඩීම සඳහා පවරා දි තිබු ඉඩම්වලින් ඉවත් කරනු ලබන කළු ගල් ප්‍රමාණය තිරණය කිරීමට අදාළ නිර්ණායක හා ගාස්තු අය කිරීම පිළිබඳ නිර්ණායක නිශ්චය කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

- භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැණීම් කාර්යාංශය විසින් 2010 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලසීමාව තුළ මෙම කළුගල් පිහිටි ස්ථාන සඳහා නිකුත් කළ බලපත්‍ර යටතේ රාජ්‍ය භාගය අයකිරීමේදී කළුගල් කියුබ් 1,266,991 ක් ඉවත් කර ඇති බවට ගණනය කර තිබුණි. මහවැලි අධිකාරිය විසින් එකි කාලසීමාව තුළ එම ස්ථාන 49 කින් කළුගල් කියුබ් 150,837 ක් සඳහා පමණක් ඉඩම් පරිහරණ ගාස්තු අය කර තිබුණි. ඒ අනුව ඉඩම් පරිහරණ ගාස්තු අය කිරීමේදි එම රාජ්‍ය ආයතනය සමඟ සන්නිවේදනයක් සහිතව ඉවත් කළ ගල් ප්‍රමාණය නිර්ණය නොකිරීම හේතුවෙන් මෙම ගල් වලවල් 49 මගින් පමණක් මහවැලි අධිකාරියට අයකළ හැකිව තිබු රු.මිලියන 1,117.50 ක ඉඩම් පරිහරණ ගාස්තුව රජයට අහිමි වී තිබුණි.

- එම ස්ථාන 49 අතරින් අක්කර 41.83 ක ප්‍රමාණයෙන් යුත් ස්ථාන 09 ක් පිළිබඳ මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් ලබාගත් මිනුම් අනුව අනුමත වෙඩි බෙහෙත් ප්‍රමාණය මත කැණිය හැකි බවට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැණීම් කාර්යාංශය මගින් පුරෝකථනය කළ ප්‍රමාණය මෙන් 1.9 ක ගුණයක් කැණීම් කර තිබුණි. බලපත්‍ර ලබාදීමේදී කළු ගලෙහි පිහිටිම පිළිබඳ සිතියම් ගත කර ඒ අනුව ඉඩම් පරිහරණ ගාස්තු අය කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා නොදීම නිසා මෙම ගල් වලවල් 49 ක් මගින් ඉවත් කර ඇති කළුගල් ප්‍රමාණය මත අහිමි වී තිබු පුරෝකථනයය කළ ඉඩම් පරිහරණ ගාස්තුව රු.මිලියන 2,407.28 ක් වී තිබුණි. විස්තර රූපසටහන 25 හා 26 හි දැක්වේ.

රූපසටන 25– අක්කර 20 ක භූමි ප්‍රදේශයක ඉංජිනේරු සමාගමක ගල් කොරිය

රූපසටහන 26 – දක්ෂිණ අධිවේගී මාර්ගයේ කි.මී.CH8+250-500 ස්ථානයේ යෝජිත මාර්ගය මධ්‍යයේ අනවසර ලෙස කැණීම් කර තිබුණු ගල්වල (මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මැනුම් අනුව ගැඹුර මීටර් 28 කි)

- 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 2 වගන්තිය යටතේ පාරිසරික කටයුතු අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත්කර තිබූ 1993 ජුනි 24 දිනැති අංක 772/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පල කල නිවේදනය අනුව හෙක්ටයාර් එකකට වැඩි ඉඩම් ප්‍රදේශයක ඇති කැළෑ ආශ්‍රිත නොවන ප්‍රයෝජනයක් සඳහා යොදා ගැනීම පරිසර පනතේ IV ඇ යටතේ නියමිත ව්‍යාපෘති ලෙස නම් කර තිබුණි. ඒ අනුව පරිසර පනතේ 23(ආ) වගන්තිය යටතේ වන පාරිසරික බලපෑම තක්සේරු කිරීමේ වාර්තාවක් ඉදිරිපත් කර පාරිසරික අනුමැතිය ලබාගෙන පරිසර අධිකාරියේ නියමනයන්ට අනුකූලව ක්‍රියාත්මක කළ යුතුව තිබුණත්, එම කළුගල් කැඩීමේ ව්‍යාපෘති සඳහා පාරිසරික ඇගයීම් කර නොතිබුණි. විස්තර රූපසටහන 27 හා 28 හි දැක්වේ.

රූපසටහන 27 බලපත්‍ර නීති උල්ලංඝණය කරමින් කැණීම් කර තිබුණු ගල් කොරියක්

රූපසටහන 28- මහවැලි ඉඩම්වල අනවසර ලෙස ගල් ඉවත් කර ඇති ඡායාරූපය

- ඛණිජ කැණීම සඳහා මහවැලි සංවර්ධන අධිකාරියට අයත් ඉඩම් බදු ලබා දීමේදී එම ඉඩම සඳහා පුනරුත්ථාපන සැලැසුමක් ලබාගෙන නොමැති අතර, පුනරුත්ථාපනය සම්බන්ධ වගකීම, ඉඩම් බලපත්‍රලාභීන්ට පැවැරෙන පරිදි ගිවිසුම්වල කොන්දේසි ඇතුළත් කර ඉඩම් ලබාදීමක් සිදු කර නොතිබුණි. 1980 අංක 27 දරන ජාතික පරිසර පනතේ විධිවිධානයන්ට අනුකූලව පාරිසරික ඇගයීම සිදු කිරිමකින් තොරව මෙම ඉඩම්වල කළුගල් කැඩීම සඳහා අවසර ලබාදී තිබුණි. බලපත්‍ර කොන්දේසි කඩ කරමින් හා ශාස්ත්‍ර ගෙවීම් පැහැර හරිමින් කැණීම් සිදුකර තිබූ අතර, ඒ සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ගයන්ට එළඹීමකින් තොරව තවදුරටත් බලපත්‍ර කාලය දීර්ඝ කිරීම සඳහා අනුමැතිය ලබාදී තිබුණි.

බදුල්ල දිස්ත්‍රික්කය

කැළෑ ආඥා පනතේ බලතල ක්‍රියාත්මක කිරිම සඳහා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂක ජනරාල්වරයා විසින් නිකුත් කර තිබුණු 2012 නොවැම්බර් 01 දිනැති අංක 03/2012 දරන චක්‍රලේඛය මත පදනම්ව ගල්වලවල් පවත්වාගෙන යාමට අවසර ලබාදී තිබූ බදුල්ල දිස්ත්‍රික්කයේ මහවැලි සී කළාපයේ හිරාඳුරුකෝට්ටේ ස්ථාන 03 ක් පරීක්ෂා කිරීමේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

- කළුගල් කැඩීම සඳහා අවසරදීමේදී එම ස්ථානයන්ගෙන් ඉවත් කරනු ලබන ගල් ප්‍රමාණය තීරණය කිරීමට අදාළව නිර්ණායක හඳුන්වා නොදීම, ගාස්තු අය කිරීම පිළිබඳ නිර්ණායක නිශ්චය කර නොතිබීම හේතුවෙන් පහත සඳහන් පරිදි රු.236.8 ක පාඩුවක් සිදුවී තිබුණි.

  - පාරිසරික හා ස්වභාවික සම්පත් අමාත්‍යවරයා විසින් කැළෑ ආඥා පනතේ 20 වැනි වගන්තියේ සඳහන් බලතල යටතේ ප්‍රකාශයට පත්කර ඇති 2009 මැයි 06 දිනැති අංක 1600/8 දරන අති විශේෂ ගැසට් නිවේදනය අනුව ඉවත් කරනු ලබන කළුගල් කියුබ් 01 ක් සඳහා අයකළ යුතු ගාස්තු අය නොකිරීම හා නිකුත් කළ වෙඩි බෙහෙත් ප්‍රමාණය මත පදනම්ව ප්‍රමාණය ගණනය නොකිරීම භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් රාජ්‍ය භාගය අයකිරීමට මෙම ක්‍රමය අනුගමනය කර තිබුණි. ඒ හේතුවෙන් රු.මිලියන 21.8 ක අලාභයක් සිදුවී තිබුණි. විගණන විමසුම් පසු 2018 ජූලි 20 දින සිට 2019 මැයි 31 දක්වා කාලසීමාව තුළ රු.මිලියන 7.04 ක් අය කරගෙන තිබුණි.

  - භෞතික පරීක්ෂාවේදී අනාවරණය වූ කරුණු අනුව මෙම ස්ථාන 03 න් ඉවත් කර ඇති කළුගල් ප්‍රමාණය කියුබ් 215,000 ක් පමණ විය. ඒ අනුව ඉඩම් පරිහරණ ගාස්තු අය කිරීමේදී ඉවත් කළ ප්‍රමාණය ගණනය කිරීමට ක්‍රමවේදයක් හඳුන්වා නොදීම නිසා එම ස්ථාන 03 න් රජයට අහිමි වී ඇති බවට පුරෝකථනය කළ ඉඩම් පරිහරණ ගාස්තුව රු.මිලියන 215 ක් වී තිබුණි.

  - 1980 අංක 27 දරණ ජාතික පරිසර පනතේ විධිවිධානයන්ට අනුකූලව පාරිසරික ඇගයීම සිදු කිරීමකින් තොරව මෙම ඉඩම්වල කළුගල් කැඩීම සඳහා අවසර ලබාදී තිබුණි. බලපත්‍ර කොන්දේසි කඩ කරමින් හා ගාස්තු ගෙවීම් පැහැර හරිමින් කැණීම් සිදුකර තිබූ අතර. ඒ සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ගයන්ට එළඹීමකින් තොරව තවදුරටත් බලපත්‍ර කාලය දීර්ඝ කිරීම සඳහා අනුමැතිය ලබාදී තිබුණි.

මොරගහකන්ද ව්‍යාපෘතිය

මොරගහකන්ද ව්‍යාපෘතියේ පාරිසරික ඇගයීම් වාර්තාව අනුව එම ව්‍යාපෘතියට අවශ්‍ය කළුගල් වනජීවින්ට අනතුරුදායක නොවන ලෙස ජලාශයට යටවන ප්‍රදේශයේ පිහිටි ස්ථාන 02 කින් ලබාගැනීමට සුදුසු බව නිර්දේශ කර තිබුණි. ඒ පිළිබඳ නොසලකා ඇලහැර - ගිරිතලේ අභයභූමියේ වස්ගමුව ජාතික රක්ෂිතය හරහා මින්නේරිය හා කවුඩුල්ල ජාතික උද්‍යානය වෙත වන අලින් සංක්‍රමණය වන ස්ථානයක පිහිටි හෙක්ටයාර් 07 ක් මීටර් 30 ක් පමණ උසට අංශය 90 ට වැඩි සිඝ්‍ර බෑවුමක් සහිතව කළුගල් කැඩීම කර තිබුණි. ඒ සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- මොරගහකන්ද ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් පසු අලි ඇතුන් සිය ගණනකගේ සංක්‍රමණ සඳහා මොරගහකන්ද ජලාශයේ බැම්මට පහළින් ඉතිරිව ඇති මීටර් 450 ක් පමණ පළල පාරිසරිකව ඉතා සංවේදී පටු බිම් තීරුවේ පිහිටා තිබූ මෙම ස්ථානයේ කළුගල් කැඩීම නිසා වන අලි සංක්‍රමණ සඳහා බාධා පැමිණ තිබුණි.

- ඒ හේතුවෙන් වන අලින්ගේ ගමන් මාර්ගය මොරගහකන්ද ව්‍යාපෘතිය යටතේ නව ජනාවාස පිහිටුවා ඇති ප්‍රදේශයට යොමුවීම තුළින් ඉදිරියේදී අලි මිනිස් ගැටුම් වර්ධනය වීමට හේතුවී තිබුණි.

- භූ විද්‍යා සමීක්ෂණ පතල් හා කැණීම් කාර්යාංශයේ වාර්තා කැළෑ ආඥා පනතේ (451 වැනි අධිකාරි) 20 වැනි වගන්තිය යටතේ පාරිසරික හා ස්වභාවික සම්පත් අමාත්‍යවරයා විසින් 2009 මැයි 06 දිනැති අංක 1600/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පල කළ නිවේදනය අනුව ගල් අනුව 2012 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලසීමාව තුළ මෙම කියුබ් එකකට ඉඩම් පරිහරණ ගාස්තු ලෙස රු.1,000 ක් බැගින් රු.මිලියන 1,891.95 ක් අය කිරීමට කටයුතු කර නොතිබුණි.
- පිබිදෙමු පොළොන්නරුව දිස්ත්‍රික් සංවර්ධන ස්ථානයෙන් කළුගල් කියුබ් 1,891,950 ක් ඉවත් කරගෙන තිබුණි. වැඩසටහන යටතේ වන මාර්ග සංවර්ධන වැඩසටහන සඳහා මෙම ස්ථානයෙන් තවදුරටත් කළුගල් ලබාගැනීමට, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර තිබුණි.

රූපසටහන 29 – මීටර් 10 න් 10 ට තට්ටු ක්‍රමයට කැණීම් කළ යුතු වුවත්, මීටර් 30 ක් පමණ උසට අංශක 90 ට වැඩි සිදු බෑවුමක් සහිතව කැණීම් කර තිබීම

- මුදල් අමාත්‍යවරයා හා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යවරයා විසින් ඒ සඳහා ඉදිරිපත් කර තිබූ නිරීක්ෂණ අනුව,

  – වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ එකඟත්වය ලබා දෙන්නේ නම්,
  – පාරිසරික සංරක්ෂණ කටයුතු නිසි ලෙස ඉටු කරන බවට මහාමාර්ග අමාත්‍යාංශය එකඟතාවය ලබාදෙන්නේ නම්,
  – ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර එය සතුටුදායක වුවහොත්, ගිවිසගත් කොන්ත්‍රාත් පිරිවැයෙහි කළුගල් සඳහා ඇතුළත් කර ඇති පිරිවැය අඩුකර ගෙවීම් කිරීමටත්,

  ආදි කරුණුවලට යටත්ව අනුමැතිය ලබාදී තිබුණි.

වනජීවී අධ්‍යක්ෂක ජනරාල්වරයා විසින් මෙම ගල්වලෙහි කටයුතු ඉදිරියටත් ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කළ නොහැකි බව 2017 අප්‍රේල් 03 දින දැනුම් දී තිබියදී, වනජීවී අධ්‍යක්ෂ (මෙහෙයුම්) විසින් 2017 මැයි 24 දින එම ස්ථානයේ පරීක්ෂණ පිපිරීමක් සඳහා අනුමැතිය ලබාදී තිබුණි.

එම අනුමැතිය භාවිතා කරමින් පෞද්ගලික සමාගම් 02 ක් විසින් අවබෝධතා ගිවිසුමක් අත්සන් කර අමාත්‍ය මණ්ඩල අනුමැතියෙහි සඳහන් කොන්දේසි නොසලකා අදාළ ගල්වලෙහි මෙහෙයුම් කටයුතු නැවත ආරම්භ කර රු.මිලියන 73.5 ඇස්තමේන්තුගත වටිනාකමකින් යුත් කළුගල් ඉවත් කර ගැනීමට කටයුතු කර තිබුණි.

වනජීවී දෙපාර්තමේන්තුවට අයත් භූමියෙහි අනවසර ක්‍රියාකාරකම් පිළිබඳ කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයකට එළඹ නොතිබුණි.

මහනුවර දිස්ත්‍රික්කය

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ දිගන නේවාසික ව්‍යාපාර කළමනාකරන කාර්යාලයට අයත් බල ප්‍රදේශය තුළ පිහිටි මහවැලි සංවර්ධන අධිකාරියට අයත් ඉඩම් කැබලි 03 ක් ඩොලමයිට් පොහොර නිෂ්පාදනය සඳහා හුණුගල් බණිජ ඉවත් කර ගැනීමට 2013 වර්ෂයේදී දිගන ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය විසින් බදු දී තිබුණි. 2009 මැයි 06 දින අංක 1600/18 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය අනුව කියුබ් 01 කට රු.1,000 ක් බැගින් ඉඩම් පරිහරණ ගාස්තුව අය කළ යුතුව තිබුණි. නමුත් කියුබ් 01 කට රු.300 බැගින් අය කර තිබුණි. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ තොරතුරු අනුව 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ කැණීම් මෙම ස්ථානයන්ගෙන් ගල් කියුබ් 31,684 ක් ඉවත් කරගෙන තිබුණි. ඒ සඳහා රු.මිලියන 30.18 ක් අඩුවෙන් ඉඩම් පරිහරණ ගාස්තු අය කර තිබුණි. 1980 අංක 27 දරන ජාතික පරිසර පනතේ විධිවිධානයන්ට අනුකූලව පාරිසරික ඇගයීම සිදු කිරීමකින් තොරව මෙම ඉඩම්වල හුණුගල් කැඩීම සඳහා අවසර ලබාදී තිබුණි. බලපත්‍ර කොන්දේසි කඩ කරමින් හා ගාස්තු ගෙවීම් පැහැර හරිමින් කැණීම් සිදුකර තිබු අතර, ඒ සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ගයන්ට එළඹීමකින් තොරව තවදුරටත් බලපත්‍ර කාලය දීර්ඝ කිරීම සඳහා අනුමැතිය ලබාදි තිබුණි.

CCTV කැමරා පද්ධතියක් ස්ථාපිත කිරිම

අම්පාර උසස් තාක්ෂණ ආයතනයේ පරිපාලන ගොඩනැගිල්ල, ගොවිපල, ඉදිරිපස දොරටුව, පරිගණක විද්‍යාගාර 01 හා 02 යන ස්ථාන ආවරණය වන පරිදි CCTV කැමරා පද්ධතියක් 2017 ජනවාරි මාසයේදී රු.මිලියන 1.24 ක් වැයකර ස්ථාපිත කර තිබුණි. මේ සම්බන්ධයෙන් ලංසු කැඳවා අවම ලංසුව ඉදිරිපත් කරන ලද සැපයුම්කරු තෝරාගෙන කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. එම කොන්ත්‍රාත්කරු සමඟ විධිමත් පරිදි කොන්ත්‍රාත් ගිවිසුමක් එළඹ නොතිබුණි. එමෙන්ම කාර්යසාධන සුරක්ෂණය ලබාගැනීමට ආයතනය විසින් කටයුතු කර නොතිබුණි. 2017 දෙසැම්බර් 09 දින වන විට සවිකරන ලද කැමරා 23 කින් කැමරා 14 ක් අක්‍රිය වී පැවැතුණි. එම අක්‍රිය කැමරා යථා තත්ත්වයට පත්කර ගැනීමට ආයතනය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබීම නිසා වැය කරන ලද සම්පූර්ණ මුදලම ආර්ථික නොවන වියදමක් වී තිබුණි.

බහුදින යාත්‍රා 10 ක් නිපදවා ප්‍රතිලාභීන් වෙත බෙදාදීම

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම, ගොඩබාන මසුන්ගේ ප්‍රමිතිය වැඩිදියුණු කිරීම හා ධීවර පද්ධතිය වැඩි දියුණු කිරීම සඳහා සීමා සහිත සීනෝර් ආයතනයෙන් සහ පෞද්ගලික යාත්‍රා නිෂ්පාදන ආයතන දෙකක් මගින් බහුදින යාත්‍රා 10 ක් නිෂ්පාදනය කරවා ගැනීමට කටයුතු කර තිබුණි. ඒ සඳහා වන මුළු පිරිවැයෙන් සියයට 50 ක් ප්‍රතිලාභීන් ගෙන් අයකර ගැනීමේ පදනම මත තෝරාගත් ප්‍රතිලාභීන් 10 දෙනෙකු වෙත ලබාදීමේ අරමුණ ඇතිව මෙම මිලදී ගැනීම සිදු කර තිබුණි. ඒ සම්බන්ධයෙන් සිදු කළ විමර්ශනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

- 2016 දෙසැම්බර් 06 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් 2017 වර්ෂයේ නිෂ්පාදනය කිරීමට සැලසුම්කර තිබුණු බහුදින යාත්‍රා 10 ක් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන 2016 වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ සලසා තිබුණු ප්‍රතිපාදනවලින් ලබාදෙන ලෙස මුදල් අමාත්‍යාංශයෙන් ඉල්ලුම් කර තිබුණි. ඒ සම්බන්ධයෙන් වූ මුදල් ඇමතිවරයාගේ නිර්දේශවලට අනුව 2017වර්ෂයේ කාර්යයන් සඳහා 2016 වර්ෂයේ ප්‍රතිපාදන ලබාදිය නොහැකි බව දන්වා තිබුණි. ඒ කෙරෙහි අවධානය යොමු නොකර 2016 වර්ෂය සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනවලින් යාත්‍රා 10 සඳහා මිලදී ගැනීම සඳහා අවශ්‍ය රු.මිලියන 149 ක් වූ සම්පූර්ණ මුදලම ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් සීනෝර් ආයතනය වෙත ලබාදී තිබුණි.

- 2016 මැයි 24 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව අඩි 55 ක් දිග බහුදින යාත්‍රාවක් නිෂ්පාදනය කිරීමට අදාළව අච්චුවක් නිෂ්පාදනය කිරීම සඳහා රු.මිලියන 22 ක මුදලක්ද, ආදර්ශ යාත්‍රාවක් නිෂ්පාදනය කිරීම සඳහා රු.මිලියන 26 ක් ද වශයෙන් රු.මිලියන 48 ක් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් සීනෝර් ආයතනය වෙත ලබාදී තිබුණි. සීනෝර් ආයතනය විසින් එම මුදලින් රු.මිලියන 0.36 ක් පමණක් වැයකර දැනට භාවිතා කරනු ලබන අච්චුවක් අළුත්වැඩියා කර එය භාවිතා කරමින් රු.මිලියන 26.06 ක් වැයකර අඩි 55 ක් දිග ආදර්ශ බෝට්ටුවක් නිෂ්පාදනය කර තිබුණි. ප්‍රතිලාභීන්ගේ අදහස් ලබා නොගෙන එම ආදර්ශ යාත්‍රාව නිෂ්පාදනය කිරීම නිසා එම ආදර්ශ යාත්‍රාවට සමාන වන සේ තම යාත්‍රාව නිෂ්පාදනය කරවා ගැනීමට ප්‍රතිලාභීන් අකමැති වී තිබුණි. ඒ අනුව නැවත රු.මිලියන 13.75 ක් වැයකර වෙනත් අච්චුවක් නිෂ්පාදනය කිරීමට සිදුවී තිබුණි. කෙසේ වුවද, මෙම අවස්ථා දෙකේදීම අච්චුව නිෂ්පාදනය සඳහා වැය වූ මුළු මුදල රු.මිලියන 14.11 ක් වන අතර අච්චුව නිෂ්පාදනය සඳහා ලබාදුන් මුදලින් තවත් රු.මිලියන 7.81 ක මුදලක් ඉතිරිවී තිබුණි. එම මුදල නැවත සීනෝර් ආයතනයෙන් අයකර ගැනීමට ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

- ප්‍රතිලාභීන් විසින් ප්‍රතික්ෂේප කරන ලද රු.මිලියන 26.06 ක් වැයකර නිෂ්පාදනය කරන ලද අඩි 55 ක් දිග ආදර්ශ බහුදින යාත්‍රාව වර්ෂයක පමණ කාලයක් නිෂ්ක්‍රියව තිබී පසුව විදේශ රටකට රු.මිලියන 21.22 කට විකිණීම නිසා රජයට රු.මිලියන 4.83 ක අලාභයක් සිදුවී තිබුණි. එමෙන්ම රජයේ ආධාර මත නිෂ්පාදනය කරන ලද මෙම ආදර්ශ යාත්‍රාව විකිණීමෙන් ලද මුදල නැවත රජය වෙත අයකර ගැනීමට දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

- 2016 දෙසැම්බර් 14 දින අමාත්‍ය මණ්ඩල තීරණයේ 24(අ) ඡේදය අනුව බහුදින යාත්‍රා නිෂ්පාදනය පෞද්ගලික යාත්‍රාංගන මගින් සිදුකර ගැනීම සඳහා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමට යටත්ව අනුමැතිය ලබා දී තිබුණි. නමුත් එම තීර්ණය නොසලකා ප්‍රතිලාභීන්ගේ කැමැත්ත පරිදි ආයතන දෙකකින් පමණක් ලංසු කැඳවා තිබූ අතර එම ආයතන දෙක මගින් සම මිල ගණන් ඉදිරිපත්කර තිබුණි.

- ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, සීමාසහිත සීනෝර් පදනම, පෞද්ගලික යාත්‍රාංගන හිමියන් හා ප්‍රතිලාභීන් විසින් අත්සන් කරන ලද සිව් පාර්ශවීය ගිවිසුම අනුව 2017 මාර්තු 31 දිනට පෙර යාත්‍රා නිෂ්පාදනය කර ප්‍රතිලාභීන් වෙත භාරදිය යුතුව තිබුණි. 2018 අගෝස්තු 31 දින වන විට පෞද්ගලික යාත්‍රාංගන වෙත පවරාදී තිබූ යාත්‍රා 05 කින් යාත්‍රා 02 ක්ද, සීනෝර් ආයතනය වෙත පවරාදී තිබූ යාත්‍රා 05 කින් යාත්‍රා 03 ක් ද වශයෙන් බහුදින යාත්‍රා 05 ක් පමණි. මේ නිසා ගිවිසුම් ප්‍රකාරව පෞද්ගලික යාත්‍රාංගන දෙකින් අය විය යුතු ප්‍රමාද ගාස්තුව වූ රු.මිලියන 4.49ක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

- සීමාසහිත සීනෝර් ආයතනය විසින් නිෂ්පාදනය කර ප්‍රතිලාභීන් වෙත ලබාදුන් එක් යාත්‍රාවක් නිෂ්පාදකයාගේ වගකීමට යටත්කාලය තුළ ගිනිගෙන විනාශවී තිබූ අතර එය යාන්ත්‍රික දෝෂයක් බවටද හඳුනාගෙන තිබුණි. එසේ තිබියදී සීනෝර් ආයතනය විසින් නැවත යාත්‍රාව අළුත්වැඩියාකර හෝ නව යාත්‍රාවක් නිෂ්පාදනය කර ප්‍රතිලාභියා වෙත ලබාදීමට කටයුතු කළ හැකිව තිබුණද, රක්ෂණයෙන් ලැබුණු සම්පූර්ණ මුදලම ප්‍රතිලාභියා වෙත ලබාදී තිබුණි. ප්‍රතිලාභියා විසින් යාත්‍රාව සඳහා ගෙවා තිබුණු මුළු පිරිවැයෙන් භාගයක් වන රු.මිලියන 12.35 ක් වී තිබුණත්, යාත්‍රාවේ මුළු වටිනාකම වූ රු.මිලියන 24.70 ක මුදලම ප්‍රතිලාභියා වෙත ගෙවා තිබුණි. මේ නිසා ප්‍රතිලාභියාට රු.මිලියන 12.35 ක් වැඩිපුර ගෙවා තිබුණි.

මූල්‍ය වංචා හා අක්‍රමිකතා සිදු කිරීම

2009 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළදී පේරාදෙනිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් රාජ්‍ය බැංකුවල ආයෝජනය කරන ලද ස්ථාවර තැන්පත් 14 ක් කල් පිරීමෙන් පසු නැවත ආයෝජනය කිරීමේදී කල්පිරෙන විට සමුච්චිත වී තිබුණු සම්පූර්ණ මුදලම නැවත ස්ථාවර තැන්පත්වල ආයෝජනය කර නොතිබුණි. ඉන් කොටසක් පමණක් නැවත ආයෝජනය කර ඉතිරි මුදලින් එකතුව රු.මිලියන 55.34 ක් එවකට අනුයුක්තව සිටි ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරයකු විසින් වංචනිකව ලබාගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ සාරාංශ කර පහත දක්වා ඇත.

- ස්ථාවර තැන්පත් අවසන් කර ඉන් ලැබෙන මුදලින් කොටසක් මහජන බැංකුවේ ජංගම ගිණුමට බැර කරන ලෙසත්, ඉතිරිය නව ස්ථාවර තැන්පතුවක් ආරම්භ කරන ලෙසත් ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අත්සනින් බැංකුවට ඉදිරිපත් කිරීම සඳහා සකස් කළ නිල නියෝග ලිපිය වෙනුවට අදාළ මුදල සඳහන් කර " මුදලින් ගෙවන්න" යනුවෙන් ව්‍යාජ උපදෙස් ඇතුළත් කරන ලද බැංකු නිල නියෝග ලිපියක් හා කූට ලෙස සංශෝධනය කරන ලද ස්ථාවර තැන්පත් කුවිතාන්සියක් හිටපු ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී විසින් ඔහු විසින්ම බැංකුවට ඉදිරිපත්කර මෙම මුදල් ලබාගෙන තිබුණු බව හිටපු අධ්‍යක්ෂවරයා ප්‍රකාශ කර තිබුණි. .

- මෙම මූල්‍ය වංචාව ගිණුම් වලින් වසන් කිරීම සඳහා ස්ථාවර තැන්පතු ස්වයංක්‍රීයව අළුත් කිරීමේදී සමුච්චිත වී තිබුණු තැන්පතු ශේෂය හා පොලිය ගිණුම්ගත කර නොතිබුණි.

- ස්ථාවර තැන්පතු 03 ක් අවසන් කර පොළිය සමඟ සමුච්ඡිත වටිනාකම වූ රු.මිලියන 3.08 ක මුදල විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ බැංකු ජංගම ගිණුම්වල තැන්පත් නොකර හා මුදල් පොතට ඇතුළත් නොකර වංචනික ලෙස මුදලින් ලබා ගෙන තිබුණි.

- ස්ථාවර තැන්පතු 03 ක් කල්පිරී අවසන් කරන අවස්ථාව වනවිට සමුච්චිතව තිබූ රු.මිලියන 24.51 ක ශේෂයෙන් රු.මිලියන 5.14 කින් නව ස්ථාවර තැන්පතු ආරම්භ කර, ඉතිරි රු.මිලියන 19.37 ක මුදල වංචනිකව ලබාගෙන තිබුණි. ආයතනය වෙත අවස්ථා තුනකදී රජයේ ප්‍රදාන යටතේ ලැබුණු රු.මිලියන 23.00 කින් රු.මිලියන 4.40 ක් පමණක් රජයේ ප්‍රදාන ලෙස ගිණුම් ගත කර තිබුණි. ඉතිරි රු.මිලියන 18.60 ක් ස්ථාවර තැන්පතු අවසන් කිරීමේදී වංචනික ලෙස ලබාගත් රු.මිලියන 19.37 ක මුදල පියවීම සඳහා යොදාගෙන තිබුණි.

- ස්ථාවර තැන්පතුවක් කල් පිරීමේදී සමුච්චිතව තිබූ රු.මිලියන 2.93 කින් රු.මිලියන 1.93 ක් හිටපු ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරයා ව්‍යාජ ලේඛන බැංකුවට ඉදිරිපත් කර මුදලින් ලබාගෙන තිබුණි. පසුව එම මුදල ජාතික විද්‍යා පදනම වෙත ගෙවූ බව හැඟවීම සඳහා විෂය භාර නිලධාරියා ලවා ගෙවීම් වවුචරයක් පිළියෙල කර එය අදාළ නිලධාරියකු ලවා අනුමත කරවා ගෙන ඔහු විසින්ම සහතික කර තමා භාරයේ රඳවා ගැනීම හා ජාතික විද්‍යා පදනම වෙත ගෙවා නොතිබුණි.

- ආයතනයේ අවශ්‍යතාවයන් සඳහා බැංකු නිල නියෝගයක් නොමැතිව අවශ්‍ය ඕනෑම අවස්ථාවකදී ස්ථාවර තැන්පතු මුදල් කර ගැනීමට හැකිවන පරිදි රු.මිලියන 5.68 ක් වූ ස්ථාවර තැන්පත් කුවිතාන්සි 06 ක් කලකට පෙර සිට ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ හා ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීගේ අත්සන හා නිල මුද්‍රාව තබා පිටසන්කර සේප්පුවේ බහා ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී භාරයේ රඳවා ගෙන තිබුණි.

- ආයතනයේ එදිනෙදා මෙහෙයුම් කටයුතු ඉටු කිරීම සඳහා අවශ්‍ය මුදල් ජංගම හා ඉතිරිකිරීමේ ගිණුම්වල රු.මිලියන 6 ක සිට රු. මිලියන 118 ක් පරාසයක ප්‍රමාණවලින් පැවැතුණි. එසේම රජයේ බැංකුවක RFC ගිණුම්වල රු.මිලියන 1 ක සිට රු. මිලියන 27 ක් පරාසයක මුදල් ශේෂද පැවැතුණි. ඒ ආකාරයෙන් පූර්ණ ද්‍රවශීලතා වත්කම් පැවැතියදී, ආයතනයේ අතිරික්ත මුදල්වලින් ආදායම් ඉපයීම සඳහා ස්ථාවර තැන්පතුවල ආයෝජන කර තිබුණු මුදල් ආපසු ලබා ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳ පැහැදිලි කිරීමක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

- මුදල් වංචා සිදුකිරීමේ අරමුණු ඇතිව 2008 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළදී ස්ථාවර තැන්පතු වෙනුවෙන් ලැබිය යුතු පොලී ආදායම රු.මිලියන 16.89 ක් වාර්ෂිකව මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. පොලී ආදායම ගිණුම්ගත නොකර ස්ථාවර තැන්පතුවල තථ්‍ය සමුච්චිත වටිනාකම අඩුවෙන් ගිණුම්වල ඇතුළත් කර එම පොලී මුදල් බැංකුවෙන් ලබාගෙන වංචා කිරීමට කටයුතු කර තිබුණු බවත්, එසේ ස්ථාවර තැන්පත් පොලී ගිණුම්ගත නොකිරීම තුළින් ස්ථාවර තැන්පත්වල තථ්‍ය වටිනාකම අඩුවෙන් ගිණුම්වල දැක්වීමට කටයුතු කර, වංචාකළ මුදල් ගිණුම්වලින් හෙළිදරව් කිරීම වසන් කිරීමට සැලසුම් සහගතව දීර්ඝ කාලයක් මුළුල්ලේ කටයුතු කර තිබුණි.

- ස්ථාවර තැන්පතු අවසන් කර වංචා සහගත ලෙස ආපසු මුදල් ලබාගැනීම හේතුවෙන් 2008 මාර්තු 14 දින සිට විගණන අවස්ථාව වන 2017 නොවැම්බර් 30 දින දක්වා උපයාගත හැකිව තිබුණු පොලී ආදායම රු.මිලියන 24.25 ක් ආයතනයට අහිමිවී තිබුණි.

- ස්ථාවර තැන්පතු ආරම්භ කිරීමේ අවශ්‍යතාවය තීරණය කිරීම හා ඒ සඳහා ස්ථාවර තැන්පත් ඉල්ලුම්පත් පිළියෙල කිරීම, ස්ථාවර තැන්පත් අවසන් කර මුදල් ලබා ගැනීමේ අවශ්‍යතාවය තීරණය කිරීම හා ඒ සඳහා බැංකු නිල නියෝග ලිපි පිළියෙල කිරීම, ස්ථාවර තැන්පතුවලට අදාල බැංකු මෙහෙයුම් කටයුතු සිදුකිරීම, ස්ථාවර තැන්පත්වලට අදාළ පොලී ගණනය කිරීම, පොලී ගිණුම්ගත කිරීම සඳහා ජර්නල් වවුචර් පිළියෙල කිරීම හා සහතික කිරීම, ස්ථාවර තැන්පතු ගනුදෙනුවලට අදාළ ගිණුම් කටයුතු පාලනය වෙනුවෙන් අභ්‍යන්තර පාලන පිළිවෙත් සැලැසුම්කර ක්‍රියාත්මක කිරීම යන සියළුම කටයුතු ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී විසින් සිදුකර තිබුණි.

- ස්ථාවර තැන්පත් ගනුදෙනු ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් පවත්වා ගතයුතු උපයෝගී ලේඛනය වන ස්ථාවර තැන්පතු ලේඛනය පවත්වා නොතිබීම හා ලිපි ගොනු විධිමත්ව පවත්වා නොතිබීම, ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී විසින් ක්‍රියාත්මක කළ ස්ථාවර තැන්පත් සම්බන්ධ මෙහෙයුම් හා ගිණුම් කටයුතු පිළිබඳව ප්‍රමාණවත් අධීක්ෂණයක් පවත්වා නොතිබීම

හා ආයතනයේ අභ්‍යන්තර පාලනය පිළිබඳව ඇගයීමක්	සිදුවන පරිදි අභ්‍යන්තර විගණනය ප්‍රමාණවත් ලෙස ක්‍රියාත්මක කිරීම	කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

ලංකා මිනරල් සැන්ඩ් සමාගමේ මෙහෙයුම් කටයුතු

ශ්‍රී ලංකාවේ ආර්ථික වශයෙන් ඵලදායී ඛනිජ වැලි පිරිපහදු කර අපනයනය කරනු ලබන ප්‍රධාන ආයතනයක් වන ලංකා මිනරල් සැන්ඩ් සමාගමේ මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් සිදු කළ විශේෂ විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ නිරීක්ෂණ සාරාංශ කර පහත දක්වා ඇත.

- **අපනයන ආදායම උපරිම කර නොගැනීම**

  ශ්‍රී ලංකාව තුළ ඛනිජ වැලි ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ස්ථාපිත වී නොතිබීම හේතුවෙන් සමාගමේ නිෂ්පාදනය වන ඛනිජ වැලි සඳහා දේශීය වෙළඳපල ඉල්ලුමක් නොතිබුණි. සමස්ථ නිෂ්පාදනයම අපනයන වෙළඳපොල කරා යොමු කර තිබුණි. ඒ අනුව සමාගමේ නිෂ්පාදන ජපානය, එක්සත් රාජධානිය, යුරෝපය, ඇමරිකා එක්සත් ජනපදය, ඉන්දියාව, පාකිස්තානය, චීනය වැනි රටවලට අපනයනය කරනු ලැබේ. එසේ වුවද, සමාගම විසින් විදේශ ගැනුම්කරුවන් හඳුනාගෙන සෘජුවම මුල් වෙළඳපල මුල් නිර්ව්‍යාජ ගැණුම්කරුවන් වෙත ඉල්මනයිට් අපනයනය කිරීම සිදු කර නොතිබුණු අතර, දේශීය හා විදේශීය ගැණුම්කරුවන් හරහා අලෙවිය සිදු කිරීම හේතුවෙන් ආදායම උපරිම වශයෙන් ලබා ගැනීමේ අවස්ථා අහිමි කර ගෙන තිබුණි.

- **ඉල්මනයිට් මෙ.ටො. 9000 ක් අලෙවි කිරීම.**

  මෙ.ටොන් 9,000 ක් වූ ඉල්මනයිට් තොගය අලෙවිය සඳහා ටෙන්ඩර් කටයුතු ආරම්භයට ප්‍රථම අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම කළ යුතුව තිබුණි. නමුත් එම අනුමැතිය ලබා ගැනීමට ප්‍රථම අලෙවි කිරීමට අදාළ ටෙන්ඩර් කැඳවීම්, මිල ගණන් ලබාගැනීම, තාක්ෂණික ඇගයීම් සිදුකිරීම, ටෙන්ඩර් මණ්ඩල අනුමැතිය ලබාදීම යනාදී සියළුම ටෙන්ඩර් කටයුතු සිදුකර තෝරාගත් ගැනුම්කරු වෙත ටෙන්ඩරය ප්‍රදානය කිරීමට ආසන්නව තිබියදී අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කර තිබුණි. මෙම සංදේශය මගින් විශාල වශයෙන් ගබඩාවල ගොඩගැසී තිබුණු සමාගමේ නිෂ්පාදිත ඉල්මනයිට් තොග පිළිබඳ තත්ත්වය, ලෝක වෙළඳපල ඉල්මනයිට් මිල ගණන් අනුව ටෙන්ඩරයෙන් ඉහළ මිලක් ලැබී ඇති බව, කලින් අලෙවි කළ මිල ගණන්වලට වඩා ඉහළ මිල ගණන් මෙම ටෙන්ඩරය සඳහා ලැබී ඇති බව, සමාගමේ ඛනිජ වැලි නිෂ්පාදනයේ වර්ධනය හේතුවෙන් ගබඩා ඉඩ පහසුකම් අවම වීම, දීර්ඝ කාලයක් තොග ගබඩා කර තැබීම හේතුවෙන් සිදුවන තොග අපතය හා හානි, නිෂ්පාදනය හා නිෂ්පාදනයේ වර්ධනය අනුව අලෙවි කිරීමේ අවශ්‍යතාවය යනාදී අත්‍යාවශ්‍ය හා වැදගත් කරුණු පිළිබඳව තොරතුරු අමාත්‍ය මණ්ඩලයේ අවධානය සඳහා යොමු කර නොතිබුණි.

  එමෙන්ම එම කාලවකවානුව තුළ ටයිටේනියම් ඩයොක්සයිඩ් (TIO_2) ප්‍රතිශතය සියයට 54 ක ඉල්මනයිට් මෙ.ටොන් 01 ක ලෝක වෙළඳපොලෙහි එ.ජ.ඩො. 215 ක්වූ ඉතා ඉහළ මිලක පැවැතුණි. එම මිල මත සමාගමේ අලෙවියට පවතින ටයිටේනියම් ඩයොක්සයිඩ් (TIO_2) ප්‍රතිශතය සියයට

51.54 ක්වූ ඉල්මනයිට් මෙ.ටොන් 01 ක් සඳහා එ.ජ.ඩො. 202.89 ක ඉහළ මිලක් ටෙන්ඩරයෙන් ලැබී තිබුණි. මේ පිළිබඳව අවධානය යොමු කර එම ටෙන්ඩර මිලට සමාගමේ ඉල්මනයිට් තොග අලෙවි කිරීමට අනුමැතිය ලබා නොදී ටෙන්ඩරය අවලංගු කිරීමට අමාත්‍යාංශයේ ලේකම්වරයා නියෝග කර තිබුණි. නමුත් ජාත්‍යන්තර වෙළඳපොලෙහි ඉල්මනයිට් මිල ඉහළ යාමේ ප්‍රවණතාවය සැලකිල්ලට ගනිමින් ජාත්‍යන්තර ලංසු කැඳවීම මගින් ඉල්මනයිට් තොග විකිණීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශ ලේකම්වරයා වෙත අමාත්‍ය මණ්ඩලය විසින් නියෝගය කර තිබුණි.

එසේම අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි අගය එකතු කළ ද්‍රව්‍ය නිපදවීම සඳහා වන යෝජනා ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයාගෙන් ඉල්ලා තිබුණද, එම කටයුතු ඉටු කිරීමද ඔහු විසින් පැහැර හැර තිබුණි. පළමු ටෙන්ඩරය සඳහා ඉල්මනයිට් මෙ.ටොන් 01 ක් වෙනුවෙන් එ.ජ.ඩො. 202.89 ක ඉහළ මිලක් ලැබී තිබුණද, එය අවලංගු කර පසුව නැවත ටෙන්ඩර් කිරීමෙන් එ.ජ.ඩො. 163.80 ක්වූ ඊට වඩා අඩු මිලක් ලැබී තිබුණි. ඉල්මනයිට් වෙළඳපල මිල ගණන් අඩුවීමේ ප්‍රවණතාවය සැලකිල්ලට ගෙන එම මිලටවත් ඉල්මනයිට් තොගය අලෙවි කිරීමට පියවර නොගෙන එම ටෙන්ඩරයද අවලංගු කර තිබුණි. වෙළඳපල මිල ගණන් වෙනස්වීමේ ප්‍රවණතාවය පිළිබඳව නිසි අධ්‍යයනයකින් හෝ ඇගයීමකින් තොරව හා විචක්ෂණශීලිභාවයකින් තොරව කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශ ලේකම්වරයා තම වගකීම් ඉටු නොකර පැහැර හැර තිබුණි.අවසාන වශයෙන් තුන්වන වරට කැඳවූ ටෙන්ඩරයේදී ඉල්මනයිට් මෙ.ටොන් 01 ක් එ.ජ.ඩො. 150 ක අඩු මිල මත ඉල්මනයිට් තොගය අලෙවි කිරිමට කටයුතු කර තිබුණි.

අමාත්‍යාංශය විසින් නිසි කලට, උචිත තීරණ ලබාදීමට පියවර නොගෙන අඩු මිල ගණන් මත මෙම ඉල්මනයිට් තොගය අලෙවි කිරීම හේතුවෙන් සමාගමට ලබාගත හැකිව තිබුණු රු.මිලියන 72.35 හෙවත් එ.ජ.ඩො.476,010 ක අලෙවි ආදායම් අහිමි වී තිබුණි.

බාහිර ආයතනයන් වෙත මුදල් ලබාදීම

සී/ස ලංකා මිනරල් සෑන්ඩ් සමාගම රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය යටතේ පැවති 2010 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාලය තුළ රාජ්‍ය ආයතන 04 කට තම අරමුණුවලට පටහැනිව එම ආයතන කළමනාකරණ මෙහෙයුම් කටයුතු සඳහා රු.මිලියන 545 ක කෙටිකාලීන ණය මුදල් සපයා තිබුණි. ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලයේ සේවක විශ්‍රාම වන්දි ගෙවීම, රාජ්‍ය වැවිලි සංස්ථාවේ සේවකයින්ට හිඟ සේවක වැටුප් ගෙවීමට, ජනතා වතු සංවර්ධන මන්ඩලයේ හදිසි ගෙවීම් සිදු කිරීම හා සීමාසහිත ජාතික කඩදාසි සමාගමේ හිඟ සේවක වැටුප් ගෙවීම සඳහා මෙම මුදල් උපයෝජනය කර තිබුණි. මෙම ණය මුදල් ගෙවීමේදී රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ උපදෙස් මත ක්‍රියාකර තිබූ අතර මෙම ණය ලබාදීම වෙනුවෙන් මුදල් අමාත්‍යාංශයේ, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලයේ සේවක විශ්‍රාම වන්දි ගෙවීම සඳහා රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව වෙත ලබාදී තිබූ රු.මිලියන 500 ක් සම්බන්ධයෙන් හැරුන විට අනෙක් ණය

මුදල් සම්බන්ධව අදාළ පාර්ශවයන් සමඟ ගිවිසුම් වලට එළඹ නොතිබුණි. 2018 නොවැම්බර් මාසය අවසන් වන විට ණය මුදල් ලබාදී වර්ෂ 05 ක් ඉක්මවා තිබුණද අදාල ණය මුදල් අය කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

දීමනා අයථා ලෙස ලබාගැනීම

ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ 2014 මාර්තු 01 දිනැති අංක එම්එම්අයි/05/06/2/13-2 දරන ලිපිය ප්‍රකාරව "රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 21/2013 ට යටත්ව මාසයකට නිවාඩු දින රාජකාරි කිරීම වෙනුවෙන් නිවාඩු දින වැටුප් ගෙවීමටත්, එම දිනයන් සඳහා වෙනත් කිසිදු දීමනාවක් නොගෙවීමටත්, වෙනත් කිසිදු දීමනාවක් සඳහා එම දින ගණනය නොකිරිමටත් කටයුතු කරන ලෙස" දන්වා තිබියදී රාජ්‍ය මුද්‍රණ දෙපාර්තමේන්තුවේ සේවකයින් 25 දෙනෙකු විසින් නිවාඩු දින වැටුප් ලබාගත් දිනවල පැය ගණන උපයෝගි කරගෙන 2017 වර්ෂය සඳහා රු.මිලියන 4.44 ක්ද, 2018 මැයි මාසය දක්වා රු.මිලියන 1.35 ක් ද හිමිකම් නොමැතිව වානිජ දීමනා ලබාගෙන තිබුණි.

ජාතික විගණන කාර්යාලයේ
2018 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම් පදනම

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අක්මුදල් ගැලැපුම් ගිණුම

2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ ආකෘතිය

ජාතික විගණන කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව පිළියෙල කර ඇත. එම චක්‍රලේඛයේ පහත සඳහන් පදනම් යොදා ගෙන 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර ඇත.

වාර්තා කිරීමේ පදනම

වාර්තාකරණ කාලපරිච්ඡේදය

2018 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවායේ බදු වන කාලසීමාව නොසළකා, ගිණුම් කාලසීමාව තුළ මුදල් ලැබීම් අනුව හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

මුදල් හා මුදල් සමාන දෑ

2018 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා			
	මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය		
ඇස්තමේන්තුගත		සටහන	තථ්‍ය
2018			2018
රුපියල්			රුපියල්
140,000,000	ආදායම් ලැබීම්		165,030,063
-	ආදායම් බදු	1	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-
140,000,000	බදු නොවන ආදායම් හා වෙනත්	4	165,030,063
140,000,000	මුළු ආදායම් ලැබීම් (අ)		**165,030,063**
-	ආදායම් නොවන ලැබීම්		-
-	භාණ්ඩාගාර අග්‍රිම		1,603,800,000
-	තැන්පතු		20,365,300
-	අත්තිකාරම් ගිණුම්		77,867,428
-	වෙනත් ලැබීම්		62,339,998
	එකතු කළ අගය මත බදු ලැබීම		26,380,610
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**1,790,753,336**
140,000,000	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**1,955,783,399**
	අඩුකළා : වියදම්		
-	පුනරාවර්තන වියදම්		
1,456,300,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	1,464,526,249
190,200,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	253,286,132
15,800,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	13,771,671
-	පොළී ගෙවීම්	8	-
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-
1,662,300,000	මුළු පුනරාවර්තන වියදම් (ඇ)		**1,731,584,052**
	මූලධන වියදම්		
12,500,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	12,212,631
23,000,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	14,834,169

-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-
87,000,000	හැකියා වර්ධනය	14	76,136,977
-	වෙනත් මූලධන වියදම්	15	-
122,500,000	මුළු මූලධන වියදම් (ඉ)		103,183,777
	ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)		118,826,825
	තැන්පතු ගෙවීම්		24,858,261
	අත්තිකාරම් ගෙවීම්		73,254,303
	එකතු කල අගය මත බදු ගෙවීම		20,714,261
1,784,800,000	මුළු වියදම් උ = (ඇ+ඉ+ඊ)		1,953,594,654
-	2018 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)		2,188,745

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අක්මුදල් ගැලපුම් ගිණුම		
	රුපියල්	රුපියල්
2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය අනුව අග්‍රිම ශේෂය		2,188,745
(+) එකතු කලා		
අත්තිකාරම් ගිණුමේ ගැලපුම් ශේෂය	1,204,496	
වෙනත් වැය විෂයයන්ගෙන් හර කිරීම්	2,404,375	3,608,871
		5,797,616
(-) අඩු කලා		
අත්තිකාරම් ලැබීම් ගැලපුම	2,462,180	
වෙනත් වැය විෂයයන් වෙනුවෙන් වියදම්	3,335,436	5,797,616
2018 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂය		(0)

2018 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2018 රුපියල්
මූල්‍ය නොවන වත්කම්		
දේපළ පිරියත හා උපකරණ	ඒසීඒ-6	126,731,812
මූල්‍ය වත්කම්		
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/ඒසීඒ-5(ඒ)	219,416,775
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-
මුළු වත්කම්		**346,148,587**
ශුද්ධ වත්කම් / ස්කන්ධය		
ශුද්ධ වත්කම්		205,279,869
දේපළ පිරියත හා උපකරණ සංචිතය		126,731,812
කුලී වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)	2,730,000
ජාතික විගණන අරමුදල		
ජංගම වගකීම්		
ගෙවිය යුතු VAT		4,542,134
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	6,864,772
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-
මුළු වගකීම්		**346,148,587**

මෙම මූල්‍ය ප්‍රකාශන යන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇති අතර ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා ,ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා නිවැරදි බවටත් මෙයින් සහතික කරමි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
විගණකාධිපති
2019 පෙබරවාරි   දින.

එස්.එම්.සී.ලක්ෂ්මි

ප්‍රධාන ගණකාධිකාරී
2019 පෙබරවාරි   දින

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2018
	රුපියල්
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්	
මුළු බදු ලැබීම්	
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	165,030,063
ආදායම් නොවන ලැබීම්	1,666,049,458
තැන්පත් ලැබීම්	20,365,300
එකතු කල අගය මත බදු	26,380,610
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	1,877,825,431
අඩුකළා : මුදල් වැය කිරීම්	
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	**1,820,864,723**
සහනාධාර සහ මාරුකිරීම්	-
බදු ගෙවීම්	20,714,261
තැන්පත් ගෙවීම්	24,858,261
මූල්‍ය පිරිවැය - භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	1,866,437,245
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	11,388,186
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්	
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	90,540
අත්තිකාරම් ආපසු අයකර ගැනීම	75,405,249
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	75,495,789
අඩුකළා : මුදල් වැය කිරීම්	
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	14,834,169
අත්තිකාරම් ගෙවීම	72,049,806
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	86,883,975
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	(11,388,186)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්	
දේශීය ණය ගැනීම්	-
විදේශීය ණය ගැනීම්	-
ප්‍රදානයන් ලැබීම්	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-
අඩුකළා : මුදල් වැය කිරීම්	
දේශීය ණය ආපසු ගෙවීම්	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-

තැන්පත් ගිණුම් හා අනෙකුත් වගකීම්වල වෙනස්වීම්	
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-

2018 වර්ෂයේදී ප්‍රසිද්ධ කළ විශේෂ විගණන වාර්තා වලින් සම්පිණ්ඩනය කරන ලද විගණන නිරීක්ෂණ

රාජ්‍ය ණය කළමනාකරණය
කෞතුකාගාරය සඳහා ස්මාර්ක ඉදිකිරිම
වෛද්‍ය සැපයීම්
වනජීවි සංරක්ෂණය පිළිබඳ කාර්යසාධනය
උමා ඔය බහු කාර්ය සංවරධන ව්‍යාපෘතිය
රාජ්‍ය සේවය ඩිජිටල්කරණය කිරිම
කිරි ගවයින් ආනයනය කිරිම
කුඹුරු පොහොර සහනාධාර වැඩසටහන
ශ්‍රී ලංකාවේ ක්‍රීඩාව හා එහි පරිපාලනය
බදු පරිපාලනය පරිගණකගත කිරිම
රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරින්ගේ කාර්යසාධනය
රත්‍රන් මිශ්‍ර පස් ආනයනය කිරිම
සමෘද්ධිලාභීයා සවිබල ගැන්වීම
කෘෂි ආර්ථිකය නඟා සිටුවීම
උතුරු මැද පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය
පුරන් කුඹුරු ගොඩකිරීමේ ක්‍රියාවලිය
ලොතරැයි සම්බන්ධයෙන් සිදු කරන ලද විශේෂ විගණන
SEMA ආයතනයේ කාර්යසාධනය
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කාර්යසාධනය
සිරකරුවන්ට ආරක්ෂාව හා රැකවරණය ලබාදීම
සේවක අර්ථසාධක අරමුදලේ අරමුදලෙහි කළමනාකරණය හා කාර්යසාධනය
රාජ්‍ය මුද්‍රණ සංස්ථාවේ කාර්යසාධනය
යාං ඔය වැලි කැණීම් ව්‍යාපෘතිය
මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය
වී අලෙවි මණ්ඩලයේ කාර්යසාධනය
නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඉටු කළ ව්‍යාපෘතිවල කාර්යසාධනය

2018 වර්ෂයේ නිකුත් කරන ලද විශේෂ විගණන වාර්තා

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව 2018 අගෝස්තු 01 දින දක්වා කාලය තුළදී විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් විශේෂ විගණන වාර්තා 08 ක් නිකුත් කරන ලදී. 2018 අගෝස්තු 01 දින සිට ක්‍රියාත්මක වන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 13 වන වගන්තිය ප්‍රකාරව 2018 අගෝස්තු 01 දිනෙන් පසුව විශේෂ විගණන වාර්තා 19 ක් ද වශයෙන් 2018 වර්ෂයේදී විශේෂ විගණන වාර්තා 27 ක් නිකුත් කරන ලදී. ජාතික විගණන කාර්යාලය විසින් විගණනය කරනු ලබන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල, රාජ්‍ය සමාගම් ඇතුළුව විගණකාධිපතිවරයා විසින් විගණනය කරනු ලබන අනෙකුත් ආයතනවලට අදාළව මෙම වාර්තා නිකුත් කර ඇත. එම වාර්තා නිකුත් කිරීම සඳහා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව හෝ රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් කරන ලද ඉල්ලීම්ද මා වෙත පැවැරී ඇති අභිමතානුසාරි බලතල මත මාධ්‍ය හෙළිදරව් කිරීම් හෝ මහජන නියෝජනයන් ආදී කරුණුද සළකා බලන ලද අතර ජාතික හා කාලීන වැදගත්කම පිළිබඳ අවධානය යොමු කරන ලදී.

පහත විස්තර දැක්වෙන පරිදි 2018 වර්ෂයේදී නිකුත් කරන ලද සියලුම විශේෂ විගණන වාර්තා පාර්ලිමේන්තුවෙහි සභාගත කර ඇති අතර, මෙම වාර්තා මහජනතාවගේ පරිශීලනය සඳහා ජාතික විගණන කාර්යාලයේ නිල වෙබ් අඩවියෙහි ත්‍රෛභාෂාවෙන් පළ කිරීමට ද කටයුතු කර ඇත.

2018 වර්ෂයේදී නිකුත් කළ විශේෂ විගණන වාර්තා පිළිබඳ තොරතුරු වගුව 03 හි දැක්වේ.

	වාර්තාවේ නම	වාර්තාවේ දිනය	වාර්තාව නිකුත් කිරීමට පසුබිම් වූ කරුණු
01	ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය කළමනාකරණය	2018.02.02	ශ්‍රී ලංකා ජනරජයේ ණය කළමනාකරණය පිළිබඳව විශ්ලේෂණාත්මක වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම
02	ලංකාවේ ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් මැදමුලන ඩී.ඒ.රාජපක්ෂ කෞතුකාගාරය හා ස්මාරකය ඉදිකිරීම	2018 .02.06	ඉදිකිරීම පිළිබඳව මේ වනවිට උද්ගතව ඇති විවාදාත්මක තත්ත්වය හා වැදගත්කම සලකා බැලීමෙන් අනතුරුව වාර්තාව ඉදිරිපත් කිරීම
03	සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයීම් අංශය විසින් සිදුකරනු ලබන වෛද්‍ය සැපයීම්,	2018.03.14	සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයීම් අංශය විසින් සිදු කරනු ලබන වෛද්‍ය සැපයීම්, සැපයීමේ ක්‍රියාවලියේ හඳුනාගත් අඩුපාඩු පැවතීම හේතුවෙන්
04	කොළඹ මහ නගර සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය	2018.03.16	මීතොටමුල්ල පොතුවිල්කුඹුර කුණු කන්ද නාය යාම නිසා සිදු වූ දේපල හා ජීවිත හානි සම්බන්ධයෙන් ඇති වූ සමාජයීය ප්‍රශ්නය

05	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය	2018.03.23	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වනජීවීන් සංරක්ෂණය සම්බන්ධයෙන් සහ වන සතුන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් වූ කාර්යභාරය නිසිලෙස ඉටුකර ඇද්දැයි යන්න පිළිබඳ විශාල කතිකාවතක් සමාජයේ ගොඩනැගෙමින් පැවතීම
06	මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය පිළිබඳ විගණකාධිපති විශේෂ විගණන වාර්තාව	2018.04.23	ඇති වූ විශාල ජල කාන්දුව හේතුවෙන් විශාල පාරිසරික හා සමාජීය ගැටළු රැසකට මුහුණපෑමට සිදුවීම හේතුවෙන්
07	රාජ්‍ය සේවය ඩිජිටල්කරණය කිරීමට අදාළව සීමාසහිත ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය (අයිසීටීඒ) ඉටුකර ඇති කාර්යභාරය පිළිබඳ විගණකාධිපති විශේෂ වාර්තාව	2018.05.09	රාජ්‍ය සේවය ඩිජිටල්කරණය කිරීම පිළිබඳව අයිසීටීඒ ආයතනයේ වගකීම නිසි ආකාරයෙන් ඉටු වී ඇත්ද යන්න සොයා බැලීම
08	කිරි ගවයින් ආනයන ව්‍යාපෘතිය පිළිබඳ විගණකාධිපති විශේෂ වාර්තාව	2018 .05. 04	කිරි ගවයින් 15,000 ක් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ගොවිපොල සඳහා ආනයනය කිරීමේ ඵලදායිතාවය ඇගයීම
09	ශ්‍රී ලංකාවේ කුඹුරු පොහොර සහනාධාර වැඩසටහන පිළිබඳ විශේෂ විගණන වාර්තාව.	2018.05.18	පොහොර සහනාධාර වැඩපිළිවෙල මඟින් අපේක්ෂා කර තිබූ අරමුණු ඉටු කර ගෙන තිබුණේද යන්න පරීක්ෂා කිරීම
10	ශ්‍රී ලංකාවේ ක්‍රීඩාව හා එහි පරිපාලනය පිළිබඳ විශේෂ විගණන වාර්තාව	2018.05.24	ශ්‍රී ලංකාවේ ක්‍රීඩාව කෙරෙහි බල පැවැත්වෙන නෛතික පසුබිම හා එම නෛතික පසුබිම තුළ ක්‍රියාත්මක විය යුතු ආයතනික කාර්යභාරය පිළිබඳ විමර්ශනාත්මකව පරීක්ෂා කර නිරීක්ෂණ ඉදිරිපත් කිරීම
11	බදු පරිපාලන පරිගණක පද්ධතියේ වැඩසටහන් මඟින් ස්වයංක්‍රීය තක්සේරු වාර්තා නිකුත් කිරීම අත්හිටුවීම හේතුවෙන් රාජ්‍ය ආදායමට සිදු වූ බලපෑම පිළිබඳ විගණකාධිපති විසින් ඉදිරිපත් කරනු ලබන විශේෂ විගණන වාර්තාව	2018.06.14	ස්වයංක්‍රීය පද්ධතිය නතර කිරීම හේතුවෙන් සිදු වූ බලපෑම පිළිබඳව සොයා බැලීම
12	රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරින්ගේ කාර්යසාධනය හා රාජකාරි තෘප්තිය පිළිබඳ විගණනය	2018.09.05	
13	රත්‍රන් මිශ්‍රිත පස් අපනයනය කිරීම පිළිබඳ විශේෂ විගණන වාර්තාව	2018.09.06	ස්වර්ණාභරණ නිෂ්පාදන ආයතනවලින් ඉවතලන රත්‍රන් මිශ්‍රිත සුන්බුන් පස් (Wastage Of Goldsmith urnet Residue)අපනයනයේදී ඇති වී තිබෙන ගැටළු සහගත තත්ත්වය පරීක්ෂා කිරීම
14	සමෘද්ධිලාභියා සවිබල ගැන්වීම සඳහා සමෘද්ධි වැඩසටහන්වල දායකත්වය	2018 .09.07	සමෘද්ධිලාභියා සවිබල ගැන්වීමේ වැඩසටහනේ ඵලදායිතාවය පරීක්ෂා කිරීම

15	කෘෂි ආර්ථිකය නගා සිටවීම සඳහා කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන්ගේ දායකත්වය ඇගයීම පිළිබඳව විශේෂ විගණන වාර්තාව	2018.09.12	කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන්ගෙන් ආර්ථිකයට සිදුවන දායකත්වය ප්‍රමාණවත් ද යන්න හඳුනාගැනීම සඳහා
16	උතුරු මැද පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කාර්යය සාධනය පිළිබඳ විශේෂ විගණන වාර්තාව	2018.09.12	උතුරු මැද පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවෙන් අපේක්ෂිත කාර්යභාරය නිසි පරිදි ඉටු වී ඇත්ද හා එම දෙපාර්තමේන්තුවෙන් ඵලදායි සේවයක් මහ ජනතාවට ලබාදීම උදෙසා උතුරු මැද පළාත් සභාව කටයුතු කර තිබේද යන්නත් සොයා බැලීම
17	කෑගල්ල දිස්ත්‍රික්කය තුළ පුරන් කුඹුරු ගොඩකිරීමේ ක්‍රියාවලිය තුළින් ඇතිවන බලපෑම පිළිබඳ විශේෂ විගණන වාර්තාව	2018.09.28	පුරන් කුඹුරු ගොඩකිරීම තුළින්ඇතිවන ක්‍රමයෙන් ඉහළ යාම නිසා ඇති වූ බලපෑම හඳුනාගැනීම සඳහා
18	ජාතික ලොතරැයි මණ්ඩලය විසින් පවත්වනු ලබන 32 වන කලම්බු එයාර් පෝර්ට් සුපර් ඩ්‍රෝ,නව ගුවන් තොටුපල හා ඩොලර් ෆෝචූන් ලොතරැයි සම්බන්ධයෙන් සිදුකරනු විශේෂ	2018.09. 09	කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපල ලොව වටා සංචාරකයින්ට සිත් ගන්නා සංක්‍රාන්ති මධ්‍යස්ථානයක් වශයෙන් ප්‍රවර්ධනය කිරීම සහ ගුවන් තොටුපොලෙන් උපයාගන්නා ආදායම වැඩිකර ගැනීම යන පරමාර්ථයෙන් නිකුත් කරන ලද ලොතරැයි වලින් අපේක්ෂිත කාර්යභාරය ඉටු වූවාද යන්න පරීක්ෂා කිරීම
19	SEMA ආයතනයේ කාර්යය සාධනය	2018.11. 01	උපායමාර්ගික ව්‍යවසාය කළමනාකරණ ආයතනය (SEMA) පිහිටුවීමේ මූලික අරමුණ ඉටු වී ඇත්ද යන්න හා මෙම ආයතනය තවදුරටත් පවත්වාගෙන යාමේ සඵලතාවය පරීක්ෂා කිරීම
20	ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙහි කාර්යසාධනය ඇගයීම සඳහා වූ විශේෂ විගණන වාර්තාව	2018.11.30	පසුගිය වසර 03 ක කාලපරිච්ඡේදය තුළ සිදු කිරීමට අපේක්ෂා කළ ජල ගාස්තු සංශෝධන යෝජනා ක්‍රියාත්මක වූයේ නම් එහි පීඩනය ජනතාවට දරා ගැනීමට සිදු විය හැකිව තිබුණු අතර පිරිවැය පාලනය කිරීමට, ආදායම් නොලබන ජල ප්‍රමාණය අවම කර ගැනීමට හා ව්‍යාපෘති කාර්ය සාධනය ඉහළ නංවා ගැනීමට අවශ්‍ය පියවර නොගෙන ජල ගාස්තු සංශෝධනය සඳහා පියවර ගැනීමට හේතු පරීක්ෂා කිරීම මෙම වාර්තාව නිකුත් කිරීමේ අරමුණ විය.
21	සිරකරුවන්ට ආරක්ෂාව හා රැකවරණය සලසමින් ඔවුන් පුනරුත්ථාපනය කර සමාජගත කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ විශේෂ විගණන වාර්තාව	2018.11.30	සිරකරුවන්ගේ ආරක්ෂාව, රැකවරණය හා පුනරුත්ථාපන ක්‍රියාවලිය නිසිපරිදි පවත්වාගෙන යාම සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුවෙහි කාර්යයභාරය ඇගයීම
22	සේවක අර්ථසාධක අරමුදලෙහි අරමුදල් කළමනාකරණයේ 2015 සහ 2016 වර්ෂයන්හි කාර්යසාධනය පිළිබඳ විශේෂ විගණන වාර්තාව	2018.11.30	2015 පෙබරවාරි හා 2016 මාර්තු මාසයන්හි දී සිදුකරන ලද ප්‍රශ්නගත බැඳුම්කර නිකුත් කිරීම් පිළිබඳව පරීක්ෂා කිරීම සඳහා පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී හා උක්ත බැඳුම්කර නිකුතුව පිළිබඳව වැඩිදුර පරීක්ෂා කිරීම සඳහා පත්කරන ලද ජනාධිපති කොමිසම හමුවේ ද සේවක අර්ථසාධක

			අරමුදල පිළිබඳව පුළුල් ලෙස ප්‍රශ්න කරන ලද අතර එම අවස්ථාවන්හිදී හඳුනාගන්නා ලද කරුණු ද සැලකිල්ලට ගනිමින් හා සෘජු ක්‍රමයට භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම අත්හිටුවීමට තීරණගත් කාලපරිච්ඡේදයට වැඩි අවධානය යොමු කරමින් අරමුදලෙහි අරමුදල් කළමනාකරණයේ කාර්යසාධනය පරීක්ෂා කිරීම සඳහා මෙම වාර්තාව සකස් කරන ලදි.
23	රාජ්‍ය මුද්‍රණ සංස්ථාවේ කාර්යසාධනය පිළිබඳ විශේෂ විගණන වාර්තාව	2018 .12.06	රාජ්‍ය අංශයේ ප්‍රමුඛ නිෂ්පාදන ආයතනයක් වන රාජ්‍ය මුද්‍රණ සංස්ථාව ආකාර්යක්ෂම වීමට හේතු පරීක්ෂා කිරීමටත් නැවතත් ලාභ ලබන ආයතනයක් බවට පත්කිරීමට ගත හැකි පියවර පරීක්ෂා කිරීමත් මෙම විගණනයේ අරමුණ විය.
24	යාන්ඔය වැලි කැණීම් ව්‍යාපෘතිය සම්බන්ධ විශේෂ විගණන වාර්තාව	2018.12.27	බලපත්‍ර නිකුත් කිරීමේදි මෙන්ම කැණීම් කිරීමේදි ඇති වී තිබෙන අවිධිමත්භාවය නිසා උද්ගත වී ඇති සමාජයීය, තාක්ෂණික හා පාරිසරික ගැටළු පිළිබඳව පරීක්ෂා කිරීම සඳහාත් ඒ සඳහා ලබාදිය හැකි විසඳුම් යෝජනා කිරීමත් මෙම වාර්තාවේ අරමුණු විය.
25	මධ්‍යම අධිවේගි මාර්ග ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යනය සහ එම ව්‍යාපෘතිය සඳහා වන ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ විශේෂ විගණන වාර්තාව	2018 .12. 28	මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යනය සහ එම ව්‍යාපෘතිය සඳහා වන ප්‍රසම්පාදන කටයුතු නිසි පරිදි සිදු වූයේද යන්න ඇගයීම සඳහා
26	වී අලෙවි මණ්ඩලයේ කාර්යසාධනය පිළිබඳ විශේෂ විගණන වාර්තාව	2018.12.28	අකාර්යක්ෂම තත්ත්වයට ආයතනය පත් වීමට හේතු පරීක්ෂා කිරීම සඳහාත් නැවත කාර්යක්ෂම තත්ත්වයට ආයතනය පත් කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පරීක්ෂා කිරීම සඳහාත් මෙම විගණනය සිදු කරන ලදී.
27	නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඉටුකළ සංවර්ධන ව්‍යාපෘති වල කාර්යය පිළිබඳ විශේෂ විගණන වාර්තාව	2018 .12.31	නිසි ප්‍රමිතියකින් තොර ව්‍යාපෘති හා නිම නොකරන ලද ව්‍යාපෘති බිහිවීමත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී රාජ්‍ය මුදල් අවභාවිතා කිරීමත් මගින් මතු වී ඇති ආර්ථික මෙන්ම සමාජීය ගැටළු හඳුනාගැනීම.

වගුව 03. – 2018 වර්ෂයේදී නිකුත් කළ විශේෂ විගණන වාර්තා

2018 වර්ෂයේදී නිකුත් කරන ලද වාර්තාවල සඳහන් විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර මෙම පරිච්ඡේදයෙහි දක්වා ඇත.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය කළමනාකරණය

මුළු රාජ්‍ය ණය හා මුළු වත්කම් වාර්තා කිරීම

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2005 වර්ෂය අවසානයට රු.බිලියන 2,142 ක් රාජ්‍ය ණය වශයෙන් ගිණුම්ගත කර තිබුණි. 2016 වර්ෂය අවසාන වන විට එම ණය ශේෂය රු.බිලියන 6,719 කින් ඉක්මවා රු.බිලියන 8,861 ක් දක්වා වැඩි වී තිබුණි. එසේම, 2005 වර්ෂය අවසානයේදී රු.බිලියන 293 ක්ව පැවති මුළු වත්කම් (මූල්‍ය වත්කම් පමණි) ප්‍රමාණය, 2016 වර්ෂය අවසාන වන විට රු.බිලියන 794 කින් වැඩිවී රු.බිලියන 1,087 ක් වි තිබුණි. මේ අනුව රටේ ණය බර ඉතා සීඝ්‍රයෙන් ඉහළ යමින් තිබුණද, එම ණය මුදල් උපයෝජනයෙන් ජනිත වූ වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කර නොතිබුණි.

2016 දෙසැම්බර් 31 දිනට මුළු රාජ්‍ය ණය ශේෂය රු.බිලියන 8,861 ක් (රජය විසින් කෙටිකාලීන ණය වශයෙන් මහ බැංකුවෙන් ලබා ගෙන ඇති අත්තිකාරම්ද ඇතුළුව) වී තිබුණි. එම ණය ශේෂය 2016 වර්ෂයේ රු.බිලියන 11,839 ක් වූ දළ දේශිය නිෂ්පාදනය සමඟ සැසඳීමේ එය සියයට 74.8 ක් පමණක් වි තිබුණි. ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්තාවලට අනුව 2016 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ණය ශේෂය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 79.3 ක් වි තිබුණි.

මුළු ශුද්ධ රාජ්‍ය ණය (මුළු ණය ගැනීම්වලින් ණය වාරික ආපසු ගෙවීම් අඩුකළ පසු) ප්‍රමාණයට සමාන හෝ ඊට වැඩි ප්‍රමාණයක රාජ්‍ය ආයෝජන පවතින්නේ නම් ණය මුදල් උපයෝජනය තුළින් රටේ සංවර්ධනයක් සිදුවී ඇති බව නිරූපණය වුවද, 2016 වර්ෂයේ හා ඉකුත් වර්ෂවල රාජ්‍ය ආයෝජන ලෙස හඳුනාගත් වටිනාකම අදාළ වර්ෂය තුළ ලබාගත් ශුද්ධ ණය ප්‍රමාණයට වඩා අඩුවී තිබුණි. එසේම, එම රාජ්‍ය ආයෝජන තුළ රාජ්‍ය ආයතනවලට ලබා දෙන ප්‍රදාන, සමාජ සුභසාධන ස්වරූපයේ සංවර්ධන සහාය කාර්යයන් සඳහා කරනු ලබන වැය කිරීම, පළාත් සභාවලට ලබාදෙන දායකත්වය ආදී වියදම්ද ඇතුළත් වේ. ඒ අනුව, රජය විසින් ලබාගනු ලබන මුළු ශුද්ධ ණයවලින් සැළකිය යුතු ප්‍රමාණයක් පුනරාවර්තන ස්වරූපයේ වැය සඳහා භාවිතා කර තිබුණි.

එසේම, දීර්ඝ කාලයක් මුළුල්ලේ රජය විසින් ලබාගනු ලබන දේශිය හා විදේශිය ණයවලින් සැළකිය යුතු ප්‍රමාණයක් ණය වාරික හා පොළී ගෙවීම සඳහා යොදා ගැනීමට සිදුවී තිබුණි. මෙනිසා රටේ අපේක්ෂිත සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමට අපොහොසත් වී තිබුණි. ඒ අනුව, ණය ගැනීම්වලට සාපේක්ෂව රාජ්‍ය ආයෝජන වර්ධනය නොවීම තුළ ප්‍රමාණවත් පරිදි නිෂ්පාදන කර්මාන්ත ඇති නොවීම හා පුනරාවර්ථන වියදම් ක්‍රමිකව ඉහළ යාම හේතුවෙන් රාජ්‍ය ණය බර දීර්ඝ කාලයක් මුළුල්ලේ අඛණ්ඩව වර්ධනය වී තිබුණි. එසේම, සංවර්ධන ව්‍යාපෘති අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක වී නොතිබීම හේතුවෙන් රටේ මූල්‍ය ස්ථාවරත්වයට මෙන්ම ණය ආපසු ගෙවීමේ හැකියාවටද අහිතකර ලෙස බලපෑම් ඇතිවිය හැකිය.

ඒක පුද්ගල ණය ප්‍රමාණය

මුළු රාජ්‍ය ණය, මධ්‍ය වාර්ෂික ජනගහනය සමඟ සැසඳීමේදී 2005 දෙසැම්බර් 31 දිනට රු.108,908 ක් වූ ඒක පුද්ගල ණය ප්‍රමාණය, 2016 දෙසැම්බර් 31 දිනට රු.417,913 ක් වි තිබුණි.

එසේම, එය 2015 දෙසැම්බර් 31 දිනට රු.373,462 ක් වූ ඒකපුද්ගල ණය ප්‍රමාණය සමඟ සැසඳීමේදී 2016 දෙසැම්බර් 31 දිනට රු.44,451 ක එනම් සියයට 12 කින් පමණ වැඩි වී තිබුණි. තවද, මුළු රාජ්‍ය ණය තුළ විදේශ ණය සැළකිය යුතු ප්‍රමාණයක් (එනම් සියයට 40 ට අධික ප්‍රමාණයක්) ඇතුළත් වී තිබුණු අතර එය අඛණ්ඩව වර්ධනය වීමත්, විවිධ හේතූන් නිසා විදේශ මුදල්වලට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වීමත්, නිසා ඒකපුද්ගල ණය ප්‍රමාණයේ තථ්‍ය වටිනාකම තවදුරටත් ඉහළ යාමේ ඉඩකඩක් පැවැතුණි. එසේම, ගිණුම්ගත නොවූ ණය (ප්‍රතිපාදන නොමැතිවීම මත ගිණුම්ගත නොකළ විදේශ ණය සහ භාණ්ඩාගාර බැඳුම්කරවල මුහුණත අගය අඩුවෙන් සටහන් කිරීම) සහ ශේෂ පත්‍රයෙන් පිටත ගිණුම් ගත කර ඇති විදේශ ණය ප්‍රමාණය (Off Balance Sheet Items) ඉහත ණය ශේෂයට ඇතුළත් නොවන අතර, එම ණය ශේෂයද ගැලපූ පසු ඒකපුද්ගල ණය ප්‍රමාණය තවදුරටත් ඉහළ අගයක් ගනු ඇත. .

අයවැය හිඟය මූල්‍යනය කිරීම (අයවැය හිඟය පියවීම)

2016 වර්ෂයේ ජනරජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, අයවැය හිඟය මූල්‍යනය කිරීම සඳහා ඇස්තමේන්තු කරන ලද මුළු මූල්‍යකරණයේ එකතුව රු.බිලියන 1,724 ක් වී තිබුණි. නමුත් තථ්‍ය මූල්‍යකරණයේ එකතුව රු.බිලියන 666 ක් වී තිබුණි. සංශෝධිත අයවැය ඇස්තමේන්තුවට අනුව, 2016 වර්ෂයේ අපේක්ෂිත දේශීය හා විදේශ ණය ගැනීම්වල එකතුව රු.බිලියන 2,438 ක් වී තිබුණත්, තථ්‍ය ණය ගැනීම්වල එකතුව රු.බිලියන 1,616 ක් වී තිබුණි. දේශීය හා විදේශ ණය ගැනීම්වල තථ්‍ය වටිනාකම රු. බිලියන 1,616 ක් වූයෙන් එය සංශෝධිත අයවැය ඇස්තමේන්තුවට සාපේක්ෂව රු.බිලියන 822 ක එනම් සියයට 33.7 ක අඩු වීමකි. 2016 වර්ෂයේදී රජය විසින් ලබාගෙන තිබූ මුළු තථ්‍ය ණය ප්‍රමාණය සංශෝධිත අයවැය ඇස්තමේන්තුව සමඟ සසඳා වගුව 04 හි දැක්වේ.

ණය වර්ගය	2016 වර්ෂය තුළ ණය ගැනීම්			
	සංශෝධිත අයවැය ඇස්තමේන්තුව අනුව	තථ්‍ය ණය ලබා ගැනිම	අයවැය ඇස්තමේන්තුවට සාපේක්ෂව තථ්‍ය ණය ගැනීම්වල වැඩිවීම/(අඩුවීම)	
			වටිනාකම	ප්‍රතිශතය
	රු. බිලියන	රු. බිලියන	රු. බිලියන	
විදේශ ණය	300	574	274	91.3
දේශීය ණය*	2,138	1,042	(1,096)	(51.3)
එකතුව	2,438	1,616	(822)	(33.7)

වගුව 04 – සංශෝධිත අයවැය ඇස්තමේන්තුවට සාපේක්ෂව තථ්‍ය ණය ප්‍රමාණය වැඩිවීම

** දේශීය ණය තුළ භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම මඟින් ලබාගත් ශුද්ධ වටිනාකම ඇතුළත් වේ.*

මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොමැති ණය ශේෂ

රජයේ මූල්‍ය ප්‍රකාශන වල ශේෂපත්‍රයෙන් පිටත ගිණුම්ගත කළ ණය (Off Balance Sheet Items) විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනට රජය විසින් ගෙවිය යුතුව තිබුණු ණය ශේෂය රු.බිලියන 8,861 ක් වී තිබුණි. පසුගිය වර්ෂ කිහිපයකදී ලබාගෙන තිබුණු, තවදුරටත් ගෙවීමට ඉතිරිව තිබුණු රු.බිලියන 826 ක ණය ශේෂ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

ණය ගිවිසුම් 14 කට අදාළව 2016 වර්ෂයේදි ලැබී තිබුණු විදේශ ණයවලින් රු.බිලියන 5 ක් හා, ණය ගිවිසුම් 09 කට අදාළව 2015 වර්ෂයේදි ලැබී තිබුණු විදේශ ණය වලින් රු.බිලියනයක් වශයෙන් එකතුව රු.බිලියන 6 ක ණය උපලබ්ධි වී තිබුණද, එම ණය මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

මූල්‍ය කාර්යසාධනය

2015 වර්ෂයේදී රු.බිලියන 2,357 ක් වූ මුළු රාජ්‍ය වියදම 2016 වර්ෂයේදී රු.බිලියන 2,365 ක් දක්වා රු.බිලියන 8 කින් එනම් සියයට එකකට වඩා අඩු ප්‍රතිශතයකින් වැඩි වී තිබුණද, මුළු පුනරාවර්තන වියදම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රු.බිලියන 98 කින් එනම් සියයට 5.9 කින් වැඩි වී තිබුණි. ඉකුත් වර්ෂයේදී මුළු පුනරාවර්තන වියදමෙන් සියයට 31.5 ක් වූ ණය සඳහා පොළී ගෙවීම්, 2016 වර්ෂයේදී සියයට 34.5 ක් දක්වා වැඩි වී තිබුණි. ඒ අනුව 2015 වර්ෂයේදී මුළු වියදමෙන් සියයට 29 ක් වූ රාජ්‍ය ආයෝජන වියදම් සමාලෝචිත වර්ෂයේදී මුළු වියදමෙන් සියයට 25 ක් දක්වා පහළ බැස තිබුණි.

2016 වර්ෂයේ මුළු දේශීය ණය වාරික ආපසු ගෙවීම්, මුළු දේශීය ණය ගැනීම් වලින් සියයට 82.3 ක් පමණ වූ අතර, ඒ අනුව, ශුද්ධ දේශීය ණය ගැනීම්, මුළු දේශීය ණය ගැනීම් වලින් සියයට 17.7 ක් පමණක් විය. තවද, 2016 වර්ෂයේ මුළු දේශීය ණය ගැනීම්, වර්ෂය තුළ සිදුකළ ණය පොළී ගෙවීම් සියයට 20.3 ක් වූයෙන් මුළු ණය ගැනීම්, ණය වාරික සහ පොළී ගෙවීමට ප්‍රමාණවත් වී නොතිබුණි. ඒ අනුව, දේශීය ණය ගැනීම් මත ආයෝජන හැකියාවක් නොතිබුණි

අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදනයේ සියයට පහක සීමාව ඉක්මවීම

2016 වර්ෂයේ ජනරජයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව ඇස්තමේන්තුගත අයවැය හිඟය රු.බිලියන 1,488 ක් වූ අතර එය 2015 වර්ෂයේ ඇස්තමේන්තුගත අයවැය හිඟයට වඩා රු.බිලියන 317 ක හෙවත් සියයට 27 ක වැඩි වී තිබුණි. 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව තථ්‍ය අයවැය හිඟය රු. බිලියන 666 ක් වූ අතර, එය ඇස්තමේන්තුගත අයවැය හිඟයට වඩා රු.මිලියන 822 කින් අඩු වී තිබුණි. 2016 වර්ෂයේ තථ්‍ය අයවැය හිඟය ඇස්තමේන්තුගත දළ දේශිය නිෂ්පාදිතය වූ රු.බිලියන 11,839 න් සියයට 5.63 ක් වී තිබුණු අතර එය 2013 අංක 15 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) (සංශෝධන) පනතින් සංශෝධිත 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ 3 (අ) වගන්තිය ප්‍රකාරව ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 5 ක් වූ සීමාව ඉක්මවා තිබුණි.

සීමාව ඉක්මවා බැරකම්වලට එළඹීම

2013 අංක 15 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්)සංශෝධන පනතින් සංශෝධිත , 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත ප්‍රකාරව රජයේ මුළු බැරකම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 80 ක ප්‍රමාණයක් නොඉක්මවිය යුතුවේ. 2016 මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනට මුළු බැරකම් වටිනාකම රු.බිලියන 9,865 ක් වූ අතර, එය 2016 වර්ෂයේ ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතය වූ රු.බිලියන 11,839 සමග සැසඳීමේදී සියයට 83.3 ක් වූ හෙයින්, එය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ සඳහන් උපරිම බැරකම් සීමාව ඉක්මවා තිබුණි.

ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් මැදමුලන ඩී.ඒ.රාජපක්ෂ කෞතුකාගාරය හා ස්මාරකය ඉදිකිරීම පිළිබඳව විගණකාධිපති විශේෂ වාර්තාව

රාජ්‍ය සම්පත් වැය කරමින් උක්ත ස්මාරකය ඉදිකිරීම (ව්‍යාපෘතිය) අවිධිමත් ක්‍රියාවලියක් බවට 2014 වර්ෂයට අදාළ විගණනයේදී අනාවරණය වීමෙන් අනතුරුව ඒ පිළිබඳව සංක්ෂිප්තව වාර්තා කර තිබූ අතර මෙම ඉදිකිරීම පිළිබඳව මේ වනවිට උද්ගතව ඇති විවාදාත්මක තත්ත්වය හා වැදගත්කම සලකා මෙම විගණකාධිපති විශේෂ වාර්තාව විස්තරාත්මකව ඉදිරිපත් කරනු ලැබේ.

මෙම ව්‍යාපෘතියට අදාළ ඉදිකිරීම් කටයුතු ශ්‍රී ලංකා නාවික හමුදාවේද සෘජු මැදිහත්වීමෙන් කර ඇති අතර ඒ සඳහා සංස්ථාව විසින් සකස් කළ රු.මිලියන 33.94 ක මූලික ඇස්තමේන්තුවක් (BOQ) තිබුණද, එය අදාළ පදනම වෙත ඉදිරිපත් කර එයට එකඟතාවය ලබාගත් බවට කිසිදු සාක්ෂියක් නොතිබුණි. මෙම ඇස්තමේන්තුගත මුදල ඉක්මවා සත්‍ය වියදම (බදු සහ පොලී ද ඇතුළත්ව) රු.මිලියන 81.31 ක් දක්වා වැඩි වී තිබුණද, ඒ කිසිවක් සඳහා සහ ව්‍යාපෘති ව්‍යුහයේ සැලසුම්වල සිදුවූ වෙනස්කම් සඳහා පදනමේ එකඟතාවය ලබා ගැනීමක් සිදුවූ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

සේවාලාභියකු විසින් කොන්ත්‍රාත්කරුවකුට ගෙවීම් කිරීමේදී එම මුදල් අදාළ කොන්ත්‍රාත්කරුගේ දැනුම්දීම පරිදි කොන්ත්‍රාත්කරුගේ කාර්යාලයට විධිමත් පරිදි ලබාදීම පිළිගත් සම්ප්‍රදාය වි තිබුණත්, සංස්ථාවේ බැංකු ගිණුමට හඳුනා නොගත් පුද්ගලයකු විසින් රු.මිලියන 25 ක් 2015 අගෝස්තු 31 දින බැරකර ඇති බව සංස්ථාවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) විසින් සංස්ථාවේ බැංකු ගිණුම් පරීක්ෂාවේදී අනාවරණය කර ගන්නා තෙක් අදාළ මුදල් ලැබීම පිළිබඳව සංස්ථාව දැනුවත්ව නොතිබුණි. 2006 අංක 35 දරන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධන) පනතට අනුව ඉටුකළ යුතු කාර්යයන් ඉටුකිරීමට ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන නොමැතිවීම හේතුවෙන් රු.මිලියන 592.79 ක් වූ සය මාසික වාරික 24 කින් ආපසු ගෙවීමට එකඟව මහා භාණ්ඩාගාරයටද විශාල වැය බරක් ඇතිවන පරිදි රාජ්‍ය බැංකුවකින් රු.මිලියන 14,277 ක ණය මුදලක් ලබාගැනීමට ගිවිසුම් අත්සන් කර ඇති රාජ්‍ය සංස්ථාවක් මෙලෙස තම සීමිත සම්පත් සිය අරමුණු ගත කාර්යයන්ගෙන් බැහැර කාර්යයන්ට යෙදවීමද

විගණනයේදී ප්‍රශ්නගතව ඇත.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයීම් අංශය විසින් සිදු කරනු ලබන වෛද්‍ය සැපයීම්, සැපයීමේ ක්‍රියාවලිය පිළිබඳ විගණකාධිපති විශේෂ විගණන වාර්තාව

ජනතා අවශ්‍යතාවයට ප්‍රතිචාර දක්වමින්, සාමූහිකව ක්‍රියාකරමින්, පරිපූර්ණ, ඉහළම මට්ටමේ, ගුණාත්මක, සමාන, ඵලදායී සහ තිරසාර සෞඛ්‍ය සේවාවක් ශ්‍රී ලංකාවාසී ජනතාවට ලබාදීම මගින් අත්කරගත හැකි ඉහළම සෞඛ්‍ය මට්ටමට ළඟාවීම සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ මෙහෙවර (Mission) විය. සෞඛ්‍ය අංශය සඳහා ප්‍රතිපත්ති සම්පාදනය, වැඩසටහන් සහ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම, සෞඛ්‍ය සේවා ලබාදීම සඳහා ප්‍රමිතීන් හා නීතිරීති සම්පාදනය කිරීම, මානව සම්පත් සංවර්ධනය, කළමනාකරණය, සැලැසුම්කරණය සහ පද්ධති සංවර්ධනය, සම්පත් බෙදාහැරීම හා වැඩසටහන් හා ව්‍යාපෘතීන් මෙහෙයවීම, අධීක්ෂණය හා ඇගයීම යන ප්‍රධාන කාර්යයන් අතරට ගැනෙන රෝගී සත්කාරක සේවා සැපයීම හා ඊට අවශ්‍ය භෞතික හා මානව සම්පත් සැපයීම වඩාත් වැදගත් වේ.

රෝගී සත්කාරක සේවා සැපයීමට අවශ්‍ය භෞතික සම්පත් අතරින් වෛද්‍ය සැපයුම් සඳහා අද්විතීය ස්ථානයක් හිමිවන්නේ වෛද්‍ය සැපයුම්වලින් තොර රෝගී සත්කාරක සේවාවක් ගැන සිතිය නොහැකි බැවිනි.

රජයේ අමාත්‍යාංශය හා පළාත් සභා යටතේ ඇති සියළුම රෝහල් හා සෞඛ්‍ය ක්ෂේත්‍රයට අයත් වෙනත් ආයතනයන්වලින් සැපයෙන රෝගී සත්කාරක සේවා සඳහා අවශ්‍ය ඖෂධ, ශල්‍ය ද්‍රව්‍ය, විකිරණශීලී ද්‍රව්‍ය හා රසායන ද්‍රව්‍ය වෛද්‍ය සැපයීම් ලෙස හඳුන්වනු ලැබේ.

වෛද්‍ය සැපයීම් සමස්ථ අවශ්‍යතාවය සම්පාදනය කර ගැනීම සඳහා ප්‍රසම්පාදනය, ඇණවුම් කිරීම, භාර ගැනීම, සැපයුම්කරුවන්ට ගෙවීම් කිරීම, ගබඩා කිරීම හා නිකුත් කිරීම යන සමස්ථ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම, පාලනය කිරීම, මෙහෙයවීම හා අධීක්ෂණය කිරීම සඳහා සෞඛ්‍ය ,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ වෛද්‍ය සැපයීම් අංශය ස්ථාපිත කර ඇත.

2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ වර්ෂ 06 ක කාලය තුළදී වාර්ෂික අයවැය ඇස්තමේන්තු මඟින් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වෙත සලසා තිබුණු සමස්ථ ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 685,152 ක් වී තිබුණු අතර ඉන් සියයට 26 ක් හෙවත් රු.මිලියන 180,544 ක් වෛද්‍ය සැපයීම් සඳහා වී එම වර්ෂ 06 තුළදී වෛද්‍ය සැපයීම් සඳහා වැයකර තිබුණු තථ්‍ය වියදම රු.මිලියන 165,162 ක් විය. ඊට අමතරව 2016 දෙසැම්බර් 31 දින වන විට වෛද්‍ය සැපයීම් වෙනුවෙන් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව හා අනෙකුත් ආයතන වෙත රු.මිලියන 7,266 ක බැරකම් සඳහා බැඳීම් ඇතිකර ගෙන තිබුණි. එම වර්ෂ 06 තුළදී රජයේ සමස්ථ වියදම රු.මිලියන 11,404,759 ක් වූ අතර ඉන් සියයට 1.4 ක් වෛද්‍ය සැපයීම් සඳහා විය.

කොළඹ මහා නගර සභාවේ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ විගණකාධිපති විශේෂ වාර්තාව

මහා නගර සභාවකට අයත් ප්‍රධාන කර්තව්‍යන් ලෙස මහජන සෞඛ්‍ය පවත්වාගෙන යාම, මහජනයාගේ සැප පහසුකම්, සුභසාධක කටයුතු හා මහා නගරයේ සුඛ විහරණ ක්‍රම ආරක්ෂා කිරීමද වීම නිසා, මහා නගර සභාව කසළ කළමනාකරණය කිරීම කෙරෙහි ප්‍රමුඛත්වයක් ලබා දී කටයුතු කළ යුතුය.

කොළඹ මහා නගර සභාව විසින් 2009 අප්‍රේල් මාසය දක්වා සභා බල ප්‍රදේශයෙහි කසළ, බ්ලූමැන්ඩල් ප්‍රදේශයට බැහැර කළ අතර "බ්ලූමැන්ඩල් කුණු කන්ද" ලෙස කසළ කන්දක් නිර්මාණය විය. කසළ දැමීම පිළිබඳව මහජන උද්ඝෝෂණ දිගින් දිගටම මතු වීම හේතුවෙන් ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දුන් තීන්දුව මත බ්ලූමැන්ඩල් කුණු කන්දට කසළ බැහැර කිරීම තහනම් කරන ලදී. ඉන්පසු 2009 අප්‍රේල් මාසයේ සිට මීතොටමුල්ල පොතුවිල්කුඹුර ප්‍රදේශයෙහි භූමියකින් අක්කර 02 ක භූමි භාගයකට වර්ෂ 02 ක කාල සීමාවක් සඳහා කසළ බැහැර කිරීමට අවසර ලබාදී තිබුණි. සභාව, ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව ඉක්මවා වසර 08 ක කාලයක් දක්වා කසළ බැහැර කිරීම හේතුවෙන් අක්කර 23 ක ප්‍රදේශයක් දක්වා කසළ කන්ද ව්‍යාප්ත වී 2017 අප්‍රේල් 14 දින නායයාමට ලක් වූ අතර එම ව්‍යවසනයෙන් මරණ 32 ක් ඇතුළුව දේපළ විශාල ප්‍රමාණයකට හානි වීම් සිදු විය. මීතොටමුල්ල කසළ කන්ද 2018 ජනවාරි මාසයේ අවස්ථා 02 කදී ගිනි ගැනීමටක ලක් වූ අතර, එවැනි ආපදා මඟින් පරිසරයට හා සාමාන්‍ය ජන ජීවිතවලට සිදු වී හානිය පිළිබඳව අවධානය යොමුකර නොතිබුණි.

මහා නගර සභාවක කසළ එම සභාවෙහි දේපළක් ලෙස සැලකිය යුතු වුවද, කොළඹ මහා නගර සභාව විසින් කසළ, සභා බල ප්‍රදේශයෙන් බැහැර ප්‍රදේශයකට ඉවත් කිරීම සඳහාත් කසළ කන්දෙහි කසළ සමතලා කිරීම සඳහාත් අධික වැයබරක් දරා පෞද්ගලික සමාගමහි සේවය ලබා ගෙන තිබුණි. තවද කසළ බැහැර කිරීමේදී සභාව විසින් අධිකරණය මඟින් ලබා දී ඇති තීන්දු තීරණ, කසළ කළමනාකරණය පිළිබඳව රජය විසින් පනවා ඇති නීති රීති හා පවතින අපද්‍රව්‍ය ප්‍රතිපත්ති පිළිබඳව අවධානය යොමුකර නොතිබුණි.

සභාව විසින් දිගින් දිගටම කසල බැහැර කිරීම සඳහා සුදුසු ප්‍රදේශ සොයා ගැනීමට අමතරව කසළ ගැටළුව විසඳීම සඳහා ස්ථිර විසඳුමක් මේ දක්වා ලබා දී නොමැත. දේශීය හා විදේශීය විද්වතුන් විසින් පෙන්වා දෙන ලද හා භාවිතා කරන කසළ ප්‍රතිචක්‍රීකරණ ක්‍රමවේද හා කසළ වත්කමක් බවට පරිවර්තනය කර නොගැනීම නිසා සභාවෙහි ආදායමින් සැලකිය යුතු ප්‍රමාණයක් කසළ බැහැර කිරීම සඳහා වාර්ෂිකව වැය කර තිබුණි. තවද සභාවෙහි ආදායමින් සැලකිය යුතු ප්‍රමාණයක් කසළ බැහැර කිරීම සඳහා වාර්ෂිකව වැය කර තිබුණි. තවද සභාවෙහි කසළ කළමනාකරණ කටයුතු සඳහා අවශ්‍ය වාහන මිලදී ගැනීමට 2010 වර්ෂයේ සිට වාර්ෂික අයවැයෙන් මූල්‍ය ප්‍රතිපාදන සලසා තිබුණද සභාවට අවශ්‍ය වාහන එසේ මිලදී නොගෙන එකම ආයතනයකින් වාහන කුලී පදනම මත ලබා ගෙන සේවයෙහි යොදවා තිබුණි.

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය

ශ්‍රී ලංකාව වන සතුන්ගෙන් ගහන රටක් වන අතර මෙහි වෙසෙන වන සතුන්ගේ වැදගත්කම සංචාරක කර්මාන්තය සඳහා විශාල පිටුවහලක් වී ඇත. වන සතුන්ගේ ආරක්ෂාව සහ සහජීවනය සම්බන්ධයෙන් සම්පූර්ණ වගකීම නීත්‍යානුකූලව රජය සතු වේ. එම නීත්‍යානුකූල වගකීම වනජීවී සංරක්ෂණදෙපාර්තමේන් 1973 අංක 2, 1942 අංක 31, 1944 අංක 12, 1945 අංක 12 (469 වන අධිකාරිය) දරන වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත සහ 1949 අංක 38 (සංශෝධන), 1964 අංක 44 (සංශෝධන), 1970 අංක 01 (සංශෝධන), 1993 අංක 49 (සංශෝධන), 2009 අංක 22 (සංශෝධන) පනත් මඟින පවරා තිබුණු අතර, ඒ අනුව වන සතුන්ගේ ආරක්ෂාවේ වගකීම රජය වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලබන්නේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තව විසිනි. වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත යටතේ වනජීවී රක්ෂිතවලින් බැහැර පෙදෙස්වල වනජීවී සම්පත් ආරක්ෂා කිරීම සඳහාද නීතිමය ප්‍රතිපාදන පනවා ඇති අතර එම නීතිමය බලයද වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත මෙම පනතින් පැවරී ඇත.

මේ සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අවශ්‍ය පහසුකම් සහ සම්පත් සපයා තිබුණු අතර තීරණ ගැනීමේ සම්පූර්ණ වගකීම පැවරී ඇත්තේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවටයි. මීට අමතරව පරිසරය රැක ගැනීමේ කටයුතු සඳහා විවිධ ආයතන කිහිපයක් සම්බන්ධ වී ඇත. උදාහරණ වශයෙන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය, තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය, භූවිද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය. සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය, වෙරළ සංරක්ෂණ, වෙරළ සම්පත් කළමනාරණ දෙපාර්තමේන්තුව, ධීවර හා ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන ආයතනය දැක්විය හැක. එසේ වුවද වන ජීවීන් සංරක්ෂණය කිරීම වෙනුවෙන් මූලික වගකීම දරන ආයතනය වන්නේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවයි. පසුගිය වර්ෂ ගණනාවක සිට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වනජීවීන් සංරක්ෂණය සම්බන්ධයෙන් සහ වන සතුන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් වූ කාර්යභාරය නිසිලෙස ඉටුකර ඇද්දැයි යන්න පිළිබඳ විශාල කතිකාවතක් සමාජයේ ගොඩනැගෙමින් පවතී. එයට ප්‍රධානම හේතූන් ලෙස වන සතුන් හා මිනිසුන් අතර ගැටුම් ඉහළ යාම, වටිනා සම්පතක් ලෙස සලකන දළ ඇතුන් මරා දැමීම හා විශාල ලෙස අලි මරණ සිදුවීම දැක්විය හැක. තවද, වන සතුන්ගේ යම් යම් සත්ව විශේෂයන් විනාශ වී යන අතර තවත් සත්ව විශේෂයන්ගේ ගහණය සීමාව ඉක්මවා ඉහළ යමින් පැවැතුණු බව විගණනයට අනාවරණය වූ අතර, (උදාහරණ පිළිවෙලින් දළ ඇතුන් හා මොණරු) ඒ සඳහා පැහැදිලි වැඩ පිළිවෙලක් තිබේද යන්න තහවුරු කර ගැනීමට සාක්ෂි නොතිබුණි.

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන උමාඔය බහුකාර්යසංවර්ධන ව්‍යාපෘතිය පිළිබඳ විගණකාධිපති විශේෂ වාර්තාව

දශක කිහිපයක් පුරාවට විවිධ අවස්ථා වලදී උමා ඔය ද්‍රෝණිය ආශ්‍රිතව විවිධ අධ්‍යයනයන් සිදුකර තිබූ අතර උමා ඔය ජලාධාර ප්‍රදේශය සඳහා වන අන්තර් ද්‍රෝණි සංවර්ධනය සහ ද්‍රෝණිය තුළ සංවර්ධනය යන විකල්ප දෙකෙන් වඩා ආකර්ශනීය විකල්පය නිර්ණය කිරීම සම්බන්ධයෙන් පසුකාලීනව වැඩි අවධානය යොමුකර තිබුණි. ඒ අනුව මේ සඳහා ශක්‍යතා අධ්‍යයනය අදියර දෙකකට බෙදා පළමුවන අදියර වශයෙන් අන්තර් ද්‍රෝණි සහ ද්‍රෝණි තුළ ශක්‍යතා අධ්‍යයනය කොට මින් වඩාත් යෝග්‍ය විකල්පය නිර්දේශ කිරීමටත්, දෙවන අදියරින් නිර්දේශිත විකල්පය සම්බන්ධව විස්තීරණ ශක්‍යතා අධ්‍යයනයක් කර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට හැකියාව උදාකර ගැනීමට කටයුතු කර තිබුණි. මෙම ශක්‍යතා අධ්‍යයනයේ පළමු අදියර 2002 වර්ෂයේදී සීමාසහිත එස්.එන්.සී.ලැවලින් සමාගම මගින් සිදුකරන ලද අතර අන්තර් ද්‍රෝණි යෝජනාව නිර්දේශ කර ස්වකීය වාර්තාව ඉදිරිපත් කර තිබුණි.

පසුව 2007 වර්ෂයේ ඉරාන රජය හා ශ්‍රී ලංකා රජය අතර ඇතිකර ගත් අවබෝධතා ගිවිසුම ප්‍රකාරව කිලෝමීටර් 20 ක් දිග භූගත උමගක් තුළින් උමා ඔයේ ජලය කිරිදි ඔයට හැරවීම මගින් ගිණිකොන දිග වියළි කලාපයේ හෙක්ටයාර 5,000 ක භූමි ප්‍රදේශයකට වාරිමාර්ග සැපයීම හා ජල විදුලි බලාගාරයක් ඉදිකිරීම මගින් මොගාවොට් 100 ක ධාරිතාවයකින් යුත් විදුලි බලය නිපදවීම සඳහා ඉරාන රජයේ ආධාර ඇතිව කොන්ත්‍රාත්කරු ලෙස ඉරානයේ ෆරාබ් සමාගම නම් කරමින් ව්‍යාපෘති කටයුතු ආරම්භ කිරීම සඳහා 2008 වර්ෂයේදී ගිවිසුම් ගත වී තිබුණි.

ඒ අනුව ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදයන්, විස්තීර්ණ ශක්‍යතා අධ්‍යයන සිදු කිරීමේ ප්‍රමාදයන් යනාදී විවිධ හේතු නිසාවෙන් මෙම උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ කටයුතු 2010 වර්ෂයේ ආරම්භ කර තිබුණි. 2013 වර්ෂයේ ඉරාන රජයට සම්බාධක පැනවීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් සම්පාදනය කර ගැනීමේ ගැටළු මතු වී ඇති අතර පසුව ශ්‍රී ලංකා රජය විසින්ම මේ වනතෙක් වූ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාල සියලු වියදම් දරා තිබුණි. එසේම 2014 දෙසැම්බර් මස ඇති වූ පළමු ජල කාන්දුව හා 2016 දෙසැම්බර් මස ඇති වූ විශාල ජල කාන්දුව හේතුවෙන් විශාල පාරිසරික හා සමාජීය ගැටළු රැසකට මුහුණපෑමට සිදුවිය.

රාජ්‍ය සේවය ඩිජිටල්කරණය කිරීමට අදාලව සීමාසහිත ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (අයිසීටීඒ) ඉටුකර ඇති කාර්යභාරය පිළිබඳ විගණකාධිපති විශේෂ වාර්තාව

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය මගින් සමාජීය හා ආර්ථික සංවර්ධනය අරමුණු කරගනිමින් 2002 නොවැම්බර් 20 දින තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්‍රමෝපාය, (ICT Development Roadmap) ඉ- ශ්‍රී ලංකා (e –Sri Lanka) ප්‍රකාශයට පත්වීමත් සමඟ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්‍රමෝපාය සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනික රාමුවක් පිහිටුවීමේ අවශ්‍යතාවය පැන නැග තිබුණි. ඒ අනුව අංක 03/060/134/022 හා 2003 අප්‍රේල් 09 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය හා 2003 අංක 27 දරන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පනත අනුව 2003 මැයි 12 වැනි දින 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සම්පූර්ණයෙන් රජය සතු පෞද්ගලික සමාගමක් වශයෙන් සීමාසහිත ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (අයිසීටීඒ) පිහිටුවා තිබුණි. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආර්ථික සංවර්ධන වැඩසටහන් සාර්ථක කර ගැනීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කිරීමේ ක්‍රියාවලියට නායකත්වය සැපයීමේ ප්‍රධාන වගකීම අයිසීටීඒ ආයතනයට පවරා තිබූ අතර 2003 අංක 27 දරන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පනත මගින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සම්බන්ධ රජයේ ප්‍රතිපත්ති හා ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සියළු පියවර ගැනීමට බලය අයිසීටීඒ ආයතනය වෙත පවරා තිබුණි.

අයිසීටීඒ ආයතනය විසින් ලෝක බැංකු ආධාර, වෙනත් විදේශ ආධාර සහ රජයේ අරමුදල් මත 2004 – 2014 කාලය තුළදී ඉ- ශ්‍රී ලංකා සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රධාන ක්ෂේත්‍ර 06 ක් හඳුනා ගනිමින් ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරන ලද අතර 2015 වර්ෂයේ සිට සම්පූර්ණයෙන්ම ඒකාබද්ධ අරමුදල් මත අදාල ව්‍යාපෘතීන් ක්‍රියාත්මක වේ.

තොරතුරු තාක්ෂණ සංවර්ධන වැඩසටහන් තුළ රාජ්‍ය අංශය ප්‍රතිනිර්මාණය මූලික උපාංගයක් ලෙස හඳුනාගෙන තිබුණි. ඒ සඳහා අයිසීටීඒ ආයතනය දරන ලද උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස එක්සත් ජාතීන්ගේ ඉ-රාජ්‍ය දර්ශකයට (e- Gov Index) අනුව 2012 වර්ෂයේ දී රටවල් 192 අතුරින් 115 වැනි ස්ථානයේ පැවැති ශ්‍රී ලංකාව, 2014 වර්ෂයේ දී ස්ථාන 41 කින් ඉහළට එමින් 74 වැනි ස්ථානයට පත්විය. එහෙත් 2016 වර්ෂයේදී එය 79 වන ස්ථානය දක්වා පහළ ගොස් තිබුණි.

කෙසේ වෙතත් 2010 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති සඳහා වැය කරන ලද සම්පූර්ණ මුදල ආයතනයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව රු.මිලියන 5,799.9 ක් වුවද රාජ්‍ය සේවය ඩිජිටල්කරණය කිරීම පිළිබඳව අයිසීටීඒ ආයතනයේ වගකීම නිසි ආකාරයෙන් ඉටු වී නොමැති බව අනාවරණය වූ නිරීක්ෂණවලට අනුව නිගමනය කරමි.

කිරි ගවයින් ආනයන ව්‍යාපෘතිය පිළිබඳ විගණකාධිපති විශේෂ විගණන වාර්තාව

2006 වර්ෂයේදී සකසන ලද රාජ්‍ය ප්‍රතිපත්තිය හා මහින්ද චින්තනයට අනුව දියර කිරි පරිභෝජනය ප්‍රචලිත කිරීම හා එයට ගැලපෙන පරිදි අදාල රාජ්‍ය බදු සහ කිරි නිෂ්පාදන ආනයන ප්‍රතිපත්ති සැකසීම හඳුනාගෙන තිබුණි.

උසස් ආරයේ කිරි ගවයින්ගේ පවතින හිඟකම මඟ හරවා කිරි පිටි ආනයන පිරිවැය අවම කර ගැනීම සඳහා උසස් ආරයේ කිරි ගවයින් 15,000 ක් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ගොවිපොල සඳහා ආනයනය කිරීමට තීරණය කර තිබුණි.

පළමු අදියර ලෙස 2012 සහ 2013 වර්ෂවලදී 2,000 ක් සහ දෙවන අදියර ලෙස 2015 වර්ෂයේදී 2,495 ක් ලෙස ආනයනය කළ කිරි ගවයින් 4,495 අතරින් 2015 වර්ෂයේ ආනයනය කළ කිරි ගවයින් 2,500 එම සතුන්ට ඔරොත්තු නොදෙන පරිසරයක පිහිටි හම්බන්තොට රිදීගම ගොවිපොල වෙත ලබාදී තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා උප ණය ලෙස ලබාගත් විදේශ ණය මුදල් අපේක්ෂිත පරිදි ගෙවීමට ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

එසේ තිබියදී 2014 ජුනි 20 දිනැති අමාත්‍ය මණ්ඩලය තීරණය අනුව තුන්වන අදියර යටතේ කිරිගවයින් 20,000 ක් ආනයනය සඳහා අනුමැතිය ලබාදීමේදී ආනයනික සතුන් සෘජුවම ගොවිපොල වෙත ලබානොදී රාජ්‍ය ගොවිපොල භාරයේ තබා රැක බලා පසුව එම දෙවන පරම්පරාවේ ගවයින් ගොවීන් වෙත බෙදා දීමට තීරණය කර තිබු නමුත් එයට අනුගත නොවී කිරි ගවයින් 5,000 ක් සෘජුවම කිරි ගොවීන් වෙත ලබාදීමට 2017 වර්ෂයේදී කටයුතු කර තිබුණි.

අදාල ප්‍රසම්පාදන ක්‍රියාවලිය රජයට වාසිසහගත අයුරින් යොදාගෙන නොතිබු අතර කිරිගව ආනයන දෙවන තෙවන අදියරයන්වලදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර නොතිබුණු අතර ව්‍යාපෘතියට අදාල සක්‍යතා වාර්තා ප්‍රමාණවත් වෘත්තීමය මට්ටමකින් යුතුව පිළියෙල කර නොතිබුණු බවද නිරීක්ෂණය විය. තවද, ව්‍යාපතිය සඳහා රු.බිලියන 7.9 ක මුදලක් වැයකර තිබුණද අපේක්ෂිත ප්‍රතිපල ලැබෙන අයුරින් ව්‍යාපෘතිය මෙහෙයවීමට අදාල නිලධාරියා අපොහොසත් වී තිබුණි.

ශ්‍රී ලංකාවේ කුඹුරු පොහොර සහනාධාර වැඩසටහන පිළිබඳ විශේෂ විගණන වාර්තාව

ශ්‍රී ලංකාවේ සහල් සඳහා පවතින ඉල්ලුම හා ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය සම්බන්ධ ඓතිහාසික, දේශගුණික හා භූගෝලීය වැදගත්කම මත වී නිෂ්පාදනය සඳහා වැඩි නැඹුරුවක් පවතී. ශ්‍රී ලංකාවේ මුළු සේවා නියුක්තියෙන් කෘෂිකර්ම ක්ෂේත්‍රයට ඇති දායකත්වය 2016 වර්ෂයේ සියයට 27 ක් වන අතර ජාතික ආදායම සඳහා කෘෂිකර්මාන්තයේ දායකත්වය 7.5% කි. ඒ හැරුණු විට ශ්‍රී ලංකාවේ කෘෂි බිම් ප්‍රමාණයෙන් සියයට 13.5 ක් වී වගාව සඳහා වෙන් වී ඇත.

එසේ වුවද වී ගොවිතැන සම්බන්ධයෙන් මෑත කාලයේදී මතු වී ඇති ගැටළු හේතුවෙන් ජාතික නිෂ්පාදනයට මෙම ක්ෂේත්‍රයේ දායකත්වය ක්‍රමයෙන් අඩුවී ගෙන යන තත්ත්වයක් නිරීක්ෂණය කළ හැක. ඊට ප්‍රධාන හේතු ලෙස කෘෂිකර්මාන්තය සඳහා වන යෙදවුම් පිරිවැයට සාපේක්ෂව ඉපයීම් අවම මට්ටමක තිබීම හා ඒ හේතුවෙන් ගොවීන්ගේ ජීවන තත්ත්වය සාපේක්ෂ වශයෙන් පහළ මට්ටමකට පත්ව තිබීම දැක්විය හැක. ගොවීන් ක්‍රමයෙන් වී වගාවෙන් ඈත්වීමට මෙය හේතුවක් වී ඇති බව නිරීක්ෂණය කළ හැක. ඒ අනුව වී නිෂ්පාදනයට අවශ්‍ය වාරි ක්‍රම ඇතුළු යටිතල පහසුකම් සංවර්ධනය මෙන්ම ක්ෂේත්‍රයට අදාළව ජාතික මට්ටමින් සිදුකරනු ලබන ප්‍රතිපත්ති සම්පාදනය හා ඊට අදාළ විවිධ සේවාවන් සැපයීම රජයේ කාර්ය භාරයක් වේ.

2006 වර්ෂයේදී වී ගොවිතැනේ ප්‍රධාන යෙදවුමක් ලෙස ගැනෙන පොහොර සඳහා සහනාධාර ක්‍රමයක් ඇති කිරීම මඟින් වගා පිරිවැය අවම කර ගැනීමට අපේක්ෂා කෙරිණි. එම අරමුණ පෙරදැරිව ගොවියා වෙත පොහොර හොන්ඩරයක් රු.350 ක් බැගින් සැපයීම මෙම වැඩසටහනේ මූලික අරමුණ වූ අතර, මෙම සහනාධාර වැඩපිළිවෙල 2015 වර්ෂය දක්වා ක්‍රියාත්මක වෙමින් පැවතියදී 2016 වර්ෂයේදී සහනාධාර පදනමින් පොහොර ලබාදීම වෙනුවට මුදල් සහනාධාරයක් ලබාදීමට කටයුතු කර ඇත. එමඟින් මෙම සහනාධාර ක්‍රමය වඩා කාර්යක්ෂම කිරීමට අපේක්ෂා කර ඇත.

නමුත් 2006 වර්ෂයේ සිට ක්‍රියාත්මක වූ මෙම සහනාධාර වැඩසටහන මඟින් අපේක්ෂා කළ හැකිව තිබූ වී අස්වැන්න වැඩි කිරීම, වී වගා බිම් ප්‍රමාණය වැඩි කිරීම, සහල් ආනයනය අඩු කිරීම, ගොවීන්ගේ ජීවන තත්වය උසස් කිරීම ඇතුළු අංශවල කාර්යසාධනය අවම මට්ටමක පැවතුණි.

2016 වර්ෂය වන විට පොහොර සහනාධාරය සඳහා රජය විසින් වැයකරනු ලබන මුදල් ප්‍රතිපාදනය රු.මිලියන 24.254 ක් වූ අතර එය මුළු රාජ්‍ය වියදමෙන් 1% ක් පමණ විය. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී විවිධ රාජ්‍ය ආයතන ගණනාවක දායකත්වයක් සැපයෙන අතර මේ තුළ සමස්ථ වැඩසටහනේ සාර්ථකත්වය රැඳී පවතී.
2016 වර්ෂයේදී පොහොර සහනාධාර වැඩපිළිවෙල සම්බන්ධ රාජ්‍ය ප්‍රතිපත්තිය වෙනස් වීමත් සමඟ පොහොර වෙනුවට මුදල් සහනාධාරයක් ලබාදීම පිණිස ආරම්භ කෙරුණු මුදල් සහනාධාර ලබාදීමේ වැඩසටහන සම්බන්ධව පරීක්ෂා කිරීමේදී අනාවරණය වූ කරුණුවලට අනුව සහනාධාර ලැබීමට සුදුසුකම් ඇති ගොවීන් වෙනුවෙන්ම අදාළ සහනාධාර මුදල් ලබානොදීම හා ලබාදිය හැකි උපරිම සහනාධාර මුදල් වටිනාකම ඉක්මවමින් මුදල් සහනාධාර ගෙවීම් කර තිබීම හඳුනාගන්නා ලදි. තවද, වෙනත් පුද්ගලයින්ගේ ගිණුම්වලට මුදල් බැරකිරීම් පිළිබඳ තොරතුරුද අනාවරණය වී ඇත. පරීක්ෂා කළ නියැදියට අනුව එසේ ගෙවා තිබූ අනාර්ථික ගෙවීම්වල වටිනාකම 2016 යල හා මහ කන්න සඳහාද 2017 යල කන්නය සඳහාද එකතුව රු.1,266,733,838 ක් විය. තවද අදාළ කන්නයට පෙර ලබා දිය යුතු සහනාධාර මුදල් නියමිත දින ඉක්මවීමෙන් පසු ගෙවීම් කළ අවස්ථා නිරීක්ෂණය වූ අතර, ඉහත සඳහන් කන්න 03 තුළදී එසේ ප්‍රමාද වී සිදු කළ ගෙවීම්වල වටිනාකම රු.5,475,649,532 ක් විය. එසේම මුදල් ගෙවීම නිවැරදි හා කාර්යක්ෂම අයුරින් සිදු lsrකිරීම පිණිස 2017 වර්ෂයේදී හඳුන්වා දී තිබූ පරිගණක පද්ධතියෙන්ද නිසි ප්‍රතිඵල ලැබී නොතිබුණි.

සහනාධාර වැඩපිළිවෙලට සමාගාමීව ජාතික පොහොර ලේකම් කාර්යාලය විසින්

රටේ පොහොර අවශ්‍යතාවය සපුරාලීම සඳහා පොහොර අවශ්‍යතා තීරණය කොට පොහොර ආනයනය කිරීම සම්බන්ධව ප්‍රසම්පාදන කටයුතු නිසි පරිදි ඉටු කිරීම තුළින් කලට වේලාවට ගොවීන්ට පොහොර ලබාදීමට කටයුතු කිරීම එහි මූලික කාර්යභාරය වන අතර, ප්‍රසම්පාදන සැලැස්මක් මත අදාළ පොහොර මිලදී ගැනීම් සිදු නොකිරීම හා තරඟකාරීත්වය සීමාවන කොන්දේසි ඇතුලත්වීම යන හේතු නිසා 2017 මහ කන්නයේ දැඩි පොහොර හිඟයකට මුහුණදීමට සිදුව තිබුණි. එහිදි පොහොර ආනයනය උදෙසා ලබා දුන් අමාත්‍ය මණ්ඩල තීරණ විටින් විට වෙනස් කිරීම හා අමාත්‍ය මණ්ඩල සංදේශවල ඇතුළත් ඇතැම් කරුණු පදනම් රහිත වූ අවස්ථා ද විය.

ඒ අනුව සමස්ථයක් ලෙස පොහොර සහනාධාර වැඩපිළිවෙල මඟින් අපේක්ෂා කළ හැකිව තිබූ අරමුණු ඉටු කර ගැනීම සතුටුදායක මට්ටමක නොමැති බව නිරීක්ෂණය කරන අතර, වී වගාව සඳහා බලපාන අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය හා පොහොර සහනාධාර ප්‍රතිපත්තිය තවදුරටත් විධිමත්ව ක්‍රියාත්මක කිරීම මෙන්ම ඊට සමගාමීව කාබනික පොහොර වැඩපිළිවෙල තවදුරටත් ව්‍යාප්ත කිරීම මෙහිදී මූලික අවශ්‍යතාවයන් ලෙස හඳුනා ගත හැකි විය.

ශ්‍රී ලංකාවේ ක්‍රීඩාව හා එහි පරිපාලනය පිළිබඳව විශේෂ විගණන වාර්තාව

රටක පුරවැසියකු උද්යෝගීමත්, නීරෝගී, විනයගරුක සහ අභිමානවත් අයෙකු බවට පත් කිරීම සඳහා ක්‍රීඩාවෙන් ලැබෙන සහය අතිමහත්ය. එම අපේක්ෂාවෙන් ලෝකයේ සෑම රටක්ම පාසා ක්‍රීඩාවේ දියුණුව වෙනුවෙන් ඉහළ මැදිහත් වීමක් සිදු කරනු ලබයි. ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීම වැනි ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුවේ පාලන රෙගුලාසිවලට ගැලපෙන ආකාරයට විශේෂිත රජයේ රෙගුලාසි සකස් කිරීම හා 1973 අංක 25 දරන ක්‍රීඩා පනත මාස 06 ක තුල සංශෝධනය කිරීමට නිර්දේශ කර තිබුනද වසර 05 ක් ගත වී ඇතත් මෙතෙක් අදාල

ශ්‍රී ලංකාවද ඊට අනුගත වෙමින් කටයුතු කිරීමට උත්සහ දරා ඇත. ඒ අනුව ක්‍රීඩාව වෙනුවෙන් වෙනම අමාත්‍යාංශයක් පිහිටුවීම, ක්‍රීඩාවට අදාළ නෛතික පසුබිම ගොඩනැඟීම වෙනුවෙන් ක්‍රීඩා පනතක් ඇති කිරීම, එක් එක් ක්‍රීඩාවට අදාළව ජාතික ක්‍රියාමාර්ග ශ්‍රී ලංකාව විසින් මෙ දක්වා ගෙන ඇත.

සංශෝධනයන් සිදුකිරීමට කටයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකාවේ ක්‍රීඩාවේ සංවර්ධනය උදෙසා ඉහත පරිදි විවිධ ක්‍රියාමාර්ග ගෙන තිබුණද ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් ක්‍රීඩාවෙන් අත්කර ගෙන ඇති ජයග්‍රහණ හා ප්‍රගතිය පිළිබඳ දැඩි කථා බහට ලක්

ක්‍රීඩා සංගම් සහ ඒ සඳහා වන පරිපාලන කටයුතු සඳහා ක්‍රීඩා රෙගුලාසි හඳුන්වා දීම මඟින් පරිපාලන ව්‍යුහයක් හඳුන්වා දීම, ක්‍රීඩා සංවර්ධනය අරමුණු කොට ගෙන අමාත්‍යාංශයට අනුබද්ධිතව විවිධ ආයතන සහ අරමුදල් ආදිය ස්ථාපිත කිරීම

වී ඇත. පසුගිය දශක කිහිපයක් තුළදී ශ්‍රී ලංකාව ළඟා කරගෙන ඇති ක්‍රීඩා ජයග්‍රහණ පිළිබඳව සැලකිමේදි මෙය පැහැදිලි වේ.

ශ්‍රී ලංකාවේ ක්‍රීඩාව කෙරෙහි බල පැවැත්වෙන නෛතික පසුබිම හා එම නෛතික පසුබිම තුළ ක්‍රියාත්මක විය

යුතු ආයතනික කාර්යභාරය පිළිබඳ විමර්ශනාත්මකව පරීක්ෂා කර නිරීක්ෂණ ඉදිරිපත් කිරීම මෙම වාර්තාව මඟින් අපේක්ෂා කෙරේ.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු පරිපාලන පරිගණක පද්ධතියේ වැඩසටහන් මඟින් ස්වයංක්‍රීය තක්සේරු වාර්තා නිකුත් කිරීම අත්හිටු වීම හේතුවෙන් රාජ්‍ය ආදායමට සිදු වූ බලපෑම පිළිබඳ විගණකාධිපති විසින් ඉදිරිපත් කරනු ලබන විශේෂ විගණන වාර්තාව

ශ්‍රී ලංකා රාජ්‍ය ආදායම බදු සහ බදු නොවන ආදායමින් සමන්විත වන අතර බදු ආදායම පාලනය කිරීමේ වගකීම දරන එක් පාර්ශවයක් ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හඳුනා ගත හැකිය. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව රැස් කරන බදු ආදායමින් සියයට 65 ක් පමණ වක්‍ර බදු ආදායමින් උපයන අතර එම වක්‍ර බදු ආදායම තුළ VAT හා NBT බදු ආදායමට සඳහා වැඩි වැදගත්කමක් හිමිවේ. එබැවින් VAT හා NBT බදු ගෙවන්නන් බදු ගෙවීම පැහැර හැරීම සිදුකළහොත් ඒ තුළින් රජයට ලැබිය යුතු බදු ආදායම අඩු වීමක් සිදුවීම වැළැක්විය නොහැකිය. එබැවින් උපරිම බදු ආදායම රජයට උපයා ගැනීම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙ හි වගකීම වන අතර එය ඉටු කර ගැනීමේ අරමුණින් වාර්තා මත හිඟ බදු සඳහා ස්වයංක්‍රීයව තක්සේරු වාර්තා නිකුත් කිරීමේ වැඩපිළිවෙළක් 2002 වර්ෂයේ සිට 2012 මාර්තු 31 දින දක්වා ක්‍රියාත්මක කරන ලදී. මෙම ස්වයංක්‍රීය වාර්තා නිකුත් වීම තුළින් පැහැර හැර ඇති බද්දක් වේ නම් ඒ පිළිබඳ තොරතුරු වාර්තා වීම, හිඟ බදු මුදල් මත දඩ මුදල් පැනවීම, පරිගණක පද්ධතියේ හිඟ බදු මුදල් පෙන්වීම ආදී වැදගත් කාර්යයන් රාශියක් ඉටු කරන ලද අතර 2012 අප්‍රේල් 01 දින සිට ස්වයංක්‍රීයව තක්සේරු වාර්තා නිකුත් කිරීම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව අත්හිටුවා එම ක්‍රියාවලිය නිලධාරීන් මාර්ගයෙන් (Manually) සිදු කිරීම ආරම්භ කරන ලදී.

ඉහත පරිදි ස්වයංක්‍රිය පද්ධතිය නතර කිරීම හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට VAT හා NBT බදු වලින් අය වීමට / නිරවුල් වීමට රු.මිලියන 15,283 ක බදු ශේෂයක් හා එම බදු ශේෂ මත අය විය යුතු දඩ මුදල විගණනයේ ගණනය කිරීම් වලට අනුව දළ වශයෙන් රු.මිලියන 9,237 ක් ද බව මෙම වාර්තාවෙන් හෙළිදරව් කරනු ලබයි. තවද, මෙම පද්ධතිය තුළ කුඩා අගයන්නගෙන් යුතු හිඟ බදු ශේෂ ද විශාල සංඛ්‍යාවක් පැවති හෙයින් වටිනාකම රු.1,000 ඉක්ම වූ හිඟ බදු ශේෂයන් පමණක් මෙම වාර්තාව සකස් කිරීමේ දී සැලකිල්ලට ගනු ලැබීය.

රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරීන්ගේ කාර්යසාධනය පිළිබඳව වූ විගණකාධිපති විශේෂ වාර්තාව

රාජ්‍ය අංශයේ ආයතන මඟින් මහජනතාවට ගුණාත්මක සේවයක් සැලසීම උදෙසාත්, රාජ්‍ය ආයතන ශක්තිමත් කිරීමේ අරමුණු මුල් කරගෙන පිහිටුවන ලද රාජ්‍ය සේවයේ සේවා නියුක්ති ජනගහනයෙන් සියයට 14.5 ක (රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ) නිලධාරින් ප්‍රමාණයක් සේවය කරනු ලබයි. මෑත කාලයේ රාජ්‍ය සේවයේ සංඛ්‍යාත්මක වර්ධනයට උපාධිධාරීන් සංවර්ධන නිලධාරීන් වශයෙන් බඳවා ගැනීම කැපී පෙනෙන හේතුවක් වී තිබුණි. ඒ අනුව මුළු රාජ්‍ය සේවයේ නිලධාරීන්ගෙන් 41,668 ක් සංවර්ධන නිලධාරීන් බව වර්තමාන සමීක්ෂණ අනුව අනාවරණය විය.

මෙසේ රාජ්‍ය සේවයට එක්වූ උපාධිධාරීන් ඉටුකරනු ලබන සේවාවන්ගේ ප්‍රමාණාත්මකභාවය ඇගයීමට ලක්කිරීම, ගෙවනු ලබන වැටුපට සරිලන ආකාරයට රාජකාරි ස්වභාවය සකස්වීම, රාජකාරියේ ස්ථානගත වීම, වැඩ පරිසරය නිර්මාණය වී ඇති ප්‍රමාණය හා මෙම නිලධාරීන්ගේ සේවය කොතෙක් දුරට මහජනතාවගේ අවශ්‍යතාවයන් සඳහා යොමු වූවක්ද යන්න පිළිබඳව අවබෝධයක් ලබාගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුව ඇත.

සමීක්ෂණයට භාජනය කරනු ලැබූ නියැදිය අනුව බඳවාගෙන තිබූ සංවර්ධන නිලධාරීන්ගෙන් සියයට 86 කටත් වැඩි ප්‍රමාණයක් ශාස්ත්‍රවේදී උපාධිධාරීන් වූ අතර, එම නිලධාරීන්ගෙන් සියයට 75 කට ආසන්න ප්‍රමාණයක් කාන්තා නිලධාරීන් විය. සංවර්ධන නිලධාරි සේවය ක්ෂේත්‍ර ගත තනතුරක් ලෙස සළකනු ලැබූවද නිලධාරීන් අතුරින් සියයට 22 ක් පමණ කාර්යාල ගත නිලධාරීන් වූ අතර, ක්ෂේත්‍රගත නිලධාරීන් සංඛ්‍යාව සියයට 78 ක් විය. තවද එම නිලධාරීන් වර්ෂය තුළ අධීක්ෂණයට භාජනය කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව 02 ත් 09 ත් අතර පරාසයක සංඛ්‍යාවක් ගෙන තිබුණි.

සංවර්ධන නිලධාරීන් සඳහා ස්ථානමාරු පරිපාටියක් සකස්කර වාර්ෂික ස්ථාන මාරු ක්‍රමයක් ක්‍රියාත්මක කර නොතිබූ බැවින් එකම සේවා ස්ථානයේ දීර්ඝ කාලීනව සේවයේ නියුක්තව සිටීම ද කාර්යසාධන කෙරෙහි බලපානු ලබන බැවින් සංවර්ධන නිලධාරි සේවය තුලින් අපේක්ෂිත කාර්යසාධනය ඉටු වී නොමැති බව පැහැදිලි විය.

රත්‍රන් මිශ්‍රිත පස් අපනයනය කිරීම පිළිබඳ විශේෂ විගණන වාර්තාව

ස්වර්ණාභරණ නිෂ්පාදන ආයතනවලින් ඉවතලන රත්‍රන් මිශ්‍රිත සුන්බුන් පස් (Wastage Of Goldsmith urnet Residue) ලෙස දක්වමින් එම පස්වල අඩංගු රත්‍රන් ඉවත්කර ගැනීම සඳහා පෞද්ගලික සමාගම් 03 ක් විසින් විදේශ රටවල් කීපයක් වෙත මෙකී ද්‍රව්‍ය අපනයනය කර තිබූ අතර වර්තමානයේ අපනයනය සඳහා සූදානම් කරමින්ද පැවතිණි. මෙකී ද්‍රව්‍ය පැටවූ බහාලුම් 51 ක් ඇනටමත් ශ්‍රී ලංකා රේගුව හරහා විදේශ රටවලට අපනයනය කර ඇති අතර එලෙස

අපනයනය කරමින් පැවති තවත් බහාලුම් 23 ක් රේගු භාරයට ගෙන තිබුණි. එයින් බහාලුම් 04 ක් සඳහා රේගු පරීක්ෂණ නිමකර දඩ මුදල් පනවා තිබූ අතර ඉතිරි බහාලුම් 19 සඳහා මේ වන විටත් රේගු පරීක්ෂණ සිදු කෙරෙමින් පවතී. මෙම අපනයනය කෙරෙන පස් මිශ්‍රිත සුන්බුන් තුල විශාල රත්‍රන් වටිනාකමක් අඩංගුව පැවතීම සැක සහිත වූ අතර, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අනුමැතියකින් තොරව සහ බලපත්‍ර නොමැතිව සිදුකරන ලද අපනයන ක්‍රියාවලිය හා එය ශ්‍රී ලංකා රේගුව හරහා බාධාවකින් තොරව අපනයනය කර තිබීම තුල මතභේදකාරී තත්ත්වයන් පැන නැගී තිබුණි. මෙම ක්‍රියාවලියට සෘජුවම සම්බන්ධ රාජ්‍ය ආයතන ලෙස ශ්‍රී ලංකා රේගුව සහ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විගණනය විසින් හඳුනා ගන්නා ලදි. එම ආයතන හරහා සිදුකරන ලද විගණන පරීක්ෂාවේදී, ශ්‍රී ලංකා රේගුවේ සිදුව තිබූ අක්‍රමිකතාවයන්ද, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් 1992 අංක 33 දරන පතල් හා ඛණිජ ද්‍රව්‍ය පනත නිසි පරිදි ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් රජයට අයවිය යුතු ගාස්තු අහිමි වී ඇති බවද අනාවරණය විය.

මෙම ක්‍රියාවලියේදී එකී ආයතනවල පැවති පද්ධති හා පාලනමය අඩුපාඩුද ආයතන අතර සම්බන්ධීකරණයේ පැවති දෝෂයන් ද මෙම අක්‍රමිකතාවයන්ට හේතු වී ඇති බව නිරීක්ෂණය විය.

කෘෂි ආර්ථිකය නගා සිටුවීම සඳහා කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර (කෘ.ප.නි.ස) නිලධාරීන්ගේ දායකත්වය ඇගයීම පිළිබඳ විශේෂ විගණන වාර්තාව

ශ්‍රී ලංකාවේ සියළුම කෘෂිකාර්මික ඉඩම් වලින් උපරිම ඵලදායකත්වයක් ලබා ගැනීමට හැකි වන පරිදි ගොවි ජනතාව පෙළඹවීම" මෙහෙවර කර ගනිමින් කෘෂිකාර්මික අංශය සම්බන්ධයෙන් ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක වන ප්‍රධාන ආයතනයක් ලෙසට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හඳුනාගෙන ඇත. එහි මෙහෙවර සඵලදායි ලෙස ඉටුකරගැනීමේ අරමුණින් 1999 වර්ෂයේ දී කෘෂි පර්යේෂණ නිෂ්පාදන සහකාර (කෘ.ප.නි.ස) තනතුර ඇති කරන ලද අතර, වර්තමානයේ එම නිලධාරීන් 9,600 ක් පමණ දීප ව්‍යාප්තව සේවය කරයි. 2011 අංක 46 දරණ ගොවිජන සංවර්ධන (සංශෝධන) පනතින් සංශෝධිත 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ 74(1) වගන්තිය යටතේ ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් පනතේ විධිවිධාන අදාල කෘ.ප.නි.ස. කොට්ඨාශ තුල ක්‍රියාත්මක කිරීමට සහ කෘෂිකාර්මික කටයුතුවලට සම්බන්ධ රජයේ වෙනත් ආයතනවල කටයුතු වලට සහාය වීම සඳහා කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් පත් කර ඇත.

මේ වන විට ශ්‍රී ලංකාව තුල කෘෂිකාර්මික අංශයෙන් දළ දේශීය නිෂ්පාදනයට ලබා දෙන දායකත්වය ක්‍රමයෙන් අඩු වී යන බව පෙන්නුම් කරන අතර කෑගල්ල දිස්ත්‍රික්කයේ වී ගොවිතැන හා සම්බන්ධ දත්ත සලකා බැලීමේදී ද පසුගිය වසර කීපය තුළ වී වගා කළ කුඹුරු ඉඩම් හා වී අස්වැන්න අඩුවී තිබීමත්, පුරන් කුඹුරු ප්‍රමාණය වැඩි වී තිබීමත් නිරීක්ෂණය කළ හැකිය. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ මෙහෙවර ඉටුකර ගැනීම සඳහා පත් කරන ලද කෘ.ප.නි.ස. නිළධාරීන් නිසි පරිදි මෙහෙයවා නොතිබීම සහ ඇතැම් අවස්ථාවලදී ඔවුන් ක්ෂේත්‍රයේ වැඩ කටයුතු නිසි ලෙස ඉටු නොකිරීම මේ සඳහා බලපා ඇති බව කෑගල්ල දිස්ත්‍රික්කයෙහි සිදු කරන ලද විගණන පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය. තවද කෘෂි කර්මාන්තය නගා සිටුවීම සඳහා කෘ.ප.නි.ස. නිලධාරීන් නිසි පරිදි මෙහෙයවීම හා ඔවුන්ගේ කටයුතු අධීක්ෂණය කිරීම සඳහා ශක්තිමත්

අභ්‍යන්තර පාලනයක් ඇති කිරීමටත්, ඔවුන් ක්ෂේත්‍රයේ රාජකාරි කටයුතු ඉටුකිරීමේදී හඳුනාගන්නා ගැටළු නිසි පරිදි කළමනාකරණය කර විසඳුම් ලබා දීමටත්, කෘ.ප.නි.ස. නිලධාරීන්ට පාලනය කළ නොහැකි කරුණු සඳහා ප්‍රතිපත්තිමය විසඳුම් ලබාදීම සඳහාත් කටයුතු කිරීම තුලින් මෙම නිලධාරීන්ගෙන් ලබාගත හැකි උපරිම සේවය ලබා ගැනීම අත්‍යවශ්‍ය බව හඳුනාගන්නා ලදී.

උතුරු මැද පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය පිළිබඳ විශේෂ විගණන වාර්තාව - 2017

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය ප්‍රකාරව, පළාත් සභා පිහිටුවීමත් සමඟ 1987 වර්ෂයේ සිට පළාත් ආයුර්වේද කොමසාරිස්වරයෙකුගේ අධීක්ෂණය හා උපදෙස් මත උතුරු මැද පළාත තුළ ආයුර්වේද දෙපාර්තමේන්තුව පිහිටුවා ඇත. එම දෙපාර්තමේන්තුව යටතේ අනුරාධපුර ආයුර්වේද රෝහල, ග්‍රාමීය රෝහල් 03 ක් සහ මධ්‍යම බෙහෙත් ශාලා 10 ක කටයුතු ආරම්භ කර තිබුණු අතර, 2017 වර්ෂය වනවිට උතුරු මැද පළාත තුළ ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ ආයුර්වේද රෝහල් 09 ක්, මධ්‍යම බෙහෙත් ශාලා 32 ක්, ඖෂධ නිෂ්පාදනාගාරයක් සහ පාරම්පරික වෙදහලක් ලෙස ව්‍යාප්ත වී ඇත.

උතුරු මැද පළාත් සභාවට වාර්ෂිකව වෙන් කරනු ලබන සමස්ථ මුදල් ප්‍රතිපාදනයෙන් පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවට සීමිත ප්‍රතිපාදනයක් පමණක් වෙන් කරනු ලබන අතර, එය 2017 වර්ෂයේ ඇස්තමේන්තුවෙන් සියයට 3 ක පමණ ප්‍රතිපාදනයකි. වර්තමානයේ දේශීය ආයුර්වේද වෛද්‍ය ක්‍රමය කෙරෙහි දේශීය ජනතාව මෙන්ම විදේශිකයින්ගේද වැඩි අවධානයක් යොමු වී තිබුණද ප්‍රතිපාදන, මානව හා භෞතික සම්පත් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් දෙපාර්තමේන්තුවට ඵලදායි සේවයක් ලබාදීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය. එමෙන්ම නිසි පරිදි සැලසුම් සකස් නොකිරීම, භෞතික හා මානව සම්පත් නිසි පරිදි කළමනාකරණය නොකිරීම, අවශ්‍යතා හඳුනා නොගැනීම ආදී කරුණුද තවදුරටත් බලපා ඇති බව නිරීක්ෂණය විය.

එලෙස ඵලදායි සේවයක් සැපයීමට අපොහොසත් වීම හේතුවෙන් දේශීය වෛද්‍ය ප්‍රතිකාර අපේක්ෂා කරනු ලබනු ජනතාවගේ අපේක්ෂාවන් ඉටුවන ආකාරයට සේවය ලබාදීමට නොහැකි වී ඇත. තවද, නියමිත පරිදි ප්‍රසම්පාදන කාර්යපරිපාටින් අනුගමනය නොකිරීම හේතුවෙන් රාජ්‍ය මුදල් අනාර්ථික ලෙස යොදවා ඇති බවද නිරීක්ෂණය විය. ආයුර්වේද රෝහල් මඟින් ඉවත් කරනු ලබන ඝන අපද්‍රව්‍ය නිසි ලෙස කළමනාකරණයට අවශ්‍ය පියවර නොගැනීම හේතුවෙන් පාරිසරික ගැටළු රාශියකට මුහුණ දීමට ද දෙපාර්තමේන්තුවට සිදු වී ඇත.

ඒ අනුව, පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවෙන් අපේක්ෂිත කාර්යභාරය නිසි පරිදි ඉටු වී නොමැති බවත්, එම දෙපාර්තමේන්තුවෙන් ඵලදායි සේවයක් මහ ජනතාවට ලබාදීම උදෙසා උතුරු මැද පළාත් සභාව කටයුතු කර නොමැති බවත් පැහැදිලි වේ.

කෑගල්ල දිස්ත්‍රික්කය තුළ පුරන් කුඹුරු ගොඩකිරීමේ ක්‍රියාවලිය තුළින් ඇතිවන බලපෑම පිළිබඳ විශේෂ විගණන වාර්තාව

1990 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා සංඛ්‍යා දත්ත පිළිබඳව පරික්ෂා කිරීමේ දි කෑගල්ල දිස්ත්‍රික්කය තුල වී වගා කරනු ලබන ඉඩම් හෙක්ටයාර ප්‍රමාණය හා වී නිෂ්පාදනය ක්‍රමයෙන් පහල යමින් පවතින බව නිරීක්ෂණය විය.මේ සඳහා ප්‍රධාන ලෙස බලපානු ලබන එක් හේතුවක් ලෙස දිස්ත්‍රික්කය තුළ පවතින පුරන්කුඹුරු අවිධිමත් ලෙස ගොඩකිරීම හඳුනාගන්නා ලදී. මෙම පුරන් කුඹුරු ගොඩකිරිම අත්හිටුවීමට කටයුතු නොකිරිමත්,නැවත වගා කිරිමට ගොවින් පෙළඹවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නිසි ලෙස නොගැනීම හේතුවෙන් දේශිය කෘෂි ආර්ථිකය නඟා සිටුවීමට කෑගල්ල දිස්ත්‍රික්කය තුළින් ලබා දීමට හැකිව තිබූ දායකත්වය ක්‍රමයෙන් පහළ යමින් පවතින බව නිරීක්ෂණය විය.

මේ වන විට පරීක්ෂාවට ලක් කරන ලද කෑගල්ල දිස්ත්‍රික්කය තුල බලපත්‍ර මගින් ලබාගත් අනුමැතිය මත පමණක් අවස්ථා 372 කදී කුඹුරු ඉඩම් අක්කර 63 රූඩ් 02 පර්චස් 12 ක පමණ ප්‍රමාණයක් ගොඩකර තිබුණි.මෙම වාර්තාව සකස් කිරීමේ දී පොත්පත් ලේඛන පරීක්ෂා කිරීම, භෞතික පරීක්ෂාව සහ සාකච්ඡා කිරීම් මගින් තොරතුරු රැස්කිරීම සිදුකරන ලදී.ඒ අනුව කරනු ලැබූ විගණන පරීක්ෂාවේදී විධිමත් ක්‍රමවේදයෙන් බැහැරව බලපත්‍ර නිකුත් කිරීම,අවසර ලබාගත් ප්‍රමාණය ඉක්මවා වගාකල කුඹුරු වලට හානිවන ලෙස ඉඩම් ගොඩකිරීම,අවිධිමත් බලපත්‍ර මත කරනු ලැබූ ගොඩකිරීම් නැවැත්වීමට කටයුතු නොකිරීම,අපද්‍රව්‍ය මුදාහැරීම හේතුවෙන් කුඹුරු විනාශවීම ආදී නිරීක්ෂණ රාශියක් හඳුනාගැනීමට හැකි විය.

ගොවිජන සංවර්ධන පනතේ 28 වගන්තිය යටතේ ගොවිජන සංවර්ධන කොමසාරිස් වෙත පැවරී ඇති බලතල නැවත සලකා බලා සංශෝධනය කිරීම,වගාකිරීම දිරිගැන්වීම සඳහා ගොවීන්ට සානුබල සැපයීම,ගොවිජන සංවර්ධන පනත හා චක්‍රලේඛ මගින් පනවා ඇති විධිවිධාන නිලධාරීන් මගින් ක්‍රියාවට නැංවීම ආදී ක්‍රියාමාර්ග ගැනීම තුළින් අවිධිමත් ලෙස පුරන් කුඹුරු ගොඩකිරීම වැලැක්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු බව නිර්දේශ කෙරේ.

ජාතික ලොතරැයි මණ්ඩලය විසින් පවත්වනු ලබන 32 වන කලම්බු එයාර්පෝර්ට් සුපර්ඩ්‍රෝ ලොතරැයිය, නව ගුවන් තොටුපල හා ඩොලර් ෆෝචූන් ලොතරැයි සම්බන්ධයෙන් සිදුකරන ලද විශේෂ විගණන වාර්තාව

කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපල ලොව වටා සංචාරකයින්ට සිත් ගන්නා සංක්‍රාන්ති මධ්‍යස්ථානයක් වශයෙන් ප්‍රවර්ධනය කිරීම සහ ගුවන් තොටුපොලෙන් උපයාගන්නා ආදායම වැඩිකර ගැනීම යන පරමාර්ථ පෙරදැරිව කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොලෙහි “විදේශ විනිමය-මෝටර් රථ ලොතරැයිය” නමින් ලොතරැයියක් පවත්වාගෙන යාම සඳහා 1991 ඔක්තෝබර් 02 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබාදී තිබුණි. ඒ අනුව ශ්‍රී ලංකාව තුළ ලොතරැයි පැවැත්වීමට බලයලත් ආයතනය වන ජාතික ලොතරැයි මණ්ඩලය විසින් මෙම ලොතරැයිය පැවැත්වීමටත්, සීමා සහිත එයාර්පෝර්ට් ඇන්ඩ් ඒවියේෂන් සර්විසස් (ශ්‍රී ලංකා) සමාගම මගින් මෙම

ලොතරැයිය සංවිධානය කිරීමටත් යෝජනා වී තිබුණි.

උක්ත යෝජනාවට අනුව 1992 දෙසැම්බර් 02 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය මගින් මෙම ලොතරැයිය පැවැත්වීමේ විධිවිධාන ප්‍රකාශයට පත්කර තිබුණු අතර එහිදී මෙම ලොතරැයිය "කොළඹ ගුවන් තොටුපොල සුපිරි දිනුම් ඇදීම" යනුවෙන් නම්කර තිබුණි. තවද, ඉහල ආදායම් ලබන පාරිභෝගික පිරිස, විදේශගතව සිටින ශ්‍රී ලාංකික පිරිස හා විදේශ රටවලින් ශ්‍රී ලංකාවට පැමිණෙන පාරිභෝගික පිරිස ප්‍රධාන වශයෙන් ඉලක්ක කරගෙන ජාතික ලොතරැයි මණ්ඩලය ඉහත ලොතරැයියට අමතරව විදේශ මුදලින් ගනුදෙනු කරන ඩොලර් ෆෝචූන් සහ නව ගුවන් තොටුපල ලොතරැයිය නමින් තවත් ලොතරැයි 02 ක් ආරම්භ කර තිබුණි.

උක්ත අරමුණු ලඟා කර ගැනීමේ අරමුණින් එම ලොතරැයිපත් නිකුත් කර තිබුණද විශේෂයෙන් 32 වන Colombo Airport super draw දිනුම් ඇදීමේදී මෙන්ම අනිකුත් දිනුම් ඇදීමේ අවස්ථාවන්හිදී එම අරමුණු සපුරා ගැනීමට නොහැකි තත්ත්වයට පත්වී තිබුණි. තවද, ලොතරැයි දිනුම් ඇදීම්වලට අදාල රීති සකස් කර ගැසට් නොකිරීම, භාණ්ඩාගාර චක්‍රලේඛ හා උපදෙස් ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා පැවතීම, ඒකාබද්ධ අරමුදලට හා අදාළ ආයතන වලට කරනු ලබන දායකත්වයන් නිසි පරිදි සිදු නොකිරීම, ලොතරැයිය ආරම්භ කිරීම, මිල තීරණය කිරීම හා පවත්වා ගැනීම වෙළඳපොල අධ්‍යයනයකින් තොරව සිදු කිරීම, අධීක්ෂණයේ දුර්වලතා හා මූල්‍ය විනය පිරිහීම, පාරිභෝගික සංතුෂ්ටිය බිඳවැටෙන අයුරින් ලොතරැයි පැවැත්වීම තුලින් ලොතරැයි ආදායම් අහිමිවීම වැනි දුර්වලතා මෙම සියලුම ලොතරැයි සම්බන්ධයෙන්ම නිරීක්ෂණයන් විය. මේ නිසා මෙම ලොතරැයි දිනුම් ඇදීම පැවැත්වීමේ ක්‍රමවේදයේදී මණ්ඩලය අපේක්ෂා කළ අරමුණු කරා ලඟා වීමට අපොහොසත් වී තිබුණු අතර මණ්ඩලය කෙරේ මහජනතාවගේ ඇති ප්‍රසාදය පලුදු වී ඇති බවද දක්නට ලැබුණි. එබැවින් ලොතරැයි පැවැත්වීමේ අරමුණු කෙරෙහි අවධානය යොමුකර උපරිම වාසි සලසා ගතහැකි පරිදි ලොතරැයි දිනුම් ඇදීම සංවිධානය කළ යුතු අතර විනිවිදභාවයකින් හා කාර්යක්ෂමතාවයකින් යුතුව ලොතරැයි දිනුම් ඇදීම සිදුකිරීම තුලින් පවත්නා අඩුපාඩු අවම කර ගැනීමට කටයුතු කළ යුතු වේ.

උපායමාර්ගික ව්‍යවසාය කළමනාකරණ ආයතනයේ (SEMA) කාර්යසාධනය ඇගයීම සඳහා වූ විශේෂ විගණන වාර්තාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපතිවරයා සතු බලතල අනුව උපායමාර්ගික ව්‍යවසාය කළමනාකරණ ආයතනය (SEMA) 2004 වර්ෂයේදී ආරම්භ කරන ලදී. මෙම ආයතනය පිහිටුවීමේ මූලික අරමුණ ලාභ නොලබන රාජ්‍ය ආයතන පෞද්ගලීකරණය නොකර උපායමාර්ගික සැලසුම් මගින් ස්වාධීන වාණිජ ව්‍යවසායන් වශයෙන් ගොඩනැගීමයි. එසේවුවද, මෙම ආයතනය මගින් අපේක්ෂිත එම අරමුණ ඉටු වී නොමැති බව විගණනයේදී නිරීක්ෂණය වූ අතර, ඒ අනුව මෙම ආයතනය තවදුරටත් පවත්වාගෙන යාමේ

සඵලතාවය පරීක්ෂා කිරීම සඳහා මෙම විගණනය සැලසුම් කරන ලදී.

මෙම ආයතනය බලාත්මක කිරීමට ජනාධිපතිවරයා විසින් විධාන පත්‍රයක් මගින් බලය ලබා දිය යුතු නමුදු වර්තමාන ජනාධිපතිවරයා විසින් එවැනි විධාන පත්‍රයක් අත්සන් කර නොතිබීම හා එවැනි බලය ලබාදීමක් නොමැතිව මෙම ආයතනය පවත්වාගෙන යාම විශේෂත්වයකි.

තවද, මෙහි පාලන කටයුතු සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කර නොමැති අතර, ආයතනයේ සභාපතිවරයා වෙත ජනාධිපති ලේකම්වරයා විසින් පැවරූ මූල්‍ය බලතල මත සියළු මෙහෙයුම් කටයුතු සිදුකර ඇත. එසේම, විධිමත් බඳවා ගැනීමේ පරිපාටියක් හෝ නොමැතිව ආයතනයට කාර්ය මණ්ඩලය බඳවා ගෙන ඇති අතර, ආයතනයට සිටිය යුතු කාර්ය මණ්ඩලය හෝ ගෙවිය යුතු වැටුප් හා දීමනා ද මේ වන විටත් විධිමත්ව අනුමත කර ගෙන නොමැත. තවද, ආයතනය වෙත බඳවා ගෙන ඇති උපදේශක මණ්ඩලය වෙත 2017 වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා රු. මිලියන 19 ක පමණ දීමනා ගෙවා තිබුණද, එම උපදේශකයන්ගේ අවශ්‍යතාවය විධිමත්ව හඳුනාගෙන නොතිබූ බවත්, ඔවුන්ගෙන් ඉටුවූ කාර්යභාරය නිසි පරිදි ලේඛණ ගතවී නොතිබූ බවත් නිරීක්ෂණය විය.

ආරම්භයේදී රාජ්‍ය ආයතන 12 ක් ද, පසුව එම ආයතනයන්ට අමතරව තවත් රාජ්‍ය ආයතන 10 ක්ද සඳහා උපායමාර්ගික සැලැසුම් සකසා අධීක්ෂණය කිරීම මෙම ආයතනය වෙත පවරා දී තිබුණද, එම ආයතන සඳහා එලෙස උපායමාර්ගික සැලැසුම් සකසා අධීක්ෂණය කිරීම සිදුකර ඇති බවට ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

ඒ අනුව, ආයතනය විධාන පත්‍රයක් මගින් බලගන්වා විධිමත් පරිදි අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කර සමගාමී කාර්යන්හි නියැලි වෙනත් රාජ්‍ය ආයතන සමග ඒකාබද්ධ කර ඵලදායී ලෙස පවත්වාගෙන යාම හෝ ප්‍රමාණවත් ප්‍රතිලාභයන් නොමැතිව මෙලෙස රාජ්‍ය මුදල් අනවශ්‍ය ලෙස වැයකරමින් මෙවැනි ආයතන තවදුරටත් පවත්වාගෙන යාම ඵලදායි නොවන බැවින් මෙම ආයතනයේ පැවැත්ම විධිමත් පරිදි හමාර කිරීම සුදුසු බව පෙන්වා දෙනු කැමැත්තෙමි.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙහි කාර්යය සාධනය ඇගයීම සඳහා වූ විශේෂ විගණන වාර්තාව

1974 අංක 02 දරන ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත ප්‍රකාරව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය 1975 වර්ෂයේ දී ස්ථාපිත කර තිබුණි. 2018 ජුනි 30 දින වන විට ජනගහනයෙන් සියයට 49.9 කට පමණ නළ ජලය සැපයීමට මණ්ඩලය කටයුතු කර තිබුණු අතර පිරිපහදු කළ ජල ඒකකයක් නිෂ්පාදනය කිරීම තුළින් සියයට 42 ක පමණ දායකත්ව ප්‍රතිලාභ අනුපාතයක් ද උපයාගනු ලබයි. එසේ වුවද මණ්ඩලය ඉහළ සේවක පිරිවැයක් දැරීම හේතුවෙන් පිරිපහදු කළ ජල ඒකකයකින් රු.4.57 ක අලාභයක් ලබන තත්වයට පත් වී ඇත. තවද නිෂ්පාදනය කරනු ලබන පිරිපහදු කළ ජල ධාරිතාවෙන් වාර්ෂිකව කියුබික් මීටර් මිලියන 166 ක් පමණ ආදායම් නොලබන ජලය බවට පත්වන බවද නිරීක්ෂණය විය. පිරිපහදු කළ ජල ඒකකයක පිරිවැය ඉහළ යාම පාරිභෝගික ජනතාවට දරා ගැනීමට සිදු වීම

වැළැක්විය නොහැකි තත්ත්වයක් වන අතර ඒ හේතුවෙන් මණ්ඩලය වරින් වර ජල ගාස්තු සංශෝධනය කිරීමට පියවර ගෙන තිබුණි. පසුගිය වසර 03 ක කාලපරිච්ඡේදය තුළ සිදු කිරීමට අපේක්ෂා කළ ජල ගාස්තු සංශෝධන යෝජනා මේ දක්වා ක්‍රියාත්මක නොවූව ද එම යෝජනා ක්‍රියාත්මක වුයේ නම් එහි පීඩනය ජනතාවට දරා ගැනීමට සිදු විය හැකිව තිබුණි. ඒ අනුව පිරිවැය පාලනය කිරීමට, ආදායම් නොලබන ජල ප්‍රමාණය අවම කර ගැනීමට හා ව්‍යාපෘති කාර්ය සාධනය ඉහළ නංවා ගැනීමට අවශ්‍ය පියවර නොගෙන ජල ගාස්තු සංශෝධනය සඳහා පියවර ගැනීමට හේතු පරීක්ෂා කිරීම මෙම වාර්තාව නිකුත් කිරීමේ අරමුණ විය. ඒ අනුව 2008 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වර්ෂ 10 ක කාල පරිච්ඡේදය තුළදී මණ්ඩලයේ කාර්යසාධනය පරීක්ෂා කරන ලද අතර ඒ සඳහා පොත්පත් ලේඛන පරීක්ෂා කිරීම, අදාළ පාර්ශව සමග සාකච්ඡා කිරීම සහ ලද තොරතුරු විශ්ලේෂණාත්මකව විග්‍රහ කිරීම යනාදිය සිදු කරන ලදී. වාර්ෂිකව ක්‍රමිකව වැඩි වන ආදායම් නොලබන ජල මට්ටම අවම කර ගැනීමට විශේෂයෙන්ම කොළඹ නගරයේ වාර්ෂිකව වාර්තා වන සියයට 43 ක් වැනි ඉහළ මට්ටමක පවතින ආදයම් නොලබන ජල ප්‍රමාණය අවම කිරීමට වර්තමානය වන විට ප්‍රමාණවත් පියවර ගෙන නොමැති බවත් ඒ සඳහා දැනට ක්‍රියාත්මක වන ජල ව්‍යාපෘතීන්හි කාර්යසාධනය ද ඉතා පහළ මට්ටමක පවතින බවත් නිරීක්ෂණය විය. තවද දැනට ආරම්භ කර ඇති ව්‍යාපෘති නියමිත කාල පරිච්ඡේදය තුළ අවසන් කිරීමට නොහැකි හා ඒ හේතුවෙන් ඇස්තමේන්තු කළ වටිනාකම් ඉක්මවා අමතර පිරිවැයක් දැරීමට සිදු වීමද ජල ව්‍යාපෘති වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන් ඉදිරිපත් කර තිබූ අධි ඇස්තමේන්තු මත පදනම්ව ගෙවීම් සිදු කර තිබීම හේතුවෙන් ද, මණ්ඩලයට ඉහළ පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි.

සේවක පිරිවැය පාලනය කිරීම තුළින් මණ්ඩලයේ පිරිපහදු කළ ජල නිෂ්පාදනය සහ බෙදාහැරීම සඳහා දරන ලබන පිරිවැය පාලනය කිරීම, කොළඹ නගරයෙහි සියයට 43.14 ක් වූ ආදායම් නොලබන ජල අනුපාතය අනෙකුත් ප්‍රාදේශිකයන්ගේ සාමාන්‍ය ආදායම් නොලබන ජල අනුපාතය වූ සියයට 23 දක්වා හෝ අඩුකර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීම, ඉංජිනේරු ඇස්තමේන්තු ඉක්මවා ගෙවීම් වළක්වා ගැනීම, ආදී පියවර ගැනීම තුළින් මණ්ඩලය දරනු ලබන පිරිවැය පාලනය කිරීම සිදුකළ යුතු බව හඳුනාගන්නා ලදී. එලෙස කටයුතු කිරීම තුළින් මණ්ඩලයට වාසිදායක ආදායමක් උපයා ගත හැකි බවත් ජල ගාස්තු සංශෝධනය කිරීම තුළින් ජනතාව මත අමතර පීඩනයක් ඇතිකිරීම අවශ්‍ය නොවන බවත් නිගමනය කරමි.

සිරකරුවන්ට ආරක්ෂාව හා රැකවරණය සලසමින් ඔවුන් පුනරුත්ථාපනය කර සමාජ ගත කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ විගණකාධිපති විශේෂ වාර්තාව

1832 වර්ෂයේ දී බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී යුගයේ ලංකාව පාලනය කළ කැමරන් ආණ්ඩුකාරවරයා විසින් හඳුන්වා දෙන ලද අධිකරණ ප්‍රතිසංස්කරණයෙහි ප්‍රතිඵලයක් වශයෙන් බන්ධනාගාරය බිහි වී තිබුණි. ඒ අනුව 1844 අංක

18 දරන නීති හා අධිකරණ ආඥාපනතට අනුව බ්‍රිතාන්‍ය බොස්ටල් ක්‍රමයට අනුරූපව වැලිකඩ බන්ධනාගාරය ගොඩනැගී තිබුණි.තවද මෙම සේවාව 1877 අංක 16 දරන බන්ධනාගාර පනතට අනුව 1905 ජූලි 16 දින සිට කොමසාරිස්වරයෙකු යටතේ වෙනමම පාලනය වන දෙපාර්තමේන්තුවක් බවට පත්කරන ලදී. එමෙන්ම සමාජ විකාශනයත් සමඟ මෙම සේවාවේ අවශ්‍යතාවය තිව්‍රවීමේ ප්‍රතිඵලයක් ලෙස 1875 දී එංගලන්ත බීන් ෆීල්ඩ් බන්ධනාගාර ආකෘතියට අනුව බෝගම්බර බන්ධනාගාරය ඉදි වූ බවත්, ශ්‍රී ලංකාවේ බන්ධනාගාර පිළිබඳ ඉතිහාසයේ සඳහන් වේ. වර්තමානයේ අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය යටතේ පාලනය වන බන්ධනාගාර දෙපාර්තමේන්තුව ආරම්භ කරන ලද මුල් අවදීන්වල සිරකරුවන්ට ආරක්ෂාව හා රැකවරණය සැපයීම දෙපාර්තමේන්තුවේ මූලික අරමුණු ලෙස හඳුනාගෙන තිබුණද සමාජ සංකීර්ණත්වයත් බන්ධනාගාර ක්‍රියාවලියේ ක්‍රමික විකාශනයත් සමඟ ආරක්ෂාව, රැකවරණය හා පුනරුත්ථාපනය දෙපාර්තමේන්තුවේ මූලික අරමුණු ලෙස හඳුනාගෙන තිබුණි.

දිවයින පුරා පවතින බන්ධනාගාර ආයතන 30 ක පමණ කටයුතු පවත්වාගෙන යාම සඳහා 7,872 ක කාර්යය මණ්ඩලයක් අනුමත කර තිබුණි. ඉකුත් 05 වසර ක කාලපරිච්ඡේදයේ දී රජය විසින් මෙම ආයතන පවත්වාගෙන යාම සඳහා රුපියල් මිලියන 30,119 ක අයවැය ප්‍රතිපාදන වෙන් කර දී තිබුණි. මෙම ප්‍රතිපාදන වැය කිරීම, එහි කළමනාකරණය හා දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටුකර ගැනීම පිළිබඳව මෙන්ම වර්තමානයේ බන්ධනාගාර පිළිබඳව සමාජගත වී ඇති තත්ත්වයන් හඳුනාගැනීමට පොත්පත් හා වාර්තා පරීක්ෂා කිරීම ප්‍රශ්ණාවලියක් මගින් තොරතුරු රැස් කිරීම සම්මුඛ සාකච්ඡා පැවැත්වීම, භෞතික පරීක්ෂාවන් සිදු කරන ලදී.

වර්තමාන අවශ්‍යතාවයන්ට අනුව වර්ෂ 140 ක් පමණ පැරණි බන්ධනාගාර ආඥාපනත සංශෝධනය නොවීම, සිරමැදිරි හා වාට්ටු තුල පවතින අධික තදබදය, සිරකරුවන්ගේ අභියාචනා විභායට ගැනීම ප්‍රමාද වීම, බන්ධනාගාර තුල තහනම් ද්‍රව්‍ය භාවිතය හා බන්ධනාගාර නිලධාරීන්ගේ කාර්යය මණ්ඩලවල පවතින ගැටළුකාරී තත්ත්වයන් මත සිරකරුවන්ගේ ආරක්ෂාව, රැකවරණය හා පුනරුත්ථාපන ක්‍රියාවලිය නිසිපරිදි පවත්වාගෙන යාම අසීරු තත්ත්වයක පවතින බව නිරීක්ෂණය විය. මෙම හේතු මත බන්ධනාගාර නිසි කළමනාකරණයකට ලක්ව නොමැති බවත් ආරක්ෂාව, රැකවරණය, පුනරුත්ථාපනය යන දෙපාර්තමේන්තුවේ මූලික අරමුණු බන්ධනාගාර ක්‍රියාවලිය තුලින් ඉටුකර ගැනීමට අපොහොසත් වී ඇති බවත් නිගමනය විය.

මෙම තත්ත්වයන් මගහරවා ගැනීම සඳහා බන්ධනාගාර ආඥාපනත වර්තමානයට ගැලපෙන පරිදි හා දේශිය හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව සංශෝධනය කිරීම තුලින් සිරකරුවන් සඳහා සාධාරණ නවාතැන් පහසුකම් සැලසීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතු බවද, එමගින් සිරකරුවන් අඛන්ඩ හා විධිමත් පුනරුත්ථාපන ක්‍රියාවලියකට යොමු කිරීම සඳහා දීර්ඝ කාලීන සැලසුම් සකස් කර ක්‍රියාත්මක කල යුතු බවද හඳුනාගන්නා ලදී.

සේවක අර්ථසාධක අරමුදලෙහි අරමුදල් කළමනාකරණයේ 2015 හා 2016 වර්ෂයන්හි කාර්යසාධනය පිළිබඳ විශේෂ විගණන වාර්තාව

ශ්‍රී ලංකාවේ පෞද්ගලික හා අර්ධ රාජ්‍ය සේවයේ සේවකයින්ට සමාජ රක්ෂණ ක්‍රමයක් පිහිටුවීමේ අරමුණින් 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ සේවක අර්ථසාධක අරමුදල ආරම්භ කර ඇති අතර මෙහෙයුම් කටයුතු 1958 මැයි 30 දින ආරම්භ කරන ලදි. එම පනතේ 4 (1) වගන්තිය ප්‍රකාරව පනත ක්‍රියාවේ යෙදවීම කම්කරු කොමසාරිස්වරයාට ද එම පනතේ 5 වගන්තිය ප්‍රකාරව අරමුදල්වල කළමනාකරණය හා භාරය දැරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකු මුදල් මණ්ඩලයට ද වගකීම් පවරා ඇත. 2017 දෙසැම්බර් 31 වන දිනට සේවක අර්ථසාධක අරමුදලෙහි ක්‍රියාකාරී සාමාජිකයින් ගණන මිලියන 2.63 ක් වූ අතර එදිනට අරමුදලේ මුළු ශුද්ධ වටිනාකම රු.මිලියන 2,066,299 ක් විය. ඒ අනුව ශ්‍රී ලංකාවේ අර්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවා නියුක්තයන්ගේ සාමාජික මුදලින් සැදුම්ලත් මෙම අරමුදලට පසුගිය වර්ෂ කිහිපය තුලදී සෘජුව හා වක්‍රව බලපෑම් ඇති වී ඇති බව අවස්ථා කිහිපයක දී සාකච්ඡාවට බඳුන් විය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2015 පෙබරවාරි හා 2016 මාර්තු මාසයන්හි දී සිදුකරන ලද ප්‍රශ්නගත බැඳුම්කර නිකුත් කිරීම් පිළිබඳව පරීක්ෂා කිරීම සඳහා පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී හා උක්ත බැඳුම්කර නිකුතුව පිළිබඳව වැඩිදුර පරීක්ෂා කිරීම සඳහා පත්කරන ලද ජනාධිපති කොමිසම හමුවේ ද මේ පිළිබඳව පුළුල් ලෙස ප්‍රශ්න කරන ලදී. ඒ අනුව, එම අවස්ථාවන්හිදී හඳුනාගන්නා ලද කරුණු ද සැලකිල්ලට ගනිමින් හා සෘජු ක්‍රමයට භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම අත්හිටුවීමට තීරණගත් කාලපරිච්ඡේදයට වැඩි අවධානය යොමු කරමින් අරමුදලෙහි අරමුදල් කළමනාකරණයේ කාර්යසාධනය පරීක්ෂා කිරීම සඳහා මෙම වාර්තාව සකස් කරන ලදි. මෙම වාර්තාව සකස් කිරීමේ දී ඒ සඳහා අදාළ වූ ලේඛන පරීක්ෂා කිරීම, සම්බන්ධිත පාර්ශව සමඟ සාකච්ඡා කිරීම, ලබාගත් දත්ත විශ්ලේෂණාත්මකව විග්‍රහ කිරීම ආදී ක්‍රමවේදයන් අනුගමනය කරන ලදි.

සේවක අර්ථසාධක අරමුදල විසින් ආයෝජන අනුමත කර ගැනීමේ ක්‍රියාවලිය තාර්කික පදනමක් මත සිදු නොකිරීම, අරමුදලෙහි ආයෝජන සඳහා ප්‍රමාණවත් මුදල් තිබියදීත් වෙන්දේසි සඳහා සහභාගි නොවීම හා එම බැඳුම්කරම නැවතත් අඩු ඵලදා අනුපාතයන් යටතේ ද්විතියික වෙළෙඳපොලෙන් මිලදී ගැනීම සහ විධිමත් අධ්‍යනයකින් තොරව පාඩු ලබන සමාගම්වල මුදල් ආයෝජනය කිරීම ආදී ක්‍රියාවන් අරමුදලෙහි ගුණාත්මකභාවයට සෘජු හා වක්‍ර ලෙස

බලපා ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව, කොටස් මිලියන 42 ක ආයෝජනයෙන් රු.මිලියන 1,300 ක හානිකරණ අලාභයක් සහ රු.මිලියන 42.8 ක තථ්‍ය අලාභයක් සිදු වී ඇති අතර බැඳුම්කර ප්‍රාථමික වෙළඳපොලෙන් මිලදී නොගෙන ද්විතීයික වෙළඳපලෙන් මිලදී ගැනීම නිසා ප්‍රාථමික වෙළඳපොලෙන් මිලදී ගැනීමට වඩා රු.මිලියන 316 ක අමතර පිරිවැයක් දැරීමට අරමුදලට සිදුවී තිබුණි. තවද ද්විතීයික වෙළඳපොලේ භාණ්ඩාගාර බැඳුම්කර අලෙවිකර දින කිහිපයක් ඇතුළත එම භාණ්ඩාගාර බැඳුම්කරම ද්විතියික වෙළඳපොලෙන් මිලදී ගැනීම නිසා රු.මිලියන 347 ක අලාභයක් සිදුවී තිබුණි. ඒ අනුව, අරමුදල නිසි පරිදි කළමනාකරණය කර නොමැති බව පැහැදිලි වන අතර මුදල් ආයෝජනය කිරීමේදී වඩාත් ඵලදායි හා කාර්යක්ෂම ලෙස ආයෝජන මාර්ග තෝරා ගැනීමට අවශ්‍ය තීරණගත යුතු බව පැහැදිලි වේ. තවද සේවක අර්ථසාධක අරමුදල් පනත සුදුසු පරිදි යාවත්කාලීන කිරීම, අරමුදලෙහි ගනුදෙනු විනිවිදභාවයකින් යුතුව සිදුකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ සේවක අර්ථසාධක අරමුදලට අදාළව බැඳුම්කර කොමිසන් සභාව විසින් ලබාදුන් නිර්දේශ කඩිනමින් ක්‍රියාත්මක කිරීම තුලින් අරමුදලේ මූල්‍ය හා පරිපාලන කාර්යයන් කාර්යක්ෂම කිරීම කළ හැකි බව නිරීක්ෂණය කෙරේ.

රාජ්‍ය මුද්‍රණ සංස්ථාවේ කාර්යසාධනය පිළිබඳ විශේෂ විගණන වාර්තාව

1968 අංක 24 දරන රාජ්‍ය මුද්‍රණ සංස්ථා පනත යටතේ රුපියල් මිලියන 15 ක ආරම්භක ප්‍රාග්ධනයක් යටතේ 1968 වර්ෂයේදී රාජ්‍ය මුද්‍රණ සංස්ථාව ආරම්භ කර තිබුණි. මෙම පනත සහ පසුකාලයේදී සම්මත කරන ලද 1978 අංක 24 දරන රාජ්‍ය මුද්‍රණ සංස්ථා (සංශෝධන) පනත, 1981 අංක 51 දරන රාජ්‍ය මුද්‍රණ සංස්ථා (සංශෝධන) පනත සහ 1998 අංක 7 දරන රාජ්‍ය මුද්‍රණ සංස්ථා (සංශෝධන) පනත යන පනත් වලින් සංස්ථාවේ අරමුණු ලෙස රජය, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, පළාත් පාලන ආයතන හෝ පුද්ගලික ආයතන වල මුද්‍රණ කටයුතු ඉටු කිරීම, ලිපි ද්‍රව්‍ය හා පොත් නිෂ්පාදනය, ආනයනය, අපනයනය, විකිණීම, මිලදී ගැනිම යන කටයුතු දක්වා තිබුණි. සභාපතිවරයෙකුගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් පාලනය වන සංස්ථාවෙහි වර්තමානය වන විට 715 ක කාර්යය මණ්ඩලයක් සේවය කරනු ලබයි.2013 වර්ෂයේ දී රු.මිලියන 41.8 ක ශුද්ධ ලාභයක් ඉපයීමට සමත් වූ සංස්ථාව ක්‍රමයෙන් 2017 වර්ෂය වන විට අලාභ ලබන තත්ත්වයට පත් වී ඇති බව නිරීක්ෂණය විය. තවද සංස්ථාවේ ද්‍රවශීලතාවය සහ ආයෝජිත ප්‍රාග්ධනයට ප්‍රතිලාභ අනුපාතයද පිරිහී තිබීම තුළ ආයතනයේ පැවැත්ම ගැටළු සහගත තත්ත්වයකට පත් වී ඇති බවද නිරීක්ෂණය විය. මෙවැනි තත්ත්වයක් තුල රාජ්‍ය අංශයේ ප්‍රමුඛ නිෂ්පාදන ආයතනයක් වන මෙම ආයතනය අකාර්යක්ෂම වීමට හේතු පරීක්ෂා කිරීමටත් නැවතත් ලාභ ලබන ආයතනයක් බවට පත්කිරීමට ගත හැකි පියවර පරීක්ෂා කිරීමත් මෙම විගණනයේ අරමුණ විය. තවද ආයතනය 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය

වන විට ක්‍රමයෙන් අලාභ ලබන තත්ත්වයට පත්වීමට හේතූන් ද පරීක්ෂා කරන ලදී.

ඒ අනුව 2016 හා 2017 වර්ෂයන්හි අලාභ ලැබීමට ප්‍රධානතම හේතු ලෙස ඉහළ සේවක පිරිවැය හා කෙටිකාලීන ණය සඳහා මූල්‍ය පිරිවැය ඉහළයාම හඳුනාගත හැකි විය. ඒ අනුව 715 ක කාර්යය මණ්ඩලයක් සඳහා අයවැය යෝජනා අනුව වර්තමානය වන විට වාර්ෂිකව වැටුප් වැඩිවීම් ලබා දීම සේවක පිරිවැය වැඩි වීමට හේතුව වී තිබුණි. තවද මුද්‍රණ සංස්ථාව වර්ෂ 20 කට වඩා පැරණි යන්ත්‍ර භාවිතා කිරීම හේතුවෙන් නිෂ්පාදන කාර්යක්ෂමතාවය ප්‍රමාණවත් නොවීම නිසා ලැබෙන ඇණවුම් භාරගැනීමට නොහැකි තත්ත්වයකට පත් වී ඇත. තවද සංස්ථාව ලොතරැයි මණ්ඩලයෙන් සහ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවෙන් ලැබෙන මුද්‍රණ ඇණවුම් මත පමණක් රඳා පැවැතීම අවදානම් තත්ත්වයක් ලෙස නිරීක්ෂණය විය. එහිදී අධ්‍යාපන ප්‍රකාශණ දෙපාර්තමේන්තුව ටෙන්ඩර් පරිපාටියෙන් බැහැරව පොත් මුද්‍රණය සඳහා ලබා දුන් සහනය අවලංගු කිරීම තුල සංස්ථාව මුහුණ දුන් තත්ත්වයෙන් මෙය මනාව පිළිඹිබු විය. ඒ අනුව ආයතනය විසින් නව යන්ත්‍ර භාවිතා කර නිෂ්පාදන විවිධාංගිකරණයට යොමු නොවුනහොත් අනාගතයේදී ආයතනයට දැඩි දුෂ්කරතාවයකට මුහුණ දීමට සිදුවීම වැලැක්විය නොහැකි බව පැහැදිලි කරුණකි. තවද ආයතනය පවත්නා ද්‍රවශීලතා ගැටළු සඳහා කඩිනමින් විසඳුම් ලබා ගනිමින් නැවතත් ලාභ ලබන නිෂ්පාදන ආයතනයක් බවට පත්කිරීම අත්‍යාවශ්‍ය බව නිරීක්ෂණය විය.

යාන් ඔය වැලි කැණීම් ව්‍යාපෘතිය සම්බන්ධ විශේෂ විගණන වාර්තාව

රිටිගල කඳුවැටියෙන් ආරම්භ වී කි.මී. 145 ක් පමණ ගලා ගොස් පුල්මුඩේ ප්‍රදේශයෙන් මුහුදට එක්වන යාන්ඔය ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පඹුරුගස්වැව ප්‍රදේශයෙන් හරස් කර යාන්ඔය ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. මෙම ව්‍යාපෘතිය රු.මිලියන 36,855 ක වියදමක් දරා 2018 මැයි 31 වන දින වනවිට අවසන් කිරීම සඳහා සැලසුම් කර තිබුණු අතර මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු පැවරී තිබූ CAMCE සමාගම ව්‍යාපෘතියට අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා ගැනීම සඳහා කැණීම් කිරීමේදී ජලාශයට යටවන ප්‍රදේශය තුළ පොළොව අභ්‍යන්තරයේ විශාල වැලි නිධියක් තැන්පත් වී ඇති බව හඳුනාගෙන තිබුණි. මෙම වැලි නිධියේ අනිශ්චිත ඇස්තමේන්තුව කියුබ් 675,000 ක් පමණ වන බවත් එහි වටිනාකම දළ වශයෙන් රු.මිලියන 2,700 ක් බවත් යාන් ඔය ව්‍යාපෘති කාර්යාලය දන්වා තිබුණි. ඒ අනුව මෙම වැලි නිධියේ කැණීම් සඳහා CAMCE සමාගමට සහ පුද්ගලයන් 183 දෙනෙකු සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් බලපත්‍ර නිකුත් කර තිබුණි. එලෙස බලපත්‍ර නිකුත් කිරීමේදි මෙන්ම කැණීම් කිරීමේදි ඇති වී තිබෙන අවිධිමත්භාවය නිසා උද්ගත වී ඇති සමාජයීය, තාක්ෂණික හා පාරිසරික ගැටළු පිළිබඳව පරීක්ෂා කිරීම සඳහාත් ඒ සඳහා ලබාදිය හැකි විසඳුම් යෝජනා කිරීමත් මෙම වාර්තාවේ අරමුණු විය.

වාර්තාව පිළියෙල කිරීමේදී, වැලි නිධිය ඉවත් කිරීමේදී අනුගමනය කර ඇති ක්‍රියාමාර්ග, ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ලබාදී ඇති කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීම හා යාන් ඔය ව්‍යාපෘතිය සඳහා අමුද්‍රව්‍ය සැපයීමේදී ශාස්ත්‍ර අයකිරීම ආදී ක්ෂේත්‍ර පරීක්ෂා කරන ලද අතර, ඒ සඳහා අවශ්‍ය ලිපි ලේඛන පරීක්ෂා කිරීම හා අදාල පාර්ශවයන් සමඟ සාකච්ඡා කිරීම් සිදුකරන ලදි. මෙහිදී සම්පත් හා කාලය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් කැණීම් බලපත්‍ර සම්බන්ධයෙන් නියැදි පරීක්ෂාවන් සිදුකරන ලද අතර, තාක්ෂණික දැනුම ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ජලාශ භූමියේ ගොඩ ගසන ලද වැලි තොගවල ප්‍රමාණයන්

නිසි පරිදි ගණනය කිරීමටද CAMCE ආයතනය කැණීම් කරන ලද ගල්, වැලි, පස් හා බොරළු ප්‍රමාණයන්ගේ සත්‍ය ප්‍රමාණයන් තහවුරු කරගැනීමට ද නොහැකි විය.

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යන ආයතන වැලි නිධිය ඉවත් කිරීම සම්බන්ධයෙන් වගකිවයුතු ආයතන වන අතර, මෙම ආයතන නිසි පරිදි ක්‍රියාත්මක නොවීම හේතුවෙන් උක්ත වැලි නිධිය ඉවත් කිරීමේ කටයුතු අවිධිමත් වී තිබුණි. තවද, වැලි කැණීම් කිරීම සඳහා බලපත්‍ර ලබාදීම තරඟකාරී හා විවෘත මිල කැඳවීමකින් තොරව සිදු කිරීමත්, වැලි නිධිය ඉවත් කිරීමේදී පරිසරයට සිදුවන බලපෑම පරිසර අධිකාරිය මගින් නැවත තක්සේරු කර නොමැතිවීම, පරිසරය පුනරුත්ථාපනය කිරීමේ වගකීම පැහැර හල බලපත්‍රලාභීන් අධීක්ෂණය කර පරිසර පුනරුත්ථාපනය කරවීමට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය පියවර ගෙන නොතිබීමත්, නිල නොවන පාර්ශවයන් විසින් කරනු ලබන අයථා මුදල් ලබාගැනීම නතර කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබීම ඇතුළු ගැටළු රාශියක් හේතුවෙන් කැණීම් කටයුතුවල විනිවිදභාවයක් හා විධිමත්භාවයක් නොමැති බව හඳුනාගන්නා ලදී. මෙම තත්ත්වය මත කැණීම් කටයුතු පරීක්ෂාව සඳහා තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත්කර ගැටළු නිරාකරණය සඳහා නිර්දේශ දක්වා තිබුණි. නමුත් එම කමිටුව මගින් ලබාදුන් නිර්දේශ ද නිසිලෙස ක්‍රියාත්මක කර නොතිබුණු බව නිරීක්ෂණය විය. ඒ අනුව, මෙමගින් සිදුවී ඇති පාරිසරික හානිය මෙන්ම ජලාශයේ ඉදිරි පැවැත්ම කෙරෙහි අහිතකර ලෙස බලපෑම හේතුවෙන් වැලි කැණීම නතර කිරීම සුදුසු වන අතර, දැනට ජලාශ භූමියේ කැණීම් කරන ලද ස්ථානයන් වසා දැමීම, ගොඩගසා ඇති පස් කඳු සමතලා කර භූමිය නැවතත් යථා තත්ත්වයට පත්කළ යුතු වේ. තවද, කැණීම් බලපත්‍ර නිකුත් කළ පසු ඒ පිළිබඳව පසු විපරම් කටයුතු සිදුකිරීම හා පනත බලාත්මක කිරීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් හඳුන්වා දී ක්‍රියාත්මක කිරීමට කාර්යාංශය කටයුතු කළ යුතු වේ.

ඒ අනුව රු.බිලියන 2.7 ක් වටිනා වැලි නිධිය ඉවත් කිරීමේදී නිසි පරිදි කළමනාකරණය නොකිරීම හේතුවෙන් හා අවිධිමත්භාවය නිසා එය පරිසරයට අහිතකර ලෙස බලපා තිබීමත්,ඒ තුලින් රජයට හිමි විය යුතුව තිබූ ආදායම ද අහිමි වී ඇති බව නිගමනය කරමි.

මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යනය සහ එම ව්‍යාපෘතිය සඳහා වන ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ විශේෂ විගණන වාර්තාව

එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය වුද වර්තමානයේ මහාමාර්ග සහ මාර්ග සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලද 2007 – 2017 මහාමාර්ග මහා සැලැස්මට අනුව උතුරු අධිවේගී මාර්ගය ඉදිකිරීම හඳුනාගෙන තිබුණි. තව දුරටත් කරුණු පරීක්ෂා කිරීමේ දී, 1990 වර්ෂයේ සිටම මධ්‍යම පළාතට අධිවේගී මාර්ගයක් ඉදිකිරීම සඳහා සැලසුම් ක්‍රියාත්මක කර තිබූ බව තහවුරු වී ඇති අතර එහි දී මෙම ඉදිකිරීම් වලට අදාල ජාතික ප්‍රතිපත්ති ක්‍රියාත්මක නොවීම නිසා රටට සිදුව ඇති අලාභ මෙපමනකැයි තක්සේරු කල නොහැකිවන අතර නිරීක්ෂණය වූ ඇතැම් කරුණු මෙම වාර්තාවට ඇතුලත් කර ඇත. කෙසේ වුවද මෙම වාර්තාව 2017 සැප්තැම්බර් මස 19 දින පැය 1430 ට පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා සාකච්ඡාවේදී මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ ප්‍රගතිය පිළිබඳව

සහ ඒ පිළිබඳව වර්තමානයේ උද්ගතව ඇති ප්‍රශ්න පිළිබඳව කරන ලද සාකච්ඡාවේදී සිදුවූ ප්‍රශ්න කිරීම්වලින් අනතුරුව ඊට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය, මාර්ග සංවර්ධන අධිකාරිය සහ ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව විශේෂ විගණන වාර්තාවක් පිළියෙල කරන ලෙස විගණකාධිපති වෙත දුන් උපදේශය සඳහාවූ එකඟතාවය පරිදි ඉදිරිපත් කරනු ලැබේ.

- විගණිත දිනය වන විටත් අධිවේගී මාර්ගපථය පැහැදිලිව හඳුනාගෙන ඇස්තමේන්තු සංශෝධනය කර නොමැති තත්වයක් යටතේ ලංසු ලේඛණ පිළියෙල කිරීම සහ ලංසු ඇගයීමේ නිරවද්‍යතාවය විගණනයට ප්‍රශ්නකාරී වේ. ව්‍යාපෘතිය සඳහා වන ඉංජිනේරු ඇස්තමේන්තුවලට ලැබුණු අනුමැතිය, එය අනමත කල දිනය, සහ එම ඇස්තමේන්තුව පිළියෙල කල නිලධාරීන්ගේ නිල මුද්‍රා නොවීය.
- මධ්‍යම අධිවේගී මාර්ග අංක 01, 02 සහ 03 වන කොටස් වලට අදාලව උපදේශක සමාගමක් සහ කොන්ත්‍රාත් සමාගමක් තෝරාගැනීමේ පටිපාටිය 2006 රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.1 වගන්තියට පටහැනිව ක්‍රියාත්මකවී තිබුණි.
- තරඟකාරී මිල ක්‍රමය අනුගමනය නොකිරීම හේතුවෙන් 2006 රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 1.2.1 වගන්තියට පටහැනිව තිබුණි.
- කොන්ත්‍රාත්කරු තෝරාගැනීමේදී අනුගමනය කර ඇති පටිපාටියට අනුව එය රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 1.4.2 සහ 1.4.3 හි දැක්වෙන ප්‍රසම්පාදන සාරධර්මවලට පටහැනි වී තිබුණි.
- ජපන් තානාපති විසින් නම් කරන ලද ආයතනවලින් ලංසු කැඳවීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය නොතිබුණි.
- ජපාන තානාපති කාර්යාලය විසින් මෙම අවිධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියට අකමැත්ත පලකර තිබියදීත් අමාත්‍යාංශ

- 2014 දෙසැම්බර් 31 දින වන විට ස්මෙක් ආයතනයට (SMEC) රු.මිලියන 1,759 ක් ද එම ආයතනයේ වාර්තා පිළිගත හැකි තත්වයක නොපවතින නිසා මේ සම්බන්ධව විවිධ අධ්‍යයන සඳහා බාහිර ආයතන වලට රු.මිලියන 65 ක්ද ගෙවා තිබුණද අවසාන ශක්‍යතා අධ්‍යන වාර්තාවක් සකස් කර නොතිබුණි.

  ලේකම් විසින් ලංසුකරුවන් නම් කරන ලෙස ජපන් තානාපති වෙත ලිපි ඉදිරිපත් කිරීමේ හැකියාව ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූල වී නොතිබුණි.
- මුදල් අමාත්‍යවරයාද විරෝධය පළ කර තිබියදීත් අනුගමනය කර තිබූ තරඟකාරී ලංසු ක්‍රියාවලිය නවතා ඊට පරිබාහිරව අමාත්‍යතුමාගේ කැබිනට් සංදේශයේ සඳහන් පරිදි Fujita සමාගම විසින් ඉදිරිපත් කර තිබූ ලංසුව පිළිබඳව එම ආයතනය (Fujita) සමඟ සාකච්ඡා කිරීමට උත්සහ කිරීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට පටහැනිවේ.
- ධාරිතාවය නොමැති හෙයින් Fujita සමාගමේ ලංසුව ප්‍රතික්ෂේපවී තිබියදීත් එකී ලංසුව නැවත වතාවක් ඇගයීමට ලක්කරන ලෙස ජපාන විශේෂ උපදේශකගේ ඉල්ලීම පිළිගෙන ක්‍රියාත්මක කිරීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට පටහැනි වේ.
- Fujita සමාගමේ ලංසුව ප්‍රතික්ෂේප කිරීම නිවැරදි බවට නැවතත් ප්‍රසම්පාදන කමිටුව නිර්දේශ කර තිබියදීත් ඊට පටහැනිව එකී සමාගමට, ප්‍රසම්පාදනය ප්‍රදානය සඳහා හිමිකමක් ඇති Taisei සමාගම සමඟ බද්ධවීමට අනුමැතිය ලබාගැනීම සහ ඊට බලපෑම් කිරීම ප්‍රසම්පාදන මූලධර්මවලට පටහැනිවේ.

ඉහත කරුණු හේතුවෙන් රාජ්‍ය මුදල් සහ අනෙකුත්

සම්පත් අපතේයාම සිදු වන අතර වැය වන මුදල සහ ඊට ලැබෙන අගය අතර විශාල වෙනසක් පවතින බව නිරීක්ෂණය විය.එසේම ව්‍යාපෘතිය සඳහා යොදා ගනු ලබන රාජ්‍ය ණය කාර්යක්ෂමව, ආර්ථිකභාවයෙන් යුතුව හා ඵලදායී ලෙස භාවිතා කළ යුතු අතර, එසේ භාවිතා කරන බව සහතික කිරීම සඳහා සුදුසු අභ්‍යන්තර පාලන ක්‍රම සැළසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා යාවත්කාලීනව පවත්වාගෙන යාම කළමනාකරණයේ වගකීමක් වේ. තවද, විදේශ ආධාර යටතේ ක්‍රියාත්මක වන මෙවැනි මහාපරිමාන ව්‍යාපෘති සැලසුම් කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදි ඊට සම්බන්ධිත නිලධාරීන් නිසි වෘත්තීය පරීක්ෂාවෙන් කටයුතු කල යුතු වන අතර යහ පාලන ආකෘතිය තුල මීට සම්බන්ධ ආයතන ක්‍රියා කිරීමද අත්‍ය අවශ්‍ය වේ.

වී අලෙවි මණ්ඩලයේ කාර්යසාධනය පිළිබඳ විශේෂ විගණන වාර්තාව

1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩල පනත යටතේ 1972 වර්ෂයේදී වී අලෙවි මණ්ඩලය සංස්ථාපනය කර තිබුණි. වී සහ සහල් මිලදී ගැනීම, අලෙවි කිරීම,සැපයීම, බෙදාහැරීමේ ව්‍යාපාරයක් ලෙස පවත්වා ගැනීම ප්‍රධාන අරමුණු ලෙස සලකමින් හා තවත් අරමුණු කිහිපයක් ළඟා කර ගැනීම සඳහා ආයතනය පිහිටුවා තිබුණි. එම අරමුණු ඉටුකර ගැනීම සඳහා මෙම ආයතනය පිහිටුවා තිබුණද 2008 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුලදී ආයතනය අලාභ ලබන තත්ත්වයට පත් වී තිබුණු අතර 2016 වර්ෂය වන විට එය රු.මිලියන 5,894 ක මෙහෙයුම් අලාභයක් වාර්තා කර තිබුණි. මෙලෙස අකාර්යක්ෂම තත්ත්වයට ආයතනය පත් වීමට හේතු පරීක්ෂා කිරීම සඳහාත් නැවත කාර්යක්ෂම තත්ත්වයට ආයතනය පත් කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පරීක්ෂා කිරිම සඳහාත් මෙම විගණනය සිදු කරන ලදී. මෙහිදි 2008 – 2018 කාලපරිච්ඡේදයට අදාලව කරුණු පරීක්ෂා කරන ලද අතර එම කාල පරිච්ඡේදය තුල ආයතනයේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය පරීක්ෂා කිරීම සඳහා වී මිලදී ගැනීම, අලෙවි කිරීම, ආනයන අපනයන ක්‍රියාවලිය හා ගබඩා පහසුකම් පිලිබඳව පරීක්ෂා කරන ලදී. ඒ අනුව 2008 වර්ෂයේ සිට සලකා බැලීමේදී 2011 වර්ෂය හැරුනු විට සෑම වර්ෂයකදීම මෙහෙයුම් අලාභ ලැබීමට අමතරව ආයතනය දළ අලාභයක්ද වාර්තා කර තිබුණි. රජය විසින් හෝ මණ්ඩලයේ ඉහල කලමනාකාරිත්වය ගන්නා ලද තාර්කික නොවන විකුණුම් මිල මත මෙවැනි තත්ත්වයක් මණ්ඩලයට ඇති වී තිබුණි. තවද ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහස් දැක්වීමට අනුව වාණිජ කටයුතු පවත්වාගත හැකි බවට තීරණය කිරීම සඳහා මණ්ඩලය පිහිටුවීමට පෙර පුළුල් අධ්‍යනයක් සිදු නොකිරීම, ප්‍රශස්ථ ගබඩා පාලනයක් සිදු නොකිරීම, පරිභෝජනයට ගත හැකි වී තොග සත්ත්ව ආහාර ලෙස නිකුත් කිරීම, පිරිවැයට වඩා අඩු අගයන්ට වී තොග විවිධ ආයතනයන්ට නිකුත් කිරීම, යාවත්කාලීන කරන ලද මිල ප්‍රතිපත්තියක් නොමැතිවීම ආදී හේතූන් නිසා එම අකාර්යක්ෂමතාවය තවදුරටත් වර්ධනය වී තිබුණි. නිසි පරිදි මිල ගණන් කැඳවා වී අලෙවි කිරීම, මණ්ඩලයට අයවිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීම හා ණය මුදල් ගෙවා බැරකම් නිදහස් කිරිම, නිසි ගබඩා පාලනයක් ඇති කිරීම, බාහිර ආයතනයන්ට සහල් නිකුත් කිරීමේදී තාර්කික මිලකට නිකුත් කිරිම ආදි පියවර කඩිනමින් ගත යුතුව ඇති බව හඳුනා ගන්නා ලදී. කෙසේවුවද වී අලෙවි මණ්ඩලය කඩිනමින් ප්‍රතිව්‍යුහගත කර

කාර්යක්ෂම ආයතනයක් බවට පත් කිරීම තුලින් පෞද්ගලික අංශය සමඟ තරඟකරමින් පෞද්ගලික අංශයේ පවතින ඒකාධිකාරී වෙළඳපල මඟ හරවා ගැනීමට කටයුතු කළ යුතු බවට නිගමනය කරමි.

නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඉටුකළ සංවර්ධන ව්‍යාපෘති වල කාර්යය සාධනය පිළිබඳ විශේෂ විගණන වාර්තාව

වර්ග කිලෝ මීටර් 1,741 ක විශාලත්වයකින් යුත් නුවරඑළිය දිස්ත්‍රික්කය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 5 කින් හා ග්‍රාම නිලධාරී වසම් 496 කින් සමන්විත වේ. දිස්ත්‍රික්කයෙහි ජනතාව රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව මනා සැලැස්මකින් යුතුව ජාතික සංවර්ධනයට දායක කර ගැනීමට හැකි වන පරිදි තිරසාර සංවර්ධනයක් උදෙසා, සම්පත් හා ආයතන ඵලදායි ලෙස මෙහෙය වන්නා වූ සම්බන්ධීකරණයක් මගින් ජනතා අවශ්‍යතා කාර්යක්ෂමව, සාධාරණව, යුක්තිගරුකව හා මිත්‍රශීලීව ඉටු කිරීම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන් අතර ප්‍රමුඛ වේ. උක්ත අරමුණු ඉටුකර ගැනීම උදෙසා රජය විසින් වාර්ෂිකව මුදල් ප්‍රතිපාදන වෙන්කරනු ලබන අතර, 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා රු.4,768,574,578 ක මුදල් ප්‍රතිපාදන වෙන්කර තිබුණි. ඉන් රු.3,613,421,660 ක් උපයෝජනය කර ව්‍යාපෘති 7,537 ක් ක්‍රියාවට නැංවීම ආරම්භ කර තිබුණු අතර ඉන් ව්‍යාපෘති 5,812 ක කටයුතු නිමකර ඇත. ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා පළාත් පාලන ආයතන මඟින් මෙම ව්‍යාපෘති ඉටුකරවා වාර්ෂිකව ව්‍යාපෘති 1,000 කට වැඩි ප්‍රමාණයක් ක්‍රියාවට නැංවුවද, තාක්ෂණික දැනුම සහිත නිලධාරීන් දිස්ත්‍රික්කය තුළ ප්‍රමාණවත් නොවන අතර එම නිළධාරීන් බඳවා ගැනීමට කටයුතු නොකිරීම, ප්‍රදේශයේ කාලගුණ තත්ත්වය පිළිබඳව පූර්ව අධ්‍යයනයකින් තොරව කොන්ත්‍රාත් ආරම්භ කිරීම හේතුවෙන් ව්‍යාපෘති ප්‍රමාදවීම්, කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේදී විවෘත මිල කැඳවීමකින් හා සමිතිවල මූල්‍ය ශක්තිය පිළිබඳව ඇගයීමට ලක් කිරීමකින් තොරව ප්‍රජා පාදක සමිති මගින් ඉටු කරවා ගැනීම මගින් ව්‍යාපෘති අසාර්ථකවීම වැනි ගැටළු පැනනැගී ඇති බව නිරීක්ෂණය විය.

තවද ව්‍යාපෘති හඳුනාගැනීම, පිරිවැය ඇස්තමේන්තු සකස් කිරීම, අවිච්ඡේද ව්‍යාපෘති නිම කර ගැනීම, විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදයන් අනුගමනය කිරීම, ප්‍රතිපාදන බෙදාදීමේ නිර්නායකයන් සකස් කිරීම ආදිය නිවැරදිව සිදුනොකිරීම හේතුවෙන් දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති වලින් අපේක්ෂා කරනු ලැබූ අරමුණු කරා ළඟාවීමට නොහැකිවී ඇති බවද නිරීක්ෂණය වේ.

උක්ත ගැටළු හේතුවෙන් නිසි ප්‍රමිතියකින් තොර ව්‍යාපෘති හා නිම නොකරන ලද ව්‍යාපෘති බිහිවීමත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී රාජ්‍ය මුදල් අවභාවිතා කිරීමත් මගින් ආර්ථික මෙන්ම සමාජීය ගැටළු රාශියක් මතුවී ඇත.

2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ වාර්ෂිකව අයවැයෙන් ප්‍රතිපාදන කරනු ලැබූ මූලධන ප්‍රතිපාදනවලට අමතරව විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මෙන්ම අමාත්‍ය හා මන්ත්‍රී ප්‍රතිපාදන මඟින් ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ලබාදුන් මූලධන ප්‍රතිපාදන වලින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ වගකීම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිලධාරීන්ගේ ප්‍රධාන වගකීමක් වූ අතර, එම ක්‍රමවේදයේ නීතිමය යාන්ත්‍රණය හා එහි ක්‍රියාකාරිත්වය ඇගයීම මෙම විගණනයේ අරමුණ විය.

ඒ අනුව හඳුනාගත් අඩුපාඩු මගහරවා ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත් කිරීම, පවතින නිලධාරි පුරප්පාඩු සම්පූර්ණ කිරීම,

අවභාවිතා වන රාජ්‍ය මුදල් සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගැනීම, නිසි පරිදි කොන්ත්‍රාත් ඉටු නොකරන කොන්ත්‍රාත්කරුවන් අසාදු ලේඛන ගත කිරීම වැනි පියවර ගැනීම අත්‍යවශ්‍ය කරුණකි. එලෙස කඩිනමින් ක්‍රියාමාර්ග නොගතහොත් අපේක්ෂිත ප්‍රාදේශීය සංවර්ධනය ළඟාකර ගැනීමට නොහැකි වේ.

සමෘද්ධිලාභියා සවිබල ගැන්වීම සඳහා සමෘද්ධි සහනාධාර වැඩපිළිවෙලේ දායකත්වය

ශ්‍රී ලංකාව නිදහස ලබාගැනීමෙන් පසුව ගත වූ දශක ගණනාවක් තිස්සේම මහජනතාව වෙත සහනාධාර ලබාදීමේ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක වූ අතර ඊට නව මුහුණුවරක් ලබා දෙමින් 1995 වර්ෂයේදී සමෘද්ධි සහනාධාර වැඩසටහන ආරම්භ කරන ලදී.

"දිළිඳුබව තුරන් කරමින් ජීවනෝපාය, ආර්ථික කටයුතු තුළින් සවිබල ගැන්වූ ප්‍රජාවක" යන දැක්ම මල්පල ගැන්වීමේ අරමුණින් 2014 වර්ෂයට පෙර සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය මඟින් සමෘද්ධි සංවර්ධන වැඩසටහන් මෙහෙයවනු ලැබූ අතර, 2014 වර්ෂයේදී සමෘද්ධි අධිකාරිය, ශ්‍රී ලංකා සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා උඩරට සංවර්ධනය අධිකාරිය, ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය හා උඩරට ගැමි පුනරුත්තාපන දෙපාර්තමේන්තුව යන ආයතන ඒකාබද්ධ කරමින් දිළිඳුබව තුරන් කිරීම සහ සමාජ සාධාරණත්වය සහතික කරනු ලබන සමාජයක් බිහි කිරීම සඳහා 2013 අංක 01 දරන දිවි නැගුම පනත යටතේ පිහිටු වූ දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව 2017 අංක 02 දරන දිවිනැගුම (සංශෝධන) පනත යටතේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව බවට පරිවර්තනය වී මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. 2017 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 27,191 ක් ද තත්‍ය කාර්ය මණ්ඩලය 25,750 ක් ද විය.

දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 332 ක ග්‍රාම නිලධාරි වසම් 14,022 ක් ආවරණය වන පරිදි පිහිටවූ සමෘද්ධි ප්‍රජාමූල බැංකු 1074 ක් හා ප්‍රජාමූල බැංකු සමිති 332 ක් මඟින් ක්‍රියාත්මක කරන වැඩසටහන් තුළින් ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය ප්‍රවර්ධනය කරමින් දිළිඳුකම තුරන් කර, සමාජ සාධාරණත්වය ඉටු කිරීමේ අරමුණින් ප්‍රජාවට මූලිකත්වය ලබා දී තිබූ අතර 2017 දෙසැම්බර් 31 දිනට ප්‍රතිලාභ ලැබූ පවුල් සංඛ්‍යාව 1,388,242 ක් විය. මෙම වැඩසටහන ක්‍රියාවට නැංවීම සඳහා තනි පුද්ගල, පවුල, කණ්ඩායම් හා ප්‍රජාව ඇතුළත්වන ආකාරයට කළාප, දිස්ත්‍රික් හා ජාතික මට්ටමේ සම්බන්ධීකරණ ජාලයක් ඇති කිරීම උදෙසා සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන, සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන, සමෘද්ධි දිස්ත්‍රික් කමිටු හා සමෘද්ධි ජාතික සම්මේලනය පිහිටුවා සමෘද්ධිලාභියා සවිබල ගැන්වීමේ වැඩසටහන් පුළුල් කර තිබුණි.

රටේ සමස්ථ සංවර්ධනය අරමුණු කොටගෙන සංවර්ධන දිශානතව ක්‍රියාත්මක කිරීම සමෘද්ධි සංවර්ධන වැඩසටහන මඟින් බලාපොරොත්තු වූ අතර අඩු ආදායම්ලාභී පවුල් අඛණ්ඩව දරිද්‍රතාවයෙන් පෙළීම වැලැක්වීම හා ඔවුන් වෙනුවෙන් රජයට වියදමක් දැරීමට සිදු නොවීම පිණිස ඔවුන්ගේ ආදායම් ඉපැයීමේ හැකියාව වැඩි දියුණු කර රටේ සමස්ථ ආර්ථික ක්‍රියාවලියට ඔවුන් පොළඹවා ගැනීම මෙමඟින් අපේක්ෂා කරන ලදී.

අධ්‍යාපනය, සෞඛ්‍ය තත්ත්වය, ආර්ථික මට්ටම, වත්කම්, නිවාසවල ස්වභාවය ආදි නිර්ණායක තුළින් සහනාධාරලාභීන් නැවත හඳුනාගැනීමේ සංගණනයක් 2015 - 2017 වර්ෂ අතර කාලය තුළ සිදු කරන ලදි. ඒ සඳහා රු. මිලියන 80 ක වියදමක් දරා තිබූ අතර

ප්‍රතිලාභ ලබමින් සිටි පවුල් 1,403,021 ක් හා නැවත හඳුනාගත් පවුල් 519,753 ක් ඇතුළත්ව පවුල් 1,922,774 ක තොරතුරු ලබාගෙන (ඇමුණුම 03) ප්‍රමුඛතා ලේඛන සකස් කර තිබූ නමුත් එය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

ක්ෂේත්‍ර අනුව සාරාංශගත කරන ලද විගණන නිරීක්ෂණ

ඒකාබද්ධ අරමුදල
රාජ්‍ය ආරක්ෂාව
රාජ්‍ය ව්‍යවසාය
පළාත් පාලනය
විදේශාධාර ව්‍යාපෘති
රාජ්‍ය බැංකු
වැවිලි කර්මාන්තය
ඉඩම් කටයුතු
අධ්‍යාපනය
කම්කරු හා වෘත්තිය සමිති සබඳතා
පරිසරය
විදේශ කටයුතු
විදේශ සේවා නියුක්තිය
ධීවර හා ජලජ සම්පත් සංවර්ධනය
සෞඛ්‍ය හා පෝෂණය
ජනමාධ්‍යය
නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධනය
වරාය හා නාවික කටයුතු
මහාමාර්ග
ආපදා කළමනාකරණය
ක්‍රීඩා කටයුතු
කාන්තා හා ළමා කටයුතු
සංචාරක කටයුතු
නාගරික සංවර්ධනය
කර්මාන්ත හා වාණිජ කටයුතු
නිවාස හා ඉදිකිරීම් කටයුතු
ප්‍රවාහනය
සමාජ සවිබලගැන්වීම හා සුභසාධනය
විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ
සංනිවේදනය
උසස් අධ්‍යාපනය
විදුලිබල හා පුනර්ජනනීය බලශක්තිය
ඛනිජතෙල් සම්පත් සංවර්ධනය
ග්‍රාමීය ආර්ථික කටයුතු
නගර සැලැසුම් හා ජලසම්පාදනය
මාරිමාර්ග හා ජල සම්පත්
කෘෂිකර්මය
සංස්කෘතික කටයුතු
බන්ධනාගාර හා පුනරුත්ථාපන කටයුතු
රජයේ සේවය සඳහා විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ
පළාත් සභා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන
බස්නාහිර පළාත් සභාව
මධ්‍යම පළාත් සභාව
දකුණු පළාත් සභාව
උතුරු පළාත් සභාව
වයඹ පළාත් සභාව
උතුරු මැද පළාත් සභාව
ඌව පළාත් සභාව
සබරගමුව පළාත් සභාව
නැගෙනහිර පළාත් සභාව

ඒකාබද්ධ අරමුදල	
	පුනරාවර්තන වියදම පියවා ගැනීමට ආදායම් ප්‍රමාණවත් නොවීම රාජ්‍ය ණය ශේෂය වාර්ෂිකව ඉහළ යාම ඒකපුද්ගල ණය ප්‍රමාණය අඛන්ඩව ඉහළ යාම රාජ්‍ය ණය වාරික හා වාර්ෂික පොලිය ගෙවීමට රැස්කළ ආදායම ප්‍රමාණවත් නොවීම විශ්‍රාම පාර්තෝෂික ගෙවීම සඳහා ලබා ගත් දේශීය බැංකු ණය ගිණුම්ගත නොකිරීම විදේශ ණය ශේෂ ගිණුම්වලින් අතහැරීම

ඒකාබද්ධ අරමුදල

රාජ්‍ය මූල්‍ය පාලනයට අදාළව, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVII පරිච්ඡේදයේ 148 ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව රාජ්‍ය මූල්‍ය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතු වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 ව්‍යවස්ථාව ප්‍රකාරව රජය විසින් එකතු කරනු ලබන ආදායම් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 හා 152 ව්‍යවස්ථාවන් ප්‍රකාරව ඒකාබද්ධ අරමුදලින් ගෙවීම් කළ යුතු ආකාරය සඳහන් කර ඇත.

2018 වර්ෂය සඳහා රාජ්‍ය වියදමට අවශ්‍ය නීතිමය විධිවිධාන 2017 අංක 30 දරන විසර්ජන පනතින් සළසා තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂය සඳහා රජයේ සැපයුම් හා සේවා සඳහා රු.බිලියන 4,298 ක ප්‍රතිපාදන සලසා තිබුණි. විස්තර වගුව 05 හි දැක්වේ.

මූලය	මූලධන ප්‍රතිපාදන	පුනරාවර්තන ප්‍රතිපාදන	එකතුව
	රු.බිලියන	රු.බිලියන	රු.බිලියන
විසර්ජන පනත මගින් සලසා තිබුණු සැපයුම් හා සේවා සඳහා වූ ප්‍රතිපාදන	831	1,312	2,143
පවත්නා නීති මගින් අනුමැතිය ලැබී ඇති, ඒකාබද්ධ අරමුදලට වැය බරක් වූ විශේෂ නීති සේවා සඳහා ප්‍රතිපාදන	1,153	852	2,005
සැපයුම් හා සේවා සඳහා අතිරේකව ලබා දෙන ලද ප්‍රතිපාදන	30	-	30
විශේෂ නීති සේවා වියදම් සඳහා අතිරේකව ලබා දෙන ලද ප්‍රතිපාදන	86	34	120
එකතුව	2,100	2,198	4,298

වගුව 05. - රජයේ සැපයීම් හා සේවා සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනය
මූලාශ්‍රය - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

2017 අංක 30 දරන විසර්ජන පනතේ 6 වන වගන්තිය ප්‍රකාරව ශීර්ෂය 240 ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ සංවර්ධන වැඩසටහන යටතේ පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය යටතේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ 2.3.3 ඡේදයේ සඳහන් කාර්යයන් සඳහා පමණක් උපයෝජනය කිරීම සඳහා රු.බිලියන 313.30 ක අතිරේක ප්‍රතිපාදන ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එම ප්‍රතිපාදනවලින් රු.බිලියන 312.97 ක් වෙනත් වැය ශීර්ෂවලට මාරු කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම ව්‍යාපෘතිය සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් රු.බිලියන 0.33 ක් ඉතිරි වී තිබුණි. විස්තර වගුව 06 හි දැක්වේ.

වියදමේ ස්වභාවය	ශුද්ධ ප්‍රතිපාදනය	ප්‍රතිපාදන වෙනත් ශීර්ෂවලට මාරුකිරීම	ඉතිරිවීම	ඉතිරිවීම ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස
	රු. බිලියන	රු. බිලියන	රු. බිලියන	
පුනරාවර්තන	130.99	130.92	0.07	0.05
මූලධන	182.31	182.05	0.26	0.14
එකතුව	313.30	312.97	0.33	0.11

වගුව 06 - පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය යටතේ වන ප්‍රතිපාදනය හා මාරුකිරීම්
මූලාශ්‍රය - ජාතික අයවැය දෙපාර්තමේන්තුව

සමාලෝචිත වර්ෂයේ රජයේ සැපයීම් හා සේවා සඳහා රු.බිලියන 4,298 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉකුත් වර්ෂය සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනය රු.බිලියන 3,860 ක් වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදනය රු.මිලියන 438 ක් හෙවත් සියයට 11.3 කින් වැඩි කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් රු.බිලියන 3,971 ක් උපයෝජනය කර තිබුණු අතර රු.බිලියන 327 ක් හෙවත් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 7.6 ක් ඉතිරි කර තිබුණි.

පුනරාවර්තන වියදම් සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.බිලියන 2,181 ක් වී තිබුණු අතර ඉන් රු.බිලියන 2,109 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.බිලියන 73 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු අතර එය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 3.3 ක් වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ මූලධන වියදම් සඳහා රු.බිලියන 880 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.බිලියන 625 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 28.9 ක් හෙවත් රු.බිලියන 255 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. වැය විෂයයන් අනුව එම ප්‍රතිපාදන ඉතිරිය පහත පරිදි සිදු වී තිබුණි.

- ශීර්ෂ 59 කට අදාළ පුනරාවර්තන වැය විෂයයන් 121 කට සලසා තිබුණු එකතුව රු.බිලියන 7 ක් හා ශීර්ෂ 101 ක වැය විෂයයන් 369 කට සලසා තිබුණු එකතුව රු.බිලියන 37 ක ප්‍රතිපාදනවලින් කිසිදු උපයෝජනයක් නොකර එම ප්‍රතිපාදන මුළුමණින්ම ඉතිරි කර තිබුණි.

- පුනරාවර්තන වියදම් සඳහා සලසා තිබුණු රු.බිලියන 59 ක ප්‍රතිපාදනවලින් රු.බිලියන 36 ක්ද, මූලධන වියදම් සඳහා සලසා තිබුණු රු.බිලියන 372 ක ප්‍රතිපාදනවලින් රු.බිලියන 186 කද, වශයෙන් එකතුව රු.බිලියන 222 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරියයන් සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 ක සිට සියයට 99 ක් දක්වා පරාසයක ප්‍රමාණයන්ගෙන් සමන්විත වී තිබුණි.

සමාලෝචිත වර්ෂයට අදාළව ණය ගෙවීම් හැර, මූලධන ප්‍රතිපාදනය රු.බිලියන 880 ක් වූ අතර ඉන් රු.බිලියන 625 ක් හෙවත් සියයට 71.04 ක් උපයෝජනය කර තිබුණි. ඉකුත් වර්ෂයේදී රු.බිලියන 658 ක මූලධන ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී මූලධන ප්‍රතිපාදන උපයෝජනය රු.බිලියන 32 කින් අඩු වී තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා වූ ප්‍රතිපාදනය රු.බිලියන 2,181 ක් වූ අතර, ඉන් රු.බිලියන 2,109 ක් හෙවත් සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 96.69 ක් උපයෝජනය කර තිබුණි. එය ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම වූ රු.බිලියන 1,946 සමඟ සැසඳීමේදී රු.බිලියන 163 කින් වැඩිවී තිබුණි. ඒ අනුව, ඉකුත් වර්ෂයේ රු.බිලියන 2,603 ක් වූ මුළු වියදම (ණය ගෙවීම් හැර) සමාලෝචිත වර්ෂයේදී රු.බිලියන 2,734 ක් දක්වා රු.බිලියන 131 කින් වැඩිවී තිබුණි. සමාලෝචිත වර්ෂයේ ණය ගෙවීම් හැර මුළු වියදම ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 19.25 ක් වී තිබුණු අතර ඉකුත් වර්ෂයේදී එය සියයට 19.59 ක් වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී එය අඩුවී තිබුණි. ඒ අනුව පසුගිය වර්ෂ 7 ක කාලය සමඟ සැසඳීමේදී මුළු රාජ්‍ය වියදම (ණය ගෙවීම් හැර) දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතය සමාලෝචිත වර්ෂය අවසන් වන විට අඩු කර ගැනීමට හැකි වී තිබුණි. විස්තර රූපසටහන 30 හි දැක්වේ.



රූපසටහන 30 - මුළු වියදම දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස
මූලාශ්‍ර - රජයේ මූල්‍ය ප්‍රකාශන හා මහ බැංකුවේ වාර්ෂික වාර්තා

සමාලෝචිත වර්ෂයේදී දේශීය හා විදේශීය ණය සඳහා පොලී, භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර මත වට්ටම් මීට අමතරව පුද්ගල පඩිනඩි වෙනුවෙන් රු.බිලියන 485 ක්ද, ප්‍රදානයන් හා ගෙවීම වෙනුවෙන් එකතුව රු.බිලියන 852 ක් පොලී වශයෙන් වැය කර තිබුණි. එය මුළු පුනරාවර්තන වියදමෙන් සියයට 40.41 ක සහනාධාර වෙනුවෙන් රු.බිලියන 599 ක්ද, අනෙකුත් භාණ්ඩ හා සේවා ප්‍රමාණයක් වී තිබුණු අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.බිලියන 117 කින් හෙවත් සියයට 15.85 කින් වැඩිවී තිබුණි.

වියදම් සඳහා රු.බිලියන 172 ක්ද වැයකර තිබුණි. මුළු පුනරාවර්තන වියදම

කෙරෙහි ඉහත වියදම් ඉහළ දායකත්වයක් ගෙන තිබුණු අතර, සමස්ථ පුනරාවර්තන වියදම පියවා ගැනීම සඳහා වර්ෂය තුළ රැස් කළ ආදායම ප්‍රමාණවත් වී නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ මුළු රාජ්‍ය ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.බිලියන 174 ක් වී තිබුණි. එසේම, මූලධන වියදම් සඳහාද සමාලෝචිත වර්ෂයේදී රු.බිලියන 625 ක් වැයකර තිබුණු අතර, පුනරාවර්තන වියදමේ කොටසක්, රාජ්‍ය ආයෝජන සහ ණය වාරික ගෙවීමට දේශීය ණය, විදේශ ණය හා අධාර ලබා ගැනීමට සිදුවී තිබුණි. ඒ අනුව වාර්ෂික ණය වාරික හා පොලී ලෙස විශාල මුදලක් ගෙවීමට සිදුවී තිබුණු අතර එම පිරිවැය වාර්ෂිකව වර්ධනය වෙමින් පැවැතුණි.

සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන හා මූලධන වියදම් සහ ණය ආපසු ගෙවීම්වල එකතුව රු.බිලියන 3,971 ක් වී තිබුණු අතර එම සමස්ථ වියදමින් සියයට 31.14 ක් ණය ගෙවීම සඳහාද, සියයට 21.46 ක් ණය පොලී හා වට්ටම් ගෙවීම සඳහාද වැයකර තිබුණි. සමස්ථ වියදම හඳුනාගත් අංශ 16 ක් අතර බෙදීගිය ආකාරය රූපසටහන 31 හි දැක්වේ.



රූපසටහන 31 - සමස්ථ වියදම හඳුනාගත් අංශ 16 ක් අතර බෙදී ගිය ආකාරය
මූලාශ්‍රය - ජනරජයේ මූල්‍ය ප්‍රකාශන 2018

රාජ්‍ය ආදායම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද 2018 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව, බදු ආදායම, බදු නොවන ආදායම හා වෙනත් ආදායම් ලෙස ඇස්තමේන්තු කළ රාජ්‍ය ආදායම රු.බිලියන 2,233 ක් වී තිබුණි. එය ඉකුත් වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම වූ රු.බිලියන 1,914 සමඟ සැසඳීමේ දී රු.බිලියන 319 ක් හෙවත් සියයට 16.7 වැඩි වීමක් විය. ඇස්තමේන්තුගත ආදායමට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රු.බිලියන 1,935 ක ආදායම් රැස් කර තිබුණු අතර එය ඉකුත් වර්ෂයේ රැස්කළ රු.බිලියන 1,845 ක ආදායමට වඩා රු.බිලියන 90 ක් හෙවත් සියයට 4.9 ක වර්ධනයක් වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ රැස්කළ රජයේ ආදායම් දළ දේශීය නිෂ්පාදනය සමඟ සැසඳීමේදී පිළිවෙලින් සියයට 13.4 ක් හා සියයට 13.7 ක් වී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව රජයේ ආදායම දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතය අඩු වී තිබුණි. පසුගිය 2016 වර්ෂයේදී එම අනුපාතය සියයට 14.3 ක් වාර්තා වී තිබුණු අතර ඉන් පසු වර්ෂවල අනුපාතය ක්‍රමිකව අඩුවෙමින් පැවැතුණි. විස්තර රූපසටහන 31 හි දැක්වේ.



රූප සටහන 31 රජයේ ආදායම දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස
මූලාශ්‍රය - ජනරජයේ මූල්‍ය ප්‍රකාශන

රාජ්‍ය ආදායම “බදු ආදායම හා බදු නොවන ආදායම” ලෙස ප්‍රධාන ප්‍රභේද දෙකක් යටතේ වාර්තා කර තිබුණු අතර, බදු ආදායම නැවත “ආදායම් බදු, දේශීය භාණ්ඩ හා සේවා මත බදු සහ ජාත්‍යන්තර වෙළඳාම මත බදු වශයෙන් වර්ග කර, රජයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් බදු වශයෙන් රු.බිලියන 370 ක් රැස් කිරීමට අපේක්ෂා කර තිබුණ ද, ඉන් රු.බිලියන 310 ක් පමණක් රැස් කිරීමට හැකි වී තිබුණි. එමෙන්ම දේශීය භාණ්ඩ හා සේවා මත පනවනු ලබන බදුවලින් රු.බිලියන 1,243 ක් රැස් කිරීමට අපේක්ෂා කර තිබුණත්, ඉන් රු.බිලියන 1,060 ක් පමණක් රැස් කිරීමට සමත් වී තිබුණි. ජාත්‍යන්තර වෙළඳාම මත පනවනු ලබන බදුවලින් රු.බිලියන 421 ක් රැස් කිරීමට ඇස්තමේන්තු කර තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන්

රු.බිලියන 341.7 ක් රැස් කර තිබුණි. මේ අනුව, බදු ආදායම් වලින් රු.බිලියන 2,034 ක් රැස් කිරීමට අපේක්ෂා කර තිබුණත්, ඉන් සියයට 84 ක් හෙවත් රු.බිලියන 1,712.3 ක් පමණක් රැස් කර ගැනීමට හැකි වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී බදු නොවන අනෙකුත් ආදායම් වලින් රු.බිලියන 199.1 ක් රැස් කිරීමට ඇස්තමේන්තු කර තිබුණ අතර එම ඇස්තමේන්තුගත ඉලක්කය රු.බිලියන 23.7 කින් ඉක්මවා රු.බිලියන 222.8 ක ආදායම් රැස් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ ආදායම් ඇස්තමේන්තුව හා රැස් කළ ආදායම පහත රූප සටහන 32 හි දැක්වේ.



රූප සටහන 32– ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම

මූලාශ්‍රය – ජනරජයේ මූල්‍ය ප්‍රකාශන – 2018

අයවැය හිඟය

"2006 වර්ෂය අවසානයේ අයවැය පරතරය, එම වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට පහක් නොඉක්මවන බවට සහ එම මට්ටම ඉන්පසු දිගටම පවත්වාගෙන යනු ලබන බවට වගබලා ගැනීමෙන් ආණ්ඩුවේ ණය දූරදර්ශී මට්ටම් දක්වා අඩු කිරීම" ආණ්ඩුව විසින් අනුගමනය කළයුතු වගකීම් සහිත මූල්‍ය කළමනාකරණයට පාදකවූ පරමාර්ථයක් ලෙස 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ 3(අ) වගන්තියෙහි දක්වා තිබුණි. එසේ වුවද, ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී ඇස්තමේන්තුගත අයවැය හිඟය එම වර්ෂවලට අදාළ ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 7.77 ක් හා සියයට 5.83 ක් වී තිබුණි. ඒ අනුව මූල්‍ය කළමනාකරණ වගකීම් පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීමට භාණ්ඩාගාරය අපොහොසත් වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ මුළු රාජ්‍ය ආදායම රු.බිලියන 1,935 ක් වූ අතර සමස්ථ රාජ්‍ය වියදම (පුනරාවර්තන වියදම + රාජ්‍ය ආයෝජන) රු.බිලියන 2,734 ක් වී තිබුණි. ඒ අනුව අයවැය හිඟය රු.බිලියන 799 ක් වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ හා පසුගිය වර්ෂ 7 ක රාජ්‍ය ආදායම, වියදම හා අයවැය හිඟය පිළිබඳ විස්තර රූපසටහන 33 හි දැක්වේ.



රූපසටහන 33 - රජයේ මුළු ආදායම, මුළු වියදම හා අයවැය හිඟය
මූලාශ්‍රය - රජයේ මූල්‍ය ප්‍රකාශන

අයවැය හිඟය මූල්‍යනය කිරීම

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී අයවැය හිඟය රු. බිලියන 41 කින් එනම් සියයට 5.42 කින් වැඩිවී තිබුණු අතර ශුද්ධ විදේශ ණය ගැනීම් රු.බිලියන 382 සිට රු.බිලියන 465 දක්වා රු. බිලියන 83 කින් එනම් සියයට 21.63 කින් වැඩි වී තිබුණි. ශුද්ධ දේශීය ණය ගැනීම් රු.බිලියන 209 ක සිට රු.බිලියන 170 ක් දක්වා රු.බිලියන 39 කින් එනම් සියයට 18.52 කින් අඩු වී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ අයවැය හිඟය මූල්‍යනය කිරීම සඳහා තැන්පතු ගිණුම් හා වගකීම්වල ශුද්ධ වෙනස්වීම රු. බිලියන 20 ක්වූ වාසිදායක ශේෂය, හම්බන්තොට වරාය බදු දීමෙන් ලත් මුදල් රු.බිලියන 108 ක් හා උපණය අයකර ගැනීම් රු.බිලියන 26 ක ඉහළ දායකත්වයක් ලබා දී තිබුණි.

පුනරාවර්තන වියදම පියවා ගැනීමට ආදායම් ප්‍රමාණවත් නොවීම

රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා පුනරාවර්තන වියදම රු.බිලියන 2,109 ක් හා මූලධන වියදම රු.බිලියන 625 ක් වශයෙන් මුළු වියදම රු.බිලියන 2,734 ක් වී තිබුණි. රජය විසින් උපයාගෙන තිබූ සමස්ථ ආදායම රු.බිලියන 1,935 ක් පමණක් වීම හේතුවෙන් එම ආදායම සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම පියවා ගැනීමටවත් ප්‍රමාණවත් වී නොතිබුණි. ඒ අනුව සමස්ථ රජයේ ආදායම ඉක්මවා රු.බිලියන 174 ක පුනරාවර්තන වියදම් කර තිබුණි 2010 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා එම තත්ත්වය පිළිබඳ විස්තර රූපසටහන 34 හි දැක්වේ.



රූපසටහන 34 - පුනරාවර්තන වියදම පියවීමට රජයේ ආදායම ප්‍රමාණවත් නොවීම
මූලාශ්‍රය - රජයේ මූල්‍ය ප්‍රකාශන

රාජ්‍ය ණය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **148** ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය ණය ඇතුළු සම්පූර්ණ මූල්‍ය පාලනය පාර්ලිමේන්තුව සතුවන අතර ජනරජයේ සියළු ණය සඳහා පාර්ලිමේන්තු අනුමැතිය ලබාගත යුතුවේ. ඒ අනුව, **2017** අංක **30** දරන විසර්ජන පනතේ **2.1(අ)** වගන්තිය ප්‍රකාරව ආණ්ඩුව සඳහා සහ ආණ්ඩුව වෙනුවෙන් ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැරව ණය ලබා ගැනීම සඳහා පාර්ලිමේන්තු අනුමැතිය ලබා දී තිබුණි.

රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේදී විදේශීය ණය රු.බිලියන **772** ක්ද, දේශීය බැංකු නොවන ණය රු.බිලියන **2,718** ක්ද වශයෙන් වර්ෂය තුළ ලබාගෙන තිබූ මුළු ණය ප්‍රමාණය රු.බිලියන **3,490** ක් වී තිබුණි. එය ඉකුත් වර්ෂයේ ලබාගෙන තිබුණු රු.බිලියන **3,150** ක ණය ප්‍රමාණය සමඟ සැසඳීමේදී, රු.බිලියන **340** කින් හෙවත් සියයට **10.79** කින් වැඩි වී තිබුණි. රජය දේශීය ණය කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වා තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී ලබාගෙන තිබුණු දේශීය ණය ප්‍රමාණය ඉකුත් වර්ෂයේදී ලබාගෙන තිබුණු රු.බිලියන **2,549** ක දේශීය ණය ප්‍රමාණය සමඟ සැසඳීමේදී එය රු.බිලියන **170** කින් හෙවත් සියයට **6.66** කින් වැඩි වී තිබුණි. විස්තර වගුව **08** හි දැක්වේ.

විස්තරය	2017	2018
	රු. බිලියන	රු. බිලියන
විදේශ ණය ගැනීම්	601	772
දේශීය ණය ගැනීම්		
භාණ්ඩාගාර බිල්පත්	1,624	1,653
භාණ්ඩාගාරබැඳුම්කර	549	763
විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක (ව්‍යාපෘති නොවන)	33	62
සංවර්ධන බැඳුම්කර	339	234
විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක (ව්‍යාපෘති නොවන)	4	6
මුළු දේශීය ණය ගැනීම්	2,549	2,718
වර්ෂය තුළ ලබාගත් මුළු ණය ප්‍රමාණය	3,150	3,490

වගුව 08 - දේශීය ණය හා විදේශ ණය ගැනීම්
මූලාශ්‍රය - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව / රජයේ මූල්‍ය ප්‍රකාශන

රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු මුළු රාජ්‍ය ණය ශේෂය රු.බිලියන 11,276 ක් වූ අතර, එය 2017 දෙසැම්බර් 31 දිනට පැවති රු.බිලියන 9,588 ක මුළු රාජ්‍ය ණය ශේෂය සමග සැසඳීමේදී රු.බිලියන 1,688 කින් හෙවත් සියයට 17.61 කින් වැඩිවී තිබුණි. ඉකුත් වර්ෂය හා සමාලෝචිත වර්ෂය අවසානයට පැවති මුළු රාජ්‍ය ණය පිළිබඳ විස්තර වගුව 09 හි දැක්වේ.

ණය වර්ගය	දෙසැම්බර් 31 දිනට ශේෂය	
	2017	2018
	රු. බිලියන	රු. බිලියන
භාණ්ඩාගාර බිල්පත්	725	759
භාණ්ඩාගාර බැඳුම්කර	3,755	4,000
රුපියල් ණය	24	24
ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර	638	614
විදේශ ව්‍යවහාර මුදලින් දේශීය ණය	64	101
විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකය (ව්‍යාපෘති)	14	19
සුහුරුපාය ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ලබාගත් ණය	-	7
කල්බදු ණය හිමියන්	12	8
මුළු දේශිය ණය	5,232	5,532
විදේශීය (ව්‍යාපෘති)	2,664	3,194
විදේශ මුදලින් කාලීන ණය පහසුකම්	217	330
ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර	1,475	2,220
මුළු විදේශිය ණය	4,356	5,745
මුළු රාජ්‍ය ණය ශේෂය	9,588	11,276
ඇස්තමේන්තුගත දළ දේශිය නිෂ්පාදිතය	13,500	14,200
මුළු රාජ්‍ය ණය ශේෂය ඇස්තමේන්තුගත දළ දේශිය නිෂ්පාදිතයෙන් ප්‍රතිශතයක් ලෙස	71.02	79.40

වගුව 09- රාජ්‍ය ණය සංයුතිය
මූලාශ්‍රය - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව / රජයේ මූල්‍ය ප්‍රකාශන

2013 අංක 15 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) (සංශෝධන) පනතින් සංශෝධිත 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත ප්‍රකාරව, යම් වර්ෂයක් අවසානයට පැවතිය හැකි උපරිම බැරකම් වටිනාකම එම වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 80 නොඉක්මවිය යුතුව තිබුණි. එම සීමාවන්ට අනුගතව මුදල් අමාත්‍යාංශය කටයුතු කර ඇති බව භාණ්ඩාගාර වාර්තා අනුව විදහාමාන වී තිබුණත්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට බැහැරින් ගිණුම් තබා ඇති එහෙත් විවිධ රාජ්‍ය ව්‍යවසායවලට අදාළ බැරකම්ද සැලකිල්ලට ගත්විට එම සීමාව ඉක්මවා තිබුණි. විස්තර වගුව 10 හි දැක්වේ.

බැරකම	2018 දෙසැම්බර් 31 දිනට බැරකම්
	රු.බිලියන
බැංකු අයිරාව	149
මහ බැංකු අත්තිකාරම්	199
රාජ්‍ය ණය	11,276
මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත නොකළ බැරකම්	
- ශේෂපත්‍රයෙන් පිටත ගිණුම් ලබන ලද විදේශ ණය	366
- භාණ්ඩාගාර බැඳුම්කර ශේෂය අඩුවෙන් ගිණුම්ගත කිරීම	344
- ප්‍රතිපාදන නොමැතිවීම නිසා ගිණුම්ගත නොකළ විදේශ ණය	58
- විශ්‍රාම වැටුප් පාර්තෝෂික ගෙවීම සඳහා වාණිජ බැංකු මගින් ලබා ගත් ණය	65
- සූර්යවැව ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය ඉදිකිරීම සඳහා ගෙවීම් කිරීමට ලබා ගත් ණය	4
මුළු බරකම්	12,462*
දළ දේශීය නිෂ්පාදිතය	14,200
මුළු බැරකම් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස	**87.76**

වගුව 10 - වර්ෂය අවසානයට තිබිය හැකි බරකම් ප්‍රමාණය

*මහා භාණ්ඩාගාරයේ ඇපකර මත රාජ්‍ය ව්‍යවසායන් විසින් ලබාගෙන ඇති ණය සඳහා බැංකු වෙත ලබාදී ඇති ඇපකර හා සහන ලිපි වටිනාකම වූ රු.බිලියන 829 ක් සහ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා විශේෂ වියදම් ඒකකවල වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල බැරකම් ප්‍රකාශන තුළ ඇතුළත් රු.බිලියන 259 ක් (රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු වාර්තා අනුව) ඉහත බැරකම් තුළට ඇතුළත් කර නොමැත.

ඒක පුද්ගල ණය ප්‍රමාණය

රාජ්‍ය ණය ශේෂය, මධ්‍ය වාර්ෂික ජනගහනය සමඟ සැසඳීමේදී 2013 දෙසැම්බර් 31 දිනට රු.291,304 ක් වූ ඒක පුද්ගල ණය ප්‍රමාණය, 2018 දෙසැම්බර් 31 දිනට රු.520,364 ක් දක්වා වැඩි වී තිබුණි. එසේම එය 2017 දෙසැම්බර් 31 දිනට රු.447,123 ක් වූ ඒකපුද්ගල ණය ප්‍රමාණය සමඟ සැසඳීමේදී 2018 දෙසැම්බර් 31 දිනට රු.73,241 කින් එනම් සියයට 16.38 කින් පමණ වැඩි වී තිබුණි. එසේම රාජ්‍ය ණය ශේෂයෙන් සියයට 45 ක් විදේශ ණයවීම හා රුපියල අවප්‍රමාණය වීමේ බලපෑම හේතුවෙන් ඒකපුද්ගල ණය ප්‍රමාණයේ තථ්‍ය වටිනාකම තවදුරටත් ඉහළ අගයක් ගෙන තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 05 ක රාජ්‍ය ණය ශේෂය, මධ්‍ය වාර්ෂික ජනගහනය හා ඒකපුද්ගල ණය ප්‍රමාණය වගුව 11 හි දැක්වේ.

විස්තරය	2013	2014	2015	2016	2017	2018
රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව රාජ්‍ය ණය ශේෂය (රු.බිලියන)	5,996	6,577	7,685	8,794	9,588	11,276
මධ්‍ය වර්ෂික ජනගහනය ('000)**	20,585	20,771	20,966	21,203	21,444	21,670
ඒකපුද්ගල ණය ප්‍රමාණය (රුපියල්)	291,304	316,664	366,544	414,751	447,123	520,364

වගුව 11 - රාජ්‍ය ණය ශේෂය, මධ්‍ය වාර්ෂික ජනගහනය හා ඒක පුද්ගල ණය ප්‍රමාණය
මූලාශ්‍රය - රජයේ මූල්‍ය ප්‍රකාශන හා ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව

එසේම මුළු රාජ්‍ය ණය ශේෂය තුළ විදේශ ණය සැළකිය යුතු ප්‍රමාණයක් ඇතුළත් වන අතර ,විදේශ මුදල්වලට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වීම නිසා විදේශ ණය ශේෂය මත ඇතිවන බලපෑම හේතුවෙන් ගෙවිය යුතු විදේශ ණය ශේෂය අඛණ්ඩව වර්ධනය වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට රුපියලේ අගය වෙනස්වීම හේතුවෙන් විදේශ ණය ශේෂය මත රු. බිලියන 1,029 ක අමතර ණය බරක් ඇතිවී තිබුණි. ඉදිරි වර්ෂවලදී ගෙවීමට තිබෙන ණය වාරික හා පොලී ප්‍රමාණය ඉහළ යාම හා රුපියල අවප්‍රමාණය වීම මත ඉදිරි වර්ෂයන්වල ණය ශේෂය තවදුරටත් ඉහළ යා හැක.

රාජ්‍ය ණය වාරික හා වර්ෂයට අදාළ පොලී ගෙවීමට රජයේ ආදායම ප්‍රමාණවත් නොවීම

සමාලෝචිත වර්ෂයේ රජයේ ආදායම රු.බිලියන 1,935 ක් වි තිබුණත්, වර්ෂයේ ණය වාරික හා පොලී වශයෙන් පිළිවෙලින් රු.බිලියන 2,856 ක් හා රු.බිලියන 852 ක් වශයෙන් රු.බිලියන 3,708 ක් ගෙවා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී ණය වාරික හා පොලී ගෙවීමට රජයේ ආදායම ඉක්මවා තවත් රු.බිලියන 1,773 ක් අවශ්‍ය වී තිබුණි. එම අවශ්‍යතාවය හා රජයේ වියදම් දැරීම සඳහා රජයට සමාලෝචිත වර්ෂයේදී දේශීය ණය වශයෙන් රු.බිලියන 2,718 ක් හා විදේශීය ණය වශයෙන් රු.බිලියන 772 ක් වශයෙන් එකතුව රු.මිලියන 3,490 ක ණය ලබා ගැනීමට සිදු වි තිබුණි. එම තත්ත්වය ඉකුත් වර්ෂ සමඟ සසඳා පහත වගුව 12 හි දක්වා ඇත.

විස්තරය	2014 රු. බිලියන	2015 රු. බිලියන	2016 රු. බිලියන	2017 රු. බිලියන	2018 රු. බිලියන
වර්ෂය තුළ ලබාගත් දේශීය ණය*	2,020	2,793	2,518	2,549	2,718
වර්ෂය තුළ ලබාගත් විදේශ ණය	423	556	574	601	771
ලබාගත් දේශීය හා විදේශ ණය එකතුව	2,443	3,350	3,092	3,150	3,490
දේශීය ණය වාරික ගෙවීම**	1,584	2,265	2,073	2,340	2,549
විදේශීය ණය වාරික ගෙවීම	107	187	145	219	307
දේශීය ණය සඳහා පොළී ගෙවීම්	376	450	510	597	668
විදේශීය ණය සඳහා පොළී ගෙවීම්	70	77	101	139	185
ණය වාරික හා පොළී ගෙවීම් එකතුව	2,137	2,980	2,829	3,295	3,708
රාජ්‍ය ආදායම	1,127	1,394	1,699	1,845	1,935
රාජ්‍ය ආදායම ඉක්මවූ ණය වාරික හා පොළී ගෙවීම් ප්‍රමාණය	1,010	1,586	1,130	1,450	1,773
දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ණය ශේෂය	6,577	7,685	8,794	9,588	11,276

වගුව 12. - රාජ්‍ය ණය ලබා ගැනීම . වාරික හා පොලී ගෙවීම, රාජ්‍ය ආදායම

මූලාශ්‍රය - රජයේ මූල්‍ය ප්‍රකාශන

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මුළු ආදායම්වල එකතුව රු.බිලියන 90 කින් එනම් සියයට 4.88 කින් වැඩි වී තිබුණද, එය ඇස්තමේන්තුගත ආදායම් ප්‍රමාණයට සාපේක්ෂව රු.බිලියන 298 ක් හෙවත් සියයට 13.34 කින් පමණ අඩු වී තිබුණි එසේම, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ශුද්ධ ණය ගැනීම් (දේශීය හා විදේශීය) රු.මිලියන 44,070 කින් වැඩි වී තිබුණු අතර, ණය සඳහා පොලී ගෙවීම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රු.බිලියන 117 කින් එනම් සියයට 145.85 කින් පමණ වැඩි වී තිබුණි. ඉකුත් වර්ෂයේ සම්පූර්ණ ණය වාරික හා ණය පොලී ගෙවීම්, වර්ෂය තුළ ලබාගත් මුළු ණය වලින් සියයට 104.60 ක් වූ අතර, එය සමාලෝචිත වර්ෂයේදී සියයට 106.23 ක් වී තිබුණි. ඒ අනුව වර්ෂය තුළ ලබාගත් මුළු ණය, වර්ෂයේ ණය වාරික හා ණය පොලී ගෙවීම් සඳහාවත් ප්‍රමාණවත් වී නොතිබුණි. මේ අනුව, වර්ෂය අවසානයට වූ මුළු රාජ්‍ය ණය ශේෂය වර්ෂ ගණනාවක් මුළුල්ලේ අඛණ්ඩව වර්ධනය වී තිබුණි. විස්තර රූපසටහන 35 හි දැක්වේ.



රූපසටහන 35 - රජයේ ආදායම, ණය වාරික හා පොලී ගෙවීම හා රාජ්‍ය ණය ලබා ගැනීම
මූලාශ්‍රය - රජයේ මූල්‍ය ප්‍රකාශන

රාජ්‍ය ණය සම්බන්ධයෙන් සිදු කළ විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

- 2018 දෙසැම්බර් 31 දිනට රු.බිලියන 11,276 ක් වූ මුළු රාජ්‍ය ණය ශේෂය, රු.බිලියන 14,200 ක් වූ ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 79.40 ක් වී තිබුණි. මේ අනුව, දීර්ඝ කාලයක් මුළුල්ලේ රජය විසින් ලබාගනු ලබන දේශීය හා විදේශීය ණයවලින් සැළකිය යුතු ප්‍රමාණයක් ණය වාරික හා පොලී වශයෙන් ආපසු ගෙවීම සඳහා යොදා ගෙන තිබුණි. මේ හේතුවෙන් අපේක්ෂිත පරිදි සංවර්ධනාත්මක ව්‍යාපෘති සඳහා ප්‍රමාණවත් ආයෝජනයක් කිරීමට නොහැකි වී තිබුණි.

- විගණනයට ඉදිරිපත් කරන ලද රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනට රජය විසින් ගෙවිය යුතුව තිබුණු ණය ශේෂය රු.බිලියන11,276 ක්වී තිබුණි. නමුත් පහත සඳහන් කරුණු හේතුවෙන් එම ණය ශේෂය රු.බිලියන 828 කින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

  - රජයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් භාණ්ඩාගාර බැඳුම්කර සම්බන්ධයෙන් වූ ගිණුම්කරණ ප්‍රතිපත්තිය 2016 වර්ෂයේ සිට නිවැරදිකර තිබුණු අතර, ඒ අනුව භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුවේදී ඒවායේ ශුද්ධ අගය වෙනුවට මුහුණත අගය ගිණුම්ගත කිරීම ආරම්භ කර තිබුණි. එසේ වුවද, 2016 වර්ෂයට පෙර නිකුත් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කරවල මුහුණත වටිනාකම තවදුරටත් ගිණුම්වලට ගැලපුම් නොකිරීම හේතුවෙන් 2018 දෙසැම්බර් 31 දින වන විට මූල්‍ය ප්‍රකාශනවල භාණ්ඩාගාර බැඳුම්කරවලට අදාළ මුළු බැරකම රු. බිලියන 344 ක් අඩුවෙන් දක්වා තිබුණි.

  - රජය විසින් ඇතිකර ගත් ගිවිසුම්ගත බැඳීම් යටතේ වූ විදේශ ණය ගිවිසුම් 08 කට අදාළව 2018 දෙසැම්බර් 31 දිනට පැවති රු.බිලියන 366 ක් වූ ණය ශේෂය මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

  - ඉහත සඳහන් විදේශ ණය ගිවිසුම් 08 තුළ ඇතුළත් ණය ශේෂවලින් රු.බිලියන 172 ක් හම්බන්තොට

වරාය ඉදිකිරීම සඳහා රජය විසින් ගනු ලැබ ඇති ණයවලින් ගෙවිය යුතුව තිබුණි. මේ සම්බන්ධයෙන් වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද 2017 ජූලි 20 දිනැති අංක MPS/SEC/2017/32 දරන "හම්බන්තොට වරාය සහන ගිවිසුම" නම් වූ අමාත්‍ය මණ්ඩල සංදේශයට 2017 අගෝස්තු 04 දින අමාත්‍ය මණ්ඩල විසින් අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව, හම්බන්තොට වරාය ඉදිකිරීම සඳහා රජය විසින් ගනු ලැබූ ණය වලින් තවදුරටත් ගෙවිය යුතුව ඇති ශේෂය ආපසු ගෙවීමේ වගකීම, එකී සහන ගිවිසුම බලාත්මක වන දිනයේ සිට බලපැවැත්වෙන පරිදි මහා භාණ්ඩාගාරය විසින් බාර ගෙන තිබුණි. නමුත්, එම ණය ශේෂය රජයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. එසේම, එම ණය ශේෂය වරාය අධිකාරියේ 2018 දෙසැම්බර් 31 ගැලපීමද, ණය ශේෂයට ගලපා තිබුණි. ඒ හේතුවෙන් වර්ෂය අවසානයට වූ විදේශ ණය ශේෂය, විදේශ ණය ගිවිසුම් 36 කට අදාළව රු.බිලියන 9 ක් වැඩියෙන් හා විදේශ ණය ගිවිසුම් 02 කට අදාළව රු.මිලියන 13 ක් අඩුවෙන්ද දක්වා තිබුණි.

- විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් 2014 වර්ෂයේ සිට විශ්‍රාම වැටුප් පාරිතෝෂික ගෙවීම සඳහා වාණිජ බැංකු මගින් ලබාගත් ණය මුදලෙන් 2018 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ණය ශේෂය රු.බිලියන 65 ක් වූ අතර, එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දේශීය ණය ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

- සූරියවැව ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය ඉදිකිරීම වෙනුවෙන් කොන්ත්‍රාත්කරු වෙත ගෙවිය යුතු වූ රු.බිලියන 4 ක හිඟ මුදල ගෙවීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දිනට වූ මූල්‍ය ප්‍රකාශනවලින්ද ඉවත්කර තිබුණි.

- 2018 වර්ෂයේදී උපලබ්ධි වූ විදේශ ණය ගිවිසුම් 50 කට අදාළව රු.බිලියන 39 ක් හා විදේශ ණය ගිවිසුම් 15 කට අදාළව 2017 වර්ෂයේදී උපලබ්ධි වූ රු.බිලියන 19 ක් ලෙස එකතුව රු.බිලියන 58 ක්, 2018 දෙසැම්බර් 31 දින වන විටත්, විදේශ ණය ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

- රජයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන 29, විදේශ ණය ශේෂ ප්‍රකාශනයේ 2018 දෙසැම්බර් 31 දිනට විදේශ ව්‍යවහාර මුදලින් වූ ණය ශේෂය රුපියල් බවට පරිවර්තනය කිරීමේදී මෙතෙක් ගිණුම්ගත නොකරන ලද ඉහත සඳහන් ණය උපලබ්ධීන්ට අදාළ වන 2018 දෙසැම්බර් 31 දිනට වන විනිමය

මහජන බැංකුවෙන් ණය මුදලක් ලබාගෙන තිබුණු අතර 2017 නොවැම්බර් 20 දිනැති අංක 17/2660/706/111-1 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව හා එම තීරණය අනුව, එම ණය මුදල හා ඊට අදාල පොලිය ගෙවීම එවකට මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත භාර දී තිබුණි. ඒ අනුව ඊට අදාළ අයවැය ප්‍රතිපාදන සලසමින් 2018 වර්ෂයේ සිට එම ණය මුදලේ පොලිය ගෙවීම ආරම්භකර තිබුණු අතර වර්ෂ 03 ක සහන කාලයකට පසුව 2021 වර්ෂයේ සිට ණය මුදලේ වාරික ආපසු ගෙවිය යුතුව තිබුණි. එසේ වුවද, එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දේශීය ණය ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

රජයේ ආදායම් රැස්කිරීම පිළිබඳව සිදු කරන ලද නියැදි විගණනවලදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

- සමාලෝචිත වර්ෂයේ දී රැස් කර තිබුණු බදු ආදායමින් දේශීය භාණ්ඩ හා සේවා මත පනවන ලද බදු මුදල රු.බිලියන 1,060 ක් හෙවත් මුළු බදු ආදායමින් සියයට 61.91 ක් ද මුළු රාජ්‍ය ආදායමින් සියයට 54.78 ක් ද වී තිබුණි. ඉකුත් වර්ෂයේ දී එය මුළු බදු ආදායමින් සියයට 61.32 ක් ද මුළු රාජ්‍ය ආදායමින් සියයට 55.51 ක් ද වී තිබුණි. ඒ අනුව, බදු ආදායම පාරිභෝගිකයා වෙත විතැන් කිරීම අවම කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද අපොහොසත් වී තිබුණි.

- සමාලෝචිත වර්ෂයේ රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, දේශීය භාණ්ඩ හා සේවා යටතේ වන එකතු කළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු වලින් සියයට 27 කට වඩා වැඩි දායකත්වයක් මුළු රාජ්‍ය ආදායමට සපයා තිබුණි. මත්පැන් හා සිගරට් යන භාණ්ඩ මත පනවා ඇති බදු වලින් මුළු ආදායමට සියයට 10.6 ක දායකත්වයක් ලබා දී තිබුණ අතර, මුළු ආදායමින් සියයට 14 කට වඩා වැඩි ප්‍රතිශතයක් දුම්වැටි හා මත්පැන්, මෝටර් රථ වාහන හා ඛනිජතෙල් නිෂ්පාදන මත පනවා ඇති නිෂ්පාදන බදු වලින් ලබාගෙන තිබුණි.

- රජයේ මූල්‍ය ප්‍රකාශන වලට අනුව, සමාලෝචිත වර්ෂයේ දී ජාත්‍යන්තර වෙළඳාම මත පනවා ඇති බදු මඟින් රු.බිලියන 342 ක් රැස් කර තිබුණු අතර එය මුළු බදු ආදායමින් සියයට 19.95 ක් ද සමස්ත රාජ්‍ය ආදායමින් සියයට 17.65 ක් ද විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී ජාත්‍යන්තර වෙළඳාම මත පනවා ඇති බදු මඟින් ආදායම් රැස් කිරීම රු.බිලියන 30 කින් එනම් සියයට 7.97 කින් පමණක් අඩුවී තිබුණි. සමාලෝචිත වර්ෂයේ ආනයන බදු රු.බිලියන 40 කින් අඩු වී තිබීම මේ සඳහා මූලිකව බලපා තිබුණි.
- ඉහත සඳහන් පරිදි රාජ්‍ය ආදායම් ව්‍යුහය තුළ වක්‍ර බදු සේ සැලකිය හැකි ආදායමේ ඉහළ දායකත්වය සහ වර්ධනය සඳහා පහත සඳහන් සාධකයන් ගෙන් ප්‍රමාණාත්මක බලපෑමක් සිදු වී තිබුණ ද, එම බලපෑම්වල මූල්‍යමය වටිනාකම ගණනය කිරීම සඳහා ආදායම් එකතු කරන දෙපාර්තමේන්තු විසින් ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. එම හේතුවෙන් ආදායම් රැස්කරන දෙපාර්තමේන්තුවල සැබෑ කාර්යසාධනය මැනීම සඳහා රැස්කරන ආදායමේ වර්ධනය පමණක් සැලකිල්ලට ගැනීම ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය.

  - රජය විසින් ඉහළ බදු අනුපාතයන් නියම කිරීම.
  - විශේෂ අවස්ථාවලදී සිදුවන ආනයනයන්ගේ වර්ධනය හේතුවෙන් ඇතිවන බදු ආදායමේ වර්ධනය.
  - භාණ්ඩ හා සේවාවල විදේශීය වෙළඳපල මිල ගණන් ඉහළ යාම නිසා සිදුවන බදු ආදායමේ වර්ධනය.
  - විදේශ විනිමය අනුපාතයේ පිරිහීම හේතුවෙන් ඇතිවන ආනයන පිරිවැය වර්ධනය මත බදු ආදායම වර්ධනය වීම. තවද, විදේශීය වෙළඳ ගිවිසුම් සහ වෙනත් නීතීන් මත සිදු කරනු ලබන බදු අත් හැරීම්, ලිහිල් කිරීම් සහ බදු නිදහස් කිරීම් හේතුවෙන් රාජ්‍ය ආදායමට සිදුවන බලපෑම සම්බන්ධ විස්තරාත්මක තොරතුරුද අදාළ දෙපාර්තමේන්තුවල කාර්යසාධනය මැනීමේ දී සැලකිල්ලට ගෙන නොතිබුණි.

- 2018 වාර්ෂික ඇස්තමේන්තු අනුව පළාත් සභා ආදායම් ඇස්තමේන්තුව රු.බිලියන 99 ක් වී තිබුණත්, ඊට අදාළ සත්‍ය ආදායම පිළිබඳ වාර්තා පවත්වා නොතිබුණි.

- 2015 ජුලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ රාජ්‍ය ආදායම් ඇස්තමේන්තු කිරීම, රැස් කිරීම, අධීක්ෂණය හා වාර්තා කිරීම පිළිබඳ මාර්ගෝපදේශය මඟින් හා විගණන කටයුතුවලදී අනාවරණය වූ කරුණු අනුව, දෙපාර්තමේන්තුව විසින් බදු නොවන

විගණන්ද්‍ර අරමුදල

ආදායම් පිළිබඳ සමාලෝචනයක් කිරීමට හෝ ඊට අදාළ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට ක්‍රියා කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

- සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයේ ආදායම් සංකේත 06 ක් යටතේ ආදායම් ඇස්තමේන්තු කර නොතිබුණත්, වර්ෂය අවසාන වන විට එම ආදායම් සංකේත 06 යටතේ රු.මිලියන 299.26 ක ආදායම් රැස්කර තිබුණි.

- සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් සංකේත 06 ක් යටතේ රු.බිලියන 18 ක ආදායම් රැස්කිරිමට අපේක්ෂා කර තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම ආදායම් සංකේත යටතේ කිසිදු ආදායමක් රැස්කර නොතිබුණි.

- ආදායම් සංකේත 03 ක් යටතේ සමාලෝචිත වර්ෂය අවසන් වන විට වර්ෂ ගණනාවක් මුළුල්ලේ පැවැත එන රු.බිලියන 3 ක ආදායමක් හිඟහිට පැවැතුණි. එම මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් ආදායම් ගණන්දීමේ නිලධාරියා විසින් හෝ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් ගෙන තිබුණු ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

- 2018 ජනවාරි 17 දිනැති අංක 01/2018 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව, පසුගිය වර්ෂ 03 ක කාලයක් තුළ සේවා සඳහා අය කරනු ලබන ගාස්තු සංශෝධනය කර නොතිබුණි.

රාජ්‍ය ආරක්ෂාව	ආරක්ෂක කටයුතු සම්බන්ධයෙන් වන අණපනත් සංශෝධනය කිරීමේ ප්‍රමාදය
	පුපුරන ද්‍රව්‍ය පිළිබඳව අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු නොවීම ආරක්ෂක හමුදාවන් විසින් අභ්‍යන්තර අරමුදල් හා ව්‍යාපෘති පැවැත්වීම ආරක්ෂක හමුදා මූලස්ථානය ඉදිකිරිම
	රාජ්‍ය ආරක්ෂක විශ්වවිද්‍යාල පනත සංශෝධනය නොකිරිම ආරක්ෂක විශ්වවිද්‍යාල ශික්ෂණ රෝහල පූර්ණ ධාරිතාවයෙන් යුක්තව ක්‍රියාත්මක නොවීම

රාජ්‍ය ආරක්ෂාව

ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩතාවය සහතික කිරීම සහ ගුවන්, මුහුදු සහ ගොඩබිම ආරක්ෂාව පවත්වා ගෙනයාම සඳහා පහත සඳහන් කාර්යභාරය ආරක්ෂක අමාත්‍යාංශය හා ඒ යටතේ වූ දෙපාර්තමේන්තු පහක් හා ව්‍යවස්ථාපිත ආයතන අටක් විසින් ඉටුකළ යුතුව පැවතුණි.

- ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩතාවය හා ජාතික ආරක්ෂාව සහතික කිරීම
- ගුවන්, මුහුදු සහ ගොඩබිම කළාපයන්හි ආරක්ෂාව පවත්වා ගෙනයාම
- ජාතික ආරක්ෂාව හා සම්බන්ධ පර්යේෂණ හා සංවර්ධන කටයුතු මෙහෙයවීම
- ශ්‍රී ලංකාවේ අභිමානය හා ස්වෛරීභාවය පවත්වා ගෙනයාම සඳහා සහයවීම
- ආරක්ෂක කටයුතු සම්බන්ධ වැඩසටහන් හා ව්‍යාපෘතීන් පිළිබඳව ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම
- නීතිය හා සාමය ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවලදී පොලීසිය වෙත සහයවීම
- ජීවිත හා දේපළවල ආරක්ෂාව සහතික කිරීම
- කුඩා ප්‍රමාණයේ ගිනි අවි නියාමනය කිරීම

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

ආරක්ෂක කටයුතු සම්බන්ධ අණපනත් සංශෝධනය කිරීමේ ප්‍රමාදයන්

2015 දෙසැම්බර් 11 දිනැති අංක පීඊඩී/04/08/01/59 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සේවාවන් සඳහා පොදු ගාස්තු අයකිරීම් සංශෝධනය කළ යුතුව තිබුණි. නමුත් 1996 අංක 22 දරන තුවක්කු (සංශෝධන) පනත හා 1998 අංක 45 දරන පෞද්ගලික ආරක්ෂක නියෝජිත ආයතන විධිමත් කිරීමේ පනත යටතේ අයකරනු ලබන ගාස්තු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සංශෝධනය කර නොතිබුණි.

පුපුරණ ද්‍රව්‍ය පාලනය සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යාංශයේ කාර්යභාර්ය ඉටුනොවීම

1956 අංක 21 දරන පුපුරණ ද්‍රව්‍ය ආඥා පනත අනුව රට තුළ පුපුරන ද්‍රව්‍ය භාවිතය හා පාලනය සම්බන්ධ බලතල ආරක්ෂක අමාත්‍යාංශය සතුවන අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අනුයුක්ත සහකාර පුපුරණ ද්‍රව්‍ය පාලකවරුන් මගින් එම බලතල ක්‍රියාත්මක කරනු ලැබේ. මේ සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී කුරුණෑගල, පුත්තලම හා අනුරාධපුරය යන දිස්ත්‍රික්කවල පුපුරන ද්‍රව්‍ය පාලන කාර්යාලවල පුපුරන ද්‍රව්‍ය භාවිතය සඳහා බලපත්‍ර ලාභීන් පිළිබඳ විස්තර සහ ඒවායේ නිකුත් කිරීම් පිළිබඳ ලේඛන නිසි පරිදි පවත්වා නොතිබුණි. තවද, සමාලෝචිත වර්ෂය තුළදී කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්කවල ගල් වැඩපලවල් සම්බන්ධයෙන් සිදු කළ ක්ෂේත්‍ර විගණන පරීක්ෂණවලදී බලපත්‍ර ලබා නොගෙන පවත්වා ගෙන යන ගල් වැඩපල 35 ක් පැවැතුණි.

ආරක්ෂක හමුදාවන් විසින් අභ්‍යන්තර අරමුදල් හා ව්‍යාපෘති පැවැත්වීම

ඉකුත් වර්ෂ කිහිපය තුළදී විගණකාධිපති වාර්තා මඟින් පෙන්වාදී තිබුණු පරිදි සහ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් නියෝග කර තිබුණු පරිදි ආරක්ෂක හමුදාවන් විසින් වාණිජ පදනමින් පවත්වාගෙන යනු ලබන විවිධ ලාභ උපයන ව්‍යාපෘති සහ අරමුදල් සම්බන්ධයෙන් පාර්ලිමේන්තු පාලනය විධිමත් කිරීමට පියවර ගෙන නොතිබුණි. උක්ත නිර්දේශය අනුව ත්‍රිවිධ හමුදාව සතු භෞතික හා මානව සම්පත් උපයෝජනය කර ගනිමින් පවත්වාගෙන යනු ලබන ව්‍යාපෘති, පොදු ප්‍රතිපත්තියක් මත පාර්ලිමේන්තුවේ අධීක්ෂණයට ලක් වන පරිදි සහ විගණනයට භාජනය වන පරිදි ව්‍යවස්ථාපිත අරමුදල් වශයෙන් ස්ථාපනය කරනු ඇතැයි බලාපොරොත්තු විය. මේ සම්බන්ධයෙන් 2009 නොවැම්බර් 11 දිනැති අංක ඊඒ/අයිඒ/05/05(02) දරන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ගේ ලිපිය මඟින් අදාළ උපදෙස් නිකුත් කර තිබුණු නමුත් ඒ සඳහා විධිමත් පියවර ගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී මේ සම්බන්ධයෙන් වැඩිදුරටත් සිදුකරන ලද විගණනයේදී ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් නිවාඩු නිකේතන 03 ක් හා ගොවිපලවල් සහ ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් නිවාඩු නිකේතන 07 ක් උත්සව ශාලා 05 ක් යනාදිය වාණිජමය පදනමක් මත පවත්වා ගෙන යන නමුත් ඒවායේ මූල්‍ය හා මෙහෙයුම් ප්‍රතිඵල මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් නොවූ බව හෙළිදරව් විය. තවද, ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අයත් හෙලිටුවර්ස් පෞද්ගලික සමාගමේ මෙහෙයුම් කටයුතුවලින් 2010 - 2018 කාලය තුළදී රු.මිලියන 54.50 ක ලාභයක් උපයාගෙන තිබුණු නමුත් ඒ සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් සිදුකරන ලද ආයෝජනයට කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි. මෙම සමාගමේ සම්පූර්ණ කොටස් හිමිකම ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිලධාරීන් 05 දෙනෙකු සතුව තිබුණු අතර රජයේ ගිණුම් පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාවේ නියෝගය පරිදි මහා භාණ්ඩාගාරයට කොටස් හිමිකම ලැබෙන පරිදි සමාගම නැවත ලියාපදිංචි කිරීමේ කළ යුතු වුවත්, එම කටයුතු 2018 දෙසැම්බර් 31 දින වන විටත් සිදුකර නොතිබුණි.

යුද්ධයෙන් මියගිය හා ආබාධිත රණවිරුවන් හා ඔවුන්ගේ පවුල් සඳහා සුභසාධන පහසුකම් සැලසීම

යුද්ධයෙන් මිය ගිය හා ආබාධිත රණවිරුවන් සහ ඔවුන්ගේ පවුල්වල සුභසාධනය සඳහා ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පිහිටුවා තිබුණු ආයතන මඟින් රණවිරුවන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සුභසාධනය සඳහා නිවාස සහ නිවාස ණය ලබාදීම, දරුවන් සඳහා ශිෂ්‍යත්ව ලබාදීම වැනි කාර්යයන් කිහිපයක් පමණක් සිදුකර තිබුණි. එම කාර්යයන් සම්බන්ධයෙන් අදාල ආයතන අතර නිසි සම්බන්ධීකරණයක් පවත්වා නොතිබුණි. ආරක්ෂක අමාත්‍යාංශය යටතේ වූ ආයතන 03 ක් විසින් ක්‍රියාත්මක කර තිබුණු නිවාස ව්‍යාපෘති කිහිපයක් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 833.51 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 787.53 ක් උපයෝජනය කර තිබුණි.

තවද, රණවිරුවන් හා ඔවුන්ගේ කලත්‍රයන් හා පවුල්වල සාමාජිකයන්

මුහුණ දෙන සමාජමය ගැටළු සම්බන්ධයෙන් අධ්‍යයනයන් සිදුකිරීමට හා එම ගැටළු විසඳීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් ආරක්ෂක අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.

ආරක්ෂක හමුදා මූලස්ථානය ඉදිකිරීම් කටයුතු

අකුරේගොඩ ප්‍රදේශයේ ඉදිකරනු ලබන ආරක්ෂක හමුදා මූලස්ථාන ගොඩනැඟිලි ඉදිකිරීම් කටයුතු තවදුරටත් ප්‍රමාද වෙමින් පැවතුණි. මෙම ඉදිකිරීම් සම්බන්ධයෙන් 2011 වර්ෂයේදී සකස් කර තිබුණු රු.බිලියන 25 ක් වූ පිරිවැය ඇස්තමේන්තුව, ඉදිකිරීම් කටයුතු සැලැසුම් පසු කාලීනව සංශෝධනය කිරීම හේතුවෙන් රු.බිලියන 55.60 ක් දක්වා ඉහළ ගොස් තිබුණි. ගාලු මුවදොර පිහිටි ශ්‍රී ලංකා යුධ හමුදාවේ ප්‍රධාන කාර්යාල ගොඩනැඟිලි එම ප්‍රදේශයෙන් ඉවත් කර කොළඹ නගරයේ හා තදාසන්න ප්‍රදේශයන්හි පිහිටි රාජ්‍ය හා පෞද්ගලික අංශවලට අයත් ගොඩනැඟිලිවල 2011 වර්ෂයේ සිට ස්ථාපනය කර තිබුණු අතර 2018 දෙසැම්බර් 31 දින වන විට ගොඩනැඟිලි කුලී වශයෙන් රු.මිලියන 1,566 ක් වැය කර තිබුණි.

ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කටයුතු

ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක විශ්වවිද්‍යාලය 1981 අංක 68 දරන ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතනය පනත, 1988 අංක 27 දරන සංශෝධිත පනත සහ 2007 අංක 50 දරන (සංශෝධිත) පනත යටතේ පිහිටුවා තිබුණු අතර එම පනත්වල විධිවිධාන අනුව ආයතනය විසින් පවත්වනු ලබන උපාධි පාඨමාලා ආරක්ෂක කටයුතු සඳහා පමණක් සීමා කර තිබුණි. කෙසේ වෙතත්, පසු කාලීනව ඇතිවූ වෙනස්කම් හේතුවෙන් වෛද්‍ය, නීති, ඉංජිනේරු යනාදි වෙනත් ක්ෂේත්‍ර සම්බන්ධයෙන් උපාධි පිරිනමනු ලබන නමුත් ඒ සඳහා බලය පැවරෙන පරිදි උක්ත පනත් සංශෝධනය කර නොතිබුණි.

2018 දෙසැම්බර් 31 දිනට ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 1,393 ක් වූ අතර ඊට ආරක්ෂක අංශවලට අයත් නිලධාරීන් 112 දෙනෙක් සමාලෝචිත වර්ෂය තුළ දකුණු ආසියානු වෛද්‍ය හා තාක්ෂණික ආයතනයෙන් (SAITAM) අනුයුක්ත කළ ශිෂ්‍යයින් 819 දෙනෙක් හා විදේශීය ශිෂ්‍යයින් 192 ක්ද විය. උක්ත පනත් අනුව වෛද්‍ය පීඨ සඳහා දේශීය ශිෂ්‍යයින් බඳවා ගෙන වෛද්‍ය උපාධි පිරිනැමීම සඳහා ප්‍රතිපාදන සලසා නොමැති වුවත්, විදේශීය පුරවැසිභාවය මත බඳවා ගෙන තිබුණු ශිෂ්‍යයින් 64 දෙනෙකු වෙනත් රටවල ද්විත්ව පුරවැසිභාවය සහිත ශ්‍රී ලාංකික ශිෂ්‍යයින් වූ බවද නිරීක්ෂණය විය.

මුදල් අයකිරීමේ පදනම මත උපාධි පාඨමාලා හැදෑරීම සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන් ආකර්ශනය කිරීම සඳහා වෙළඳපල තරඟයක් පවතින නමුත්, ආරක්ෂක විශ්වවිද්‍යාලය විසින් ඉදිරි වර්ෂ සඳහා ව්‍යාපාර සංවර්ධන සැලැස්මක් සකස් කිරීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව ආරක්ෂක විශ්වවිද්‍යාලය විසින් ඉදිරි වෙළඳපල ජය ගැනීමේ අභියෝග සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණු බව තහවුරු විය.

ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ ශික්ෂණ රෝහල

ශික්ෂණ රෝහලේ මෙහෙයුම් කටයුතු 2017 දෙසැම්බර් මාසයේදී ආරම්භ කර තිබුණු නමුත් රෝහලේ මෙහෙයුම්, පූර්ණ ධාරිතාවයෙන් යුක්තව ක්‍රියාත්මක වී නොතිබුණි. 2018 දෙසැම්බර් 31 දින වන විට රෝගී ඇඳන් ප්‍රමාණය 433 ක් වුවත්, 2018 මාර්තු මාසයේ සිට දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ නේවාසික රෝගීන් 2,012 ක් සඳහා පමණක් ප්‍රතිකාර ලබාදී තිබුණි. ඒ අනුව එම කාල සීමාව තුළ සාමාන්‍ය ඇඳන් උපයෝජන අනුපාතය එක් ඇඳක් සඳහා රෝගීන් 04 ක් පමණක් විය. තවද, ක්‍රියාත්මක කර තිබුණු බාහිර සායන 16 ක් මගින් රෝගීන් 95,820 කට පහසුකම් සැලසිය හැකි වුවත්, 2018 දෙසැම්බර් 31 දින වන විට රෝගීන් 25,735 කට පමණක් ප්‍රතිකාර කර තිබුණි.

කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම නිසා රෝහලේ මෙහෙයුම් කටයුතු උපරිම ධාරිතාවයෙන් සිදු කිරීමට නොහැකි වී තිබුණි. ශික්ෂණ රෝහල සඳහා අනුමත වෛද්‍ය හා පරිපාලන කාර්ය මණ්ඩලය පිළිවෙලින් නිලධාරින් 1,380 දෙනෙක් හා 516 දෙනෙක් වී තිබුණත්, 2018 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සහ හමුදා සේවයෙන් අනුයුක්ත නිලධාරින් ඇතුළත්ව සේවා නියුක්ත කාර්ය මණ්ඩලය පිළිවෙලින් නිලධාරින් 437 දෙනෙක් හා 284 දෙනෙක් වී තිබුණි. කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන සිටි නිලධාරින් 85 දෙනෙකු 2019 ජුනි 30 දින වන විට සේවයෙන් ඉවත් වී තිබුණි. කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනීමේ පටිපාටි සකස් කර අනුමත කර ගැනීමට ප්‍රමාදවීම හේතුවෙන් පූර්ණ පහසුකම් සහිත ශික්ෂණ රෝහලේ කටයුතු ඌන උපයෝජිතව පැවැතුණි.

ශික්ෂණ රෝහල ඉදිකිරීම සඳහා මහා භාණ්ඩාගාරයේ ඇපකරයක් මත විදේශීය මුදලින් එ.ජ.ඩො.මිලියන 177.33 සහ දේශීය මුදලින් රු.මිලියන 3,165.12 ක ණය මුදලක් ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් ලබාගෙන තිබුණි. 2018 සැප්තැම්බර් 17 දින මෙම ණය මුදල් ප්‍රතිව්‍යුහගත කර තිබුණි. ඒ අනුව මුළු ණය මුදලින් එ.ජ.ඩොලර් මිලියන 82.33 කට සමාන රු.මිලියන 12,773.34 ක් දේශීය මුදලට පරිවර්තනය කර තිබුණු අතර 2018 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබුණු රු.මිලියන 717.92 ක පොලී මුදල හා රු.මිලියන 617.47 ක් වූ විදේශ විනිමය පරිවර්තනයේදී වූ අවාසිය දේශීය මුදලින් වූ ණය මුදලට එකතු කර තිබුණි. මේ අනුව 2018 දෙසැම්බර් 31 දිනට මහා භාණ්ඩාගාරය සහ විශ්වවිද්‍යාලය විසින් 2023 වර්ෂයේ සිට ගෙවීමට එකඟවී තිබුණු මුළු ණය මුදල පිළිවෙලින් එ.ජ.ඩො. මිලියන 95 ක් හා රු.මිලියන 17,274.55 ක් වී තිබුණි.

වත්කම් කළමනාකරණය

ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් අළුත්වැඩියා කටයුතු සඳහා 2014 අප්‍රේල් 25 දින ගුවන් මගින් චීනයට යවා තිබුණු රේඩාර් රිසිවරයක් හා ඇන්ටෙනා ස්කෑනරයක් ගුවන් මගින් ප්‍රවාහනය කිරීමේදී අස්ථානගත වීම හේතුවෙන් රු.මිලියන 74.46 ක අලාභයක් සිදුවී තිබුණි. මේ සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තාවක් 2015 අගෝස්තු 31 දින ඉදිරිපත් කර තිබුණු නමුත් ඊට අදාල ඉදිරි පියවරයන් 2018 දෙසැම්බර් 31 වන විටත් ගෙන නොතිබුණි.

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් රු.මිලියන 74.76 ක් වියදමින් නව ප්‍රධාන කාර්යාල ගොඩනැඟිල්ල පානදුර මෝල්පේ ප්‍රදේශයේ ඉදිකර තිබුණි. එම ගොඩනැගිල්ල පිහිටි ඉඩම වර්ෂ 30 ක කාලයක් සඳහා බදු පදනම මත ලබාගත් පූජනීය ස්ථානයකට අයත් තිබුණි. අදාළ බදු කාලය අවසන් වූ පසු එම ගොඩනැඟිලිවල හිමිකම පූජනීය ස්ථානයට හිමිවිය යුතු බවට වූ කොන්දේසි අදාළ බදු ගිවිසුමේ ඇතුළත් වී තිබුණි.

රාජ්‍ය බාධෂාය

ඉදිරිපත් කළ තොරතුරු අනුව ආයතන 389 කින් ආයතන 101 ක් අලාභ ලැබීම

විගණනයට ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ආයතන 13 කට අහිත කර විගණන මතයන් ප්‍රකාශ වීම

2018 වර්ෂයට අදාළව ආයතන 59 ක් මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් නොකිරිම.

රාජ්‍ය ව්‍යවසායන්

රාජ්‍ය ව්‍යවසායන් යනු තම නමින් ගිවිසුම්ගත වීමට බලයක් සහිත, ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සඳහා මූල්‍ය හා මෙහෙයුම් අධිකාරය පවරා ඇති සහ ලාභයක් සහිතව හෝ සම්පූර්ණ පිරිවැය ආවරණය කරගන්නා පරිදි සාමාන්‍ය ව්‍යාපාරික ක්‍රියාකාරකම් තුළ අනෙකුත් අස්ථිත්වයන්ට භාණ්ඩ හා සේවා විකිණීම් කරනු ලබන සහ රාජ්‍ය අංශයේ අස්ථිත්වයක් මගින් පාලනය වන ආයතනයක් ලෙස හැඳන්විය හැකිය. උපයෝගීතා සේවා සපයන වෙළෙඳ ව්‍යවසායන් සහ මූල්‍ය ආයතන වැනි මූල්‍ය ව්‍යවසායන් රාජ්‍ය ව්‍යවසායන් යටතට අයත් වේ. රාජ්‍ය ව්‍යාපාර ව්‍යවසායන් සමහරක් ප්‍රජා සේවා සැපයීම පිළිබඳව වගකීමක් සහිතව ඇතැම් පුද්ගලයන්ට සහ ජන කොටස්වලට හා සේවා මිල අයකිරීමකින් තොරව හෝ සැළකිය යුතු පරිදි අවම ගාස්තු පදනමක් මත භාණ්ඩ හා සේවා සැපයීමේ පරමාර්ථයෙන් ක්‍රියාත්මක වුවත් සාමාන්‍යයෙන් ලාභයක් ඉපයීම සඳහා ක්‍රියාත්මක වේ. ඒ අනුව එහි වත්කම් මත ප්‍රතිලාභයක් ඉපැයීම අනාගත සංවර්ධනය සඳහා අවශ්‍ය වේ. නියාමන, ප්‍රවර්ධනාත්මක හා අධ්‍යාපනික රාජ්‍ය ව්‍යවසායන් සම්ප්‍රදායානුකූලව වාණිජ අංශයන්ට අයත් නොවන අතර එම ව්‍යවසායන් ලාභ නොලබන සංවිධාන ලෙස සැලකෙන අතර, ලාභදායීත්වය හැර වෙනත් නිර්ණායකයන් භාවිතා කරමින් ඒවායේ කාර්යසාධනය පරික්ෂා කළ යුතු වේ. පහත සඳහන් ශීර්ෂයන් යටතේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යවසායන් පුළුල් ලෙස වර්ගීකරණය කළ හැක.

- විශේෂිත ව්‍යාපාර ව්‍යවසායන්
- ව්‍යවස්ථාපිත හා ව්‍යවස්ථාපිත නොවන අරමුදල්
- රජය සතු සීමිත වගකීම් සමාගම්
- නියාමන හා අධීක්ෂණ ආයතන
- විශ්වවිද්‍යාල, පර්යේෂණ සහ වෙනත් පුහුණු ආයතන
- වෙනත් සංවර්ධන හා ලාභ නොලබන ආයතන

විදුලි බලය, ජලය, ඛනිජ තෙල් නිෂ්පාදිත, විදුලි සංදේශ හා ගුවන් ප්‍රවාහන, වරාය ආදී ආර්ථිකයේ උපාය මාර්ගිකව ඉතා වැදගත් ක්ෂේත්‍ර රාජ්‍ය ව්‍යවසායන් මඟින් මෙහෙයවනු ලැබේ. ආර්ථිකයේ සමස්ත හිමිකම් සහ තරඟකාරිත්වය කෙරෙහි සියළු රාජ්‍ය ව්‍යවසායන්හි ආයතනික පාලනය ඉතා වැදගත් වේ. 2018 දෙසැම්බර් 31 දිනට එක් එක් වර්ගයන්හි රජය සතු සීමිත වගකීම් සහිත සමාගම් හැර රාජ්‍ය ව්‍යවසායන් 344 ක මුළු වත්කම්වල සංයුතිය ඉකුත් වර්ෂය අවසානය සමඟ සසඳා පහත රූපසටහන 36 හි දැක්වේ.



රූපසටහන 36 – *2017 වර්ෂය සමඟ සසඳා 2018 වර්ෂයේ රාජ්‍ය ව්‍යවසායන්හි මුළු වත්කම*

2018 වර්ෂයේදී රාජ්‍ය ව්‍යවසායන්ට දළ වශයෙන් රජයේ පුනරාවර්තන ප්‍රදාන සඳහා රු.බිලියන **28.6**ක් පුනරාවර්තන වියදම් සඳහා සහ දළ වශයෙන් රු.බිලියන **21** ක ප්‍රාග්ධන ප්‍රදාන ලබාදී තිබුණි. ඉකුත් වර්ෂයට අනුරූපීව එම සංඛ්‍යා පිළිවෙලින් රු.බිලියන **55.4** ක් සහ රු. බිලියන **29.26** ක් විය. ඒ අනුව රජයේ ප්‍රදාන ලබාදීමේ පහත වැටීමක් නිරීක්ෂණය විය.

කාර්යසාධනය

ඇගයීම

රාජ්‍ය ව්‍යවසායන් විගණනය මූල්‍ය හා අනුකූලතා විගණනයට පමණක් සීමා නොවන අතර අරමුණු හා ඉලක්ක ඉටුකර ගැනීම සඳහා කාර්යක්ෂමතාවය, ආර්ථික බව හා ඵලදායීතාවය කෙරෙහිද අවධානය කරනු ලැබේ.

රාජ්‍ය ව්‍යවසායන්හි කාර්යක්ෂමතාවය හා ඵලාදායීතාවය පිළිබඳ විගණනය සමහර ප්‍රමිතින් හා නිර්නායකයන් මත පදනම්ව සිදු කරනු ලැබේ. ලාභය කාර්යසාධනයේ ප්‍රධාන නිර්නායකය නොවන අතරම රාජ්‍ය අරමුදල් ආර්ථිකභාවයෙන් හා කාර්යක්ෂමව යොදා ගැනීමේ කළමනාකරණයේ කාර්යසාධනය සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම වඩාත් ඵලදායී වේ. ව්‍යවසායෙන් ව්‍යවසායාට අරමුණු වෙනස් වේ. විගණනයේ එක් ප්‍රමුඛ කාර්යයක් වනුයේ ව්‍යවසායක කාර්යසාධනය ඇගයීම සඳහා නිර්නායකය හඳුනාගැනීමයි. නිෂ්පාදන ව්‍යවසායක, උදාහරණයක් වශයෙන්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ගත් විට, අරමුණු සහ ආයෝජනයේ පදනම, ධාරිතාවය, පිරිවැය හා කාල සැලැසුම්, පරිභෝජන නියමයන්, ඉපැයීම්, ඵලදායීතාවය, පිරිවැය, ප්‍රතිලාභ අනුපාතය ආදිය කාර්යසාධනය මැනීමේ මිනුම් දඬු වේ. ව්‍යවසායක් වෙත ඇති දිගු හා කෙටි කාලීන ප්‍රාග්ධනය හා මෙහෙයුම් සැලැසුම් කාර්යසාධනය තක්සේරු කිරීමේ වෙනත් ආශ්‍රිත ලක්ෂණයන් වේ.

භෞතික කාර්යසාධනය ඇගයීම අදාළ වන අවස්ථාවක ඒකකයක තක්සේරු කළ ධාරිතාවය පිළිගත හැකි මිණුම් ලකුණක් වේ. අනුපාතික ධාරිතාවය උපයෝජනය යනු අමු ද්‍රව්‍ය සහ උපයෝගීතා පරිභෝජනය සඳහා සම්මතයන් ඉපැයීම් හා ප්‍රතික්ෂේපිතයන් මෙන්ම විධිමත් නඩත්තුව හා උපකරණ සේවා කිරීම සඳහා අවශ්‍යතාවයන් සමඟ තක්සේරු කිරීමයි. කාර්යසාධනය ඇගයීම සඳහා අනෙක් වැදගත් පදනම වන්නේ පිරිවැය කාර්යක්ෂමතාවයයි. ධාරිතා උපයෝජනය, පරිභෝජනයන්, ඵලදායීතාවය, ඉපයීම් ආදිය පිළිබඳ සම්මතයන් මත පදනම්ව ප්‍රමිති හා පිරිවැය ඉලක්කයන් තීරණය කරනු ලැබේ. ආයතනික පාලනය, සාමාන්‍ය කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය, ප්‍රසම්පාදන කළමනාකරණය, ඉදිකිරීම් කළමනාකරණය සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යවසායායක් අනුගමනය කළ යුතු මාර්ගෝපදේශ භාණ්ඩාගාරය විසින් නිකුත් කර ඇති අතර මෙම මාර්ගෝපදේශ ව්‍යවසායයක කාර්යසාධනය හා පද්ධති ඇගයීම් කිරීම සඳහා වෙනත් පදනමක් වේ. අභ්‍යන්තර හා බාහිර විශේෂඥයින් විසින් සිදුකරන වෙනත් තාක්ෂණික අධ්‍යයනයන් හා ප්‍රමිතීන් මෙම මාර්ගෝපදේශයට පදනම් වන වෙනත් නිර්නායකයන් වේ.

කාර්යසාධන විගණනය කාලීන අවශ්‍යතාවයකි. මූල්‍ය විගණයේදී මූල්‍ය පාලනය හා ගිණුම්වල නිවැරදිතාවය පිළිබඳ සහතිකවීමක් සිදුකරයි. නමුත් සම්පත් ආර්ථිකබවින්, කාර්යක්ෂම හා ඵලදායීව උපයෝජනය වීම පිළිබඳ පරීක්ෂා කිරීම කාර්යසාධන විගණනයෙන් අපේක්ෂා කෙරේ.

මෙම සාධක තුනට අමතරව වර්තමානයේදී පරිසරාත්මක බලපෑම පිළිබඳවද පරීක්ෂා කරනු ලබයි. කාර්යසාධන විගණනය පිළිබඳව විවිධ නාමයන් භාවිත කරනු ලබයි.

- මුදලට අගය විගණනය
- කළමනාකරණ විගණනය
- මෙහෙයුම් විගණනය
- 3 "E" විගණනය

ජාතික විගණන කාර්යාලයේ වර්තමාන විගණන වාර්තා තුළින් මූල්‍ය විගණනයට හා සමානවූ ස්ථානයක් කාර්යසාධන විගණනයටද ලබා දීමත් ඒ තුලින් රාජ්‍ය ව්‍යවසායන් වෙත ලබාදෙන සම්පත් හා අරමුදල් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් උපයෝජනය සිදුවූයේද යන්න පුළුල්ව විග්‍රහ කරනු ලබයි.

වර්තමානයේ සමාජීය හා ආර්ථික වශයෙන් විශාල අර්බුදකාරී තත්ත්වයක් මතුව ඇති හා මහජනතාවගේ අවධානයට ලක් වී ඇති ආන්දෝලනාත්මක සිද්ධීන් කිහිපයක් තෝරා ගනිමින් ඉන් රටට, මහජනයාට මෙන්ම පරිසරයට සිදුවන බලපෑම පිළිබඳ කාර්යසාධන විගණනයන් සිදු කරනු ලබන අතර මේ වන විට කාර්යසාධන විගණන වාර්තා 26ක් නිකුත් කරන ලදී.

විගණකාධිපතිවරයා විසින් පවත්වනු ලබන බාහිර විගණනය ගණන්දීමේ වගකීම් පිළිබඳ උපකරණයක් වේ. රජයට සහායක් සේම ව්‍යවසාය කළමනාකාරිත්වයේ ඔවුන්ගේ කාර්යක්ෂමතාවය හා ඵලාදායිතාවය වැඩිදියුණු කර ගැනීම සඳහා රාජ්‍ය ව්‍යාපාර විගණනය සමානවම වැදගත් වන කාරණයක් වේ. මූල්‍ය හා මෙහෙයුම් අඩුපාඩු, පද්ධති ප්‍රමාණාත්මක නොවීම හෝ අකාර්යක්ෂමතාවය, කාර්යසාධනයේ ඌනතාවයන්, නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම් ආදිය සහ කාර්යසාධනය පිළිබඳ පිළිගත හැකි ප්‍රමිතින් පිළිබඳ ඉලක්කයන් සපුරා නොගැනීම සම්බන්ධයෙන් හේතු විග්‍රහ කිරීම මඟින් මෙය සපුරා ගැනේ. මූල්‍ය කාර්යසාධනය භෞතික කාර්යසාධනය සමඟ සම්බන්ධවන අතර කාර්යක්ෂම හා ආර්ථික මෙහෙයුම් සහ සම්පත් කළමනාකරණය පිළිබඳ ගැටළු විගණන වාර්තාවෙන් අවධාරණය කරනු ලැබේ. ආයතනවල කළමනාකරිත්වය සමඟ මාගේ නිලධාරින් විසින් පවත්වන විධිමත් රැස්වීම්වලදී අවශ්‍ය පද්ධති හා මෙහෙයුම් වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ සාකච්ඡා කරනු ලැබේ. විගණකාධිපතිවරයා විසින් නිරීක්ෂණය කෙරෙන අහිතකර සොයා ගැනීම් සඳහා රාජ්‍ය ව්‍යවසායන්හි අධ්‍යක්ෂ මණ්ඩලය හා කළමනාකාරිත්වය පසු විපරම් කටයුතු සිදුකිරීමද වැදගත් වේ. එකම කරුණ සඳහා වර්ෂයක් පාසාම කෙරෙන අහිතකර සොයා ගැනීම් නැවත නැවත සිදුවීමෙන් තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා වැඩි ප්‍රවනතාවය පෙන්නුම් කරනු ලැබේ.

මූල්‍ය කාර්යසාධනය

ලැබී ඇති තොරතුරුවලට අනුව රාජ්‍ය ව්‍යවසායන් 389 කට අදාළව තොරතුරු පහත වගුව 13 හි දැක්වේ.

	ආයතන විස්තරය	ආයතන ගණන	අලාභ ලබන ආයතන	ලාභ ලබන ආයතන	තොරතුරු ඉදිරිපත් නොකළ ආයතන
(i)	වෙනත් සංවර්ධන හා ලාභ මූලික නොවන ආයතන	70	23	34	13
(ii)	ව්‍යවස්ථාපිත හා ව්‍යවස්ථාපිත අරමුදල්	54	04	22	28
(iii)	නියාමන හා අධීක්ෂණ ආයතන	29	10	18	01
(iv)	විශේෂිත ව්‍යාපාර ව්‍යවසායයන්	58	12	38	08
(v)	විශ්වවිද්‍යාල පර්යේෂණ හා වෙනත් පුහුණු ආයතන	66	28	29	09
(vi)	රජය සතු සීමිත වගකීම් සමාගම්	112	24	51	37
	එකතුව	389	101	192	96

වගුව 13 - රාජ්‍ය ව්‍යවසායයන් 389 කට අදාළ තොරතුරු

ඉහත තොරතුරුවලට අනුව රාජ්‍ය ව්‍යවසායන් 75ක මූල්‍ය ප්‍රතිඵලය ඌනතාවයක් පෙන්නුම් කළ අතර මුළු වටිනාකම රු.මිලියන 135,821ක් වී තිබුණි. සැලකිය යුතු මූල්‍ය ඌනතාවයක් සහිත ආයතන අතර ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, වී අලෙවි මණ්ඩලය හා විශ්වවිද්‍යාල විද්‍යාතන ඇතුළුව විශ්වවිද්‍යාල 15ක් අන්තර්ගත විය.

තිරසර සංවර්ධනය

ස්වභාවික සම්පත් සීඝ්‍රයෙන් පරිභෝජනය කිරීම හේතුවෙන් අනාගත පරපුර සඳහා සම්පත් හිඟවීමේ අවධානමකට මුහුණ දීමට සිදුවන ආකාරය හඳුනාගත හැකිය. එසේම සම්පත් පරිභෝජනයේ අතුරුඵලයක් වන අපද්‍රව්‍ය මගින් පරිසරයේ දරාගැනීමේ හැකියාව ඉක්මවා යන ආකාරයක්ද හඳුනාගත හැකිව තිබේ. අනිවාර්යයෙන්ම විය යුතු ආර්ථික සංවර්ධනයක් පරිසරයේ තිබිය යුතු තිරසාර බවත් යන දෙකෙහිම අත්‍යාවශ්‍ය වූ ඒකාබද්ධ කිරීමත් තිරසර සංවර්ධන සංකල්පයේ කේන්ද්‍රගත වූවකි. ආර්ථික සංවර්ධනය හා පාරිසරික සංරක්ෂණය එකිනෙකින් පෝෂණය වන තත්ත්වයක් ඇතිකළ යුතු බවත් ඒ සඳහා ලෝකය පුරා දැනුවත් බවක් ඇතිකළ යුතු බව අවධාරණය වේ.

පරිසර සංවර්ධනය කිරීමේ ලෝක සංවිධානය දක්වන ආකාරයට තිරසර සංවර්ධනයේ මූලික අරමුණ වන්නේ මූලික මිනිස් අවශ්‍යතාවයන් තෘප්ත කිරීමත්, ඔවුන්ගේ ජීවිතවල ගුණාත්මකබව වැඩිදියුණු කිරීමත්, පරිසර ආරක්ෂා කිරීමත් සමඟ නිෂ්පාදනය වර්ධනය කිරීමත්ය. ඒ අනුව අනාගත පරපුරට සිය අපේක්ෂාවන් හා අවශ්‍යතාවන් ඉටුකර ගැනීමට පවතින විභවතාව පවත්වාගෙන යන අතරම වත්මන් පරපුරට ඉහළම ප්‍රතිලාභ ලැබෙන අන්දමට මිනිසා විසින් ජෛව ගෝලය පරිහරණය කිරීම හා කළමනාකරණය තිරසාර සංවර්ධනය වේ.

ආර්ථික, සමාජීය, පාරිසරික ආදී ක්ෂේත්‍රයන්හි විවිධ කාලයන්හි පසුවන එක්සත් ජාතීන්ගේ සංවිධානයට අයත් සාමාජික රාජ්‍යයන් 2030 වසර වන විට එකම කාලයකට ගෙනඒමේ අපේක්ෂාවෙන් තිරසර සංවර්ධන අරමුණු හඳුන්වා දී ඇති අතර මේ පිළිබඳව 2015 සැප්තැම්බර් මාසයේදී පැවති එක්සත් ජාතීන්ගේ තිරසර සමුළුවේදී රැස් වූ රාජ්‍ය නායකයන් එකඟ වී තිබේ. තිරසර සංවර්ධනය සඳහා වූ 2030 න්‍යාය පත්‍රය මේ සඳහා අදාල

කරගෙන ඇති අතර එය මිනිසා, පෘථිවිය සහ සෞභාග්‍ය ඉලක්ක කර ගත් සියළු සාමාජික රටවල් විසින් ක්‍රියාත්මක කළ යුතු විශ්වීය ප්‍රකාශණයක් වේ. ශ්‍රී ලංකාවද එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටක් බැවින් මෙම විශ්වීය ප්‍රකාශනය ශ්‍රී ලංකාව තුළද ක්‍රියාත්මක කිරීමට බැඳී පවතී. ඒඅනුව 2017 වර්ෂයේ සිට විගණනය කරනු ලබන ආයතන තුළින් මෙම සංකල්පය ක්‍රියාත්මක වීම පිළිබඳව සොයා බලනු ලබන අතර තිරසර සංවර්ධන අරමුණු කරා ළඟාවීම සඳහා රාජ්‍ය ආයතනවල සූදානම් තත්ත්වය හා ඒවා ක්‍රියාත්මක කිරීම පිළිබඳව රාජ්‍ය විගණනයක් සිදුකිරීමේදී හා වාර්තා කිරීමේදී අවධානයට ලක්වන විශේෂිත වූ නිරීක්ෂණයක් ලෙස තිරසර සංවර්ධනය හඳුනාගෙන තිබේ.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය

රාජ්‍ය ව්‍යවසායන් විසින් වර්ෂය අවසානයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත වාර්ෂිකව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලැබේ. ආයතනවල ක්‍රියාකාරිත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් මූල්‍ය ප්‍රකාශනවලින් පිළිබිඹු කරන්නේද යන බවට ස්වාධීන සහතිකයක් විගණකාධිපති විසින් ලබාදෙනු ලැබේ. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම මගින් මෙම සහතිකය ලබාදෙනු ලැබේ. රාජ්‍ය ව්‍යවසායන්හි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනවලින් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු වන්නේද හෝ නොවන්නේද යන්න සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතින්ට හෝ දැනට ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිතින්ට අනුකූල වන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට සහ මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතින්ට එම මූල්‍ය ප්‍රකාශන අනුකූල වන්නේද හෝ නොවන්නේද යන්න පිළිබඳ විගණකාධිපතිවරයාගේ නිගමනය විගණන මතයෙන් ප්‍රකාශ කෙරේ.

මූල්‍ය ප්‍රකාශන අනුව ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් හෝ නොඑකඟතාවයන් හා විෂය පථය සීමාවීම් හා කළමණාකරණය හා විගණනය අතර මතුවන නොඑකඟතාවයන් සලකාබැලීමෙන් අනතුරුව සිව් ආකාරයක මතයන් ප්‍රකාශයට පත්කරනු ලබයි. ඒවා නම්.

තත්ත්වාගණනය නොකළ මතය

මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් හෝ නොඑකඟතාවයක් නොමැති විටෙක.

තත්ත්වාගණනය කළ මතය (හැර මතය)

මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් හෝ නොඑකඟතාවයන් ඇතත් ඒවා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵල විකෘති කර දැක්වීවට තරම් පෘථුල නොවන විටක,

අහිතකර මතය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මතයක් ප්‍රකාශ කිරීමට නොහැකිවන ලෙස විෂය පථය සීමාකර ඇති විට.

මතය ව්‍යාවනය කිරීම

තෝරාගෙන ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති, ඒවා ව්‍යවහාර කරන ලද ක්‍රමය හෝ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම්වල ප්‍රමාණවත් බව යනාදී කරුණු පිළිබඳව කළමනාකරණය හා විගණනය අතර ප්‍රමාණාත්මක/පෘථුල නොඑකඟතාවයන් හා වරදවා දැක්වීම් ඇතිවිට.

මූල්‍ය ප්‍රකාශන සඳහා මතයක් ප්‍රකාශ කිරීමේදී එය වඩාත් සාධාරණීකරණය වීම උදෙසා මූල්‍ය විගණනයේදී භාවිතා කළ හැකි පරිගණක විගණන මෘදුකාංගයක උපකාරයද ඉවහල් කර ගනු ලැබිය. ගිණුම් පරීක්ෂා කරමින් තෝරා ගන්නා ලද නියැදියක් ආශ්‍රයෙන් හා සමස්ථ ප්‍රමාණාත්මකභාවයට ප්‍රතිශතයක් ලෙස නිවැරදි නොකරන ලද සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් එකතුව ගලපා එම ප්‍රතිඵලය මත විගණන මතය තීරණය කරනු ලබයි.

2018 වර්ෂය සඳහා රාජ්‍ය ව්‍යවසායන් 330 ක් විසින් ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් නිකුත් කළ විගණන වාර්තාවල ඇතුළත් විගණන මතය ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත වගුව 14 හි දැක්වේ.

විගණන මතයේ ආකාරය	2018	2017
තත්ත්වාගණනය නොකළ	75	80
තත්ත්වාගණනය කළ	160	113
ව්‍යාවනය කළ	09	20
අහිතකර	13	06
මෙතෙක් තීරණය නොකළ	73	228

වගුව 14 - රාජ්‍ය ව්‍යවසායන් විසින් ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන සඳහා විගණකාධිපතිවරයා විසින් නිකුත් කළ විගණන මතයන්

ස්ථාවර වත්කම් පිළිබඳ වාර්තා පවත්වා ගැනීම

දේපළ පිරියත හා උපකරණ යනු නිෂ්පාදනයේදී හා සේවා සැපයීමේ දී භාවිතා කරනු ලබන සහ වෙනත් අයට කුලියට දීම සඳහා හෝ පරිපාලනමය කටයුතු සඳහා තබාගෙන ඇති වත්කම් වන අතර එම වත්කම් එක් වාර්තාකරණ කාලපරිච්ඡේදයකට වඩා වැඩි කාලයක් තුළ භාවිතා කිරීමට අපේක්ෂිත ස්පෘශ්‍ය වත්කම් වේ. තවද ජංගම වත්කම් ලෙස හඳුන්වනුයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළදී විකිණීමට හෝ පරිභෝජනය කිරීමට අදහස් කරන හෝ වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසුව මාස දොළහක් තුලදී උපලබ්ධි වෙතැයි අපේක්ෂා කරන වත්කම් වේ. සෑම ස්ථාවර වත්කමක්ම නිවැරදිව අංකනය කිරීමක් හා ස්ථාවර වත්කම් ලේඛන නිසිපරිදි නඩත්තු කිරීම නොකරන්නේ නම් වත්කම් නිවැරදිව හඳුනාගැනීමට නොහැකි වන අතර ඒවා පිළිබඳ භෞතික සත්‍යාපනය අසාර්ථක කාර්යයක් බවට පත්වන බව නිරීක්ෂණය විය. එක් එක් ස්ථාවර වත්කම් පිළිබඳ විස්තර තබා ගැනීමේ ක්‍රියාමාර්ගය වත්කම් පාලනය තහවුරු වීම හා වත්කම් සාවද්‍ය පරිහරණයෙන් වලක්වා ගැනීම තහවුරු කර ගැනීමට ආයතනයකට පහසුකම් සලසයි. ක්ෂය ගණනය කිරීම, බදු සඳහා සහ රක්ෂණ කාර්යයන් සඳහා ඉඩ සැලසෙන වත්කම්වල නිවැරදි වටිනාකම තබා ගැනීමේ ක්‍රියාමාර්ගයක්ද වේ. ස්ථාවර වත්කම් ලේඛනය කළමනාකරණ අවශ්‍යතාවලට ගැලපෙන සම්පූර්ණ සහ නිවැරදි වාර්තා ජනනය කරයි. ගණන්දීමේ නිලධාරීන් විසින් රජය සතු වූ හෝ රජය භාරයේ පවත්නා මුදල්, බඩුබාහිරාදී උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව පවත්වා ගැනීම හා සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් හා විධිමත් විධිවිධාන යොදනු ලබන බවට හා ඒවා වරින්වර සත්‍යාපනය කරනු ලබන බවටත්, නියමිත රෙගුලාසි හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බවටත් සෑහීමකට පත්විය යුතු වුවද බොහෝමයක් ආයතන චක්‍රලේඛ ප්‍රකාරව වත්කම් ලේඛන පවත්වාගෙන නොයන අතර මුදල් රෙගුලාසි අංක 756 හා 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක්ද සිදුකර නොතිබූ බව විගණනයේදී අනාවරණය විය.

බොහෝ රාජ්‍ය ආයතනවල භාවිතයෙන් ඉවත්කරන ලද වත්කම් නිෂ්ක්‍රීයව පවතින අතර එම වත්කම් 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන රාජ්‍ය මුදල්

චක්‍රලේඛය ප්‍රකාරව රජයේ ආයතනවල අපහරණය කළ යුතු භාණ්ඩ සහ වත්කම් නියමිත පරිදි අපහරණය නොකිරීමෙන් එම භාණ්ඩ සහ වත්කම් විකිණීමෙන් ලබාගත හැකි ආදායම රජයට අහිමි වන අතර එම භාණ්ඩ ආරක්ෂා කිරීම හා ගබඩා කිරීම සඳහා අමතර පිරිවැයක්ද දැරීමට සිදුවන බව නිරීක්ෂණය විය.

වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත දී කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

2018 වර්ෂය සඳහා රාජ්‍ය ව්‍යවසායන් 330ක මූල්‍ය ප්‍රකාශන 2019 සැප්තැම්බර් 30 දින වන විට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබුණි. කෙසේ වුවද 2018 දෙසැම්බර් 31 දිනට මුදල් වර්ෂය අවසානවී මාස 9 ක් ඉකුත්වීමෙන් පසුවත් ආයතන 59ක් විසින් තම මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය අනුව රාජ්‍ය සංස්ථාවක් වන හෝ රජය විසින් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් කොටස් වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් දරනු ලබන සමාගමක අනුමත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් අදාළ ලේඛන සහ තොරතුරු විගණකාධිපතිවරයා වෙත ලැබී මාස තුනක් ඇතුළත, සිය වාර්ෂික වාර්තාවේ පළකිරීම සඳහා එම රාජ්‍ය සංස්ථාවේ හෝ සමාගමේ පාලක මණ්ඩලයේ සභාපතිවරයා වෙත විගණකාධිපතිවරයා විසින් වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

වෘත්තීය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට හා රඳවා ගැනීම සඳහා ස්වාධීනත්වය නොමැතිවීම

වාණිජමය තීරණ ගැනීමේදී හා පුහුණු කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සහ රඳවා තබා ගැනීමේ දී බලපාන විවිධ අනුමත කිරීමේ අවශ්‍යතාවයන් අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රියාකාරීත්වයන්ටද අහිතකර ලෙස බලපානු ලබයි. මෙම සීමා කිරීම හේතුවෙන් බොහෝ ව්‍යවසායන් ඉහළ වැටුප් මත කොන්ත්‍රාත් පදනමින් වෘත්තිකයන් බඳවා ගැනීම සිදුකරන බව නිරීක්ෂණ විය. පුද්ගලික අංශය සමඟ සැසඳීමේදී ඉතා අඩු වැටුප් ව්‍යුහයක් හේතුවෙන් විශේෂයෙන් ගණකාධිකාරිවරුන්, ඉංජිනේරුවරුන් හා තක්සේරුකරුවන් ආදී තනතුරු සඳහා බඳවා ගැනීමට හා වෘත්තීමය සුදුසුකම්ලාභීන් රඳවා ගැනීමට රාජ්‍ය ව්‍යවසායන්ට මහත් පරිශ්‍රමයක් දැරීමට සිදුවිය.

රජය සතු සීමිත වගකීම් සමාගම්

රාජ්‍ය ව්‍යවසායන් ලෙස රජය සතු සීමිත වගකීම් සමාගම්, සමාගම් පනත යටතේ ස්ථාපිත කර තිබූ අතර මෙම සමාගම් සම්පූර්ණයෙන් රජය සතුවන හෝ රාජ්‍ය පුද්ගලික බද්ධ ව්‍යාපාර ලෙස ක්‍රියාත්මක වන කොටස් ප්‍රාග්ධනයෙන් යම් ප්‍රතිශතයක් රජය සතුවන සමාගම් වේ. සම්පූර්ණයෙන්ම රජය සතු ව්‍යවසායන් කෙරෙහි ඇතිවන බොහෝ ගැටළු වළක්වා ගැනීමට පුද්ගලික අංශයේ මැදිහත්වීම පාලන යාන්ත්‍රණයක් ලෙස ක්‍රියා කරයි. මහා භාණ්ඩාගාරයේ මැදිහත් වීමක් නොමැතිව අදාළ පුද්ගලික ව්‍යවසායන් මගින් ප්‍රාග්ධනය යොදවන පරිපාලිත හෝ ආශ්‍රිත සමාගම් ලෙස රාජ්‍ය ව්‍යවසායන් මගින් ඇති කරන ලද හා සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද රජය සතු සමාගම්ද පවතී.

රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවේ පරීක්ෂාව සඳහා සමහර සමාගම් කැඳවූ අවස්ථාවලදී එම සමාගම් විසින් පෙනී සිටීම ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවන්ද විය. රජය මගින් සම්පූර්ණයෙන් හෝ කොටසක් වශයෙන් හෝ එසේ නොමැති නම් සෘජුව හෝ වක්‍රව රාජ්‍ය සම්පත් සපයමින් ඕනෑම ලිඛිත නීතියක් යටතේ ඕනෑම කෙනෙකුට හෝ ස්ථාපනය කරන ලද අධිකාරියක් ආවරණය කිරීම සඳහා කෙටුම්පත් විගණන පනතට දැනටමත් සංශෝධන යෝජනා කර තිබූ බව නිරීක්ෂණය විය. මෑත කාලයේදී සමහර රාජ්‍ය ව්‍යවසායන් හා විශ්වවිද්‍යාල විසින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමෙන් තොරව පවා සමාගම් පනත යටතේ සීමිත වගකීම් සමාගම් විශාල ප්‍රමාණයක් සංස්ථාපනය කර තිබූ බව නිරීක්ෂණය විය.

කොටස්වලින් සියයට 100 ක්ම රජය හෝ රාජ්‍ය ව්‍යවසායක් සතුවන සීමිත වගකීම් සමාගම්වල අධ්‍යක්ෂවරු පත්කිරීමේ බලය රජය සතුවන අතර කිසිදු පුද්ගලික තැනැත්තෙකුට ලාභයෙන් කොටසක් ලැබිය නොහැකිය. එය සැබැවින්ම රාජ්‍ය සංස්ථාවක් වශයෙන් රජය විසින් සරල කොටස් විකිණීමක් මගින් සාමාන්‍ය "පුද්ගලික අංශයේ" සමාගමකට පරිවර්තනය කිරීම ප්‍රමාණවත්වීම හා සමාන වේ. කොටස්වලින් සියයට 50කට අඩු ප්‍රමාණයක් විකිණීමේදී ද සමාගම් අධ්‍යක්ෂවරු පත් කිරීමේ බලය රජය සතුවේ. කොටස්වලින් සියයට 50 කට වැඩි ප්‍රමාණයක් විකිණීමේදීද රජය ආයතනික ප්‍රතිපත්තියට බලපෑම් කිරීමට හැකි වන ප්‍රමාණවත් බලවත් තත්ත්වයක ඇත. කෙසේ වුවද බොහෝ රාජ්‍ය සංස්ථා විසින් පරිපාලතයන්හි අධ්‍යක්ෂ මණ්ඩලයේ බහුතරය ඔවුන්ගේ සාමාජිකයන්ගෙන් සමන්විත වුවද ඔවුන්ගේ පාලන බලතල පරිපාලනයන් සඳහා පවත්වාගෙන නොයන බව නිරීක්ෂණය විය.

ලාභ මූලික නොවන අනෙකුත් රාජ්‍ය ව්‍යවසායන්

මෙම ව්‍යවසායන් නියාමන හා අධීක්ෂණ ආයතන, විශ්වවිද්‍යාල, පර්යේෂණ හා අනෙකුත් පුහුණු ආයතන හා වෙනත් සංවර්ධන හා ලාභ මූලික නොවන ආයතනයන්ගෙන් සමන්විත වන අතර ආයතනවල ප්‍රධාන ලක්ෂණය නම් වාර්ෂික රජයේ ප්‍රදාන හෝ සමහර භාණ්ඩ හා සේවා මත රජය පනවන ලද බදු එම ආයතනවල ප්‍රධාන ආදායම් ප්‍රභවය වීමයි.

පශ්චාත් පාලනය

කොන්ත්‍රාත් පරිපාලනය අඩුපාඩු

අවිධිමත් ලෙස කසළ බැහැර කිරීම

වත්කම් අත්පත් කර ගෙන තිබුණත්, ඒවා අදාළ අරමුණුවලට නොයෙදීම

හිඟහිටි වරිපනම් අය කර ගැනීමට කටයුතු නොකිරීම

බදු ගිවිසුම්වල අඩුපාඩු නිසා හිඟහිටි බදු අයකර ගැනිමට නොහැකි වීම.

පළාත් පාලනය

ශ්‍රී ලංකාවේ ස්ථාපනය කර ඇති පළාත් පාලන ආයතන 341 කින් මහා නගර සභා 24 ක් මහා නගර සභා ආඥා පනතේ (පරි.252) විධිවිධාන මගින්ද, නගර සභා 41 ක් නගර සභා ආඥා පනතේ (පරි.255) විධිවිධාන මගින්ද, ප්‍රාදේශීය සභා 276 ක් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන මගින්ද පිහිටුවා ක්‍රියාත්මක වෙමින් පවතින අතර, මෙම පළාත් පාලන ආයතනයන්ගේ 2018 වර්ෂයේ ගිණුම් විගණනයට ඉදිරිපත් කිරීම හා එම ගිණුම් පිළිබඳ විගණන මතයන් පිළිබඳ සාරාංශයක් වගුව 15 හි දැක්වේ.

පළාත් පාලන ආයතන වර්ගය	ගිණුම් ඉදිරිපත් කළයුතු සභා ගණන	2019.08.15 දිනට ගිණුම් ඉදිරිපත් කළ සභා ගණන	විගණන වාර්තා නිකුත් කළ සභා ගණන	2019.08.15 දිනට නිකුත් කර ඇති වාර්තා අනුව විගණන මතය			
				තත්ත්වාගණනය කළ මතය	තත්ත්වාගණනය නොකළ මතය	මතය ඩායාවනය	අහිතකර මතය
මහා නගර සභා	24	24	24	22	-	01	01
නගර සභා	41	40	40	40	-	-	-
ප්‍රාදේශීය සභා	276	272	271	266	03	02	-
එකතුව	341	336	335	328	03	03	01

වගුව - 15 - පළාත් පාලන ආයතන විසින් ගිණුම් විගණනයට ඉදිරිපත් කිරීම හා නිකුත් කළ විගණන මතයන්
මූලාශ්‍රය - විගණකාධිපති වාර්තා 2018

පළාත් පාලන බලමණ්ඩල විසින් ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව නිකුත් කළ විගණන වාර්තාවලින් අනාවරණය කර ඇති වැදගත් නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දැක්වේ.

- ජා ඇල ප්‍රාදේශීය සභාව විසින් කුඩහකපොල බහුකාර්ය ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අදාළව ප්‍රතිපාදන නොලැබීම නිසා අත්තිවාරම පමණක් යොදා ඉදිකිරීම් කටයුතු නවතා තිබූ හෙයින් කොන්ත්‍රාත්කරු විසින් තමන්ට සිදු වූ අලාභය සම්බන්ධයෙන් නඩුවක් ගොනු කර තිබුණි. ඒ අනුව 2012 හා 2013 වර්ෂවලදී රු.මිලියන 2.40 ක වන්දියක් ගෙවා ඇති අතර, ඉදිකිරීමට අදාළ ලිපිගොනුව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. 2019 සැප්තැම්බර් 30 දින වන විට එහි අත්තිවාරම ගලවා තිබුණු බව අනාවරණය විය.
- කටුනායක සීදුව නගර සභාව විසින් 2004 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා වූ කාල සීමාව තුළ නගර සභාවේ සේවා නියුක්තව සිටි ව්‍යාපෘති කම්කරුවන් 105 දෙනෙකු වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් නොගෙවීම හේතුවෙන් එම කාල සීමාවට අදාළව හිඟ අර්ථසාධක දායක මුදල් හා අධිභාර වශයෙන් රු.මිලියන 12.22 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.
- මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව විසින් ඡාපාලවත්ත කර්මාන්තපුරයේ වානේ සෙවිලි කළ මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්ත ශාලාවක වරිපනම් තක්සේරුව

සම්බන්ධයෙන් ව්‍යාපාරික ආයතනය විසින් නීතිමය පියවර ගෙන තිබුණි. එහිදී උසාවිය විසින් සංශෝධිත තක්සේරුව ස්ථිර කර තිබුණද, 2018 දෙසැම්බර් 31 දින වන විට අයවිය යුතු හිඟ වරිපනම් රු.557,600 ක් අය කර ගැනීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

- මහා නගර සභා ආඥා පනතේ (252 වන අධිකාරිය) 179(අ) වගන්තියේ විධිවිධාන කෙරෙහි සැලකීමකින් තොරව මාතලේ මහා නගර සභාවේ නගරාධිපතිවරයාගේ නිල රථය වෙනුවෙන් පෞද්ගලික ආයතනයකින් ලබාගත් වාහනයක් සේවයේ යොදවා ගැනීමට කටයුතු කර තිබුණි. ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් වීමට ප්‍රථම එම වාහනය සේවයේ යොදවා ගැනීමට කටයුතු කර තිබුණු අතර, එම වාහනය නගරාධිපතිවරයාගේ පෞද්ගලික නමින් ලියාපදිංචි කර තිබුණි. එම වාහනය සේවයේ යොදවා ගත් 2018 ජූනි මාසයේ සිට 2019 ජූලි 11 දින දක්වා කාලය තුළ රු.මිලියන 1.69 ක කුලී ගාස්තු ගෙවා තිබුණි. 2019 ජූලි 12 දින සිට 2019 සැප්තැම්බර් 11 දින දක්වා තවදුරටත් රු.260,000 ක් ගෙවිය යුතුව තිබුණි.
- ගාල්ල මහා නගර සභා බල ප්‍රදේශයේ භූගෝලීය තොරතුරු පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා එළඹ තිබුණු ගිවිසුම ප්‍රකාරව 2013 ජූලි 02 දින හෝ ඊට පෙර එම ව්‍යාපෘතිය අවසන් කළ යුතුව තිබුණි. 2018 දෙසැම්බර් 31 දින වන විටද ව්‍යාපෘතියේ වැඩ අවසන් කර නොතිබුණි. තවද ගිවිසුම්ගත මුදලට අමතරව රු.මිලියන 2.03 ක් වැය කර තිබුණත්, ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ලඟා කර ගෙන නොතිබුණි.
- මාතර මහා නගර සභාව විසින් 2015 වර්ෂයේ සිට වර්ෂ 04 ක කාලයක් තුළ ප්‍රතිචක්‍රීකරණය කළ හැකි දිරන කසළ ට්‍රැක්ටර් ලෝඩ් 30,725 ක් හා ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි කසළ ට්‍රැක්ටර් ලෝඩ් 1,661 ක් අක්‍රමවත් හා අවිධිමත් ලෙස කොටවිල කසළ අංගනයට බැහැර කිරීම නිසා කසළ කන්දක් නිර්මාණය වී තිබුණි. මෙම කසළ කන්ද තුනී කිරීම සඳහා 2015 වර්ෂයේ සිට 2018 ඔක්තෝබර් මාසය දක්වා සභාවේ බැකෝ යන්ත්‍රය පැය 2,703 ක් යෙදවීම වෙනුවෙන් ඉන්ධන වියදම් ලෙස රු.මිලියන 1.31 ක් හා පෞද්ගලික බැකෝ යන්ත්‍රයක් සඳහා රු.මිලියන 2.63 ක් වැය කර තිබුණි. අවිධිමත්ව කසල බැහැර කිරීම නිසා මහජන විරෝධතා දිනෙන් දින වර්ධනය වී තිබුණි.
- මාතර මහා නගර සභාව විසින් 2012 වර්ෂයේදී ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන සඳහා රු.මිලියන 2.68 ක් වැයකර යතුරුපැදි 10 ක් මිලදී ගෙන තිබුණි. එම යතුරුපැදි මිලදී ගැනීමේදී අමතර කොටස් ලබා ගැනීම හා සේවා කටයුතු සිදු කිරීම වැනි කාරණා පිළිබඳව අවධානය යොමු නොකිරීම හේතුවෙන් රු.මිලියන 1.61 ක් වටිනා යතුරුපැදි 06 ක් අමතර කොටස් නොමැති වීමෙන් ධාවනයෙන් ඉවත් කර තිබුණි.
- හක්මණ ප්‍රාදේශීය සභාව විසින් ඉකුත් වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ කුරුඳු පියස ජල ව්‍යාපෘතියෙන් ජලය සැපයීම සඳහා නල ළිං 02 ක් ඉදි කිරීමට රු.මිලියන 1.59 ක් ජලසම්පාදන හා

ජලාපවහන මණ්ඩලය වෙත ගෙවා තිබුණි. ජලමූලාශ්‍ර හඳුනා නොගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය වන විටත් අදාළ කාර්යය ඉටු කර නොතිබුණි.

- පස්ගොඩ ප්‍රාදේශීය සභාව විසින් ඉකුත් වර්ෂයේදී ජංගම පුස්තකාලයක් ආරම්භ කිරීම සඳහා රු.මිලියන 2.17 ක් වැයකර ටාටා සුපර් වර්ගයේ ට්‍රක් රථයක් මිලදී ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් වාහනය අදාළ අරමුණ ඉටු කරගැනීම සඳහා යොදාගෙන නොතිබුණි.
- තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු පිරිවැය රු.මිලියන 5.81 ක් වූ බැකෝලෝඩර් යන්ත්‍රය වර්ෂ 07 ක් මුළුල්ලේ ස්වභාවික ආපදාවන්ට ලක්වෙමින් පෞද්ගලික ගරාජයක දිරාපත් වෙමින් පැවතුණි.
- මහව ප්‍රාදේශීය සභාව වෙත 2016 සැප්තැම්බර් මාසයේදී පොදු වෙළඳ සංකීර්ණය ලැබී තිබුණි. එම වෙළෙඳ සංකීර්ණයේ කඩ කාමර බදුදීම සඳහා බදුකරුවන් තෝරා ගෙන තිබුණි. එසේ තෝරාගත් බදුකරුවන් වෙත, 2018 සැප්තැම්බර් මාසයේදී යතුරු භාර දී තිබුණද, 2018 දෙසැම්බර් මාසය වන විටද විදුලිය ලබා නොගැනීම හා දොරවල්වල පවතින අඩුපාඩු හේතුවෙන් කුලී අය කිරීමට නොහැකිවී තිබුණි. මේ නිසා අවම වශයෙන් රු.මිලියන 3.28 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි.
- ආයතන සංග්‍රහයේ IX වැනි පරිච්ඡේදයේ පළමු වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු 1990 ජුනි 05 දිනැති පළාත් සභා අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 3(ආ) ඡේදය ප්‍රකාරව පළාත් සභාවේ කාර්ය මණ්ඩලයට දීමනා ගෙවීම සඳහා ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබා ගත යුතුව තිබුණි. කුරුණෑගල ප්‍රාදේශීය සභාව විසින් රාජ්‍ය ආයතනවලින් ලැබෙන විවිධ ප්‍රතිපාදන මත සංවර්ධන කටයුතු සිදුකිරීම වෙනුවෙන් 2011 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා සභා අරමුදලට ලැබී තිබූ පරිපාලන වියදමින් රු.මිලියන 2.39 ක් ආණ්ඩුකාරවරයාගේ අනුමැතියෙන් තොරව සභාවේ සේවයේ නියුතු නිලධාරීන් 22 දෙදෙනෙකු වෙත ගෙවා තිබුණි.
- රත්නපුර මහා නගර සභාව සතු ඉහළ ජෛව විවිධත්වයකින් යුතු හා ස්වභාවික ජල පෙරනයක් සහිත ස්වභාවික පිහිනුම් තටාකයකින් යුත් පොම්පකැලය නාගරික වනෝද්‍යානය ප්‍රමාණවත් පරිදි නඩත්තු කර නොතිබුණි. මේ හේතුවෙන් වර්තමානය වනවිට ජල පෙරනය අක්‍රීය වී ජල තටාකයද අපවිත්‍ර වී කිසිවෙකුත් ප්‍රයෝජනයට නොගන්නා තත්ත්වයට පත්ව තිබුණි. ආරම්භයේදී අක්කර 56 ක පමණ භූමි ප්‍රමාණයකින් සමන්විත වූ මෙම වනෝද්‍යානය අනවසර ඉදිකිරීම්, ආපදාවන්ට ලක් වූවන් පදිංචි කරවීම හා විසල් ජල ව්‍යාපෘතිය සඳහා ඉඩ පහසුකම් සපයාදීම නිසා වර්තමානය වනවිට අක්කර 35 කට පමණ සීමා වී තිබුණි. වනෝද්‍යානය සංරක්ෂණය සඳහා 2012 හා 2015 වර්ෂවලදී යෝජනා ඉදිරිපත් කර තිබුණද, එම යෝජනා කිසිවක් 2018 වර්ෂය අවසන් වනවිටත් ක්‍රියාත්මක කිරීමට සභාව අපොහොසත් වී තිබුණි.
- රත්නපුර මහා නගර සභාවට අයත් නගර මධ්‍යයට ආසන්නයේ පිහිටි ඉහළ වාණිජමය වටිනාකමකින් යුතු අක්කර 05 ක භූමිය හා එහි පිහිටි

ගොඩනැගිල්ල, ටෙනිස් ක්‍රීඩා පිටි දෙක හා බැඩ්මින්ටන් ක්‍රීඩාපිටිය විධිමත් තක්සේරුවකින් තොරව රු.350 ක වාර්ෂික බදු කුලියකට වර්ෂ 33 ක කාල පරිච්ඡේදයක් සඳහා 2000 නොවැම්බර් මාසයේදී රත්නපුර නිතීඥ සංගමය වෙත දීර්ඝ කාලීනව බදු දී තිබුණි. 2019 සැප්තැම්බර් 30 දින වන විට වර්ෂ 18 ක් ගත වී තිබුණද, බදු කුලිය සංශෝධනය කර නොතිබුණු අතර, බදු කුලිය වශයෙන් කිසිදු මුදලක් සභාවට අය වී නොතිබුණි.

- පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව විසින් රු.මිලියන 1.92 ක් වැයකර තුංකම පාසල පිවිසුම් මාර්ගය මීටර් 264.4 ක් කොන්ක්‍රීට් කර තිබුණි. එයින් මීටර් 195 ක පමණ ප්‍රමාණයක මතුපිට සිමෙන්ති සහ කළුගල් තට්ටුව ගැලවී තිබුණි. ඒ අනුව, එම කොටස සංවර්ධනය සඳහා රු.මිලියන 1.42 ක් වැය කර තිබුණි.
- බලංගොඩ නගර සභාවට අයත් බලංගොඩ තානායමේ අලෙවි කිරීම සඳහා 2016 මැයි 21 වෙනි වෙසක්පුර පසලොස්වක පෝය දිනයේදී රට බීම මිලි ලීටර් 163,110 ක් බලපත්‍ර කොන්දේසිවලට පටහැනිව තබා ගැනීම මත රත්නපුර සහකාර සුරාබදු කොමසාරිස් විසින් 2016 අගෝස්තු 08 දින නියම කළ රු.මිලියන 1.52 ක දඩ මුදල වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමේ පදනමට සභාව විසින් ගෙවා තිබුණි. දඩ මුදල් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීම සඳහා විත්තිකරුවන් තිදෙනෙකුට එරෙහිව නඩු පවරා තිබූ නමුත් සහකාර සුරාබදු කොමසාරිස්ගේ චෝදනා පත්‍රයේ සඳහන් වෙසක් මාසයේ පුර පසලොස්වක පෝය දිනයේදී මත්පැන් විකිණීම යන චෝදනාද ඇතුළත්ව අනෙකුත් චෝදනා නඩුවේ චෝදනා ලෙස ඇතුළත් කිරීමට සභාව කටයුතු කර නොතිබුණි.
- කොළඹ මහා නගර සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 3,203.55 ක වරිපනම් හිඟහිටව පැවැතුණි. එයින් රු.500,000 ඉක්ම වූ දේපළ 753 කට අදාළ හිඟ වරිපනම් වටිනාකම රු.මිලියන 1,507.22 ක් වී තිබුණි. එය මුළු හිඟහිටි වරිපනම් ප්‍රමාණයෙන් සියයට 47 ක් වී තිබුණි. එසේම රු.මිලියන 10.00 කට වැඩි වරිපනම් ගෙවන්නන් සංඛ්‍යාව 25 ක් වූ අතර එයින් 19 දෙනෙකු විසින් රු.මිලියන 349.50 ක වරිපනම් හිඟහිටව තිබුණත්, ඉන් කිසිදු මුදලක් ඔවුන් විසින් ගෙවා නොතිබුණි.
- කොළඹ මහා නගර සභාව විසින් 2016 පෙබරවාරි 28 දින වන විට රු.මිලියන 200.86 ක් වැය කර කොළඹ 12, පැරඩයිස් පෙදෙසේ පිහිටි ලොන්ඩරි භූමිය තුළ නිවාස 64 ක් ඉදිකර තිබුණි. නියමිත පදිංචි කරුවන්ට හා අඩු ආදායම්ලාභී නිවාස නොමැති ජනතාවට එම නිවාස ලබාදීමට 2019 අප්‍රේල් 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි.
- දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව විසින් ගල්කිස්ස හෝටල් පාරේ අංක 4/89 දරන බිම් සැලැස්මේ රූඩ 01 පර්චස් 4.1 ක් වූ ඉඩම වාහන නැවතුම් පොලක් ලෙස භාවිතා කිරීම සඳහා ගල්කිස්ස හෝටලය වෙත බදුදී තිබුණි. එම ගිවිසුම්වල වූ අඩුපාඩු හේතුකොට ගෙන 2018 දෙසැම්බර් 31 දින වන විට එම

දේපලේ හිඟ කුලිය රු.මිලියන 5.12 ක් වී තිබුණ අතර එම කුලි මුදල් බදුකරුගෙන් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

- අනුරාධපුර මහා නගර සභාවේ ස්ථිර හා අනියම් සේවකයින් 532 කින් සමන්විත කාර්ය මණ්ඩලයේ වැටුප් සැකසීම සඳහා රාජ්‍ය වැටුප් සැකසීම් පද්ධතිය භාවිතා කර තිබුණි. එම පද්ධතිය ක්‍රියාත්මක කිරීමේදී දත්ත සමුදාය විධිමත්ව පරිපාලනය නොකිරීම, පුද්ගල නාම, මූලික වැටුප් ඇතුළත් කිරීමේ යෙදවුම් පාලනය නොකිරීම, උපුටා ගැනීම් සඳහා බලය නොපැවතීම සහ ආරක්ෂා නොකිරීම, මනා අභ්‍යන්තර පරීක්ෂාවක් සිදුකර නොතිබීම, පුද්ගල වැටුප් ලේඛන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ලේඛනය හා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබීම නිසා රු.මිලියන 40.85 ක වැටුප් වංචාවක් සිදු වී තිබුණි.
- අනුරාධපුර මහා නගර සභාවේ සේවය කළ කාර්යාල කාර්ය සහායකවරයකු 2013 අගෝස්තු 19 දින සිට පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරු වී ගොස් තිබුණි. එම ස්ථාන මාරුවීම වැටුප් ලේඛනවල සටහන් කර නොතිබීම නිසා 2013 සැප්තැම්බර් මාසයේ සිට 2018 ජුනි මාසය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව රු.මිලියන 1.82 ක මුදලක් මහා නගර සභාව විසින් වැටුප් සහ දීමනා ලෙස ගෙවීම් කර තිබුණි.
- මහියංගණ ප්‍රාදේශීය සභාව විසින් පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ ජාතික ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියේ ප්‍රතිපාදන යටතේ 2013 වර්ෂයේදී රු.මිලියන 13.66 ක් වැයකර අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීය මධ්‍යස්ථානයක් ඉදිකර තිබුණි. 2017 වර්ෂයේදී රු.18,846 ක් වැයකර විදුලි සම්බන්ධතාවයද ලබාගෙන තිබුණි. එහෙත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි.
- බදුල්ල මහා නගර සභාව විසින් 2017 වර්ෂයේදී රු.මිලියන 73.40 ක් වියදම් කර ඉදිකරන ලද වාහන නවතා තැබීමේ රථගාල කළමනාකරණය කිරීම සඳහා සේවකයින් 09 දෙනෙකු යොදවා පරිගණක මෙහෙයුම් පද්ධතියක් ද ස්ථාපිත කර තිබුණි. දිනකට රථවාහන 170 ක් පමණ ගාල් කළහැකි වුවත්, දැනට වාහන 10-15 ක් අතර ප්‍රමාණයක් ගාල්කර තිබුණු අතර මාසිකව රු.58,000 ක පමණ ආදායමක් ලබා ගෙන තිබුණි. නගරයේ විවිධ ස්ථානවල අවිධිමත් ලෙස නවතා ඇති රථ වාහන මෙම ස්ථානයට යොමු කිරීම සඳහා වැඩ පිළිවෙලක් සභාව විසින් ක්‍රියාත්මක නොකිරීම නිසා රථගාලේ සම්පූර්ණ ධාරිතාවය ප්‍රයෝජනයට ගැනීමට නොහැකිවී තිබුණි.
- බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව විසින් පුරනැගුම ව්‍යාපෘතිය යටතේ හිඟුරුකඩුව උපකාර්යාලය සඳහා රු.මිලියන 29.25 ක් වැයකර ගොඩනැගිල්ලක් ඉදිකර 2017 ජුනි මාසයේදී අවසන් කර තිබුණි. එහි උප කාර්යාලය ස්ථාපනය කර නොතිබුණු අතර ව්‍යාපෘතිය මගින් ලබා දී තිබුණු රු.මිලියන 1.48 ක් වටිනා ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ ද නිෂ්කාර්යව පැවතුණි.
- ගිරිබාව ප්‍රාදේශීය සභාවට අයත් මාසික කඩ කුලිය රු.200 බැගින් වූ හත්පී කුච්චි

පළාත් පාලනය

පිහිටි කඩකාමර 07 ක බදු ගැණුම්කරුවෙක් සභාවට දැනුම්දීමකින්	තොරව එම කඩ කාමර රු.මිලියන 2.00 කට	වෙනත් පාර්ශවයන්ට විකුණා තිබුණි.

විදේශාධාර ව්‍යාපෘති

සම්පූර්ණ කළ වැඩ සඳහා කොන්ත්‍රාත්කරුවන්ගේ බිල්පත් නිරවුල් කිරීමට අපොහොසත්වීම

පාසල්වලට බෙදා දුන් විද්‍යාත්මක උපකරණ ගුණාත්මකභාවය අඩුවීම නිසා උපයෝජනය නොකිරිම

විදේශාධාර ව්‍යාපෘති 18 ක මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් නොකිරීම

විදේශ ආධාර ව්‍යාපෘති

2018 වර්ෂය සඳහා වූ මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව අනුව, සමාලෝචිත වර්ෂයේදී සමස්ථ අයවැය හිඟය වූ රු.බිලියන 761 ක් පියවීම සඳහා රජය දේශීය මූලාශ්‍රවලින් රු.බිලියන 437 ක් හා විදේශීය මූලාශ්‍ර වලින් රු.බිලියන 324 ක් ණය වශයෙන් ලබාගෙන තිබුණි. ඉකුත් වර්ෂයේදී විදේශ මූලාශවලින් ලබාගෙන තිබුණු රු.බිලියන 439 ක ශුද්ධ විදේශ ණය ප්‍රමාණය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී විදේශ ණය ගැනීම්වල සියයට 26 ක පහළයාමක් දැකිය හැකිය.

සමාලෝචිත වර්ෂයේදී රජය විදේශ සංවර්ධන පාර්ශ්වකරුවන්ගෙන් සහ ණය දෙන නියෝජිත ආයතන සමඟ නව විදේශ මූල්‍යයන එකගතා ගිවිසුම් 39 කට එළඹ තිබුණු අතර එමගින් ඉදිරි වර්ෂ වලදී එ.ජ.ඩො.මිලියන 1,241.6 ක් ලබාගැනීමට නියමිතව තිබුණි. ණය එකඟතා ගිවිසුම් 25 ක් මඟින් ලබාගැනීමට බලාපොරොත්තු වූ එ.ජ.ඩො.මිලියන 1,108.7 ක් හා ප්‍රදාන ආධාර ගිවිසුම් 25 ක් මඟින් ඉදිරි වර්ෂවලදී ලැබීමට නියමිතව තිබුණු එ.ජ.ඩො.මිලියන 132.9 කින් එය සමන්විත විය. මෙම ණය හා ආධාර මුදල් ප්‍රධාන වශයෙන් අධ්‍යාපනය හා පුහුණු, පරිසරය, සෞඛ්‍ය හා සනීපාරක්ෂක සහ සමාජ යටිතල පහසුකම් අංශයන් සඳහා උපයෝජනය කිරීමට නියමිතය.

විදේශ ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය අවසාන වන විට විදේශ ආධාර ව්‍යාපෘති 164 ක් ක්‍රියාත්මක තත්ත්වයේ පැවති අතර ඒ අතරින් විදේශ ආධාර ව්‍යාපෘති 146 ක වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත්, ඉන්දියානු ණය ක්‍රමය, චීන රජයේ ආධාර සහ වෙනත් ද්විපාර්ශවයික ණය යෝජනා ක්‍රම යටතේ ක්‍රියාත්මකව පැවති ව්‍යාපෘතිවලට අදාළ ණය ගිවිසුම්වල, වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයාගේ පරීක්ෂණයට භාජනය විය යුතු බව සඳහන් කොන්දේසි අනිවාර්ය අවශ්‍යතාවයන් ලෙස දක්වා නොතිබීම හේතුවෙන් එම ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. 2018 වර්ෂයේ විදේශ සංවර්ධන පාර්ශ්වකරුවන් සහ ණය දෙන නියෝජිත ආයතන මඟින් ක්‍රියාත්මක කර තිබුණු විදේශ ව්‍යාපෘති පිළිබඳ විස්තරයක් රූප සටහන 37 හි දැක්වේ.



රූපසටහන 37 - විදේශ ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම

විදේශ ආධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය

විදුලිබල අංශය

ශ්‍රී ලංකාවේ විදුලිබල අංශයේ ගුණාත්මකතාවය වර්ධනය කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ විදේශ ආධාර ව්‍යාපෘති 11 ක් ක්‍රියාත්මක කර තිබුණු අතර ඒවායේ භෞතික ප්‍රගතිය මන්දගාමීව පැවතුණි. එම ව්‍යාපෘති සඳහා වෙනම ව්‍යාපෘති මෙහෙයුම් ඒකක පිහිටුවා නොතිබුණු අතර ලංකා විදුලිබල මණ්ඩලයේ සහ සුනිත්‍ය බලශක්ති අධිකාරියේ විවිධ අංශ මඟින් අදාළ ව්‍යාපෘතිවල සංරචක වෙන වෙනම ක්‍රියාත්මක කර තිබුණි. එම අංශ අතර නිසි සම්බන්ධීකරණයක් නොවීමත් ව්‍යාපෘති මඟින් ප්‍රසම්පාදනය කර තිබුණු පිරියත දේපල හා උපකරණ සම්බන්ධයෙන් වෙනම වාර්තා පවත්වා නොතිබීමත් හේතුවෙන් ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය කාර්යසාධනය ඇගයීම දුෂ්කර වී තිබුණි. විදේශ ආධාර ව්‍යාපෘති මඟින් විදුලිබල ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා ආයෝජනය කර තිබුණු විදේශ ණය උපයෝජනය කිරීම කාර්යක්ෂම කිරීම සඳහා උක්ත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කර තිබුණු ක්‍රමවේදය නැවත සමාලෝචනය කර නිවැරදි කිරීම අත්‍යවශ්‍ය කරුණක් වී තිබුණි. තවද, ලංකා විදුලිබල මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කර තිබුණු පුනර්ජනනීය බලශක්ති අවශෝෂණය කිරීම ප්‍රවර්ධනය සඳහා වූ විදේශ ආධාර ව්‍යාපෘතිවල විෂය පථය පසු කාලීන වෙනස් කිරීම සහ කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය වැනි කරුණු හේතුවෙන් 2018 දෙසැම්බර් 31 දින වන විට එම ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය පසුගාමීව පැවතුණි.

මාර්ග අංශය

සමාලෝචිත වර්ෂය තුළ, මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කර තිබුණු බොහොමයක් ව්‍යාපෘතිවල භෞතික කාර්යසාධනය අපේක්ෂිත ඉලක්ක සපුරා නොතිබුණු බව හෙළිදරව් විය. මේ සඳහා කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වලතා මෙන්ම සම්පූර්ණ කරන ලද වැඩ සඳහා වූ කොන්ත්‍රාත්කරුවන්ගේ බිල්පත් නිරවුල් කිරීමට කඩිනමින් කටයුතු කිරීමට රේඛීය අමාත්‍යාංශය අපොහොසත් වීමද හේතුවී තිබුණි.

ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය කිරීම සඳහා 2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක කර තිබුණු ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන යටතේ දකුණු, මධ්‍යම, සබරගමුව, උතුරු මැද හා වයඹ පළාත්වල සහ කළුතර දිස්ත්‍රික්කයේ ජාතික මට්ටමේ මහා මාර්ග කිලෝමීටර් 285 ක් හා ප්‍රාදේශීය මට්ටමේ මහා මාර්ග පද්ධතියේ කිලෝමීටර් 3,038 ක් පුනරුත්ථාපනය කිරීමට අපේක්ෂිතව පැවැතුණි. 2018 දෙසැම්බර් 31 දින වන විට ජාතික මාර්ග පද්ධතියේ කිලෝමීටර් 25 ක් හා ප්‍රාදේශීය මාර්ග පද්ධතියේ 668 ක් පමණක් පුනරුත්ථාපනය කර තිබුණි. මෙම ව්‍යාපෘතියේ දෙවන කොටසේ කාර්යයන් 2017 වර්ෂයේදී ආරම්භ කර තිබුණු අතර ඒ යටතේ උතුරු, නැගෙනහිර, ඌව හා බස්නාහිර පළාත්වල ජාතික මාර්ග පද්ධතියේ කිලෝමීටර් 400 ක් හා ප්‍රාදේශීය මාර්ග පද්ධතියේ කිලෝමීටර් 3,750 ක් පුනරුත්ථාපනය කිරීමට සැලැසුම් කර තිබුණි. කෙසේ නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විට අදාළ ප්‍රසම්පාදන කටයුතු ආරම්භක අවධියේ පැවතුණි. පුනරුත්ථාපන කිරීම සඳහා ආරම්භක අවස්ථාවේ හඳුනාගෙන තිබුණු ග්‍රාමීය මාර්ග පසු කාලීනව වෙනස් කිරීම, කොන්ත්‍රාත්කරුවන්ගේ වැඩ ප්‍රමාදයන් යනාදිය

හේතුවෙන් මෙම ව්‍යාපෘතිය යටතේ වූ මාර්ග පුනරුත්ථාපන කටයුතු මන්දගාමීව පැවතුණි.

ජලසම්පාදන අංශය

ජාතික ජලසම්පාදන හා ජලපවාහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කර තිබුණු විදේශ ආධාර ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය සතුටුදායක නොවීම පොදු ලක්ෂණයක් විය. පසුකාලීනව සැලැසුම් වෙනස් කිරිම, ජල නල හා වෙනත් උපාංග සපයා ගැනීමේ ප්‍රමාදයක් සහ මහාමාර්ග හා වෙනත් පද්ධතීන් උපයෝජනය සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය හා පළාත් පාලන ආයතනවලින් ලබාගත යුතු අනුමැතීන් ප්‍රමාද වීම යනාදිය හේතුවෙන් බොහෝ ව්‍යාපෘති ඉලක්ක ගත කාල සීමාව තුළදී නිම කිරීමට නොහැකි වී තිබුණි.

යාපනය අර්ධද්වීපයේ ජනතාවට පානීය ජලය සැපයීමේ හා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාත්මක කර තිබුණු යාපනය, කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය මඟින් ඉරනමඩු ජලාශය, ජල මූලාශ්‍රය වශයෙන් තෝරාගෙන තිබුණු නමුත් ප්‍රදේශයේ ජනතාවගේ විරෝධය හේතුවෙන් ව්‍යාපෘතියේ කටයුතු අතරමග නැවතී තිබුණි. කෙසේ වෙතත්, පසුකාලීනව මුහුදු ජලය පානීය ජලය බවට පරිවර්තනය කර ජල මූලාශ්‍රය වශයෙන් යොදා ගැනීමට ව්‍යාපෘතියේ විෂය පථය සංශෝධනය කර තිබුණි. මේ සඳහා ආසියානු සංවර්ධන බැංකුව මඟින් නව ණය ගිවිසුම් 02ක් යටතේ අරමුදල් සම්පාදනය කිරීමට එකඟ වී තිබුණු අතර, ව්‍යාපෘති වියදම එ.ජ.ඩො.මිලියන 120 කින් ඉහළ ගොස් තිබුණි. කෙසේ වෙතත්, මුහුදු ජල ප්‍රතිලෝම ඔස්මෝසිස් බලාගාරයේ කටයුතු සම්පූර්ණ වී නොමැති වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විට ඉදිකිරීම් සම්පූර්ණ කර තිබුණු ජල කුළුණු 15 ක් හා ජල සැපයුම් මාර්ග නිෂ්කාර්යව පැවතුණි.

නාගරික සංවර්ධන අංශය

නාගරික සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කර තිබුණු කොළඹ අගනගර ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘතියේ හා උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතියේ කටයුතු දේශපාලනිකමය ප්‍රතිපත්ති වෙනස්වීම හේතුවෙන් බෙහෙවින් මන්දගාමීව පැවතුණි. මේ හේතුවෙන් අදාළ ව්‍යාපෘති සඳහා අතිරේක වියදම් දැරීමට සිදුවී තිබුණු අතර ව්‍යාපෘතිවලින් අපේක්ෂිත ප්‍රයෝජන නාගරික ජනතාවට ලැබී නොතිබුණි.

කොළඹ මහනගර සීමාවේ හා තදාසන්න ප්‍රදේශවල නාගරික පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාත්මක කර තිබුණු කොළඹ අග නගර ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘතියේ කාර්යයන් සඳහා වෙන්කර තිබුණු එ.ජ.ඩො. මිලියන 213 කට සමාන රු.මිලියන 27,980 ක මුදලින් 2018 දෙසැම්බර් 31 දින වන විට එ.ජ.ඩො.මිලියන 103.66 කට සමාන රු.මිලියන 14,890 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ව්‍යාපෘතිය යටතේ මහ කොළඹ ප්‍රදේශයේ ජල ගැලීම් පාලනය සඳහා ඉදිකිරීමට අපේක්ෂිත ශාන්ත සෙබස්තියන් ඇල මාර්ගය හා කොලොන්නාව ඇල මාර්ගය සංවර්ධනය කිරීම, තලංගම හා බෞද්ධාලෝක මාවත ප්‍රදේශයේ ජල පාලන ගේට්ටු ඉදිකිරීම හා මෝදර හා ටොරින්ටන් පෙදෙස ඉදිකිරීමට නියමිත ජල උමං මාර්ගවල කටයුතු මන්දගාමීව ක්‍රියාත්මක වෙමින් පැවතුණි.

අධ්‍යාපන හා පුහුණු අංශය

ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්වීතික අධ්‍යාපන අංශවල හා කාර්මික අධ්‍යාපන අංශයේ සංවර්ධනය වෙනුවෙන් ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මකව තිබුණු අතර, පාසල් අධ්‍යාපන පද්ධතිය දැනුම

කේන්ද්‍රීය පදනමක් වශයෙන් පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ පාසල්වල තාක්ෂණ විෂය ධාරාව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ප්‍රවර්ධනය කිරීමට කටයුතු කර තිබුණි. කෙසේ වෙතත් පළාත් මට්ටමෙන් පාසල් උපකරණ බෙදාහැරීමේ වැඩපිළිවෙල ශක්තිමත් නොවීම හේතුවෙන් එම උපකරණ ප්‍රාදේශීය පාසල් වෙත අපේක්ෂිත පරිදි ලැබී නොතිබුණු අවස්ථාවන් සහ පාසල් වෙත ලැබී තිබුණු ඇතැම් උපකරණ ගුරු හිඟය, ගොඩනැඟිලි ඉඩකඩ ප්‍රමාණවත් නොවීම වැනි වෙනත් හේතු නිසා භාවිතයට නොගෙන තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. සබරගමුව පළාත් පාසල් 45 ක් සඳහා බෙදා හැර තිබුණු රු.බිලියන 13.07ක් වටිනා විද්‍යාත්මක උපකරණ බාල ගුණාත්මක තත්ත්වයන් හේතුවෙන් උපයෝජනය කර නොතිබුණු අවස්ථාවන් සහ පළාත් ඉංග්‍රීසි අධ්‍යාපන උපකරණ මධ්‍යස්ථාන සඳහා රු.බිලියන 24.90 ක් වටිනා පරිගණක අදාළ සැපයුම්කරුවන් විසින් නියමිත කාල සීමාව තුළදී බෙදා හැර නොතිබුණු අවස්ථාවක්ද විගණනයේදී නිරීක්ෂණය විය.

තවද, ශ්‍රී ලංකා පාසල් පද්ධතිය තුළ විශේෂ අවශ්‍යතා සහිත ශිෂ්‍ය සංඛ්‍යාව 10,284 ක් වූ බවද ඔවුන් සඳහා ජාතික පාසල් 112 ක හා පළාත් පාසල් 704 ක විශේෂ අධ්‍යාපන ඒකක පිහිටුවා තිබුණි. නමුත් විශේෂ අවශ්‍යතා සඳහා පුහුණු ගුරු තනතුරු 597 ක් 2018 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩුව පැවති බවත් විශේෂ පුහුණුව ලැබූ ගුරුවරුන් 158 දෙනෙක් වෙනත් විෂයයන් ඉගැන්වීම සඳහා අනුයුක්ත කර තිබුණු බවත් විගණනයේදී හෙළිදරව් වී තිබුණි. තවද, මෙම පුහුණුව ලැබූ වෙනත් ගුරුවරුන් 189 දෙනෙක් විශේෂ අධ්‍යාපන ඒකක පිහිටුවා නොමැති පාසල්වලට අනුයුක්ත කර තිබුණි.

පොදු නිරීක්ෂණ

විදේශ ආධාර ව්‍යාපෘතිවලින් අපේක්ෂිත අරමුණු කාර්යක්ෂමව ඉටුකිරීම සඳහා ව්‍යාපෘති මෙහෙයුම් ඒකකවල ප්‍රධාන කළමනාකරණ තනතුරු නිරන්තරයෙන් පුරප්පාඩුව පැවතීම ප්‍රධාන වශයෙන් බාධාවක්ව පැවති බව විගණනයේදී හෙළිදරව් විය. කෘෂිකර්ම අංශයේ නවීකරණ ව්‍යාපෘතිය, උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය, මහ කොළඹ ජල සම්පාදන හා අප ජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සහ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යන ව්‍යාපෘතිවල ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන්, පරිසර නිලධාරි, ඉඩම් අත්පත් කර ගැනීමේ නිලධාරි යනාදී තනතුරු අඛණ්ඩව පුරප්පාඩුව පැවතීම හේතුවෙන් එම ව්‍යාපෘතිවල කාර්යසාධනය මන්දගාමීව පැවතුණි.

විදේශ ආධාර ව්‍යාපෘතිවල ක්‍රියාකාරී කාල සීමාව අවසාන වීමෙන් පසුවද, සමහර ව්‍යාපෘති කළමනාකරණ ඒකක විසින් අඛණ්ඩ පැවැත්ම සංකල්පය පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් ව්‍යාපෘතියේ අවසාන මූල්‍ය වර්ෂයේදී, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු ආකාරය පිළිබඳව විධිමත් උපදෙස් ලබාදී නොතිබීම හේතුවෙන් මේ තත්ත්වය උද්ගතවී පැවතුණි. තවද, විදේශ අරමුදල් උපයෝජනය කර මිලදීගත් දේපල, පිරියත හා උපකරණ යනාදී වත්කම් ව්‍යාපෘතියේ ක්‍රියාකාරී කාල සීමාව අවසන්වීමෙන් පසු හා අදාළ ක්‍රියාත්මක කිරීමේ ආයතන වෙත භාරදීමෙන් පසු ඒවා අපේක්ෂිත අරමුණු වෙනුවෙන් උපයෝජනය කරන බව තහවුරු කිරීම සඳහා පසු පරීක්ෂාවන් රේඛීය අමාත්‍යාංශය විසින් සිදුකර නොතිබීම ප්‍රධාන අඩුපාඩුවක් විය.

බැංකු කටයුතු

ලංකා බැංකුවේ අක්‍රීය ණය හා අත්තිකාරම් ශේෂය ඉහළයාම. එය සියයට 2.9 ක සිට සියයට 3.6 දක්වා වැඩිවීම

ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ වෙළෙඳපොළ කොටස සියයට 13.7 ක සිට සියයට 9.9 දක්වා අඩුවීම

ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් වංචනික ලෙස මුදල් ආපසු ගැනීම් වැඩි වී තිබීම

නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව හා ප්‍රාදේශීය සංවර්ධන බංකුවල සේවකයින් ගෙවිය යුතු උපයන විට ගෙවීමේ බදු බැංකු විසින් ගෙවීම

බැංකු අංශය

බැංකු අංශය

බලපත්‍රලාභී වාණිජ බැංකු (එල්.සී.බී) සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු (එල්.එස්.බී) වලින් බැංකු අංශය සමන්විත වේ. 2018 වර්ෂය අවසන් වන විට බැංකු අංශය, බලපත්‍රලාභී වාණිජ බැංකු 26 කින් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු 7 කින් සමන්විත විය. මුළු බලපත්‍රලාභී වාණිජ බැංකු අතරින් විදේශ බැංකු 13 ක් පැවතුණි. බැංකු සේවාවන් වැඩිදියුණු කිරීම සහ දිවයින පුරා සිය ජාලය සහ ප්‍රවේශය ව්‍යාප්ත කිරීම මඟින් බැංකු අංශය විසින් අඛණ්ඩව ආර්ථික ක්‍රියාකාරකම් හා සංවර්ධනය සඳහා දායක විය. ඒ අනුව 2018 වර්ෂය තුළ නව ශාඛා 34 ක් විවෘත කර තිබූ අතර ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 801 ක් ස්ථාපිත කර තිබුණි. 2018 වර්ෂය අවසාන වන විට බැංකු සහ ශාඛාවන්ගේ ව්‍යාප්තිය වගුව 16 හි සාරාංශ කර දක්වා ඇත.

කාණ්ඩය		බැංකු ගණන	ශාඛා ගණන	ශිෂ්‍ය ඉතුරුම් ඒකක	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ගණන
LCBs	දේශීය බැංකු	13	2876	3309	4655
	විදේශීය බැංකු	13	51		
LCBs	ජාතික මට්ටමේ ඉතිරිකිරීමේ බැංකු	1	261		
	නිවාස මූල්‍ය ආයතන	2	64		376
	අනෙකුත් බලපත්‍රලාභී විශේෂිත බැංකු	4	371		

වගුව 16.- 2018 වර්ෂය අවසාන වන විට බැංකු හා ශාඛාවන්ගේ ව්‍යාප්තිය
මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකුව (සංශෝධිත හා තාවකාලික දත්ත)

වත්කම්

2018 වර්ෂය අවසාන වන විට බැංකු අංශයේ වත්කම් පදනම රුපියල් ට්‍රිලියන 11 ඉක්මවා තිබුණු අතර 2017 වර්ෂය අවසන් වන විට සියයට 13.8 සිට 2018 වර්ෂය අවසන් වන විට සියයට 14.6 දක්වා වර්ධනය වී තිබුණි. වත්කම් කළඹ ප්‍රධාන වශයෙන් ණය හා අත්තිකාරම් වලින් සමන්විත වූ අතර, එය බැංකු අංශයේ වත්කම් වලින් සියයට 65.2 ක . අගයක් ගෙන තිබුණි. ප්‍රධාන රාජ්‍ය බැංකු දෙක වන ලංකා බැංකුවේ සහ මහජන බැංකුවේ වත්කම් ප්‍රමාණය පිළිවෙලින් රු. බිලියන 2,268 ක් හා රු.බිලියන 1,735 ක් වූ අතර එය බැංකු අංශයේ මුළු වත්කම් වලින් සියයට 33.9 ක් නියෝජනය විය. විසිතර රූපසටහන 38 හි වේ.



රූපසටහන 38 - බැංකු අංශයේ මුළු වත්කම්
මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකුව (සංශෝධිත හා තාවකාලික දත්ත)

අක්‍රීය ණය

බැංකු අංශයේ සමස්ත අක්‍රීය ණය අනුපාතය 2017 වර්ෂය අවසානයේ සියයට 2.5 ක සිට 2018 වර්ෂය අවසාන වන විට සියයට 3.4 දක්වා වැඩි වී තිබුණි. ප්‍රධාන රාජ්‍ය බැංකු දෙක වන ලංකා බැංකුවේ සහ මහජන බැංකුවේ 2018 වර්ෂය අවසානය වන විට අක්‍රීය ණය පිළිවෙලින් රු.බිලියන 53.75 ක් සහ රු.බිලියන 31.47 ක් වී තිබුණි. ඒ අනුව, අක්‍රීය ණය අනුපාතය පිළිවෙලින් සියයට 1 ක් සහ සියයට 2.48 ක් ලෙස 2018 වර්ෂය අවසානයේ බැංකු අංශයේ අනුපාතයට වඩා අඩු අනුපාතයක් පෙන්නුම් කෙරිණි. විස්තර රූපසටහන 39 හි වේ.



රූප සටහන 39 - බැංකු අංශයේ අක්‍රීය ණය
මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකුව (සංශෝධිත හෝ තාවකාලික දත්ත)

වගකීම් සහ ප්‍රාග්ධනය

වගකීම්වල ප්‍රධාන මූලාශ්‍රය බවට ගනුදෙනුකරුවන්ගේ තැන්පතු අඛණ්ඩව පැවතුණු අතර එය බැංකු අංශයේ මුළු වගකීම් හා ප්‍රාග්ධනයෙන් සියයට 72 ක අගයක් ගෙන තිබුණි. 2018 වර්ෂය අවසන් වන විට ප්‍රධාන රාජ්‍ය බැංකු දෙක වන ලංකා බැංකුවේ සහ මහජන බැංකුවේ තැන්පතු පිළිවෙලින් රු.බිලියන 1,765 ක් හා රු.බිලියන 1,423 ක් වූ අතර එය බැංකු අංශයේ මුළු තැන්පතු වලින් සියයට 37.5 ක් නියෝජනය කර තිබුණි. බැංකු අංශයේ මුළු ණය ගැනීම් 2017 වර්ෂයේ වාර්තා වූ රු.බිලියන 89.3 ක (සියයට 5.3 සෘණ වර්ධනය) අඩු වීමට සාපේක්ෂව 2018 වර්ෂයේදී රු.බිලියන 156.3 කින් (සියයට 9.7) වර්ධනය විය. මෙම වර්ධනයට 2018 වර්ෂයෙහි රුපියල් ණය ගැනීම්වල සිදු වූ සියයට 23.7 (රුපියල් බිලියන 142.3) ක වර්ධනය මූලික වශයෙන් හේතු වී තිබුණි. ප්‍රධාන රාජ්‍ය බැංකු දෙකෙහි ණය ගැනීම් රු.බිලියන 237 ක් වී තිබුණි. විස්තර රූපසටහන 40 හි දැක්වේ.



රූපසටහන 40 - බැංකු අංශයේ වගකීම්
මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකුව (සංශෝධිත හෝ තාවකාලික දත්ත)

තැන්පතු

බැංකු අංශයේ තැන්පතු පදනම වර්ෂය තුළදී රු.බිලියන 1,100 කින් වැඩි වූ අතර, එය 2018 වර්ෂය අවසානය වන විට රු.බිලියන 8,500 ක් වී තිබුණි. මුළු තැන්පතුවලින් කාලීන තැන්පතු ප්‍රතිශතයක් ලෙස 2017 අවසානයේදී වාර්තා වූ සියයට 63.6 කට සාපේක්ෂව 2018 වර්ෂය අවසාන වන විට සියයට 65.5 ක් දක්වා වැඩි වීමක් පෙන්නුම් කෙරුණි. ප්‍රධාන රාජ්‍ය බැංකු දෙකේ කාලීන තැන්පතු 2018 වර්ෂය අවසන් වන විට රු.බිලියන 1,743 ක් වී තිබුණි. විස්තර රූපසටහන 41 හි වේ.



රූපසටහන 41 - බැංකු අංශයේ තැන්පතු

මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකුව (සංශෝධිත හා තාවකාලික දත්ත)

ශ්‍රී ලංකා මහ බැංකුව

1949 අංක 58 දරන මුදල් නීති පනත (සංශෝධිත පරිදි) යටතේ ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය හා ගෙවීම් ක්‍රමයේ පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය සඳහා වගකිව යුතු ඉහළම අධිකාරිය ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව පිහිටුවන ලදී. ශ්‍රී ලංකාවේ ඵලදායී සම්පත් සංවර්ධනය කිරීම, දිරිගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ආර්ථික හා මිල ස්ථායිතාව සහ මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව සුරක්ෂිත කිරීමේ අරමුණු පෙරදැරිව ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු කරයි.

දේශීය මුදල් ස්ථායිකරණය සඳහා දේශීය මුදල් ප්‍රතිපත්තිය නිර්ණය කිරීමට මුදල් නීති පනත මඟින් බලය ලබා දී ඇති ක්‍රියාවන් මඟින් හැකිතාක් දුරට සුරක්ෂිත කිරීම සඳහා සැපයුම, තිබෙන බව සහ මුදල් පිරිවැය නියාමනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය උත්සාහ කළ යුතුය. මුදල් සැපයුමේ වෙනස්වීම් මිල ස්ථායිතාවයට බලපාන ප්‍රධාන සාධකයක් වේ. ගුණකය හරහා සංචිත මුදල්වලට සම්බන්ධ වන පුළුල් මුදල් සැපයුමේ වෙනස්කම්වලට බලපෑම් ඇති කිරීම මඟින් මිල ස්ථාවරත්වය ලබා ගත යුතුය.

සංචිත මුදල් යනු මුදල් ප්‍රතිපත්තියේ මෙහෙයුම් ඉලක්කයයි. වර්තමානයේ භාවිතා කරන ප්‍රධාන මූල්‍ය ප්‍රතිපත්ති මෙවලම් වන්නේ ප්‍රතිපත්ති පොලී අනුපාත, විවට වෙළෙඳපොල මෙහෙයුම් (OMO) සහ වාණිජ බැංකු තැන්පතු වගකීම් මත ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා (SRR) වේ. ස්ථාවර තැන්පතු අනුපාතිකය සහ ස්ථාවර ණය අනුපාතිකය වැනි ප්‍රතිපත්ති අනුපාතිකයන් සියයට 7.25 හා සියයට 8.75 සිට 2018 වර්ෂයේදී පිළිවෙළින් සියයට 8 හා සියයට 9 ක් දක්වා වැඩිකර තිබුණි.

2017 වර්ෂයේ රු.බිලියන 83.6 ක ඉහළයාමක් වාර්තා කළ සංචිත මුදල් ප්‍රමාණය 2018 වර්ෂය තුළදී රු.බිලියන 961.1 ක් දක්වා රු.බිලියන 21.3 කින් වැඩි විය. මහ බැංකුව වෙතැති වාණිජ බැංකු සතු තැන්පතු ප්‍රමාණය 2018 වසරේ පළමු මාස දහය තුළදී රු.බිලියන 43.1 ක වැඩිවීමක් වාර්තා කරන ලද අතර, 2018 නොවැම්බර් මාසය මැද භාගයේ සිට ක්‍රියාත්මක වන පරිදි ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සියයට 7.50 ක සිට සියයට 6.00 ක්

දක්වා අඩු කිරීමත් සමඟ 2018 නොවැම්බර් සහ දෙසැම්බර් යන මාසවලදී රු.බිලියන 64.7 කින් සැලකිය යුතු ලෙස අඩු විය.

සංචිත මුදල්වල වත්කම් අංශය මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම් (NDA) සහ ශුද්ධ විදේශ වත්කම් (NFA) වලින් සමන්විත වේ. සංචිත මුදල් වල වත්කම් අංශය අනුව, සංචිත මුදල් වර්ධනය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම් වර්ධනය මුළුමනින්ම දායක විය. ඉකුත් වර්ෂයේදී වාර්තා කරන ලද රු.බිලියන 203.9 ක සැලකිය යුතු අඩුවීමට සාපේක්ෂව ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම් 2018 වර්ෂයේදී රු.බිලියන 116.9 කින් වැඩි විය. ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් තොගයෙහි වැඩි වීමක් පිළිඹිබු කරමින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය සැලකිය යුතු ලෙස වර්ධනයවීමෙහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව සතු ශුද්ධ දේශීය වත්කම් ප්‍රසාරණය විය.

2018 වර්ෂයේදී ශ්‍රී ලංකා රුපියලේ බාහිර වටිනාකම අඛණ්ඩව අවප්‍රමාණය විය. 2017 වර්ෂය අවසන් වන විට රු.152.85 ක සිට 2018 වර්ෂය අවසන් වන විට රු.182.75 ක් දක්වා සියයට 16.4 කින් රුපියල අවප්‍රමාණය විය. 2017 වර්ෂය තුළ එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය අවප්‍රමාණය රුපියල් 149.8 සිට රුපියල් 152.85 දක්වා සියයට 2 ක් විය.

එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුව විසින් පොලී අනුපාත ඉහළ දැමීම හමුවේ සමස්තයක් ලෙස එක්සත් ජනපද ඩොලරය ශක්තිමත් වීමත් සමඟ අනෙකුත් ප්‍රධාන මුදල් වර්ග එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව අවප්‍රමාණය විය. ඒ අනුව, යුරෝවලට සාපේක්ෂව සියයට 12.68 කින්ද, ඉන්දියානු රුපියලට සාපේක්ෂව සියයට 8.72 කින්ද, ජපන් යෙන්වලට සාපේක්ෂව සියයට 18.05 සහ ස්ටර්ලින් පවුමට සාපේක්ෂව සියයට 11.35 කින්ද, ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය විය.

ගෝලීයව සහ දේශීයව පැවැති අභියෝගාත්මක වෙළෙඳපොළ තත්ත්වයන් හමුවේ වුවද, වර්ෂය තුළදී මූල්‍ය අංශය ප්‍රධාන සාර්ව විචක්ෂණතා ගැටලුවලින් තොරව අඛණ්ඩව වර්ධනය විය. කෙසේ වුවද, 2017 වර්ෂය සමඟ සසඳන කළ 2018 වර්ෂයේදී අක්‍රීය ණය සහ අත්තිකාරම් ඉහළ යෑම හේතුකොට ගෙන බැංකු අංශයේ සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගම් (LFC) සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්(SLC) අංශයේ ණය ගුණාත්මකභාවයේ සැලකිය යුතු පිරිහීමක් දැකිය හැකි විය.

2018 වර්ෂය අවසානයේදී බලපත්‍රලාභී මූල්‍ය සමාගම් 43 කින් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් 5 කින් බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශය සමන්විත විය. කෙසේ වුවද, මූල්‍ය ගැටලු හා ද්‍රවශීලතා අර්බුද හේතුවෙන් සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆිනෑන්ස් පී එල් සී (CIFL) සහ ද ස්ටෑන්ඩර්ඩ් ක්‍රෙඩිට් ෆිනෑන්ස් ලිමිටඩ් (TSCFL) හි බලපත්‍ර පිළිවෙලින් 2018 මාර්තු 05 දින සහ 2018 ජූලි 25 දින සිට ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් අවලංගු කරන ලදී.

එම සමාගම් වල තැන්පත්කරුවන්ට ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාර යෝජනා ක්‍රමයෙන් රු.600,000 ක් දක්වා වන්දි ලබා ගැනීමට හිමිකම් ඇත. බලපත්‍ර අවලංගු කරන අවස්ථාව වනවිට සෙන්ට්‍රල් ඉස්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆිනෑන්ස් පී එල් සී (CIFL) සහ ස්ටෑන්ඩර්ඩ් ක්‍රෙඩිට් ෆිනෑන්ස් ලිමිටඩ් (TSCFL) හි මුළු තැන්පතු ශේෂය පිළිවෙළින් රු.මිලියන 3,966.39 ක් සහ රු.මිලියන 2,656.12 ක් විය. මෙයින් සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. සහ ද ස්ටෑන්ඩර්ඩ් ක්‍රෙඩිට් ෆිනෑන්ස් ලිමිටඩ් හි තැන්පත්කරුවන්ට ගෙවිය යුතු සුදුසුකම් ලබන වන්දි මුදල පිළිවෙලින් තැන්පත්කරුවන් 15,126 ක් සඳහා රු.මිලියන 1,656.71 ක් සහ තැන්පත්කරුවන් 6,793 ක් සඳහා රු. මිලියන 1,235.91 ක් විය. ඒ අනුව, 2018 දෙසැම්බර් 31 දින වන විට සෙන්ට්‍රල්

ඉන්වෙස්ට්මන්ට් සහ ෆිනෑන්ස් පී.එල්.සී. හි තැන්පත්කරුවන්ට රු.මිලියන 597.61 (සියයට 36) ක වන්දි මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද, 2018 දෙසැම්බර් 31 දින වන විට ද ස්ටැන්ඩර්ඩ් ක්‍රෙඩිට් ෆිනෑන්ස් ලිමිටඩ් හි තැන්පත්කරුවන්ට කිසිදු වන්දි මුදලක් ගෙවා නොතිබුණි.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිති අංක 9 (SLFRS 09) ; "මූල්‍ය උපකරණ" ක්‍රියාත්මක කිරීමත් සමඟ, 2018 ජනවාරි 01 දින හෝ ඊට පසු වාර්ෂික කාලසීමාවක් සඳහා සියලු ආයතන වල මූල්‍ය වත්කම් සහ වගකීම්වල මූල්‍ය වාර්තාකරණය නව ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල විය. ඒ අනුව, බලපත්‍රලාභී බැංකු විසින් පෙර සිදු කළ ණය අලාභ ප්‍රවේශය වෙනුවට අපේක්ෂිත ණය අලාභ ප්‍රවේශය යටතේ ණය අලාභ සඳහා වෙන් කිරීම් සිදුකිරීමට අවශ්‍ය වේ.

ලංකා බැංකුව

ලංකා බැංකුව , 1938 අංක 53 දරන ලංකා බැංකු ආඥාපනත යටතේ 1939 අගෝස්තු 01 දින නිසි පරිදි සංස්ථාගත කරන ලද අතර 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකුවක් ලෙස පිහිටුවා ඇත.

බැංකුවේ මෙහෙවර වනුයේ, ගෝලීය බැංකුකරණයේ නැවුම් අත්දැකීම් අප ගනුදෙනුකාර ප්‍රජාව වෙත ලඟාකරමින් සේවක පරිපූර්ණත්වය මත ගොඩනැන්වූ වඩාත් කාර්යක්ෂමවත්, ගනුදෙනුකරු කේන්ද්‍රගත නම්‍යශීලී හා නවීන තාක්ෂණ මවේදයන් මුසු වූ නව මූල්‍ය සේවාවන් හරහා සියලු පාර්ශ්වකරුවන් වෙත වටිනාකම් උත්පාදනය කරවීමයි.

ඉහත මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා බැංකුව විසින් 2018 වර්ෂය වනවිට ශාඛා 577 ක්, සීඩීඑම් යන්ත්‍ර 281 ක් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 776 ක් හරහා සිය සේවාවන් බෙදා දී ඇත. මීට අමතරව කාර්ය මණ්ඩලය 8,724 ක් නියුක්ත වී ඇත.

බැංකුව

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2018 වර්ෂය තුළ බැංකුවේ මුළු පොලී ආදායම සියයට 14 කින් හෙවත් රු.මිලියන 171,344 ක සිට රු.මිලියන 195,394 ක් දක්වා වැඩි වී තිබුණි. පසුගිය වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂය අවසානයේ දී සමස්ත ණය හා අත්තිකාරම් සියයට 22.9 කින් හෙවත් රු.මිලියන 1,163,161 ක සිට රු.මිලියන 1,429,107 ක් දක්වා වැඩි වී තිබුණි. මීට අමතරව, වර්ෂය අවසානයේදී බැංකුවේ මුළු තැන්පතු පදනම රු. මිලියන 1,546,832 සිට රු. මිලියන 1,765,026 ක් දක්වා වැඩිවී ඇත.

පෙර වර්ෂයේ අනුරූපී බදු පෙර ශුද්ධ ලාභය රු.මිලියන 37,592 හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී බැංකුවේ මෙහෙයුම්වලින් වූ බදු පෙර ශුද්ධ ලාභය රු. මිලියන 41,480 ක් ලෙස වාර්තා වී තිබුණු අතර එය මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 3,888 ක් හෙවත් සියයට 10.3 ක වැඩිවීමකි. සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභය (ROAA) සහ සාමාන්‍ය ස්කන්ධය මත ප්‍රතිලාභය (ROAE) පෙර වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් සියයට 0.2 සහ සියයට 4.1 කින් අඩු වී තිබුණි.

තවද, සීමාසහිත ෆිච් රේටින්ග්ස් ලංකා ආයතනය විසින් දේශීය බැංකු අංශයේ, බැංකුවේ ජාතික දිගු කාලීන ශ්‍රේණිගත කිරීම "ස්ථාවර දෘෂ්ටියක් සහිත" AA + (LKA) "ලෙස යළිත් තහවුරු කර ඇති අතර, සීමාසහිත ICRA Lanka ආයතනයෙහි ණය ගුණාත්මක ශ්‍රේණිගත කිරීම අනුව 2018

වර්ෂය තුළ "(ස්ථාවර) දෘෂ්ටියක් සහිත AAA" තත්වය ප්‍රදානය කර ඇත.

සමූහය

2018 වර්ෂය සඳහා සමූහයේ වාර්තාගත ලාභය රු.බිලියන 42.2 ක් වූ අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 10.6 ක වැඩිවීමකි. සමූහයේ මුළු වත්කම් පදනම රු. බිලියන 2,313 ක් දක්වා වැඩි වී තිබුණු අතර එය ඉකුත් වර්ෂය අවසානය හා සැසඳීමේදී සියයට 15.7 ක වර්ධනයක් පෙන්නුම් කරයි. 2017 වර්ෂය හා සසඳන විට දළ ණය සහ අත්තිකාරම් සහ මුළු තැන්පතු පිළිවෙලින් සියයට 22.3 සහ 13.9 කින් වැඩි වී තිබුණු අතර අක්‍රිය ණය අනුපාතය සියයට 1.3 ක අනුපාතයකින් පවත්වා ගැනීමට සමූහයට හැකි විය. 2018 වර්ෂය තුළදී සමූහය පාරිභෝගික ණය සහ අත්තිකාරම් රු. ට්‍රිලියන 1 ක සන්ධිස්ථානය පසු කර තිබුණි.

බලපත්‍රලාභී බැංකුවල නියාමන අවශ්‍යතාවයන් සඳහා පළමු පෙළ I (මධ්‍ය) ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය (CAR) සියයට 5 ට නොඅඩු හා සමස්ත CAR සියයට 10 ට නොඅඩු ප්‍රමාණයක් පවත්වා ගෙන යා යුතුය. 2018 දෙසැම්බර් මාසය අවසාන වන විට බැංකුවේ පළමු පෙළ සියයට 10.9 ක සිට 10.4 ක් දක්වා පහත වැටී තිබුණු අතර ඉකුත් වර්ෂය හා සැසඳමේදී සමස්ත CAR සියයට 14.5 සිට 14.6 දක්වා වැඩි වී තිබුණි.

මහජන බැංකුව

රජයට අයත් බැංකුවක් ලෙස 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකුවක් වශයෙන් මහජන බැංකුව සංස්ථාපනය කර තිබුණි. පනතේ 4 වන වගන්තිය හා සංශෝධන අනුව බැංකුවේ අරමුණු වනුයේ ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරය, ග්‍රාමීය බැංකුකරණය, කෘෂිකර්මය සහ කර්මාන්ත සංවර්ධනය කිරීම හා සහාය වීම සහ වාණිජ බැංකු, උකස් තැරැව්කරු සහ වෙළඳ බැංකු ලෙස ව්‍යාපාරය පවත්වාගෙන යාම යි.

මහජන බැංකුව 2018 වර්ෂය අවසාන වන විට දිවයින පුරා ශාඛා 738 ක් සමඟ ක්‍රියාත්මක වේ. ඊට අමතරව, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 256 ක්, මුදල් තැන්පතු යන්ත්‍ර 111 ක්, කියොස්ක් 97 ක්, පූර්ණ ස්වයංක්‍රීය ස්වයං බැංකුකරණ ඒකක 108 ක් සහ සේවා මධ්‍යස්ථාන 2 ක් වසර තුළ ස්ථාපනය කර ඇත. බැංකුවේ මුළු තැන්පතු පදනම වසර තුළදී රු. බිලියන 179 ක් හෙවත් සියයට 14.4 කින් පුළුල් කර 2018 වර්ෂය අවසන් වන විට රු. බිලියන 1,423 ක් දක්වා වර්ධනය වී ඇත.

2018 දෙසැම්බර් මාසය අවසන් වන විට බැංකුවේ මුළු වත්කම් පදනම රු. බිලියන 267.7 කින් හෙවත් සියයට 18.2 කින් පුළුල් කර රු. බිලියන 1,734.7 ක් ඉක්මවා තිබුණි. ප්‍රධාන වශයෙන් රු. බිලියන 253 ක අනෙකුත් ගනුදෙනුකරුවන්ට ණය සහ ලැබිය යුතු දෑ වැඩි වීම වත්කම් වැඩිවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. 2017 වර්ෂයේදී වාර්තා වූ සියයට 1.9 ට සාපේක්ෂව අක්‍රිය ණය අනුපාතය සියයට 2.5 ක් ලෙස සමාලෝචිත වර්ෂයේදී සටහන් වීමෙන් බැංකුවේ වත්කම්වල ගුණාත්මකභාවය පහත වැටී තිබුණි. රු. බිලියන 24.4 ක බදු ගෙවීමට පෙර ලාභය බැංකුව වාර්තා කළ අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 5.8 ක අඩුවීමක් වී තිබුණි. කෙසේ වෙතත්, බැංකුවේ ශුද්ධ පොලී ආදායම 2017 වර්ෂයට සාපේක්ෂව රු. බිලියන 9.6 කින් හෙවත් සියයට 19.1 කින් වැඩි වී තිබුණි.

බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාත ඉහළ යන ප්‍රවණතාවයක් පෙන්නුම් කළ අතර අවම නියාමන අවශ්‍යතාවයන්ට වඩා ඉහළ මට්ටමක පැවතුණි. 2018 වර්ෂය අවසානයේදී

මූලික ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය සහ සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය පිළිවෙලින් සියයට 11.02 ක් (අවම වශයෙන් සියයට 8.875) සහ 14.47 ක් (අවම වශයෙන් සියයට 12.875) විය.

ජාතික ඉතිරිකිරීමේ බැංකුව

ජාතික ඉතිරිකිරීමේ බැංකුව 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතින් රජය සතු බැංකුවක් ලෙස ශ්‍රී ලංකාවේ ස්ථාපිත කර තිබුණි. 1988 අංක 36 දරන බැංකු පනත ප්‍රකාරව බලපත්‍රලාභී විශේෂ බැංකුවක තත්ත්වය පිරිනමා තිබුණි. පනතේ 2 (අ) වගන්තිය හා එයට අදාළ සංශෝධන ප්‍රකාරව, බැංකුවේ අරමුණ ශ්‍රී ලංකාවේ ජනතාව අතර ඉතිරිකිරීම් ප්‍රවර්ධනය, විශේෂයෙන් සීමිත අර්ථයෙන් ගත් කළ ඔවුන් අතර ඉතිරිකිරීම් පිළිබඳ ලාභදායි අයෝජන බලමුළු ගැන්වීමයි.

2018 වර්ෂය තුළදී ජාතික ඉතිරිකිරීමේ බැංකුව නව ශාඛාවන් 2 ක් පිහිටුවන ලද අතර ඒ අනුව, 2018 වර්ෂය අවසානයට මුළු ශාඛා සංඛ්‍යාව 255 ක් විය. වර්ෂය ඇතුළත බැංකුවේ මුළු තැන්පතු පදනම රු.බිලියන 102 කින් හෙවත් සියයට 14 කින් පුළුල් වී ඇති අතර 2018 වර්ෂය අවසානයට රු. බිලියන 840 ට ළඟා වී ඇත.

වර්ෂය තුළදී බැංකුවේ මුළු වත්කම් පදනම රු.බිලියන 27 ක් හෙවත් සියයට 3 ක් දක්වා පුළුල් වී තිබුණු අතර 2018 දෙසැම්බර් මාසය අවසාන වන විට එය රු.බිලියන 1,037 කට ළඟා වී තිබුණි. ප්‍රධාන වශයෙන් රු.බිලියන 49 ක් දක්වා ණය හා අත්තිකාරම් වැඩිකිරීම වත්කම් වැඩිවීම කෙරෙහි බලපා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී සියයට 14 ක තැන්පතු වර්ධනය මූලික වශයෙන් අරමුදල් සැපයීම කෙරෙහි බලපා තිබුණි. අක්‍රීය ණය අනුපාතය සියයට 1.34 ලෙස සටහන් වූ අතර වර්ෂය තුළ බැංකුවේ වත්කම්වල ගුණාත්මකභාවය 2017 දී වාර්තා වූ සියයට 1.44 ට සාපේක්ෂව වර්ධනය වී තිබුණි.

බැංකුවේ බදු පෙර ලාභය රු.බිලියන 8 ක් ලෙස වාර්තා වී තිබුණත්, ඉකුත් වර්ෂය හා සැසඳමේදී එය සියයට 44 ක අඩුවීමක් වී තිබුණි. ශුද්ධ පොලී ආදායම, වෙළඳාමෙන් වන ශුද්ධ ලාභය, ශුද්ධ මෙහෙයුම් ආදායම අඩුවීම සහ සේවක වියදම් වැඩිවීම මූලා ප්‍රතිඵලය පිරිහීමට බලපෑ ප්‍රධාන හේතු විය.

බැංකුවේ ශුද්ධ පොලී ආදායම ඉකුත් වර්ෂය හා සැසඳීමේ දී රු.මිලියන 249 කින් හෙවත් සියයට 1 කින් අඩු වී තිබුණ අතර, 2018 වර්ෂයේ මාස නවයක කාලයට අදාළ කල්පිත බද්ද නොසැලකීම සහ ස්ථාවර තැන්පතු පොලී අනුපාත ඉහළ යාම, තැන්පතු පිරිවැය ඉහළ යාමට බලපෑ ප්‍රධාන හේතු විය. බැංකුවේ රජයේ සුරකුම් කළඹේ සහ ස්කන්ධ කොටස්වල සාධාරණ අගය අඩුවෙමින් පැවතීම හේතුවෙන් වෙළඳාමෙන් වූ ශුද්ධ ලාභය රු. මිලියන 1,914 කින් හෙවත් සියයට 159 කින් අඩුවී තිබුණි. 2018 වර්ෂය සඳහා ජාතික ඉතිරිකිරිමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගම (ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ පූර්ණ හිමිකාරිත්වය සහිත පරිපාලිත ආයනයකි.) විසින් ලාභාංශ ප්‍රකාශයට පත් නොකිරීම හේතුවෙන් ශුද්ධ මෙහෙයුම් ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 630 කින් හෙවත් සියයට 37 කින් අඩු වී තිබුණි. සාමූහික ගිවිසුමට අනුව 2018 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි සේවකයින්ට ලබා දී ඇති වැටුප් වැඩිවීම් සහ 2018 වර්ෂයේ VI සහ VII ශ්‍රේණිවල ඇතැම් කොන්ත්‍රාත් පදනම් සේවකයින් ස්ථිර සේවක මණ්ඩලයට අන්තර්ග්‍රහණය කිරීම හේතුවෙන් බැංකුවේ සේවක වියදම් රු. මිලියන 2,376 කින් හෙවත් සියයට 35 කින් වැඩි වී තිබුණි.

බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාත අවම නියාමන අවශ්‍යතාවයන්ට වඩා ඉහළ අගයක් ගෙන තිබුණි. මූලික ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය සහ සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය පිළිවෙලින් සියයට 13.3 ක් (අවමය සියයට 10) සහ සියයට 16.1 ක් (අවමය සියයට 14) විය. බලපත්‍රලත් විශේෂිත බැංකු අංශයට සාපේක්ෂව බැංකුවේ තැන්පතු පදනම් කරගත් වෙළඳපල කොටස සියයට 1.8 කින් අඩු වී තිබුණි.
රජයේ (Sovereign) දිගුකාලීන විදේශ මුදල් නිකුත්කිරීමේ ශ්‍රේණිගතකිරීම 2018 දෙසැම්බර් 3 වනදින සිට ස්ථාවර දැක්මක් සහිතව "B+" සිට "B" දක්වා පහත හෙළනු ලැබීමෙන් පසුව ශ්‍රී ලංකාවේ ජාතික ශ්‍රේණිගත කිරීමේ පරිමාණය නැවත ගණනය කිරීමෙන් අනතුරුව, 2019 පෙබරවාරි මාසයේ දී ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ජාතික දිගු කාලීන ශ්‍රේණිගත කිරීම AAA (lka) සිට 'AA + (lka)' දක්වා සංශෝධනය කර ඇත. කෙසේවෙතත්, 2019 ජුනි මස සීමාසහිත ICRA ලංකා ආයතනය විසින් බැංකුව වෙත AAA තත්වය ස්ථාවර දෘෂ්ටියක් සහිතව ලබා දී ඇත.

බැංකුවේ 2017 වාර්ෂික වාර්තාවට සම්මාන 8 ක් ලැබී ඇත. එනම් "රිදී සම්මානය - රාජ්‍ය බැංකු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය ", "වඩාත්ම වැඩිදියුනු කළ ඒකාබද්ධ වාර්තා හොඳම 10 දෙනා අතරින් ඉහල වාර්තාව - CMA ශ්‍රී ලංකා ආයතනය , "ලෝකඩ සම්මානය ලිඛිත පෙළ ඉතිරිකිරීම් සහ ණය - ARC සම්මාන තරගය" , "ලෝකඩ සම්මානය- අභ්‍යන්තර නිර්මාණ- ඉතිරිකිරීම් සහ ණය- ARC සම්මාන තරගය "," ලෝකඩ සම්මානය- වෙළඳ නොවන වාර්ෂික වාර්තා - ඉතිරිකිරීම් සහ ණය- ARC සම්මාන තරගය" සහ " රිදී සම්මානය- ආවරණ ඡායාරූප නිර්මාණ -ඉතිරිකිරීම් සහ ණය- ARC සම්මාන තරගය" වේ.

LK ඩොමේන් රෙජිස්ට්‍රි විසින් සංවිධානය කරන ලද the best web.lk 2018 තරඟයේදී "වඩාත් ජනප්‍රිය ආයතනික වෙබ් අඩවි සම්මානය" සහ මූල්‍ය ක්ෂේත්‍රයේ හොඳම වෙබ් අඩවි කාණ්ඩය යටතේ 2018 වසර සඳහා ඩිජිටල් විශිෂ්ටත්වය සඳහා "SLT Zero One" " අනුශූරතාවය" සම්මානයෙන් බැංකුව පිදුම් ලැබිය. "

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතිය හා එයට අදාල සංශෝධන යටතේ රාජ්‍ය උකස් හා අයෝජන බැංකුව ස්ථාපිත කර ඇත. පනතේ 2 වන වගන්තිය පරිදි, පනතේ විධිවිධානවලට අනුකූලව මූල්‍ය හා වෙනත් ආධාර සැපයීමෙන් කෘෂිකාර්මික, කර්මාන්ත හා නිවාස සංවර්ධනයට සහායවීම බැංකුවේ කාර්ය වන්නේය.

2018 වර්ෂය අවසාන වන විට බැංකුවේ මුළු තැන්පතු ප්‍රමාණය රු.බිලියන 34 ඉක්මවා තිබුණු අතර 2017 වර්ෂය හා සැසඳීමේදී එය සියයට 1.9 ක වැඩිවීමකි. 2018 වර්ෂයේදී බැංකුවේ පැවැති මුළු වත්කම් ප්‍රමාණය 2017 වර්ෂයට සාපේක්ෂව රු.බිලියන 0.6 කින් හෙවත් සියයට 1.4 කින් ප්‍රසාරණය වී තිබුණු අතර එය වර්ෂය අවසාන වන විට රු.බිලියන 43 ක් ඉක්මවා තිබුණි. ගනුදෙනුකරුවන්ට ලබා දුන් ණය හා ලැබිය යුතු දෑ රු.බිලියන 1.2 කින් වැඩිවීම ඒ සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

බැංකුව විසින් රු.මිලියන 480 ක බදු පෙර ලාභයක් වාර්තා කර තිබූ අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 27 ක වැඩිවීමකි. 2017 වර්ෂය හා සැසඳීමේදී බැංකුවේ ශුද්ධ පොළී ආදායම රු. මිලියන 304 කින් හෙවත් සියයට 19 කින් වැඩි වී තිබුණි.

පසුගිය වර්ෂය සමග සැසඳීමේදී ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය සියයට 2.05 කින් පහත වැටී තිබුණු අතර, 2018 දෙසැම්බර් 31 දින වන එය සියයට 22.24 ක් වී තිබුණි. අක්‍රීය

ණය අනුපාතය ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී සියයට 1 කින් පහත වැටී තිබුණු අතර 2018 දෙසැම්බර් 31 දින වන විට එය සියයට 22 ක් වී තිබුණි. සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී මුළු තැන්පතු රු.මිලියන 652 කින් වැඩි වී තිබුණු අතර 2018 දෙසැම්බර් 31 දින වන විට එය රු.මිලියන 34,272 ක් වී තිබුණි.

නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

1997 අංක 7 දරන නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකු පනත (2003 අංක 15 හා 2011 අංක 45 දරන පනත් වලින් සංශෝධිත) යටතේ නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව සංස්ථාපනය කර තිබුණි. 1988 අංක 30 දරන බැංකු පනත මඟින් බලපත්‍රලාභී විශේෂ බැංකුවක් බවට පත් විය. පනතේ අංක 12(අ) හා සංශෝධනවලට අනුව බැංකුවේ අරමුණු වනුයේ, සියළුම ශ්‍රී ලාංකිකයන්ගේ නිවාස සිහිනය සැබෑ කර ගැනීමට නිවාස ආශ්‍රිත මූල්‍ය සම්පාදනයේ අවිවාදාත්මක වෙළඳපොල නායකයා බවට පත් වීමය.

2018 වර්ෂයේදී නව ශාඛා විවෘත කිරීමක් සිදු නොවූ අතර, මුළු ශාඛා ජාලය එම වර්ෂය අවසන් වන විට 39 ක් විය. 2017 වර්ෂයේදී බැංකුවේ ණය කළඹ රු.බිලියන 34.9 ක් වූ අතර බැංකුවේ ණය කළඹ සියයට 8.4 කින් වර්ධනය වී 2018 වර්ෂය අවසාන විට එය රු.බිලියන 37.9 ක් වී තිබුණි. එහෙයින් බැංකුවේ පොළී ආදායම ඉකුත් වර්ෂයේ පැවති රු.බිලියන 6.61 ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රු.බිලියන 6.68 දක්වා සියයට 1 කින් වර්ධනය වී තිබුණි. බැංකුවේ තැන්පතු පදනම, 2017 වර්ෂය අවසාන වන විට පැවති රු.බිලියන 36.65 සිට සියයට 1 කින් වර්ධනය වී 2018 වර්ෂය අවසාන වන විට රු.බිලියන 37.02 ක් බවට පත් වී තිබුණි. අඩු ඵලදාවක් සහිත ආයෝජන කළඹ සහ ද්‍රවශීල වත්කම් අඩු කිරීමේ උපායමාර්ගික තීරණය හේතුවෙන් බැංකුවේ සමස්ථ වත්කම් පදනම 2017 වර්ෂය අවසාන විට රු.බිලියන 49.72 සිට 2018 දී රු.බිලියන 49.28 දක්වා රු.මිලියන 440 කින් පහත වැටී තිබුණි. 2017 වර්ෂයේදී අක්‍රීය ණය සියයට 18.2 වූ අතර, එය 2018 වර්ෂයේදී සියයට 20.46 දක්වා වැඩි වී තිබුණි.

2018 වර්ෂය සඳහා බැංකුවේ බදු පෙර ලාභය පෙර වර්ෂයට සාපේක්ෂව 6.79 ක වැඩිවීමක් වාර්තා කරමින් රු.මිලියන 629 ක් බවට පත් වී තිබුණි. එසේම, ශුද්ධ ණය පොළී ආදායම 2017 වර්ෂය හා සසඳන විට රු.මිලියන 367 කින් එනම් සියයට 19.59 කින් වර්ධනය වී තිබුණි.

ප්‍රධාන ප්‍රාග්ධන අනුපාතය (Tier 1) අවම ව්‍යවස්ථාපිත අවශ්‍යතාවය වන සියයට 7.87 ඉක්මවූ අතර එය සියයට 16.41 විය. කෙසේ වුවද, 2014 ජනවාරි 17 වන දින මූල්‍ය අංශයේ ආයතන ඒකාබද්ධ කිරීමට අදාළ ප්‍රධාන සැලැසුමට අනුව නිකුත් කරන ලද ශ්‍රී ලංකා බැංකු මහ පෙන්වීම් අංක 02/17/402/0073/002 යටතේ මූලික ප්‍රාග්ධනය 2019 ජනවාරි 01 වන විට රු.මිලියන 5,000 ක් විය යුතුය. බාසල් III මාර්ගෝපදේශයට අනුකූල වීම සඳහා තිබිය යුතු ප්‍රධාන ප්‍රාග්ධනය සඳහා යෝජිත දිගුකාලීන ප්‍රාග්ධන මූලාශ්‍රයට රජයේ අනුමැතිය ලබා ගැනීම සඳහා වන ක්‍රියාපටිපාටිය සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දී ඇති කාලසීමාව තවදුරටත් මාස 06 කින් දීර්ඝ කර තිබුණි.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකු 06 ක් ඒකාබද්ධ කිරීම මඟින් 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පණත යටතේ 2010 දී රජයට අයත් බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් ලෙස ස්ථාපිත කරන ලදී. පනතේ 6 වන වගන්තිය පරිදි බැංකුවේ අරමුණ වනුයේ ප්‍රධාන වශයෙන් සූක්ෂම මූල්‍ය ආයතන සහ කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහා මූල්‍යමය සහාය ලබාදෙමින් සංවර්ධනය, කෘෂිකර්මය, කර්මාන්ත, වෙළෙඳ, වාණිජ, පශු සම්පත් සහ කාන්තා සවිබලගැන්වීම, ධීවර කටයුතු ප්‍රවර්ධනය කිරීම මඟින් ශ්‍රී ලංකාවේ සමස්ත කළාපීය ආර්ථික සංවර්ධනය සඳහා පහසුකම් සැලසීමයි.

2018 වර්ෂය අවසානයේදී බැංකුවේ ශාඛා 265 ක් විය. බැංකුවේ මුළු තැන්පතු පදනම රු.බිලියන 1.7 ක් හෙවත් සියයට 1.2 ක ප්‍රතිශතයකින් වර්ෂය තුළදී ව්‍යාප්ත වූ අතර 2018 වර්ෂය අවසානය වන විට රු.බිලියන 141.6 ක් දක්වා ළඟාවිය. බැංකුවේ මුළු වත්කම් පදනම රු.බිලියන 7.7 ක් හෙවත් සියයට 4.5 ක ප්‍රතිශතයකින් වර්ෂය තුළදී ව්‍යාප්ත වී 2018 දෙසැම්බර් මාසය අවසානය වන විට රු.බිලියන 176.9 ඉක්මවා තිබුණි. ගනුදෙනුකරුවන්ගෙන් අයවිය යුතු ණය හා ලැබීම් රු.බිලියන 5.9 කින් වැඩිවීම වත්කම්වල වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වුවද, ණය ගුණාත්මකභාවය වර්ෂය තුළදී අඩු වී ඇති අතර 2017 වර්ෂයේ වාර්තා වූ සියයට 3.27 ක් වූ දළ අක්‍රීය ණය අනුපාතය 2018 වර්ෂයේදී සියයට 5.40 ක් දක්වා වැඩි වී තිබුණි. බැංකුවේ බදු පෙර ලාභය රු.බිලියන 2.1 ක් වූ අතර එය පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 4 ක අඩුවීමක් වී තිබුණි. කෙසේ වුවද, බැංකුවේ ශුද්ධ පොළී ආදායම් 2017 වර්ෂය හා සැසඳීමේදී රු.බිලියන 2.2 කින් හෙවත් සියයට 23 කින් වැඩි වී තිබුණි.

2018 දෙසැම්බර් 31 දිනට අවම ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතයක් බැංකුව විසින් පවත්වා ගෙන ඇති අතර ඒ අනුව, පළමු පෙළ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය සහ මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය පිළිවෙළින් සියයට 11.58 (අවමය 7.875) ක් සහ සියයට 13.61 (අවමය 11.875) ක් විය. තවද, 2016 අයවැය යෝජනාවක් අනුව ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමඟ ඒකාබද්ධ කිරීමට යෝජනා වී තිබූ අතර, ඒ අනුව ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ සියයට 100ක කොටස් අයිතිය රු.බිලියන 4.176 ක ගැනුම් ප්‍රතිෂ්ඨාවකට එකඟ වූ අතර 2018 දෙසැම්බර් 31 දින සිට බලපැවැත්වෙන පරිදි මහා භාණ්ඩාගාරයට නව කොටස් නිකුතුවක් මඟින් පියවන ලදී.

ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව

ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව, ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජයීය සංවර්ධන ක්‍රියාදාමයේ දීප්තිමත්ම නියමුවා බවට පත්වීම යන දැක්මක් සහිතව සම්පූර්ණ අයිතිය රජය සතු සමාගම් පනත යටතේ පිහිටවූ සීමිත පොදු සමාගමක් වන අතර 1988 අංක 30 දරන බැංකු පනත යටතේ ස්ථාපිත බලපත්‍ර ලාභී විශේෂිත බැංකුවකි. 2016 අයවැය යෝජනාවක් අනුව ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමඟ ඒකාබද්ධ කිරීමට යෝජනා වී තිබූ අතර, ඒ අනුව ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ සියයට 100 ක කොටස් අයිතිය රු.බිලියන 4.176 ක ගැනුම් ප්‍රතිෂ්ඨාවකට එකඟ වූ අතර 2018 දෙසැම්බර් 31 දින සිට බලපැවැත්වෙන පරිදි මහා භාණ්ඩාගාරයට නව කොටස් නිකුතුවක් මඟින් පියවන ලදී.

2018 වර්ෂය අවසානයේදී බැංකුවේ ශාඛා 8 ක් විය. වර්ෂය තුළදී බැංකුවේ මුළු තැන්පතු පදනම රු.මිලියන 77.7 කින් හෙවත් සියයට 19 ක ප්‍රතිශතයකින් අඩු වී තිබුණි. බැංකුවේ මුළු වත්කම් පදනම රු.මිලියන 244 ක් හෙවත් සියයට 2.6 ක ප්‍රතිශතයකින් ව්‍යාප්ත වී තිබුණි. 2018 වර්ෂය අවසානය වන විට ගනුදෙනුකරුවන්ගෙන් අයවිය යුතු ණය හා ලැබීම් රු.මිලියන 404 ක් හෙවත් සියයට 12.9 කින් අඩු වී ඇත. තවද, ණය ගුණාත්මකභාවය වර්ෂය තුළදී අඩු වී තිබුණු අතර 2017 වර්ෂයේ වාර්තා වූ සියයට 37.2 ක් වූ දළ අක්‍රීය ණය අනුපාතය 2018 වර්ෂයේදී සියයට 46.5 ක් දක්වා වැඩිවී තිබුණි. බැංකුවේ බදු පෙර ලාභය 2018 වර්ෂය සඳහා රු.මිලියන 297.5 ක් වූ අතර එය 2017 වර්ෂයේදී රු.මිලියන 298.1 ක් වී තිබුණි.

බැංකුව 2018 දෙසැම්බර් 31 දිනට අවම ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතයන් ඉක්මවා පවත්වා ගෙන තිබුණු අතර ඒ අනුව, පළමු පෙළ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය සහ මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය පිළිවෙළින් සියයට 95.09 (අවමය 7.875) ක් සහ සියයට 95.76 (අවමය 11.875) ක් වී තිබුණි.

සීමාසහිත ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව

සීමාසහිත ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව (SLSBL) 2006 ජූලි මාසයේදී බැංකු පනත යටතේ ආරම්භ කරන ලද අතර සමාගම් පනතේ විධිවිධාන යටතේ සංස්ථාගත කරන ලද්දේ ප්‍රධාන වශයෙන් අසාර්ථක වූ ප්‍රමුඛ ඉතිරිකිරීමේ සහ සංවර්ධන බැංකුවේ (PSDB) තැන්පත්කරුවන්ට සහන සැලසීමේ අරමුණිනි. ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව 2008 දී රජය සතු බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් ලෙස සිය ව්‍යාපාරය ආරම්භ කර තිබුණි. බැංකුව 2010 දී ජාතික සංවර්ධන භාර අරමුදල් සමාගම (NDTF) සමඟ ඒකාබද්ධ විය. බැංකුවේ ප්‍රධාන මෙහෙයුම් අතර තැන්පතු ඒකරාශීකිරීම, ණය ප්‍රදානය, කල්බදු, කුලීපිට ගැනුම් සහ උකස් අත්තිකාරම් ඇතුළත් වේ.

බැංකුවේ මුළු තැන්පතු පදනම වර්ෂය තුළ රු. මිලියන 11 කින් හෙවත් සියයට 1 කින් පුළුල් වී 2018 වර්ෂය අවසන් වන විට රු.මිලියන 1,089 ක් දක්වා වැඩි වී තිබුණි .සමාලෝචිත වර්ෂයේ බැංකුවේ ණය සහ අත්තිකාරම් රු.මිලියන 272 කින් හෙවත් සියයට 6 කින් අඩු වූ අතර ප්‍රතිමිලදී ගැනුම් සහ ස්ථාවර තැන්පතු ආයෝජන පසුගිය වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 95 කින් හෙවත් සියයට 2 කින් වැඩි වී තිබුණි.

බැංකුවේ බදු පෙර ලාභය රු.මිලියන 488 ක් වාර්තා කළ අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 19 කින් අඩු වී තිබුණි. අනෙකුත් මෙහෙයුම් ආදායම අඩු වීම, ඉහළ සේවක වියදම් සහ අනෙකුත් වියදම් සහ එකතු කළ අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු වැඩිවීම සහ 2018 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන පරිදි ආදායම් බද්දට යටත් වීම මෙම අඩුවීමට ප්‍රධාන හේතු වී තිබුණි.

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ප්‍රමුඛ ඉතිරිකිරීමේ සහ සංවර්ධන බැංකුවේ (PSDB) අක්‍රීය ගනුදෙනුකරුවන් හැර බැංකුවේ දළ අක්‍රීය අත්තිකාරම් අනුපාතය සියයට 11 ක් වූ අතර එය බලපත්‍රලාභී විශේෂිත බැංකු අංශයේ සාමාන්‍ය අනුපාතය වන සියයට 4.8 ට වඩා ඉහළ අගයක් ගෙන තිබුණි.

2018 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය සියයට 89.9 ක් වූ අතර අවම ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයට සියයට 12.5 ක් වී තිබුණි.

ප්‍රධාන විගණන නිරීක්ෂණ

ශ්‍රී ලංකා මහ බැංකුව

- මුදල් නීති පනතේ 38 සහ 41 වැනි වගන්ති හා බැංකුවේ ලාභ බෙදා හැරීමේ ප්‍රතිපත්තියට අනුව තීරණය කරන පරිදි බෙදා හැරිය හැකි ලාභයක්, සමාලෝචිත වර්ෂය සඳහා නොතිබුණි. ඒ අනුව ඒකාබද්ධ අරමුදලට කිසිදු මුදලක් බෙදා හැරීමට නොහැකි වී තිබුණි. කෙසේ වෙතත්, ඉකුත් වර්ෂයේදී බෙදා හැරිය හැකි ලාභයෙන් ඒකාබද්ධ අරමුදලට රු. බිලියන 15 ක් බෙදා හැර තිබුණි.

- ආර්ථිකයේ වැඩෙන ඉල්ලුමට සරිලන පරිදි අභ්‍යන්තර හා බාහිර කම්පනයන් සඳහා ඔරොත්තු දීමේ හැකියාව වැඩි කරන ශක්තිමත් බැංකු / බැංකු නොවන මූල්‍ය ආයතන අංශයක් සංවර්ධනය කිරීමේ අරමුණින් 2014 ජනවාරි 17 වන දින මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීම සඳහා බැංකුව විසින් ප්‍රධාන සැලැස්ම එළිදැක්විණි. ඒ අනුව, 2018 මාර්තු 31 වැන දිනට රු. මිලියන 74 ක් වැය කරමින් බැංකු, මුදල් සමාගම් හා කල්බදු සමාගම් ඇතුළු ආයතන 19 ක් සමඟ වූ ඒකාබද්ධ කිරීමේ සැලැසුම් සම්පූර්ණ කර තිබුණි. කෙසේ වෙතත්, 2019 මාර්තු මාසය අවසන් වන විටත් ආයතන 14 ක් සමඟ වූ ඒකාබද්ධ කිරීමේ සැලැසුම් සම්පූර්ණ කර නොතිබුණු අතර මේ සම්බන්ධයෙන් රු.මිලියන 53 ක මුදලක් බැංකුව විසින් වැය කර තිබුණි. ඉහත වියදම් වලට අමතරව, ඉහත ඒකාබද්ධ කිරීමේ සැලැසුම්වල ඇතුළත් නොවූ ආයතන 20 ක් සම්බන්ධව තොරතුරු ලියවිල්ල, නිසි විශ්ලේෂණ හා තක්සේරු වාර්තා පිළියෙල කිරීම සහ අනෙකුත් කරණා සඳහා බැංකුව විසින් රු.මිලියන 59 ක් වැය කර තිබුණි.

- 2000 අංක 56 දරන මූල්‍ය කල්බදු පනතට අනුව, බදු දීමනාකරුගේ, බදු ගැණුම්කරුගේ සහ සැපයුම්කරුගේ කාර්යභාරය 11 සිට 31 දක්වා වගන්ති වලින් විස්තර කර ඇත. 11 වගන්තිය අනුව, මූල්‍ය කල්බදු යටතේ බදු ගැණුම්කරුට ලබා දී ඇති උපකරණවල නිරවුල් හා සාමකාමී සන්තකය බදු ගැණුම්කරුට ඇති එකම අයිතිය වේ. 15 වන වගන්තිය අනුව, මූල්‍ය කල්බදු කාල සීමාව ඉකුත්වීමෙන් පසු, බදු ගැණුම්කරු විසින් බදු දීමනාකරු වෙත උපකරණය ආපසු භාරදීම, සාධාරණ ගෙවීයාමකට සහ කල්බදු මූල්‍යකරණයේ පාර්ශවකරුවන් විසින් එකඟවන ලද සුළු වශයෙන් වූ වෙනස් කිරීම් කිසිවකට යටත්ව, එය බදු ගැනුම්කරුට භාරදුන් තත්ත්වයෙන්ම සිදු කළ යුතුය. 20 වන වගන්තිය අනුව, බදු ගැනුම්කරුගේ කිසියම් පැහැර හැරීමක දී, සපයන ලද උපකරණයේ සන්තකය ආපසු ලබාගැනීමට සහ කල්බදු මූල්‍යකරණයේ නියම හා කොන්දේසිවලට අනුකූලව බදු ගැනුම්කරු එහි විධිවිධාන අනුව කටයුතු කර ඇත්නම්, බදු දීමනාකරු විසින් දරනු ලැබිය හැකිව තිබුණු තත්වයකට, බදු දීමනාකරු පත් කිරීමට අවශ්‍ය අලාභ අයකර ගැනීමට බදු දීමනාකරුට අයිතිය ඇත. පනතේ ඇතුළත් විධිවිධානවලට අනුව, මූල්‍ය කල්බදු යටතේ නියම කර ඇති පරිදි බදු ගැනුම්කරු විසින් නියමිත මුදල් ගෙවා තිබුණද, නොතිබුණද, උපකරණයේ සන්තකය, අයකර ගත් මුදල් සහ අයකර ගත හැකි කිසියම් අලාභ වේ නම් එයද බදු දීමනාකරුට හිමි වේ. එමෙන්ම මූල්‍ය කල්බදු යටතේ වන සමස්ත වගකීම්වලට බදු ගැනුම්කරු යටත් වේ. එබැවින්, පනතේ කිසියම් සංශෝධනයක් කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගැනීම සඳහා පනත සමාලෝචනය කිරීම අවශ්‍ය විය හැකිය.

- ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර කරගෙන යන සමාගම්වලට බලපත්‍ර නිකුත් කිරීම, නියාමනය සහ අධීක්ෂණය, 2016 ජුලි 15

දින සිට බලපැවැත්වෙන පරිදි 2016 අංක 06 දරන ක්ෂුද්‍ර මූල්‍ය පනත යටතේ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් සිදු කරනු ලබයි. තැන්පතු භාර ගන්නා සහ ප්‍රධාන වශයෙන් අඩු ආදායම්ලාභීන්ට හා ක්ෂුද්‍ර ව්‍යවසායයන්ට මූල්‍ය සේවා සපයන සමාගම් (ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර) මෙම පනත යටතේ බලපත්‍රයක් ලබා ගත යුතුය. ඒ අනුව, මෙම පනත බලපැවැත්වෙන දින සිට 2019 මැයි 09 දක්වා ක්ෂුද්‍ර මූල්‍ය කටයුතු කරගෙන යාම සඳහා සමාගම් දෙකක් පමණක් බලපත්‍ර ලබාගෙන තිබුණි. තැන්පතු භාර නොගන්නා නමුත් රට තුළ සිටින අඩු ආදායම්ලාභීන්ට හා ක්ෂුද්‍ර ව්‍යවසායයන්ට මූල්‍ය සේවා සපයන සමාගම් මෙම පනත යටතේ බලපත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය නොවේ. එබැවින් එම සමාගම්වලට, මෙම පනත යටතේ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් බලපත්‍ර නිකුත් කිරීම, නියාමනය හා අධීක්ෂණය නොකරනු ලබයි.

- බැංකුව විසින් එක් ප්‍රාථමික අලෙවිකරුවකුගේ කළමනාකාරිත්වය ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙත 2016 ජනවාරි 04 වැනි දින පවරන ලදි. ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනු වෙනුවෙන් ප්‍රමාණවත් පරිදි සුරැකුම්පත් වෙන් නොකිරීමෙන් ලැබිය යුතු පොලියද, ඇතුළත්ව 2016 ජනවාරි 04 දිනට ගනුදෙනුකරුවන්ට අයකර ගත නොහැකි ආයෝජන වටිනාකම රු. බිලියන 7.2 ක් විය. මුළු අයකර ගත නොහැකි වටිනාකමෙන් රු. බිලියන 2.1 ක්, අභ්‍යන්තර අරමුදල් හසුරුවන බැංකුවේ දෙපාර්තමේන්තු හතරට ආපසු අයකර ගත නොහැකි බව පෙන්නුම් කෙරුණි.

- ලංකාසෙට්ල් පද්ධතියේ මෙහෙයුම් සඳහා බැංකුව විසින් නිකුත් කරන ලද ලංකාසෙට්ල් පද්ධති නීති, අනුවාදය 2.1 (2013) හි වගන්ති අංක 2.2 අනුව ප්‍රාථමික අලෙවිකරුවෙකු අනුගමනය කළ යුතු නීති හා රෙගුලාසි උල්ලංඝනය කරන විටදී එම ප්‍රාථමික අලෙවිකරුට එරෙහිව දඩ මුදල් නියම කළ හැකිය. කෙසේ වෙතත්, බැංකුවට මෙම පද්ධති නීති බලාත්මක කිරීමට නොහැකිවීමෙන් ප්‍රාථමික අලෙවිකරුවන්ට එරෙහිව දඩ මුදල් පනවා නොතිබුණි. ගනුදෙනුකරුගේ යහපතට එරෙහිව කටයුතු කරන ප්‍රාථමික අලෙවිකරුවන්ට දඩ මුදල් පැනවීමට සුදුසු රාමුවක් සකස් කිරීම සඳහා 2015 සැප්තැම්බර් මාසයේදී මුදල් මණ්ඩලය විසින් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව වෙත උපදෙස් ලබා දී තිබුණි. කෙසේ වුවද, 2019 මාර්තු මාසය අවසන් වන විටත් එවැනි සුදුසු රාමුවක් සකස් කර නොතිබුණි.

ලංකා බැංකුව

ණය හා අත්තිකාරම්

- 2018 දෙසැම්බර් 31 දිනට බැංකුව විසින් ලබා දුන් දළ ණය සහ අත්තිකාරම් රු.මිලියන 1,510,534 ක් වූ අතර, එය ඉකුත් වර්ෂයේ ශේෂය වූ රු.මිලියන 1,219,914 හා සැසඳීමේදී සියයට 23.8 කින් වැඩි වී තිබුණි. එම වැඩිවීමට ප්‍රධාන හේතුව සමාලෝචිත වර්ෂය තුළ අයිරා ඉහළ යාමයි. ඉහත ශේෂයෙන් රු. මිලියන 1,136,530 ක් හෝ මුළු හිඟ මුදලින් සියයට 75 ක් කාලීන ණය, අයිරා සහ පුද්ගලික ණය වලින් සමන්විත විය. සියළු ණය සහ අයිරා වල වැඩිවන ප්‍රවණතාවයක් පෙන්නුම් කර ඇති අතර එය 2018 වර්ෂය තුළ සියයට 64 ක වර්ධනයක් පෙන්නුම් කරයි.

- 2017 වර්ෂය සඳහා වූ මුළු අක්‍රිය ණය සහ අත්තිකාරම් රු.මිලියන 34,261 ක් සමඟ සැසඳීමේදී 2018 දෙසැම්බර් 31 දිනට එය සියයට 57 කින් වැඩි වී රු.මිලියන 53,753 ක් වී තිබුණි. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී 2018 වර්ෂයේ බැංකුවේ අක්‍රිය ණය

අනුපාතය සියයට 2.9 ක සිට සියයට 3.6 ක් දක්වා වැඩි වී තිබුණි.

- තවද, ආයතනික, දෙවන ආයතනික ශාඛා සහ අක්වෙරළ බැංකු අංශය විසින් 2018 වර්ෂය අවසානයට රු.මිලියන 20,636 ක ඉහළ අක්‍රීය වටිනාකමක් වාර්තා කර තිබුණු අතර එය බැංකුවේ සමස්ථ අක්‍රීය ණය සහ අත්තිකාරම්වලින් සියයට 38 ක් වී තිබුණි. ඊට අමතරව, දෙවන ආයතනික අංශය විසින් රු.මිලියන 5,354 ක් වන මුළු අක්‍රීය අත්තිකාරම් මුදල පාලනය කරනු ලබයි.

- 2018 වර්ෂය අවසානයට ඉහළම අක්‍රීය ගනුදෙනුකරුවන් තිදෙනෙකු වාර්තා වී තිබූ අතර පිළිවෙලින් රු.මිලියන 2,738 ක්, රු.මිලියන 1,532.48 ක් සහ රු.මිලියන 1,455 ක් වූ අක්‍රීය ණය මුදල , බැංකුවේ සමස්ත අක්‍රීය ණය සහ අත්තිකාරම් වලින් සියයට 15 ක් වී තිබුණි.

ණය හා අත්තිකරම් කපා හැරීම

2018 වර්ෂයේදී කපා හරින ලද ණය මුදලේ මුළු ප්‍රාග්ධන කොටස රු.මිලියන 40 ක් වන අතර එය බැංකුවේ ගනුදෙනුකරුවන් 2,843 ක් නියෝජනය කරයි. ඉහත හිඟ මුදල් සඳහා පොලිය රු.මිලියන 53 ක් වී තිබුණි. ඒ අතරින් ණය මුදලේ ප්‍රාග්ධන කොටස රු.මිලියන 26 ක් සහ පොළිය රු.මිලියන 40 ක් පළාත් අයකරගැනීම් ඒකකයට සම්බන්ධව වූ අතර, ණය මුදලේ ප්‍රාග්ධන කොටස ප්‍රාග්ධනය රු.මිලියන 14.8 ක් හා පොලිය රු.මිලියන 12.5 ක් ආයතනික අයකරගැනීමේ ඒකකයට අදාළව විය.

මහජන බැංකුව

- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2008 මැයි 08 දිනැති මහ පෙන්වීම් අංක 4 (5) අනුව, එක් ගනුදෙනුකරුවකුට බහුවිධ ණය පහසුකම් ලබා දී ඇති විට, අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කර ඇති හිඟ මුදල මුළු ප්‍රමාණයෙන් සියයට 30 ඉක්මවන්නේ නම් එම ගනුදෙනුකරුට ලබා දී ඇති මුළු ණය පහසුකම් අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කළ යුතුය. එහෙත් එම උපදෙස් අනුව, ගනුදෙනුකරුවන් කිහිප දෙනෙකු අක්‍රීය ණය ලෙසවර්ගීකරණය කර නොතිබුණි.

- බැංකුව සමහර ආදායම් කාණ්ඩ සඳහා වැට් බදු එකතු කර නොතිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස බැංකුවට රු. 19,412,393 ක නිමවුම් බද්දක් ගෙවීමට සිදු විය. ගෙවිය යුතු වැට් බදු සමඟ ආදායම් ගිණුම් සිතියම්ගත කිරීම (Mapping) පරීක්ෂා කිරීම නිර්දේශ කරනු ලැබේ.

- බැංකු චක්‍රලේඛ අංක 614/2007 (4) ට අනුව, තාවකාලික අයිරා කිසිදු ප්‍රමාදයකින් තොරව අය කර ගත යුතුය. කෙසේ වෙතත්, තාවකාලික අයිරා පහසුකම් නැවත අයකර ගැනීමට ප්‍රමාද වූ අවස්ථා පැවතුණි.

- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2009 සැප්තැම්බර් 01 දිනැති මහ පෙන්වීම් අංක 03 (4.1 (xi)) ට අනුව සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ඉදිරිපස කාර්යාලයේ නියෝජිතයන් ඔවුන්ට පවරා ඇති ගනුදෙනු සීමාවන් ඉක්මවා නොයෙදන බව සහතික කිරීම සඳහා, කරනු ලබන සියලුම ගනුදෙනු අධීක්ෂණය කිරීමට තත්කාලීන අධීක්ෂණ පද්ධතියක් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. කෙසේ වෙතත්, බැංකුවේ භාණ්ඩාගාර සීමාවන් ෆින්කල් භාණ්ඩාගාර පද්ධතියට ඇතුළත් කර ඇති අතර බැංකුවේ ශක්තිමත් අධීක්ෂණ පද්ධතියක් නොමැති නිසා, නිරන්තර කාල පරාසයන්හිදී හෝ ඊළඟ දිනයේ දී අධීක්ෂණය සිදු කරනු ලැබේ.

ජාතික ඉතිරිකිරීමේ බැංකුව

- 2010 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා බැංකු අංශයේ සමස්ත තැන්පතු පදනම සියයට 228 කින් වර්ධනය වී තිබුණත්, එම

කාලය තුළ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ තැන්පතු පදනම් වර්ධනය සියයට 136 ක් පමණක් වී තිබුණි. එම නිසා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ වෙළඳපොළ කොටස 2010 වර්ෂයේදී සියයට 13.7 ක සිට 2018 වර්ෂයේදී සියයට 9.9 ක් දක්වා පිරිහී තිබුණි. බලපත්‍රලාභී විශේෂිත බැංකු අංශයට සාපේක්ෂව ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ වෙළඳපල කොටස ද 2010 වර්ෂයේදී සියයට 82.1 සිට 2018 වර්ෂයේදී සියයට 77.4 දක්වා පිරිහී තිබුණි.

- 2018 දෙසැම්බර් 31 දින වන විට වංචනික මුදල් ආපසු ගැනීම්වලින් බැංකුවට ලැබිය යුතු මුදල රු.මිලියන 110.5 ක් වන අතර ඉකුත් වර්ෂය හා සැසඳීමේදී එහි වැඩිවීම රු.මිලියන 15.7 ක් හෙවත් සියයට 16.6 ක් පෙන්නුම් කරයි. මෙම ලැබිය යුතු ශේෂය වැඩි කිරීමට ප්‍රධාන හේතුව 2018 වර්ෂයේදී ප්‍රධාන කාර්යාල ශාඛාවේ සිදු වූ වංචාවයි. ඉහත ශේෂයෙන් රු. මිලියන 85 ක් වර්ෂයකට වැඩි කාලයක් හිඟව පැවති අතර රු.මිලියන 29 ක් වර්ෂ පහකට වැඩි කාලයක් හිඟව පැවැතුණි.

- බැංකුවේ අනුමත මුළු සේවක සංඛ්‍යාව 5,406 ක් අතරින් මාණ්ඩලික සහකාර සහ කාර්යාල කාර්ය සහකාර තනතුරු සඳහා අනුමත කාර්ය මණ්ඩලය පිළිවෙලින් 2,066 ක් සහ 563 ක් විය. ඒ අනුව මුළු කාර්ය මණ්ඩලයෙන් සියයට 48.6 ක් එම තනතුරු සඳහා වෙන්කර තිබුණි. සුදුසුකම් ලත් අපේක්ෂකයින්ගෙන් ප්‍රසිද්ධියේ අයදුම්පත් කැඳවීමකින් තොරව අමාත්‍යාංශයේ හා කළමනාකාරිත්වය විසින් ඉදිරිපත් කර තිබුණු ලැයිස්තු භාවිතා කර ඉහත තනතුරු සඳහා බඳවා ගැනීම සිදු කර තිබුණි. එබැවින්, ශ්‍රී ලංකාවේ රැකියා වෙළඳපොලේ රැකියා අපේක්ෂා කරන සමස්ත ජනතාවටම එය අසාධාරණයක් වී තිබුණි.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

- 2016 සැප්තැම්බර් 01 සිට 2017 මාර්තු 31 දක්වා කාල පරිච්ඡේදය තුළදී බැංකුවේ ණය අංශය විසින් මුළු වටිනාකම රුපියල් මිලියන 68.34 ක මුදලක් ව්‍යාජ පෞද්ගලික සංවිධාන දෙකක සේවකයින් ලෙස පෙනී සිටින පුද්ගලයින් 47 දෙනෙකු අතර ණය වශයෙන් බෙදා දී තිබුණි. මෙම ව්‍යාජ පෞද්ගලික සංවිධාන දෙකේ සේවකයින් ලෙස පෙනී සිටිමින් ඔවුන් අදාල ණය සඳහා අයදුම්කිරීමේදී ව්‍යාජ ලියකියවිලි ඉදිරිපත් කර තිබු බව අනාවරණය විය. ඉහත මුළු ණය වටිනාකම් 2018 දෙසැම්බර් 31 දිනට අක්‍රීය ණය ශේෂයේ ඇතුළත් කර තිබුණි.

- බැංකුව විසින් 2017 වර්ෂය තුළදී කිරිබත්ගොඩ ශාඛාවේ බෙදා වෙන්කිරීම් (partition) හා ඉදිකිරීම් සඳහා රුපියල් මිලියන 1.16 ක මුදලක් වියදම්කර තිබුණි. එසේ වුවත්, එම ඉදිකිරීම් අවසන්වී මාස නවයකට පසුව එම ශාඛාව 2018 වර්ෂය තුළදී නව පරිශ්‍රයකට මාරු කර තිබු බැවින් එම බෙදා වෙන්කිරීම හා ඉදිකිරීම සඳහා දරන ලද වියදම නිෂ්ඵල වියදමක් ලෙස විගණනයේදී නිරීක්ෂණය විය.

- සමාලෝචිත වර්ෂය සඳහා බැංකු ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ බදුකුලිය ලෙස රු. 38,312,700 ක් ගෙවා තිබුණද, රථගාල, ගබඩා, විදුලි පරිපථය ආදී බොහෝමයක් පහසුකම් සම්බන්ධයෙන් සෑහීමට පත් විය නොහැකි මට්ටමක පවතින බව නිරීක්ෂණය විය. එසේම, බදුකුලී ගිවිසුම පරිදි බැංකුව රක්ෂණ ආවරණයක් ලබා ගැනීමට ද අපොහොසත් වී තිබුණි. එම නිසා සේවකයින්, වත්කම් හා පාරිභෝගිකයින්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් අවදානමක් පැවතුණි.

නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

- ජ්‍යෙෂ්ඨ පුරවැසි සඳහා වන විශේෂ පොලී සහනාධාර යෝජනා ක්‍රමය යටතේ වූ එකතුව රු.මිලියන 75.14 ක් අතරින්

රු.මිලියන 41.19 ක් හෙවත් සියයට 55 ක් වර්ෂයකට වැඩි කාලයක් රජයෙන් අයකර ගෙන නොතිබුණි.

- 2016 අප්‍රේල් 29 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනිව, බැංකුව විසින් එහි සේවකයන්ගේ වැටුපෙන් අඩු නොකොට 2018 වර්ෂය සඳහා රු.මිලියන 22. 39 ක උපයන විට ගෙවීමේ බදු (PAYE) බැංකුවේ අරමුදල්වලින් ගෙවා තිබුණි.

- අංක 09/188/2015 දරන අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව අනුව, සීබැන්ක් ඒකකයෙන් සියයට 15 ක ඇස්තමේන්තුගත වාර්ෂික ප්‍රතිලාභයක් ලබා ගැනීමටත් වත්කම් හා වගකීම් කල් පිරීමේ පරතරය කළමනාකරණය කිරීමටත් බැංකුව සැලැසුම් කර තිබුණි. කෙසේ වෙතත්, 2015 වර්ෂයේ සිට රු. මිලියන 25.00 ක ආයෝජනය සඳහා කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි. ආරම්භක ආයෝජන මිල රුපියල් 10 ක් හා සසඳන විට ඒකක භාරයේ වෙළඳපල වටිනාකම පසුගිය වසර 3 තුළ සැලකිය යුතු ලෙස පිරිහී තිබුණු බව තවදුරටත් නිරීක්ෂණය විය. වර්ෂය අවසානයේදී ඒකක භාරයේ වෙළඳපල අනුපාතය රුපියල් 7.50 ක් විය.

- විමසීම මට්ටමේ (WATCH states) පැවති රු.මිලියන 57.17 ක් වටිනා ණය 37 ක් සුරැකුමක් නොමැති හෙයින් ද්විතීයික අයකර ගැනීමේ විකල්පයක් නොමැතිව හිඟ වී තිබුණු අතර අක්‍රීය ණය බවට පත්වීමේ අවධානමක පැවැතුණි.

- 2018 වර්ෂය තුළ ප්‍රදානය කරන ලද රු.මිලියන 282.27 ක් වටිනා ණය 808 ක් එකදු වාරිකයක්වත් නොගෙවීම හේතුවෙන් අක්‍රීය ණය බාණ්ඩයට මාරු කර තිබුණි. ඉන් රු.මිලියන 264.03 ක් වටිනා ණය 798 ක් එනම් සියයට 93.6 ක් සේවක අර්ථසාධක අරමුදල් ඇපයට තබා ලබා දුන් ණය (EPF) මඟින් නියෝජනය වී තිබුණි.

- 2018 වර්ෂය තුළ ප්‍රදානය කරන ලද රු.මිලියන 107.92 ක් වටිනා ණය 280 ක් පළමු වාරිකය ගෙවීමෙන් පසු ආපසු නොගෙවීම හේතුවෙන් අක්‍රීය ණය බාණ්ඩයට මාරු කර තිබුණි. ඉන් රු.මිලියන 107.48 ක් වටිනා ණය 274 ක් එනම් සියයට 99.6 ක් සේවක අර්ථසාධක අරමුදල් ඇපයට තබා ලබා දුන් ණය (EPF) මඟින් නියෝජනය වී තිබුණි.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

- රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රයේ අංක 2.1.1 මාර්ගෝපදේශයට හා අංක පීෆ්/429(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට පටහැනිව, රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජෙනරාල්වරයාගේ අනුමැතියක් ලබා නොගෙන බැංකුව විසින් සංවර්ධිත ප්‍රසම්පාදන අත්පොතක් භාවිතා කර තිබුණි.

- 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 114 වන වගන්තිය, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 83 වන වගන්තිය (2018.04.01 දින සිට බලපැවැත්වෙන පරිදි), 2000 ජනවාරි 31 දිනැති හා අංක පීඑෆ් / පීඊ / 06 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට හා 2016 අප්‍රේල් 29 දිනැති අංක පීඊඩී 03/2016 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනිව, 2018 වර්ෂය සඳහා රු.මිලියන 191.48 ක් සේවකයින්ගේ උපයන විට ගෙවීම් බදු ලෙස අදාළ සේවකයින්ගේ වැටුපෙන් අඩු නොකර බැංකුව විසින් සිය අරමුදලින් ගෙවා තිබුණි. අංක 03/2016 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලය සහ රජය සතු ව්‍යවසායයන්හි ජ්‍යෙෂ්ඨ කළමනාකරණය, උපයන විට ගෙවීම් බද්ද අඩු කර දේශීය ආදායම්

දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීමට වග බලා ගත යුතුව තිබුණි.

- 2018 දෙසැම්බර් 31 දින වන විට වත්කම් මත ප්‍රතිලාභ සහ ස්කන්ධය මත ප්‍රතිලාභ පිළිවෙලින් සියයට 0.62 සහ සියයට 7.30 දක්වා අඩු වී තිබුණි. ඉහළ අක්‍රීය ණය අනුපාතය හේතුවෙන් හානිකරණ වියදම් සහ ඉහළ කාර්ය මණ්ඩල පිරිවැය, අඩු ලාභදායිතා මට්ටමකට හේතු වූ අතර ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව ඒකාබද්ධ කිරීම ස්කන්ධය වැඩි කිරීමට දායක විය. සියයට 54.2 ක් වූ ආංශික අනුපාතය හා සසඳන විට 2018 වර්ෂයේ මෙහෙයුම් වියදම් සඳහා කාර්ය මණ්ඩල පිරිවැය සියයට 75.01 ක් වී තිබුණි. දුර්වල ණය ඇගයීම් සහ ඵලදායී නොවූ හා තිරසාර නොවන ණය අයකර ගැනීමේ ප්‍රයත්නයන් හේතුවෙන් ඉකුත් වර්ෂයේ අවසානයේ වූ සියයට 3.27 ක සිට 2018 දෙසැම්බර් 31 දින වන විට අක්‍රීය ණය අනුපාතය සියයට 5.40 දක්වා සැලකිය යුතු ලෙස ඉහළ යාමත් සමඟ වත්කම්වල ගුණාත්මකභාවය පිළිබඳ අහිතකර ප්‍රවණතාවයක් දක්නට ලැබුණි. තවද, 2019 මැයි 31 වන විට බැංකුවේ අක්‍රීය ණය අනුපාතය සියයට 9.87 දක්වා වැඩි වී තිබේ.

ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව

- බැංකුව සිය ගනුදෙනුකරුවන්ට ණය ලබා නොදී බැංකුවේ මුදල්වලින් විශාල ප්‍රමාණයක් අවදානම් රහිත පොලී අනුපාතයකට ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. මෙය කාර්මික, කෘෂිකාර්මික, වාණිජ, ඉදිකිරීම් සහ වෙනත් ව්‍යවසායන් ප්‍රවර්ධනය කිරීම, ස්ථාපිත කිරීම, පුළුල් කිරීම, නවීකරණය කිරීම සහ සංවර්ධනය කිරීම යන බැංකුවේ මූලික පරමාර්ථයට පටහැනි විය.

- ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 09 – "මූල්‍ය උපකරණ", 2018 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන මූල්‍ය වාර්තාකරණ කාල පරිච්ඡේදයට අදාල වේ. කෙසේ වෙතත්, ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවෙහි මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 09 අනුව සකස් කර නොමැති අතර, එබැවින් මූල්‍ය ප්‍රකාශනවලට ඉහත ප්‍රමිතිය මත වන බලපෑම තක්සේරු කළ නොහැකි විය.

- 2018 දෙසැම්බර් 31 දිනට එ.ජ.ඩො.මිලියන 16.41 ක ණය ශේෂයක් සහ ඒ.ජ.ඩො.මිලියන 20.51ක ගෙවිය යුතු පොලිය, මහ බැංකු ඒ.ජ.ඩොලර් විකුණුම් අනුපාතය වූ රු.184.6966 ක් වෙනුවට මහ බැංකු එ.ජ.ඩොලර් මිලදී ගැනීමේ අනුපාතය වූ රු.180.72 භාවිතා කරමින් පරිවර්තනය කර ඇත. එබැවින් 2018 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ණය ශේෂය සහ පොලී වියදම රු.මිලියන 65.33 කින් අඩුවෙන් පෙන්වා තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී GOSL USD ණය ශේෂයේ ප්‍රාග්ධනය සහ පොලී වාරික වශයෙන් රු.මිලියන 109.39 ක් භාණ්ඩාගාරයට මහ බැංකු එ.ජ. ඩොලර් මිලදී ගැනීමේ විනිමය අනුපාතය භාවිතා කරමින් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, එ.ජ.ඩොලර් ණය වාරික මහ බැංකු එ.ජ. ඩොලර් විකුණුම් අනුපාතය භාවිතා කර පරිවර්තනය කළ යුතු බැවින් 2018 වර්ෂයෙහි ණය වාරික ගෙවීම රු.මිලියන 2.47 කින් අඩුවෙන් පෙන්වා තිබුණි.

- 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලයේ පරිභෝජන භාණ්ඩ, ලිපි ද්‍රව්‍ය සහ ප්‍රවර්ධන භාණ්ඩ සම්බන්ධයෙන් වන පොදු ලෙජර ශේෂයන් හා භෞතික සත්‍යාපන ශේෂය අතර රු.මිලියන 6.89 ක වෙනසක් අනාවරණය විය.

සීමාසහිත ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව

- බැංකුවේ ප්‍රධාන අරමුණ වනුයේ තිරසාර ආදායම් උපයන අවස්ථා හඳුනා ගැනීම,

සංවර්ධනය කිරීම, ප්‍රවර්ධනය , උත්ප්‍රේරණය සහ සහාය ලබාදීම හා ඵලදායී ස්වයං රැකියා සඳහා ග්‍රාමීය කාර්යන් සඳහා මූල්‍ය සහයෝගය හා සේවා ලබාදීම තුළින් දුප්පත් ජනතාව සඳහා ඉහළ ජීවන තත්ත්වයක් ලබාදීම වුවද, ඊට පටහැනි ලෙස බැංකුව සිය මුළු වත්කම්වලින් සියයට 66 ක් පමණ ප්‍රතිමිලදී ගැනුම්, ස්ථාවර තැන්පතු, ණයකර සහ ස්කන්ධ කොටස් වැනි විවිධ කෙටිකාලීන ආයෝජන සඳහා භාවිතා කර තිබුණි. බැංකුවේ මුළු වත්කම් වලින් සියයට 26 ක් පමණක් ණය හා අත්තිකාරම් නියෝජනය කරයි.

- 2010 මැයි 24 දිනැති අංක පීඊඩී/එන්ඩීටීඑෆ් දරන අමාත්‍ය මණ්ඩල සංදේශයේ 1.3 වගන්තිය ප්‍රකාරව, අසාර්ථක ප්‍රමුඛ ඉතිරිකිරීමේ සහ සංවර්ධන බැංකුවේ (PSDB) තැන්පත්කරුවන්ට සහන සැලසීමට 2006 වර්ෂයේදී බැංකුව පිහිටුවා තිබුණි. 2018 වර්ෂය තුළදී බැංකුව විසින් රු.මිලියන 541 ක් ප්‍රමුඛ ඉතිරිකිරීමේ සහ සංවර්ධන බැංකුවේ තැන්පත්කරුවන්ට ගෙවා තිබුණු අතර එම ශේෂය ඉකුත් වර්ෂයේ හිඟ තැන්පතු වගකීම් ශේෂයෙන් සියයට 47 ක් නියෝජනය කරයි. තවද, 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රමුඛ ඉතිරිකිරීමේ සහ සංවර්ධන බැංකුවේ හිඟ වගකීම් ශේෂය රු. මිලියන 656 ක් වේ.

- 2017 දෙසැම්බර් 31 දිනට පැවති රු.මිලියන 1,035 ක්ව පැවති ප්‍රමුඛ ඉතිරිකිරීමේ සහ සංවර්ධන බැංකුවේ හිඟ අක්‍රිය ණය අතුරින් රු.මිලියන 15 ක් හෙවත් සියයට 2 ක් සමාලෝචිත වර්ෂය තුළදී අයකරගෙන තිබුණි. ඒ අනුව 2018 දෙසැම්බර් 31 දිනට අයකර ගත යුතු ණය ශේෂය රු.මිලියන 1,020 ක් වී තිබුණි.

- 2018 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මුළු ණය කළඹ අතුරින් රු.මිලියන 1,319 ක් හෙවත් සියයට 33.3 ක් ක්ෂුද්‍ර මූල්‍ය ණය නියෝජනය කරයි. 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ ක්ෂුද්‍ර මූල්‍ය ණය මුදල අතුරින් රු. මිලියන 568 ක් හෙවත් සියයට 43 ක් ප්‍රජාමූල සංවිධාන 06 කට ප්‍රදානය කර තිබූ අතර එක් එක් ණය මුදල රු.මිලියන 50 ක් ඉක්මවා තිබුණි. හිඟ ණය ශේෂවලට එරෙහිව සපයා තිබුණු ආරක්ෂිත ඇපකර සියයට 13 ක සිට සියයට 45 ක් දක්වා වූ ප්‍රමාණයක් පමණක් ඉහත ණය මුදලින් ආවරණය වී තිබුණි. ගනුදෙනුකරුවන් කිහිපදෙනෙකු කෙරෙහි අධික විශ්වාසය තබාගැනීම බැංකුවට සැලකිය යුතු ණය අවදානමක් නිර්මාණය කරයි.

වැවිලි කර්මාන්තය

ඉඩම්වල වාණිජ වටිනාකම සලකා බලා බදු කුලිය සංශෝධනය නොකිරීම

තේ ප්‍රවර්ධන වියදම් වැඩි වී තිබුණත්, තේ අපනයන ප්‍රමාණය අඩුවීම

තේ නැවත වගා කිරීමේ සහනාධාර ගෙවා තිබුණත්, තේ නැවත වගා කිරීම අපේක්ෂිත මට්ටමට නොවීම

වතු සමාගම්වල වාර්ෂික පොල් ඵලදාව ගෙඩි 11 – 54 ක් දක්වා අඩුවීම

රබර් සහනාධාර වැඩසටහන් ක්‍රියාත්මක කර තිබුණත් සමස්ථ රබර් නිෂ්පාදනය අඛණ්ඩව අඩුවීම

වැවිලි කර්මාන්තය

රටේ සීඝ්‍ර ආර්ථික සංවර්ධනය වෙනුවෙන් අපනයන වෙළෙඳපොල ඉලක්ක කර ගනිමින් ප්‍රධාන වැවිලි බෝගයන්ගේ ඵලදායිතාවය, ලාභදායකත්වය හා තිරසාරභාවය වර්ධනය කිරීම මෙම අංශයෙන් අපේක්ෂා කරන ප්‍රතිඵලය වී තිබුණි. එම අපේක්ෂා ඉටු කිරීම සඳහා අමාත්‍යාංශය හා ව්‍යවස්ථාපිත ආයතන 14 කින් පහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි.

- වැවිලි කර්මාන්ත විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම සහ ඇගයීම
- වැවිලි බෝගවල ඵලදාව ඉහළ නැංවීම සඳහා අවශ්‍ය සානුබල සහ අනෙකුත් පහසුකම් සැලසීම.
- වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ ඵලදායිතාව සඳහා අන්තර්ජාතික තරඟකාරිත්වය ඉහළ නැංවීම.
- වැවිලි බෝග මත පදනම් වූ එකතු කළ වටිනාකම වැඩි කිරීම සම්බන්ධ කර්මාන්ත නඟා සිටුවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- තේ හා රබර් සම්බන්ධ බලපත්‍ර නිකුත් කිරීම.
- තේ අපනයනය සඳහා අවසරපත් නිකුත් කිරීම.
- තේ හා රබර් වතු කැබලි කිරීම සම්බන්ධ බලපත්‍ර නිකුත් කිරීම සහ පාලනය.
- බහුබෝග වගාවන් සහ සංගත ගොවිපල ක්‍රම තුළින් වැවිලි ඉඩම් ප්‍රශස්ත මට්ටමින් ප්‍රයෝජනයට ගැනීම සහ එමඟින් නිෂ්පාදනය හා සේවා නියුක්තිය වැඩි කරලීම.
- තේ, රබර් සහ පොල් කර්මාන්ත සංවර්ධනය සහ පර්යේෂණයන්ට අදාළ කටයුතු
- අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන සඳහා ව්‍යවසායන් හා ව්‍යුහාත්මක වෙනස්කම් හඳුන්වා දීම

ඉහත සඳහන් කාර්යභාරයන් ඉටු කිරීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණයන් සම්පිණ්ඩනය කර පහත දැක්වේ.

කල් බදු කුලී පදනමට ඉඩම් පවරා දීම හා ආදායම රැස් කිරීම

1992 වර්ෂයේදී වැවිලි සමාගම් 23 ක් වෙත ලබා දී තිබුණු රජයට අයත් එකතුව අක්කර 617,486 ක් වූ වතුවලින්, අක්කර එකකින් ලැබෙන වාර්ෂික බදු කුලී ආදායම රු.433 ක සිට රු.2,780 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි. වර්තමානයේ ඉඩම්වල වාණිජ වටිනාකම සළකා බලා අය කරනු ලබන බදු කුලිය සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

2017 පෙබරවාරි 15 දිනැති අංක PE/PL/RP/Gen/2017 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය අනුව රජයේ ඉඩම් උප බදුදීම් තුළින් උපයන කුලී ආදායමෙන් සියයට 20 ක ගාස්තුවක් ඒකාබද්ධ අරමුදලට අය කිරීමට නියම කර තිබුණි. 2017 වර්ෂයට පෙර උපබදු දී තිබූ වැවිලි සමාගම් 05 කට අදාළව 2018 වර්ෂය සඳහා අයකර තිබුණු රු.මිලියන 36.51 ක බදු කුලී ආදායමෙන් සියයට 20 ක ගාස්තුව ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.

වැවිලි සමාගමක් විසින් 2011 මැයි 31 දින සිට 2045 ජූනි 17 දින දක්වා කාලපරිච්ඡේදය සඳහා වාර්ෂිකව රු.මිලියන 12.22 ක උප බදු වටිනාකමක් මත අක්කරයක ඉඩම් ප්‍රමාණයක් ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත බදු දී තිබුණි. එම වැවිලි සමාගම වෙත රජයේ ඉඩම් බදු දුන් ගිවිසුම ප්‍රකාරව රජයේ අවශ්‍යතා මත වැවිලි සමාගම් වෙත බදු දුන් ඉඩම් නැවත පවරා

ගැනීමට හැකියාවක් අමාත්‍යාංශයට තිබුණත්, ඒ කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

තේ අළෙවි ප්‍රවර්ධනය වැඩසටහන ක්‍රියාත්මක කිරීම

තේ ප්‍රවර්ධන අරමුදලේ ඉපැයීම්වලින් රු.බිලියන අටක් යොදවා ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර තිබුණු ගෝලීය තේ ප්‍රවර්ධන වැඩසටහනේ නිෂ්පාදන හා නිර්මාණාත්මක කටයුතු සඳහා පෞද්ගලික සමාගමක් තෝරාගෙන වෙළඳ දැන්වීම් නිර්මාණ කටයුතු වෙනුවෙන් රු.මිලියන 199.67 ක් වැය කර තිබුණි. මාධ්‍ය කටයුතු අවසන් නොවීම හේතුවෙන් අපේක්ෂිත වැඩසටහන අපේක්ෂිත වූ ආකාරයට ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වී තිබුණි. එසේම 2018 වර්ෂයේ ප්‍රවර්ධන වියදම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 18.87 කින් වැඩියෙන් වැය කර තිබුණත්, තේ අපනයන ප්‍රමාණය සියයට 2.21 කින් අඩු වී තිබුණි. විස්තර වගුව 17 හි දැක්වේ.

වර්ෂය	දේශීය තේ අපනයනය (කිලෝ ග්‍රෑම් මිලියන)	තේ අළෙවි ප්‍රවර්ධනය (රු.මිලියන)
2014	317.8	381,134,199
2015	298.9	481,352,966
2016	280.8	884,151,296
2017	278.2	560,202,236
2018	271.7	665,959,711

වගුව 17 - දේශීය තේ අපනයනය හා තේ අලෙවි ප්‍රවර්ධනය

මූලාශ්‍රය - ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සංඛ්‍යා දත්ත ප්‍රකාශනය හා මූල්‍ය ප්‍රකාශන

තේ නැවත වගා සහනාධාර

2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ අදියර පහක් යටතේ තේ නැවත වගා සහනාධාර ගෙවා තිබුණි. ඉඩම් හෙක්ටයාර් 577 ක් හිමි ගොවීන් විසින් පළමු අදියර තුනක් යටතේ පමණක් රු.මිලියන 920.13 ක තේ නැවත වගා සහනාධාර ලබා ගෙන තිබුණි. නමුත් එම ගොවීන් විසින් තේ නැවත වගා නොකිරීම නිසා එම සහනාධාර ලබා දීමෙන් අපේක්ෂා කළ අරමුණු ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි. ඒ සම්බන්ධයෙන් කළමනාකරණයේ අවධානය යොමු කර නොතිබුණි.

පොල් කර්මාන්තය

පොල් කර්මාන්තය දළ දේශිය නිෂ්පාදනය සඳහා වැවිලි ක්ෂේත්‍රයෙන් ඉහළතම දායකත්වය ලබා දෙන්නාවීම සහ නිෂ්පාදන අලෙවි විවිධාංගීකරණයේදී ගෝලීය නායකයා වීමට විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර තිබුණි. එසේ වුවද, පොල් අස්වැන්න 2017 වර්ෂයේදී පොල් ගෙඩි මිලියන 2,450 ක සිට 2018 වර්ෂයේදී පොල් ගෙඩි මිලියන 2,623 ක් දක්වා සුළු ප්‍රමාණයකින් වැඩිවී තිබුණි. නමුත් 2015 වර්ෂයේ පොල් ගෙඩි මිලියන 3,056 ක පොල් අස්වැන්න සමග සැසදීමේදී පොල් අස්වැන්න පසු බෑමට ලක් වී තිබුණි. විස්තර රූපසටහන 42 හි දැක්වේ.



රූපසටහන 42 - වාර්ෂික පොල් නිෂ්පාදනය
මූලාශ්‍රය - වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තාව 2018

වාර්ෂික පොල් ඵලදාව

පොල් පර්යේෂණ ආයතනයේ සම්මතයන්ට අනුව පොල් ගසක වාර්ෂික සාමාන්‍ය ඵලදාව ගෙඩි 72 ක් පමණ විය යුතු වුවත්, කුරුණෑගල වැවිලි සමාගම විසින් පාලනය කරන වතු 07 ක එම අගය පොල් ගෙඩි 31-54 ක් ද, හලාවත වැවිලි සමාගමේ වතු 06 ක එම අගය පොල් ගෙඩි 11-36 ක්ද, වී තිබුණි. පොල් පර්යේෂණ ආයතනයේ සම්මතය කරා ළඟාවීමට සමාගම් විසින් පාංශු පරීක්ෂාව සිදු කර ඒ අනුව පොහොර හා රසායනික ද්‍රව්‍ය යෙදීමටත්, වාරි පද්ධති ඇති කර නව වගාවන් මඟින් නියමිත ඵලදාව ලබා ගැනීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුව තිබුණත්, එසේ කටයුතු කර නොතිබුණි.



රූපසටහන 43. - වාර්ෂික රබර් නිෂ්පාදනය
මූලාශ්‍රය -වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව 2018

රබර් නිෂ්පාදනය

රබර් වගා බිම් ප්‍රමාණය වැඩි කිරීමට සහ රබර් වගා බිම් වල ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සහනාධාර වැඩ සටහන් ක්‍රියාත්මක කර තිබුණි. 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා සමස්ථ රබර් නිෂ්පාදනය අඛණ්ඩව අඩු වෙමින් පැවති අතර 2017 වර්ෂයේ මෙට්‍රික් ටොන් 83,070 ක් වූ රබර් නිෂ්පාදනය 2018 වර්ෂයේ දී මෙට්‍රික් ටොන් 82,560 ක් දක්වා අඩු වී තිබුණි. විස්තර රූපසටහන 43 හි දැක්වේ.

අමු රබර් අපනයනය

2017 වර්ෂයේ දී මෙට්‍රික් ටොන් 17,230 ක් වූ රබර් අපනයනය 2018 වර්ෂයේදී මෙට්‍රික් ටොන් 13,982 ක් දක්වා සියයට 19 කින්ද, 2017 වර්ෂයේ රු.මිලියන 5,920 ක් වූ රබර් අපනයන ආදායම 2018 වර්ෂයේ දී රු.මිලියන 5,088 ක් දක්වා සියයට 14 කින්ද අඩු වී තිබුණි. විස්තර රූපසටහන 44 හි දැක්වේ.



රූපසටහන 44 - අමු රබර් අපනයනය
මූලාශ්‍රය -වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව

අරමුණුවලට ලඟා නොවීම

සමාලෝචිත වර්ෂයේ කුඩා රබර් වතුහිමියන්ගේ හා වැවිලි සමාගම්වල පිළිවෙලින් ඉඩම් හෙක්ටයාර් 1,000 ක හා හෙක්ටයාර 500 ක රබර් නැවත වගා කිරීමට අපේක්ෂා කර තිබුණි. ඉන් පිළිවෙලින් හෙක්ටයාර 523 ක හා හෙක්ටයාර 319 පමණක් රබර් නැවත වගා කර තිබුණි. ඒ අනුව ඉටු නොකළ ප්‍රමාණය සැලැසුම් කළ ප්‍රමාණයෙන් පිළිවෙලින් සියයට 48 ක් හා සියයට 36 ක් වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ සම්ප්‍රදායික හා සම්ප්‍රදායික නොවන ප්‍රදේශවල නව ඉඩම් හෙක්ටයාර් 750 ක රබර් වගා කිරීමට සැලැසුම්කර තිබුණද, ඉඩම් හෙක්ටයාර් 342.5 ක පමණක් රබර් වගා කර තිබුණි. ඒ අනුව ඉටු නොකළ ප්‍රමාණය සැලැසුම් කළ ප්‍රමාණයෙන් සියයට 54 ක් වී තිබුණි.

නිෂ්කාර්ය වත්කම්

විශේෂ ව්‍යාපෘති සඳහා තේ පර්යේෂණ ආයතනයට ලැබී තිබුණු රු.මිලියන 14.03 ක් වැයකර Walk in Type Environmental Facility නමැති උපකරණය 2018 මැයි 08 දින ඉන්දියාවෙන් ආනයනය කර තිබුණි. එම උපකරණයේ ක්‍රියාකාරී අපේක්ෂිත මට්ටම තීරණය නොකර ආනයනය කර තිබුණි. මේ නිසා එම උපකරණය ආයතනයට ලැබී වර්ෂයක් ගත වී තිබුණත්, එය පර්යේෂණ සඳහා භාවිතා නොකර නිෂ්කාර්යව පැවැතුණි.

2014 වර්ෂයේ සිට අවශ්‍යතාවය හඳුනා ගැනීමකින් තොරව රු.මිලියන 5.80 ක් වටිනා රසායානාගාර භාණ්ඩ මිලදී ගැනිම නිසා එම තොගවලින් රු.මිලියන 3.46 ක් වටිනා තොග නිෂ්කාර්යව පැවැතුණි.

2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ පොල් ආශ්‍රිත නිෂ්පාදනවල ඇලවීම සඳහා රු.මිලියන 7.18 ක් වටිනා ස්ටිකර් 4,076,000 ක් අවශ්‍යතාවය හඳුනාගැනීමකින් තොරව මිලදී ගෙන තිබුණි. එම තොග වර්ෂ 2 කට වැඩි කාලයක සිට නිෂ්කාර්යව පැවැතුණි.

රබර් පර්යේෂණ ආයතනය විසින් 2010 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ මිල දී ගෙන තිබුණු රු.මිලියන 15.74 ක් වටිනා උපකරණ 04 ක් අළුත්වැඩියා කර භාවිතයට නොගෙන වර්ෂ 2 ක සිට වර්ෂ 8 දක්වා පරාසයක කාලයක් නිෂ්කාර්යව පැවැතුණි.

සීමාසහිත හලාවත වැවිලි සමාගම විසින් කිණියම වතු කොටසේ පවත්වාගෙන යනු ලබන බීජ පොල් උයනට ජලය ලබාගැනීම සඳහා 2018 මාර්තු 19 දින රු.මිලියන 1.39 ක පිරිවැයකට විදුලි ජනන යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණි. ජල නළ එළීමේ කටයුතු 2019 අගෝස්තු 31 දින වන විටත් අවසන් නොකිරීම නිසා එම යන්ත්‍රය භාවිතයට ගෙන නොතිබුණි.

සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගම සතු කර්මාන්තශාලා 06 කින් කර්මාන්තශාලා 03 ක් අක්‍රිය තත්ත්වයේ පැවති අතර අක්‍රිය කර්මාන්තශාලා තේ නිෂ්පාදන කටයුතු සඳහා දායක කර ගැනීමට හෝ බදු දීමට කටයුතු කර නොතිබුණි.

කළමනාකරණ ක්‍රියාකාරකම්

කජු සංස්ථාවට අයත් සුදුවතුර ආර බීජ උද්‍යානයට අයත් අක්කර 160 කට ආසන්න භූමි ප්‍රමාණයක් සහ කමන්දළුව වතු යායේ, ඔට්ටුකුලම කොටසේ වූ ඉඩමේ අක්කර 10 ක ප්‍රමාණයක් බාහිර පාර්ශවයන් විසින් අත්පත් කරගෙන කන්න භෝග සහ බුලත් ඇතුළු වගාවන් සිදුකරමින් පැවතුණි. එම ඉඩම් නැවත අත්පත් කර ගැනීම සඳහා අවශ්‍ය

ෛනතික ක්‍රියාමාර්ග ගැනීමට කජු සංස්ථාව කටයුතු කර නොතිබුණි.

2012 ජුලි 24 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් කජු සංස්ථාවට අයත් නීත්‍යනුකූල අයිතිය නොමැති ඉඩම්වල අයිතිය සංස්ථාවට පවරා ගැනීමට කටයුතු කළ යුතු බව දන්වා තිබුණත්, සංස්ථාව විසින් කජු වගා කරන ඉඩම් අක්කර 15,329 ක නීත්‍යානුකූල අයිතිය 2019 මැයි 31 දින වන විටත් පවරා ගැනිමට කටයුතු කර නොතිබුණි.

නිෂ්කාර්ය වියදම්

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම විසින් ශක්‍යතා අධ්‍යනයක් සිදු කිරීමෙන් තොරව 2016 වර්ෂයේදී රු.මිලියන 12.08 ක් වැය කර ආරම්භකරන ලද රබර් කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන කටයුතු උපරිම ධාරිතාවයෙන් පවත්වාගෙන යාමට අවශ්‍ය අමුද්‍රව්‍ය නොලැබීම හා ප්‍රමාණවත් අලෙවි ආදායමක් නොලැබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට කර්මාන්තශාලාවේ නිෂ්පාදන කටයුතු නවතා තිබුණි. ඒ අනුව, කර්මාන්තශාලාව සඳහා වැය කළ මුදල නිෂ්ඵල වී තිබුණි.

මෙහෙයුම් අකාර්යක්ෂමතා

2013 වර්ෂයේ සීමාසහිත හලාවත වැවිලි සමාගමට අයත් ශාන්ත ජෝන් බී හා මරිච්චිකට්ටුව වත්තේ හෙක්ටයාර් 20.75 ක භූමියක කජු පැල 4,131 ක් වගා කර තිබුණි. 2018 වර්ෂය අවසන් වන විට ඒ සඳහා රු.මිලියන 7.06 ක් වැය කර තිබුණි. එසේ වගා කළ කජු පැල වලින් වර්ධනය වූ කජු ගස් 3,685 ක් හෙවත් වගා කළ ප්‍රමාණයෙන් සියයට 89 ක් නඩත්තු හා අධීක්ෂණ කටයුතුවල දුර්වලතා හේතුවෙන් විනාශ වී තිබුණි.

විදේශාධාර ව්‍යාපෘතිවල ප්‍රගතිය

කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදල හා ශ්‍රී ලංකා රජයේ මූල්‍ය දායකත්වය යටතේ 2016 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාල පරාසය තුළ ක්‍රියාත්මක කරනු ලබන කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේදී රු.මිලියන 1,400 ක ප්‍රතිපාදන සලසා තිබුණි. 2018 වර්ෂයේදී තේ වතු හෙක්ටයාර් 2,115 ක්, රබර් වතු හෙක්ටයාර 1,000 ක් හා මාර්ග 31 ක් සංවර්ධනය කිරීමට ඉලක්ක ගත කර තිබුණද, තේ වතු හෙක්ටයාර 1,344 ක් , රබර් හෙක්ටයාර 293 ක් සහ මාර්ග 24 ක් පමණක් නිම කිරීම නිසා අපේක්ෂිත ඉලක්කවලට ළඟා වී නොතිබුණි.

සහනාධාර ගෙවීමේ ගිවිසුම්වල කොන්දේසි ප්‍රකාරව සහනාධාර වාරිකය ගොවීන් වෙත නිදහස් කිරීම සඳහා කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ තේ පරීක්ෂකවරුන්ගේ නිර්දේශය ලබා ගත යුතුව තිබුණි. තේ පරීක්ෂකවරුන්ගේ නිර්දේශයන් ලබාදීමේ ප්‍රමාදය නිසා මහනුවර දිස්ත්‍රික්කයේ කුඩා තේ වතු හිමියන් 331 දෙනෙකුගේ එකතුව හෙක්ටයාර් 47.23 ක භූමි ප්‍රමාණය තේ නැවත වගාව සඳහා සූදානම් කර තිබියදීත්, දෙවන හා තෙවන සහනාධාර වාරිකය ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

මහනුවර දිස්ත්‍රික්කයේ හෙක්ටයාර 23.85 ක තේ නැවත වගාව සඳහා බලපත්‍ර ලබා ගෙන තිබූ ප්‍රතිලාභීන් 109 දෙනෙක් වෙත එකතුව රු.මිලියන 3.58 ක් වූ මූලික සහනාධාර ගෙවා තිබුණද, තේ නැවත වගාව ආරම්භ කර නොතිබුණි.

2016 හා 2017 වර්ෂවලදී අම්පාර දිස්ත්‍රික්කයේ දමන හා ලාහුගල ප්‍රදේශ, මහඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ඉඩම් හෙක්ටයාර 59.457ක වගා කිරීමට රු.මිලියන 4.88ක් ප්‍රතිලාභීන් 99 දෙනෙකු වෙත ගෙවා තිබුණි. එහෙත් එම රබර් වගාවන් පිළිවෙලින්

නියඟය, වන අලි විසින් විනාශ කිරීම හා වරාපිටිය ජලාශය ඉදි කිරීම සඳහා අත් කර ගෙන තිබීම වැනි කරුණු හේතුවෙන් වගාවට ගෙවා තිබූ එම සහනාධාර මුදල් නිෂ්කාර්ය වී තිබුණි.

අම්පාර දිස්ත්‍රික්කයේ ගොවීන් 15 දෙනෙකු විසින් 2016 හා 2017 වර්ෂවලදී වගා කර තිබූ හෙක්ටයාර් 12.135 ක රබර් වගාව සඳහා එකතුව රු.849,317 ක මූලික සහනාධාර ලබා ගැනීමෙන් පසුව එම වගාවන් අතහැර තිබුණි.

ඉඩම් කටයුතු

අත්පත් කර ගත් ඉඩම් සඳහා වන්දි ගෙවීම ප්‍රමාදවීම නිසා වන්දි පොලී ලෙස රු.මිලියන 542.71 ක් ගෙවීම

ඉඩම් බදු ආදායමෙන් රු.මිලියන 2,657 ක ආදායම් හිඟහිට පැවැතීම

ඉඩම් බදුදීම විධිමත් පරිදි සිදු නොවීම

සිතියම්කරණයේ කාර්යසාධනය අඩුවීම

ඉඩම් පරිහරණ සැලැස්ම පිළියෙල නොකිරිම

මිනින්දෝරුවන්ගේ විෂමාචාර සම්බන්ධයෙන් මන්දගාමීව කටයුතු කිරිම.

ඉඩම් කටයුතු

තිරසාර සංවර්ධනය උදෙසා ඉඩම් සම්පත ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම ඉඩම් අංශයෙන් අපේක්ෂා කරන ප්‍රතිඵලය වී තිබුණි. එම අපේක්ෂාව ඉටු කිරීම සඳහා ඉඩම් අමාත්‍යාංශය, දෙපාර්තමේන්තු 4 ක් හා ව්‍යවස්ථාපිත මණ්ඩල 4 ක් විසින් පහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි.

- ඉඩම් විෂයයට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- තිරසාර සංවර්ධනය උදෙසා ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිවලට අනුකූලව සිදු කරනු ලබන අධ්‍යයනයන් මත අදාළ අංශ සඳහා උපදෙස් ලබාදීම.
- රජයේ ඉඩම් පරිපාලනය සහ කළමනාකරණය.
- නීතියෙන් නිශ්චය කොට දක්වා ඇති පරිදි ඉඩම් අන්සතු කිරීම.
- ජාතික අවශ්‍යතාවන් සඳහා ඉඩම් අත්පත් කර ගැනීම.
- රජයේ ඉඩම්වල අයිතිය තහවුරු කිරීම සඳහා දීමනා පත්‍ර ලබා දීම.
- සංවර්ධන සහ නේවාසික අවශ්‍යතා සඳහා රජයේ ඉඩම් දීර්ඝකාලීනව හා කෙටිකාලීනව බදුදීම.
- ඉඩම් අයිතිය තහවුරු කිරීම සඳහා හිමිකම් සහතික ලියාපදිංචි කිරීම.
- ජාතික සැලැසුම්කරණය ඉලක්ක කරගෙන ඉඩම් මැනීම, සිතියම් සකස් කිරීම හා අනුරේඛන සම්පාදනය කිරීම.
- රජයේ සියළුම ඉඩම් පිළිබඳව තොරතුරු පද්ධතියක් සකස් කිරීම.

අමාත්‍යාංශය, දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත මණ්ඩල විසින් ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම පිළිබඳව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

ඉඩම් අත්පත් කර ගැනීම.

1950 අංක 9 දරන ඉඩම් පනතේ 38(අ) අතුරු විධාන ආඥාව පරිදි රජයේ සංවර්ධන ක්‍රියාවලිය සඳහා ඉඩම් පුද්ගලික අංශයෙන් අත්පත් කර ගැනීම් ක්‍රියාවලිය ඉඩම් අමාත්‍යාංශය, සංවර්ධන කටයුත්ත ක්‍රියාත්මක කරන ආයතනය, තක්සේරු දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මිනින්දෝරු දෙපාර්තමේන්තුව හා ඊට අදාළ අනෙකුත් ආයතනයන් විසින් සාමූහිකව ඉටු කළ යුතුව තිබුණි. එම කාර්යභාරය ඉටු කිරීම සඳහා කාල වකවානු ඇතුළත් කර ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. මේ නිසා 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ එසේ ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සඳහා ඉදිරිපත් කර තිබුණු ගොනු 8029 කින් සමාලෝචිත වර්ෂය අවසන් වන විට නිම කර තිබුණේ 1368 ක් හෙවත් කටයුතු කළ යුතු ලිපිගොනු සංඛ්‍යාවෙන් සියයට 17 ක් වැනි අඩු සංඛ්‍යාවකි. 1970 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ අත්පත් කරගෙන තිබූ ඉඩම් සඳහා වන්දි ගෙවීම ප්‍රමාද වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වන්දි පොලී ලෙස රු.මිලියන 452.71 ක් ගෙවා තිබුණි.

රාජ්‍ය ඉඩම් තොරතුරු හා කළමනාකරණ පද්ධතිය.

තොරතුරු තාක්ෂණය භාවිතා කරමින් රජයේ ඉඩම් තොරතුරු හා කළමනාකරණ පද්ධතියක් නිර්මාණය කර 2013 වර්ෂයේ සිට පවත්වාගෙන යන අතර ඒ සඳහා 2018 වර්ෂය වන විට රු.මිලියන 115.71 ක් වැය කර තිබුණි. බදු දී තිබුණු සියළු ඉඩම්

සම්බන්ධ තොරතුරු 2019 මැයි 31 දින වන විටත් මෙම පද්ධතියට ඇතුළත් කර නොතිබුණි. මේ හේතුවෙන් බදු අයකිරීම සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු මෙම පද්ධතියෙන් ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

ඉඩම් බදු ආදායම් කළමනාකරණය

අන්තර් පළාත් ගොවි ජනපද ප්‍රදේශයන්හි ඉඩම් බදු ආදායම් රැස් කිරීම ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් සිදුකරන අතර එම ආදායම් එකතු කිරීමට අදාළ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි. මේ හේතුව නිසා සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.මිලියන 35.65 ක ආදායම් හිඟහිටව පැවැතුණි.

අන්තර් පළාත් ගොවි ජනපද ප්‍රදේශයන් හැර සෙසු ප්‍රදේශවල බදු ආදායම් රැස් කිරීම පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් සිදු කර තිබුණි. එම ප්‍රදේශවල රජයේ ඉඩම් පරිපාලනය හා පරිපාලනය සම්බන්ධ නිලධාරීන් අධීක්ෂණය කිරීමේ සම්පූර්ණ බලතල රජයේ ඉඩම් ආඥා පනතේ 91 වගන්තිය හා 2010 පෙබරවාරි 03 දිනැති අංක එස්පී/ආර්ඩී/02/10 දරන ජනාධිපති කාර්යාලයේ චක්‍රලේඛය ප්‍රකාරව ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා වෙත පැවරී තිබුණි. එසේ වුවද, බදුදීමේ ක්‍රියාවලියේ හා බදු මුදල් අය කිරීමේ අධීක්ෂණ කටයුතු දුර්වල තත්වයක පැවතීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 2,656.59 ක ආදායමක් හිඟහිටව පැවතුණි.

සැලැසුම් කළ ඉලක්ක කරා ළඟා නොවීම

- බිම්සවිය වැඩසටහන 2002 වර්ෂයේ ආරම්භ කර 2021 වර්ෂය වන විට අවසන් කිරීමට සැලැසුම් කර තිබුණත්, 2018 වර්ෂය අවසන් වනවිට ඒ සඳහා වර්ෂ 16ක් ගතවී තිබුණි. නමුත් එම වැඩසටහන ක්‍රියාත්මකවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 57 කට අයත් මුළු ග්‍රාම නිලධාරී කොට්ඨාශ 3659 කින් ග්‍රාම නිලධාරී කොට්ඨාශ ගණන 1695ක් පමණක් සියයට 46 ක ප්‍රමාණයක මිනුම් කටයුතු අවසන් කර තිබුණි.

- එමෙන්ම හිමිකම් නිරවුල් කිරීමේ ක්‍රියාව අතරතුර 2018 වර්ෂයේ දී ලිපිගොනු 34,428 ක් පසෙක තබා ඇති අතර 2018 දෙසැම්බර් 31 දිනට පසෙක තබන ලද සමස්ත ලිපිගොනු සංඛ්‍යාව 414,543 ක් වී තිබුණි. පසෙක තැබූ එම ලිපිගොනුවලින් 2018 වර්ෂය තුළ ලිපිගොනු 12,341 ක පමණක් ගැටළු නිරවුල් කර හිමිකම් ප්‍රකාශ නිකුත් කර තිබුණි. ඒ අනුව පසෙක තැබූ ගොනු සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ප්‍රගතිය සියයට 36 ක් වී තිබුණි.

ඉඩම් බදුදීම විධිමත් පරිදි සිදු නොකිරීම

ඉඩමේ ප්‍රමාණය අක්කර 05 කට වැඩි වන අවස්ථාවල ව්‍යාපෘති සඳහා ඉඩම් බදුදීමේදී අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතුව තිබුණි. නමුත් කළුතර දිස්ත්‍රික්කයේ මැද්දේ ගෙදර වත්ත ඉඩමේ අක්කර 80 ක්, 04 දෙනෙකු වෙත කෘෂිකාර්මික කටයුතු සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියකින් තොරව ඉඩම් කොමිෂන් සභාව විසින් බදු දී තිබුණි. ඒ සඳහා මූලික ඇස්තමේන්තු මුදල පමණක් අයකරගෙන තිබුණු අතර රජයේ තක්සේරුව අනුව බදු මුදල් අයකරගෙන නොතිබුණි.

වර්ෂයකට වැඩි කාලයක් සඳහා කළුගල් ඉඩම් බදු දීමේදී, මධ්‍යම පරිසර අධිකාරිය හා භූ විද්‍යා හා පතල් කාර්යාංශය වැනි ආයතනවල නිර්දේශ ලබා ගෙන විධිමත් බදු ගිවිසුමක්

මත ඉඩම් බදුදීම සිදු කළ යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂයේදී බදු ගිවිසුම් හා අදාළ ආයතනවල නිර්දේශ නොමැතිව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඔලබොඩුව, යහල කැලේ හා ඉංගිරිය වතුවලට අයත් අක්කර 22 ක භූමියක පිහිටි කලුගල් ඉඩම් 2001, 2004 හා 2005 යන වර්ෂවලදී බදු දී තිබුණි. එමෙන්ම මිල්ලනිය හොරේකන්ද වතු යායට අයත් අක්කර 10 ක ඉඩමක පිහිටි කළු ගලක් 2003 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අනවසරයෙන් කැනීම් කර තිබුණත්, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. බදුකරුවන් විසින් බදු මුදල් නොගෙවීම හා අදාල ආයතනවලින් ලබා ගත යුතු අනුමැතිය ලබා නොගැනීම හේතුවෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සමඟ එළඹ තිබුණු ගිවිසුම් අවලංගු කර තිබුණද, අනවසර කැනීම් නතර කිරීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව 2018 නොවැම්බර් 30 දින වන විට රු.මිලියන 47.43ක බදු මුදලක් හිඟහිටව පැවැතුණි. එමෙන්ම පුත්තලම දිස්ත්‍රික්කයේ අක්කර 173 ක් ඉස්සන් වගා කිරීමට අනවසරයෙන් හා බදු පදනමට ලබා දී තිබුණත්, නිසි ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම හේතුවෙන් 2018 වර්ෂය අවසාන වන විට රු. මිලියන 16.42 ක ආදායමක් හිඟහිටව පැවතුණි.

ඉඩම් පිළිබඳ ලේඛනයක් පවත්වා ගැනීම.

1972 වර්ෂයේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව පිහිටවූ දින සිට අත්පත් කරගත් ඉඩම්වලට අදාළව, එම ඉඩම්වල අක්කර ගණන එක් එක් ඉඩම් පිහිටි ප්‍රදේශ, අත්පත් කරගනු ලැබුවේ කවරෙකුගෙන්ද, දැනට බුක්තිය පවරාදීම් පිළිබඳ විස්තර, ගැසට් පත්‍රයේ පළ කළ අදාළ නිවේදන සහ ඉඩම් බැහැර කිරීම්වලට අදාළ සියලුම විස්තර ඇතුළත් ලේඛනයක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් යාවත්කාලීන කර නොතිබුණි. එමෙන්ම ඒ පිළිබඳ උපයෝගී ලියවිලි මඟින් පැහැදිලි කිරීමටද සභාව අපොහොසත් විය. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු.මිලියන 676.17 ක් වූ පවරාගත් ඉඩම්වල පැවැත්ම හා අගය කිරීමේ නිවැරදිතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.

ඉඩම් අන්සතු කිරීම

2004 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩලය විසින් ඉඩම් අන් සතු කිරීම තහනම් කර තිබුණත්, 2002 වර්ෂයේ සිට 2004 වර්ෂය දක්වා ඉඩම් ප්‍රතිසංස්කරණ සභාව විසින් ව්‍යාපෘති සඳහා ඉඩම් බදු දීමේ ක්‍රමවේදයට පරිබාහිරව ඉඩම් අන්සතු කර තිබුණි. එසේ අන්සතු කළ ඉඩම් භුක්තියට පවරාදීමක් හා භුක්තියට පවරාදීමක් සිදු නොකරන ලද ලෙස විධි 02 කින් ලැයිස්තු ගත කර තිබුණි. භුක්තියට පවරා දෙන ඉඩම් අතරින් අක්කර 760 පර්චස් 31 ක් ආපසු බාරදී නොතිබුණි. භුක්තිය භාර නොදුන් අක්කර 1689 ක් සඳහා ලබා ගෙන තිබුණු අත්තිකාරම් මුදල් එම ඉල්ලුම්කරුවන්ට ආපසු ලබා දීමට කටයුතු කර නොතිබුණු අතර, එම ඉඩම් පිළිබඳ පසුවිපරම් කටයුතු ද සිදුකර නොතිබුණි.

මැනුම් නියෝග ඉටු කිරීමේ හා සිතියම්කරණයේ කාර්යසාධනය

වර්ෂ 36 කට පෙර සිට මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මිනින්දෝරුවරයකු මාසයකට මැනිය යුතු අවම බිම් කැබලි සංඛ්‍යාව (Norms) 20 ක සම්මතයක් මත කටයුතු කර තිබුණි. වර්ෂ 36 කටත් පෙර පිහිටුවාගත් සම්මතය මැනුම් ශිල්ප ක්‍රම හා උපකරණවල තාක්ෂණික දියුණුවත් සමඟ

වර්තමානයට ගැලපෙන ආකාරයට සමාලෝචනය කර සම්මතය සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. 2009 වර්ෂයේ සිට 2018 වර්ෂය අවසාන වනවිට ලැබී තිබුණු මුළු මැනුම් නියෝග 33,443 කින් මැනුම් නියෝග 22,039 ක් නිම කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. මේ නිසා දෙපාර්තමේන්තුවේ මැනුම් නියෝග ඉටු කිරීමේ සමස්ත කාර්යසාධනය සියයට 34 ක මට්ටමක පැවතුණි. 2017 වර්ෂය අවසන් වනවිට 1:50,000 සිතියම් 92 ක් නිර්මාණය කිරීමට තීරණය කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය වන විට සිතියම් 70 ක් පමණක් කර තිබුණි. මුළු දිවයිනම ආවරණය වන පරිදි 1:10,000 සිතියම් 1834 ක් නිර්මාණය කළ යුතුව තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සිතියම් 700 ක් පමණක් නිම කර තිබුණි.

ජාතික ඉඩම් පරිහරණ සැලැස්මක් පිළියෙල කිරීම

2010 මැයි 20 දිනැති අංක 1654/21 දරන (අතිවිශේෂ) ගැසට් පත්‍රයේ පළ කළ නිවේදනයක් මඟින් ජාතික ඉඩම් පරිහරණ සැලැස්මක් සැකසීම සහ ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේ මූලික අරමුණු ඇතිව ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලැසුම් දෙපාර්තමේන්තුව ස්ථාපිත කර තිබුණි. දෙපාර්තමේන්තුව විසින් ඉඩම් පරිහරණ සැලැස්ම සැකසීමට හා ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය නෛතික පසුබිම සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සකස් කර නොතිබුණි.

මිනින්දෝරුවරුන්ගේ විෂමාචාර පරීක්ෂා කිරීම හා නියාමනය

2002 අංක 17 දරන මැනුම් පනත ප්‍රකාරව, මැනුම් වෘත්තීය හා එහි ව්‍යවහාරයන් ක්‍රමවත්ව පවත්වා ගන්නා බවටත්, වෘත්තියේ යෙදෙන්නන් විසින් වෘත්තිය පැවැත්මේ ඉහළම ප්‍රමිතීන් පවත්වා ගනු ලබන බවටත් තහවුරු කිරීම අරමුණු කරගෙන ඉඩම් මැනුම් සභාව ස්ථාපිත කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ මිනින්දෝරුවරුන්ගේ වෘත්තීය විෂමාචාර පිළිබඳව මහජනතාව විසින් ඉදිරිපත් කර තිබුණු මුළු පැමිණිලි සංඛ්‍යාව 78 කින් සභාව විසින් පැමිණිලි 45 ක් හෙවත් පැමිණිලිවලින් සියයට 58 ක් පමණක් විසඳා තිබුණි. සභාවේ ලියාපදිංචි නොවී මැනුම් කටයුතු සිදු කරන පුද්ගලයින් සම්බන්ධව සොයා බැලීමට ප්‍රමාණවත් ක්‍රියා මාර්ගද අනුගමනය කර නොතිබුණි.

අභියෝගය

ජාතික පාසල්වල සීමාව ඉක්මවා සිසුන් ඇතුළත් කර ගැනීම

තාක්ෂණ විෂය ධාරාව සඳහා ගුරු පුරප්පාඩු පැවැතීම

විනය පරීක්ෂණ නිම නොකිරීම

ජාතික පාසල් විශාල සංඛ්‍යාවක අනුයුක්ත කාර්ය මණ්ඩලයේ කොටසකට කිසිදු කාර්යයක් පවරා නොතිබීම

පාසල්වල ගුරු පුස්තකාලාධිපති වරුන් 1,906 දෙනෙකු අවශ්‍ය සුදුසුකම් සපුරා නොතිබීම

ජාතික පාසල් 258 ක විදුහල්පති පුරප්පාඩු පිරවීමට අපොහොසත්වීම

අධ්‍යාපනය

ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව තුළ, ජාතික පොදු අරමුණු ඉටුකරගැනීම උදෙසා, වෙනස්වන ලෝකයට සරිලන සේ අධ්‍යාපනය ප්‍රතිනිර්මාණය කරමින්, ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ පුරෝගාමී වගකීම දරන්නා වශයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය, දෙපාර්තමේන්තු 02 ක් හා ව්‍යවස්ථාපිත ආයතන 04 ක් විසින් පහත සඳහන් කාර්යභාරයන් ඉටුකළ යුතුව පැවතුණි.

- ශ්‍රී ලාංකික ළමා සහ යෞවන පරපුරට, ආත්ම විශ්වාසයකින් සහ සාර්ථකත්වය පිළිබඳ විශ්වාසයකින් යුතුව, ලෝක තරඟකාරීත්වයට ප්‍රවේශවීමට හැකියාව ඇති කරවන අන්දමේ ජාතික අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය කිරීම.
- ශ්‍රී ලංකාව තුළ පවතින සියළුම පාසල් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූලව ක්‍රියාත්මක වන බව සාක්ෂාත් කරගැනීම සඳහා ඒවා අධීක්ෂණය කිරීම.
- අධ්‍යාපන විෂයයට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය, පසු විපරම් කිරීම හා ඇගයීම.
- ජාතික පාසල් සඳහා අවශ්‍ය භෞතික හා මානව සම්පත් සැපයීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- නොමිලේ පෙළපොත්, නිල ඇඳුම්, පාවහන් හා දිවා ආහාර ලබාදීම ආදී සිසු සුබසාධන සැලසීම.
- සමස්ථ අධ්‍යාපන පද්ධතිය තුළ හා සිසුන් අතර අධ්‍යාපනයෙහි ගුණාත්මක බව සහ විනය සහතික කරලීම.
- ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ, විදුහල්පති සේවයේ, ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ සහ ශ්‍රී ලංකා ගුරු සේවයේ පරිපාලන හා පිරිස් කළමනාකරණය කටයුතු කිරීම.
- බෞද්ධ හා පාලි අධ්‍යයන කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ පිරිවෙන් අධ්‍යාපනය නගා සිටුවීම.
- කියවීමෙන් සිසුන් සම්පූර්ණ කරලීම සඳහා පාසල් පුස්තකාල ප්‍රවර්ධනය හා සංවර්ධනය.
- රාජ්‍ය ලේඛන විධිමත් කළමනාකරණය හා සංරක්ෂණය කිරීම.
- විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සඳහා අධ්‍යාපන අවස්ථා තහවුරු කිරීම.

අමාත්‍යාංශය, දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන විසින් ඉහත කාර්යභාරයන් සාක්ෂාත් කරගැනීම සඳහා කටයුතු කිරීමේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

ප්‍රතිපාදන ඌන උපයෝජනය

සමාලෝචිත වර්ෂය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්යභාරයන් ඉටුකිරීම වෙනුවෙන් මූලධන වැය විෂයයන් 21 ක් හා පුනරාවර්තන වැය විෂයයන් 04 ක් සඳහා පිළිවෙළින් රු.මිලියන 5.46 ක් හා රු.මිලියන 4.81 ක් වශයෙන් එකතුව රු.මිලියන 10.27 ක ප්‍රතිපාදන කිසිදු කාර්යයක් සඳහා උපයෝජනය කර නොතිබුණි.

පාසල්වල අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් ඇතුළත් කිරීම

2015 ඔක්තෝබර් 14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය හා 2008 සැප්තැම්බර් 19 දිනැති අංක 37 දරන අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව ජාතික පාසලක ප්‍රාථමික ශ්‍රේණිවල සමාන්තර පන්තියක සිටිය යුතු උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව 40 ක්ද, ද්විතීයික ශ්‍රේණිවල සමාන්තර පන්තියක සිටිය යුතු උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව 45 ක්ද, 2018 වර්ෂයේ පළමු ශ්‍රේණියට 38 ක්ද, වශයෙන් උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව සඳහන් කර තිබුණි. නමුත් 2018 වර්ෂයේදී ජාතික පාසල් 73 ක් විසින් එම සීමාවන් ඉක්මවා සිසුන් 3,339 ක් ඇතුළත් කරගෙන තිබුණි.

වැඩ ආවරණය කිරීම සඳහා නිලධාරීන් පත්කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය ප්‍රකාරව නිත්‍ය පත්කිරීමක් සිදුකරන තෙක් තාවකාලික පදනමක් මත වැඩබැලීමේ නිලධාරියකු පත්කළ හැකිව තිබුණි. එසේ වුවද, වර්ෂ ගණනාවක සිට 2018 වර්ෂය අවසන් වන විට ජාතික පාසල් 353 කින් පාසල් 258 ක විදුහල්පති තනතුරු පුරප්පාඩු වී තිබුණු අතර, එම තනතුරුවල වැඩ ආවරණය කිරීම සඳහා නිලධාරීන් පත් කර තිබුණි. එම පුරප්පාඩු වූ තනතුරු 2018 දෙසැම්බර් 31 දින වන විටත් පිරවීමට අපොහොසත් වී තිබුණි.

තාක්ෂණ විෂය ධාරාව සඳහා ගුරු පුරප්පාඩු පැවතීම

සමාලෝචිත වර්ෂය අවසානය වන විට දිවයින පුරා තාක්ෂණික විෂය ධාරාව සඳහා ගුරු පුරප්පාඩු 166 ක් පැවතුණි. එම පුරප්පාඩු අතර ඉංජිනේරු තාක්ෂණ විෂය සඳහා ගුරු පුරප්පාඩු 35 ක්ද, තාක්ෂණය විද්‍යාව විෂය සඳහා ගුරු පුරප්පාඩු 117 ක් හා ජෛව පද්ධති තාක්ෂණවේදය සඳහා ගුරු පුරප්පාඩු 14 ක්ද පැවැතුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම පුරප්පාඩු පිරවීමට අධ්‍යාපන අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

විනය පරීක්ෂණ නිම නොකිරීම

අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික පාසල්, විද්‍යාපීඨ හා අමාත්‍යාංශයේ අනෙකුත් ආයතනවලට අදාළව විනය ගැටළු 397 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විසඳා අවසන් කර නොතිබුණි. මෙම විනය ගැටළු 128 ක් වර්ෂ දෙකකට අඩු කාලයක සිටද, ගැටළු 30 ක් වර්ෂ 2 ක සිට වර්ෂ 7 ක් දක්වා කාලයක සිටද, විනය ගැටළු 9 ක් වර්ෂ 7 කට අධික කාලයක සිටද පැවැත එමින් තිබුණි. මෙම විනය ගැටළුවලින් ගැටළු 42 ක් මූල්‍ය අක්‍රමිකතා පිළිබඳවද, ගැටළු 62 ක් පාසල්වලට ළමුන් ඇතිකිරීම පිළිබඳව හා ළමා අපචාර සම්බන්ධයෙන් විනය ගැටළු 19 ක්ද වී තිබුණි.

පාසල් ආදි ශිෂ්‍ය සංගම්

1964 නොවැම්බර් 20 දිනැති අංක 1964/27 දරන අධ්‍යාපන චක්‍රලේඛය හා 1996 ජූනි 21 දිනැති ආදි ශිෂ්‍ය සංගම් ලිපිය අනුව පාසල්වල සුබසාධනය හා කාර්යසාධනය ඉහළ නැංවීම වෙනුවෙන් ආදි ශිෂ්‍ය සංගම් පිහිටුවිය යුතු බව සඳහන් කර ඇත. එසේ හෙයින්, පාසලේ නම භාවිතා කරමින් ආදි ශිෂ්‍ය සංගම් විසින් රැස්කරනු ලබන අරමුදල් එම පාසල්වල සුබසාධනය හා කාර්යසාධනය වෙනුවෙන් මුළුමනින්ම හෝ වැඩි ප්‍රමාණයක් වැය කළ යුතුව තිබුණත්, 2018 වර්ෂයේදී පාසල් 18 ක ආදි ශිෂ්‍ය සංගම් විසින් රු.මිලියන 129 ක් රැස්කර තිබුණි. ඉන් පාසල් 08 ක් වෙනුවෙන් රු.මිලියන 24 ක් පමණක් වැය කර තිබුණි. පාසල් 09 ක ආදි ශිෂ්‍ය සංගම් විසින් රැස්කර තිබුණු රු.මිලියන 70 ක් එම පාසල්වල කිසිදු කටයුත්තක් වෙනුවෙන් වැයකර නොතිබුණි.

පාසල් ආරම්භ කිරීම හා වසා දැමීම

2018 වර්ෂයේ සංඛ්‍යා ලේඛන අනුව දිස්ත්‍රික් 21 ක පාසල් 101 ක් වසා දමා තිබුණි. ඉන් පාසල් 31 ක ප්‍රමාණවත් ශිෂ්‍ය සංඛ්‍යාවක් නොමැතිවීම හා පාසල් 45 ක රටේ පවතින තත්ත්වය යටතේ බව සඳහන් කර වසා දමා තිබුණි. එම වසා දමා තිබුණු පාසල්වල පරිහරණය සඳහා තිබුණු භෞතික සම්පත් පිළිබඳව කටයුතු කරන ආකාරය සම්බන්ධයෙන් පැහැදිලි ප්‍රතිපත්තියක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

සිසුන් දක්ෂ ක්‍රීඩකයින් බවට පත්කිරීමේ වැඩසටහන

කායික හා මානසික සමබරතාවයෙන් යුතු නිරෝගී පරපුරක් දැයට දායද කිරීම හා ක්‍රීඩා දක්ෂතා සහිත සිසුන් දක්ෂ ක්‍රීඩකයින් බවට පත්කිරීම සඳහා වූ අධ්‍යාපන අමාත්‍යාංශයේ ව්‍යාපෘති යෝජනාවකට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. අරමුණු 07 ක් මුල් කරගෙන 2016 වර්ෂයේ සිට ඉදිරි වර්ෂ 5 ක් තුළ එම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 18,394.5 ක් ඇස්තමේන්තු කර තිබුණි. 2016 වර්ෂයේදී එම වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණු අතර 2017 වර්ෂයේදී රු.මිලියන 250 ක් හා 2018 වර්ෂයේදී රු.මිලියන 300 ක ප්‍රතිපාදන ලැබී තිබුණි. 2018 වර්ෂය සඳහා සළසා තිබුණු රු. මිලියන 300 ක ප්‍රතිපාදනවලින් රු.මිලියන 99 ක් පමණක් වැඩසටහනේ කාර්යයන් සඳහා වැය කර තිබුණු නමුත්, අරමුණු ගත පරිදි වැඩ සටහන ක්‍රියාත්මක කර නොතිබුණි.

විශේෂ අධ්‍යාපන ඒකක

ජාතික පාසල් 112 ක හා පළාත් පාසල් 704 ක විශේෂ අධ්‍යාපන ඒකක පවත්වා තිබුණි. එම පාසල්වල විශේෂ අවශ්‍යතා සහිත සිසුන් 10,284 ක් ඉගෙනුම ලබමින් සිටියි. ජාතික පාසල්වල හා පළාත් පාසල්වල පවතින විශේෂ අධ්‍යාපන ඒකක සඳහා පිළිවෙලින් ගුරුභවතුන් 1,189 දෙනෙකුගේ හා ගුරුභවතුන් 597 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි. විශේෂ අධ්‍යාපන ඒකකයේ උගන්වනු ලබන ගුරුභවතුන්ගෙන් 158 දෙනෙක් හෙවත් උගන්වනු ලබන ගුරුභවතුන්ගෙන් සියයට 13 ක් වෙනත් විෂයයකට පත්වීම් ලද ගුරුභවතුන් වී තිබුණි. විශේෂ අධ්‍යාපනය සඳහා පුහුණුව සහ පත්වීම් ලද ගුරුභවතුන් 189 දෙනෙක් එම ඒකක නොමැති පාසල්වලත්, එම ඒකක තිබෙන පාසල්වල වෙනත් පන්ති කාමරවල ගුරුභවතුන් 54 දෙනෙක් උගන්වනු ලබයි. ඒ අනුව විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන්ට අවශ්‍ය ඉගැන්වීම් ලබාදීමට හැකි ගුරුවරුන්ගෙන් එම අවශ්‍යතාවය ඉටු වන පරිදි අනුයුක්ත කර නොතිබුණි.

පෞද්ගලික පාසල් පැවැත්වීම

1961 අංක 8 දරන උපකෘත පාඨශාලා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 25 වන වගන්තිය ප්‍රකාරව අවුරුදු 05 ක සිට අවුරුදු 14 ක් දක්වා වයස් කාණ්ඩයේ පසුවන ළමුන්ට අධ්‍යාපනය ලබා දීම සඳහා කිසිදු පුද්ගලයෙකුට පෞද්ගලික පාසල් ආරම්භ කළ නොහැකි බව සඳහන් කර තිබුණි. එම විධිවිධානයට අනුකූල නොවන අයුරින් ජාත්‍යන්තර හා පෞද්ගලික පාසල් විශාල සංඛ්‍යාවක් ආරම්භ කර තිබුණි. එම පාසල් 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ හෝ ආයෝජන මණ්ඩලය යටතේ හෝ පෞද්ගලික ආයතන ලෙස ලියාපදිංචි වී තිබුණි. ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූලව ජාත්‍යන්තර පාසල් අධීක්ෂණය කිරීම අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන අරමුණක් වී තිබුණත්, එම පාසල් ශ්‍රී ලංකාව තුළ මූලික අධ්‍යාපනය ලබා දෙන පාසල් ලෙස අධ්‍යාපන අමාත්‍යාංශය තුළ ලියාපදිංචි

වී නොතිබුණි. එමෙන්ම එම පාසල් සම්බන්ධ තොරතුරු අමාත්‍යාංශය විසින් රැස්කර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් පිළියෙල කර නොතිබුණි.

රජයේ පාසලක තිබිය යුතු අවම ගුණාත්මක හා ප්‍රමාණාත්මක පිරිවිතරවලින්වත් මෙම පෞද්ගලික පාසල් පෝෂිත මට්ටමක පවතින්නේද, එක් එක් මට්ටම් අනුව සිසුන් වෙත ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීම සඳහා සුදුසුකම් හා අත්දැකීම් ලත් ගුරු මණ්ඩලයකින් සමන්විත වන්නේද සහ අධ්‍යාපන ක්‍රමය තුළ කාලීනව සිදුවන වෙනස්කම් පිළිබඳ යාවත්කාලීන වන්නේද යන කරුණු අධීක්ෂණය කිරීමේ ක්‍රියාවලියක් අමාත්‍යාංශය විසින් සිදුකර නොතිබුණි.

ගුරු තුලනය, ස්ථාන මාරු හා කාර්යභාරයන් පැවරීම

ගුරු තුලනය නොකිරීම හේතුවෙන් ජාතික පාසල් 113 ක විෂයයන් 1,069 ක් වෙනුවෙන් ගුරු ඌනතාවයන් 1,359 ක් හා විෂයයන් 584 ක් වෙනුවෙන් ගුරු අතිරික්තය 898 ක් වී තිබුණි. එම අතිරික්ත හා ඌනතා තුලනය කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි. වාර්ෂික ස්ථාන මාරු ක්‍රමය ක්‍රියාත්මක කිරීම ආරම්භ කර තිබුණු නමුත්, තවදුරටත් ජාතික පාසල් 115 ක වර්ෂ 8 කට වැඩි කාලයක සිට ඉගැන්වීම් කටයුතුවල නියුක්ත ගුරුභවතුන් 2,276 දෙනෙක් සිටින අතර, ජාතික පාසල් 107 ක ගුරුභවතුන් 601 දෙනෙකු වෙත පත්වීම් ලද විෂයයට පරිබාහිර විෂයයන් පවරා තිබුණි. ජාතික පාසල්වල නියෝජ්‍ය හා සහකාර විදුහල්පතිවරුන් වෙත හා ගුරුභවතුන් වෙත පිළිවෙළින් කාල පරිච්ඡේද 10 ක් 12 ක් හා 35 ක් සතියකට වෙන් කළ යුතු වුවද, 2018 වර්ෂයේදී ජාතික පාසල් 164 ක කිසිදු කාර්යයක් පවරා නොතිබුණු නියෝජ්‍ය විදුහල්පතිවරු, සහකාර විදුහල්පතිවරු හා ගුරුභවතුන් සංඛ්‍යාව පිළිවෙළින් 139 දෙනෙක්, 42 දෙනෙක් හා 549 දෙනෙක් වී තිබුණි.

අ.පො.ස. උසස් පෙළ විෂයයන්හි ප්‍රතිඵල හා ගුරු ශක්‍යතා

2017 වර්ෂයේදී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, සංයුක්ත ගණිතය, තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය සහ තාක්ෂණය සඳහා විද්‍යාව යන විෂයයන් හැදෑරූ සිසුන්ගෙන් 1/3 කට ආසන්න ප්‍රමාණයක් විභාගය අසමත් වී තිබුණි. කෘෂි විද්‍යාව, කෘෂි තාක්ෂණය, ඉංජිනේරු තාක්ෂණය, ජෛව පද්ධති තාක්ෂණය හා තාක්ෂණය සඳහා විද්‍යාව යන විෂයයන්වල විශිෂ්ඨ සාමාර්ථ ලබා ගැනීම සියයට එකකටත් වඩා අඩු මට්ටමක පැවැතුණි. එය පිළිවෙළින් සියයට 0.82 ක්, 0.44 ක්, 1.11 ක්, 0.61 ක් හා 0.37 ක් වී තිබුණි. ඉංග්‍රීසි සාහිත්‍යය, ප්‍රංශ, රුසියානු හා ජපන් යන විදේශ භාෂා සඳහා ගුරු පුරප්පාඩු 52 ක් පැවතුණු අතර, රුසියානු හා ජපන් භාෂා සඳහා පසුගිය වර්ෂ පහක කාලය පුරාම ගුරුභවතුන් බඳවාගෙන නොතිබුණි. ඉංග්‍රීසි සාහිත්‍යය විෂයය සඳහා 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කිසිදු ගුරු පුහුණු වැඩසටහනක් පවත්වා නොතිබුණි.

සිසු අරුණ අධ්‍යාපනික අරමුදල

2001 වර්ෂයේදී සිසු අරුණ අධ්‍යාපනික අරමුදල ආරම්භ කර තිබුණි. 2003 අප්‍රේල් 29 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් වාර්තාවට අනුව අරමුදලේ ඇති ස්ථාවර තැන්පත්වල වටිනාකම රු.මිලියන 2.5 ක් සම්පූර්ණ වූ පසු ශිෂ්‍යත්ව ලබා දීමට අවශ්‍ය පියවර ගත යුතු බවට තීරණය කර තිබුණි. 2015 වර්ෂය අවසාන වන විට අදාළ ස්ථාවර තැන්පතුවල වටිනාකම රු.මිලියන 2.6 ක්

සම්පූර්ණ කර තිබුණු අතර, 2018 දෙසැම්බර් 31 දින වන විට එය රු.මිලියන 4.4 ක් වී තිබුණි. අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණු සීමාව 2015 වර්ෂය අවසාන වන විටද ඉක්මවා තිබුණ නමුත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ශිෂ්‍යාධාර පිරිනැමීමට කටයුතු කර නොතිබුණි. මෙම අරමුදල පිළිබඳව ප්‍රමාණවත් අධීක්ෂණයක් සිදු නොකිරීම හේතුවෙන්, අරමුදලේ නාමය කපා හැර ඇති බැවින් එහි දේපළ හා අයිතිවාසිකම් මහා භාණ්ඩාගාරය වෙත පැවරී තිබුණි.

පාසල් පුස්තකාල සංවර්ධනය

වර්තමානය වන විට දිවයිනේ පවතින මුළු පාසල් සංඛ්‍යාව 10,162 ක් වී තිබුණත්, ඉන් පාසල් 3,499 කට පමණක් ස්ථිර පුස්තකාල පහසුකම් පැවතුණු අතර කියවීමේ කාමර 2,185 ක් හා තාවකාලික පුස්තකාල 3,314 ක් පැවතුණි. 2018 වර්ෂයේදී අදියර 3 ක් යටතේ පළාත් 9 හි කළාප 98 ක විෂය අධ්‍යක්ෂවරු 80 දෙනෙකු රු.මිලියන 3.6 ක් වැයකර පුස්තකාල සංවර්ධනය පිළිබඳව පුහුණුව ලබා දී තිබුණි. නමුත්, එම පුහුණුවේ ප්‍රතිඵල පළාත් නිලධාරීන් මගින් පාසල් වෙත ලබා දී නොතිබුණි. පාසල්වල ගුරු පුස්තකාලාධිපතිවරුන් වශයෙන් 2,607 දෙනෙක් සේවයේ නියුක්තව සිටි අතර, ඉන් 1,906 දෙනෙක් ඒ සඳහා වන සුදුසුකම් සපුරා නොතිබුණි.

තිරසර සංවර්ධන අරමුණු ළඟා කරගැනීම

තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය අනුව එහි කාර්යයන්ට සම්බන්ධ ඉලක්ක ළඟා කර ගැනීමේ වැඩපිළිවෙළ සැලැසුම්වලට ඇතුළත් කර, එම සන්ධිස්ථානයන් හා ඉලක්කයන් වෙත ළඟා වීම පිළිබඳ මැන බැලීම සඳහා දර්ශක හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

විභාගවල ප්‍රතිඵල සහතික නිකුත් කිරීම

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) හා (උසස් පෙළ) විභාගවල ප්‍රතිඵල සහතික ලබා ගැනීම සඳහා දිනපතා විශාල පිරිසක් විභාග දෙපාර්තමේන්තුව වෙත පැමිණෙන බව නිරීක්ෂණය විය. දෙපාර්තමේන්තුව විසින් මුදල් අයකර නිකුත් කරනු ලබන ඉහළ ගුණාත්මකභාවයෙන් යුත් ප්‍රතිඵල සහතිකයට සමාන සහතිකයක් පාසල් මගින් නිකුත් කිරීමට කටයුතු නොකිරීම නිසා මෙම තත්ත්වය උද්ගත වී තිබුණි. එමෙන්ම එක්දින සේවය මගින් සහතික පත්‍ර ලබා ගැනීම සඳහා දිනකට විශාල පිරිසක් පැමිණෙන බැවින් සහතික පත්‍ර ශාඛාවට අනුයුක්ත නිලධාරීන්ගෙන් වැඩි පිරිසක් එක් දින සේවයේ කවුළුවල කටයුතු සඳහා අනුයුක්ත කර තිබුණි. එම හේතුවෙන් ප්‍රතිඵල සනාථ කිරීමේ කාර්ය සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් යොදවා ගැනීමට නොහැකි වී තිබුණි. 2018 දෙසැම්බර් 31 දින වන විට ප්‍රතිඵල 10,660 ක ප්‍රමාණයක සනාථ කිරීම් සිදු කර ගැනීමට නොහැකිව පැවැතුණි.

දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයේ දත්ත සහකාර තනතුරු 49 කින් තනතුරු 40 ක් පුරප්පාඩුව පැවැතුණත්, එම පුරප්පාඩු පුරවා ගැනීමට විභාග දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

පෙළ පොත් මුද්‍රණය කිරීම හා බෙදාහැරීම

2018 වර්ෂයේ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂය වෙනුවෙන් රු.මිලියන 3, 499.25ක් වටිනා පොත් 419 ක පිටපත් 39,714, 000 ක් රාජ්‍ය ආයතන 02කින් හා පෞද්ගලික මුද්‍රණකරුවන් 27 දෙනෙකුගෙන් මුද්‍රණය කරවා ගෙන තිබුණි. මෙහිදී කොමසාරිස්වරයෙකු හා නියෝජ්‍ය

කොමසාරිස්වරුන් දෙදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් නම් කර එම කමිටු නිර්දේශ මත අවස්ථා කිහිපයක දී මුද්‍රණකරුවන් හට පෙළ පොත් මුද්‍රණය සඳහා වගකීම් පවරා දී තිබුණ ද, ඒ සඳහා අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුවේ අවසරයක් ලබා ගෙන නොතිබුණි.

2017 මැයි 31 දිනැති අංක 09/2017 දරන අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්ගේ අභ්‍යන්තර චක්‍රලේඛයේ 9ඡේදයට අනුව පෙළ පොත් බෙදාහැරීම සම්බන්ධයෙන් ගබඩාවල අතිරික්ත පොත් ගබඩා කර තබා ගැනීමක් සිදු නොවන ලෙස අත්‍යවශ්‍ය පෙළ පොත් අවශ්‍යතාවය නිවැරදිව ගණනය කර ඉල්ලුම් කිරීමට පාසල් වෙත උපදෙස් දී තිබුණි .එහෙත් කොළඹ ප්‍රදේශයේ පාසල් 11 කට අවශ්‍යතාවය ඉක්මවා පෙළ පොත් 10,545 ක් දෙපාර්තමේන්තුව විසින් වැඩිපුර නිකුත් කර තිබුණි .

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6.3 මාර්ගෝපදේශය අනුව ශ්‍රී ලංකා ප්‍රමිත ආයතනය විසින් සකස් කරනු ලබන ප්‍රමිතීන් හැකි උපරිම ප්‍රමාණයෙන් භාවිතා කළ යුතුව තිබුණි. නමුත් තත්ත්ව පරීක්ෂණ පිරිවිතරයන් 04 කට අදාළව තත්ත්ව පරීක්ෂණ හා පරීක්ෂණ ක්‍රමයන් ක්‍රියාත්මක කර නොතිබුණි.

2018වර්ෂයේදී බෙදාහැරීම සඳහා නව විෂය නිර්දේශය අනුව සකස් කල 3ශ්‍රේණිය ඉංග්‍රීසි වැඩ පොත, ඉංග්‍රීසි ලිවීම් පොත සහ ඉංග්‍රීසි පෙළ පොත දෝෂසහිත වීම නිසා 2019වර්ෂයේදී නැවත වරක් සංශෝධනය කර තිබුණි .ඒ හේතුවෙන් 2018 වර්ෂයේ අවශ්‍යතාවයට වඩා වැඩිපුර මුද්‍රණය කළ රු.මිලියන 5.72ක් වටිනා පොත් 27, 275ක් සිසුන්ගේ භාවිතයට ගැනීමෙන් තොරව ඉවත් කර තිබුණි .

2018 පිරිවිතර කමිටු වාර්තාවේ 7ඡේදය අනුව 6,7,8 හා 9ශ්‍රේණිවල පෙළ පොත් නැවත භාවිතය සියයට 50ක් දක්වා වැඩි කිරීම හේතුවෙන් කඩදාසිවල ගුණාත්මකභාවය ඉහළ දැමීමට සහ දීප්තියේ අගය සියයට 85දක්වා ඉහළ දැමීමට තීරණය කර තිබුණි. 2017 වර්ෂයේදී 2018 වර්ෂය වෙනුවෙන් මුද්‍රණය කළ මුළු පොත් වර්ග 357 කින් 106 ක දීප්තිය වෙනස් වීම හේතුවෙන් රු.මිලියන 6.13ක දඩ මුදලක් අය කර තිබුණි. තවද 2019වර්ෂය වෙනුවෙන් 2018 වර්ෂයේදී මුද්‍රණය කරන ලද පොත්වල පිට කවර හා ඇතුළත කඩදාසිවල දෙපාර්තමේන්තුව නියම කර තිබුණු පිරිවිතරවලට අනුව මුද්‍රණ හා ගබඩා අනුමැතීන් ලබා දීමේ දී පරීක්ෂා කළ යුතු ඇදෙන සුළු බව (Tensile index) පරීක්ෂාව කිසිදු පොතක් සම්බන්ධයෙන් හෝ සිදු කර නොතිබුණි.

වාර්ෂික පොත් අවශ්‍යතාවය නිවැරදිව හඳුනා නොගැනීම නිසා අතිරික්ත පොත් තොග ඉහළ යාම මෙන්ම එම පොත් ගබඩා කිරීමේ දුර්වලතාවයන් හේතුවෙන් 2016, 2017 හා 2018යන වර්ෂයන්වලදී පෙළ පොත්, ගුරු අත් පොත් සහ අතිරේක පොත් 1,190, 691 ක ප්‍රමාණයක් අපහරණය කර තිබුණි.

තෙමහල් නේවාසිකාගාරයේ වැසිකිළි පද්ධතිය ඉදිකිරීම

2008 වර්ෂයේදී ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 27.85 ක්වූ ජාතික අධ්‍යාපන ආයතනයේ තෙමහල් නේවාසිකාගාරයේ වැසිකිළි පද්ධතියක් ඉදිකිරීම වෙනුවෙන් සැලැසුම් හා ඇස්තමේන්තු සකස් කිරීම සඳහා උපදේශක ගාස්තු ලෙස කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 5 ක්වූ රු.මිලියන 1.20 ක් ගෙවා තිබුණි. එම ගෙවීමෙන් පසු වර්ෂ 10 ක් ගතවී තිබුණත් ඉදිකිරීම කටයුතු 2018 දෙසැම්බර් 31 වන විටත් ආරම්භ කර නොතිබුණි.

කම්කරු හා වෘත්තීය සම්බන්ධතා

වෘත්තීය සුරක්ෂිතා අංශය සතු රසායානාගාර පරිශ්‍ර දෙක භාවිතයට නොගැනීම

අධිකරණය විසින් නඩු තීන්දු මගින් සේවක අර්ථසාධක අරමුදල වෙත යොමු කරන ලද මුදල් සේවකයන්ට නොගෙවා දෙපාර්තමේන්තුවේ රඳවා ගැනීම

අක්‍රීය නඩු **4,921** ක් පැවැතු අතර, එම නඩුවලින් රු.මිලියන **1,548** ක් අය කර ගත යුතුව තිබීම.

කම්කරු වෘත්තීය සමිති සබඳතා

ඵලදායි සහ කාර්මික ආරවුල්වලින් තොර කාර්මික සබඳතාවක් ඇතිකිරීමේ අපේක්ෂාවෙන් කම්කරු, වෘත්තීය සබඳතා අමාත්‍යාංශය හා ඒ යටතේ දෙපාර්තමේන්තු දෙකක් හා ව්‍යවස්ථාපිත මණ්ඩල/ආයතන 03 ක් විසින් පහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි.

- කම්කරු හා වෘත්තීය සමිති සබඳතා විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම
- සේවක අර්ථසාධක අරමුදල, පෞද්ගලික අර්ථසාධක අරමුදල සහ පෞද්ගලික විශ්‍රාම ගැන්වීමේ ක්‍රම පරිපාලනය කිරීම
- ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන්, සේවක පරිපාලනය සහ සුබසාධනය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම
- ජාත්‍යන්තර කම්කරු සංවිධානය සහ ජාත්‍යන්තර සමාජ ආරක්ෂණ සංවිධානය සමඟ අන්තර් සහයෝගීතාව පවත්වා ගැනීම
- වෘත්තිය සමිති ලියාපදිංචි කිරීම සහ රාජ්‍ය සහ පෞද්ගලික අංශවල සියළුම වෘත්තිය සමිතිවල කටයුතු රටේ සංවර්ධනයට යොදා ගැනීම සඳහා අවශ්‍ය සාධනීය පියවරයන් හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම
- ජාතික මිනිස්බල හා රැකී රක්ෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම
- වෘත්තිය සහ රැකියා මාර්ගෝපදේශ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- කාර්මික සබඳතා හා කාර්මික ආරවුල් නිරාකරණය කිරීම
- කම්කරු සබඳතාවලට අදාළ නීති රීති සම්පාදනය සහ නියාමනයට අදාළ කටයුතු කිරීම

අමාත්‍යාංශය, දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන විසින් ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම පිළිබඳව සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

ශ්‍රී ලංකාවේ වෘත්තීය ස්වස්ථතාව හා සෞඛ්‍යය

අනතුරු හා උපද්‍රවයන්ගෙන් තොරව සෞඛ්‍යාරක්ෂිත සේවා පරිසරයක් ගොඩනැගීම සේවකයන්ගේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය ඉහළ නැංවීමට ඉවහල් වේ. එම අරමුණු ඉටු කර ගැනීම සඳහා 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥා පනත මගින් නෛතික ප්‍රතිපාදන සේවායෝජකයන් වෙත ලබාදී තිබුණි. ශ්‍රී ලංකාවේ වෘත්තීය ස්වස්ථතාව හා සෞඛ්‍ය පිළිබඳ සිදු කරන ලද නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

- කර්මාන්තශාලා ආඥා පනතේ 13(2) වගන්තිය ප්‍රකාරව කර්මාන්තශාලා සඳහා ප්‍රමාණවත් ආලෝකය ලබාදීමේ උපමාන, අංක 14577 දරන 1965 දෙසැම්බර් 04 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ නියම කර තිබුණි. එම නියමය වර්තමානයට ගැලපෙන ආකාරයට යාවත්කාලීන කර නොතිබුණි. තවද, කර්මාන්තශාලා ආඥා පනතේ 12 (2) වගන්තිය ප්‍රකාරව කර්මාන්තශාලා සඳහා ප්‍රමාණවත් වාතාශ්‍රය ලබාදීමේ උපමාන අමාත්‍යවරයා විසින් නියම කර ගැසට් පත්‍රයේ පළ කළ යුතු වුවත් එසේ කර නොතිබුණි.

- කම්කරු දෙපාර්තමේන්තුවේ වෘත්තීය සුරක්ෂිතතා අංශය සතුව රසායනාගාර පරිශ්‍ර 02 ක් පවතින නමුත් ඒවා භාවිතයට ගැනීමට හැකිවන පරිදි නඩත්තු කර නොතිබුණි. මෙම රසායනාගාරවලින් සේවා නියුක්තිකයින් සඳහා නොමිලේ රුධිර පරීක්ෂණයන් සිදු කර තිබුණත්, 2004 වර්ෂයෙන් පසුව නොමිලේ රුධිර

පරීක්ෂණ සිදුකිරීම නවතා තිබුණි. ඒ වෙනුවෙන් භාවිතා කළ රසායනාගාර උපකරණ අබලන්ව රසායනාගාර පරිශ්‍රය තුළ පැවතිණි. තවද, අනුමත කාර්ය මණ්ඩලයේ පර්යේෂණ සහකාර තනතුරු 03 ක පුරප්පාඩුව පැවැතුණි.

- ශ්‍රී ලංකාවේ වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ 2009 අංක 38 දරන ජාතික වෘත්තීය සහ සෞඛ්‍ය පිළිබඳ ආයතන පනත මගින් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය පිහිටුවා තිබුණි. එහි ප්‍රධාන පරමාර්ථයක් වන වෘත්තීය ආරක්ෂණ හා සෞඛ්‍ය ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රමිත 2018 වර්ෂය අවසාන වනවිටත් ස්ථාපිත කර නොතිබුණි.

සේවක ප්‍රතිලාභ නිරවුල් කිරීම

2011 වර්ෂයේ සිට 2018 නොවැම්බර් මාසය දක්වා අධිකරණය විසින් නඩු තීන්දු මගින් සේවක අර්ථසාධක අරමුදල වෙත යොමු කරන ලද මුදලින් සේවකයින්ට නොගෙවූ එකතුව රු.මිලියන 299.35 ක වූ මුදල් ශේෂයක් ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් ගිණුමට බැර නොකර, කම්කරු දෙපාර්තමේන්තුව විසින් රඳවාගෙන තිබුණි. 2011 වර්ෂයේදී එසේ රඳවා ගෙන තිබුණු ශේෂය රු.මිලියන 1.11 ක් වූ අතර 2018 වර්ෂය වන විට එම ශේෂය රු.මිලියන 219.34 ක් දක්වා වාර්ෂිකව වැඩිවෙමින් පැවැතුණි. විස්තර රූපසටහන 45 හි දැක්වේ.



රූපසටහන 45 - අධිකරණය විසින් නඩු තීන්දු මගින් ලබා දී තිබුණු මුදල

මූලාශ්‍රය - සේවක අර්ථසාධක අරමුදල විසින් විගණනයට ඉදිරිපත් කළ තොරතුරු

- සේවායෙන් විසින් අධිකරණයේ තැන්පත් කරන ලද මුදල්, කොටස් වශයෙන් චෙක්පත් මාර්ගයෙන් කම්කරු කොමසාරිස් වෙත එවනු ලබන අතර එම මුදල් සඳහා සකස් කළ “C” වාර්තා හා රික්විෂිසන් පත්‍රවල පැවති විවිධ දුර්වලතා නිසා ගෙවීම් කිරීමට නොහැකිව, නඩු 181 කට අදාළව රු.මිලියන 93.09 ක ශේෂයක් පැවැතුණි.

- කම්කරු කාර්යාල විසින් නඩු මගින් අයකර ගෙන තිබුණු, සේවක අර්ථසාධක අරමුදල් නොවන අනෙකුත් අයකර ගැනීම්වලින් රු.මිලියන 409.76 ක් 2019 ජූලි 01 දින වන විටත් සේවකයන්ට නොගෙවා රඳවා ගෙන තිබුණි.

- අධිකරණය විසින් රැස්කරගත් මුදල් දෙපාර්තමේන්තුව වෙත එවීමේදී නඩු අංකය පමණක් සඳහන් කරන අතර, අදාළ කම්කරු කාර්යාලය සඳහන් කර නොතිබීම හේතුවෙන් එම මුදල ගෙවිය යුතු සේවකයින් නිශ්චිතව හඳුනාගැනීමට අපහසු වී තිබුණු අතර ඊට විශාල කාලයක් වැය කිරීමට සිදු වී තිබුණි. නමුත් අධිකරණය විසින් එසේ මුදල් එවීමේදී අදාළ කම්කරු කාර්යාලය හඳුනාගෙන සඳහන් කර තිබුණද, 2019 ජූලි 01 දින

වන විටත් නොගෙවන ලද රු.මිලියන 0.79 ක මුදලක් පැවැතුණි.

- ශ්‍රී ලංකා මහ බැංකුවේ දායක මුදල් ගිණුමෙහි රඳවා ගෙන තිබුණු සේවායතනවල දායක මුදල් ගිණුම්ගත කිරීමට කම්කරු කාර්යාල හරහා කඩිනම් පියවර ගන්නා බවට මහ බැංකුව සමඟ පැවති සාකච්ඡාවකදී එකඟවී තිබුණි. 2018 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 10 කට වැඩි ශේෂයයන් සහිත ආයතන කිහිපයක් පැවැති අතර නිවැරදි සී වාර්තා නොලැබීම මත එම මුදල් ගිණුම්ගත නොකර පැවැතුණි.

- උසාවි තීරණයන් ලද හා ප්‍රතිලාභීන්ගේ ගිණුම්වලට බැර කළ යුතුව තිබුණත්, 'C' වාර්තාවල අඩුපාඩු නිසා සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එසේ බැර කර නොතිබූ රු.මිලියන 43.69 ක් පැවතිණි.

කම්කරු පරීක්ෂණවල ප්‍රමාණවත් භාවය

දිස්ත්‍රික් කම්කරු කාර්යාල 40 කට අදාළව පරීක්ෂා කළ යුතු සමස්ථ ආයතන 146,468 කින් සමාලෝචිත වර්ෂයේදී ආයතන 75,086 ක් එනම්, සියයට 51 ක් පරීක්ෂා කර නොතිබුණි. ඒ අතරින් මහරගම, බටහිර කොළඹ, අනුරාධපුරය, උතුරු කොළඹ, ජාඇල, නුවරඑළිය යන දිස්ත්‍රික් කම්කරු කාර්යාලවල පරීත්ෂාවට ලක්නොවූ ආයතනවල ප්‍රතිශතය පිළිවෙලින් සියයට 84, 80, 64, 66, 65,ක් හා 75 ක් වී තිබුණි.

මහජන පැමිණිලි හා පෙත්සම් සම්බන්ධයෙන් ක්‍රියාකිරීම

දිස්ත්‍රික් කම්කරු කාර්යාල 40 කට අදාළව සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති හා සමාලෝචිත වර්ෂයේදී ලැබූ විවිධ මහජන පැමිණිලිවල එකතුව 24,972 ක් වී තිබුණි. 2011 අප්‍රේල් 29 දිනැති අංක 06/2011 දරන කම්කරු දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය ප්‍රකාරව දින 14 ක් තුළ පැමිණිළි විසඳිය යුතුව තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් පැමිණිළි 10,064 ක් හෙවත් සියයට 40 ක ප්‍රමාණයක් විසඳා නොතිබුණි.

අක්‍රිය නඩු

2018 දෙසැම්බර් 31 දිනට මුළු අක්‍රිය නඩු සංඛ්‍යාව 4,921 ක් වූ අතර ඒ යටතේ රු.මිලියන 1,547.62 ක් අයකර ගත යුතුව තිබුණි. එම නඩුවලින් වර්ෂ 05 කට වැඩි කාලයක සිට ගොනුකළ නඩු 3,186 ක් වී තිබුණි. එය සමස්ථ නඩු සංඛ්‍යාවෙන් සියයට 65 ක ප්‍රමාණයක් විය. තවද, විවෘත වරෙන්තු ලෙස නඩු ගොනු 2,994 ක් පැවැති අතර ඒ යටතේ රු.මිලියන 933 ක් අයකර ගතයුතුව තිබුණි. ඉන් වර්ෂ 05 ට වැඩි කාලයක සිට නඩු ගොනු 2,047 ක් පැවැත එමින් තිබුණු අතර එය සමස්ථ සංඛ්‍යාවෙන් සියයට 68 ක් වී තිබුණි.

සේවක වන්දි නිරවුල් කිරීම

2013 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා ආපදාවකට හෝ මරණයට පත්වන සේවකයන් වෙනුවෙන් වන්දි කොමසාරිස් කාර්යාලය විසින් සේවා යෝජකයන්ගෙන් අයකර ගෙන තිබුණු රු.මිලියන 17.29 ක් 2018 දෙසැම්බර් 31 වන විටත් විවිධ හේතු දක්වා හිමිකරුවන් වෙත නොගෙවා රඳවා ගෙන තිබුණි. වයස් පූර්ණත්වයට පත් වූ බාලවයස්කරුවන් වෙත නිදහස් කළ යුතුව තිබුණු වර්ෂ 01 ක සිට වර්ෂ 25 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එන රු.මිලියන 9.96 ක් වටිනා ගිණුම් 384 ක් වන්දි කොමසාරිස් කාර්යාලයේ විසින් 2019 පෙබරවාරි 14 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

සාමාජිකයන් නැවත ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘතිය

- සාමාජිකයින් නැවත ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘතියේ පළමු අදියර 2007/2008 වර්ෂයේදීද, දෙවන අදියර 2010/2011

වර්ෂයේදීද, තෙවන අදියර 2016/2017 වර්ෂයේදී ද ක්‍රියාත්මක කර තිබුණි. මේ සඳහා 2008 වර්ෂයේ සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා කම්කරු දෙපාර්තමේන්තුවේ වාර්ෂික ඇස්තමේන්තු මගින් සලසා තිබුණු ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 247.1ක් වැය කර තිබුණි. නමුත් ඇඟිලි සලකුණු ලබාගත් සාමාජිකයන් ගණන ඇස්තමේන්තුගත සාමාජික සංඛ්‍යාවෙන් එක් එක් අදියර යටතේ පිළිවෙලින් සියයට 38 ක්, සියයට 25 ක් හා සියයට 14 ක් වැනි අවම මට්ටමක පැවතුණි.

- Kiosk යන්ත්‍ර සවි කිරීමේ ව්‍යාපෘතියේ පළමු අදියර යටතේ 2008 දෙසැම්බර් මාසයේදී රු.මිලියන 12.61 ක් වැයකර කාඩ්පත් 15,000 ක් හා රු.මිලියන 2.75 ක් වැයකර Kiosk යන්ත්‍ර 05 ක් මිලදී ගෙන තිබුණි. කාඩ්පත්වල සාමාජික නම, ජාතික හැඳුනුම්පත් අංකය ආදී තොරතුරු මුද්‍රණය කිරීමෙන්ද අනතුරුව සාමාජිකයන්ට බෙදාහැරීමෙන් තොරව 2018 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 10 ක් මුළුල්ලේ ගබඩා කර තිබුණි. තවද, එලෙස මිලදීගත් Kiosk යන්ත්‍ර ද මිලදීගත් දින සිටම ක්‍රියාත්මක වූ බවට තොරතුරු අනාවරණය නොවූ බැවින් ව්‍යාපෘතියේ පළමු අදියර යටතේ වැය කළ මුදල නිෂ්ඵල වී තිබුණි. තවද, දෙවන අදියර යටතේ 2015 වර්ෂයේදී රු.මිලියන 14.92 ක් වැයකර මිලදීගෙන තිබු යන්ත්‍ර 30 කින් 2018 දෙසැම්බර් 31 දින වන විට යන්ත්‍ර 10 ක් අක්‍රියව පැවතුණි.

නඩු පැවරීමෙන් අයකරගත් මුදල් නිරවුල් නොකිරීම

සේවක අර්ථසාධක අරමුදල වෙත දායක මුදල් එවා නොතිබුණු සේවායෝජකයන්ට එරෙහිව නඩු පැවරීමෙන් අයකර ගෙන තිබුණු 2018 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 301.47 ක් සාමාජික ගිණුම්වලට බැර නොකර කම්කරු දෙපාර්තමේන්තුවේ තැන්පත් ගිණුමක 2011 වර්ෂයේ සිට රඳවා ගෙන තිබුණි. එම මුදල් තැන්පත් ගිණුමේ රඳවා ගැනීම නිසා සාමාජිකයන්ට හිමිවිය යුතු පොලී ආදායම අහිමි වී තිබුණි.

නිරවුල් නොකරන ලද ප්‍රතිලාභ

ප්‍රතිලාභ ලබාගැනීම සඳහා සාමාජිකයන් විසින් දිස්ත්‍රික් කම්කරු කාර්යාල 18 කට 2016 ජනවාරි 01 දින සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය තුළ ඉදිරිපත් කර තිබුණු අයදුම්පත් අතරින් රු.මිලියන 17.92 ක් වූ ප්‍රතිලාභ අයදුම්පත් 112 ක ගෙවීම් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කර තිබුණු අතර ඉන් අනතුරුව විවිධ හේතු මත ඒවා ප්‍රතික්ෂේප කර තිබුණි. එම අයදුම්පත් අතරින් අයදුම්පත් 90 ක් හෙවත් මුළු අයදුම්පත් සංඛ්‍යාවෙන් සියයට 80 ක් 2019 මාර්තු 01 දින වන විට මාස 06 ක සිට වර්ෂ 03 ක් දක්වා කාල පරාසයක ප්‍රමාදයන් සිදු වී තිබුණත්, ඒවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

පරිසරය

උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය නියමිත කාල රාමුව තුළ ක්‍රියාත්මක කිරිමට නොහැකිවීම

ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ කසල රදවන ඉදිකිරිම වර්ෂය අවසන් වන විටත් ආරම්භ නොකිරිම.

පිළිසරු ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීමට අපේක්ෂිත කොම්පොස්ට් අංගන 30 ක් ඉදිකිරීමට කටයුතු කර නොතිබීම.

පරිසරය

තිරසාර පරිසරයක් උදෙසා ක්‍රියාත්මක වීම සඳහා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය යටතේ දෙපාර්තමේන්තු දෙකක් හා ව්‍යවස්ථාපිත ආයතන 08 ක් ස්ථාපිත කර තිබුණි. එම ආයතනවලින් පහත සඳහන් කාර්යභාරයන් ඉටුකළ යුතුව තිබුණි.

- පරිසර ක්ෂේත්‍ර සඳහා ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය කිරිම
- වර්තමාන හා අනාගත පරපුර උදෙසා පරිසරය සුරැකීම
- පරිසර දූෂණය මැඩලීම පිණිස වැඩසටහන් සම්පාදනය කිරීම හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම
- සමුද්‍ර දූෂණ නිරාවරණ කටයුතු සහ නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
- වනාන්තර, වන සතුන් හා තුරුලතා ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය
- රටේ දැව සපුරාලීම සඳහා වාණිජ වනවගා ප්‍රවර්ධනය
- මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය සහ වෙළඳාම ප්‍රවර්ධනය හා නියාමනය
- වෙරළ සංරක්ෂණය හා ආරක්ෂණය

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන විසින් ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරිම පිළිබඳව සිදුකළ නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දැක්වේ.

උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය

උමාඔය ද්‍රෝණියේ පාරිසරික හා අනෙකුත් ජල අවශ්‍යතාවලට බලපෑමක් ඇති නොවන අයුරින් එම ද්‍රෝණියේ සිට ජල ඌණතාවයෙන් පෙළෙන දක්ෂිණ කළාපයේ කිරිදිඔය ද්‍රෝණියට ජලය ඝන මීටර් මිලියන 145 ක් වාර්ෂිකව හැරවීම ප්‍රධාන අරමුණ කර ගෙන ශ්‍රී ලංකා රජය හා ඉරාන රජය අතර අවබෝධතා ගිවිසුමක් 2007 නොවැම්බර් 27 දින අත්සන් කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය වන මුදල් ඉරාන අපනයන සංවර්ධන බැංකුව (EDBI) මගින් එ.ජ.ඩො.මිලියන 450.00 ක්ද, ශ්‍රී ලංකා රජය ලබාදෙන එ.ජ.ඩො. මිලියන 79.06 ක් හෙවත් රු.මිලියන 15,474.25 කින් සමන්විත වේ. ව්‍යාපෘතියේ සියළුම ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීම හෝ නිම කිරීම නියමිත කාල රාමුව තුළ සිදුකිරීමට නොහැකි වීම හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලබාගැනීමට නොහැකි වී තිබුණි.

ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය

ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදලේ කොරියානු ණය ආධාර මත ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එ.ජ.ඩො. මිලියන 41.89 ක් වී තිබුණි. මේ සඳහා මුල්‍යාධාර වර්ෂ 10 ක සහන කාලයකින් පසුව වර්ෂ 40 කින් ගෙවිය යුතු වන පරිදි සියයට 0.15 ක් වූ වාර්ෂික පොලියක් මත එ.ජ.ඩො.මිලියන 33.54 ක ණය මුදලක් කොරියානු ණය ආධාරය මත ලබා ගෙන තිබුණි. ව්‍යාපෘතියේ දේශීය අරමුදල් ප්‍රතිපාදනය එ.ජ.ඩො. මිලියන 8.35 ක් වී තිබුණි. 2013 ජූලි 23 දින අරමුදල හා ශ්‍රී ලංකා රජය ණය ගිවිසුමට එළඹ තිබුණි. මෙම වැඩසටහන මගින් වර්ෂ 04 ක් ඇතුළත පොකුරු ක්‍රමය යටතේ පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල ජනනය වන කසළ අවසාන ලෙස බැහැර කිරීම සඳහා පහසුකම් සැපයිය යුතුව තිබුණි. එම අරමුණ ඉටුකර ගැනීම

සඳහා සනීපාරක්ෂක කසළ රඳවන 04 ක් අනුරාධපුරයේ කිරික්කුලම, හික්කඩුව මොන්රෝවියාවත්ත, පානදුර මාලමුල්ල හා උඩුනුවර ගොනාඩිකාවත්ත යන ස්ථානවල ඉදිකිරීමට සැලැසුම් කර තිබුණි.

විධිමත් ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර සනීපාරක්ෂක කසළ රඳවන සඳහා ස්ථාන තෝරා ගැනීමට ව්‍යාපෘතිය ආරම්භයේදීම කටයුතු කර නොතිබුණි. පානදුර, මාලමුල්ල, උඩුනුවර හා ගොනාඩිකාවත්ත ඉදිකිරීම් වෙනුවට යාපනය, කිරීමලේ, මැදිරිගිරිය හා යුධගනාව යන ස්ථානවල මෙම කසල රඳවන ස්ථාපිත කිරීමට පමණක් ව්‍යාපෘතිය ආරම්භ කර වර්ෂ 2 ක පමණ කාලයක් ගත වී තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත අරමුණු කාලාණුරූපීව හා ඵලදායී ලෙස ළඟා කර ගැනීමට නොහැකි වී තිබුණු අතර කසළ රඳවන ඉදිකිරීම් කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ආරම්භ කර නොතිබුණි.

පිළිසරු ව්‍යාපෘතිය

පිළිසරු ව්‍යාපෘතිය මගින්, නිසි සම්පත් සංරක්ෂණය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය තහවුරු කිරීම, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් අදාළ පුද්ගලයින්ගේ දැනීම හා දක්ෂතා වර්ධනය කිරීම, ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යපෘති ක්‍රියාත්මක කිරීම, වැඩසටහන් නිරීක්ෂණය කිරීම, පහසුකම් සැපයීම, අවශ්‍ය මූලික ප්‍රතිපාදන සැපයීම, ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණ බැංකු ක්‍රමයක් ස්ථාපිත කිරීම, නිසි පරිදි ඝන අපද්‍රව්‍ය කළමනාකරණය නොකරන පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම ප්‍රධාන අරමුණු වේ. වර්ෂ 06 ක් සඳහා වූ අරමුදල් සැලැස්ම අනුව ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු.බිලියන 5.6 ක් වී තිබුණි. ඉන් රු. බිලියන 2.675 ක් මහා භාණ්ඩාගාරයෙන්ද, රු.බිලියන 03 ක් 2008 වාර්ෂික අයවැය ලේඛනය මගින් හඳුන්වාදී තිබුණු "හරිත බද්ද" මගින්ද ලබා ගැනීමට අපේක්ෂා කර තිබුණි.

ව්‍යාපෘතිය ආරම්භයේ සිට සමාලෝචිත වර්ෂය වන විට, කොම්පෝස්ට් අංගන 139 ක් අතරින් ක්‍රියාත්මක කොම්පෝස්ට් අංගන 108 ක් ද ඉදිකරමින් පවතින අංගන 12 ක් ද, අක්‍රිය තත්ත්වයේ පවතින අංගන 14 ක් ද, ඉදිකිරීම් නොකර නැවත මුදල් ලබාදුන් අංගන 02 ක් හා ඉදිකිරීම් අතරමග නතර කළ අංගන 14 ක් ද පැවතුණි. ක්‍රියාකාරී කොම්පෝස්ට් අංගන විශාල ප්‍රමාණයක් පළාත් පාලන ආයතන මගින් නිසි ලෙස ක්‍රියාත්මක නොකිරීම හා ව්‍යාපෘතිය විසින් නිසි ලෙස පසු විපරම් නොකිරීම හේතුවෙන් ප්‍රශස්ථ මට්ටමින් ක්‍රියාත්මක වී නොතිබුණි.

විදේශ කටයුතු

කැන්බරා ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය සතු ගොඩනැගිල්ල

දූත මණ්ඩල කාර්යාලය සඳහා කුලී ගෙවීම

කොන්සියුලර් ජෙනරාල් කාර්යාලය අළුත්වැඩියා කිරිම

තානාපති කාර්යාල සඳහා අක්මුදල් යැවීම

විදේශ කටයුතු

අනොන්‍ය ප්‍රතිලාභ අත්පත් කර ගන්නා ලොව මිත්‍රශීලී රටක් වීම විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් අපේක්ෂා කරන ප්‍රතිඵලය වී ඇත. එම ප්‍රතිඵලය අත්පත් කර ගැනීම සඳහා අමාත්‍යාංශය දේශීය වශයෙන් අංශ 18 ක් සහ 2018 වර්ෂය අවසාන වනවිට විදේශීය වශයෙන් තානාපති කර්යාල 37 ක්, මහ කොමසාරිස් කාර්යාල 13 ක්, නියොජ්‍ය මහ කොමසාරිස් කාර්යාල 01 ක්, කොන්සියුලර් ජනරාල් කාර්යාල 13 ක් , එක්සත් ජාතීන් සඳහා නිත්‍ය දූත මණ්ඩල 02 ක් හා නියෝජිත කාර්යාල 01 ක් වශයෙන් ගෝලීයව ව්‍යාප්ත වී ඇති දූත මණ්ඩල ජාලයක් විසින් පහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි.

- විදේශ කටයුතු විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
- ශ්‍රී ලංකාව පිළිබඳ හිතකර ප්‍රතිරූපය නංවාලීම සහ ජාත්‍යන්තර වශයෙන් එල්ල වන එදිරිවාදී ප්‍රචාරයන් සම්බන්ධයෙන් නිසි ප්‍රතිචාර දැක්වීම.
- විදේශ රටවල් සමඟ රාජ්‍ය දූත සබඳතා පවත්වා ගෙන යාම ප්‍රඥප්ති, ගිවිසුම් සහ සම්මුතීන් පිළිබඳ සාකච්ඡා කිරීම.
- රාජ්‍යතාන්ත්‍රික විශේෂ මුක්ති හා වරප්‍රසාද ලබාදීම.
- විදේශ වෙළෙඳ හා සංචාරක කටයුතු ප්‍රවර්ධනය සඳහා සහාය වීම.
- භූ දේශපාලන ප්‍රවණතා අධ්‍යයනය කිරීම සහ එම ප්‍රවණතා පිළිබඳව රජයට උපදෙස් දීම.
- විදේශ රටවල වාසය කරන ශ්‍රී ලාංකිකයින්ගේ සුබසාධනය පිළිබඳ අවශ්‍ය පියවර ගැනීම.

අමාත්‍යාංශය විසින් ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීමේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

කැන්බරා ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය සතු ගොඩනැගිල්ල

ඕස්ට්‍රේලියාවේ කැන්බරා ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයට අයත් ඕස්ට්‍රේලියානු ඩොලර් 2,589,000 ක් වටිනා ගොඩනැගිලි 02 ක් 2012 වර්ෂයේ සිට සහ 2007 වර්ෂයේ සිට භාවිතයෙන් ඉවත් කර තිබුණි. ඉන් එක ගොඩනැගිල්ලක් මහ කොමසාරිස්වරයාගේ නිල නිවස බවට පත්කිරීමට 2017 සැප්තැම්බර් 26 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබාදී තිබුණි. ඒ සඳහා 2018 වර්ෂයේ අයවැය මඟින් රු.මිලියන 260 ක ප්‍රතිපාදන ලබාදී තිබුණ ද ඒ සම්බන්ධයෙන් කිසිදු උපයෝජනයක් කර නොතිබුණි.

දූත මණ්ඩල කාර්යාලය සඳහා කුලි ගෙවීම

සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 93 ක් කැනඩාවේ ටොරොන්ටෝ සහ ඔටාවාවල පිහිටි දූත මණ්ඩල කාර්යාල හා නිල නිවාස සඳහා (ඔටාවා නිල නිවස හැර) කුලී වශයෙන් වැය කර තිබුණි. එම වියදම් අවම කර ගැනීමට විකල්පයක් වශයෙන් දේපල මිලදී ගැනීමේ හැකියාව පිළිබඳව අවධානය යොමු කිරීමට කටයුතු කර නොතිබුණි.

මහ කොමසාරිස් නිල නිවස අලුත්වැඩියා කිරීම

වර්ෂ 100 ක් පමණ පැරණි කැනඩාවේ ඔටාවා මහ කොමසාරිස් නිල නිවස අලුත්වැඩියා කිරීම සඳහා විකල්ප ක්‍රියාමාර්ගයන් පිළිබඳව සොයා බැලීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ දී රු.මිලියන 26.71 වැය කර තිබුණි.

කොන්සියුලර් කාර්යයන් වෙනුවෙන් අය කරනු ලබන ගාස්තු

විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල මගින් ඉටුකරනු ලබන කොන්සියුලර් කාර්යයන් සඳහා අය කරනු ලබන ගාස්තු 2018 මාර්තු 01 දින සිට සංශෝධනය කර ගැසට් පත්‍රයේ පළ කළ දැන්වීම් මගින් ප්‍රකාශයට පත් කර තිබුණි. නමුත් එම ගැසට් නිවේදනයේ සඳහන් මුදල් ඒකක භාවිතා නොකරනු ලබන රටවල්වල අදාළ මුදල් ඒකකවලට පරිවර්තනය කළ යුතු ආකාරය පිළිබඳව පොදු ක්‍රමවේදයක් නිශ්චය කර නොතිබුණි. එම හේතුවෙන් විවිධ නිර්ණායක පදනම් කර ගෙන පරිවර්තිත අනුපාත තීරණය කර තිබුණි.

කොන්සියුලර් ජෙනරාල් කාර්යාලය අලුත්වැඩියා කිරීම

2016 වර්ෂයේ දී රු.මිලියන 28.16 ක් වැය කර මුම්බායි කොන්සල් ජෙනරාල් කාර්යාලය අලුත්වැඩියා කර තිබුණි. එසේ වුවද, එම අලුත්වැඩියා කටයුතු නිසිපරිදි ඉටු නොකිරීම හේතුවෙන් 2018 වර්ෂයේ දී නැවත අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් රු. 999,626 ක් වැය කිරීමට සිදුවී තිබුණි.

තානාපති කාර්යාලය සඳහා අත් මුදල් යැවීම

ඇමරිකා එක්සත් ජනපදය මගින් පනවා ඇති සම්බාධක හේතුවෙන් ටෙහෙරාන් තානාපති කාර්යාලය සඳහා අත් මුදල් යැවීම ඩුබායි කන්සියුලර් ජෙනරාල් කාර්යාලය මගින් සිදුකර තිබුණි. ඒ සඳහා සෑම මාසයකදීම ටෙහෙරාන් තානාපතිවරයාට ඩුබායි රටට යාමට සිදු වී තිබුණි. මෙම ක්‍රියාවලිය අනාරක්ෂිත මෙන්ම අධික වියදම්කාරී ක්‍රියාවක් වී තිබුණු අතර, ගමන් ටිකට්පත් හා අනෙකුත් දීමනා වශයෙන් 2017 හා 2018 වර්ෂවල දී පිළිවෙළින් රු.මිලියන 5.12 ක් හා රු.මිලියන 3.83 ක් වැය කර තිබුණි.

විශ්‍රාම ශාලා දෛනික ආදායම

නවදිල්ලියේ පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය යටතේ පවතින විශ්‍රාම ශාලාවට පැමිණෙන වන්දනාකරුවන් සම්බන්ධ නාම ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. එම හේතුවෙන් විශ්‍රාම ශාලාවෙන් ලැබෙන දෛනික ආදායමට අදාළව නිකුත් කර තිබුණු කුවිතාන්සි ප්‍රමාණයන්ගේ නිරවද්‍යතාවය හා ලැබුණු සියළු ආදායම් බැංකු ගත කළ බව තහවුරු කර ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි. එසේම එහි රාජකාරි කටයුතු සඳහා කොන්ත්‍රාත් පදනම මත අනුයුක්ත කර ඇති ස්වාමින් වහන්සේට සහ නිලධාරියෙකු සම්බන්ධයෙන් විධිමත් බඳවා ගැනීමේ පටිපාටියක් අනුගමනය කර නොතිබුණි.

විදේශ සේවා නියුක්තිය

යාවත්කාලීන වූ තොරතුරු පද්ධතියක් පවත්වා නොතිබීම

විදේශ රැකියා ක්ෂේත්‍රය ප්‍රවර්ධනය සඳහා ප්‍රමාණවත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක නොකිරීම

අක්‍රමිකතා සම්බන්ධයෙන් කටයුතු නොකිරිම

කුවේට් වන්දි නිසි පරිදි නිරවුල් නොකිරීම

විදේශගත ශ්‍රමිකයන්ගෙන් විවිධ ගාස්තු අයකිරීම

විධිමත් අනුමැතියකින් තොරව කාර්ය මණ්ඩලයට දීමනා ගෙවීම

විධිමත් අනුමැතියකින් තොරව සේවක රක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක කිරිම

විදේශ සේවා නියුක්තිය

විදේශ රැකියා අවස්ථා වැඩිකිරිම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීම හා විදේශ ප්‍රේෂණ හරහා ජාතික ආර්ථිකයට ඇති දායකත්වය වැඩිකිරීම විදේශ සේවා නියුක්තියෙන් අපේක්ෂා කරන ප්‍රතිඵලය වී තිබුණි. එම ප්‍රතිඵලය අත්පත් කර ගැනීම සඳහා විදේශ රැකියා අමාත්‍යාංශය යටතේ ව්‍යවස්ථාපිත මණ්ඩල/ආයතන 02 ක් විසින් පහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි.

- විදේශ රැකියාවලට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම
- සංක්‍රමනික සේවා නියුක්තිකයන්ගේ සුභසාධනය සහ අනේවාසික ශ්‍රී ලාංකිකයන්ගේ සුභසාධනය
- ලියාපදිංචි රැකියා නියෝජිත ආයතන නියාමනය හා අධීක්ෂණය.
- විදේශ රැකියා සඳහා වෘත්තිය මාර්ගෝපදේශනය.

අමාත්‍යාංශය හා ඒ යටතේ වන ව්‍යවස්ථාපිත ආයතන විසින් ඉහත සඳහන් කාර්යභාරයන් ඉටු කිරීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණනයේදී අනාවරණය වු විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

විදේශ රැකියා ක්ෂේත්‍රය සම්බන්ධයෙන් යාවත්කාලීන වූ තොරතුරු පද්ධතියක් පවත්වා නොතිබීම.

1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ 53 (1) වගන්තිය ප්‍රකාරව ශ්‍රි ලංකාවෙන් පිටත සහ තම සේවා නියුක්තිය නිම කිරීමෙන් පසුව පෙරලා පැමිණෙන ශ්‍රී ලාංකිකයින් සම්බන්ධයෙන් තොරතුරු දත්ත බැංකුවක් පවත්වා ගතයුතුව තිබුණි. එහෙත් ක්ෂේත්‍රයට සම්බන්ධ ආයතන සම්බන්ධීකරණය කර යාවත්කාලීන වූ දත්ත බැංකුවක් පවත්වා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විදේශ රැකියා අමාත්‍යාංශයට හා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට නොහැකි වී තිබුණි. විශේෂයෙන්ම ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතිය හා සම්බන්ධ වී විදේශ රැකියා සඳහා පිටත්ව යන සහ නැවත පැමිණෙන ශ්‍රමිකයන්ගේ තොරතුරු ලබා ගැනීමේ පහසුකමද කාර්යාංශයට ලැබී නොතිබුණි. ක්ෂේත්‍රය තුළ පවතින විවිධ ගැටලු සඳහා කඩිනම් විසඳුම් ලබා දීමට සහ ජාතික විගමනික සංක්‍රමණික ප්‍රතිපත්තිය සහ විගමනය සම්බන්ධ අනෙකුත් ජාතික හා ජාත්‍යන්තර ප්‍රතිපත්ති, නීති යනාදිය ක්‍රියාත්මක කිරීමට මෙම තත්ත්වය බාධාවක් වී තිබුණි.

විදේශ රැකියා ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනයට කටයුතු කිරීම

රටින් පිටවන ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් පිළිබඳ සම්බන්ධීකරණය පවත්වා ගෙන යාම, විදේශගත ශ්‍රමිකයාගේ සුරක්ෂිතතාවය තහවුරු කිරීම, විගමණික ශ්‍රමිකයන් සඳහා උසස් හා ගුණාත්මක විදේශ රැකියා වෙළඳ පොළක් නිර්මාණය කිරීම, රාජ්‍යයන් අතර දැනුම හා අනෙකුත් සම්පත් හුවමාරු කර ගැනීම වැනි කාර්යයන් සඳහා රාජ්‍ය තාන්ත්‍රික මට්ටමේ සහයෝගය ලබා ගැනීම හා ශක්තිමත් අවබෝධතා ගිවිසුම් පවත්වා ගැනීම වැදගත් වේ. එසේ වුවද දැනට ක්ෂේත්‍රය තුළ පවතින ගැටළු සලකා බැලීමේදී ඉහත සම්බන්ධතාවය පවත්වා ගැනීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

අක්‍රමිකතා සම්බන්ධයෙන් කටයුතු කිරීම

විදේශ රැකියා ක්ෂේත්‍රය තුළ සිදුවී ඇති විවිධ අක්‍රමිකතා සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණයක් මත

කාර්යාංශයේ විශේෂ විමර්ශණ ඒකකය ආරම්භ කර තිබුණි. 2018 දෙසැම්බර් 31 දින වන විට එම ඒකකය සඳහා පොලිස් නිලධාරීන් 17 දෙනෙකු ඇතුළත් කාර්ය මණ්ඩලය 36 දෙනෙකු අනුයුක්ත කර තිබුණි. 2018 වර්ෂයේදී එම ඒකකය වෙත පැමිණිලි 2452 ක් යොමු කර තිබුණු අතර ඉන් පැමිණිලි 1,364 ක විමර්ශණ කටයුතු අවසන් කර තිබුණි. පැමිණිලි 322 ක් පොලිස් ස්ථාන වෙත යොමු කිරීමට පියවර ගෙන තිබුණු අතර පැමිණිලි 1088 ක් 2018 දෙසැම්බර් 31 දින වන විටත් විමර්ශණ මට්ටමේ පැවතුණි.

2017 හා 2018 වර්ෂවල මාස 13 ක කාලපරිච්ඡේදය තුළ විදේශ රැකියා ලබා දෙන බවට පොරොන්දු වී එකතුව රු.මිලියන 108.46 ක මුදල් වංචා කිරීම්වලට අදාළ පැමිණිලි 274 ක් එම ඒකකය වෙත ලැබී තිබුණි. විදේශ රැකියා ලබාදීමට පොරොන්දු වූ බවට ලිඛිතව තහවුරු කළ නොහැකි වූ බැවින් එම පැමිණිලි විශේෂ විමර්ශණ ඒකකයේ සටහන් කර අදාළ පොලිස් ස්ථාන වෙත යොමු කර තිබුණි. එම පැමිණිලි සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු සිදු කර නොතිබුණු අතර ක්ෂේත්‍රය තුළ සිදුවන මෙවැනි අක්‍රමිකතා අවම කර ගැනීමට එම ඒකකය ආරම්භ කිරීමෙන් පමණක් නොහැකි වී තිබුණි.

රැඳවුම් නිවාසවලට පැමිණෙන සංඛ්‍යාව අවම කිරිම

පසුගිය සමගාමී වර්ෂ 03 තුළ මැදපෙරදිග රටවලට රැකියා සඳහා විදේශගත වී විවිධ හේතූන් මත විදේශ දූත මණ්ඩලවල රැකවරණය සඳහා පැමිණි ශ්‍රී ලාංකික කාන්තාවන්ගෙන් 10,324 දෙනෙකු රැඳවුම් නිවාසවලට යොමුකර තිබුණි. 2017 වර්ෂය අවසන් වන විට එහි සිටි රැඳවියන් 250 දෙනෙකුගෙන් 20 දෙනෙකු මාස 06 කට වැඩි කාලයක් එම නිවාසවල ගත කර තිබුණි. එමෙන්ම එම නිවාසවල කුලී , කෑම සහ වෛද්‍යාධාර සඳහා 2017 වර්ෂයේදී එකතුව රු.මිලියන 43.30 ක් රජය විසින් වැය කර තිබුණි. 2018 වර්ෂයේදී ඒ සඳහා රු.මිලියන 87.32 ක් වැයකර තිබුණු අතර 2,383 දෙනෙකු පැමිණ තිබුණි. මෙසේ රැඳවුම් නිවාසවලට නිරන්තරයෙන් පැමිණීමට හේතු සොයා බලා එම තත්ත්වය අවම කර ගත හැකි ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

කුවේට් වන්දි නිසි පරිදි නිරවුල් නොකිරීම

1990/1991 ගල්ෆ් යුද්ධය හේතුවෙන් එහි රැකියාවන්හි නියුක්ත ශ්‍රී ලාංකිකයන්ට වන්දි ගෙවීම සඳහා එක්සත් ජාතීන්ගේ වන්දි කොමිසමෙන් ලැබී තිබූ වන්දිවලට අදාළ අරමුදල් ගිණුමේ 2018 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 3,177.56 ක් වී තිබුණි. 2018 දෙසැම්බර් 31 දින වන විට වන්දි හිමියන්ට සත්‍ය වශයෙන්ම ගෙවිය යුතුව තිබූ මුදල රු.මිලියන 251.45 ක් වී තිබුණි. එහෙත් කාර්යාංශය විසින් එම මුදල් නිරවුල් කිරීමෙන් තොරව ආයෝජනය කර එකතුව රු.මිලියන 2,926.10 ක ආදායමක් එක්රැස් කර තිබුණි

රටවිරු ව්‍යාපෘතිය

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ සහ කාර්යාංශයේ සහයෝගිතාවයෙන් විගමණික සේවකයන් සඳහා ක්‍රියාත්මක වූ නිවාස ණය යෝජනා ක්‍රමය යටතේ, 2018 සැප්තැම්බර් 20 දින වන විට විගමණිකයන් 12,078 දෙනෙකු සඳහා සමෘද්ධි බැංකුව මගින් රු.මිලියන 3,557 ක ණය මුදලක් ලබා දී තිබුණි. විගමණිකයන් 2157 දෙනෙකුට අයත් රු.මිලියන 214.68 ක ණය ගෙවීම් පැහැර හැර තිබුණි. ඉන් විගමණිකයන් 1,573 දෙනෙකු වෙත ණය ලබාදීමේ කොන්දේසිවලට පටහැනිව හා කිසිදු ඇපයක් රහිතව ණය ලබා දී තිබුණි. මේ වන විට ගිවිසුමට අනුකූලව කටයුතු නොකිරීම, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ හා පසු විපරම් කිරීමේ දුර්වලතා වැනි කරුණු හේතුවෙන් එම යෝජනා ක්‍රමය අකර්මන්‍ය වී තිබුණු අතර කාර්යාංශය සතුව මේ සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් නොතිබුණි. උක්ත කාර්යයට අදාළ ගිවිසුම ප්‍රකාරව කාර්යාංශය නමින් රු.මිලියන 100 ක් තැන්පත් කිරීම වෙනුවට කාර්යාංශය විසින් ලංකා බැංකුවේ සමෘද්ධි අධිකාරිය නමින් පවත්වාගෙන යන ගිණුමේ

රු.මිලියන 100 ක් තැන්පත් කිරීම නිසා ඊට අදාළ පොලියද 2014 වර්ෂයේ සිට කාර්යාංශයට ලැබී නොතිබුණි.

විදේශගතවන ශ්‍රමිකයින්ගෙන් විවිධ ගාස්තු අය කිරීම

1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතෙහි විධිවිධානවලට අනුව රැකියා සඳහා විදේශ ගතවන පුද්ගලයින්ගෙන් කාර්යාංශයේ මූලික ලියාපදිංචියක දී රු.15,200 ක් හා නැවත ලියාපදිංචියක දී රු.3,200 ක් පමණක් ගාස්තු වශයෙන් අයකළ හැකිව තිබුණි. එහෙත් විධිමත් අනුමැතියකින් තොරව සහ ගාස්තු තීරණය කිරීමට විධිමත් ක්‍රමවේදයක් නොමැතිව විදේශගතවන ශ්‍රමිකයන්ගෙන් විවිධ ක්‍රම මඟින් ගාස්තු අය කිරීමට කාර්යාංශය කටයුතු කර තිබුණි. මේ හේතුවෙන් 2018 වර්ෂයේදී පමණක් රු.මිලියන 391.67 ක ආදායම් කාර්යාංශය විසින් උපයාගෙන තිබුණි.

විධිමත් අනුමැතියකින් තොරව කාර්ය මණ්ඩලයට දීමනා ගෙවීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 9.7 වගන්තියට අනුව, භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව කාර්යාංශය විසින් සකස් කරගත් නිර්ණායක මත ක්‍රම 09 ක් යටතේ කාර්ය මණ්ඩල දීමනා ගෙවීමට කටයුතු කර තිබුණි. 2017 හා 2018 වර්ෂවලදී පිළිවෙලින් ඒ සඳහා රු.මිලියන 83.17 ක් හා රු.මිලියන 86.40 ක් වැය කර තිබුණි. එමෙන්ම 2018 වර්ෂයේදී ගෙවන ලද රු.මිලියන 90.35 ක දිරිදීමනාවලට අමතරව 2018 ජුනි 20 දින අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, එක් නිලධාරියකුට රු.17,500 ක් බැගින් විශේෂ දිරි දීමනා ලෙස එකතුව රු.මිලියන 28.63 ක් කාර්යාංශය විසින් ගෙවා තිබුණි.

විධිමත් අනුමැතියකින් තොරව සේවක රක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව කාර්යාංශයේ කාර්ය මණ්ඩලය සඳහා වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය කිරීමේ හා හදිසි අනතුරු වන්දි ලබාදීමේ රක්ෂණ ක්‍රමයක් 1995 වර්ෂයේ සිට ක්‍රියාත්මක කර තිබුණි. වාර්ෂිකව ඊට අදාළ සම්පූර්ණ වන්දි මුදල් කාර්යාංශයේ ආදායම් උපයෝගී කරගෙන ගෙවා තිබුණු අතර ඒ සඳහා 2017 හා 2018 වර්ෂවල පිළිවෙලින් රු.මිලියන 45.09 ක් හා රු.මිලියන 44.29 ක් වැයකර තිබුණි. 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ II කොටසේ 17(3) උප වගන්තියට අනුව කාර්යාංශයේ අරමුදල් මඟින් එවැනි වියදම් කිරීමේ හැකියාවක් නොතිබුණි.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධනය

වාර්ෂික මත්ස්‍ය නිෂ්පාදනය ක්‍රමිකව අඩුවීම

ප්‍රතිපාදන සලසා තිබුණු කලපුවල රොන්මඩ ඉවත් නොකිරීම

කලපු සීමා ලකුණු කිරීම සඳහා ප්‍රමිතියට අනුකූල නොවී මායිම් ගල් මිලදී ගැනීම

ගිලන් යාත්‍රාවක් නිෂ්පාදනය කිරීම

බහුදින යාත්‍රා නිපදවීම

රජයේ මුදල් අවභාවිතා කිරීමට ඉඩ දීම

අවශ්‍යතාවය ඉක්මවා මත්ස්‍ය දැල් මිලදී ගැනීම

ඌන උපයෝජිත වත්කම්

මුදාහල නිලධාරීන්ගේ වැටුප් හා වේතන ගෙවීම

ධීවර හා ජලජ සම්පත් සංවර්ධනය

මත්ස්‍ය පරිභෝජනය වැඩිකිරීම මගින් ඉහළ පෝෂණ මට්ටමක් සහිත ජනතාවක්, ඉහළ විදේශ විනිමය ඉපයීමක් හා ධීවර ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා වැඩි කිරීමෙන් ධීවර ප්‍රජාවට උසස් ජීවන මට්ටමක් ලබාදීමත් මෙම ක්ෂේත්‍රයෙන් අපේක්ෂිත ප්‍රතිඵල වී තිබූ අතර එම ප්‍රතිඵල අත්පත් කරගැනීම සඳහා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව හා ව්‍යවස්ථාපිත මණ්ඩල/ ආයතන 5 ක් විසින් පහත සඳහන් කාර්යභාර්යන් ඉටු කළ යුතුව තිබුණි.

- ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය සහ අමාත්‍යාංශය යටතට ගැනෙන දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතනයන් හා සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
- සමුද්‍ර කිවුල් දිය හා මිරිදිය මත්ස්‍ය කර්මාන්තය සංවර්ධනය හා කළමනාකරණය
- රජයට අයත් ධීවර යාත්‍රා කළමනාකරණය සහ මෙහෙයවීම
- අනන්‍ය ආර්ථික කළාපය තුළ ධීවර කටයුතු සංවර්ධනය සහ කළමනාකරණය කිරීම
- ධීවර කර්මාන්තය වෙනුවෙන් අවශ්‍ය වන අයිස් යන්ත්‍රාගාර, ශීත කාමර සහ වෙනත් යටිතල පහසුකම් පිහිටුවාලීම සහ ක්‍රියාත්මක කිරීම
- ජීව සහ අජීව ජාතික ජලජ සම්පත් සංවර්ධනය කිරීම
- ධීවර යාත්‍රා සහ ධීවර ආම්පන්න නිෂ්පාදනය, ආනයනය හා බෙදාහැරීම
- මුහුදු මත්ස්‍ය වගාව ඇතුළු ජලජීවී වගා සංවර්ධනය සහ කළමනාකරණය
- මත්ස්‍ය හා මත්ස්‍ය ආශ්‍රිත නිෂ්පාදන වෙළඳාම හා බෙදාහැරීම
- ධීවර අංශයේ පර්යේෂණ කටයුතු පුළුල් කිරීම හා එම ප්‍රතිඵල ධීවර කර්මාන්තයේ උන්නතිය සඳහා යොදා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම
- නවීන විද්‍යාත්මක ක්‍රමවේද ඇසුරින් සාගර සම්පත් පර්යේෂණ කටයුතු පුළුල් කිරීමට පහසුකම් සැපයීම

අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුව හා ව්‍යවස්ථාපිත ආයතන විසින් ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

වාර්ෂික මත්ස්‍ය නිෂ්පාදනය ක්‍රමිකව අඩුවීම

සමාලෝචිත වර්ෂයේ මත්ස්‍ය නිෂ්පාදනයේ අපේක්ෂිත ඉලක්කය මෙට්‍රික් ටොන් 633,750 ක් වුවද, නිෂ්පාදනය කළ ප්‍රමාණය මෙට්‍රික් ටොන් 527,060 ක් විය. 2014 වර්ෂයේදි මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 535,050 ක් වී තිබුණත්, එය 2018 වර්ෂය අවසාන වන විට මෙට්‍රික් ටොන් 7,990 කින් අඩු වී මෙට්‍රික් ටොන් 527,060 ක් දක්වා අඩුවී තිබුණි. විස්තර රූපසටහන 46 හි දැක්වේ.



රූපසටහන 46 - වාර්ෂික මත්ස්‍ය නිෂ්පාදනය
මූලාශ්‍රය: ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ සංඛ්‍යා ලේඛන අංශය

මුළු මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන අපනයනයේ වර්ධනය

2017 හා 2018 වර්ෂවල මුළු මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන අපනයනය පිළිවෙලින් මෙට්‍රික් ටොන් 24,827 ද මෙට්‍රික් ටොන් 27,998 ක් ද වූ අතර 2017 වර්ෂය හා සැසඳීමේ දී එය මෙට්‍රික් ටොන් 3,171 කින් වැඩි වී තිබුණි. එහෙත් දළ දේශීය නිෂ්පාදිතයට මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන දායකත්වය 2017 හා 2018 වර්ෂවලදී පිළිවෙලින් සියයට 1.3 ක් හා සියයට 1.2 ක් වී තිබුණි.

කලපුවල රොන්මඩ ඉවත් කිරීම

2018 වර්ෂයේ වාර්ෂික ඇස්තමේන්තුවෙන් කලපු 10 ක රොන්මඩ ඉවත්කර ගැඹුරු කර පිරිසිදු කිරීම සඳහා රු.මිලියන 1,000 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. එම ප්‍රතිපාදනවලින් පුත්තලම, නයාරු, ආරුගම්බේ හා රැකව යන කලපුවල රොන්මඩ ඉවත් කිරීමේ කටයුතු ප්‍රමුඛව සිදු කරන බව සඳහන් කර තිබුණත්, 2019 මැයි 31 දින වන විටත් කිසිදු කලපුවක් සංවර්ධනය කිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි.

කලපු සීමා ලකුණු කිරීම සඳහා මායිම් ගල් මිලදී ගැනීම

ධිවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් විශේෂිත සංරක්ෂණ ප්‍රදේශයක් ලෙස පවත්වා ගැනීමට කලපු සීමා සලකුණු කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන තිබුණි. ඒ අනුව කලපු 10 ක සීමා ලකුණු කිරීම සඳහා රු.මිලියන 31.96 ක වටිනා අඩි 5 x 6 ප්‍රමාණයේ මායිම් ගල් 19888 ක් සපයා ගැනීමට සැලසුම් කර තිබුණි. 2019 ජනවාරි මාසය වන විට මායිම් ගල් 11264 ක් සපයා තිබුණි. ඉන් 2018 දෙසැම්බර් 31 දිනට මායිම් ගල් 4831 ක් සැපයීම වෙනුවෙන් රු.මිලියන 7.70 ක් වැය කර තිබුණි. 2019 ජුනි මාසය වන විට මාස 6 ක කාලයක් ඉක්මවා තිබුණත් එම මායිම් ගල් කලපු මායිම් ලකුණු කිරීම සඳහා යොදාගෙන නොතිබුණි. එම මායිම්ගල් කලපු ආශ්‍රිතව ගොඩගසා තිබුණු අතර සමහර මායිම් ගල් අදාළ ප්‍රමිතියට අනුකූලවී නොතිබුණු බව අනාවරණය විය.

යාත්‍රා නිරීක්ෂණ මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ යාත්‍රා නිරීක්ෂණ මධ්‍යස්ථාන ගොඩනැගිල්ල දීර්ඝ කිරීමේ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුව පදනම් කර ගෙන රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 හා 4.3.2 මාර්ගෝපදේශයන් ප්‍රකාරව ගෙවිය හැකි උපරිම අවිනිශ්චිත / අසම්භාව්‍ය ප්‍රමාණය අනුව විචලනය රු.8,974,795 ක් විය යුතුව තිබුණි. ඒ සඳහා ගෙවීම් කිරීමේදී එම වටිනාකම ඉක්මවා රු.මිලියන 15.93 ක් දක්වා භෞතික අවිනිශ්චිතතා සඳහා ගෙවීම් කර තිබුණි. ඒ අනුව අනුමැතියකින් තොරව, ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට පටහැනිව රු.මිලියන 6.96 ක් වැඩිපුර ගෙවා තිබුණි.

ගිලන් යාත්‍රාවක් නිෂ්පාදනය කිරීම

උතුරු පළාත් සෞඛ්‍ය සේවා අමාත්‍යාංශය විසින් 2015 වර්ෂයේ දී ඉදිරිපත් කළ ඇණවුමක් මත, ලිඛිත ගිවිසුමකට එළඹීමකින් තොරව සීමාසහිත සිනෝර් පදනම විසින් රු.මිලියන 4.52 ක් වැය කර ගිලන් යාත්‍රාවක් (AMBULANCE BOAT) නිෂ්පාදනය කර තිබුණි. නියමිත පිරිවිතරයන්ට අනුකූල බවට තාක්ෂණික ඇගයීම් කමිටුවක් මඟින් පරීක්ෂා කර තහවුරුවක් ලබා නොගෙන යාත්‍රාව සඳහා රු.මිලියන 1.13 ක් වටිනා බෝට්ටු එන්ජිමක් මිලදී ගෙන සවිකර තිබුණි. එම එන්ජිම අධික ලෙස රත්වීම හේතුවෙන් ගැණුම්කරු විසින් යාත්‍රාව මිලදී ගැනීම ප්‍රතික්ෂේප කර තිබුණි. ඒ අනුව යාත්‍රාව හා එන්ජිම සඳහා වැය කළ රු.මිලියන 4.52 ක පිරිවැය අයකර ගැනීමට නොහැකි වී තිබුණි. ඒ සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂාවක් 2018 ඔක්තෝබර් 29 දින වන විටත් සිදුකර නොතිබුණි.

බහුදින යාත්‍රා නිපදවීම

මත්ස්‍ය පසු අස්වනු හානිය අවම කර ගුණාත්මකභාවයෙන් යුතු මත්ස්‍ය නිෂ්පාදන, පාරිභෝගිකයන්ට ලබාදීමේ අරමුණින් බහුදින යාත්‍රා 10 ක් නිපදවා සැපයීමට සී-නෝර් පදනමට ලබා දීමට 2016 ජූලි 06 දින අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර තිබුණි. බහුදින යාත්‍රාවක නිෂ්පාදන මිල රු.මිලියන 26 කට තක්සේරු කර රජයෙන් සියයට පනහක සහනාධාරයක් ද, සියයට පනහක් ධීවරයා විසින් ද දැරිය යුතුව තිබුණි. මෙම කාර්යය 2016 දෙසැම්බර් 15 දිනට ප්‍රථම ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර තිබුණු බැවින් බහුදින යාත්‍රාවලින් 5 ක් සී-නෝර් පදනම විසින් ද, ඉතිරි යාත්‍රා 5 ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි පෞද්ගලික යාත්‍රාංගන දෙකක් මඟින් සී-නෝර් පදනමේ අධීක්ෂණය යටතේ නිෂ්පාදන කටයුතු සිදුකිරීම ආරම්භ කර තිබුණි.

සී-නෝර් පදනම විසින් 2016 දෙසැම්බර් 15 දිනට පෙර බහුදින යාත්‍රා 5 ක නිෂ්පාදන කටයුතු අවසන් කළයුතු වුවත්, සී-නෝර් පදනම බහුදින යාත්‍රාවක නිෂ්පාදනය ද පෞද්ගලික ආයතනයකට ලබාදුන් බහුදින යාත්‍රා 3 ක නිෂ්පාදනය ද 2018 දෙසැම්බර් 31 දිනවන විට අවසන් කිරීමට නොහැකි ව තිබුණි.

සී-නෝර් පදනම නිපදවා ධීවරයෙකුට භාරදෙන ලද යාත්‍රාවක්, ප්‍රථම මුහුදු ගමනේදීම එනම් 2018 මාර්තු 22 දින ගිනිගෙන විනාශ වී තිබුණි. 2018 පෙබරවාරි 20 දින ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ නාවික ඉංජිනේරු සහකාර විසින් බහුදින යාත්‍රාව හොඳ තත්ත්වයෙන් නිපදවා ඇති බව සනාථ කර තිබුණ ද, මෙම හානිය සම්බන්ධ මුදල් රෙගුලාසි 103 හා 104 ප්‍රකාරව විධිමත්ව පරීක්ෂාවක් සිදු කර නොතිබුණි.

රජයේ මුදල් අවභාවිතා කිරීමට ඉඩදීම

කලපු සංවර්ධන වැඩසටහන යටතේ ජාතික ජලජීවි වගා සංවර්ධන අධිකාරිය විසින් රු.මිලියන 161.40 ක වටිනා වල්පැළෑටි සහ සුන්බුන් ඉවත් කිරීමේ යන්ත්‍ර 03 ක් මිලදී ගැනීම සඳහා රු.මිලියන 42.57 ක් සැපයුම්කරුට ගෙවා තිබුණි. මෙම අත්තිකාරම් ගෙවීම සඳහා ඉදිරිපත් කර තිබුණු බැඳුම්කර ලියවිලි, අත්සන් ව්‍යාජ ඒවා වී තිබුණු අතර එම කූට ලේඛන පදනම් කරගෙන රු.මිලියන 42.57 ක අත්තිකාරම් ගෙවා තිබුණි. එම අත්තිකාරම් මුදල් මාස 06 ක පමණ කාලයක් පෞද්ගලික පරිහරණයට ඉඩ දී ආපසු අයකර ගෙන තිබුණි.

අවශ්‍යතාවය ඉක්මවා මත්ස්‍ය දැල් මිලදී ගැනීම

2017 දෙසැම්බර් 31 දිනට ජාතික ජලජීවි වගා සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලය ඇතුළු මධ්‍යස්ථාන 15 ක එකතුව රු.මිලියන 21.41ක් වටිනා මත්ස්‍ය දැල් බෙදාහැරීමෙන්

තොරව ඉතිරි වී තිබුණි. 2018 සැප්තැම්බර් 30 දින වන විට මවු මසුන් කළමනාකරණය වෙනුවෙන් වැය කර තිබුණු රු.මිලියන 8.93 කින් සියයට 80 ක් හෙවත් රු.මිලියන 7.18 ක් මත්ස්‍ය දැල් මිලදී ගැනීම සඳහා වැය කර තිබුණි. දඹුල්ල, කලාවැව, උඩවලව, ඉරණමඩු, මුරුතවෙල යන මධ්‍යස්ථානවල එකතුව රු.මිලියන 17.71 ක් වටිනා දැල් තොගයක් තිබියදී එම මධ්‍යස්ථාන වලටම 2018 වර්ෂයේදීද එකතුව රු.මිලියන 4.90 ක දැල් බෙදා හැර තිබුණි.

ඌන උපයෝජිත වත්කම්

ලංකා ධීවර සංස්ථාවට අයත් අනුරාධපුර පිහිටි පැරණි අතුරු නිෂ්පාදන කම්හලක්, පොළොන්නරුව, රත්නපුර, පුත්තලම, වේලනි, සයින්දමරුදු, බේරුවල සහ හම්බන්තොට පිහිටි අයිස් යන්ත්‍රාගාර 07ක් , නිල නිවාසයක්, කරවල වියලීමේ අංගනයක්, ත්‍රිකුණාමලය පිහිටි දැල් සැකසුම් මධ්‍යස්ථානයක්, මන්නාරම පිහිටි පැරණි කරවල වියලීමේ අංගනයක් සහ පේසාලෙයි ඉඩමේ පිහිටි අයිස් යන්ත්‍රාගාරය මඩකලපුව පිහිටි බහාලුම් ශීතාගාර කොටස් 03 ක් යාපනය කරෙයිපූර් ඉඩම සහ ශීතාගාර ගොඩනැගිල්ල ,කුරුණෑගල පිහිටි ඉඩම සහ පැරණි සංචාරක බංගලාව ප්‍රයෝජනයට ගැනීමකින් තොරව වර්ෂ 02 ක සිට වර්ෂ 29 ක් දක්වා කාල පරාසයක සිට නිෂ්කාර්යව පැවතුණි. ලංකා ධීවර සංස්ථාවට අයත් වාහන 20 ක් සංස්ථා පරිශ්‍රය තුළ හා අදාළ විධායක තුළ නිෂ්කාර්යව පැවැතුණි. එමෙන්ම මෝදර ශීතාගාරයේ සම්පිණ්ඩන යන්ත්‍ර 07 ක්ද, ශීත කාමර 13 ක්ද, අධි ශීත කාමර 04 ක්ද, කන්ඩෙන්සර් 02 ක්ද, නිෂ්කාර්යව පැවතුණි.

මුදාහල නිලධාරීන්ගේ වැටුප් හා වේතන ගෙවීම

සමාලෝචිත වර්ෂයේදී ලංකා ධීවර සංස්ථාවේ නිලධාරීන් පස්දෙනෙකු වෙනත් රාජ්‍ය ආයතන 4 ක් වෙත මුදාහැර තිබුණි. එම නිලධාරීන් පස්දෙනාගෙන් තිදෙනෙකු සඳහා වැටුප් හා වේතන ලෙස රු.මිලියන 1.66 ක් සංස්ථාවේ අරමුදලින් ගෙවා තිබුණි.

අපේක්ෂිත මිල ගණන්වලින් බැහැරව මත්ස්‍ය අස්වනු මිලදී ගැනීම

යුරෝපා සංගමය විසින් පනවා තිබුණු තහනම ඉවත් කරන තුරු ධීවරයන්ගේ අතිරික්ත මත්ස්‍ය අස්වනු මිලදීගැනීම සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන මත ආරම්භ කර තිබූ වූනා ව්‍යාපෘතියේ අපේක්ෂිත මිල ගණන්වලින් බැහැරව එවකට සිටි ලංකා ධිවර සංස්ථාවේ උප සභාපතිවරයාගේ අනුමැතිය මත මසුන් තොග මිලදී ගැනීම හා විකිණීම සිදු කර තිබුණි. මේ නිසා සති 02 ක කාලයක තුළ රු.මිලියන 47.36 ක අලාභයක් සිදුවී තිබුණි.

විනය පරීක්ෂණයක් සිදු නොකර නැවත සේවයේ පිහිටුවීම

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව විසින් 2007 වර්ෂයේදී රු.මිලියන 5.06 කට ඉන්ධන ටැංකි 06 ක් ලබා ගැනීම සඳහා වූ කොන්ත්‍රාත්තුව වෙනුවෙන් අත්තිකාරම් වශයෙන් රු.මිලියන 2.79 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. එම ඉන්ධන ටැංකි සංස්ථාවට නොලැබීම පිළිබඳව ඊට වගකිව යුතු සැපයුම් කළමනාකරුට එරෙහිව විනය පරීක්ෂණයක් කිරීමට උපදෙස් දී තිබියදී, එම විනය පරීක්ෂණය සිදු නොකර අදාළ සැපයුම් කළමනාකරු නැවත සේවයේ පිහිටුවා තිබුණි.

පාලම් තරාදි භාවිතයට ගත හැකි පරිදි ස්ථාපිත නොකිරීම

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව විසින් ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමය යටතේ ගාල්ල, මිරිස්ස, කුඩාවැල්ල සහ බේරුවල ධීවර වරායන් සඳහා ටොන් 40 ක ධාරිතාවය සහිත පාලම් තරාදි 04 ක් මිලදී ගැනීම සඳහා වූ කොන්ත්‍රාත්තුව 2016 දෙසැම්බර් 23 දින රු.මිලියන 4.48 ක කොන්ත්‍රාත් වටිනාකමක් මත පෞද්ගලික සමාගමක් වෙත ප්‍රදානය කර තිබුණි.

කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත්තුව භාරගත් 2016 දෙසැම්බර් 28 දින සිට දින 120 ක් ඇතුළත එනම් 2017 අප්‍රේල් 26 දින වන විට ධීවර වරායන් 04 හි පාලම් තරාදි භාවිතයට ගත හැකි තත්ත්වයට පත් කළ යුතුව තිබුණත්, 2019 පෙබරවාරි 12 දින වන විට දින 777 ක් ගතවී තිබියදී කිසිදු වරායක පාලම් තරාදි භාවිතයට ගත හැකි තත්ත්වයට ස්ථාපිත කර නොතිබුණි.

සෞඛ්‍ය හා පෝෂණය

- රැස්කර ඇති ආදායම ඒකාබද්ධ අරමුදලට බැර නොකිරීම
- ඇඟිලි සලකණු යන්ත්‍ර භාවිතා නොකිරීම
- අවිධිමත් ලෙස අතිකාල ගෙවීම
- ශාක්‍යතා අධ්‍යයනයකින් තොරව බස් රථ මාලදී ගැනීම
- විධිමත් කාල සටහනක් අනුව ඖෂධ ඇණවුම් කිරීම
- තත්ත්වයෙන් අසමත් වෛද්‍ය සැපයිම්
- කල් ඉකුත් වූ වෛද්‍ය සැපයිම්
- සේවය හැරගිය වෛද්‍යවරුන්ට වැටුප් ගෙවීම
- වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු රෝහලේ දේපල භෞතික භුක්තියට පවරා නොගැනිම
- හයිඩ්‍රොක්ලේව් යන්ත්‍ර දෙකක් නිෂ්කාර්යව පැවැතීම
- රෝහල් සංවර්ධන සංගමය නමින් ඉඩමක් මිලදී ගැනීම
- අවිධිමත් ලෙස නිදර්ශක දීමන ගෙවිම

සෞඛ්‍ය හා පෝෂණය

රටෙහි සීඝ්‍ර ආර්ථික සංවර්ධනයක් වෙනුවෙන් දායකවන නිරෝගීමත් ජනතාවක් බිහිකිරීම උදෙසා ප්‍රතිපත්ති, උපායමාර්ග හා සංවර්ධන ක්‍රියාකාරකම් සම්පාදනය තුළින් ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් තහවුරු කිරීම සෞඛ්‍ය හා පෝෂණ අංශයෙන් අපේක්ෂා කරන ප්‍රතිඵලය වී ඇත. එම ප්‍රතිඵලය අත් කර ගැනීම සඳහා අමාත්‍යාංශය, ඒ යටතේ දෙපාර්තමේන්තුවක් හා ව්‍යාවස්ථාපිත මණ්ඩල/ආයතන 12 කින් සමන්විත වේ. එම ආයතන විසින් පහත සඳහන් කාර්යයන් ඉටු කළ යුතුව තිබුණි.

- සෞඛ්‍ය අංශය සඳහා ප්‍රතිපත්ති සම්පාදනය,වැඩසටහන් හා ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම
- සෞඛ්‍ය සේවා ලබා දීම සඳහා ප්‍රමිතීන් හා මාර්ගෝපදේශ සම්පාදනය කිරීම
- මානව සම්පත් සංවර්ධනය
- කළමනාකරණය, සැලැසුම්කරණය සහ පද්ධති සංවර්ධනය
- සම්පත් බෙදා හැරීම, වැඩසටහන් හා ව්‍යාපෘතීන් අධීක්ෂණය හා ඇගයීම
- ප්‍රධාන රෝහල් පරිපාලනය
- පෞද්ගලික සෞඛ්‍ය ආයතන නියාමනය හා අධීක්ෂණය
- ජාතික සෞඛ්‍ය රක්ෂණ වැඩසටහනට අදාළ කටයුතු
- මහජන සෞඛ්‍ය හා පෝෂණය වැඩිදියුණු කිරීම සඳහා වැඩසටහන් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම
- සෞඛ්‍ය අංශයේ පර්යේෂණ අවස්ථා පුළුල් කිරීම

මෙහි ප්‍රධාන කාර්යයයන් වේ. ඉහත සඳහන් කාර්යභාරයන් ඉටුකිරීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

ප්‍රතිපාදන උපයෝජනය නොකිරිම

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් මූලධන වැය විෂයයන් 15 ක් සඳහා සලසා ගෙන තිබුණු රු.මිලියන 1,198 ක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් හා මුදල් රෙගුලාසි 66 මාරු කිරීම් මගින් වැය විෂයයන් 12 ක් සඳහා සලසා ගෙන තිබුණු රු.මිලියන 1,466 ක ප්‍රතිපාදන වශයෙන් එකතුව රු.මිලියන 2,664 ක ප්‍රතිපාදන කිසිදු උපයෝජනයක් නොකර මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

රාජ්‍ය ආදායමට බැර නොකිරීම

ජාතික රුධිර පාරවිලයන සේවය විසින් අතිරික්ත රුධිර ප්ලස්මා ලීටර් 31,572 ක් විකිණීමෙන් ලද රු.මිලියන 120 ක් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය ආදායමට බැර නොකර ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල යටතේ පවතින ජාතික ලේ බැංකු සංවර්ධන අරමුදලට බැර කර තිබුණි. තවද, කුරුණෑගල මහ රෝහලෙහි ආපනශාලාව බඳුදීමේ ප්‍රසම්පාදන කටයුතු රෝහල විසින් සිදු නොකර රෝහල් සේවක සුභසාධක සංගමය විසින් සිදුකර කුලී ආදායම රු.මිලියන 7 ක් රජයේ ආදායමට බැර නොකර සේවක සුභසාධක සංගමයේ ගිණුමකට බැර කර තිබුණි.

යාපනය ශික්ෂණ රෝහලේ ගොඩනැගිලි ස්ථාන 08 ක් සුභසාධක සංගමය වෙත ලබාදී තිබුණු අතර ඉන් ස්ථාන 05 ක් සුභසාධක සංගමය විසින් පෞද්ගලික අංශය වෙත බඳු දී ආදායම් උපයාගෙන තිබුණි.

රෝහල වෙත අයවිය යුතු බදු ආදායම් සුභසාධක සංගමයට අයකර ගැනීමට ඉඩහැරීම නිසා රජයට අහිමි වී තිබුණු මුළු ආදායම රු.මිලියන 4.21 ක් වී තිබුණි. ඉතිරි ගොඩනැගිලි ස්ථාන 03 හි සුබසාධක සංගමය විසින් පවත්වා ගෙන යන ව්‍යාපාරික කටයුතුවලින් මාසිකව රු.30,000 ක සිට රු.300,000 ක් දක්වා පරාසයක ආදායම් උපයා තිබුණි. ඉන් ඒකාබද්ධ අරමුදලට කිසිදු ආදායමක් බැර කර නොතිබුණි.

ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා නොකිරීම

අමාත්‍යාංශය විසින් රු.මිලියන 32 ක් වැයකර 2017 වර්ෂයේදී හා ඊට පෙර මිලට ගෙන තිබුණු ඇඟිලි සලකුණු යන්ත්‍ර 224 ක් 2019 මැයි 31 දින වන විටත් භාවිතයට ගෙන නොතිබුණි. 2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2017 මැයි 12 දිනැති අංක DMS/0016 දරන භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ලිපිය ප්‍රකාරව, ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා නොකරන්නේ නම් නව වැටුපට අතිකාල දීමනා ගෙවීම් නොකිරීමට වගබලා ගත යුතු වුවද, වර්තමාන වැටුප පදනම් කරගෙන අතිකාල දීමනා අමාත්‍යාංශය විසින් ගෙවා තිබුණි. කාර්යාලය තුළ සේවය කරන ඉහළ කළමනාකරණයේ වෛද්‍යවරුන් විසින් ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා නොකිරීම හේතුවෙන් සෙසු සේවකයින්ද ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කිරීම ප්‍රතික්ෂේප කර තිබුණි.

අවිධිමත් ලෙස අතිකාල ගෙවීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXVIII පරිච්ඡේදයේ 1.1 ඡේදයේ දක්වා ඇති විධිවිධාන හා 2006 මැයි 30 දිනැති අංක 09/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව, වෛද්‍ය නිලධාරීන්ගේ කාර්යාල වේලාවන් නියම කරමින් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2014 පෙබරවාරි 05 දින අංක 02-20/2014 දරන පොදු චක්‍රලේඛය නිකුත්කර තිබුණි.

එම චක්‍රලේඛය පදනම් කරගෙන අමාත්‍යාංශ ප්‍රධාන කාර්යාලයේ විවිධ අංශවල සේවය කරන සෞඛ්‍ය සේවාවන්ට අදාළ පොදු පරිපාලන කටයුතුවල නියැලෙන නමුත් සෘජුවම සායනික සේවාවන් ඉටු නොකරන වෛද්‍යවරුන්ට, සායනික සේවාවන් ඉටු කරන වෛද්‍යවරුන්ට පමණක් ගෙවිය හැකි දිනකට පැයක හෝ පැය දෙකක කාලයක් සඳහා අතිකාල දීමනා ගෙවා තිබුණි. 2018 වර්ෂයේ මුල් මාස 06 දී පමණක් රු.මිලියන 6 ක අතිකාල එසේ ගෙවා තිබුණි.

එම අතිකාල දීමනාව ලබා ගත් වෛද්‍ය නිලධාරීන්, ආයතන සංග්‍රහයේ XXVIII පරිච්ඡේදයේ 1.3 වගන්තිය සමඟ කියවිය යුතු 2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ දැක්වෙන රජයේ නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම සම්බන්ධයෙන් වූ ඇඟිලි සලකුණු සටහන් යන්ත්‍ර භාවිත කර නොතිබුණි. ඒ වෙනුවට මාසයකට වරක් පමණක් අධීක්ෂණ නිලධාරියකු විසින් අත්සන් කරනු ලබන දින පොතක සටහන් කළ පැමිණීම් වාර්තා පදනම් කරගෙන අතිකාල දීමනා ගෙවා තිබුණි

අවිධිමත් ලෙස මුදල් රැස්කිරීම හා වියදම් කිරීම

කිසිදු අධිකාරී බලයකින් තොරව, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයාට උපහාර පිරිනැමීමේ උත්සවයක්

පැවැත්වීම සඳහා රාජ්‍ය ආයතන 04 කින් රු.මිලියන 3 ක් ඇතුළුව මුළු මුදල රු.මිලියන 5 ක් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් නමින් වූ බැංකු ගිණුමකට රැස්කර එම උත්සවයේ වියදම් සඳහා රු.මිලියන 7 ක් වැය කර තිබුණි. මෙම උපහාර උළෙලේ ඉසව් කළමනාකරණ කටයුතු (Event Management) ඉටුකර ගැනීමට රු.මිලියන 6 ක අවම ලංසුවක් ඉදිරිපත් කර තිබුණි. ව්‍යාජ ලිපි ලේඛන මත පදනම්ව ඉදිරිපත් කර තිබුණු එම ලංසුව පිළිබඳව අවධානය යොමු නොකර හා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ගෙන් බැහැරව පූර්ව නිශ්චිත ආයතනයක් ඉලක්ක කර ගනිමින් කටයුතු කර කොන්ත්‍රාත්තුව එම ආයතනය වෙත පිරිනමා තිබුණි. අමාත්‍යාංශය යටතේ ඇති බොහොමයක් රෝහල්වලට වෛද්‍ය වායු සැපයීමේ කොන්ත්‍රාත්කරුද මෙම උත්සවය සඳහා මුදල් ලබාදුන් පාර්ශවයන් අතර විය.

රජයේ නිලධාරියෙකු නොවන අයෙකු විදේශ ගමන් සඳහා සහභාගී කරවා ගැනීම හා වියදම් දැරීම

අමාත්‍ය කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකු ලෙස පත්කර නොතිබුණු නමුත් අමාත්‍ය කාර්ය මණ්ඩලයේ මාධ්‍ය ලේකම්, ඉසව් සංවිධායක හා උත්සව සම්බන්ධීකාරක ලෙස ව්‍යාජ ලෙස පෙනී සිටි රජයේ නිලධාරියෙකු නොවූ පුද්ගලයෙකු 2018 සැප්තැම්බර් 26 හා 27 දිනවලදී ඇමරිකා එක්සත් ජනපදයේ නිව්යෝර්ක් නුවර පවත්වා තිබුණු සමුළුවකට හා 2018 ඔක්තෝබර් 01 දින සිට 06 දින දක්වා ස්විස්ටර්ලන්තයේ පවත්වා තිබුණු සමුළුවකට සහභාගීකරවීම සඳහා යානාපත්‍ර සඳහා රු.487,500 ක් ද, අනියම් දීමනා හා සංයුක්ත දීමනා ලෙස රු.685,545 ක්ද වශයෙන් එකතුව රු.1,173,045 ක් අමාත්‍යාංශය විසින් වැයකර තිබුණි.

ශක්‍යතා අධ්‍යයනයකින් තොරව බස් රථ මිලට ගැනීම

ජාතික අයවැය දෙපාර්තමේන්තුව අනුමත කර තිබුණු රු.මිලියන 40 ක මූල්‍ය සීමාව ඉක්මවා බස් රථයක් සඳහා රු.මිලියන 10.6 ක් බැගින් රු.මිලියන 53 ක් වැය කර වායු සමීකරණය කරන ලද සුඛෝපභෝගී ආසන 54 ක් සහිත බස් රථ 05 ක් හෙද විදුහල් 05 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබුණි. ශක්‍යතා අධ්‍යයනයකින් තොරව මිලදී ගෙන තිබුණු මෙම බස් රථ හෙද විදුහල් පිහිටි පළාත්වල මාර්ගවල ධාවනය කිරීමේ අපහසුතාවය, හෙද විදුහල් පරිශ්‍රවලට ඇතුළත් කළ නොහැකිවීම හා විවිධ තාක්ෂණික දෝෂ හේතුවෙන් ඌන උපයෝජිතව එම හෙද විදුහල්වල ගාල් කර තිබුණි.

විධිමත් කාල සටහනක් අනුව ඖෂධ ඇණවුම් නොකිරීම

මාස 11 ක සැපයුම් කාලයක් සහිතව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත ඇණවුම් නිකුත් කිරීමේ ප්‍රතිපත්තිය මත වෛද්‍ය සැපයීම් අංශය විසින් ඇස්තමේන්තුගත අයිතම මිලදී ගැනීම සිදු කර තිබුණි. නමුත් ප්‍රමාදයකින් තොරව වෛද්‍ය සැපයීම් සිදු කිරීමට රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව අපොහොසත් වී තිබුණි. සමාලෝචිත වර්ෂයට අදාළ වෛද්‍ය සැපයීම්වල මුළු ඇණවුම් අයිතම සංඛ්‍යාව 8,918 ක් වී තිබුණු අතර, ඉන් ඇණවුම් අයිතම 5,544 ක් හෙවත් සියයට 62 ක් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් වර්ෂය තුළදී සපයා නොතිබුණි. මෙම ප්‍රමාදය හේතුවෙන් සෑම වර්ෂයකදීම ඉතා විශාල පිරිවැයක් සහිත වෛද්‍ය සැපයීම් දේශීය වෙළඳපලින් මිලදී ගෙන තිබුණි. ඒ අනුව ප්‍රධාන ඇණවුම සැපයීමේ ප්‍රමාදය හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී

රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව හරහා දේශීය වෙළඳපලින් සහ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වෙළඳ තොගය ඇතුළුව මිලදී ගෙන තිබුණු වෛද්‍ය සැපයීම්වල මුළු පිරිවැය රු.මිලියන 5,242 ක් වී තිබුණි.

තත්ත්වයෙන් අසමත් වෛද්‍ය සැපයීම්

සමාලෝචිත වර්ෂයේදී තත්ත්වයෙන් අසමත්ව භාවිතයෙන් ඉවත් කළ (withdraw) වෛද්‍ය සැපයීම් වර්ග 48 ක මුළු පිරිවැය රු.මිලියන 538 ක් වූ අතර එහි වර්ග 08 ක පමණ ප්‍රතිජීවක ඖෂධ (Antibiotics), ඩෙංගු, කොලොස්ට්‍රෝල්, අපස්මාර, දියවැඩියා හා අක්ෂි රෝග සඳහා වූ ඖෂධ මෙන්ම ගෝස් හා ශල්‍ය ද්‍රව්‍ය ද විය. එලෙස තත්ත්වයෙන් අසමත්වූ වෛද්‍ය සැපයීම් භාවිතයෙන් ඉවත් කරන ලෙසට නියෝග ලැබෙන අවස්ථා වන විටත් ඇතැම් අයිතම සියයට 100 ක්ම රෝගීන්ට නිකුත් කර අවසන්ව තිබුණු බව නියැදි පරීක්ෂාවේදී අනාවරණය විය. ඒ අනුව රෝගීන්ට නිකුත් කළ එම ඖෂධ තත්ත්වයෙන් අසමත් ඖෂධ (Quality Fail) බව සමාලෝචිත වර්ෂයේදී හෙළිදරව් වී තිබුණි.

කල් ඉකුත් වූ වෛද්‍ය සැපයීම්

2018 වර්ෂයේදී වෛද්‍ය සැපයීම් අංශයේ ගබඩා 08 ක් තුළ පිරිවැය රු. මිලියන 31 ක හා අමාත්‍යාංශය යටතේ පවත්නා රෝහල් හා ආයතන 50 ක් තුළ පිරිවැය රු.මිලියන 95 ක වශයෙන් මුළු පිරිවැය රු. මිලියන 126 ක් වූ වෛද්‍ය සැපයීම් කල් ඉකුත් වී තිබුණු බව Pronto පරිගණක පද්ධතියෙන් ලබාගත් තොරතුරු අනුව තහවුරු විය. ඒ අතරින් පිරිවැය රු.මිලියන 9 ක් වූ අයිතම 4 ක් වෛද්‍ය සැපයීම් අංශයේ ගබඩා තුළද, එක් අයිතමයක පිරිවැය රු.මිලියනය ඉක්මවූ මුළු පිරිවැය රු.මිලියන 12 ක් වූ අයිතම 10 ක් රෝහල් 08 කද කල් ඉකුත් වී තිබුණි. අධි ඇස්තමේන්තු කිරීම හා සෙමින් චලනය වන අයිතම වීම ඊට හේතුවී තිබුණි.

අධි ඇස්තමේන්තුමත ඖෂධ තොග ලබා ගැනීම

ගර්භණී මව්වරුන්ට ලබා දෙනු ලබන Calcium lactate 300 mg අයිතමය අධි ඇස්තමේන්තු කර ගෙන්වා තිබුණි. ඒ හේතුවෙන් ඇති වූ අතිරික්ත තොග බෙදා හැර අවසන් කිරීමේ අරමුණින් පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ අනුමැතියකින් තොරව වයස අවුරුදු 13 ට වැඩි පාසල් දරුවන්ට හා සුවනාරි සායනවලට සහභාගීවන්නන්ට බෙදාහැර තිබුණි. එමෙන්ම එම ඖෂධ කිරිදෙන මව්වරුන්ට වැඩි මාත්‍රාවන් ලබාදීමටත් කටයුතු කර තිබුණි. බෙදා අවසන් කර ගැනීමට නොහැකි වූ රු.මිලියන 13.5 ක ඖෂධ තොග කල් ඉකුත්වී තිබුණි.

අධ්‍යයන කටයුතු සඳහා විදේශගත වී යළි සේවයට නොපැමිණීම

පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා විදේශගත වීමෙන් පසු නැවත සේවයට වාර්තා නොකිරීම, සේවයට වාර්තා කිරීමෙන් පසු අනිවාර්ය සේවා කාලය රජයට සේවය ලබා නොදීම, රැකියා සඳහා වැටුප් රහිත නිවාඩු ලබා විදේශගත වීමෙන් පසු නැවත සේවයට වාර්තා නොකිරීම හා පුහුණු කටයුතු අතරමඟ හැර යාම ආදී කරුණු හේතුවෙන් රජය සමඟ අත්සන් කර තිබුණු ගිවිසුම් බැඳුම්කර කඩ කළ නිලධාරීන් 69 දෙනෙකුගෙන් රු.මිලියන 118 ක් අයවිය යුතුව තිබුණි. තවත් නිලධාරීන් 141 කුගෙන් අයවිය යුතු මුදල අමාත්‍යාංශය විසින් ගණනය කර නොතිබුණි. තවද වැඩිපුර ගෙවූ වැටුප්, අයවිය යුතු ණය ශේෂ හා

අනෙකුත් ගෙවීම් සැලකිල්ලට ගෙන නොතිබීම හේතුවෙන් වෛද්‍යවරු 06 දෙනෙකුගෙන් රු.මිලියන 2 ක් අඩුවෙන් අයකර ලිපිගොනු වසා දැමීමට හා තවත් වෛද්‍යවරු 06 දෙනෙකුගෙන් අයවිය යුතු මුදල රු. මිලියන 2.8 ක් අඩුවෙන් ගණනය කිරීමට කටයුතු කර තිබුණි.

අවිධිමත් ලෙස ස්ථිර පත්වීම් ප්‍රදානය කර තිබීම

2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය යටතට ගැනෙන ව්‍යාපෘතිවලට කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන සිටි සේවකයින්, 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව ස්ථිර කිරීමේ හැකියාවක් නොතිබුණි. එසේම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ දක්වා ඇති සේවා ගණයන්ට අයත් නොවන සේවකයින්ට ස්ථිර පත්වීම් ප්‍රදානය කළ නොහැකිව තිබියදී එවැනි ව්‍යාපෘති සේවකයින් 120 දෙනෙකුට ස්ථිර පත්වීම් ප්‍රදානය කර තිබුණි.

පරිභෝජන ද්‍රව්‍ය බෙදාහැරීමකින් තොරව රඳවා ගැනීම

සාර්ක් සංවර්ධන අරමුදල් (මාතෘ හා ළමා සෞඛ්‍ය) ව්‍යාපෘතියෙන් පරිත්‍යාග ලෙස ලැබී තිබුණු ඇමෙරිකානු ඩොලර් 500,000 ක් වටිනා පරිභෝජ්‍ය ද්‍රව්‍ය (consumables) පවුල් සෞඛ්‍ය කාර්යාංශය වෙත ලැබී තිබුණි. මෙම පරිභෝජ්‍ය තොගය ගුවන් තොටුපොලෙන් නිෂ්කාශණය කර ගැනීම සඳහා දින 27 ක සිට දින 105 ක් දක්වා කාල පරාසයක් ගත කර තිබුණු අතර පමා කුලී රු.මිලියන 6 ක්ද ඇතුළුව නිශ්කාෂණ ගාස්තු ලෙස රු.මිලියන 15.7 ක් වැය කර තිබුණි. එම පරිභෝජ්‍ය තොගයේ ඇතුළත්ව තිබුණු Dispo Van single use syringe 24 G 20 ml සිරින්ජර් ඒකක 145,000 ක තොගයක් 2015 වර්ෂයේ සිට බෙදාහැරීමකින් තොරවම පවුල් සෞඛ්‍ය කාර්යාංශ පරිශ්‍රය තුළ හා නයිනමඩම වින්තන මධ්‍යස්ථානය තුළ රඳවා ගෙන තිබුණි. 2017 මාර්තු, ජූලි හා ඔක්තෝබර් යන මාසවලදී එම ද්‍රව්‍යවල ජීව කාලය ඉකුත් වී තිබුණි. මෙම සිරින්ජර් 145,000 වෙනුවෙන් වැයකර තිබුණු රු.මිලියන 1.9 ක් වූ පමා කුලී හා නිෂ්කාශණ ගාස්තු නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

සේවය හැර ගිය වෛද්‍යවරුන්ට වැටුප් ගෙවීම

වෛද්‍යවරුන් සේවය හැර ගිය දින සිට මාස 01 ක සිට මාස 57 ක් දක්වා පරාසයක ප්‍රමාද කාලයකින් පසුව සේවය හැර යාමේ ලිපි නිකුත් කර තිබුණු අතර, ඔවුන් සේවයේ නොසිටි කාලයටද වැටුප් ගෙවා තිබුණු අවස්ථා විය. සේවය හැර ගිය වෛද්‍යවරුන්ගේ වර්තමාන ලිපිනයන් සොයාගැනීමට නොහැකිවීම මත ඔවුන්ගෙන් අයවිය යුතු රු.මිලියන 53 ක් සම්බන්ධයෙන් ඉදිරි නීතිමය පියවර ගැනීමට නොහැකිවී තිබුණු අතර මේ පිළිබඳ නීතිමය කටයුතු පසු විපරමට ලක් නොකළ අවස්ථාද විය.

වාහන කළමනාකරණයේ දුර්වලතා

අමාත්‍යාංශයේ ලේකම්, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් හා සෞඛ්‍ය ක්ෂේත්‍රයට අයත් විවිධ තනතුරු නාම යටතේ ලියාපදිංචි වාහන 5,556 ක් පවතින බවට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දත්ත අනුව තහවුරු වූ අතර අමාත්‍යාංශයේ වාහන

ලේඛනය අනුව එම ප්‍රමාණය 5,792 ක් වී තිබුණි. ඉන් වාහන 1,794 ක භෞතික පැවැත්ම තහවුරු කරගෙන නොතිබුණි. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට අනුව අමාත්‍යාංශය සතු වුවද, අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කළ වාහන ලේඛනයේ ඇතුළත්ව නොතිබුණු වාහන 202 කින් මෝටර් රථ හා යතුරු පැදි 171 ක භෞතික පැවැත්ම සනාථ කර නොතිබුණි.

අමාත්‍යාංශය ඉදිරිපත් කළ වාහන ලේඛනයේ ඇතුළත්ව තිබුණු නමුත් බාහිර පාර්ශව වෙත පවරා තිබුණු බවට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් තහවුරු කළ මෝටර් රථ හා යතුරු පැදි 177 ක් එම පාර්ශව වෙත පවරන ලද පදනම අමාත්‍යාංශය විසින් තහවුරු කර නොතිබුණි.

භෞතික පැවැත්ම සත්‍යාපනය කර ගැනීමට නොහැකි වූ මෝටර් රථ 584 ක් ස්ථාවර වත්කම් ලේඛනයෙන් ඉවත් කිරීම සඳහා 2017 මාර්තු 24 දින අමාත්‍යාංශ ලේකම් විසින් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර තිබුණද, එම ඉල්ලීම සඳහා අනුමැතිය ලබාදී නොතිබුණි.

2010 මැයි 14 දිනැති අංක සීඒ/1/17/1 දරන ජනාධිපති ලේකම්ගේ රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛයේ 4.1 ඡේදය ප්‍රකාරව හිමිකම් ලබන වාහන ප්‍රමාණය ඉක්මවා අමාත්‍යවරයා, කාර්ය මණ්ඩලය හා අමාත්‍ය කාර්යාලය වෙත මෝටර් රථ 16 ක් ද, නියෝජ්‍ය අමාත්‍යවරයා, කාර්ය මණ්ඩල හා නියෝජ්‍ය අමාත්‍ය කාර්යාල වෙත මෝටර් රථ 8 ක් ද වෙන්කරදී තිබුණි. තවද අමාත්‍යවරයාට හා නියෝජ්‍ය අමාත්‍යවරයාට හිමි ඉන්ධන දීමනාවට අමතරව 2017 වර්ෂය තුළදී පමණක් පිළිවෙලින් රු.මිලියන 2 ක හා රු.මිලියන 4 ක ඉන්ධන අමාත්‍යාංශය විසින් ලබාදී තිබුණි.

අමාත්‍ය, නියෝජ්‍ය අමාත්‍ය හා කාර්ය මණ්ඩලයට වෙන්කළ වාහනවලට අමතරව 2017 වර්ෂයේ මාස 06 ක කාල පරිච්ඡේදයක් තුළදී පමණක් සංචිත මෝටර් වාහන අවස්ථා 314 කදී ලබාදී තිබුණි. එම අවස්ථා අතරින් අවස්ථා 102 කදී කිලෝ මීටර් 56,182 ක් සඳහා රු.795,370 ක ඉන්ධන වියදම් අමාත්‍යාංශය විසින් වැයකර තිබුණි.

ණය ගිවිසුමට පටහැනිව කටයුතු කිරීම

ශ්‍රී ලංකා ජාතික රෝහල තුළ අපස්මාර රෝහලක් හා දිවයිනේ පළාත් 09 ක් හි අපස්මාර සෞඛ්‍ය මධ්‍යස්ථාන ඉදිකිරීම සඳහා වූ සෞදි රියාල් මිලියන 75 ක් හෙවත් ඇමරිකානු ඩොලර් මිලියන 20 ක් (ආසන්න වශයෙන් රු.මිලියන 3,000 ක්) වූ ණය ගිවිසුම 2008 මාර්තු 26 දින අත්සන් කර තිබුණි. එම ණය ගිවිසුම ප්‍රකාරව, ව්‍යාපෘතිය 2009 දෙසැම්බර් 31 දින අවසන් කිරීමට නියමිතව තිබුණි. අපස්මාර රෝහල පමණක් වර්ෂ 08 ක ප්‍රමාද කාලයකින් පසු ඉදිකර තිබුණු නමුත් පළාත් 09 හි සෞඛ්‍ය මධ්‍යස්ථාන ඉදිකිරීම් කටයුතු ආරම්භ කර හෝ නොතිබුණි. තවද ණය ගිවිසුමට පටහැනිව, පළාත් 09 හි සෞඛ්‍ය මධ්‍යස්ථාන ඉදිකිරීම සඳහා අනුමත වී තිබුණු ණය මුදලද, අපස්මාර රෝහල ඉදිකිරීම සඳහාම වැය කර තිබුණි. ව්‍යාපෘතියේ එක් අරමුණක් වූ අපස්මාර සෞඛ්‍ය මධ්‍යස්ථාන 09 ඉදිකිරීම සඳහා 2015 ඔක්තෝබර් 30 දින නැවතත් සෞදි සංවර්ධන අරමුදලෙන් සෞදි රියාල් මිලියන 45 ක් හෙවත් ඇමරිකානු ඩොලර් මිලියන 12 ක (ආසන්න වශයෙන් රු.මිලියන 1,800 ක්) ණයක්

ලබා ගැනීම සඳහා වූ අතිරේක ණය ගිවිසුමට එළඹී තිබුණි. ණය ගිවිසුම් කොන්දේසිවලට පටහැනිව, ණය මුදල සෞඛ්‍ය මධ්‍යස්ථාන ඉදිකිරීම සඳහා වැය නොකර අපස්මාර රෝහල සඳහා අවශ්‍ය වෛද්‍ය ප්‍රතිරූපන උපකරණ (Diagnostic Medical Imaging Equipment) මිලදී ගැනීම සඳහා වැයකර තිබුණි.

මාලඹේ වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු රෝහලේ දේපල භෞතික භුක්තියට පවරා ගැනීම

මාලඹේ වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු ශ්‍රී ලංකා රුසියානු මිත්‍රත්ව රෝහලේ දේපල ඇතුළු ගොඩනැගිලිවල භෞතික භුක්තිය අනු කල්බදු පදනම මත වර්ෂ 10 කට ශ්‍රී ලංකා රජය වෙත මාරු කිරීමට එකඟතාවයකට පැමිණීමටත්, රෝහල ස්ථාපනය කිරීම සඳහා පෞද්ගලික ආයතනයක් රාජ්‍ය බැංකුවකින් ලබා ගෙන තිබුණු රු.මිලියන 1,013 ක ණය මුදල ගෙවා නිමවන තෙක් එකී දේපලවල අයිතිය හා නීත්‍යානුකූලභාවය එම පෞද්ගලික ආයතනය වෙත එලෙසම පවත්වා ගැනීමටත්, ණය මුදල ගෙවා අවසානයේදී රෝහලේ අයිතිය හා සියළු දේපල වටිනාකම ශ්‍රී ලංකා රජය වෙත මාරු කිරීමටත් යෝජනා කරමින් ඉදිරිපත් කර තිබුණු අමාත්‍ය මණ්ඩල සංදේශය සලකා බලමින් එම රෝහල රජයට පවරා ගැනීම සඳහා 2017 ජූලි 05 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි.

අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී වර්ෂ දෙකකට ආසන්න කාලයක් ගතව තිබුණද, රෝහලේ දේපල ඇතුළු ගොඩනැගිලිවල භෞතික භුක්තිය රජයට පවරා ගැනීමට අනු කල්බදු ගිවිසුමකට ඇතුළත්වී නොතිබුණු අතර එවැනි ගිවිසුමකට එළඹීමෙන් තොරව 2017 අගෝස්තු 01 දින සිට 2018 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය තුළදී මෙම රෝහලේ අයහාර වියදම් පියවා ගැනීම සඳහා අමාත්‍යාංශය විසින් රු.මිලියන 583 ක් වැයකර තිබුණි.

පෝෂණ අතිරේකයන් ලබා ගැනීම සඳහා වැඩියෙන් ගෙවීම

2016/2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික රෝහල විසින් සකස් කරන ලද ආහාර ද්‍රව්‍ය සපයා ගැනීමේ ප්‍රසම්පාදනය සඳහා පත්කර තිබුණු තාක්ෂණික ඇගයීම් කමිටුවට පෝෂණ අතිරේක පිළිබඳ දැනුමක් සහිත පෝෂණවේදියෙකු පත්කර නොතිබුණි. වෛද්‍යවරුන්ගේ හා පෝෂණවේදීන්ගේ නිර්දේශ මත හා මාසික අවශ්‍යතාවය මත පදනම්ව පිළියෙල කර තිබුණු ඇස්තමේන්තුවෙහි පෝෂණ අතිරේකයන් 05 ක් සම්බන්ධයෙන් මිනුම් ඒකකය ටින් හෝ පැකට් ලෙස සඳහන් කර තිබුණි. නමුත් ඒවාට අදාළ බර ප්‍රමාණයන් හා අඩංගු විය යුතු පෝෂණ කොටස් පිළිබඳව සඳහන් කර නොතිබුණි. එසේම සැපයුම්කරුවන් විසින් ටින් සඳහා ලංසු ඉදිරිපත් කළ ආහාර වර්ග පැකට් වශයෙන්ද, පැකට් සඳහා ලංසු ඉදිරිපත් කළ ආහාර වර්ග ටින් වශයෙන්ද සපයා තිබුණි. Impact පෝෂණ අතිරේකය ග්‍රෑම් 74 කුඩා සැෂේ පැකට් 05 ක් අන්තර්ගත ටින් එකක් සඳහා රු.1,390 ක ලංසුවක් ඉදිරිපත් කර තිබුණු සැපයුම්කරු වෙත එම සැෂේ පැකට් 23,304 ක් සඳහා පැකට් එකකට රු.1,390 ක් බැගින් ගෙවා තිබීම හේතුවෙන් සැපයුම්කරු වෙත රු.මිලියන 26 ක් වැඩියෙන් ගෙවා තිබුණි. මෙම Impact පෝෂණ අතිරේකය ග්‍රෑම් 74 කුඩා සැෂේ පැකට් එකක සාමාන්‍ය වෙළඳපොලේ සිල්ලර මිල රු.365 ක් විය.

හයිඩ්‍රොක්ලේව් යන්ත්‍ර දෙක නිෂ්කාර්යව පැවතීම

සායනික අපද්‍රව්‍ය විනාශ කිරීම සඳහා ශ්‍රී ලංකා ජාතික රෝහලේ සවිකර තිබුණු හයිඩ්‍රොක්ලේව් යන්ත්‍ර දෙක නඩත්තු කිරීම හා සේවා කිරීම පෞද්ගලික සමාගමක් වෙත පවරා තිබුණි. නමුත් ගිවිසුම් ගත කාලය ඉකුත්වීමට මාස 06 කට පෙර එම යන්ත්‍ර දෙක භාවිතා කරමින් සායනික අපද්‍රව්‍ය විනාශ කිරීමේ ක්‍රියාවලිය නවතා දමා තිබුණි. ඒ හේතුවෙන්, 2016/2017 කාල පරිච්ඡේදය සඳහා 2016 අගෝස්තු මාසයේදී ගෙවා තිබුණු රු. මිලියන 3 ක් වූ නඩත්තු හා සේවා ගාස්තුවෙන් 2016 දෙසැම්බර් මාසයේ සිට වූ මාස 06 ක කාලපරිච්ඡේදය වෙනුවෙන් ගෙවා තිබුණු රු.මිලියන 1.6 ක වියදම නිෂ්කාර්ය වී තිබුණි. තවද, එම හයිඩ්‍රොක්ලේව් යන්ත්‍ර දෙක හා ඊට සම්බන්ධ කර තිබුණු ඉලෙක්ට්‍රොනික් ස්ටීම් බොයිලර් යන්ත්‍ර දෙක 2016 දෙසැම්බර් මාසයේ සිට නිෂ්කාර්යව තබා තිබුණි.

පෙට් සීටී ස්කෑනර් (Pet CT Scanner) යන්ත්‍රයක් මිලදී ගැනීම

මහරගම අපේක්ෂා රෝහල සඳහා පෙට් සීටී ස්කෑනර් (Pet CT Scanner) යන්ත්‍රයක් සැපයීම, ස්ථාපනය කිරීම, පරීක්ෂා කිරීම හා ක්‍රියාත්මක කරවීම සඳහා වූ ප්‍රසම්පාදනය වෙනුවෙන් ඉදිරිපත් කර තිබුණු අවම ලංසුව රු.මිලියන 156 ක් වූ අතර, දෙවන හා අවසාන වැඩිම සංශෝධිත ලංසුව වූ රු.මිලියන 192 ක් ඉදිරිපත් කර තිබුණු ලංසුකරු වෙත කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.5 මාර්ගෝපදේශය ප්‍රකාරව, පිළිගත හැකි සුරක්ෂණයක් මත ණයවර ලිපියේ වටිනාකමින් සියයට 30 කට සමාන මුදලකට වැඩි නොවන මුදලක් අත්තිකාරමක් වශයෙන් ගෙවිය හැකිව තිබුණි. ඊට පටහැනිව ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශය විසින් යන්ත්‍රයේ මව් සමාගමේ නමට මෙම Pet CT Scanner යන්ත්‍රයේ වටිනාකමින් සියයට 80 ක වටිනාකමට ණයවර ලිපි විවෘත කර තිබුණි. 2018 මාර්තු 30 දින වන විට මෙම ප්‍රසම්පාදනය වෙනුවෙන් රු.මිලියන 179 ක් සැපයුම්කරු වෙත ගෙවා තිබුණි.

මෙම යන්ත්‍රය මිලදී ගැනීම සඳහා පුද්ගල සංවිධානයක් හා එක්ව මුදල් රැස්කිරීමටත් එම මුදල් ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල නමින් වූ ගිණුමකට බැර කිරීමටත් කටයුතු කර තිබුණි. නමුත් ඒ සඳහා සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් හා ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලෙන් පූර්ව අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

සමාජ සේවා හා පොදු පහසුකම් සැපයීම සඳහා පුන්‍ය ආයතනයක් ලෙස සමාජ සේවා දෙපාර්තමේන්තුවෙන් විධිමත් පරිදි බලය ලබාගත් ආයතනයක් නොවූ එම පුද්ගල සංවිධානය විසින් මහජන මුදල් රැස්කිරීමට කටයුතු කර තිබුණි. රූපවාහිනී නාලිකාවක් මගින් මේ පිළිබඳ ප්‍රචාරණ කටයුතු සඳහා පමණක් මැදිහත්වී තිබුණු අතර එම පුද්ගල සංවිධානය විසින් මෙම යන්ත්‍රය මිලදී ගැනීම සඳහා කිසිදු මුදලක් පරිත්‍යාගකර නොතිබුණි. ප්‍රසම්පාදන කටයුතු සඳහා අමාත්‍යාංශ නිලධාරීන් වෙත බලපෑම්කර තිබුණු මෙම පුද්ගල සංවිධාන යන්ත්‍රයේ පිරිවිතර සම්බන්ධයෙන් අදහස් දක්වා තිබුණි.

වර්තමානය වන විට මෙම පුද්ගල සංවිධානය පොදු සීමිත සමාගමක් නමින් වූ

ලිපි ශීර්ෂ භාවිතා කරමින් තම සංවිධාන කටයුතු පවත්වාගෙන යන එම තත්ත්වයන් යටතේ මහජන මුදල් රැස්කිරීම සඳහා අනිසි අධිකාරී බලයක් එම පුද්ගල සංවිධානයට ලැබී තිබීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය අවධානය යොමු වී නොතිබුණි.

රෝහල් සංවර්ධන සංගමය නමින් ඉඩමක් මිලදී ගැනීම

යාපනය ශික්ෂණ රෝහලේ අධ්‍යක්ෂකවරයා හා එම රෝහල් සංවර්ධන සංගමය විසින් ඉඩමක් මිලදී ගැනීමට අදාළව යාපනය දිස්ත්‍රික් ලේකම්වරයා සමඟ ලිපි ගනුදෙනු සිදුකර තිබුණි. එම ලිපිවලට අනුව ඉඩම මිලදී ගැනීමට අපේක්ෂාවෙන් පසුවන්නේ යාපනය ශික්ෂණ රෝහල් සංවර්ධන සංගමය නැමැති රාජ්‍ය නොවන සංවිධානයක් වන බව තහවුරු වී තිබුණි. නමුත් දිස්ත්‍රික් ලේකම්වරයකු හා රෝහලේ අධ්‍යක්ෂකවරයකු සතු බලතල අභිබවායමින් වෙනත් කිසිදු අධිකාරී බලයකින් හෝ අනුමැතියකින් තොරව රජයේ මුදල් රු.මිලියන 12.5 ක් දිස්ත්‍රික් ලේකම්වරයා විසින් රෝහල වෙතත් ඉන් පසුව රෝහල් අධ්‍යක්ෂකවරයා විසින් රෝහල් සංවර්ධන සංගමය වෙතත් මුදාහැරීමට කටයුතු කර තිබුණි.

රෝහල් සංවර්ධන සංගමය විසින් රු.මිලියන 12.5 ක් ගෙවා එම සංගමය නමින් ඉඩම මිලදී ගෙන තිබුණි. ඉඩමේ අයිතිකරු වෙත සෘජුවම මුදල් ගෙවා ඉඩම මිලදී ගැනීම වෙනුවට වක්‍රාකාර මුදල් ගෙවා ගනුදෙනුවේ අවිධිමත් බව යටපත් කර තිබුණි.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් ඉඩම මිලදී ගැනීම සඳහා මුදල් මුදාහැරීමට පෙර මිලදී ගැනීමට යෝජිත පත්ඉරු මගින් සනාථ කර ගත යුතු ඉඩමේ ඉතිහාසය, ඉඩමේ සැලැස්ම හා ඉඩමේ තක්සේරු වටිනාකම ආදී තොරතුරු ලබා ගෙන ගනුදෙනුවේ සාධාරණ බව හා විනිවිදභාවය සම්බන්ධයෙන් සෑහීමකට පත්විය යුතු වුවත්, එපරිදි කටයුතු කර නොතිබුණි.

ඉඩම මිලදී ගෙන තිබුණු 2011 අගෝස්තු 02 දිනට පසු එනම් 2011 සැප්තැම්බර් 19 දින තක්සේරු වාර්තාව ලබා ගෙන තිබුණු අතර ඉඩමේ හිමිකරු බලාපොරොත්තු වූ වටිනාකම ඔහු වෙත ලබාදීම අරමුණු කරගනිමින් තක්සේරු වාර්තාව නිකුත් කර තිබුණි. තවද තක්සේරු වාර්තාවෙහි මෙම ඉඩම වාණිජ වටිනාකමක් සහිත ඉඩමක් ලෙස සලකා තක්සේරු කර තිබුණි.

යාපනය ශික්ෂණ රෝහලේ ඉදිකිරීම්

2016, 2017 හා 2018 යන වර්ෂවලදී යාපනය ශික්ෂණ රෝහලේ ඉදිකිරීම සම්බන්ධයෙන් මුළු කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 170 ක් වූ කොන්ත්‍රාත් 310 ක් රාජ්‍ය නොවන සංවිධානයක් ලෙස ලියාපදිංචි කර තිබුණු සංගමයක් වෙත ප්‍රදානය කර තිබුණි. එම සංගමය යාපනය ශික්ෂණ රෝහලේ විශේෂඥ වෛද්‍යවරුන් 06 දෙනෙකු පමණක් සාමාජිකත්වය දරන ප්‍රජා පාදක සංවිධානයක් ලෙස සැලකිය නොහැකි සංවිධානයක් වූ අතර ICTAD ආයතනයේ M8 ශ්‍රේණියේ හෝ ඊට ඉහළ ශ්‍රේණියක ලියාපදිංචියද ලබා ගෙන නොතිබුණි. ඒ අනුව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 හා 3.9.2 මාර්ගෝපදේශවල සඳහන් අවශ්‍යතාවයන් ඉටු කර නොතිබුණු මෙම සංගමය වෙත ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයා සහ දෙපාර්තමේන්තු ප්‍රධානියා නම් කරන ලද සාමාජිකයින් දෙදෙනෙකු ගෙන් සමන්විත කමිටුවක නිර්දේශ ලබා ගැනීමකින් තොරව ඉහත සඳහන් කොන්ත්‍රාත්තු පිරිනමා තිබුණි.

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 මාර්ගෝපදේශ

ප්‍රකාරව, පවරන ලද කොන්ත්‍රාත්තු, උප කොන්ත්‍රාත් වශයෙන් වෙනත් පාර්ශවයන් වෙත ලබා නොදිය යුතුව තිබුණත්, එම සියලු කොන්ත්‍රාත් යාපනය ශික්ෂණ රෝහලේ අධ්‍යක්ෂවරයාගේ සභාපතිත්වයෙන් යුක්ත සුභසාධක සංගමයක් වෙත නැවත උප කොන්ත්‍රාත් ලෙස ලබාදී තිබුණි. එමෙන්ම දෙවන උප කොන්ත්‍රාත් ලබාගත් එම සුභසාධක සංගමය ICTAD ආයතනයේ ලියාපදිංචි වූ හා පූර්ව කොන්ත්‍රාත් පළපුරුද්දක් සහිත හා අදාළ වෘත්තීය දක්ෂතාවයකින් යුත් සේවකයන්ගෙන් සමන්විත වී නොතිබුණි. එබැවින් එම සුභසාධක සංගමය විසින් ලබාගෙන තිබුණු උපකොන්ත්‍රාත් කාර්යයන් පෞද්ගලික මට්ටමින් වෘත්තිකයන් යොදවාගෙන නිමකර තිබුණි. ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිත්වය දරන රෝහල් අධ්‍යක්ෂවරයා විසින් තමා සභාපතිත්වය දරන සුභසාධක සංගමය වෙත වක්‍රාකාරව රෝහල් කොන්ත්‍රාත් ලබාගැනීම තුළ ප්‍රසම්පාදනයේ විනිවිදභාවය අහිමි කර තිබුණි.

කොන්ත්‍රාත් 310 ට අදාළ ප්‍රමාණ පත්‍ර (BOQ) මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය (CECB) විසින් පිළියෙල කර තිබුණි. ප්‍රමාණ පත්‍ර පිළියෙල කිරීමට පෙර අදාළ කාර්ය ඇතුළත් ප්‍රදේශය (Location), කාර්යය ඉටුකළ යුතු ආකාරය, මිනුම් අගයන් හා භාවිතා වන මූලික ද්‍රව්‍ය පිළිබඳ දත්තයන් ඇතුළත් Drawings පිළියෙල කර ඊට අදාළ වන සේ ප්‍රමාණ පත්‍ර සැකසීම සාමාන්‍ය ක්‍රමය විය. එවැනි Drawings නොමැතිව ප්‍රමාණයන් හා රේටයන් පමණක් ඇතුළත්ව CECB ආයතනය විසින් ප්‍රමාණ පත්‍ර (BOQ) පිළියෙල කර තිබුණි. රාජ්‍ය ආයතනවලට අදාළ කොන්ත්‍රාත් හා අළුත්වැඩියා කාර්යයන්හි ප්‍රමාණ පත්‍ර පිළියෙල කිරීමේදී ගොඩනැගිලි දෙපාර්තමේන්තුව ඒ ඒ පළාත්වලට අදාළව නිකුත් කර ඇති රේටයන් භාවිතයට ගත යුතු වුවත්, CECB ආයතනය විසින් රෝහල සඳහා ඔවුන් විසින් පිළියෙල කර තිබුණු රේටයන් භාවිතා කර තිබුණි. රෝහලේ තාක්ෂණික නිලධාරියා විසින් CECB අනුමත රේටයන් ද භාවිතා නොකොට වෙනත් රේටයන් භාවිතා කර තිබීම තුළ, උක්ත කොන්ත්‍රාත් විෂයන් සඳහා පිළියෙල කර තිබුණු ප්‍රමාණ පත්‍රයන්හි දැක්වෙන පිරිවැය ඇස්තමේන්තු නිවැරදි හා තාත්ත්වික අගයන් වී නොතිබුණි.

අවිධිමත් ලෙස නිදර්ශක දීමනා ගෙවීම

නියැදි පදනම මත තෝරා ගත් පොළොන්නරුව, යාපනය හා බදුල්ල ශික්ෂණ රෝහල් තුනෙහි එක්ස් කිරණ පරීක්ෂාවන් සිදුකරන විකිරණ ශිල්පින්, භෞත චිකිත්සක අංශයේ තෙරපිවරුන්, ECG බන්ධ රේඛන ශිල්පීන් හා රසායනාගාර පරීක්ෂකවරුන් (MLT) වැනි පරිපූරක වෛද්‍ය සේවයේ නිලධාරීන් විසින් අවිධිමත්ව, විනිවිදභාවයකින් තොරව හා නීත්‍යානුකූල නොවන පරිදි අතිකාල හා නිදර්ශක දීමනා ලබා ගෙන තිබුණි.

පරිපූරක වෛද්‍ය සේවයේ නිලධාරීන් වෙත තම සේවා කටයුතු වෙනුවෙන් අවදානම ඉතා අඩු, කාර්යක්ෂම හා පූර්ණ ස්වයංක්‍රීය යන්ත්‍ර සූත්‍ර හඳුන්වා දී තිබුණු නමුත්, අතිකාල වෙනුවෙන් වූ නිදර්ශකය හා නිදර්ශක දීමනාව පැහැදිලි ලෙස අර්ථකතනය කර නොතිබීම හේතුවෙන් ප්‍රායෝගිකත්වයෙන් හා සාධාරණත්වයෙන් තොරව අතිකාල දීමනා ගෙවා තිබුණි. අතිකාල දීමනා සඳහා වරින් වර නිකුත් කර ඇති චක්‍රලේඛනයන්හි නිදර්ශක දීමනාව, අතිකාල දීමනාව, පොරොත්තු දීමනාව හා උපරිම අතිකාල

දීමනාවල වටිනාකම් අතර පරස්පරතාවයන් පැවති අතර, අතිකාල දීමනා සඳහා එක් ස්ථිර පොදු නිර්ණායකයක් ස්ථාපිත කර නොතිබුණි.

සේවා මුර ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම තුළින් තම මූලික වැටුප මෙන් කිහිප ගුණයක් අතිකාල දීමනා ලබාගැනීමට ලබාදී තිබුණු අවස්ථාවන් පාලනය කරමින් අතිකාල පාලනයක් ඇති කිරීමට කටයුතු කර නොතිබුණි. පරීක්ෂණයට ලක් කළ බොහෝ අවස්ථාවන්හිදී, සාමාන්‍ය රාජකාරි කාලය තුළ සිදුකරන ලද පරීක්ෂණ සංඛ්‍යාවට වඩා දෙතුන් ගුණයකින් වැඩි පරීක්ෂණ සංඛ්‍යාවක් අතිකාල කාලය තුළ සිදුකරමින් අසාමාන්‍ය අතිකාල දීමනා ලබා ගෙන තිබුණු බව තහවුරු විය. සාමාන්‍ය රාජකාරි කාලය තුළ සිදුකරන පරීක්ෂණ, විවේක කාලය තුළ සිදුකළ බවට ව්‍යාජ සටහන් යොදා දීමනා ලබා ගෙන තිබුණු අවස්ථා අනාවරණය විය.

නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත ජීව වෛද්‍ය උපකරණ

සේවක පුරප්පාඩු පැවතීම, වෛද්‍යවරු නොමැති වීම, ගොඩනැගිලි ඉදිකර නොතිබීම, උපාංග හා අමතර කොටස් නොමැති වීම, ඉල්ලීම කළ විශේෂඥ වෛද්‍යවරයා ස්ථානමාරුවීම, ඉල්ලීමකින් තොරව උපකරණ ලැබී තිබීම හා ඒවායේ අවශ්‍යතාවයක් නොතිබීම, ශ්‍රී ලංකා පරමාණු බලශක්ති පනත අනුව ලබා ගත යුතු බලපත්‍ර ලබා නොතිබීම හා අළුත්වැඩියා නොකිරීම යනාදී වූ හේතු නිසා මුළු පිරිවැය රු.මිලියන 3,030 ක් වූ ජීව වෛද්‍ය උපකරණ 854 ක් රෝහල් 33 ක් තුළ මාස 05 ක සිට වර්ෂ 07 ක් දක්වා වූ කාල පරාසයක සිට නිෂ්කාර්යව හෝ ඌන උපයෝජිතව පැවතුණි. ඊට අමතරව යාපනය, කරාපිටිය හා මඩකළපුව ශික්ෂණ රෝහල්වල ස්ථාපිත පිළිකා රෝග ප්‍රතිකාර ඒකක සඳහා රු.මිලියන 726 කට මිලදී ගෙන තිබුණු අධිශක්ති විකිරණ උපකරණ 03 ක් ඒවා ස්ථාපිත කිරීමට අවශ්‍ය බංකර ඉදිකර නොතිබීම හේතුවෙන් වර්ෂ 03 කට අධික කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි.

ප්‍රමාධ්‍යය

ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූල නොවීම

ගෙවීම් ප්‍රමාද කිරිම නිසා වූ අවාසිය

ගෙවා තිබුණු අත්තිකාරම් ආපසු අයකර නොගැනීම

සේවක අර්ථසාධක අරමුදලට අධිභාර ගෙවීම

රජයේ පුවත්පත් අලෙවිය අඩුවීම

ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරිම

ජනතා ආකල්ප යහපත් මානයන් කරා කේන්ද්‍රගත කරමින් ආර්ථික, සමාජීය, සංස්කෘතික හා දේශපාලනමය ක්ෂේත්‍රයන්හි ප්‍රගමන කාරකයක් ලෙස ජනමාධ්‍ය දායකත්වය ලබාදීම මෙම ක්ෂේත්‍රයේ අරමුණු වී තිබුණි. එම අරමුණු ඉටුකිරීම සඳහා පහත සඳහන් කාර්යභාරය මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුවක් හා ව්‍යවස්ථාපිත ආයතන නවයක් විසින් ඉටුකළ යුතුව පැවතුණි.

ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය සහ සමාජ ප්‍රගතිය කඩිනම් කිරීම සඳහා රාජ්‍ය සම්පත් ප්‍රශස්ත අන්දමින් සහතික කිරීම පිණිස රාජ්‍ය මූල්‍ය හා ජනමාද්‍ය කටයුතුවලට අදාළ වන ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායයන් සම්පාදනය කර ක්‍රියාත්මක කිරිම සහ ජනතා ආකල්ප යහපත් මානයන් කරා කේන්ද්‍ර ගත කරමින් ආර්ථික, සමාජීය, සංස්කෘතික හා දේශපාලනික ක්ෂේත්‍රයන්හි ප්‍රගමන කාරකයක් ලෙස ජනමාධයයෙහි දායකත්වය ලබා දීම.

අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තුව හා ව්‍යවස්ථාපිත ආයතන විසින් ඉහත සඳහන් කාර්යභාරය ඉටුකිරිම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වු නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

සංනිවේදන උපකරණ මිලදී ගැනීම

සංහිදියාවේ නාලිකාව වෙනුවෙන් ප්‍රධාන පාලක මැදිරියට රු.මිලියන 48.60 ක් වැයකර විදේශීය සැපයුම්කරුවකුගෙන් සන්නිවේදන උපකරණ මිලදීගැනීම සඳහා වූ ප්‍රසම්පාදනයේදී ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ තාක්ෂණික පිරිවිතර අනුව උපකරණ කොටස් සඳහා වගකීම් කාලය වර්ෂ 5 ක් ලෙස සඳහන් කර තිබුණි. නමුත් කොන්ත්‍රාත් ගිවිසුමෙහි වගකීම් කාලය එක් වර්ෂයට පමණක් සීමා කර තිබුණි. තවද සතියේ ඕනෑම දිනක පැය 24 තුළම සේවා සහාය ලබා දීමට කොන්ත්‍රාත්කාර සමාගම එකග වී තිබුණද, 64 x 64 Digital Video Switch මිලදී ගෙන මාස 09 ක් ඉකුත්වීමට පෙර ක්‍රියාවිරහිත වී තිබුණි. ඒ සඳහා සේවා සැපයීම දින 21 කට පසුව ආරම්භකර තිබුණි. තවද, මෙම උපකරණය සඳහා අතිරේක පද්ධතියක් සැපයීමට සහ ඇතැම් උපකරණ සඳහා අවශ්‍ය අමතර උපාංග සැපයීමට පිරිවිතර අනුව එකග වී තිබුණද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූල නොවීම

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.6.1 මාර්ගෝපදේශය ප්‍රකාරව එකම භාණ්ඩය මිලදී ගැනීම සඳහා මුල් සැපයුම්කරු වෙත, නැවත ඇණවුමක් නිකුත් කරනු ලබන විට එම ඇනවුමේ වටිනාකම මුල් කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 50 ක් වැඩි නොවිය යුතුය. එසේ වුවද, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව 2018 ජනවාරි හා පෙබරවාරි මාසවලදී broadcast quality H.D කැමරා තුනක් එ.ජ.ඩො 82,256.12 කට මිලදී ගත් කොන්ත්‍රාත්කරුගෙන් මාර්තු සහ අප්‍රේල් මාසවලදී නැවත කැමරා දෙකක් එ.ජ.ඩො 47,685.52 කට මිලදී ගෙන තිබුණි. ඒ අනුව මුල් කොන්ත්‍රාත්තුවේ සියයට 50 ක වටිනාකමට වඩා එ.ජ.ඩො 6,557.46 ක් ඉක්මවා තිබුණි.

ගෙවීම් ප්‍රමාද කිරීම

2016 අගෝස්තු මාසයේ පැවති රියෝ ඔලිම්පික් තරගාවලියේ විකාශන අයිතිය ලබාගැනීම

සම්බන්ධයෙන් විදේශීය පෞද්ගලික සමාගමක් හා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව අතර ගිවිසුමකට එළඹ තිබුණි. එම ගිවිසුම අනුව 2016 අගෝස්තු මාසයේදී විදේශීය සමාගමට එ.ජ.ඩො.125,000 ක් ගෙවිය යුතුව තිබුණි. එම ගෙවීම වර්ෂ දෙකකට වැඩි කාලයක් ප්‍රමාද කිරීම නිසා ඇති වූ විනිමය අනුපාතයේ අවාසි වෙනස හේතුවෙන් සංස්ථාවට රු.මිලියන 2.12 ක අවාසියක් සිදු වී තිබුණි.

ලොතරැයි දිනුම් ඇදීම විකාශය කිරීම

සමාලෝචිත වර්ෂයේදී ලොතරැයි දිනුම් ඇදීම විකාශය කිරීමෙන් රු.මිලියන 763.36 ක ආදායමක් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව විසින් උපයා ගෙන තිබුණි. ඒ සඳහා සංස්ථාව රු.මිලියන 154.01 ක නිෂ්පාදන වියදමක් කර තිබුණි. නියෝජිත කොමිස් රු.මිලියන 91.40 ක් හා අලෙවි විධායක කොමිස් රු.මිලියන 1.08 ක් වශයෙන් එකතුව රු.මිලියන 246.49 ක් වී තිබුණි. එම ගනුදෙනුව සඳහා රාජ්‍ය ආයතන සෘජුවම සම්බන්ධ නොවීම නිසා රු.මිලියන 91.40 ක් සංස්ථාවට අහිමි වී තිබුණි.

ගෙවා තිබුණු අත්තිකාරම් ආපසු අයකර නොගැනීම

ශ්‍රී ලංකාවේ ජාතික අනන්‍යතාව ලොවට ගෙනයාම හා විදේශගත ලාංකිකයන්ගේ දැනුම රසාස්වාදය ප්‍රවර්ධනය සඳහා චන්ද්‍රිකා තාක්ෂණය ඔස්සේ ඉතාලියේ හෝ යුරෝපයේ වෙනත් රටක ස්ථාපිත කරන මැදිරියක රූපවාහිනී නාලිකාවක් පවත්වාගෙන යාමටත් ඊට අවශ්‍ය උපකරණ තාවකාලිකව බදු පදනමක් යටතේ මුදල් අමාත්‍යාංශයේ එකඟතාවය මත ලබා ගැනීමටත් අමාත්‍ය මණ්ඩලය විසින් 2014 දෙසැම්බර් මාසයේදී අනුමැතිය ලබා දී තිබුණි. එහි ආරම්භක කටයුතු සඳහා 2015 ජනවාරි 02 දින රු.මිලියන 3.45 ක් අත්තිකාරම් වශයෙන් චන්ද්‍රිකා තාක්ෂණය අන්තර්ජාතිකව බෙදාහරින සමාගමක් වෙත ගෙවා තිබුණි. එම ගෙවීම සඳහා ලිඛිත ගිවිසුමකට එළඹ නොතිබුණු අතර මුදල් අමාත්‍යංශයේ එකඟතාවයද ලබා ගෙන නොතිබුණි. එසේ වුවත් 2015 ජනවාරි මාසයෙන් පසුව එම කාර්යය මුළුමනින්ම අත්හැර තිබුණු අතර ගෙවන ලද අත්තිකාරම ආපසු අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

සේවක අර්ථසාධක අරමුදලට අධිභාර ගෙවීම

1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 15 වන වගන්තිය අනුව සේවක අර්ථසාධක අරමුදල් දායකයන් අඩුකළ මාසයට පසුව එළඹෙන මාසයේ අවසාන දිනට පෙර එම අර්ථසාධක අරමුදල් දායකයන් සේවක අර්ථසාධක අරමුදල වෙත ප්‍රේෂණය කළ යුතු වුවත්, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව විසින් 2007 හා 2008 වර්ෂවල අවකරණය කරන ලද සේවක අර්ථසාධක අරමුදල් දායකයන් ප්‍රමාද කර ප්‍රේෂණය කර තිබුණි. මෙම ප්‍රමාද කිරීම හේතුවෙන් 2007 අප්‍රේල් මාසයේ සිට 2009 දෙසැම්බර් මාසය දක්වා කාලයට අදාළව රු.මිලියන 15.05 ක් අධිභාර සංස්ථාව විසින් ගෙවා තිබුණි.

ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම

ශ්‍රී ලංකා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර සංවර්ධන ව්‍යාපෘති 10 ක් ක්‍රියාවට නැංවීම සඳහා රු.මිලියන 81 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, සමාලෝචිත වර්ෂයේදී එම ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම නිසා

සලසා තිබුණු ප්‍රතිපාදනය මුළුමණින්ම ඉතිරි කර තිබුණි.

පුවත්පත් අලෙවිය අඩුවීම

සීමාසහිත ලංකාවේ එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් ප්‍රකාශනය කරනු ලබන සන්ඩේ ඔබ්සවර්, ඩේලි නිවුස්, දිනමිණ සහ සිළුමිණ පුවත්පත්වලට අදාළව සමාලෝචිත වර්ෂයේදී අලෙවි කරන ලද පිටපත් සංඛ්‍යාව සියයට 5 ක සිට සියයට 12 ක් දක්වා පරාසයකින් අඩු වී තිබුණි. “තරුණී” ,“මාංචු” සහ “සුබසෙත” නම් වූ වාර සඟරාවල ද සියයට 9 ක සිට සියයට 11 ක් දක්වා වූ පරාසයකින් අලෙවි කරන ලද පිටපත් සංඛ්‍යාව අඩුවී තිබුණි.

සීමාසහිත ලංකාවේ එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී වාණිජ මුද්‍රණ අංශය, විශේෂ ප්‍රකාශන සහ ඩිජිටල් මුද්‍රණයන්ගේ ආදායම පිළිවෙලින් සියයට 13 ක්, සියයට 21 ක් සහ සියයට 63 ක් වශයෙන් අඩු වී තිබුණි.

නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධනය

රථවාහන අනතුරු වැඩිවීම

අපරාධ විසඳීම ඉකුත් වර්ෂයට සාපේක්ෂව අඩුවීම

තොරතුරු සන්නිවේදනය පද්ධතිය වැඩි දියුණු නොකිරීම

“ගමට පොලීසිය“ සංකල්පය සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන ඌන උපයෝජනය

එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරියට එක් නොවීම

නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධනය

නීති ගරුක සමාජයක් සඳහා නීතිය හා සාමය පවත්වාගෙන යාම, දකුණු පළාතේ සංවර්ධනය ඉහළ නැංවීම මෙම ක්ෂේත්‍රයෙන් අපේක්ෂා කරන ප්‍රතිඵලය වී තිබුණි. එම ප්‍රතිඵලය අත්කර ගැනීම සඳහා නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුවකින් හා ව්‍යවස්ථාපිත මණ්ඩල/ආයතන 03 ක් විසින් පහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි.

- නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන විෂයයන්ට අදාළ අදාළ ප්‍රතිපත්ති වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසුවිපරම් කිරීම හා අගැයීම, නීතිය හා සාමය පවත්වාගෙන යාම සමාජ විනය තහවුරු කරන පුළුල් ප්‍රතිසංස්කරණය කිරීම ඇතුළත් උපාය මාර්ග සංවර්ධනය.
- රථවාහන ගමනාගමනය පාලනය.
- අපරාධ හා සමාජ විරෝධී ක්‍රියා මැඩපැවැත්වීම හා වැලැක්වීම
- ඓතිහාසික ගාලු කොටුව සංරක්ෂණය, ආරක්ෂාව සහ පුරුත්ථාපනය කිරීම.
- දක්ෂිණ පළාත් සංවර්ධන මණ්ඩලය ස්ථාපනය කිරීම.

ඉහත සඳහන් කාර්යභාරයන් ඉටු කිරීම සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

රථවාහන අනතුරු වැලැක්වීම

ජනතාවගේ ජීවිත හා දේපළවල ආරක්ෂාව සලසන පරිදි රථවාහන ගමනා ගමනය විධිමත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්ය වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව මුළු රිය අනතුරු සංඛ්‍යාව සමාලෝචිත වර්ෂයේ දී 2,133 කින් අඩු වී තිබුණද, මාරක අනතුරු සංඛ්‍යාව 31 කින් හා බරපතල තුවාල අනතුරු සංඛ්‍යාව 173 කින් වැඩි වී තිබුණි. 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ රටේ සිදුවූ රිය අනතුරු සංඛ්‍යාව වගුව 13 හි දැක්වේ.

අනතුරු වර්ගය	දෙසැම්බර් 31 දිනට (ප්‍රමාණය)		
	2016	2017	2018
මාරක	2,824	2,922	2,953
බරපතල තුවාල	8,148	8,302	8,475
සුළු තුවාල	14,604	13,592	12,264
අලාභ	13,510	13,072	12,064
එකතුව	39,086	37,888	35,756

රූපසටහන- 13. - වාහන අනතුරු සංඛ්‍යාව

මූලාශ්‍රය : නීතිය හා සාමය අංශයේ වාර්ෂික වාර්තාව - 2018

අපරාධ විසඳීම

නීතිය හා සාමය ආරක්ෂාවීමේ ප්‍රගතිය පිළිබිඹු කරන ප්‍රධාන දර්ශකයක් වන්නේ රටතුළ අපරාධ වාර්තාවීම්වල නිරපේක්ෂ ප්‍රමාණය සහ වාර්තා වූ අපරාධ විසඳීමේ සාපේක්ෂ අගයයි. ශ්‍රී ලංකා පොලීසිය වෙත ලැබී තිබුණු පැමිණිලිවලින් විසඳනු ලැබූ පැමිණිලි ප්‍රමාණයේ ප්‍රතිශතය අපරාධ වර්ග 01 ක් හැර 09 ක් සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව පහළ අගයක් වාර්තා කර තිබුණි. විස්තර වගුව 14 හි දැක්වේ.

අපරාධ වර්ගය	2017			2018		
	වාර්තා වූ ප්‍රමාණය	විසඳනු ලැබූ ප්‍රමාණය	විසඳූ ප්‍රතිශතය	වාර්තා වූ ප්‍රමාණය	විසඳනු ලැබූ ප්‍රමාණය	විසඳූ ප්‍රතිශතය
බරපතල අපරාධ	35,979	28,016	77.87	36,355	28,246	77.69
සුළු වැරදි පුද්ගලයන්ට එරෙහි	42,224	29,303	69.40	41,888	27,831	66.44
සුළු වැරදි දේපළවලට එරෙහි	32,881	16,664	50.68	31,415	14,143	45.02
සුළු පැමිණිලි	1,029,087	1,029,047	100.00	971,617	971,617	100.00
ළමයින්ට එරෙහි බල අපරාධ	2,911	1,998	68.64	3,344	1,572	47.01
කාන්තාවන්ට එරෙහි බල අපරාධ	790	498	63.04	775	326	42.06
සුරා සම්බන්ධ වැරදි	120,198	103,022	85.71	129,813	104,048	80.15
නිද්‍රා ජනක ද්‍රව්‍ය සම්බන්ධ වැරදි	107,944	104,592	96.89	124,940	120,052	96.09
දූෂණ වැරදි	1,055	1,025	97.16	954	868	90.99
ව්‍යවස්ථාපිත වැරදි	49,013	46,857	95.60	40,607	38,102	93.83

රූප සටහන 14 - වාර්තාගත වූ අපරාධ ගණන හා ඒ සඳහා විසඳුම් ලබාදීම

මූලාශ්‍රය - වාර්ෂික කාර්යසාධන වාර්තාව 2018 - ශ්‍රී ලංකා පොලීසිය

මත්ද්‍රව්‍ය පාලනය

අන්තරායකාරී ඖෂධ භාවිතය හා සංසරණය වැලැක්වීම ද අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයක් වී තිබුණි ඉකුත් වර්ෂයේ දී හෙරෝයින් හා ගංජා සම්බන්ධ වැරදිවලට අදාළව අත්අඩංගුවට ගත් පුද්ගල සංඛ්‍යාව පිළිවෙලින් 29,288 දෙනෙක් හා 51,788 දෙනෙක් වී තිබුණත්, සමාලෝචිත වර්ෂයේදී එය 40,997 දෙනෙක් සහ 54,685 දෙනෙක් වී තිබුණි. සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයේදී අත්අඩංගුවට ගෙන තිබූ මත්ද්‍රව්‍ය ප්‍රමාණය රූප සටහන 15 හි දැක්වේ.

ආයතනය	Heroin හෙරෝයින් කි.ග්‍රෑ.		Cannbis කැනබීස් කි.ග්‍රෑ.		Hashish - හෂීස් කි.ග්‍රෑ.		Cocaine කොකේන් කි.ග්‍රෑ.	
	2017	2018	2017	2018	2017	2018	2017	2018
පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය	23.598	669.310	206.587	543.555	1.122	1.667	2.050	18.266
පොලිස් ස්ථාන	236.814	46.658	3,876.945	2,420.902	3.040	9.814	218.647	0.134
විශේෂ කාර්යය බලකාය	0.295	3.831	512.882	1,267.644	-	1.846	-	0.036
වෙනත් ආයතන	54.246	12.325	390.644	546.648	34.009	19.983	-	2.768
එකතුව	314.953	732.124	4,987.058	4,778.749	38.171	33.310	220.697	21.204

රූපසටහන 15. - අත් අඩංගුවට ගෙන තිබුණු මත්ද්‍රව්‍ය ප්‍රමාණය

මූලාශ්‍රය : පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයේ වාර්ෂික වාර්තාව - 2018

පොලිස් තොරතුරු හා සන්නිවේදන පද්ධතිය වැඩිදියුණු කිරීම.

නූතන අවශ්‍යතාවයන්ට ගැලපෙන ලෙස ශ්‍රී ලංකා පොලීසියේ පොලිස් තොරතුරු හා සන්නිවේදන පද්ධතීන් වැඩි දියුණු කිරීමට හා අපරාධ පරීක්ෂණ ඒකක සංවර්ධනය සඳහා සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 440 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, ඉන් කිසිදු උපයෝජනයක් නොකිරීම නිසා මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

ප්‍රජා පොලිස් සංකල්පය සංවර්ධනය

පොලිස් ස්ථාන 483 ක "ගමට පොලීසිය" සංකල්පය සඳහා සහ ප්‍රජා පොලිස් කටයුතු සඳහා අවශ්‍ය යතුරු පැදි ඇතුළු උපකරණ මිලදී ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 150 ක ප්‍රතිපාදන සලසා තිබුණත් එම ප්‍රතිපාදනවලින් රු.මිලියන 143.67 ක් අදාළ කටයුතු සඳහා උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි.

පොලිස් විශ්වවිද්‍යාලය ඇති කිරීම.

පොලිස් විශ්වවිද්‍යාලය පනත කෙටුම්පත් කිරීම, ලී බඩු උපකරණ මිලදී ගැනීම වැනි කටයුතු සඳහා සමාලෝචිත වර්ෂයයේදී රු.මිලියන 125 ක ප්‍රතිපාදන සලසා තිබුණද, වර්ෂය අවසාන වන විට එම කටයුතු ඉටු නොකිරීම නිසා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 102.94 ක් ඉතිරි කර තිබුණි.

ශ්‍රී ලංකා පොලීසියේ ගොඩනැගිලි ඉදිකිරීම් ප්‍රගතිය

2016-2018 මධ්‍ය කාලීන අයවැය රාමුව තුළ මුළු පිරිවැය රු.මිලියන 1,808.09 ක් වූ ශ්‍රී ලංකා පොලීසියේ ඉදිකිරීම් ව්‍යාපෘති 4 ක් ක්‍රියාත්මක කිරීම සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත පවරා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට භට නිවාස, ශ්‍රවනාගාර, නිල නිවාස හා රථවාහන මූලස්ථාන ගොඩනැගිල්ල යන මෙම ව්‍යාපෘති 4 හි භෞතික ප්‍රගතිය සියයට 2 ක සිට සියයට 60 දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

විශේෂ කාර්ය බලකායේ UN MISSION ව්‍යාපෘතිය

එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී සඳහා විශේෂ කාර්ය බලකායේ සංග්‍රාමික බල ඇණියක් මාලි රාජ්‍යය තුළ ස්ථාපිත කිරීමට අවශ්‍ය අවි ආයුධ, සන්නද්ධ රථ හා සන්නිවේදන උපකරණ ඇතුළු උපකරණ මිලදී ගැනීම සඳහා 2016 වර්ෂයේ සිට කටයුතු කරමින් තිබුණි. නිලධාරීන් 320 දෙනෙකුට 2016 වර්ෂයේදී පුහුණුවක් ද ලබා දී තිබුණි. 2017 හා 2018 වර්ෂ දෙකෙහිදී උපකරණ මිලදී ගැනීම සඳහා එකතුව රු.මිලියන 792 ක් වැය කර තිබුණු අතර එම උපකරණ කටුකුරුන්ද කඳවුරේ ගබඩා කර තිබුණි. 2019 මැයි මාසය වන විටත් විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් එක්සත් ජාතීන්ගේ සාම සාධක රාජකාරීයට එක්වී නොතිබුණි.

වරාය හා නාවික කටයුතු

අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

විදේශ ණය ඌන උපයෝජනය

රාජ්‍ය අනුග්‍රහය ප්‍රශස්ථ ලෙස යොදා නොගැනීම

පර්යන්ත මෙහෙයුම් කටයුතු පහත වැටීම

නැගෙනහිර බහලුම් පර්යන්තයේ මෙහෙයුම් කටයුතු ආරම්භ නොකිරීම

හම්බන්තොට වරාය ඉදිකිරීම සඳහා ලබා ගත් විදේශ ණය විධිමත් අනුමැතියකින් තොරව මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කිරීම

CCTV කැමරා පද්ධතිය සවි නොකිරීම

වරාය හා නාවික කටයුතු

බාධාවකින් තොර සමුද්‍රීය වරාය පහසුකම් නිර්මාණය කිරීම මෙම අංශයෙන් අපේක්ෂා කරන ප්‍රතිඵලය වී තිබුණි. එම අපේක්ෂාව ඉටු කර ගැනීම සඳහා වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය හා ව්‍යවස්ථාපිත මණ්ඩල/ආයතන 03 ක් විසින් පහත සඳහන් කාර්ය භාරයන් ඉටු කළ යුතුව තිබුණි.

- වරාය හා නාවික කටයුතු විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
- අද්මිරාල්තියට අයත් ඒවා හැර අනෙකුත් වරාය තෙල් ටැංකි උපකරණ, ප්‍රදීපාගාර සහ ප්‍රදීපස්ථම්භ සංවර්ධනය සහ පරිපාලන කටයුතු
- නාවික සේවා සැපයුම්කරුවන් හා පරිහරණය කරන්නන් අතර ආරවුල් බේරුම්කරණය
- නාවික සේවාවන් සඳහා තරඟ රීති මාලාවන් පැනවීම
- නාවික සැපයුම්කරුවන් සහ පරිහරණය කරන්නන් අතර උපදේශාත්මක සම්බන්ධීකරණය තහවුරු කිරීම හා සහායවීම
- බුන් යාත්‍රා සහ සමුද්‍ර මුක්තාවශේෂ භාර ගැනීම
- නාවික කටයුතු සංවර්ධන අරමුදල පරිපාලනය කිරීම
- නැව් ගාස්තු හා නාවික සේවා කටයුතු
- වෙරළාසන්න මගී ප්‍රවාහනය
- ආයතනයන් අධීක්ෂණය කිරීම.

ඉහත සඳහන් කාර්යභාරයන් ඉටු කිරීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ වැදගත් විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

මූලධන වැය විෂයයන් 15 ක් යටතේ ප්‍රාග්ධන ව්‍යාපෘති 08 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 3,376.90 ක ප්‍රතිපාදන සලසා තිබුණි. ඉන් සංවර්ධනය ව්‍යාපෘති 05 ක් සඳහා රු.මිලියන 2,270.00 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, එම ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම නිසා සලසා තිබුණු මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

වෙරළාසන්න මගී ප්‍රවාහන සේවා විධිමත් කිරීම් අරමුණ ඇතුව යාපනය අර්ධද්වීපය සහ දූපත් අතර මගී හා භාණ්ඩ ප්‍රවාහන යාත්‍රා ලියාපදිංචිය, නියාමනය හා අළුත්වැඩියාව සඳහා පහසුකම් සැපයීම සඳහා 2016 වර්ෂයේදී ව්‍යාපෘති දෙකක් ක්‍රියාත්මක කර තිබුණි. අදාළ ඉදිකිරීම් 2017 දෙසැම්බර් 31 දින වන විට අවසන් කිරීමට සැලැසුම් කර තිබුණි. 2018 දෙසැම්බර් 31 දින වනවිට මූලික ඉදිකිරීම් පමණක් අවසන් කර තිබුණු අතර 2019 අප්‍රේල් 09 දින වන විටත් ජලය හා විදුලිය ඇතුළු යටිතල පහසුකම් සංවර්ධන කිරීමේ කටයුතු මූලික අදියරෙහි පැවතුණි.

විදේශ ණය උපන උපයෝජනය

අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත කන්කසන්තුරේ වරාය කටයුතු මෙහෙයවීම හා සංවර්ධනය සඳහා පරිපාලන ගොඩනැඟිල්ලක් හා ගුදමක් ඉදිකිරීමට

සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 1,350 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එම ප්‍රතිපාදන ඉන්දියානු එක්සිම් බැංකුවේ ණය (Line of Credit) යටතේ මූල්‍යාණය කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපෘතියට අදාළ ප්‍රසම්පාදන කාර්යයන් හා ඉදිකිරීම්වලින් සියයට 5 ක පමණ ප්‍රමාණයක් අවසන් කිරීමට සැලැසුම් කර තිබුණි. නමුත් එම සැලැසුම් කළ කාර්යයන් මූලික මට්ටමේ පැවති අතර මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය සඳහා සලසා තිබුණු රාජ්‍ය ණය ප්‍රශස්ථ ලෙස උපයෝජනය කිරීමට අපොහොසත් වී තිබුණි.

රාජ්‍ය අංශයේ නැව් භාණ්ඩ ආනයනය කිරීම

2016 ජනවාරි 13 දින පැවති අමාත්‍ය මණ්ඩලයේ තීරණය ප්‍රකාරව විදේශාධාර ව්‍යාපෘතිද ඇතුළුව සියළුම රාජ්‍ය ආයතන විසින් 2015 මැයි 06 දිනැති අංක 415 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව රාජ්‍ය අංශයේ නැව් භාණ්ඩ ආනයනය කිරීම සීමාසහිත ලංකා නැව් සංස්ථාව මගින් කළ යුතුව තිබුණි. එසේම 2016 පෙබරවාරි 18 දිනැති අංක 03 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ලිපිය මගින්ද, 2016 අගෝස්තු 11 දිනැති ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වාණිජ බැංකු වෙත ලබාදී තිබූ උපදෙස් මගින්ද රාජ්‍ය අංශයේ භාණ්ඩ ආනයනය සී/ස ලංකා නැව් සංස්ථාව මගින් සිදුකළ යුතු බවට තවදුරටත් සහතික කර තිබුණි.

සමාගමේ සේවා සපයාගනු ලබන රාජ්‍ය ආයතන ගණන සීමාවී පැවති අතර, විශාල වශයෙන් ආනයන කටයුතුවල යෙදෙන රාජ්‍ය ආයතන සමාගමේ සේවා ලබාගෙන නොතිබුණි. එසේම, ඇතැම් රාජ්‍ය ආයතන වෙනත් විදේශීය නැව් සමාගම් මගින් ආනයනයන් සිදු කර ගැනීම සඳහා ඉල්ලීම්කර තිබුණු බව අනාවරණය විය. 2017 වර්ෂයේදී එවැනි ඉල්ලීම්කර තිබූ අවස්ථා 700 කට අධික සංඛ්‍යාවක් සඳහාද, 2018 වර්ෂයේදී අවස්ථා 538 ක් සඳහා ද සමාගම විසින් අත්හැරීමේ නිවේදන ලිපි (waivers) නිකුත් කර තිබුණි. මේ අනුව රාජ්‍ය ආයතන විසින් සිදුකරනු ලබන භාණ්ඩ ආනයනය කිරීම් හා සම්බන්ධ ව්‍යාපාරික අවස්ථාවන් සමාගම වෙත ලබාගැනීම සඳහා සුදුසු ක්‍රමවේදයක් ක්‍රියාවට නංවා නොතිබුණි. ඉහත සඳහන් චක්‍රලේඛ මඟින් සමාගමේ වෙළඳපල කොටස පුළුල්කර ගැනීම සඳහා සලසා තිබුණු රාජ්‍ය අනුග්‍රහයන් ප්‍රශස්ථ ලෙස යොදා ගැනීමට සීමාසහිත ලංකා නැව් සංස්ථාව විසින් කටයුතු කර නොතිබුණි.

බහලුම් මෙහෙයුම් කටයුතුවල ජාත්‍යන්තර ස්ථානය සහ වරාය අධිකාරියේ වෙළඳපළ කොටස

2018 වර්ෂය සඳහා ලෝක වරාය පිළිබඳව ඇල්ෆාලයින් සංවිධානය විසින් නිකුත් කරන ලද ඇල්ෆාලයිනර් වාර්තාව (Alpha liner Report) අනුව කොළඹ වරාය විසිසම ඒකක (Twenty Equivalent Unit) 7,047,486 ක මෙහෙයුම් සිදු කරමින් ලෝකයේ 23 වෙනි ස්ථානයේ රැඳී සිටි අතර, 2017 වර්ෂයට සාපේක්ෂව එම කටයුතුවල සියයට 13.5 ක වර්ධනයක් ළඟා කර ගෙන තිබුණි. එසේම ශ්‍රී ලංකා වරාය අධිකාරියෙහි බහලුම් හැසිරවීම 2017 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේදී සියයට 14.6 කින් වර්ධනය වී තිබුණි.

නැව් බඩු මෙහෙයුම් කටයුතු

කොළඹ, ගාල්ල, හම්බන්තොට හා ත්‍රිකුණාමලය යන ප්‍රධාන වරායන් වෙත 2016 වර්ෂයේදී පැමිණි නැව් සංඛ්‍යාව 5,023 ක් වී තිබුණත්, එය 2018 වර්ෂය වන විට නැව් සංඛ්‍යාව 4,933 ක් දක්වා අඩු වී

තිබුණි. නමුත් මෙමෙහෙයවන ලද විසිසම (TEUs) බහලුම් ඒකක ගණන 2014 දී මිලියන 4.91 ක සිට 2018 වර්ෂයේදී මිලියන 7.05 ක් දක්වා වැඩි වී තිබුණි. එසේම මෙමෙහෙයවන ලද සම්ප්‍රදායික නැව් බඩු ප්‍රමාණය 2016 වර්ෂයේදී මෙ.ටො.මිලියන 7.81 ක සිට 2018 වර්ෂය වන විට මෙ.ටො.මිලියන 7.44 ක් දක්වා අඩු වී තිබුණි. විස්තර පහත වගුව 15 හි දැක්වේ.

විස්තරය	2014	2015	2016	2017	2018
පැමිණි නැව් සංඛ්‍යාව (බහලුම්ගත, සම්ප්‍රදායික වෙනත්	4,298	4,760	5,023	4,942	4,933
මෙමෙහෙයවන ලද විසිසම (TEUs) බහලුම් ඒකක ගණන (ඒකක 000)	4,908	5,185	5,735	6,209	7,047
මෙමෙහෙයවන ලද සම්ප්‍රදායික නැව් බඩු ප්‍රමාණය (මෙ.ටොන් 000)	6,339	7,156	7,811	7,735	7,438

වගුව - 15 ප්‍රධාන වරායන්වල මෙමෙහෙයවන ලද බහලුම් ඒකක හා සම්ප්‍රදායික නැව් බඩු ප්‍රමාණය
මූලාශ්‍රය :- ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කාර්යසාධන සමාලෝචන වාර්තාව

කොළඹ වරායේ මෙහෙයුම් කටයුතු

පර්යන්ත මෙහෙයුම් කටයුතු පහත වැටීම

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2001 වර්ෂයේ සිට 2018 වර්ෂය අවසානය දක්වා වර්ෂ දහ අටක කාලය තුළ බහලුම් මෙහෙයුම් ධාරිතාවය මුළු බහලුම් හැසිරවීමේ ප්‍රතිශතයක් ලෙස සැලකීමේදී සියයට 81 ක සිට සියයට 33 ක් දක්වා සීඝ්‍ර ලෙස පහත වැටී තිබුණි. කෙසේ නමුත්, කොළඹ වරාය තුළ තරඟකාරීව කටයුතු කරන පුද්ගලික සමාගම් දෙකෙන් 2013 වර්ෂයේදී මෙහෙයුම් කටයුතු ආරම්භ කළ සමාගම සියයට 01 ක සිට සියයට 38 ක් දක්වා සීඝ්‍ර වර්ධනයක් ලබා ගෙන තිබුණි. අනෙක් සමාගම 2001 වර්ෂයේදී සියයට 19 ක් වූ සිය වෙළඳපල කොටස 2018 වර්ෂය වන විට සියයට 29 ක් දක්වා වර්ධනය කරගෙන තිබුණි. පසුගිය වර්ෂ දහඅටක බහලුම් හැසිරීම පිළිබඳ විස්තර රූපසටහන 47 හි දැක්වේ.



රූපසටහන 47 – ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත මෙහෙයුම් කටයුතු
මූලාශ්‍රය – ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2018 කාර්යසාධනය සමාලෝචන වාර්තාව

ඉහත දත්ත අනුව ශ්‍රී ලංකා වරාය අධිකාරියට බහලුම් මෙහෙයවීම සඳහා හිමිව තිබුණු වෙළඳපෙළ කොටස ක්‍රමානුකූලව පුද්ගලික අංශය වෙත නතු වෙමින් පැවතුණි. අධිකාරියේ බහලුම් මෙහෙයුම් කටයුතු සම්බන්ධ පර්යන්ත උපයෝජන අනුපාතය (Terminal Occupancy Ratio) සලකා බැලීමේදී 2017 වර්ෂය හා සැසඳීමේදී 2018 වර්ෂයේදී සියයට 60 ක සිට සියයට 65 ක් දක්වා වර්ධනය වී තිබුණි.

නැගෙනහිර බහලුම් පර්යන්තයේ මෙහෙයුම් කටයුතු ආරම්භ නොකිරීම.

කොළඹ වරායේ දැනට බහාළුම් හැසිරවීම සඳහා ක්‍රියාත්මක පර්යන්ත අතුරින් ගැඹුර (Draft) මීටර් 14.25ට වඩා වැඩි නැව් පැමිණිය හැකි එකම පර්යන්තය, කොළඹ ජාත්‍යන්තර බහාළුම් පර්යන්තය (C.I.C.T) පමණක් වන අතර එහි ධාරිතාවය වර්ෂයකට විසිසම ඒකක මිලියන 2.4 ක් වේ. 2018 වර්ෂයේ දී එම පර්යන්තය වෙත ගැඹුර මීටර් 14.25 ට වඩා වැඩි නැව් 308 ක් පැමිණ තිබූ අතර මුළු බහාළුම් ඒකක මිලියන 2.6 කට වැඩි සංඛ්‍යාවක් මෙහෙයවා තිබුණි. ඒ අනුව, 2017 වර්ෂයට සාපේක්ෂව එම පර්යන්තයේ බහාළුම් හැසිරවීම සියයට 12 ක වර්ධනයක් සිදුව තිබුණි. ඉදිරියේදී ඇති විය හැකි පර්යන්ත සේවා ඉල්ලුමේ වර්ධනයකට සරිලන කොළඹ වරාය පර්යන්ත සේවා සැපයීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

කෙසේ වුවද, කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියට අදාළව දේශීය බැංකුවකින් අරමුදල් සම්පාදිතව බහාළුම් ඒකක 800,000 ක වාර්ෂික ධාරිතාවයක් සහිත ඉදිකිරීම පිරිවැය රු.මිලියන 11,168 ක් වූ මීටර් 18 ක ගැඹුරකින් හා මීටර් 440 ක් දිගැති නැගෙනහිර බහාළුම් පර්යන්තයේ ඉදිකිරීම් කටයුතු 2016 අප්‍රේල් මාසයේ අවසන් කර තිබුණද, නැව් බඩු මෙහෙයවීම සඳහා අවශ්‍ය ග්‍රැන්ට් දොඹකර ඇතුළු උපකරණ සපයා ගෙන මෙම පර්යන්තයේ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට 2019 අප්‍රේල් 30 දින වන විටත් ශ්‍රී ලංකා වරාය අධිකාරිය කටයුතු කර නොතිබුණි.

හම්බන්තොට වරාය ඉදිරිකිරීම සඳහා ලබා ගත් විදේශ ණය

හම්බන්තොට වරාය ඉදිකිරීම සඳහා ලබාගෙන තිබූ විදේශ ණයවලින් 2017 නොවැම්බර් 30 දිනට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ගිණුම්වල පැවති ණය ශේෂය වූ රු. මිලියන 147,746 ක් මහා භාණ්ඩාගාරයේ එකඟතාවකින් හෝ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියකින් තොරව ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර තිබුණි. ඒ හේතුවෙන් රජයේ කිසිදු ගිණුමක එම ණය මුදල් ඇතුළත්ව නොතිබුණි. මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ලේඛන අනුව, 2018 දෙසැම්බර් 31 දිනට එම ණය ශේෂය රු.මිලියන 179,546 ක් වී තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටද මෙම ණය ගිණුම්ගත කිරීම පිළිබඳව දෙපාර්ශවය අතර එකඟතාවයකට එළඹ නොතිබුණි.

ඉහත ණය මුදලට අදාළව 2017 නොවැම්බර් 30 දින වන විට ගණනය කරන ලද විදේශ විනිමය පරිවර්තන අලාභය රු.මිලියන 31,544 ක්ද, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ගිණුම්වලින් ඉවත් කර තිබුණි. 2017 නොවැම්බර් 30 දින සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා විදේශ විනිමය සමුච්චිත අලාභ වූ රු.මිලියන 28,396 ක් කිසිදු ගිණුමක ඇතුළත් කර නොතිබුණි. මේ අනුව මෙම ණය මුදල සම්බන්ධයෙන් 2018 දෙසැම්බර් 31 දිනට සමුච්චිත විදේශ විනිමය පරිවර්තන අලාභය රු.මිලියන 59,940 ක් වී තිබුණි.

සමාගමක් විසින් ලබා ගත් ණය වෙනුවෙන් ඇපවීම

මාගම්පුර වරාය කළමනාකරණ සේවා (පුද්ගලික) සමාගම විසින් පුද්ගලික බැංකුවකින් එ.ජ.ඩො. මිලියන 24 ක ණය

මුදලක් ලබා ගෙන තිබුණු අතර, ඒ සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ඇප වී තිබුණි. 2017 නොවැම්බර් මාසයේ සිට එම සමාගමේ මෙහෙයුම් කටයුතු නතර කර තිබුණු අතර ලබා ගෙන තිබුණු ණය මුදල එම සමාගම විසින් පියවා නොතිබුණි. 2019 අගෝස්තු 30 දින වන විට එම ණය පියවීම සඳහා සමාගම සතුව ප්‍රමාණවත් මුදල් නොපැවතුණි. කෙසේ වුවද, ණය මුදල සඳහා ඇපකරු වශයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියට විරුද්ධව හිඟ ණය ශේෂය වූ එ.ජ.ඩො. මිලියන 22.3 ක් අයකර ගැනීම සඳහා නීතිමය වශයෙන් කටයුතු කරන බව අදාළ බැංකුව විසින් එන්තරවාසියක් 2019 අප්‍රේල් 02 දින අධිකාරිය වෙත යොමු කර තිබුණි.

CCTV කැමරා පද්ධතිය සවි නොකිරීම

අධි ආරක්ෂිත කලාපයක් ලෙස නම් කර තිබෙන වරාය පරිශ්‍රයේ ආරක්ෂාව තහවුරු කර ගැනීම පිණිස 2017 වර්ෂයේදී සියළු ගේට්ටු සහ බන්ධිත ගුදම්වල ආරක්ෂාව සඳහා රු.මිලියන 60 ක් වැය කර CCTV කැමරා පද්ධතියක් සවි කිරීමට සැලැසුම්කර තිබුණි. 2018 වර්ෂයේදී ඒ සඳහා රු.මිලියන 150 ක් ප්‍රතිපාදන සලසා තිබුණද, අපේක්ෂිත පරිදි අදාළ කාර්යය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අවසන් කර නොතිබුණි.

රේගුව විසින් පනවා තිබුණු දණ්ඩනය

2011 වර්ෂයේ දී ශ්‍රී ලංකා රේගුව දැනුවත් කිරීමකින් තොරව ආනයනය කරන ලද දොඹකර 27 ක් සම්බන්ධයෙන් රේගුව විසින් පනවා තිබූ රු.මිලියන 1,580 ක් වූ රේගු දණ්ඩනය ලිහිල් කර ගැනීම සඳහා රේගු ආඥා පනතේ 165 වගන්තිය ප්‍රකාරව රේගු විමර්ශණයක තීන්දුවක් මත මුදල් අමාත්‍යවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකිව තිබුණි. නමුත් අධිකාරිය විසින් මුදල් අමාත්‍යවරයා වෙත එවැනි අභියාචනයක් ඉදිරිපත් කර නොතිබුණි. කෙසේ වුවද, මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල රු.මිලියන 1,577 ක අසම්භාව්‍ය බැරකම් දක්වා තිබුණි. ඉහත කරුණ සම්බන්ධයෙන් අධිකාරිය අභියාචනාධිකරණයේ නඩුවක් පවරා තිබුණු අතර එය අභියාචනා අධිකරණය විසින් නිශ්ප්‍රභා කර තිබුණි. ඉන් පසුව අධිකාරිය විසින් අභියාචනාධිකරණයේ නියෝගයට එරෙහිව අභියාචනයක් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කර තිබුණි.

මහාමාර්ග	ඉඩම් පවරා ගැනීමට කටයුතු නොකිරීම අධිවේගී මාර්ගවලින් ලබන ආදායම උපයෝජනය කිරිම ශ්‍රී ලංකා පොලිස් දේපාර්තමේන්තුව වෙනුවෙන් වියදම් කිරිම මාර්ග වැඩිදියුණු කිරිමට සාපේක්ෂව පාලම් පුනර්ථාපනය නොකිරිම යකඩ පාලම් නඩත්තු කිරිම සඳහා විධිමත් ක්‍රමවේදයක් නොතිබීම ගිවිසුම් කාලය තුළ මාර්ග ඉදිකිරීම් අවසන් නොකිරීම ව්‍යාපෘතිය ආරම්භ කිරිමට පෙර කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

මහාමාර්ග

ඉහළ සංසරණ පද්ධතියක් ඇති කිරීම තුළින් ගමන් කාලය හා පිරිවැය අවම කිරීම සහ මාර්ග ආරක්ෂාව හා සුවපහසුව වැඩි කිරීම තුළින් මාර්ග භාවිතා කරන්නන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම මෙම ක්ෂේත්‍රයේ අපේක්ෂිත ප්‍රතිඵලය වී තිබුණි. එම ප්‍රතිඵලය අත්පත් කර ගැනීම සඳහා උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය හා ව්‍යවස්ථාපිත ආයතන දෙකක් විසින් පහත සඳහන් කාර්යයන් ඉටු කළ යුතුව තිබුණි.

- මහාමාර්ග විෂයට අදාළව ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම
- එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- පළාත් සභා හා පළාත් පාලන ආයතන සමඟ ඒකාබද්ධව ජාතික ප්‍රතිපත්ති පදනම් කරගත් සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය කිරීම

අමාත්‍යාංශය හා ව්‍යවස්ථාපිත ආයතන විසින් එම කාර්ය භාරයන් ඉටු කිරීම සම්බන්දයෙන් සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

අධිවේගී මාර්ග පද්ධතියේ ධාරිතාව වැඩි කිරීමට අදාල නොවන වියදම් ඇතුලත් කිරීම

1991 වර්ෂයේ සිට 2005 වර්ෂය දක්වා කොළඹ කටුනායක අධිවේගී මාර්ගය වෙනුවෙන් වැය කර තිබූ රු. මිලියන 5,063 ක් 2018 වර්ෂයේ දී මාර්ග සංවර්ධන අධිකාරිය විසින් නඩත්තු කරන අධිවේගී මාර්ග පද්ධතියේ පිරිවැයක් ලෙස බැර කර තිබුණි. නමුත් එම කාලය තුළ වැය කර තිබූ වියදම් තුළින් අධිවේගී මාර්ග පද්ධතියේ ධාරිතාවය වැඩි දියුණු කිරීමට කිසිදු දායකත්වයක් සිදු කර නොතිබුණි.

ඉඩම් පවරා ගැනීමට කටයුතු නොකිරීම

මහාමාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව භුක්ති විද පසුව මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාර දී තිබූ හෙක්ටයාර් 7,586.39 ක ඉඩම් කැබලි 546 ක් 2019 අගෝස්තු 30 දින වන විටත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පවරාගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, අධිවේගී මාර්ග ව්‍යාපෘති සඳහා ඉඩම් පවරා ගැනීම හා අවතැන් වූවන් වෙනුවෙන් ලබා දීමට නියමිත ඉඩම්වලින් ඉතිරි ඉඩම් කැබලි 164 ක වටිනාකම අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

වත්කම් කළමනාකරණ

මාර්ග සංවර්ධන අධිකාරියේ වත්කම් කළමනාකරණ හා ආදායම් අංශය විසින් අක්කර 21.5 ක් වූ ඉඩම් කැබලි 11 ක් බදු පදනම මත බාහිර පාර්ශව වෙත ලබා දී තිබුණි. උක්ත දේපළ බදු දීමේ අවස්ථා 06 ක දී බදු ගිවිසුම් රහිතවත්, අවස්ථා 05 ක දී බදු ගිවිසුම් සහිතවත් බදු දීම සිදු කර තිබුණ අතර එම ගිවිසුම්වල සැලකිය යුතු අඩුපාඩු පැවැතුණි. 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ විධිවිධානවලට පටහැනිව එම ගිවිසුම්වලට එළඹ තිබුණු අවස්ථා අනාවරණය විය. එමෙන්ම එකී දේපළවලින් ආදායම උපයා ගැනීම සහ දේපළ නිසි අධීක්ෂණයක් යටතේ පවත්වා ගැනීමට අධිකාරිය අපොහොසත්වී තිබුණි. තවද, මාර්ග රක්ෂිත සම්බන්ධයෙන් ප්‍රමාණවත් තොරතුරු පද්ධතියක් අධිකාරිය සතුව නොතිබුණු අතර මාර්ග රක්ෂිත බදු දීමට අදාළ විධිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක්ද ක්‍රියාත්මක කර නොතිබුණි.

අධිවේගී මාර්ගවලින් ලබන ආදායමෙන් පිරිවැය ආවරණය කිරීම

මාර්ග සංවර්ධන අධිකාරියේ විෂය පථයට අයත් කි.මී. 169.13 ක් දිග අධිවේගී මාර්ග පද්ධතියෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලද මුළු ආදායම රු.මිලියන 36,074 ක් වී තිබුණි. එම මාර්ග පද්ධතිය ඉදිකිරීම සඳහා රජය විසින් රු.මිලියන 245,769 ක් වැය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසන් වන විට අධිවේගී මාර්ග තුළින් ලැබී තිබූ ආදායමින් වියදම ආවරණය කිරීම සඳහා ඉදිරියේදී දක්ෂිණ අධිවේගී මාර්ගයට වසර 38 ක්ද, කටුනායක අධිවේගී මාර්ගයට වසර 16 ක්ද, කොළඹ පිටත වටරවුම් මාර්ගයට වසර 35 ක්ද, කාලයක් ගත කළ යුතුව තිබුණි.

අධිවේගී මාර්ගවලින් ලබන ආදායම උපයෝජනය

2015 අප්‍රේල් 27 දිනැති අංක 1912/2 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කළ නිවේදනයේ 10 ඡේදය ප්‍රකාර අධිවේගී මාර්ගවලින් ලැබෙන ආදායම මාර්ග සංවර්ධන අධිකාරියේ ගිණුමට බැර කර එම මුදල්, ගාස්තු ගෙවිය යුතු ජාතික මහාමාර්ග පද්ධතිය සංවර්ධනය කර පවත්වාගෙන යෑමේ කාර්යය සඳහා භාවිතා කළ යුතුව තිබුණි. නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විට මුළු අධිවේගී මාර්ග ආදායම වූ රු.මිලියන 36,074 කින් රු.මිලියන 25,548 ක් ඉහත නියමයන් අනුගත නොවී ඉන් බැහැරව මාර්ග සංවර්ධන අධිකාරියේ එදිනෙදා වියදම් හා භාණ්ඩාගාරය වෙත ගෙවීම සඳහා වැය කර තිබුණි. එම ආදායමෙන් රු.මිලියන 5,507 ක් පමණක් අදාළ ගිණුමේ ඉතිරි කර තිබුණි.

අධිවේගී මාර්ග ඉදිකිරීම සඳහා රජය විසින් ලබා ගෙන තිබූ රු.මිලියන 245,769 ක ණය මුදල සඳහා වාරික හා පොලිය මහා භාණ්ඩාගාරය විසින් ගෙවා තිබුණි. නමුත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ලැබෙන අධිවේගී මාර්ග ආදායම එම ගෙවීම් සඳහා යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව වෙනුවෙන් වියදම් කිරීම

ශ්‍රී ලංකා පොලීසියේ හා විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් අධිවේගී මාර්ග පද්ධතියේ රාජකාරි සඳහා යෙදවීම වෙනුවෙන් වත්කම් මිලදී ගැනීම හා ඉන්ධන සඳහා රු.මිලියන 414 ක් අධිවේගී මාර්ග ආදායමින් ශ්‍රී ලංකා පොලීසිය වෙත ගෙවා තිබුණි.

මාර්ග වැඩිදියුණු කිරීමට සාපේක්ෂව පාලම් පුනරුත්තාපනය නොකිරීම

මාර්ග සංවර්ධන අධිකාරියට අයත් පාලම් සම්බන්ධ තොරතුරු පද්ධතියට අනුව 2018 දෙසැම්බර් 31 දින වන විට ජාතික මහාමාර්ග පද්ධතියට අයත් ගුවන් පාලම් සංඛ්‍යාව 15 ක් හා මීටර් 03 ට වඩා වැඩි පාලම් සංඛ්‍යාව 4,153 ක් වී තිබුණි. ඉන් පාලම් 46 ක් නැවත ඉදිකිරීම් කළ යුතු බවත් පාලම් 161 ක් ප්‍රතිසංස්කරණය කළ යුතුව තිබුණු බවත් හඳුනාගෙන තිබුණි.

නැවත ඉදිකිරීම් කළ යුතු වූ පාලම් 46 කින් පාලම් 09 ක් සහ ප්‍රතිසංස්කරණය කළ යුතු වූ පාලම් 161 කින් පාලම් 37 ක් ම වාණිජමය වශයෙන් වැදගත් නගර හා පළාත් යා කරන A ශ්‍රේණියේ ජාතික මහා මාර්ගවල පිහිටා තිබුණි. පසුගිය වසර කිහිපය තුළ මෙම මහා මාර්ගවල කාපට් අතුරා පුළුල් කිරීම් හා වැඩිදියුණු කිරීම් සිදුකළ ද, පාලම් ඉදිකිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීමට එම මාර්ග වැඩිදියුණු කරන

අවස්ථාවේදී කටයුතු කර නොතිබුණි.

පුළුල් කරන ලද හා වැඩිදියුණු කරන ලද මාර්ගවල පවතින පාලම්වල පළල ප්‍රමාණවත් නොවී තිබුණු අතර ඇතැම් පාලම් අබලන් වී තිබුණු බැවින් රටේ පොදු මහජනතාව වෙනුවෙන් අධිකාරියේ මෙහෙවර අපේක්ෂිත පරිදි ඉටු කිරීමට එය බාධාවක් වී තිබුණි.

යකඩ පාලම් නඩත්තු කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් නොතිබීම

ජාතික මහාමාර්ග ජාලය තුළ පිහිටා ඇති ගුවන් පාලම්ද ඇතුළුව පාලම් 4,168 කින් පාලම් 615 ක් යකඩ පාලම් වේ. මෙම යකඩ පාලම් නියමිත කාල අන්තරවලදී නඩත්තු කළ යුතුව තිබුණත්, මාර්ග සංවර්ධන අධිකාරිය සතුව යකඩ පාලම් නඩත්තු කටයුතු සඳහා විශේෂඥ දැනුමැති කණ්ඩායමකින් සමන්විත ඒකකයක් පිහිටුවා නොතිබුණි. මෙම හේතුව නිසා අනාගතයේ දී යකඩ පාලම් නඩත්තු කිරීම අධිකාරියට ගැටළු සහගත විය හැකිව තිබුණි.

ගිවිසුම් කාලය තුළ මාර්ග ඉදිකිරීම් අවසන් නොකිරිම

මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සපයන ලද තොරතුරු අනුව ජාතික මහාමාර්ග ජාලයේ මාර්ග වැඩි දියුණු කිරීම හා පුළුල් කිරීමට අදාළව 2016 සහ 2017 වර්ෂවලදී එළඹ තිබුණු මාර්ග වැඩි දියුණු කිරීම හා පුළුල් කිරීමේ ගිවිසුම් අතරින් රු.මිලියන 1,871 ක වටිනාකමකින් යුතු ගිවිසුම් 35 ක ගිවිසුම් ගත කාලය ඉකුත්ව ගොස් තිබුණ ද, එකී ගිවිසුම්ගත කාර්යන් 2018 දෙසැම්බර් 31 දින වන විට අවසන් කර නොතිබුණි.

මාර්ග ඉදිකිරීම් ගිවිසුම් අවලංගු කිරීම

මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මාර්ග ඉදිකිරීම සඳහා 2016 හා 2017 වර්ෂවලදී එළඹ තිබුණු ගිවිසුම්වලින් රු.මිලියන 1,245 ක් වටිනා ගිවිසුම් 19 ක් විවිධ හේතූන් මත අවලංගු කර තිබුණි. එම ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීමට 2019 අගෝස්තු 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

ද්විත්ව ගෙවීම

මධ්‍යම අධිවේගී මාර්ගයේ ශක්‍යතා අධ්‍යයනය සිදුකිරීම පිණිස ඕස්ට්‍රේලියානු සමාගමක් වෙත රු.මිලියන 1,759 ක් ගෙවා තිබුණත්, එම සමාගමෙන් අදාළ කාර්යය ඉටුකර නොගෙන එය දේශීය ආයතන කිහිපයක් ඉටු කර ගැනිම සඳහා රු.මිලියන 97 ක ගිවිසුම්වලට එළඹ තිබුණි.

ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර කාර්ය මණ්ඩල බඳවා ගැනීම

මධ්‍යම අධිවේගී මාර්ගයේ පොතුහැර සිට ගලගෙදර දක්වා කොටස වෙනුවෙන් 2017 වර්ෂයේදී කොන්ත්‍රාත්කරු හා උපදේශක සමාගම තෝරාගෙන තිබු නමුත් කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් තැබීමට හෝ ඉදිකිරීම් ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. ඉඩම් පවරා ගැනීම වෙනුවෙන් හා ව්‍යාපෘති කළමනාකරණය වෙනුවෙන් වැය කළ මුදල පිළිවෙලින් රු.මිලියන 3,200 ක් හා රු.මිලියන 1,931 ක් වූයෙන් ව්‍යාපෘතිය ආරම්භ කිරීමකින් තොරව ව්‍යාපෘති කාර්යමණ්ඩලය බඳවාගැනීම, නඩත්තුව හා වාහන භාවිතය සඳහා වියදම් කර තිබුණි.

ඇපකරය ඉක්මවා වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගෙවීම

ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන කෑගල්ල දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් පැකේජ් අංක 1 මාර්ග පුනරුත්ථාපන කටයුතුවල නිරත වී සිටින කොන්ත්‍රාත්කරුට වැඩ

ආරම්භ කිරීමේ අත්තිකාරම් සුරක්ෂණය ඉක්මවා වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වශයෙන් රු.මිලියන 30 ක මුදලක් ගෙවා තිබුණි.

නිෂ්කාර්ය කැපකරු කොමිස් ගෙවීම

ආසියානු සංවර්ධන බැංකුවේ ණය ප්‍රතිපාදන යාවත්කාලීනව උපයෝජනය කර නොගැනීම නිසා ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන යටතේ රු. මිලියන 476 ක් හා දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන් යටතේ රු.මිලියන 31 ක කැපකරු කොමිස් නිෂ්කාර්යව ගෙවීමට සිදු වී තිබුණි.

කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම යන්ත්‍රෝපකරණ ඉවත් කර ගැනීම

ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනේ කෑගල්ල දිස්ත්‍රික්කයේ පැකේජ දෙකක් සහ රත්නපුර දිස්ත්‍රික්කයේ පැකේජයක් සඳහා කොන්ත්‍රාත්කරු වෙත ලබා දී තිබූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදලින් රු.මිලියන 1,087 ක් අය විය යුතුව තිබුණි. එසේ තිබියදීත් අදාළ කොන්ත්‍රාත්තු අත්හිටුවීමට තීරණය කර තිබුණු අතර එකී අත්තිකාරම් මුදල පියවා ගැනීමෙන් තොරව සහ ඉංජිනේරුවරයාගේ අනුමැතියකින් තොරව කොන්ත්‍රාත්කරු ඔහුට අයත් යන්ත්‍රෝපකරණ වැඩබිමෙන් ඉවත් කරගෙන තිබුණි.

ශාක්‍යතා අධ්‍යනය සඳහා වියදම් කිරිම

දකුණු අධිවේගී මාර්ගයට සම්බන්ධ මාර්ග 30 ක කිලෝ මීටර 250 ක දුර ප්‍රමාණයක් සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යනයක් සිදු කර සවිස්තරාත්මක වාර්තාවක් පිළියෙළ කිරීම අධිවේගී මාර්ග සම්බන්ධතා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ අරමුණ විය. මෙම ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 790.80 ක් වැයකර එම කටයුතු 2014 දෙසැම්බර් 19 දින ආරම්භ කර 2016 අගෝස්තු 31 දින වන විට අවසන් කර තිබුණි. කෙසේ වෙතත් පුනරුත්ථාපනය කිරීම සඳහා තෝරා ගෙන තිබුණු ඉහත සඳහන් කිලෝ මීටර 250 කින් කිලෝ මීටර 24 ක් පමණි. මේ අනුව මාර්ග සැලැසුම් යල්පැනිම නිසා ඉතිරි මාර්ගවල ශක්‍යතා අධ්‍යනය සඳහා වැය කර තිබූ මුදල් ඵලරහිත වියදම් බවට පත්වී තිබුණි.

ණය සැපයුම් ණය දෙන ආයතනය වෙත ආපසු යෑමට

ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතියේ ණය සපයන ආයතන විසින් ලබා දී තිබූ මුළු ප්‍රතිපාදනවලින් සියයට 7.2 ක් හෙවත් රු.මිලියන 923 කට සමාන එ.ජ.ඩො.මිලියන 6.12 ක් ප්‍රතිපාදන ව්‍යාපෘතියේ පැවති මන්දගාමී ප්‍රගතිය නිසා උපයෝජනය නොකර ආපසු ණය සැපයුම් ආයතනය වෙත යැවීමට සිදු වී තිබුණි.

ප්‍රාරම්භක අත්තිකාරම් වැඩිපුර ගෙවීම

දක්ෂිණ අධිවේගී මාර්ගයේ කොන්ත්‍රාත් පැකේජ එකක් යටතේ රු.මිලියන 134.32 ක් වටිනා වැඩ ප්‍රමාණ අයිතම 235 ක් හා කොන්ත්‍රාත් පැකේජ තුනක් යටතේ රු.මිලියන 189 ක් වටිනා වැඩ ප්‍රමාණ අයිතම 260 ක් ඉටු කිරීමට කොන්ත්‍රාත්කරු විසින් කටයුතු කර නොතිබුණි. මේ අනුව කොන්ත්‍රාත් පැකේජවලට අදාළ ඉංජිනේරු ඇස්තමේන්තු නිවැරදිව පිළියෙළ නොකිරීම නිසා කොන්ත්‍රාත්කරුට රු.මිලියන 61.72 ක් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් විධිවිධානවලට පටහැනි ප්‍රාරම්භක අත්තිකාරම් ගෙව තිබුණි.

නිෂ්කාර්ය හෝ කැපකිරීම් ගාස්තු ගෙවීම

පාලම් 37 ව්‍යාපෘතියේ ණය ගිවිසුම මඟින් ජපන් යෙන්

මිලියන 12,381 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර පාලම් ඉදි කිරීමේ පැවති අසාමාන්‍ය ප්‍රමාදය හේතුවෙන් 2018 දෙසැම්බර් 31 දින වන විට එම ප්‍රතිපාදනයෙන් ජපන් යෙන් මිලියන 7,003 ක් නොහොත් මුළු ප්‍රතිපාදනයෙන් සියයට 57 ක් පමණක් උපයෝජනය කර තිබුණි. එම හේතුව නිසා ණය දෙන ආයතනය වෙත රු.මිලියන 68.53 ක් කැපවීම් ගාස්තු ලෙස නිෂ්කාර්යව ගෙවීමට සිදු වී තිබුණි. තවද ගිවිසුම් කාලය තුළ ව්‍යාපෘතිය කටයුතු අවසන් කිරීම පිළිබඳ අවිනිශ්චිතතාවක්ද පැවතුණි.

ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම

වරාය පිවිසුම් මාර්ග ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන සැලැස්ම අනුව රු.මිලියන 44,945 ක් වැයකර අධීක්ෂණ උපදේශක සේවා, ගොඩනැගිලි සැලැසුම් කටයුතු හා වැඩමුළු පැවැත්වීම සඳහා 2018 වර්ෂයේදී ආරම්භ කිරීමට සැලැසුම් කර තිබුණි. නමුත් එම කටයුතු 2019 ජුනි 30 දින වන විටත් ආරම්භ කර නොතිබුණි. මේ නිසා 2018 අයවැය මඟින් ප්‍රතිපාදනය කර තිබූ රු.මිලියන 3,040 ක ප්‍රතිපාදනයෙන් ප්‍රාග්ධන ප්‍රතිපාදන රු.2,925 ක් වෙනත් ව්‍යාපෘතියකට මාරු කර තිබුණි. තවද ඉතිරි ප්‍රතිපාදනවලින් ද රු.මිලියන 84.55 ක් උපයෝජනය කර නොගෙන මහා භාණ්ඩාගාරය වෙත ආපසු යවා තිබුණි.

බේරුම්කරණ ගැටළු විසඳා නොතිබීම

රත්නපුර අධිවේගී මාර්ගයේ පැකේජ 01 ඉංගිරිය සිට රත්නපුර දක්වා කොටසේ ඉදිකිරීම්වලට අදාළව 2018 පෙබරවාරි 27 දින කොන්ත්‍රාත්කරු විසින් මාර්ග සංවර්ධන අධිකාරියට එරෙහිව බේරුම්කරණයක් ලබා ගෙන තිබුණි. මේ අනුව කොන්ත්‍රාත්කරු විසින් ආරවුල් 07 ක් සඳහා රු.මිලියන 1,687 ක ගාස්තුවක් ඉල්ලා තිබුණි. මීට අමතරව මේ සඳහා 2018 අප්‍රේල් 30 දින වන විට රු. මිලියන 903.10 ක පොලියක්ද එකතු වී තිබුණි. මෙම බේරුම්කරණ ගැටළුව 2019 මැයි 30 දින දක්වාම විසඳීමට කටයුතු කර නොතිබුණි.

ව්‍යාපෘතියේ විෂය පථය වෙනස් නොකිරීම

ප්‍රවාහන සම්බන්ධතා හා වත්කම් කළමනාකරණ ව්‍යාපෘතියේ මූලික විෂය පථය 2018 අගෝස්තු 15 දිනැති අමාත්‍ය මණ්ඩල නියෝගය අනුව වෙනස් කර තිබුණි. එම හේතුවෙන් මාර්ග පුළුල් කිරීම සඳහා ඉඩම් අත්පත් කරගැනීම, මැණුම් සිදු කිරීම හා සැලැසුම් සිදු කිරීම සඳහා වැය කර තිබූ රු.මිලියන 91.23 ක නිෂ්කාර්ය වියදමක් බවට පත් වී තිබුණි.

ඉඩම් පවරා ගැනීම් කටයුතු අවසන් නොකිරීම

ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතිය (අතිරේක මූල්‍යනය) යටතේ රජයට අයත් ඉඩම් කැබලි 1,535 ක් සමඟ මුළු ඉඩම් කැබලි 7,082 ක් අත්පත් කර ගැනීම සඳහා සැලැසුම් කර තිබුණි. ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 17 වගන්තිය ප්‍රකාර මෙම ඉඩම් කැබලිවලින් ඉඩම් කැබලි 4,343 ක් සඳහා රු.මිලියන 1,933 ක් ගෙවා තිබුණි. මීට අමතරව ඉඩම් අත්පත් කර ගැනීම් බේරුම්කරණ කමිටුවේ තීරණ අනුව අමතර රු.මිලියන 4,134 ක් සහ ඊට අදාළ පොලිය වූ රු.මිලියන 379.44 ක් 2018 දෙසැම්බර් 31 වන විට ගෙවා තිබුණි. ව්‍යාපෘතිය මඟින් 2018 දෙසැම්බර් 31 දින වන විටත් එක් ඉඩම් කට්ටියක් හෝ ඉඩම් අත්පත් කරගැනීමේ පනතේ 44 වගන්තිය ප්‍රකාර නිවේදන නිකුත් කර මෙම කටයුතු අවසන් කර නොතිබුණි.

ආපදා කළමනාකරණය

වැඩිම ස්වභාවික ආපදාවන්ට ලක්වන රටක්වීම

ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත සඳහා යෝජිත සංශෝධන ක්‍රියාත්මක නොවීම

ආපදාවලින් පීඩාවට පත් වූ ජනතාව සඳහා ආධාර ලබාදීම

ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම

ඩොප්ලර් රේඩාර් පද්ධතිය අක්‍රීය වීම

තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමට ප්‍රමාණවත් පියවර නොගැනීම

ආපදා කළමනාකරණය

ස්වභාවිකව හා මිනිසා විසින් ඇති කරනු ලබන ආපදා අවම කිරීම හා වැලැක්වීමට ඵලදායි ක්‍රියාමාර්ග ගැනීම තුළින් ජීවත්වීමට සුදුසු සුරක්ෂිත පරිසරයක් ගොඩනැගීම මෙම ක්ෂේත්‍රයෙන් අපේක්ෂා කරන අරමුණ වී තිබුණි. එම අරමුණ ඉටු කර ගැනීම සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුවක් හා ව්‍යවස්ථාපිත මණ්ඩල/ ආයතන 04 ක් විසින් පහත සඳහන් කාර්යභාරයන් ඉටු කළ යුතුව තිබුණි.

- ආපදා කළමනාකරණ විෂයට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම.
- ස්වභාවික විපත් හා මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇතිවන විපත් ලිහිල් කිරීම, ප්‍රතිචාර දැක්වීම, ප්‍රතිසාධනය (Recovery) හා සහන සැලසීමේ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය හා කළමනාකරණය.
- ජාතික ප්‍රතිපත්තිය මත පදනම් වූ ජාතික ව්‍යසන කළමනාකරණය සැලැස්ම හා ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම සැකසීම.
- ව්‍යසන ලිහිල් කිරීම, ප්‍රතිචාර දැක්වීම් හා ප්‍රතිසාධනය පිළිබඳ විදේශාධාර ව්‍යාපෘති ආරම්භ කිරීම හා සම්බන්ධීකරණය කිරීම.
- පාරිසරික අවදානම්වලට ඔරොත්තු දිය හැකි තාක්ෂණික ප්‍රමිතියකින් යුත් නිවාස තැනීම ප්‍රවර්ධනය කිරීම.
- නිවාස ඉදිකිරීම සඳහා යෝග්‍ය තාක්ෂණයට අදාළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු දිරිගැන්වීම.
- කාලගුණ විද්‍යාත්මක සමීක්ෂණ හා පර්යේෂණ සිදු කිරීම.
- ස්වභාවික ව්‍යසන පෙරයීම් කිරීම (Forecasting of Natural Disasters) හා ඒ පිළිබඳ අදාළ අංශ දැනුවත් කිරීම.
- ස්වභාවික ව්‍යසන හා මිනිසා විසින් සිදු කරනු ලබන ව්‍යවසනවලදී ගලවා ගැනීමේ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම.
- ජාත්‍යන්තර මානුෂීය සහන සේවා වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.

අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන විසින් ඉහත සඳහන් කාර්යභාරය ඉටුකිරීම පිළිබඳව සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂණවලින් අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

ස්වාභාවික ආපදාවලට මුහුණදීම

ලෝකයේ ස්වාභාවික ආපදාවන් පිළිබඳ අධ්‍යයනයන් සම්බන්ධයෙන් පිළිගත් ආයතනයක් වන ජර්මන් වොච් සංවිධානය විසින් 2019 වර්ෂයේදී ප්‍රකාශයට පත් කරන ලද ලෝකයේ ස්වාභාවික ආපදාවන්වලට මුහුණ පාන රටවල් පිළිබඳ වර්ගීකරණය අනුව, 1998- 2017 කාලපරිච්ඡේදය තුළ වැඩිම ස්වාභාවික ආපදාවන්ට මුහුණ දෙන ලද රටවල් අතුරින් දෙවන ස්ථානයට ශ්‍රී ලංකාව පත්වී තිබුණි. ඉන් ගම්‍ය වූයේ ස්වාභාවික ආපදාවන් කළමනාකරණය කෙරෙහි වැඩි අවධානයක් යොමු වියයුතු විමය.

ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණය සම්බන්ධ නීතිමය රාමුව

ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ කටයුතු සම්බන්ධ නීතිමය විධිවිධාන 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යවසන කළමනාකරණ පනත මගින් සලසා තිබුණි. ආපදා කළමනාකරණය සම්බන්ධයෙන් අනාගත අභියෝගයන් ජය ගැනීම සඳහා ව්‍යසන කළමනාකරණ පනතේ ඇතුළත් වූ නීතිමය අවශ්‍යතාවය පුළුල් කිරීම කළ යුතුව තිබුණි. නමුත් ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත සඳහා 2013 වර්ෂයේදී යෝජනා කරන ලද සංශෝධන සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

තවද, ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය, ව්‍යවස්ථාපිත විධිවිධාන මත ස්ථාපනය කරන ලද ආයතනයක් නොවන අතර ඒ හේතුවෙන් පර්යේෂණ සංවිධානය මඟින් මහජනතාව වෙත නිකුත් කරනු ලබන නායයාම් අවදානම පිළිබඳ තක්සේරු වාර්තා සම්බන්ධයෙන් නීතිමය පිළිගැනීමක් නොතිබුණි. මේ හේතුවෙන් ආපදා අනතුරු ඇඟවීම් නොසලකා ඉදිකිරීම් සිදුකරනු ලබන පාර්ශවයන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට පර්යේෂණ සංවිධානයට හැකි වී නොතිබුණි.

ශ්‍රී ලංකාව තුළ සිදුවිය හැකි ස්වභාවික හා ස්වභාවික නොවන ව්‍යසනයන් හඳුනා ගැනීම

2005 අංක 13 දරන දරන ශ්‍රී ලංකා ව්‍යවසන කළමනාකරණ පනත යටතේ ශ්‍රී ලංකාව තුළ සිදුවිය හැකි ව්‍යසනයන් 21 ක් හඳුනාගෙන තිබුණු නමුත් ලෝකයේ රටවල් බහුල වශයෙන් මැත කාලීනව මුහුණ පා තිබෙන ව්‍යසනයන් වන ගෝලීය උෂ්ණත්වය ඉහලයාම , සාගර ජල මට්ටම වැඩිවීම යනාදිය මඟින් සිදුවිය හැකි ආපදාවන්, ව්‍යසනයන් වශයෙන් හඳුනාගෙන නොතිබුණි. තවද, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් සමාලෝචිත වර්ෂයේදී ඉටුකරන ලද ආපදා අවදානම අවම කිරීමේ කටයුතු ගංවතුර, නායයාම් සහ නියඟය යන ආපදාවන් කිහිපයකට පමණක් සීමා වී තිබුණි.

ආපදා කළමනාකරණ සැලැසුම් සකස් කිරීම

ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 8 වැනි පර්ච්ඡේදයේ 2(අ) වගන්තිය ප්‍රකාරව ජාතික ආපදා කළමනාකරණ සැලැස්මක් පිළියෙල කළ යුතු වූ අතර ආපදා කළමනාකරණය සම්බන්ධයෙන් වූ ජාත්‍යන්තර සම්මුතිය වූ "සෙන්දායි" රාමුවට අනුකූල වන පරිදි එම ජාතික සැලැස්ම පිළියෙල කළ යුතුව තිබුණි. කෙසේ වෙතත් 2018 – 2030 කාල පරිච්ඡේදය සඳහා ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම සකස් කිරීමේ කටයුතු 2017 මාර්තු 07 දින ආරම්භ කර තිබුණු නමුත් එම කටයුතු 2018 දෙසැම්බර් 31 දින වන විටත් නිම කර නොතිබුණි. මෙම ජාතික ආපදා කළමනාකරණ සැලැසුම් පිළියෙල නොකිරීම හේතුවෙන් ඊට සමගාමීව පිළියෙල කළ යුතු දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සැලැසුම්, ආයතනික ආපදා කළමනාකරණ සැලැසුම් හා ජාතික හදිසි මෙහෙයුම් සැලැසුම් යනාදී උප සැලැසුම් නිම කිරීමට නොහැකි වී තිබුණි.

ආපදාවලින් පීඩාවට පත්වූ ජනතාව සඳහා ආධාර ලබාදීම

2017 වර්ෂය තුළ සිදුවූ ගං වතුර හා නාය යෑම් හේතුවෙන් අධි අවදානම් කළාපවල ජීවත්වන බව හඳුනාගෙන තිබුණු කළුතර දිස්ත්‍රික්කයේ පවුල් 1,444 ක් රත්නපුර දිස්ත්‍රික්කයේ පවුල් 312 ක් සහ මහනුවර දිස්ත්‍රික්කයේ පවුල් 328 ක් සඳහා වූ ආපදා සහන සැලසීමේ කටයුතු සිදු කළ යුතුව තිබුණි. මේ සම්බන්ධයෙන් සිදුකළ විගණන පරීක්ෂණවලදී අදාළ ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ ක්‍රමවේදය විධිමත් නොවීම, නව නිවාස ඉදිකිරීමේ ප්‍රගතිය සතුටුදායක නොවීම, අවදානම් කළාපවලින් බැහැරව ඉඩම් තෝරා ගැනීමේ අපහසුතා වැනි පොදු අඩුපාඩු අනාවරණය විය. ඒ අනුව කළුතර දිස්ත්‍රික්කයේ නිවාස 167 ක් හා රත්නපුර දිස්ත්‍රික්කයේ නිවාස 151 ක් ඉදිකිරීම් කටයුතු 2019 මාර්තු 31 දින වන විටත් මූලික අදියරයන්හි පැවතුණි. මහනුවර දිස්ත්‍රික්කයේ තෝරාගත් පවුල් 125 ක් කිසිදු නිවාස පහසුකමක් නොමැතිව අධි අවදානම් කළාප තුළම ජීවත් වන බව නිරීක්ෂණය විය.

සමාලෝචිත වර්ෂය තුළදී නියං සහනාධාර කටයුතු සඳහා දිස්ත්‍රික්ක 14 ක ප්‍රතිලාභීන් 451,224 ක් හඳුනාගෙන තිබුණු අතර ඒ සඳහා රු.මිලියන 700 ක මූල්‍ය ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත 2018 සැප්තැම්බර් 25 දින ප්‍රේෂණය කර තිබුණු නමුත් එම මුදල ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ

උපදෙස් මත 2018 ඔක්තෝබර් 09 දින වන විට ආපසු ලබාගැනීමට කටයුතු කර තිබුණි.

හදිසි ආපදා තත්වයන්ගෙන් විපතට පත් ජනතාවට සහන සැලසීමේ අරමුණින් ආධාර එකතු කිරීම සඳහා අමාත්‍යාංශය විසින් පවත්වා තිබුණු බැංකු ගිණුමේ දේශීය හා විදේශීය පරිත්‍යාගශීලීන්ගෙන් ලැබී තිබුණු රු.මිලියන 294.43 ක් 2018 අගෝස්තු 06 දින වන විටත් උපයෝජනය කර නොතිබුණි. එම අරමුදල සඳහා චීන සමූහාණ්ඩුවෙන් ලැබී තිබුණු එ.ජ. මිලියන 1.00 ක්ද, ඊට ඇතුළත්වී තිබුණි. මේ අනුව අරමුදල සඳහා දායකත්වය සැපයූ පරිත්‍යාගශීලීන්ගේ අරමුණු ඉටුවී නොතිබුණි.

ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

සමාලෝචිත වර්ෂයේදී ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අයවැය ඇස්තමේන්තුව මගින් රු.මිලියන 480 ක ප්‍රතිපාදනයක් සලසා තිබුණු නමුත් ඒ ඒ දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති සම්බන්ධ විස්තර ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරි සැලැසුම්වල දක්වා නොතිබුණි. 2017 වර්ෂයේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘති 15 ක හිඟ බිල්පත් නිරවුල් කිරීම සඳහා සලසා තිබුණු රු.මිලියන 20 ක ප්‍රතිපාදනයද ඊට ඇතුළත්ව තිබුණි. කෙසේ වෙතත්, මධ්‍යස්ථානයේ ප්‍රගති වාර්තාව අනුව 2018 වර්ෂය වෙනුවෙන් ව්‍යාපෘති 278 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 474.43 ක ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත මුදාහැර තිබුණි. 2018 දෙසැම්බර් 31 දිනට එම ප්‍රතිපාදනවලින් රු.මිලියන 361.49 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

ස්වාභාවික ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සලසා තිබුණු මුළු ප්‍රතිපාදනයෙන් සියයට 22 ක් හෙවත් රු.මිලියන 104.97 ක් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති 93 ක් ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගෙන තිබීම නිසා දිවයිනේ දිස්ත්‍රික්ක අතර ප්‍රතිපාදන වෙන්කිරීම සමගාමී වී නොතිබුණි. ගාල්ල දිස්ත්‍රික්කයේ නැවත පදිංචි කිරීමේ කටයුතු සඳහා තෝරාගන්නා ලද අළුත්වත්ත පාර ඉඩම සංවර්ධනය සඳහා රු.මිලියන 10 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර එය ආපදා අවම කිරීමේ අරමුණුවලට අනුගත වී නොතිබුණු කාර්යයක් විය.

බහුවිධ අවදානම් පැතිකඩ සංවර්ධනය කිරීම යටතේ සලසා තිබුණු රු.මිලියන 50 ක ප්‍රතිපාදනයෙන් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 20.31 ක් පමණක් වැයකර තිබුණු අතර සමස්ථ ප්‍රතිපාදනයෙන් උපයෝජනය කිරීමට අපොහොසත් වී තිබුණි.

ඩොප්ලර් රේඩාර් පද්ධතිය

2006 වර්ෂයේ අයවැය යෝජනාවක් අනුව සලසා තිබුණු රු.මිලියන 400 ක ප්‍රතිපාදන උපයෝගී කර ගෙන රු.මිලියන 320 ක් වටිනා ඩොප්ලර් රේඩාර් පද්ධතියක්, ලෝක කාලගුණ විද්‍යා සංගමයෙන් ලබාගෙන 2011 වර්ෂයේදී දෙනියාය ප්‍රදේශයේ ස්ථාපිත කර තිබුණි. 2016 දෙසැම්බර් 31 දින වන විට පද්ධතියේ ඇතිවී තිබුණු විවිධ තාක්ෂණික ගැටළු හේතුවෙන් එය ක්‍රියාත්මක කර නොතිබුණි. රේඩාර් පද්ධතිය ආනයනය කිරීමෙන් පසු දීර්ඝ කාලයක් නිෂ්කාර්යව පැවතීම, එම පද්ධතිය අක්‍රිය වීමට හේතුවී තිබුණි.

2017 අප්‍රේල් 21 දින වන විට සම්පූර්ණයෙන්ම අක්‍රියව පැවති රේඩාර් පද්ධතිය ගලවා අළුත්වැඩියා කටයුතු සඳහා ඇමරිකා එක්සත් ජනපදයේ පිහිටි නිෂ්පාදන ආයතනය වෙත ආපසු යවා තිබුණි. කෙසේ වෙතත් 2018 දෙසැම්බර් 31 දින වන විට අළුත්වැඩියා කටයුතුවල ප්‍රගතිය පිළිබඳ තොරතුරු කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් ලබාගෙන නොතිබුණි.

2018 දෙසැම්බර් 31 දින වන විට රේඩාර් පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා රු.මිලියන 408.82 ක් වැය කර තිබුණු නමුත් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ එදිනට මූලා

ප්‍රකාශනවල මෙම කරුණු හෙළිදරව් කර නොතිබීමත්, ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා නොතිබීමත්, හේතුවෙන් මේ සම්බන්ධ තොරතුරු සඟවා තැබීමේ අවදානමක් පැවතිණි.

තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම

තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සම්බන්ධයෙන් ආපදා කළමනාකරණ විෂයය ඍජුව සම්බන්ධ වන නමුත් ආපදා කළමනාකරණ අමාත්‍යාංශය යටතේ වූ ආයතන තම විෂය පථයට යටතේ වූ තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගැනීමට හා එම කාර්යයන් ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

මානව සම්පත් කළමනාකරණය

ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ හා ඒ යටතේ ආයතනවල කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පැවතීම ආදාළ ආයතන විසින් ඉටුකළ යුතු කාර්යයන් ඵලදායී ලෙස ඉටු කිරීමට බාධාවක් වී පැවැතුණි. 2018 දෙසැම්බර් 31 දින වන විට ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ තනතුරු 35 ක් සහ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල් තනතුර ඇතුළත්ව මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරු 11 ක් පුරප්පාඩුව පැවතුණි.

ක්‍රීඩා කටයුතු

වයාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

අපේක්ෂිත පරිදි ක්‍රීඩා සංකීර්ණ ඉදිකිරීම් නිම නොකිරීම

වැඩිපුර වැටුප් ගෙවීම

ප්‍රගතියක් ලබා නොතිබුණු වයාපෘති

ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලින් බැහැරවීම

උත්තේජක ද්‍රව්‍ය ලබා ගැනීමට එරෙහිව රීති සම්පාදනය නොකිරීම

ජාතික ක්‍රීඩා අරමුදලෙන් නිලධාරීන්ට ගෙවීම් කිරීම

මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් නොකිරීම

මූල්‍ය වංචාව

ක්‍රීඩා කටයුතු

ක්‍රියාශීලි ජාතියක් ගොඩනැගීම හා ජාතික ප්‍රතිරූපය අන්තර්ජාතික වශයෙන් ඉහළ නැංවීම සඳහා රටේ දේශිය හා ජාත්‍යන්තර ක්‍රීඩාවන්ට අදාළ කටයුතු සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම ක්‍රීඩා අමාත්‍යාංශයෙන් අපේක්ෂා කරන ප්‍රතිඵලය වී තිබුණි. එම ප්‍රතිඵලය අත්කර ගැනීම සඳහා ක්‍රීඩා අමාත්‍යාංශය හා ඒ යටතේ වන ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව, ව්‍යවස්ථාපිත ආයතන 05 ක්, ක්‍රීඩා අරමුදලක් හා ක්‍රීඩා සංගම් 64 ක් මඟින් පහත සඳහන් කාර්ය භාරයන් ඉටු කළ යුතුව තිබුණි.

- ක්‍රීඩා විෂයට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසුවිපරම් කිරීම සහ ඇගයීම.
- ක්‍රීඩා කටයුතු දිරිගැන්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම හා ක්‍රීඩා ක්ෂේත්‍රය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
- ක්‍රීඩා අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම.
- ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය අන්තර්ජාතික වශයෙන් ගොඩනැගීම සඳහා ක්‍රීඩාව යොදා ගැනීමට හැකිවන ලෙස නව ක්‍රමෝපායයන් සම්පාදනය හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පොදු මහජනතාවගේ ශාරීරික සුවතාවය සැලසීමට අවශ්‍ය පහසුකම් ප්‍රවර්ධනය හා සම්බන්ධීකරණය සිදු කිරීම.
- ආයතනයන් අධීක්ෂණය කිරීම.

අමාත්‍යාංශය හා ඒ යටතේ වන ආයතන විසින් ඉහත සඳහන් කාර්යභාරයන් ඉටු කිරීමේදි අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දැක්වේ.

ශ්‍රී ලාංකිකයින් දිනාගත් ජාත්‍යන්තර ජයග්‍රහන

2017 වර්ෂයේදී ශ්‍රී ලාංකික ක්‍රීඩකයින් ජාත්‍යන්තර තරඟාවලි 08 කට සහභාගි වී රන් 29 ක්, රිදී 39 ක් සහ ලෝකඩ 11 ක් වශයෙන් පදක්කම් 79ක් හිමිකරගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේදී තරඟාවලි 10 කට සහභාගි වී රන් 23 ක් රිදී 16 ක් සහ ලෝකඩ 22 ක් වශයෙන් පදක්කම් 61 ක් පමණක් ලබාගෙන තිබුණි.

ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

අමාත්‍යාංශය විසින් වැල්වැටිතුරේ පිහිනුම් තටාකය ඉදිකිරීම, දියගම මහින්ද රාජපක්ෂ ජාතික ක්‍රීඩා ඇකඩමියේ මීටර් 400 කෘත්‍රිම ධාවන පථය, එහි වැසිකිළි පද්ධතිය හා පිවිසුම් මාර්ග සකස් කිරීම, කුරුණෑගල මලියදේව විද්‍යාලීය වෙඩි තැබීමේ සහ දුනු විදීමේ මධ්‍යස්ථානයක් ඉදිකිරීම යන ව්‍යාපෘති 04 ක් සඳහා රු.මිලියන 429.39 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එම ව්‍යාපෘතීන් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 222.48 ක් වැයකර තිබුණි. 2019 මැයි මාසය වන විටත් එම ව්‍යාපෘති නිම කර නොතිබුණි.

ක්‍රීඩා සංකීර්ණ ඉදිකිරීම

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ 12 ක් හා පළාත් ක්‍රීඩා සංකීර්ණ 7 ක් ඉදිකිරීම සඳහා රු.මිලියන 1,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ 10 ක් හා පළාත් ක්‍රීඩා සංකීර්ණ 7 ක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර ඒ සඳහා රු.මිලියන 692 ක් වැය කර තිබුණි. එයින් දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ 6

ක් සහ පළාත් ක්‍රීඩා සංකීර්ණ 2 ක වැඩ අවසන් කර තිබුණු අතර දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ 4 ක සහ පළාත් ක්‍රීඩා සංකීර්ණ 5 ක වැඩ අවසන් කර නොතිබුණි.

වැඩිපුර වැටුප් ගෙවීම

ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරීන් ඒකාබද්ධ සේවයේ ව්‍යාපෘති නිලධාරී තනතුරට උසස් කිරීමට අදාළව වැටුප් පරිවර්තනය කිරීමේදී වැඩිපුර වැටුප් ගෙවා තිබුණි. එසේ වැඩිපුර වැටුප් ගෙවා තිබුණු දැනට සේවයේ නියුතු නිලධාරීන් 26 දෙනෙකුගෙන් රු.මිලියන 1.20 ක් හා විශ්‍රාමික නිලධාරීන් 5 දෙනෙකුගෙන් රු.මිලියන 0.50 ක් වශයෙන් රු.මිලියන 1.70 ක් 2018 දෙසැම්බර් 31 දින වනවිට අයකර ගත යුතුව තිබුණි. තවද වයස අවුරුදු 55 සම්පූර්ණ කර නොතිබුණු නිලධාරියෙකුට 2017 අප්‍රේල් 8 දින සිට විශ්‍රාම ගැනීම අනුමත කර තිබුණු අතර එම නිලධාරියාට වැඩිපුර ගෙවා තිබුණු වැටුප් අයකර ගත යුතුව තිබුණි. එසේ වැඩිපුර ගෙවා තිබුණු වැටුප් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

අවුරුදු 13-14 වයස් කාණ්ඩවල පසුවන ක්‍රීඩා කෞශල්‍යයන්ගෙන් හෙබි දරුවන් විද්‍යාත්මක පදනමක් මත හඳුනා ගනිමින්, 2024 සහ 2028 වර්ෂවලදී පැවැත්වෙන ඔලිම්පික් තරඟාවලියට යොමු කිරීම සඳහා වූ ව්‍යාපෘතිය, ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබුණි. 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර තිබුණු මෙම ව්‍යාපෘතිය සඳහා එකතුව රු.මිලියන 474 ක ප්‍රතිපාදන සලසා තිබුණි. 2018 වර්ෂය අවසන් වනවිට ඊට අදාළව රු.මිලියන 132.1 ක් වැයකර තිබුණි. මෙම ව්‍යාපෘතිය 2018 වර්ෂයේදී නවතා තිබුණු අතර ව්‍යාපෘතියේ ප්‍රගතිය හා නවතා දැමීමට හේතු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලින් බැහැර වීම

ජාතික සංචිතවල ක්‍රීඩකයින්ගේ ආහාර සැපයීම සඳහා එකතුව රු.මිලියන 54.63 ක කොන්ත්‍රාත්තු ප්‍රදානය කර තිබුණි. ඒ සඳහා වන කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2 මාර්ගෝපදේශයේ සඳහන් අරමුණු ඉටුවන පරිදි සිදු කර නොතිබුණි.

උත්තේජක ද්‍රව්‍ය ලබා ගැනීමට එරෙහිව රීති සම්පාදනය නොකිරීම

2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ලබා ගැනීමට එරෙහි සම්මුති පනතේ 33 වගන්තිය ප්‍රකාරව උත්තේජක ද්‍රව්‍ය ලබා ගැනීමට එරෙහිව රීති සම්පාදනය කර අමාත්‍යවරයාගේ අනුමැතිය යටතේ ගැසට් පත්‍රයේ පලකර බලාත්මක කළ යුතුව තිබුණි. 2018 වර්ෂය අවසාන වනවිට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය පිහිටුවා වර්ෂ 5 ක් ගත වී තිබුණද, ආයතනයෙන් අපේක්ෂා කරන ලද ප්‍රධානතම කාර්යය වූ උත්තේජක ලබා ගැනීමට එරෙහිව ක්‍රියාකිරීම සඳහා රීති සකස් කර නොතිබුණි.

ජාතික ක්‍රීඩා අරමුදලෙන් නිලධාරීන්ට ගෙවීම් කිරීම

2017 හා 2018 වර්ෂවලදී ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවය කරන මාණ්ඩලික නිලධාරීන් 4 දෙනෙකුට ක්‍රීඩා පුහුණුකරුවන් ලෙස

සලකා ජාතික ක්‍රීඩා අරමුදලෙන් අවස්ථා කිහිපයකදී මාසික දීමනා වශයෙන් එකතුව රු.මිලියන 1.19 ක් ගෙවා තිබුණි. එම නිලධාරීන් 4 දෙනා විසින් ඉටු කරන ලද ක්‍රීඩා පුහුණුවීම් සම්බන්ධ කාර්යසාධනය ඇගැයීමක් සිදු කර නොතිබුණි. තවද ඉහත නිලධාරීන්ගෙන් 02 දෙනෙකු සඳහා ක්‍රීඩා පුහුණුකරුවන් යටතේ පොදු රාජ්‍ය මණ්ඩලීය බර ඉසිලීමේ තරඟ ජයග්‍රහනය වෙනුවෙන් රු.මිලියන 1.60 ක් ජාතික ක්‍රීඩා අරමුදලෙන් ගෙවා තිබුණි.

දීර්ඝ කාලයක සිට පවතින ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂවල එකතුව රු.මිලියන 39.99 ක් වී තිබුණු අතර එම ශේෂයෙන් රු.මිලියන 31.66 ක ශේෂ වර්ෂ 01 කට වඩා වැඩි කාලයක සිට හිඟහිටව පැවැත එන නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. කොළඹ මහ නගර සභාවට වර්ෂ 11 ක පමණ කාලයක සිට නිරවුල් කළ යුතුව තිබුණු රු.මිලියන 1.12 ක ශේෂය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් නොකිරීම

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ක්‍රිකට් ඒඩ් (ගැරන්ටි) ලිමිටඩ් නැමැති ඇපයෙන් සීමාසහිත සමාගමක් 2016 මැයි 23 දින සංස්ථාපනය කර තිබුණි. පුනරාධාර සහ සමාජීය වගකීම් වැඩසටහන් සඳහා ආධාර ලෙස වාර්ෂිකව රු.මිලියන 10 ක් ලබා දීමට ශ්‍රී ලංකා ක්‍රිකට් විධායක කමිටුව විසින් අනුමත කර තිබුණු අතර ඒ අනුව 2017 වර්ෂයේ සිට 2019 ජුනි 30 දින දක්වා රු.මිලියන 16.75 ක් එම සමාගම වෙත ලබා දී තිබුණි. 2016, 2017 හා 2018 වර්ෂ සඳහා මෙම සමාගමේ මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම සඳහා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

ජාත්‍යන්තර ක්‍රිකට් විකාශන අයිතිය

2018 ජූලි 12 දින දකුණු අප්‍රිකා ජාතික ක්‍රිකට් කණ්ඩායම ශ්‍රී ලංකා තරඟ සංචාරයේදී ජාත්‍යන්තර ක්‍රිකට් තරඟ විකාශන අයිතිය එ.ජ.ඩොලර් මිලියන 1.25 කට ලබාදීමට ජාත්‍යන්තර රූපවාහිනී විකාශන සමාගමක් සමඟ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය ගිවිසුමකට එළඹ තිබුණි. එම ගිවිසුම්ගත වටිනාකමෙන් සියයට 15 ක් වූ රු.මිලියන 29.83 ක් හෙවත් එ.ජ.ඩො.මිලියන 0.19 ක් වූ අවසන් ගෙවීම් වටිනාකම 2018 අගෝස්තු 14 දින තරඟ සංචාරය අවසන් වීමෙන් පසුව ලබා ගත යුතුව තිබුණි. එම ගෙවීම් වටිනාකම ලබා ගැනීම සඳහා ව්‍යාජ විදේශීය බැංකු ගිණුම් අංකයක් සහ ව්‍යාජ ඊ-මේල් ලිපිනයක් ඉන්වොයිසියේ ඇතුළත් කර ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ මූල්‍ය අංශයේ ප්‍රධානි විසින් අදාළ සමාගම වෙත යොමු කර ඇති බව දැන ගන්නට ලැබුණු බව සඳහන් පැමිණිල්ලක් 2018 ඔක්තෝබර් 04 දින ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරි විසින් කොළඹ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විශේෂ විමර්ශන අංශයට යොමු කර තිබුණි. මෙම මුදල ශ්‍රී ලංකා ක්‍රිකට් වෙත ලබා දී ඇති බව 2019 මැයි 10 දින එම සමාගම විසින් ප්‍රධාන විධායක නිලධාරි වෙත දැනුම්දී තිබුණද, මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් විධිමත් ක්‍රියාමාර්ග 2019 මැයි 31 දින වන විටත් ගෙන නොතිබුණි.

මූල්‍ය වංචාව

ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ හිටපු මුදල් කළමනාකරු විසින් තරඟ විනිසුරුවන් ලෙස ව්‍යාජ නම් ඇතුළත් කර මුදල් ලබාගෙන ඇති බව 2017 වර්ෂයේදී ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය විසින් කරන ලද පරීක්ෂණවලදී අනාවරණය වී තිබුණි. මෙම මුදල් වංචාව සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වැඩිදුර පරීක්ෂණ පවත්වන අතර වංචාකරන ලද මුළු මුදල් ප්‍රමාණය සමාලෝචිත වර්ෂයේදී ද අනාවරණය කර ගැනීමට නොහැකි වී තිබුණි. මේ පිළිබඳව 2017 වර්ෂයේ විගණකාධිපති වාර්තාව මගින් පෙන්වා දී තිබුණද 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හඳුනා නොගත් අරමුදල් මාරු කිරීම් ලෙස රු.මිලියන 14.53 ක් ලැබිය යුතු ගිණුම් යටතේ දක්වා තිබුණි.

කාන්තා හා ළමා කටයුතු

නිති හා ප්‍රතිපත්ති බලාත්මක නොකිරීම

කාන්තාවන් හා දරුවන් සඳහා ක්ෂණික සහන ලබා දීම

කාන්තාවන් දිරිගැන්විම හා ඔවුන් සවිබල ගැන්වීම

පැමිණිලි සඳහා විසඳුම් ලබාදීමේ ප්‍රමාදය

ළමයින් සඳහා වන සමාජ ආරක්ෂණ වැඩසටහන

ජාතික ළමා ආරක්ෂක ප්‍රතිපත්තිය නීතිගත නොකිරිම

මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සැලැසුම් කළ පරිදි ඉටු නොකිරීම

කාන්තා හා ළමා කටයුතු

ළමයින් හා කාන්තාවන්ගේ අයිතිවාසිකම් හා ආරක්ෂාව තහවුරු කරන හිතකර සංවේදී සමාජයක් බිහි කිරීමේ අපේක්ෂාවෙන් කාන්තා හා ළමා කටයුතු සහ වියළි කළාප සංවර්ධන අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුවක්, ව්‍යවස්ථාපිත අධිකාරියක් හා විදේශාධාර ව්‍යාපෘතියක් යන ආයතන 03 ක් යටතේ පහත සඳහන් කාර්යයන් ඉටු කළ යුතුව තිබුණි.

- කාන්තා හා ළමා කටයුතු විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම.
- රාජ්‍ය කටයුතුවලදී තීරණ ගැනීම සහ දේශපාලන ක්ෂේත්‍රය තුළ කාන්තාවන්ගේ සහභාගිත්වය සහ නියෝජනය වැඩි කිරීම සඳහා ක්‍රමෝපායන් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම.
- ගැටුම්වලින් හා දරිද්‍රතාවයෙන් විපතට පත් කාන්තා මූලික ගෘහ කණ්ඩායම් විශේෂයෙන් අරමුණු කර ගනිමින් කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ සාධාරණත්වය ඇති කිරීම.
- කාන්තා හා ළමා හිංසනය වැළැක්වීම සඳහා නීති හා ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- ළමා කටයුතුවලට අදාළ සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ ඉටු කර ගැනීමේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
- කාන්තා හා ළමා ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.
- ශාරීරික හා මානසික වශයෙන් නිරෝගී දරුවෙකු ඇති කරලීමේ අභිප්‍රායෙන් මුල් ළමාවිය රැකවරණය හා අනාරක්ෂිත තත්ත්වයේ සිටින දරුවන් වෙනුවෙන් ජාතික ප්‍රතිපත්ති හා ජාත්‍යන්තර සම්මතයන්ට ගැලපෙන සේ සැලසුම්, වැඩසටහන් හා ව්‍යාපෘති සැකසීම හා ක්‍රියාත්මක කිරීම.
- සෙවන සරණ කැපකරු මව්පිය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම.

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීමේ දී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

ළමා හා කාන්තා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම

ළමා හා කාන්තා අයිතිවාසිකම් තහවුරු කිරීම, ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය කිරීම සඳහා සම්පාදනය කළ නීති හා සකස් කළ ප්‍රතිපත්ති බලාත්මක කර ක්‍රියාත්මක කර නොතිබුණි.

ගොවිජන මන්දිරයේ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීම

ගොවිජන මන්දිරයේ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීමට හා ඒ සඳහා උපකරණ ලබා ගැනීම සඳහා රු.මිලියන 1.5 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එම ප්‍රතිපාදනවලින් අදාළ කාර්ය ඉටු කිරීම සඳහා රු.මිලියන 1.26 ක් පාර්ලිමේන්තු මහලේකම් වෙත 2018 සැප්තැම්බර් මාසයේදී යවා තිබුණි. එම මුදල් අදාල කාර්යය සඳහා යෙදවීමකින් තොරව පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

කාන්තාවන් හා දරුවන් සඳහා ක්ෂණික සහන ලබා දීම

2018 වර්ෂයේ දී කාන්තාවන් හා දරුවන් සඳහා ක්ෂණික සහන ලබා දීම සඳහා රු.මිලියන 3 ක

ප්‍රතිපාදන සලසා තිබුණි. එම ප්‍රතිපාදනවලින් ප්‍රතිලාභීන් 6 දෙනෙකු සඳහා පමණක් රු.378,329 ක ප්‍රතිලාභ ලබා දී තිබුණි.

කාන්තාවන් දිරි ගැන්වීම සහ ඔවුන් සවිබල ගැන්වීම

ව්‍යවසායක කාන්තාවන්ගේ ආදායම් වර්ධනය සඳහා නිපැයුම්වලට ස්ථිර වෙළඳපොලක් ඇති කිරීම සඳහාත්, වෙළඳපොල අවශ්‍යතාවන්ට ගැලපෙන ලෙස හා නිසි ප්‍රමිතියෙන් යුතු භාණ්ඩ හා සේවා සැපයීමට ඔවුන් පෙළඹවීමත් අරමුණු කර ගෙන පාරිසරික සංචාරක කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා කාන්තාවන් දිරි ගැන්වීම සහ ඔවුන් සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි.
2018 වර්ෂයේදී රු.මිලියන 4 ක ප්‍රතිපාදන සලසා ගෙන අලෙවි මධ්‍යස්ථාන 2 ක් ඉදිකිරීමට සැලැසුම් කර තිබුණි. ඉන් රු.මිලියන 1.01 ක් වැය කර එක් මධ්‍යස්ථානයක් පමණක් ඉදිකර තිබුණි. 2017 වර්ෂයේ රු.මිලියන 5.47 ක් වැය කර අලෙවි මධ්‍යස්ථාන 2 ක් ඉදිකර තිබුණ ද, විගණිත දිනය වූ 2019 මැයි 8 දින වන විටත් එක් මධ්‍යස්ථානයක් විවෘත කර නොතිබුණි. මේ නිසා ව්‍යාපෘතියෙන් අපේක්ෂා කළ අරමුණු ඉටු කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

පැමිණිලි සඳහා විසඳුම් ලබා දීමේ ප්‍රමාදය

2011 වර්ෂයේ සිට 2018 වර්ෂය අවසානය දක්වා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත පැමිණිලි 9,266 ක් ලැබී තිබුණි. 2019 මාර්තු 31 දින වන විට එම පැමිණිලිවලින් 7,326 ක් එනම්, සියයට 79 ක් සඳහා විසඳුම් ලබා දී නොතිබුණි. අධිකාරිය වෙත වර්ෂයක් පාසා ලැබෙන පැමිණිලිවලට සම්බන්ධ තොරතුරු රැස්කර වාර්තා කිරීමට ප්‍රාදේශීය හා දිස්ත්‍රික් නිලධාරීන්ගේ ඇති අකාර්යක්ෂමතාවය, තොරතුරු කැඳවීම හා විමර්ශන කටයුතු පිළිබඳ පසුවිපරම් නොකිරීම හා නිසි අධීක්ෂණය සිදු නොකිරීම යනාදී කරුණු නොවිසඳීම හේතුවෙන් ලැබී තිබුණු පැමිණිලි සංඛ්‍යාව ශීඝ්‍රයෙන් වර්ධනය වී තිබුණි.

ළමයින් සඳහා වන සමාජ ආරක්ෂණ වැඩසටහන

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් ළමයින් සඳහා වන සමාජ ආරක්ෂණ වැඩසටහන යටතේ දිස්ත්‍රික්ක 25 ක් තුළ වැඩමුළු 25 ක් පැවැත්වීමටත්, ජාතික හා පළාත් මට්ටමේ කමිටු 18 ක් පිහිටුවීමටත්, පුහුණු වැඩසටහන් 11 ක් පැවැත්වීමටත්, ධාරිතා සංවර්ධන වැඩසටහන් 6 ක් හා දරුවන්ගේ ආරක්ෂාව ශක්තිමත් කිරීමේ අරමුණින් වැඩසටහන් 3 ක් ක්‍රියාත්මක කිරීමටත් සැලැසුම් කර තිබුණි. ඒ සඳහා රු.මිලියන 7.8 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණු අතර එම කාර්යයන් ක්‍රියාත්මක කර නොතිබුණි. එමෙන්ම ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ද සමාජ ආරක්ෂණ වැඩසටහන සඳහා කාර්යභාරයන් 11 ක් ඇතුළත් කර රු.මිලියන 20 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා වන මාර්ගෝපදේශය පිළිබඳ පුහුණු කිරීම, ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සැකසීම, ළමා විවාහ වැලැක්වීමට අදාළ වාර්තා වැඩසටහන් හා ප්‍රකාශන සකස් කිරීම හා වැඩසටහන් 25 ක් පැවැත්වීම, අයිතිවාසිකම් හා ළමා ගැටළුවලට අදාල ප්‍රකාශන සකස් කිරීම යන කාර්යයන් 2018 වර්ෂය අවසානය වන විටත් ආරම්භ කර නොතිබුණි.

ජාතික ළමා ආරක්ෂක ප්‍රතිපත්තිය නීතිගත නොකිරීම

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිහිටුවා වර්ෂ 20 ක් ගත වී තිබුණත්, ජාතික ළමා ආරක්ෂක ප්‍රතිපත්තිය නීතිගත කිරීමට 2018 වර්ෂයේ දී ද අපොහොසත් වී තිබුණි.

මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සැලැසුම් කළ පරිදි ඉටු නොකිරීම

ශ්‍රී ලංකාව තුළ ඉහළ ගුණාත්මයෙන් යුතු මුල් ළමාවිය සංවර්ධනය කිරීමේ අරමුණින් එ.ජ.ඩො.මිලියන 50 ක ලෝක බැංකු ණය ආධාර යටතේ මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. 2018 වර්ෂය සඳහා ව්‍යාපෘතියේ කටයුතු ඉටු කිරීම සඳහා රු.මිලියන 1,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. ඉන් රු.මිලියන 767.75 ක් වැය කර තිබුණි. 2018 ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර රු.මිලියන 3,957 ක ප්‍රතිපාදන සලසා තිබූ වතු අංශයේ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන 28 ක් ඉදිකිරීම, අඩු ප්‍රතිලාභ සහිත ප්‍රදේශවල මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ඉදිකිරීම, ප්‍රාථමික ශ්‍රේණිවල පාසල් ගුරුවරුන් පුහුණු කිරීම හා මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම යන කාර්යයන් සැලැසුම් කළ පරිදි ඉටු කර නොතිබුණි. එමෙන්ම මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන 1,500 ක පහසුකම් සංවර්ධන ප්‍රදාන සඳහා රු.මිලියන 1,230.10 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණ ද, 2018 වර්ෂය තුළ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන 259 ක් සඳහා රු.මිලියන 51.32 ක ප්‍රදාන පමණක් ලබා දී තිබුණි.

සංචාරක කටයුතු

ප්‍රතිපාදන ඌන උපයෝජනය

අපේක්ෂිත ක්‍රියාකාරකම් ඉටු කිරීම

අලෙවි ප්‍රවර්ධන වියදම්වලින් අපේක්ෂිත ඉලක්ක සපුරා නොතිබීම

අපගමන බදු අය නොකිරීම

සංචාරක කටයුතු

ශ්‍රී ලංකාව සංචාරකයන්ගේ මතකයේ රැඳෙන, අව්‍යාජ සහ විවිධත්ව අත්දැකීම් සඳහා ලොව විශිෂ්ටතම දූපත ලෙස හඳුනාගැනීමට අවශ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීම මඟින් ශ්‍රී ලංකාවේ තරුණ ප්‍රජාවට සෘජු හා වක්‍ර රැකියා අවස්ථා උදා කිරීම මඟින් ආර්ථිකයට ඉහළ විදේශ විනිමයක් ඉපැයීම සංචාරක කටයුතු අංශයේ ප්‍රධාන අරමුණ වී තිබුණි. එම අරමුණ ඉටුකර ගැනීම සඳහා සංචාරක සංවර්ධනය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය, ව්‍යවස්ථාපිත ආයතන 04 ක් හා අරමුදලක් විසින් පහත සඳහන් කාර්යභාර්ය ඉටු කළ යුතුව තිබුණි.

- සංචාරක කර්මාන්තය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට අනුකූලව සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම සහ ප්‍රමිතීන් සම්පාදනය කිරීම.
- සංචාරක නියෝජිතායතන ලියාපදිංචි කිරීම සහ නියාමන කටයුතු.
- විවේක ගත කිරීම සඳහා විනෝදාත්මක පහසුකම් සැපයීමට අදාල කටයුතු ප්‍රවර්ධනය කිරීම.
- වනජීවි ආරක්ෂිත ප්‍රදේශයන්හි සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනයේදී අදාළ පරිසර පද්ධති සංරක්ෂණය කිරීම අවධාරණය සඳහා අවශ්‍ය පියවර ගැනීම.

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

සංචාරකයින්ගේ පැමිණීම හා විදේශ විනිමය ඉපැයීම

ස්වභාවික මනස්කාන්ත වෙරළවල්, හිතවාදී සහ මිත්‍රශීලි ජනයා සමඟ පොහොසත් වනජීවීන් සහ ස්වභාව ධර්මය, සංස්කෘතිය, සූපශාස්ත්‍ර, පුරා විද්‍යාත්මක උරුම, ජලය ආශ්‍රිත වික්‍රමාන්විත හා අපූර්වත්වය මුසුවූ විශ්ව සංචාරකයන්ගේ මනස්කාන්තම ස්ථානය මෙන්ම ලෝක චාරිකා සම්මාන උළෙලේදී ආසියාවේ ප්‍රමුඛතම වික්‍රමාන්විත සංචාරක ගමනාන්තය ලෙස සම්මානයට පාත්‍ර වී තිබුණි. ලෝන්ලි ප්ලැනට් සඟරාවට අනුව ශ්‍රී ලංකාව "2018 අංක 01 ගමනාන්තය" වශයෙන් ජාත්‍යාන්තර වශයෙන් පළමු වරට ස්ථානයක් ලබාගනිමින් සහ චීනයේ පීපල්ස් ඩේලි පුවත්පතට අනුව කාන්තා සංචාරකයින් සඳහා ඉහළම ගෝලීය ආරක්ෂිත ගමනාන්තය ලෙස තම ප්‍රතිරූපය වඩවා ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 712,027.3 ක විදේශ විනිමයක් ශ්‍රී ලංකාවට දායාද කරමින්, සංචාරකයින් 2,333,796 ක් පැමිණ තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සංචාරකයන්ගේ පැමිණීම සියයට 10 කින් වර්ධනය වී තිබුණි.

රටක් වශයෙන් ගත් කළ සංචාරක කර්මාන්තයෙන් ශ්‍රී ලංකාව බලාපොරොත්තු වන්නේ ඉහළ විදේශ විනිමය ඉපැයීමක් වන අතර 2018 වර්ෂයේ දී මෙම කර්මාන්තයෙන් එ.ජ.ඩො. මිලියන 4,380.6 ක ආදායමක් උපයා තිබුණි. එම ප්‍රමාණය ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 11.6 ක වර්ධනයක් ලෙස සඳහන් කළ හැකිය. විස්තර රූපසටහන 48 හි දැක්වේ.



රූපසටහන 48 - සංචාරක ව්‍යාපාරයෙන් ඉපයූ ආදායම
මූලාශ්‍රය - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

කෙසේ වෙතත්, ඉකුත් වර්ෂයේ දී මෙන් ම සමාලෝචිත වර්ෂයේදී ද ප්‍රධාන කළාප බහුතරයකින් සංචාරක පැමිණීම වර්ධනය විය. එමෙන් ම වැඩිම සංචාරකයින් ගණන වන 424,887 දෙනෙකු ඉන්දියාවෙන් පැමිණ තිබුණි. එම පැමිණීම ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 10.46 ක වර්ධනයක් වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ඊලඟ පැමිණි වැඩිම සංචාරකයින් ගණන වන 265,965 දෙනෙකු චීන සමූහාණ්ඩුවෙන් පැමිණ තිබුණි. නමුත් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී එය සියයට 1.12 කින් අඩු වී තිබුණි.

විදේශීය සංචාරක පැමිණීම ඉහළයාම මෙන් ම සංචාරකයකුගේ සාමාන්‍ය වියදම සහ සංචාරකයකු ශ්‍රී ලංකාවේ ගත කරන සාමාන්‍ය දින ගණන ඉහළ යාම සංචාරක ඉපැයුම් වර්ධනය වීමට ප්‍රධාන සාධකයක් ලෙස සඳහන් කල හැකිය. 2018 වර්ෂයේදී සංචාරකයෙකුගේ සාමාන්‍ය දෛනික වියදම එ.ජ.ඩො.173.8 ක් වූ අතර එම ප්‍රමාණය 2017 වර්ෂයේදී එ.ජ.ඩො.170.1 ක් විය. ඒ අනුවද සංචාරක ඉපැයීම් කිසියම් අනුපාතයකින් ඉහළ යාමටද මෙය බලපා තිබුණි. එමෙන් ම සංචාරකයකු ශ්‍රී ලංකාවේ ගත කරන සාමාන්‍ය දින ගණන සමාලෝචිත වර්ෂයේදී දින 10.8 ක් වූ අතර එය 1987 වර්ෂයේ සංචාරකයකු ශ්‍රී ලංකාවේ ගත කරන සාමාන්‍ය දින ගණන 13.2 ක සමඟ සැසඳීමේදී එම ඉලක්කයට ලඟා වීමට නොහැකි වී තිබුණි.

ප්‍රතිපාදන ඌන උපයෝජනය

සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයට සංචාරක සංවර්ධන ව්‍යාපෘති සඳහා රු.මිලියන 845 ක ප්‍රතිපාදන සලසා තිබූණි. ඉන් සංචාරක ආකර්ෂණයන් සංවර්ධනය කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 390 ක ප්‍රතිපාදන සලසා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.මිලියන 256.83 ක් හෙවත් සියයට 65.85 ක් පමණක් වියදම් කර තිබුණි. එමෙන්ම සංචාරක ගම්මාන සංවර්ධනය කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 10 ක ප්‍රතිපාදන සලසා තිබුණද, වර්ෂය අවසාන වන විට රු.මිලියන 2.19 ක් පමණක් වියදම් කර තිබුණි.

අපේක්ෂිත ක්‍රියාකාරකම් ඉටුකිරීම

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව අපේක්ෂිත ක්‍රියාකාරකම් 178 කින් ක්‍රියාකාරකම් 72 ක් පමණක් ඉටු කර තිබුණි. අධිකාරියේ ක්‍රියාකාරකම් ඉටු කිරීමට අංශ 07 ක් පිහිටුවා තිබුණු අතර ඒ සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 2446.90 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, ඉන් රු.මිලියන 244.33 ක් හෙවත් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 9 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

අලෙවි ප්‍රවර්ධන වියදම්

මැදපෙරදිග, චීනය, ඉන්දුනීසියාව, මැලේසියාව, තායිලන්තය, කොරියාව යන රටවල් වෙනුවෙන් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී සංචාරක ප්‍රවර්ධනය වෙනුවෙන් වැය කළ වියදම ඉකුත් වර්ෂයට සාපේක්ෂව ඉහළ ප්‍රතිශතයක් ගෙන තිබුණි. නමුත් එම රටවලවලින් සංචාරකයන්ගේ පැමිණීමේ

වර්ධනය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී පහත වැටී තිබුණි. තවද, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂයේදී ලෝකයේ ප්‍රධාන රටවල් 28 ක් තුළ ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර තිබූණු අලෙවි ප්‍රවර්ධන ඉසවු ගණන 152 කින් ඉසව් 89 ක් පමණක් නිම කර තිබුණි.

අපගමන බදු අය නොකිරීම

2003 අංක 25 දරන මුදල් පනතේ 2(ආ) උපවගන්තිය අනුව ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන නැවකින් ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන මගියෙකු සඳහා නිකුත් කරන සෑම ටිකට් පතකින්ම බදු අයකර ඉන් කොටසක් සංචාරක සංවර්ධන අරමුදල වෙත ප්‍රේෂණය කළ යුතුව තිබුණි. එලෙස නැව් මඟින් ගමන්කරන මගීන්ගෙන් බදු අයකර අධිකාරිය වෙත එවා නොතිබුණි. 2018 වර්ෂයේදී මඟීන් 87631 ක් පිටත් වී තිබුණු බැවින් ඒ වෙනුවෙන් එක මගියෙකුගෙන් එ.ජ.ඩො.1.66 ක් බැගින් රු.මිලියන 23.56 ක අපගමන බදු ආදායම අය කර ගැනීමට අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි.

නාගරික සංවර්ධනය

ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මහ සංවර්ධන සැලැස්මේ සඳහන් කාර්යයන් ආරම්භ නොකිරිම

පොදු ප්‍රවාහන හා බස්සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

කොට්ටාව, කඩුවෙළ සහ කඩවත නගර සංවර්ධන ව්‍යාපෘතිය

බස්නාහිර කළාපීය මහනගර සැලැසුම් ව්‍යාපෘතිය

විද්‍යා හා තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය

ගුවන් නගර හා පරිපාලන නගර ව්‍යාපෘතිය

කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය

නාගරික සංවර්ධනය

බස්නාහිර කළාපය සහ අනෙකුත් මහානගර ආර්ථික, සමාජ සහ සංස්කෘතිකමය වශයෙන් දියුණු ප්‍රජාවකගෙන් සමන්විත අති නවීන වාස්තු විද්‍යානුකූල නගර ලෙස නිර්මාණය කිරීම මෙම ක්ෂේත්‍ර යෙන් අපේක්ෂා කරන ප්‍රතිඵලය වී තිබුණි. එම ප්‍රතිඵලය අත් කර ගැනීම සඳහා මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුවක් හා ව්‍යවස්ථාපිත මණ්ඩල/ආයතන 02 ක් විසින් පහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි.

- මහානගර හා බස්නාහිර සංවර්ධන විෂයන්ට අදාළ ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
- කොට්ටාව, කඩුවෙල සහ කඩවත නගර සංවර්ධන ව්‍යාපෘතිය සහ ඒ ආශ්‍රිත කටයුතු
- නාගරික ප්‍රදේශවල ආර්ථික, සාමාජික සහ භෞතික සංවර්ධනය ඒකාබද්ධව විධිමත් ලෙස ප්‍රවර්ධනය කිරීම හා නියාමන කටයුතු
- නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
- පහත් බිම් ගොඩකිරීම සහ සංවර්ධනයට අදාළ කටයුතු
- නාගරික ප්‍රදේශවල පිහිටි සේවා හා පහසුකම් අඩු ප්‍රදේශ සහ වගුරු බිම් පොදු සැලැස්මකට අනුව සංවර්ධනය කිරීමට අවශ්‍ය මඟපෙන්වීම
- ජාතික භෞතික සැලසුම් හා ප්‍රාදේශීය භෞතික සැලැසුම් පිළියෙල කිරීම
- ඒකාබද්ධ නාගරික සංවර්ධනයන් සහතික කිරීම සඳහා ජාතික භෞතික සැලැසුම් පදනම් කරගෙන සියළු ඉදිකිරීම් කටයුතු මෙහෙයවීම හා නියාමනය කිරීම
- අමාත්‍යාංශයේ විෂය පථයට අයත් ආයතනයන්හි පැවැරී ඇති අනෙකුත් සියළුම විෂයයන්ට අදාළ කටයුතු
- අමාත්‍යාංශයේ විෂය පථයට අයත් ආයතන අධීක්ෂණය

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම පිළිබඳව සිදු කරන ලද නියැදි විගණනයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

ත්‍රිකුණාමල දිස්ත්‍රික් මහසැලැස්ම

ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කෘෂිකර්ම බලශක්ති හා සංචාරක කර්මාන්ත ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් එකී දිස්ත්‍රික්කය සඳහා මහ සැලැස්මක් පිළියෙල කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය කිරීමෙන් තොරව සිංගප්පූරුවේ උපදේශක සමාගමක් තෝරාගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එකී මහ සැලැසුම් වාර්තාව අමාත්‍යාංශයට ඉදිරිපත් කර තිබූ අතර ඒ සඳහා එ.ජ.ඩො. 982,000 ක් හෙවත් රු.මිලියන 90.29 කට සමාන මුදලක් වැයකර තිබුණි. කෙසේවුවද ත්‍රිකුණාමල දිස්ත්‍රික් මහ සැලැස්ම සකස් කිරීමෙන් පසු එය විධිමත් ලෙස අධ්‍යයනය කර සැලැස්මෙන් ඉදිරිපත් කරන සංවර්ධන කාර්යයන් ඉටුකිරීම සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පියවර ගෙන නොතිබුණි.

පොදු ප්‍රවාහන හා බස්සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

යථෝක්ත ව්‍යාපෘතිය සඳහා 2017 වර්ෂය අවසානය වන විට රු.මිලියන 104.04 ක්ද, 2018 වර්ෂයේදී රු.මිලියන

609.79 ක්ද, වශයෙන් එකතුව රු.මිලියන 713.83 ක් වැය කර තිබුණි. පොදු ප්‍රවාහන සේවාව වැඩිදියුණු කිරීම වෙනුවෙන් බස් සේවාව දියුණුකිරීමට ප්‍රමුඛතා බස් මංතීරු හඳුන්වාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 346.93 ක් වැය කර තිබුණි. 2019 ඔක්තෝබර් මාසය වන විට එම වැඩසටහන ක්‍රියාත්මක නොවීම නිසා වැය කළ වියදම නිෂ්ඵල වී තිබුණි.

කොට්ටාව, කඩුවෙල සහ කඩවත නගර සංවර්ධන ව්‍යාපෘතිය

මහ කොළඹ ප්‍රවාහන ජාල වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ උපසංරචකයක් ලෙස කොට්ටාව, කඩුවෙල සහ කඩවත නගර සංවර්ධන ව්‍යාපෘතිය Township Development Component (3K ව්‍යාපෘතිය) ආරම්භ කර තිබුණි. ව්‍යාපෘතියට අදාළ ණය ගිවිසුම අනුව 2015 මැයි 31 දිනෙන් ව්‍යාපෘතිය අවසන් වී තිබුණි. කෙසේවුවද, ව්‍යාපෘතිය යටතේ ඉටුකිරීමට සැලසුම් කළ කාර්යයන් නියමිත කාලසීමාවේදී ඉටුකිරීමට අපොහොසත්වීම මත ණය මුදල් ලබාගැනීමෙන් තොරව භාණ්ඩාගාර ප්‍රතිපාදන මත වර්තමානයේදී මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. ඒ අනුව නියමිත කාලය තුළ ව්‍යාපෘතිය අවසන් නොකිරීම නිසා කාර්ය මණ්ඩලයට මාසයකට ගෙවිය යුතු පරිපාලන වියදම (වැටුප් හා අනෙකුත් වියදම්) දළ වශයෙන් මිලියන 1.4 ක් වූ බැවින්, 2018 වර්ෂය අවසාන වන විට මුළු පරිපාලන වියදම දළ වශයෙන් රු.මිලියන 60.2 වූ අතර ව්‍යාපෘතියේ කටයුතු ඉතාම මන්දගාමී ලෙස ක්‍රියාත්මක වෙමින් පැවැතුණි.

බස්නාහිර කළාපීය මහනගර සැලසුම් ව්‍යාපෘතිය

බස්නාහිර කළාපයේ මහනගර සැලසුම් කිරීමේ ව්‍යාපෘතිය 2015 මැයි මාසයේදී ආරම්භ කරන ලද අතර එය 2017 සැප්තැම්බර් මාසය වන තෙක් පුරා වර්ෂ 02 කට වැඩි කාලයක් ක්‍රියාත්මකව පැවැතුණි. ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මිලියන 330.23 ක් වැයකර තිබුණි. කෙසේවුවද, සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 10.22 ක් වැය කර බස්නාහිර කළාපීය සැලසුම් ව්‍යාපෘතිය නමින් නව ව්‍යාපෘතියක් ලෙස පැරණි ව්‍යාපෘතියම ඉදිරියට කර ගෙන යමින් පැවතුණු අතර එකී ව්‍යාපෘතිය නිම කරන කාල රාමුවක් දක්වා නොතිබුණි. තවද, බස්නාහිර කළාපීය මහනගර සැලසුම් ව්‍යාපෘතියෙන් දක්වන ලද සැලසුම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිළිබඳව විධිමත් ශක්‍යතා අධ්‍යනයක් සිදුකර නොතිබුණි. මහනගර සැලසුම් කිරීමේ ව්‍යාපෘතියෙන් ඉදිරිපත් කර තිබුණු සැලසුම්වලින් කොටසක් පමණක් ක්‍රියාත්මක කිරීමට විවිධ ව්‍යාපෘති කිහිපයක් ආරම්භ කර තිබුණි. කෙසේවුවද, ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව මගින්ද විවිධ කළාපීය සැලසුම් ව්‍යාපෘති සකස් කිරීමේ කාර්යයේ නිරත වී තිබුණි.

විද්‍යා හා තාක්‍ෂණික නගර සංවර්ධන ව්‍යාපෘතිය

විද්‍යා හා තාක්‍ෂණික නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මාලබේ, හෝමාගම, කඩුවෙල අතුරුගිරිය යන නගර සංවර්ධනය කිරීමට යෝජිත වන අතර තෘතීය අධ්‍යාපන කළාපය, විද්‍යාත්මක පර්යේෂණ හා සංවර්ධන කළාපය, තාක්‍ෂණ ව්‍යවසායික කළාපය, නැනෝ තාක්ෂණ, ජෛව තාක්‍ෂණ ප්‍රදර්ශනාගාර කළාපය ලෙස කළාප 05 කට වෙන්කර සංවර්ධනය කිරීමට අපේක්ෂා කර තිබුණි. මෙම ව්‍යාපෘතිය 2017 මාර්තු 01 දින ආරම්භ කර තිබුණු අතර 2023 මාර්තු 01 දින අවසන් කිරීමට නියමිතව තිබුණි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශය හා කොරියානු රජයේ ඉඩම්

යටිතල පහසුකම් හා ප්‍රවාහන අමාත්‍යාංශය සමග අවබෝධතා ගිවිසුමක් 2016 මැයි 24 දින අත්සන් කර තිබුණි. ඉන් අනතුරුව ශක්‍යතා අධ්‍යනයක් කොරියානු රජයේ අමාත්‍යාංශයෙන් ආරම්භ කර තිබුණි. කෙසේවුවද, තාක්‍ෂණ නගර ව්‍යාපෘතිය සදහා පිහිටුවා තිබුණු ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට අනුයුක්ත කාර්ය මණ්ඩලයේ වැටුප් හා දීමනා ලෙස 2017 වර්ෂයේදී රු.මිලියන 25.49 ක්ද, 2018 වර්ෂයේදී රු.මිලියන 40.72 ක්ද වැයකර තිබුණි. මෙම ව්‍යාපෘතිය මගින් විද්‍යා හා තාක්‍ෂණික නගරයේ පොදු පහසුකම් වර්ධනය කිරීම මූලික අරමුණ වී තිබුණි.

ගුවන් නගර හා පරිපාලන නගර ව්‍යාපෘතිය

අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ගුවන් නගර හා පරිපාලන නගර ව්‍යාපෘති දෙකෙහි කාර්යමණ්ඩල වැටුප් හා වෙනත් පුනරාවර්තන වියදම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 80.7 ක් වැයකර තිබුණි. නමුත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමට පෙර එකී ව්‍යාපෘති සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යනයක් හෝ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමෙන් සිදුවන පරිසර බලපෑම සම්බන්ධව තක්සේරු වාර්තා ලබා ගෙන නොතිබුණි. එසේම ව්‍යාපෘති 02 න් සැලැසුම් කළ කාර්යයන් කිරිම සදහා ආයෝජකයින් සොයාගෙන නොතිබුණු බැවින් මෙම ව්‍යාපෘතිද මුළුමනින්ම භාණ්ඩාගාරයේ අරමුදල් මත යැපෙමින් පැවතුණු අතර නිශ්චිත සැලැසුම් නොමැතිව ඉතා මන්දගාමී ලෙස ක්‍රියාත්මකව පැවතුණි.

කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය

කොළඹ ජල ද්‍රෝණියේ පෝෂක ප්‍රදේශයේ ජල ගැලීම් අඩු කිරීම, කොළඹ අගනගර ප්‍රදේශයේ පළාත් පාලන ආයතනවල ධාරිතාවය ශක්තිමත් කිරීම හා කොළඹ නගරය අලංකරනය කිරීම අරමුණු කරගෙන කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 42,031.44 කට සමාන එ.ජ.ඩො. මිලියන 321 ක් වී තිබුණි. ඉන් එ.ජ.ඩො. මිලියන 213 ක් හෙවත් මුළු පිරිවැයෙන් සියයට 66.35 ක් ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සදහා වූ ජාත්‍යන්තර බැංකුව විසින් මුල්‍යනය කරන අතර ඉතිරි ප්‍රමාණය ශ්‍රී ලංකා රජය විසින් සිදු කිරීමට යටත් ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සිදු කළ විගණනයේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

- මෙම ව්‍යාපෘතිය 2012 ජූලි 10 දින ආරම්භ කර 2017 ජූනි 30 දින වන විට නිම කිරිමට නියමිතව තිබුණද, අවස්ථා 02 කදී ව්‍යාපෘතියේ කාලය දීර්ඝ කර තිබුණි. ඒ අනුව 2020 ජූනි 30 දින ව්‍යාපෘතිය නිමවීමට නියමිතව තිබුණි. කෙසේවුවද 2018 වර්ෂය අවසානය වන විට ලෝක බැංකු ණය යටතේ අරමුදල්වලින් රු.මිලියන 14,890.18 කට සමාන එ.ජ.ඩො.මිලියන 103.66 ක් උපයෝජනය කර තිබුණු අතර ඊට අමතරව ශ්‍රී ලංකා රජයේ අරමුදල්වලින් රු.මිලියන 4,891.46 ක් හෙවත් එ.ජ.ඩො.මිලියන 32.86 ක් වැයකර තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මකර වර්ෂ 05 1/2 ක කාලයකට පසු ණය මුදලින් සියයට 48.66 කට ආසන්න ප්‍රමාණයක් උපයෝජනය කර තිබුණි.

- කොළඹ අගනගරය වඩාත් පරිසර හිතකාමි හා අලංකාරය කිරිම

සඳහා ව්‍යාපෘතිය මගින් බේරේවැව සංවර්ධනය කිරීමේ විවිධ කාර්යයන් සඳහා රු.මිලියන 1,552.07 ක් වැය කර තිබුණු අතර භාණ්ඩාගාර අරමුදල්වලින් තවත් රු.මිලියන 470 ක් වැයකර තිබුණි. කෙසේවුවද, බේරේවැව ආශ්‍රිත නිවාස හා හොටල්වල අපද්‍රව්‍ය බේරේවැවට මුසුවීම වැළැක්වීමට ක්‍රියාමාර්ග නොගැනීම නිසා බේරේවැව අවට තද දුර්ගන්ධයක් පැවැතුණි. බේරේ වැවේ සංවර්ධන කටයුතුවලින් සංචාරක ව්‍යාපාරයට සහ ශ්‍රී ලාංකිකයන්ට විවේකය ගතකිරිමට සුදුසු පරිසරයක් සකස්වී නොතිබුණු අතර බේරේ වැව සංවර්ධනය කිරීමේ කාර්යයන් සඳහා වැයකරන ලද මුදලෙන් මහජනයාට ප්‍රතිලාභයක් අත්වී නොතිබුණි.

- තත්කාලීන ගංවතුර පාලන ක්‍රමයක් ස්ථාපිත කිරිම සඳහා වු සැලැස්ම අනුව එ.ජ.ඩො.මිලියන2.6 ක් හෙවත් රු.මිලියන 390 ක වියදම් ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 105.5 ක් ව්‍යාපෘතිය සඳහා වැය කර තිබුණි. වැයකර තිබුණු මුදලින් රු.මිලියන 24.74 ක් එම අංශයේ උපදේශකවරයාගේ පාරිශ්‍රමිකය ලෙස ගෙවා තිබුණු අතර ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතියක් ලබා ගෙන නොතිබුණි. තත්කාලීන ගංවතුර පාලන පද්ධතිය ස්ථාපිත කිරිම සඳහා අවශ්‍යය උපාංග හා උපකරණ ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබු අතර වර්ෂ 02 ක කාලයක් තුළ එම උපදේශකවරයා විසින් මොරටුව විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්‍ෂකයින් සහාය කරගෙන වර්ෂාපතන දත්ත සටහන් කර ගනිමින් කාළගුණික අනාවැකි ලබාගැනීම සඳහා පමණක් කටයුතු කර තිබුණි.

උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය

උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකාවේ සහභාගිත්ව නගර කළාපවල තෝරාගත් නාගරික සේවා සහ පොදු නාගරික ස්ථාන වැඩිදියුණුකිරීමේ අරමුණ ඇතිව ක්‍රියාත්මක වන අතර එකී ව්‍යාපෘතිය යටතේ සහභාගිත්ව නගර කලාප ලෙස මහනුවර නගරය, ගාල්ල නගරය තෝරාගෙන තිබු අතර ව්‍යාපෘතියේ මුලා ගිවිසුම අනුව ව්‍යාපෘතිය ඇස්තමේන්තුගත මුළු වියදම රු.මිලියන 27,507 කට සමාන එ.ජ.ඩො. මිලියන 202 ක මුළු අරමුදල්වලින්, ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීමේ දින සිට වර්ෂ 4 ½ ක් ඉකුත් වු පසු එනම් 2018 දෙසැම්බර් 31 දිනට මුළු වෙන්කිරීමෙන් සියයට 18 ක් නියෝජනය වන රු.මිලියන 5,638.31 කට සමාන එ.ජ.ඩො. මිලියන 36.28 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

සමාලෝචිත වර්ෂයේදී උපාය මාර්ග නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ගාල්ල සහ මහනුවර නගර සංවර්ධන ව්‍යාපෘති සඳහා රු.මිලියන 3,700 ක් අයවැය ඇස්තමේන්තු මගින් ප්රතිපාදන සලසා ගෙන තිබුණි. ඉන් සියයට 64 ක් හෙවත් රු.මිලියන 2,386 ක් පමණක් වියදම් කර තිබුණි. එමෙන්ම යාපනය නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 1,400 ක් අයවැය ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන සලසා තිබුණද, ඉන් සියයට 22 ක් හෙවත් රු.මිලියන 313 ක් පමණක් වියදම් කර තිබුණි.

සමාලෝචිත වර්ෂයේදී ඉටු කිරිමට සැලැසුම් කර තිබුණු කෙරීගෙන යන ව්‍යාපෘති 13 ක භෞතික කාර්යසාධනය සියයට 50 කට වඩා අඩු අගයක් ගෙන තිබුණු අතර ව්‍යාපෘති 33 ක මුලා කාර්යසාධනය සියයකට 50

කට වඩා අඩු අගයක් ගෙන තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය අවසානයට වැඩ අවසන් කළ යුතු ව්‍යාපෘති 3 ක භෞතික කාර්යසාධනය සියයට 62 ක සිට සියයට 90 ක් දක්වා පරාසයක පැවතුණි. කොන්ත්‍රාත්කරුවන්ගේ මූල්‍යමය ශක්‍යතාවය ඇගයීමකින් තොරව කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම, කොන්ත්‍රාත්කරුවන් විසින් ප්‍රමාණවත් නොවන කාර්මික නිලධාරින් සංඛ්‍යාවක් සේවයේ යෙදවීම, සැලැසුම් උපදේශකවරුන් පිළියෙල කළ සැලසුම්වල පැවති දෝෂ, ව්‍යාපෘතිය මගින් උපදෙස් ලබාදීමේ ප්‍රමාදයන් යනාදී අඩුපාඩු කොන්ත්‍රාත් වැඩවල දුර්වල කාර්යසාධනය කෙරෙහි සෘජුව බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට රු.මිලියන 6,100 ක ප්‍රතිපාදන සලසා තිබුණු ව්‍යාපෘතිවලින් ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 1,333 ක් වූ ව්‍යාපෘති 26 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. එම වටිනාකම අයවැයගත ඇස්තමේන්තු වටිනාකමින් සියයට 22 ක් වී තිබුණි.

යාපනය නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කළ වැඩසටහන් 03 කට අදාළ උපදේශන සේවා වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 144 ක ප්‍රතිපාදන සලසා තිබුණි ද, වර්ෂය අවසාන වන විට එම උපදේශන සේවා ක්‍රියාත්මක කර නොතිබුණි. එසේම සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කළ යාපනය අර්ධද්වීපයේ සංවර්ධන වැඩ සටහනක් (Contract Facilitate the proposed developments Intervention in Jaffna peinsula) සඳහා රු.මිලියන 5.8 ක ප්‍රතිපාදන සලසා තිබුණද, එම වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි.

බස්නාහිර කලාපීය සමුද්‍රිය නගර සංවර්ධන ව්‍යාපෘතිය

මීගමුව වෙරළ තීරයේ සිට කළුතර කැලිඩෝ වෙරළ තීරය දක්වා මුහුදු වෙරළ තීරය කොටස් 03 කට වෙන්කර කොල්ලුපිටියේ සිට දෙහිවල දක්වා විනෝදාස්වාද මුහුදු තීරයක් ලෙසද, කොළඹ වරාය ආශ්‍රිත ක්‍රියාකාරකම් සංවර්ධනය සඳහා බිලුමැන්ඩල් කිඹුලා ඇල ප්‍රදේශයද , වැලිසර නාවික හමුදා මූලස්ථානය පිහිටි ප්‍රදේශය සැපයුම් හා සේවා ජාලයක් බිහිකිරිමේ අරමුණින් විශේෂ ව්‍යාපෘතියක් 2017 වර්ෂයේ ආරම්භ කර තිබුණි. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් 2017 වර්ෂයේදී සහ 2018 වර්ෂයේදී රු.මිලියන 47.2 ක් වැයකර තිබුණද, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ශක්‍යතා අධ්‍යනයක් හෝ ව්‍යපෘතිය ක්‍රියාත්මක කිරිම මගින් සිදුවන පරිසරයට වන බලපෑම තක්සේරු කිරිමේ වාර්තාවක් ලබාගැනීමෙන් තොරව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරමින් පැවතුණි.

නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය

නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ 2013 වර්ෂයේ සිට 2018 වර්ෂය අවසානය වන විට නිවාස ව්‍යාපෘති 16 ක් ක්‍රියාත්මක කර නිවාස ඒකක 8,113 ක් සම්පූර්ණයෙන් නිමකර අඩු ආදායම්ලාභී පවුල් පදිංචි කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ඉදිකරමින් පැවතුනු නිවාස ව්‍යාපෘති 02 ක සහ අළුත්ම නිවාස ව්‍යාපෘති 12 ක් මඟින් තවත් නිවාස ඒකක 7,395 ක් ඉදිකරමින් පැවතුණි. මෙම ව්‍යාපෘතිය යටතේ අඩු ආදායම්ලාභී පැල්පත්වාසීන් පදිංචිකරුවන් හට නිවාස ඒකක 68,000 ක් ඉදිකර පදිංචි කිරිමට සැලසුම් කර තිබුණි.

නාගරික සංවර්ධනය සැලැසුම් පිළියෙල කිරිම

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 3 වගන්තිය අනුව

දිවයිනේ නාගරික සංවර්ධන කළ යුතු කළාප හඳුනාගැනීම සහ එම කළාප සඳහා සංවර්ධන සැලැසුම් පිළියෙල කිරීම කළ යුතු වේ. කෙසේවුවද, සමාලෝචිත වර්ෂය අවසානයට නාගරික සංවර්ධන කළාප 243 ක් හඳුනාගෙන තිබුණද, සමාලෝචිත වර්ෂයේ අවසාන වන විට එයින් සංවර්ධන සැලැසුම් සියයකට වඩා අඩු කළාපයන් සඳහා පමණක් සංවර්ධන සැලැසුම් පිළියෙල කර තිබුණි.

කර්මාන්ත හා වාණිජ කටයුතු	
	කර්මාන්තපුර සංවර්ධනය
	නියාමන ක්‍රමවේදයන් ක්‍රියාත්මක නොකිරිම
	අර්තාපල් අලෙවි කිරිමට විධිමත් වැඩපිළිවෙලක් නොතිබීම
	කොන්ත්‍රාත් ගිවිසුම්වල ලියාපදිංචිය අළුත් නොකිරීම
	සමාගම්වල මූල්‍ය වාර්තා ලියාපදිංචි නොකිරීමෙන් ආදායම් අහිමිවීම
	සමාගම් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය පරිගණක ගත කිරීමේ ව්‍යාපෘතිය අගහැර දැමීම
	ජාත්‍යන්තරව වෙළෙඳ ලකුණු ලියාපදිංචි කිරීම

කර්මාන්ත හා වාණිජ කටයුතු

ගෝලීය වශයන් තරඟකාරී සහ වාසිදායක ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීම මෙම ක්ෂේත්‍රයෙන් අපේක්ෂා කරන ප්‍රතිඵලය වී ඇත. එම ප්‍රතිඵලය අත්පත් කර ගැනීම සඳහා කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය, දෙපාර්තමේන්තු 09 ක් ව්‍යවස්ථාපිත මණ්ඩල 07 ක් හා රාජ්‍ය ව්‍යාපාර 20 ක් විසින් පහත සඳහන් කාර්යභාරයන් ඉටු කළ යුතුව තිබුණි.

- කර්මාන්ත හා වාණිජ විෂයට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසුවිපරම් කිරීම හා ඇගැයීම
- කර්මාන්ත ප්‍රවර්ධනය සහ සංවර්ධනය
- වෙළෙඳ ප්‍රදර්ශන පැවැත්වීම
- දේශීය වෙළෙඳපොල තුළ පාරිභෝගික භාණ්ඩ ගුණාත්මක මට්ටමෙන් හා හිඟයකින් තොරව සාධාරණ මිලකට සැපයීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම
- 1949 අංක 6 දරන උකස් පනතෙහි 114 වැනි වගන්තිය යටතේ ණය දෙන ආයතන අනුමත කිරීම
- පාරිභෝගික භාණ්ඩවලට අදාළ වන ජාතික මිල ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාවන්හි යෙදවීම
- පාරිභෝගික ආරක්ෂණය සඳහා ක්‍රියාමාර්ග ගැනීම
- ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත නිෂ්පාදනය සඳහා මෝස්තර සංවර්ධනය හා ප්‍රචලිත කිරීම
- බුද්ධිමය දේපල පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය පරිපාලනය කිරීමට අදාළ කාර්යයන්හි ප්‍රකාශන අයිතිය හා ජගත් බුද්ධිමය දේපල කාර්යාලයෙහි ප්‍රකාශන අයිතිය සම්බන්ධ කටයුතු

ඉහත සඳහන් කාර්යභාරයයන් ඉටු කිරීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත සඳහන් කර ඇත.

කර්මාන්තපුර සංවර්ධනය

සංවර්ධිත ප්‍රදේශවලට පමණක් සීමාවී තිබුණු සංවර්ධනය ප්‍රාදේශීය මට්ටමින් ව්‍යාප්ත කිරීමටත්, එමගින් ජාතික ආදායමට කර්මාන්ත අංශයෙන් වන දායකත්වය ඉහළ නැංවීමටත් කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයින් නැවත පදිංචි කිරීම, සමූපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ කර්මාන්ත සංවර්ධන වැඩ සටහනින් දායකත්වය සපයනු ලබයි. මෙම කාර්යයේදී ප්‍රාදේශීය වශයෙන් කර්මාන්ත ක්ෂේත්‍රයේ ආයෝජනය දිරි ගැන්වීම සහ අවශ්‍ය යටිතල පහසුකම් සලසාදීම වෙනුවෙන් 2018 වර්ෂයේදී අමාත්‍යාංශයේ කර්මාන්ත සංවර්ධන අංශය මගින් කර්මාන්තපුර 18 ක ව්‍යාපෘති 33 ක් වෙනුවෙන් රු.මිලියන 328.76 ක් වැයකර තිබුණි. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව කර්මාන්තපුර 02 ක යටිතල පහසුකම් සංවර්ධනය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී සලසා තිබුණු මුළු ප්‍රතිපාදනය රු.මිලියන 26.11 කින් රු.මිලියන 25.85 ක් වැයකර තිබුණි. කිසිදු භෞතික ප්‍රගතියක් අත්කරගෙන නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණු වටිනාකම රු.මිලියන 165.25 ක් වූ ව්‍යාපෘති 13 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිම කර නොතිබුණි. තවද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් නොවූ ව්‍යාපෘති 02 ක් වෙනුවෙන් රු.මිලියන 11.37 ක් වැයකර තිබුණු

අතර, ව්‍යාපෘති 07 ක් වෙනුවෙන් ඇස්තමේන්තුගත මුදල ඉක්මවා රු.මිලියන 21.82 ක් වැයකර තිබුණි.

නියාමන ක්‍රමවේදයන් ක්‍රියාත්මක නොකිරිම

2013 අප්‍රේල් 26 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව සමූපකාර ග්‍රාමීය බැංකු, ග්‍රාමීය බැංකු සංගම්, සණස සමිති, සණස සංගම් සහ වෙනත් මූල්‍ය සමුපකාර සමිතිවල කටයුතු නියාමනය කිරීම පිණිස විශේෂිත නියාමන ඒකකයක් පිහිටුවිය යුතු බවට තීරණය කර තිබුණි. ඒ අනුව පිහිටුවනු ලැබූ නියාමන ඒකකයේ කටයුතු වෙනුවෙන් 2013 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා රු.මිලියන 20.99 ක් සමූපකාර සංවර්ධන කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් වැය කර තිබුණි. එසේ වුවද, එම ඒකකය ආරම්භ කර වර්ෂ 06 ක කාලයක් ගත වී තිබුණත්, එම නියාමන කටයුතු සම්බන්ධයෙන් විධිමත් වැඩපිළිවෙලක් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කර නොතිබුණි. තවද, දෙපාර්තමේන්තුව විසින් ග්‍රාමීය බැංකු ක්ෂේත්‍රය හැර අනෙකුත් මූල්‍ය සේවා සමිති සහ සණස සමිති සඳහා නියාමන ක්‍රමවේදය ක්‍රියාත්මක කර නොතිබුණි .

අර්තාපල් අලෙවි කිරීමට විධිමත් වැඩපිළිවෙලක් නොතිබීම

2018 ඔක්තෝබර් 16 දින පැවැති ජීවන වියදම් කමිටුවේ නිර්දේශ මත ඌව පළාතේ ගොවීන්ගේ අර්තාපල් කිලෝවක් රු.92 ක සහතික මිලකට මිලදී ගැනීමට මහා භාණ්ඩාගාරය විසින් රු.මිලියන 150 ක් වාරික 02 කින් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සීමාසහිත ශ්‍රී ලංකා පාරිභෝගික සමුපකාර සමිති සංගමය වෙත ලබාදීමට අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේදී තීරණය කර තිබුණි. ඒ අනුව ජනාධිපති ලේකම් කාර්යාලයේ වැය ශීර්ෂය යටතේ රු.මිලියන 75 ක ප්‍රතිපාදන දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබුණි. 2018 නොවැම්බර් 29 දින එම මුදල් සංගමය වෙත ලබා දී තිබුණි. එසේ ලබා දී තිබුණු මුදල් සංගමයෙන් ආපසු ලබා ගෙන මහා භාණ්ඩාගාරය පියවිය යුතු බවත් ඒ සම්බන්ධයෙන් වූ සියළුම කටයුතු සම්බන්ධීකරණය හා අධීක්ෂණය දෙපාර්තමේන්තුව වෙත පවරන බව කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශ ලේකම්වරයා විසින් දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී තිබුණි. එසේ වුවත්, සංගමයට අර්තාපල් අලෙවි කිරීමට විධිමත් වැඩපිළිවෙලක් නොතිබීම හා දෙපාර්තමේන්තුව විසින් ප්‍රමාණවත් අධීක්ෂණයක් සිදු කර නොතිබීම නිසා රු.මිලියන 85.82 ක්වූ අර්තාපල් කිලෝ 932,868 ක් නරක්වී තිබුණි.

කොන්ත්‍රාත් ගිවිසුම්වල ලියාපදිංචිය අළුත් නොකිරිම

1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 5(1), 5(2) හා 2(1) උප වගන්ති ප්‍රකාරව සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ප්‍රකාශිතවම පවරන ලද නැතහොත් නියම කරන ලද බලය ක්‍රියාත්මක කරමින් කොන්ත්‍රාත් ගිවිසුම්වල ඇතුළත් වටිනාකම රු.මිලියන 5.00 ක් ඉක්මවන්නා වූ සෑම පොදු කොන්ත්‍රාත් ගිවිසුමක්ම මෙම පනතේ විධිවිධානවලට අනුව ලියාපදිංචි කළ යුතුව තිබුණි. ප්‍රසම්පාදනයන් සඳහා ඇතුළත්වීමට අදහස් කර ඇති කොන්ත්‍රාත්කරුවන් 24,345 දෙනෙකු සමාලෝචිත වර්ෂය තුළ ලියාපදිංචි වී තිබුණද, කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමෙන් අනතුරුව ගිවිසුම් 398 ක් පමණක් ලියාපදිංචි කර තිබුණි. එම පනතේ 1 හා 3 වගන්ති ප්‍රකාරව ලියාපදිංචියෙන් වර්ෂයක් ඉක්මවන ලද

කොන්ත්‍රාත්වල ලියාපදිංචිය අලුත් කිරීම සඳහා ක්‍රියාකළ යුතුව තිබුණත්, ලියාපදිංචිය අලුත් කිරීම් කරන ලද ගිවිසුම් කිසිවක් නොතිබුණි.

සමාගම් පනතේ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 131 (1) හා (2) වගන්ති ප්‍රකාරව සෑම සමාගමක්ම ලියාපදිංචි වී වර්ෂ 1½ කින් පසු වාර්ෂික වාර්තා ගොනු කළ යුතුය. 2007 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා ලියාපදිංචි කර ඇති මුළු සමාගම් සංඛ්‍යාව 83,225 ක් වන අතර එයින් සමාලෝචිත වර්ෂයේදී සමාගම් 18,054 ක් 2018 වර්ෂයට අදාළව වාර්ෂික වාර්තා ගොනු කර තිබුණි. 2010 වර්ෂයේදී වාර්ෂික වාර්තා ගොනු කිරීම පැහැර හරින ලද සමාගම් සංඛ්‍යාව 11,411 ක් වූ අතර එය 2018 වර්ෂය වන විට 65,171 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට අයවීමට ඇති වාර්ෂික වාර්තා ආදායම රු.මිලියන 1,974.60 ක් වි තිබුණි.

සමාගම් පනතේ 170(1) වගන්තිය අනුව පෞද්ගලික නොවන සෑම සමාගමක් විසින්ම සමාගමේ මූල්‍ය ප්‍රකාශ, විගණකවරයාගේ වාර්තාවක්ද සමඟ ලියාපදිංචිය සඳහා සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් වන බවට වග බලා ගත යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය වාර්තා ලියාපදිංචි කළ යුතු සමාගම් සංඛ්‍යාව 6,893 ක් පැවැතියද, එයින් සමාගම් 2,110 ක් පමණක් මූල්‍ය වාර්තා ලියාපදිංචි කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය සඳහා පමණක් ලියාපදිංචි සමාගම් 4,783 ක් සඳහා ලැබිය යුතු රු.මිලියන 9.57 ක ආදායම් අහිමි වී තිබුණි.

සමිති ලියාපදිංචි කිරීම

2005 අංක 11 දරන සමිති ආඥා පනත අනුව ලියාපදිංචි සමිති 12,307 ක් අතරින් සමාලෝචිත වර්ෂය සඳහා සමිති 180 ක් පමණක් විසින් වාර්ෂික වාර්තා ගොනු කර තිබුණි. ඒ අනුව 2018 වර්ෂයට පමණක් හිඟ සමිති ආදායම රු.මිලියන 12.12 ක් වී තිබුණි.

බදු ආදායම අයකර ගැනීම

සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 1500 ක් මූලික බදු ආදායම් වශයෙන් ඇස්තමේන්තු කර තිබුණි. එම ආදායම් සංකේතය යටතේ වන කිසිදු ආදායමක් සමාලෝචිත වර්ෂයේදී රැස් කර නොතිබුණි. මෙම බදු අයකර ගැනීම සඳහා ගැසට් පත්‍රයේ නිවේදනයක් පළ කර ආදායම් රැස්කළ යුතුව තිබුණත්, එසේ නොකිරීම නිසා පැන නැගුණු ගැටළුකාරී තත්ත්වය මඟහරවා ගැනීම සඳහා ආදායම් රැස්කිරීම අත්හිටුවා තිබුණි.

සමාගම් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය පරිගණක ගත කිරීම

සමාගම් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය පරිගණකගත කිරීමේ මෘදුකාංගයක් ස්ථාපිත කිරීම සඳහා වූ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණි. එම ව්‍යාපෘතිය මාස 9 කින් නිම කිරීමේ අපේක්ෂාවෙන් රු.මිලියන 57 ක වටිනාකමකට කොන්ත්‍රාත්තුව 2017 මැයි 30 දින කොන්ත්‍රාත්කරුවෙකු වෙත පිරිනමා තිබුණි. මෙම කොන්ත්‍රාත්තුවේ කාලය වාර දෙකකදී දීර්ඝ කර තිබුණු අතර මාස 25 කාලයක් ගත වී තිබුණද, 2019 අගෝස්තු 31 දින වන විටත් කොන්ත්‍රාත්තුව අවසන් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට පළමු අදියර අවසන් කිරීම සඳහා වූ රු.මිලියන 1.52 ක පළමු ගෙවීම පමණක් සිදු කර තිබුණි. මෙම ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය පරිගණක ගත කිරීමේ ක්‍රියාවලිය සඳහා 2014 වර්ෂයේදිද, කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණු අතර ඒ සඳහා රු.මිලියන 13.27 ක් ගෙවා තිබුණු අතර, පසුව ව්‍යාපෘතිය අත්හැර තිබුණි.

සමාගම් අරමුදල් ආයෝජනය කිරීම

2007 වර්ෂයේදී සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව විසින් සමාගම් අරමුදලින් රු.මිලියන 90.27 ක් වැය කර පාඩු ලබමින් තිබුණු සමාගමක කොටස් ප්‍රාග්ධනයේ ආයෝජනය කර තිබුණි. මෙම ආයෝජනය සඳහා 2007 මාර්තු 29 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයකින් අනුමැතිය ලබා දී තිබුණු අතර අයෝජනයට අවශ්‍ය මුදල්, අලෙවි සංවර්ධන හා සමුපකාර අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ප්‍රේෂණය කර තිබුණි. මෙම ආයෝජනයේ කිසිදු ප්‍රතිලාභයක් සමාගම් අරමුදලට ආයෝජිත දිනයේ සිට 2019 අගෝස්තු 30 දින වන විටත් ලැබී නොතිබුණු අතර අයෝජනය කරන ලද වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වත්කම් ලෙස දක්වා ඇත. 2013 ජනවාරි 02 දින දරන අමාත්‍ය මණ්ඩල සංදේශයක් මෙම සමාගම බුන්වත් බව සඳහන් කර ඉදිරිපත් කර තිබුණි. මෙම ආයෝජිත මුදල හෝ ඊට ලැබිය යුතු ප්‍රතිලාභ ලබා ගැනීමට මේ දක්වාම කටයුතු කර නොතිබුණි.

ජාත්‍යන්තරව වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීම

ජාත්‍යන්තරව වෙළඳ ලකුණු ලියාපදිංචිය කිරීම සඳහා වූ මැඩ්රිඩ් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට රේඛීය අමාත්‍යාංශයෙන් ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපල කාර්යාලය වෙත 2016 වර්ෂයේ සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා රු.මිලියන 93.00 ක ප්‍රතිපාදන ලැබී තිබුණි. ඉන් රු.මිලියන 79.43 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. 2016 දෙසැම්බර් 30 දින ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සර්වර් යන්ත්‍රයක් මිලදී ගැනීමට, පද්ධතිය ස්ථාපිත කිරීමට හා නඩත්තු කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 32.5 ක් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනය වෙත ගෙවා තිබුණි. එදිනම දෙපාර්ශවය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණ අතර ගිවිසුමේ 4,3 වගන්තියට අනුව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනය සම්පූර්ණ මිලදී ගැනීමේ ක්‍රියාවලිය සඳහා වගකිවයුතු බවත් ගිවිසුම් ගත දින සිට මාස 06 ක් ඇතුළත එම කාර්යය සිදු කළ යුතු බවත් දක්වා තිබුණි. එහෙත් 2019 මැයි මාසය අවසන් වන විටත් සර්වර් යන්ත්‍රය සපයා ගැනීමට කටයුතු කර නොතිබුණි.

යෝජිත භෝජනාගාරයේ අභ්‍යන්තර අලංකාර කටයුතු සිදු කිරීම

පේෂකර්ම හා ඇඟළුම් ආයතනය සඳහා වන භෝජනාගාරයේ යෝජිත අභ්‍යන්තර අලංකාර කටයුතු කිරීම සඳහා රු.මිලියන 6.00 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණි. ඒ වෙනුවෙන් 2017 දෙසැම්බර් මාසයේදී රු.මිලියන 6.41 ක ප්‍රතිපාදන භාණ්ඩාගාරය විසින් ලබා දී තිබුණි. එම කටයුතු සඳහා 2017 නොවැම්බර් 28 දින රු.මිලියව 8.02 ක පිරිවැයකට ලංසුව ඉදිරිපත් කළ කොන්ත්‍රාත්කරුවකු වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. මෙම කොන්ත්‍රාත්තුව සඳහා 2017 දෙසැම්බර් 06 දින සිට 2018 මාර්තු 06 දක්වා කාලයට වලංගු වූ සුරක්ෂණයක් මත 2018 ජනවාරි 03 දින රු.මිලියන 1.88 ක අත්තිකාරම් පේෂකර්ම හා ඇඟළුම් ආයතනය විසින් කොන්ත්‍රාත්කරු වෙත ලබා දී තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එම කොන්ත්‍රාත්තුව අවසන් කර නොතිබුණි. එමෙන්ම අත්තිකාරම් සුරක්ෂණයේ කාලය ඉකුත්ව තිබුණද එය අලුත් කිරීමට කටයුතු කර නොතිබුණු අතර

කොන්ත්‍රාත්තුවේ නිම කරන ලද වැඩ පිළිබඳ ඉංජිනේරු වාර්තාවක් හෝ ලබාගෙන නොතිබුණි. 2018 සැප්තැම්බර් 09 දින සිට දින 60 ක් ඇතුළත මෙම කොන්ත්‍රාත්තුවේ වැඩ අවසන් කළ යුතු බවට සඳහන් කර ගිවිසුමකට එළඹ තිබුණද, ගිවිසුම අලුත් කිරීමටද කටයුතු කර නොතිබුණි.

කුලී පදනම මත ගොඩනැගිල්ලක් ලබා ගැනීම

මහල් 04 ක නව ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා පැරණි ගොඩනැගිල්ලේ කොටසක් කඩා ඉවත් කිරීමට සිදුවන බැවින් ඒ සඳහා කුලී පදනම මත මාසික වාරිකය රු.80,000 ක් වූ ගොඩනැගිල්ලක් 2017 ජුනි 01 දින සිට වර්ෂයක කාලයක් සඳහා ලබා ගෙන තිබුණි. 2019 අගෝස්තු 31 දින වන විට නව ගොඩනැගිල්ල ඉදිකිරීම් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කර නොතිබුණි. කුලී පදනම මත ලබාගත් ගොඩනැගිල්ල වර්ෂයක කාලයක් තුළ වසා දමා තිබුණි. මේ සඳහා කුලී වශයෙන් රු.960,000 ක්ද, විදුලිය වෙනුවෙන් රු.8,353 ක් ද ගෙවා තිබුණි.

නිවාස හා ඉදිකිරීම් කටයුතු

ආදර්ශ ගම්මාන වැඩසටහන

බෝගස්වැව විශේෂ නිවාස ව්‍යාපෘතිය

වීර සුමිතුරු නිවාස වැඩසටහන

ග්‍රාම ශක්ති උදාගම්මාන නිවාස වැඩසටහන

විසිරි නිවාස ව්‍යාපෘතිය

නිවාස හා ඉදිකිරීම් කටයුතු

සියලුම පුරවැසියන්ට යහපත් ජීවන තත්ත්වයක් සහතික කිරීම අරමුණු කර ගනිමින් සෑම පවුලක් සඳහාම යෝග්‍ය නිවාස පහසුකම් සැපයීම මෙම අංශයෙන් අපේක්ෂා කර තිබුණු ප්‍රතිඵලය වී තිබුණි. එම ප්‍රතිඵලය අත්පත් කර ගැනීම සඳහා නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය, දෙපාර්තමේන්තු 02 ක් හා ව්‍යවස්ථාපිත මණ්ඩල/ ආයතන 8 ක් විසින් පහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි.

- නිවාස හා ඉදිකිරීම් පිළිබඳ රජයේ දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතනයන් හා සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගැයීම
- රජයේ නිල නිවාස සහ අනෙකුත් ගොඩනැගිලි සඳහා ප්‍රමිති හා ප්‍රතිමාන නියම කිරීම
- අඩු ආදායම්ලාභීන් සහ විශේෂිත ප්‍රජා කණ්ඩායම් ද ඇතුළුව මහාජනතාවගේ නිවාස අවශ්‍යතාවය සපුරාලීම සඳහා නිවාස යෝජනා ක්‍රම සහ නිවාස මූල්‍යාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- පරිසර හිතකාමී ලෙස වියදමට සරිලන ප්‍රතිලාභ ගෙන දෙන නිවාස තැනීමේ තාක්ෂණ ක්‍රම පිළිබඳව ග්‍රාමීය ජනතාවට මගපෙන්වීම
- ප්‍රධාන වශයෙන් රජයේ ආයතනවලට යාන්ත්‍රික ඉංජිනේරු සේවා සැපයීම
- අදාළ නීති, රීති හා ප්‍රමිතීන්වලට අනුව ඉදිකිරීම් කර්මාන්ත ක්ෂේත්‍රයේ කටයුතු නියාමනය, ලියාපදිංචි කිරීම, විධිමත් කිරීම සහ ප්‍රමිතිකරණය
- ඉදිකිරීම් කර්මාන්තයට උපදේශන හා නියාමන සේවා සැපයීම සහ ඉදිකිරීම් උපකරණ ක්‍රියාත්මක කරවීම හා නඩත්තුව පිළිබඳ පුහුණුව
- සභාධිපත්‍ය දේපළ කළමනාකරණය සහ නියාමන කටයුතු
- මහජන සභාධිපත්‍ය ප්‍රතිසංස්කරණය කිරීම සහ කාර්යක්ෂම සහ කඩිනම් ලෙස නිවාසවල අයිතිය පැවරීම

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම පිළිබඳව සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේ දී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

ආදර්ශ ගම්මාන වැඩසටහන

මෙම වැඩසටහන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කර තිබුණි. ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 937 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, ඉන් රු.මිලියන 581 ක් පමණක් උපයෝජනය කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී නිවාස 20,375 ක් ඉදිකිරීමට අපේක්ෂා කර තිබුණත්, වර්ෂය අවසන් වන විට එම ඉලක්කයෙන් සියයට 08 ක් හෙවත් නිවාස 1,555 ක් සම්පූර්ණ වශයෙන් හා වහල දක්වා පමණක් ඉදිකර තිබුණි. මේ අනුව වැඩසටහනේ කාර්යසාධනය පහළ මට්ටමක පැවැතුණි.

මෙම වැඩසටහන යටතේ 2017 වර්ෂයේදී නිම කිරීමට නොහැකි වී 2018 වර්ෂයට අවිච්ඡේද වී තිබුණු නිවාස ඉදිකිරීම සඳහා රු.මිලියන 632 ක වියදම් ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ඒ සඳහා රු.මිලියන 486 ක් වැය කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය සියයට 76 ක් වී තිබුණි. ව්‍යාපෘතියේ ඉලක්කගත නිවාස 4,960 කින් නිවාස 3,099 ක් පමණක් නිමකර තිබුණි. ව්‍යාපෘතිය නිම කළ යුතුව තිබුණු දිනය 2018

සැප්තැම්බර් 30 දින වුවත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට මාස 03 ක කාලයක් ඉක්මවා තිබුණත්, ව්‍යාපෘතිය නිම කිරීමට අපොහොසත් වී තිබුණි.

බෝගස්වැව විශේෂ නිවාස ව්‍යාපෘතිය

මෙම නිවාස ව්‍යාපෘතිය ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කර තිබූ අතර, නිවාස 1,566 ක් ඉදිකිරීම සඳහා රු.මිලියන 449 ක වියදමක් ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.මිලියන 280 ක් වැය කර නිවාස 978 ක් වහලය දක්වා හා සම්පූර්ණ වශයෙන් නිම කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී නිවාස 1,566 ක් ඉදිකර නිම කිරීමට අපේක්ෂා කර තිබුණත්, වර්ෂය අවසාන වන විට ඉන් සියයට 62 ක් හෙවත් නිවාස 978 ක් පමණක් නිම කර තිබුණි.

විරු සුමිතුරු නිවාස වැඩසටහන

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හා රණවිරු සේවා අධිකාරිය සමග ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබන මෙම ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 116 ක වියදම් ඇස්තමේන්තුවක් මත නිවාස 550 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂයේ දී ඒ සඳහා රු.මිලියන 113 ක් වැය කර නිවාස 405 ක් වහල දක්වා සහ සම්පූර්ණ වශයෙන් ඉදිකර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉදිකර නිම කළ යුතුව තිබුණු නිවාස ගණනින් සියයට 74 ක පමණ ප්‍රමාණයක් ඉදිකිරීම නිම කර තිබුණි.

ග්‍රාම ශක්ති උදාගම්මාන නිවාස වැඩසටහන (නව)

මෙම ව්‍යාපෘතිය ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කර තිබුණි. ව්‍යාපෘතිය මගින් සමාලෝචිත වර්ෂය අවසන් වන විට නිවාස 1,200 ක් ඉදිකර නිම කිරීම සඳහා රු.මිලියන 100 ක වියදමක් ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී අමතර ප්‍රතිපාදන ඇතුළුව ඒ සඳහා රු.මිලියන 234 ක් වැය කර වහල දක්වා සහ සම්පූර්ණ වශයෙන් නිවාස 255 ක් ඉදිකර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉලක්කගත නිවාස සංඛ්‍යාවෙන් සියයට 21 ක නිවාස ප්‍රමාණයක් පමණක් නිම කර තිබුණි.

විසිරි නිවාස ව්‍යාපෘතිය (නව)

මෙම නිවාස ව්‍යාපෘතිය ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කර තිබුණි. වර්ෂයේ ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 709 ක් වූ අතර 2018 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 637 ක් වැය කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය සියයට 90 ක් වී තිබුණි. වර්ෂයේ ඉලක්කගත නිවාස ඉදිකිරීම් සංඛ්‍යාව වූ නිවාස 7,000 කින් නිවාස 4,879 ක් වහල දක්වා සහ සම්පූර්ණ වශයෙන් නිමකර තිබුණි. එම නිවාස සංඛ්‍යාව ඉලක්කගත නිවාස සංඛ්‍යාවෙන් සියයට 70 ක් වී තිබුණි.

ප්‍රවාහනය

අධිවේගී මාර්ගවල ධාවනයට සුදුසු බස්රථ නොතිබීම

ටෙන්ඩර් කිරීමෙන් තොරව නිත්‍ය සේවා බලපත්‍ර නිකුත් කිරීම

කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය

ධාවනය කළ දුම්රිය වාර ගණන අඩුවීම

දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම් පරිහරණය දුර්වලවීම

භාණ්ඩ ප්‍රවාහනයෙන් ලබන ආදායම අඩුවීම

දුම්රිය මැදිරි පුනරුත්ථාපනය කිරීමේ පමාව

මගී ප්‍රවාහනය සඳහා බස්රථ යෙදවීම අඩුවීම

ප්‍රවාහනය.

ජනතාවගේ ජීවන තත්ත්වයන් නඟා සිටුවීම උදෙසා නව්‍යතම තාක්ෂණික ක්‍රමෝපායයන් භාවිතා කරමින් ඉතා උසස් ප්‍රවාහන, යටිතල පහසුකම් ක්‍රියාත්මක කිරීම, සංවර්ධනය සහ තිරසාරව පවත්වාගෙන යාම ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ කාර්යභාරය වී තිබුණි. එම ප්‍රතිඵලය අත්පත් කර ගැනීම සඳහා අමාත්‍යාංශය හා ඒ යටතේ දෙපාර්තමේන්තු 02 ක් හා ව්‍යවස්ථාපිත මණ්ඩල / ආයතන 07 ක් විසින් පහත සඳහන් කාර්යභාරයන් ඉටුකළ යුතුව තිබුණි.

- නව තාක්ෂණය යොදා ගනිමින් ඒකාබද්ධ මඟී සහ භාණ්ඩ දුම්රිය ප්‍රවාහන සේවා කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම සහ දුම්රිය යටිතල පහසුකම් සංවර්ධනය හා දුම්රිය සේවා සැපයීම.
- මඟී තොටුපළ සේවාවන් සැපයීම.
- ආරක්ෂාකාරී සහ විශ්වාසනීය මඟී ප්‍රවාහන සේවාවක් සැපයීම.
- පරිසර හිතකාමී ප්‍රවාහන පද්ධතියක් හඳුන්වා දීම.
- පෞද්ගලික මඟී ප්‍රවාහන සේවාවන් නියාමනය කිරීම.
- නව දුම්රිය මාර්ග ඉදිකිරීමට අදාළව ඉඩම් පවරා ගැනීම සහ යටිතල පහසුකම් සංවර්ධනය ඇතුළු සියළු කටයුතු.
- මෝටර් රථ වාහන ලියාපදිංචි කිරීම සහ බලපත්‍ර නිකුත් කිරීම.
- රියදුරු බලපත්‍ර නිකුත් කිරීම.
- මෝටර් රථ වාහනවලට අදාළ නීතිරීති සහ මාර්ගෝපදේශ නිකුත් කිරීම සහ නියාමනය කිරීම.
- ගුවන් තොටුපළවල් සංවර්ධනය සහ නියාමන කටයුතු සිදු කිරීම.
- ගුවන් තොටුපළ මඟින් සැලසෙන සේවාවන්වල ප්‍රගතිය, ගාස්තු සහ ගුණාත්මකභාවය නියාමනය කිරීම.
- ජාත්‍යන්තර ගුවන් ගමන් පුළුල් කිරීම සඳහා අනෙකුත් රටවල් සමඟ ගිවිසුම්වලට එළඹීම ඇතුළුව අනෙකුත් අවශ්‍ය පියවර ගැනීම.
- ශ්‍රී ලංකාවේ ගුවන් තොටුපළවල් විදේශ රටවල් විසින් භාවිතා කිරීමට අදාළ ප්‍රවර්ධනය හා නියාමනය.
- පුද්ගලික ගුවන් ගමන් සේවා අධීක්ෂණය සහ නියාමනය.
- ගුවන්යානා ලියාපදිංචි කිරීම.

අමාත්‍යාංශය හා ඒ යටතේ වන ආයතන විසින් ඉහත සඳහන් කාර්යභාරයන් ඉටු කිරීම සම්බන්ධයෙන් සිදු කළ විගණනයේ දී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දැක්වේ.

මාතර - බෙලිඅත්ත, කතරගම නව දුම්රිය මාර්ගය ඉදිකිරීම.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය විසින් විදේශාධාර ව්‍යාපෘතියක් යටතේ රු.මිලියන 36,166 ක ඇස්තමේන්තුගත පිරිවැයක් මත ඉටුකිරීමට මාතර - කතරගම දුම්රිය මාර්ග ව්‍යාපෘතිය 2013 අගෝස්තු 01 දින ආරම්භ කර තිබුණු අතර 2016 ජූලි 31 දින වන විට එය නිමකළ යුතුව තිබුණි. ව්‍යාපෘතියේ වැඩ නිසි පරිදි ඉටු කිරීමට කොන්ත්‍රාත්කරු අසමත්වීම මත නිමකළ යුතු දිනය 2018 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණු අතර එදින වන විට රු. මිලියන 33,730 ක් එනම් කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 93 ක් කොන්ත්‍රාත්කරු වෙත

ගෙවා තිබුණි. 2019 වර්ෂයේ දී බෙලිඅත්ත දක්වා දුම්රිය ධාවනය සඳහා විවෘත කර තිබුණත්, ඒ සම්බන්ධව පහත සඳහන් අඩුපාඩු අනාවරණය වී තිබුණි.

- කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසිවල 7.4 වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත්කරු විසින් සපයනු ලබන රේල්පීලි හා සිල්පරවල ගුණත්වය ඉංජිනේරු විසින් දේශීය වශයෙන් පරීක්ෂා කර තත්ත්ව පරීක්ෂණ වාර්තාවක් ලබා දිය යුතුව තිබුණි. 2018 මාර්තු 31 දින එ.ජ.ඩොලර් 4,526,117 කට මිලදී ගෙන තිබුණු රේල්පීලි හා සිල්පරවල අදාළ තත්ත්ව පරීක්ෂණ වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.

- දුම්රිය මාර්ග ඉදිකිරීම් වෙනුවෙන් මිලදී ගත යුතු රේල්පීලි ප්‍රමාණය, භාවිතා කර ඇති ප්‍රමාණය හා ඉතිරි ප්‍රමාණයයන් දැක්වෙන වාර්තාවක් උපදේශන සමාගම විසින් ලබා දීමට අපොහොසත් වී තිබුණි. මේ නිසා මිලදී ගෙන ඇති රේල්පීලි සම්බන්ධ තොග පාලනයක් සිදු කිරීමට නොහැකි වී තිබුණි.

- ව්‍යාපෘතියට අදාළ ණය ගිවිසුමේ කොන්දේසි 1.3 වගන්තිය ප්‍රකාරව ණය ගිවිසුම අත්සන් කළ දින සිට වර්ෂ හතරක් ඇතුළත ණය ලබා ගත යුතුව තිබුණි. 2013 අප්‍රේල් මාසයේදී අත්සන් කරන ලද ණය ගිවිසුම අනුව 2017 අප්‍රේල් මාසය වන විට එම කාලය නිම වී තිබුණි. ඉදිකිරීම් ප්‍රමාදය මත 2017 මැයි මාසයේ සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා කාල පරිච්ඡේදය තුළ සිදු කරන ලද ගෙවීම් වෙනුවෙන් රු.මිලියන 5.35 ක පමණ විදේශ විනිමය අලාභයක් සිදු කර තිබුණි.

කුරුණෑගල - හබරණ දුම්රිය මාර්ගය ඉදිකිරීම

කුරුණෑගල හබරණ දක්වා කි.මී. 84 ක දිගින් යුත් දුම්රිය මාර්ගයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා අමාත්‍යාංශය යටතේ 2018 වර්ෂයේදී රු.මිලියන 500 ක ප්‍රතිපාදන සලසා තිබුණි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු ඉතා සෙමෙන් සිදු වූ බැවින් ව්‍යාපෘතිය සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 420 ක් මාතර - කතරගම ව්‍යාපෘතිය සඳහා මාරුකර තිබුණි. 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා පස් අවුරුදු සැලැස්ම තුළ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතු වුවද, 2019 මැයි මාසය වන විට ඉඩම් අත්පත් කර ගැනීම සඳහා රු.මිලියන 56 ක් පමණක් වැය කර තිබුණි.

කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය.

ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කර තිබුණි. ව්‍යාපෘති කාර්යභාරය ඉටු කිරීම සඳහා රු.මිලියන 1,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද, ඉන් රු.මිලියන 700 ක ප්‍රතිපාදන නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතියක් සඳහා මාරු කර තිබුණි. 2018 ජනවාරි මාසයේ දී ආරම්භ වූ මෙම ව්‍යාපෘතිය 2020 දී නිමකළ යුතු වුවත්, 2018 වර්ෂය අවසාන වන විට සවිස්තරාත්මක නිර්මාණ සැකසීමෙන් සියයට 30 ක් පමණක් ඉටුකර තිබුණි.

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව.

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව 1867 වර්ෂයේ දී ආරම්භ කර තිබුණි. එම වර්ෂයේ සිට 1934 වර්ෂය දක්වා දෙපාර්තමේන්තුව මෙහෙයුම් ලාභ ලබා තිබුණි. එම කාලය තුළ දුම්රිය මගින් භාණ්ඩ ප්‍රවාහනය කිරීමෙන් සමස්ථ ආදායමෙන් සියයට 57 ක පමණ ප්‍රමාණයක ආදායමක්

උපයා තිබුණි. 2018 දෙසැම්බර් 31 දින වන විට දුම්රිය දෙපාර්තමේන්තුවේ පුනරාවර්තන ආදායම රු.බිලියන 7.41 ක් වූ අතර පුනරාවර්තන වියදම රු.බිලියන 14.38 ක් වී තිබුණි. ඒ අනුව පුනරාවර්තන අලාභය රු.බිලියන 6.97 ක් වූ අතර පුනරාවර්තන ආදායම ඉක්මවූ පුනරාවර්තන අලාභය සියයට 94 ක් විය. විස්තර වගුව 17 හි දැක්වේ.

පුනරාවර්තන ආදායම, වියදම හා අලාභය	2013	2014	2015	2016	2017	2018
	රු.මිලියන	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
පුනරාවර්තන ආදායම	5,425	5,910	6,335	6,623	6,490	7,412
පුනරාවර්තන වියදම	10,586	16,943	14,048	13,396	14,080	14,380
පුනරාවර්තන අලාභය	5,161	11,033	7,713	6,773	7,590	6,968
පුනරාවර්තන අලාභය, පුනරාවර්තන ආදායමේ ප්‍රතිශතයක් ලෙස	95.13	186.68	121.75	102.26	116.95	94

වගුව 17 - ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ පුනරාවර්තන ආදායම, වියදම හා අලාභය
මූලාශ්‍රය - ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන

ආදායම් රැස් කිරීම.

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ආදායම් රැස්කිරීම ඉතාම දුර්වල මට්ටමක පවතින අතර සමාලෝචිත වර්ෂයේ ආදායමට වඩා පුනරාවර්තන වියදම දෙගුණයකට ආසන්න වී තිබුණි. දුම්රිය දෙපාර්තමේන්තුවේ කාර්යභාරයන් ඉටු කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී භාණ්ඩාගාරය විසින් රු.බිලියන 25.92 ක අමතර ප්‍රතිපාදන ලබාදී තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී දෙපාර්තමේන්තුව රැස්කළ රු. මිලියන 7,412 ක ආදායමේ සංයුතිය රූප සටහන 49 හි දක්වා ඇත.



රූප සටහන 49 – 2018 වර්ෂයේ ආදායමේ සංයුතිය
මූලාශ්‍රය : 2018 ආදායම් ගිණුම

මගී හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා ආරක්ෂිත, විශ්වාසදායී නියමිත වේලාවට ධාවනය වන සකසුරුවම් හා කාර්යක්ෂම ප්‍රවාහන සේවාවක් සැපයීම දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන මෙහෙවර වේ. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ ඉදිරිපත් කෙරේ.

ධාවනය කළ දුම්රිය ගමන් වාර ගණන අඩුවීම

සමාලෝචිත වර්ෂය සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් මගී දුම්රිය ගමන් වාර 121,473 ක් සැලැසුම් කර තිබුණ ද, ධාවනයේ යෙදවූ දුම්රිය ගමන්වාර ගණන 117,189 ක් දක්වා අඩු වී තිබුණි. ඒ අනුව ගමන් වාර 4,284 ක් ධාවනය කර නොතිබුණි. ධාවනය කළ දුම්රිය ගමන් වාර 50,997 ක් ප්‍රමාද වී ධාවනය කර තිබූ අතර අවලංගු කරන ලද දුම්රිය ගමන් වාර සංඛ්‍යාව 4,284 ක් වී තිබුණි.

දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම් පරිහරණය දුර්වලවීම

දුම්රිය දෙපාර්තමේන්තු රක්ෂිතය ලෙස ඉඩම් අක්කර 14,000 ක් තිබුණත්, ඒ සඳහා දත්ත පද්ධතියක් පවත්වා නොතිබීම නිසා එම ඉඩම්වල අනවසර පදිංචිවීම් හා බදු මුදල් ගෙවීම පැහැර හැරීම නිසා දුම්රිය දෙපාර්තමේන්තුවට විශාල ආදායමක් අහිමි වී තිබුණි.

භාණ්ඩ ප්‍රවාහනයෙන් ලබන ආදායම අඩුවීම

භාණ්ඩ ප්‍රවාහනය මගින් දුම්රිය දෙපාර්තමේන්තුවට අතිරේක ආදායම උපයාගත හැකිව තිබුණ ද, භාණ්ඩ ප්‍රවාහන ආදායම ඉකුත් වර්ෂය හා සැසඳීමේ දී සියයට 2.25 කින් අඩු වී තිබුණි. විස්තර වගුව 18 හි දැක්වේ.

දර්ශකය	2017	2018	ඉකුත් වර්ෂයට සාපේක්ෂව වැඩිවීම/ (අඩුවීම)	වැඩිමේ/ (අඩුවීමේ ප්‍රතිශතය
භාණ්ඩ කි.මී. (මිලියන)	144.79	119.78	(25.01)	(17.27)
භාණ්ඩ ප්‍රමාණය ටොන් (මිලියන)	2.00	1.84	(0.16)	(8.00)
ධාවනය කරන ලද භාණ්ඩ දුම්රිය සංඛ්‍යාව	6,590	6,845	255	3.87
භාණ්ඩ ආදායම (රු.මිලියන)	429.11	418.22	(10.89)	(2.53)

වගුව 18 ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ භාණ්ඩ ප්‍රවාහන ආදායම
මූලාශ්‍රය -ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තාව 2018

දුම්රිය මැදිරි පුනරුත්ථාපනය කිරීමේ පමාව.

පෞද්ගලික පාර්ශවයක් සමඟ එක්ව ධාවනයෙන් ඉවත් කළ මගී මැදිරි 200 ක් පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහන යටතේ 2018 දෙසැම්බර් 31 දින වන විට අළුත්වැඩියාව සඳහා ලබාදුන් මැදිරි 88 කින් මැදිරි 52 ක් පමණක් පුනරුත්ථාපනය කර තිබුණි.

මාර්ග අනතුරු අවම කර ගැනීම හා ආරක්ෂාව

රක්ෂණ ආයතනවල තෙවන පාර්ශවීය වාහන රක්ෂණය කිරීම්වලින් ලැබෙන ආදායමින් සියයට 01 ක් හා වෙනත් ආදායම ලෙස රු. මිලියන 66 ක ආදායමක් සමාලෝචිත වර්ෂයේ දී මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව විසින් රැස්කර තිබුණි. සභාවේ කාර්යභාරයන් ඉටු කර ගැනීම සඳහා රු.මිලියන 14

ක් පමණක් වැය කර තිබුණි. සභාව විසින් රු.මිලියන 319.5 ක් ආයෝජනය කර තිබුණත්, මාර්ග අනතුරු අවම කර ගැනීම සඳහා වූ කාර්යභාරය ඉටු කිරීම කෙරෙහි සභාවේ අවධානය යොමු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී දුම්රිය අනතුරු හේතුවෙන් තුවාල සිදුවීම 474 ක්ද, මරණ 220 ක්ද වාර්තා වී තිබුණි. එම දුම්රියෙන් සිදුවන අනතුරු වැලැක්වීම සඳහා ප්‍රමාණවත් කාර්යභාරයක් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවෙන් සිදු වී නොතිබුණි. මාර්ග අනතුරුවලින් සිදුවන අනතුරු අවම කර ගැනීම සෑම වර්ෂයකම මාර්ග ජාලයට අළුතින් එකතුවන මාර්ග රථ වාහන ප්‍රමාණය, මාර්ග අනතුරු, දේපළ හානි හා සම්බන්ධ සියළු තොරතුරු ඇතුළත් පරිගණක දත්ත ගබඩාවක් පවත්වාගෙන යාම සභාව පිහිටුවීමේ පනතේ අරමුණක් වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම කාර්යය ඉටු කර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

මගී ප්‍රවාහනය සඳහා බස්රථ යෙදවීම අඩුවීම

ඉකුත් වර්ෂයේ දී ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සතුව බස් රථ 7,302 ක් පැවැතුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විට එය බස් රථ 6,929 ක් දක්වා සියයට පහකින් අඩු වී තිබුණි. 2018 වර්ෂයේදී මණ්ඩලය සතුව දිනකට ධාවනය කළ හැකි බස් රථ 5,575 ක් පැවැතියද, ඉන් දිනකට බස් රථ 5,151 ක් පමණ ධාවනය කර තිබුණි. කාල සටහන් අවශ්‍යතාවය සහිත සාමාන්‍ය බස් රථ සංඛ්‍යාව 2018 වර්ෂයේ දී 6,465 ක් වුවත්, ධාවනය සඳහා බස් රථ 5,575 ක් පමණක් ලබා දී තිබුණි.

ගැමි සවිය සඳහා බස් රථ ධාවනය නොකිරිම

ශ්‍රී ලංකා ජාතික ගමනාගමන මණ්ඩලය විසින් දිනකට බස් රථ 5,000 ක් පමණ ධාවනය කරමින් පැවැති අතර, ආදායම් සහිත මාර්ගවල මෙන්ම කාර්යාල හා පාසල් ළමුන් ප්‍රවාහනය සඳහාද එම බස් රථ යොදවා තිබුණි. ඒ අනුව 2018 වර්ෂයේ සිසු සැරිය සඳහා බස් රථ 726 ක්ද, නිසි සැරිය සඳහා බස් රථ 142 ක්ද යොදවා තිබුණි. එසේ වුවද, සමාලෝචිත වර්ෂයේදී ගම්බද මාර්ගවල ක්‍රියාත්මක වන ගැමි සැරිය සඳහා බස් රථ යෙදවීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

ජීපීඑස් පද්ධතියෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොගැනීම

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේ සිට බස් රථ ධාවනය පිළිබඳ තොරතුරු පරීක්ෂා කිරීම සඳහා මණ්ඩලය විසින් ජීපීඑස් පද්ධතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර තිබුණි. ඒ අනුව එම පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා පුද්ගලික සමාගමක් සමඟ එකතුව රු.33,628,840 ක ගිවිසුමකට එළඹ තිබුණි. මණ්ඩලයේ සුඛෝපභෝගී බස් රථ 125 ක් වෙනුවෙන් මෙම ජීපීඑස් ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබුණු අතර ඒ සඳහා අවශ්‍ය කැමරා හා උපාංග බස් රථ සඳහා සවිකර තිබුණි. මෙම පද්ධතිය අධීක්ෂණය කිරීම සඳහා ප්‍රධාන කාර්යාලයේ හෝ ඩිපෝවල නිලධාරීන් යොදවා නොතිබීම නිසා ව්‍යාපෘතියේ ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

අධිවේගී මාර්ගවල ධාවනයට සුදුසු බස්රථ නොතිබීම

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් අධිවේගී මාර්ගයේ බස් රථ ධාවනය කරනු ලැබුවද, එම මාර්ගවල ධාවනය කිරීමට තරම් සුදුසු හා ප්‍රමාණවත් බස් රථ මණ්ඩලය සතුව නොතිබුණි. එම නිසා බාහිර පාර්ශවයන් වෙතින් ලබා ගන්නා ලද බස් රථ මණ්ඩලයේ ලාංඡනය යටතේ ධාවනය කිරීමට කටයුතු කර, එම බස් රථ ආදායමෙන් සියයට 15 ක

ආදායමක් පමණක් ලබා ගැනීට කටයුතු කර තිබුණි.

ටෙන්ඩර් කිරීමෙන් තොරව නිත්‍ය සේවා බලපත්‍ර නිකුත් කිරීම

2005 ඔක්තෝබර් 06 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ටෙන්ඩර් කිරීම මත නිත්‍ය සේවා බලපත්‍ර නිකුත් කිරීමට කොමිෂන් සභාවට අනුමැතිය ලබා දී තිබුණි. එසේ වුවද, ලංසු කැඳවීමකින් තොරව ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් 2018 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට මාර්ග බලපත්‍ර 3,440 ක් නිකුත් කර තිබුණු අතර, ඉන් සියයට 64 ක් වාර්ෂික අළුත් කිරීමේ ගාස්තු වන රු. 3,000 ක ගාස්තු අයකිරීම මත හා සියයට 27 ක් වාර්ෂිකව රු. 15,000 ක ගාස්තු අයකිරීම මත පමණක් ලබා දී තිබුණි. ඒ අනුව නිකුත් කරන ලද මුළු බලපත්‍රවලින් සියයට 91 ක් ටෙන්ඩර් කිරීමෙන් තොරව ලබාදීම නිසා කොමිෂන් සභාවට ලබාගත හැකිව තිබූ ආදායම් අහිමි වී තිබුණි. එසේම කොමිෂන් සභාව අධිවේගී මාර්ගයේ බස් රථ සඳහා තාවකාලික මාර්ග සේවා අවසරපත්‍ර අවම තාක්ෂණික අගය පදනම් කරගෙන ලබා දී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දී උපරිම දින 28 ක කාලයක් සඳහා බලපත්‍ර 820 ක් නිකුත් කර තිබුණු අතර, ටෙන්ඩර් කිරීම මගින් ලබාගත හැකි උපරිම ආදායම අහිමි වී තිබුණි.

මගී සේවා අවසරපත් නිකුත් නොකිරීම

සමාලෝචිත වර්ෂයේ දී ලංකාවේ විවිධ පළාත්වල සිට උතුරු, නැගෙනහිර පළාත් දක්වා මගී සේවා අවසරපත්‍ර නොමැතිව බස් රථ 28 ක් පමණ ධාවනය කරනු ලබන බව ජංගම පරීක්ෂණ අංශය විසින් හඳුනාගෙන තිබුණි. ඒ අනුව මාර්ග 17 ක් සඳහා මගී සේවා අවසරපත්‍ර 31 ක් නිකුත් කිරීමට ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් කටයුතු කර තිබුණි. මේ අනුව කොමිෂන් සභාව විසින් මාර්ග 06 ක් සඳහා මගී සේවා අවසරපත්‍ර 09 ක් නිකුත් කිරීමට ලංසු කැඳවා සාර්ථක ඉල්ලුම්කරුවන් තෝරා ගෙන තිබුණි. තෝරාගත් ඉල්ලුම්කරුවන් සඳහා අවසරපත්‍ර ප්‍රදානය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් නොපැවැත්වීම නිසා අනුමැතිය ලබා ගැනීමට නොහැකි වීම මත සමාලෝචිත වර්ෂයේදී අවසරපත්‍ර ප්‍රදානය කිරීමට නොහැකි වී තිබුණි. මේ හේතුවෙන් කොමිෂන් සභාවට වර්ෂයකට රු.මිලියන 25.82 ක ආදායම් අහිමි වී තිබුණි.

සිසුන් හා පාසල් විසින් ඉදිරිපත් කර තිබුණු ඉල්ලීම් ඉටු නොකිරීම

සිසු සැරිය ව්‍යාපෘති සඳහා සිසුන් හා පාසල් විසින් ඉල්ලීම් 31 ක් ඉදිරිපත් කර තිබුණද, 2018 වර්ෂයේ දී එම ඉල්ලීම් 31 ම ඉටු කිරීමට නොහැකි වී තිබුණි. මෙම ව්‍යාපෘතිය ඉටු කිරීමේ දී ප්‍රවාහනය නියාමනය සිදු කරන ආයතනය ලෙස අදාළ සේවාවන් සඳහා බස් රථ යෙදවීම ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ මූලික කාර්යයක් මෙන්ම සමාජ වගකීමක් වන අතර ඒ පිළිබඳව අවධානය යොමු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

දෛනික පැය පදනම මත වෛද්‍යවරුන්ගේ සේවය ලබා ගෙන වෛද්‍ය සහතික නිකුත් කිරීම

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ ප්‍රධාන කාර්යය වෛද්‍ය සහතික නිකුත් කිරීම වුවද, මේ සඳහා ආයතනයේ ප්‍රමාණවත් වෛද්‍යවරු සංඛ්‍යාවක් නොමැති අතර කොන්ත්‍රාත් හා දෛනික පැය පදනම යටතේ වෛද්‍යවරු සේවයේ යොදවා ගෙන තිබුණි. 2018 වර්ෂයේදී සිදු කළ විගණන පරීක්ෂාවේ දී ශාඛා කාර්යාල 07 ක් සඳහා එක් ස්ථිර වෛද්‍යවරයෙකු හෝ පත් කර නොතිබුණු අතර

දෛනික පදනම මත වෛද්‍යවරු සේවයේ යොදවා වෛද්‍ය සහතික නිකුත් කර තිබුණි.

පනතේ කාර්යයන් ප්‍රමාණවත් පරිදි ඉටු නොකිරීම

1997 අංක 25 දරන ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන පනත ප්‍රකාරව අනතුරුවලට අදාළව වෛද්‍ය සේවා හා ආධාර සැලැසීම, ගෙවිය යුතු වන්දි හෝ අලාභ පිළිබඳ උපදෙස් ලබාදීම, ආයතනයේ කර්තව්‍යන් ඉටු කිරීම සඳහා සුදුසු වෛද්‍ය නිලධාරී මණ්ඩලයක් පත්කිරීම, සියළුම මෝටර් වාහන ශාරීරිකව හෝ මානසිකව යෝග්‍ය හා ප්‍රවීන තැනැත්තන් විසින් පමණක් ධාවනය කරන බවට වග බලා ගැනීම හා අදාළ ක්‍රියාත්මක කිරීම් බලධරයන් විසින් පිළිගත යුතු හා ක්‍රියාත්මක කළ යුතු ප්‍රවාහන වෛද්‍ය කටයුතුවලට ප්‍රමිත සකස් කිරීම සහ සීමා නියම කිරීම යන කාර්යන් ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය විසින් ඉටු කර නොතිබුණි.

සමාජ සවිබලගැන්වීම හා සුභසාධනය

සමාජ ආරක්ෂණ අරමුදලේ ශේෂය අමාත්‍ය මණ්ඩලයේ තීරණය කළ පරිදි අදාළ කාර්යයන් සඳහා යොදවා නොතිබුණි.

සාධනීය වියපත්වීම පිළිබඳ පර්යේෂණ නොපැවැත්වීම

ආබාධිත තැනැත්තන් සඳහා වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ඉදිකිරීමේ කටයුතු අවසන් නොකිරීම

කළමනාකරණ තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීමට නොහැකි වීම

සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම

සමාජ සවිබලගැන්වීම් හා සුභසාධනය

ආර්ථික හා සමාජමය වශයෙන් සවිබලගැන්වූ සුරක්ෂිත ජාතියක් ඇති කිරීමේ ප්‍රතිඵලය ළඟා කර ගැනීම සඳහා සමාජ සවිබලගැන්වීමේ හා සුභසාධන අමාත්‍යාංශය, දෙපාර්තමේන්තු දෙකකින් හා ව්‍යවස්ථාපිත මණ්ඩල/ආයතන 05 ක් විසින් පහත සඳහන් කාර්යයන් ඉටු කළ යුතුවේ.

- සමාජ සවිබල ගැන්වීම හා සුභසාධන විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම හා ඇගයීම
- ග්‍රාමීය ජන දිවිය සවිබල ගැන්වීම පිණිස ක්‍රමෝපායන් හඳුන්වාදීම හා ඒවා ක්‍රියාත්මක කිරීම මූලාධාර සම්පාදනය කිරීම.
- ග්‍රාමීය හා ප්‍රාදේශීය ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනය කිරීම
- දිවිනැඟුම (සමෘද්ධි) වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන්ගේ දුබලතාවයන් හඳුනා ගැනීම හා පුනරුත්ථාපනය සිදු කිරීම
- මහජන ආධාර යෝජනා ක්‍රමය සමාලෝචනය කිරීම, ප්‍රතිසංවිධානය හා උචිත නව ප්‍රතිසංස්කරණය හඳුන්වා දීම.
- ක්ෂය රෝගීන්ට, වකුගඩු රෝගීන්ට, ලාදුරු රෝගීන්ට,පිළිකා හා තැලිසීමියා රෝගීන්ට සහ ඔවුන්ගේ යැපෙන්නන්ට ආධාර ලබාදීම.
- පවුල් උපදේශන සේවා ක්‍රියාත්මක කිරීම.
- ආබාධ සහිත පුද්ගලයන් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීමට හා රැකියා අවස්ථා ඇතිකරලීමට අවශ්‍ය ක්‍රමෝපායන් සැළසීම.
- ආබාධිතයන් සඳහා සමාජ ආරක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීම.
- වයෝවෘද්ධ තැනැත්තන් රැකබලා ගැනීම, සමාජ සංවර්ධන කාර්යයන්හි වැඩිහිටියන්ගේ සහභාගිත්වය ඉහළ නැංවීම හා ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ අයිතිවාසිකම් සුරැකීමට අවශ්‍ය පියවර ගැනීම

අමාත්‍යාංශය, දෙපාර්තමේන්තු හා ව්‍යවාස්ථාපිත ආයතන විසින් ඉහත සඳහන් කාර්යභාරයන් ඉටු කිරීම පිළිබඳව සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

ජ්‍යෙෂ්ඨ පුරවැසි දීමනාව

සමාලෝචිත වර්ෂයේ පළමු මාස 03 තුළ වයස අවුරුදු 70 ඉක්මවූ අඩු ආදායම්ලාභී ජ්‍යෙෂ්ඨ පුරවැසියන් 386,083 දෙනෙකුට හා පසුව එළඹුණු මාස 09 ක කාලය තුළ වැඩිහිටියන් 416,667 දෙනෙකුට රු.2,000 ක් බැගින් වූ ජ්‍යෙෂ්ඨ පුරවැසි දීමනා ගෙවීම සඳහා රු.මිලියන 9,816.50 ක ප්‍රතිපාදන සළසා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී වැඩිහිටියන් 410,397 දෙනෙකුට රු.මිලියන 9,590.03 ක දීමනා ගෙවා තිබුණි. 2018 දෙසැම්බර් 31 දින වන විට සලසා තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 226.47 ක් උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි. කෙසේ වුවද, දිස්ත්‍රික්ක 25 ක් තුළ පොරොත්තු ලේඛනයේ වැඩිහිටියන් 117,598 දෙනෙක් ජ්‍යෙෂ්ඨ පුරවැසි දීමනාව අපේක්ෂා කර තිබුණි. 2016 අගෝස්තු 31 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි වැඩිහිටියන් වෙත ලබා දෙන මෙම දීමනාවෙන් රු.100 ක් බැගින් අඩුකර ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් වැඩිහිටි මහ ලේකම් කාර්යාලය වෙත ලබා දිය

යුතුව තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 490.82ක් සමාජ ආරක්ෂණ අරමුදලට ප්‍රේෂණය කළ යුතුව තිබුණත්, ඉන් රු.මිලියන 5.36 ක් අඩුවෙන් ප්‍රේෂණය කර තිබුණි. එහෙත් එම ඌණතාවය අයකර ගැනීම සම්බන්ධව මහ ලේකම් කාර්යාලය විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් විමසීම් කර නොතිබුණි.

2018 දෙසැම්බර් 31 දින වන විට සමාජ ආරක්ෂණ අරමුදලේ ශේෂය රු.මිලියන 1,476.16 ක් වූ අතර එම ශේෂය සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අමාත්‍ය මණ්ඩලයේ තීරණයේ සඳහන් කර තිබූ කිසිදු කර්තව්‍යකට උපයෝජනය නොකර නිෂ්කාර්යව පැවතිණි.

සාධනීය වියපත්වීම පිළිබඳ පර්යේෂණය

ශ්‍රී ලංකාවේ ප්‍රජා මූලික වැඩිහිටි රැකවරණ පද්ධතිය සංවර්ධනය කිරීම පිළිබඳ පර්යේෂණය කිරීම සඳහා රු.මිලියන 4.20 ක ප්‍රතිපාදනයන් වැඩිහිටි මහා ලේකම් කාර්යාලය වෙත සලසා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම ව්‍යාපෘතියට අදාළ පර්යේෂණ සිදු කර නොතිබුණි.

ආබාධිත දීමනා ගෙවීම

සමාලෝචිත වර්ෂයේදී ආබාධිත දීමනාව වශයෙන් දිස්ත්‍රික්ක 25 ක් තුළ ආබාධිත පුද්ගලයන් 34,667 දෙනෙකුට මාසිකව රු.3,000 බැගින් ආබාධිත දීමනා ගෙවීම සඳහා රු. මිලියන 1,151.77 ක ප්‍රතිපාදන වැඩිහිටි මහා ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ආබාධිත පුද්ගලයන් 31,956 දෙනෙකුට දීමනා ලබාදීමෙන් පසුව රු.මිලියන 10.55 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

ආබාධිත පුද්ගලයින්ට නිවාස ආධාර ගෙවීම

අඩු ආදායම්ලාභී ආබාධිත තැනැත්තන් සඳහා නිවාස ආධාර ලබාදීමේ වැඩසටහන යටතේ ඉකුත් වර්ෂවලදී ආරම්භ කරන ලද නමුත්, 2018 දෙසැම්බර් 31 දින වන විටත් නිවාස 366 ක වැඩ අවසන් කර නොතිබුණි. එම නිවාස සඳහා තව දුරටත් ගෙවිය යුතු වාරික වල වටිනාකම රු.මිලියන 25.11 ක් වී තිබුණි. එම ගෙවිය යුතු වාරිකවලින්, ඉදිකිරීම් ආරම්භ කර වර්ෂ 02 ක සිට වර්ෂ 06 ක් දක්වා කාල පරාසයක සිට වැඩ නිම නොකළ නිවාස 169 ක් පැවතුණි. ඉදිකිරීම් ආරම්භ කර වර්ෂයකට වඩා වැඩි කාල පරාසයක් ගත වී තිබුණු නිවාස ගණන 67 ක් වී තිබුණි. එම නිවාස වෙනුවෙන් පිළිවෙලින් රු.මිලියන 14.26 ක් හා රු.මිලියන 3.40 ක් වශයෙන් එකතුව රු.මිලියන 17.66 ක් ගෙවිය යුතුව තිබුණි.

ආබාධ සහිත තැනැත්තන්ට ගොඩනැගිලිවලට ඇතුළුවීම සඳහා ප්‍රවේශ පහසුකම් සැපයීම

2016 අංක 01 දරන ආබාධ තැනැත්තන් සඳහා වූ ප්‍රවේශ නියෝග යටතේ නීති ක්‍රියාමාර්ග ගැනීම සහ ප්‍රවේශ පහසුකම් සපුරාලීම පිළිබඳව පසුවිපරම් හා අධීක්ෂණ කටයුතු මෙන්ම ඒ සම්බන්ධ සියළුම කාර්යයන් හි වගකීම ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ සභාව වෙත පැවරී තිබුණි. ජාතික ආබාධිත මහ ලේකම් කාර්යාලයේ අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් තාක්ෂණ නිලධාරිවරයෙක් 2019 සැප්තැම්බර් 30 දින වන විටත් බඳවා ගෙන නොමැති බැවින් එම කාර්යය සාර්ථකව ඉටුකර ගැනීමට නොහැකිවී තිබුණි.

සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම

වැඩිහිටි සත්කාරක සහකරුවන් 100 දෙනෙකු බඳවාගෙන පුහුණු කිරිමට රු.මිලියන 2.50 ක්ද, වැඩිහිටියන් සතු සම්ප්‍රදායික හා දේශීය සුපවේදී ක්‍රම සමාජය තුළ ප්‍රවර්ධනය කිරීම සඳහා අත්තම්මා කේටරින් ව්‍යාපෘතියට රු.මිලියන 5.00 ක්ද, කතරගම වැඩිහිටි නිවාස පාලකවරයාගේ නිල නිවාසය අළුත්වැඩියාවට රු.මිලියන 3.00 ක්ද, ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය විසින් වැඩිහිටියන්ගේ සුභසාධනය වෙනුවෙන් ප්‍රධාන කාර්යයන් 03 ක් ඉටුකිරීමට සමාජ ආරක්ෂණ අරමුදලින් ලබාගත් රු.මිලියන 252.83 ක්ද වශයෙන් එකතුව රු.මිලියන 263.33 ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේදී සලසා තිබුණත් එම ප්‍රතිපාදන උපයෝජනය කිරීමට අවශ්‍ය මූලික කටයුතු ඉටු නොකිරීම නිසා මුළු ප්‍රතිපාදනයම උපයෝජනය කර නොතිබුණි.

ඉඩම් උපයෝජනය

වැඩිහිටි නිවාස ඉදිකිරීම සඳහා 2011 වර්ෂයේදී තැගි ඔප්පු මගින් සභාවට ලබා දී තිබූ රු.මිලියන 13.00 ක් වූ ගම්පහ හෝලික්‍රොස් ඉඩම සහ රු.මිලියන 3.20 ක් වූ හාරගම රාජිත වත්ත යන ඉඩම් අදාළ නිවාස ඉදිකිරීමට අපොහොසත් වීම නිසා නිෂ්ක්‍රියව පැවතුණි.

ගොඩනැගිල්ලක් මිලදී ගැනීම

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය විසින් අවශ්‍ය අරමුදල් වෙන්කර ගැනීමකින් සහ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව, රජයේ තක්සේරුව වූ රු.මිලියන 165.00 ක් ඉක්මවා මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යාමට විශ්‍රාම වැටුප් අරමුදලින් රු.මිලියන 195.00 ක් වැය කර 2013 වර්ෂයේදී ගොඩනැගිල්ලක් මිලදී ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ගොඩනැගිල්ල මිලදී ගෙන වර්ෂ 05 ක් කාලයක් ගතවී තිබුණත්, ගෙඩනැගිල්ලේ වර්තමාන වටිනාකම තක්සේරු කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විධිමත් තීරණයක් ගෙන නොතිබුණි.

කළමනාකරණ තොරතුරු පද්ධතියක් මිලදී ගැනීම

සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් කළමනාකරණය සඳහා තොරතුරු පද්ධතියක් මිලදී ගැනීම සඳහා 2018 වර්ෂයේදී රු.මිලියන 12.51 ක් ප්‍රතිපාදනය සළසා තිබුණි. මෙම පරිගණක පද්ධතිය මිලදී ගැනීම සඳහා වර්ෂ 03 ක කාලයක පටන් සැලැසුම් කර තිබුණත් එය ස්ථාපිත කිරීමට නොහැකි වී තිබුණි. මණ්ඩලයේ පවත්නා කළමනාකරණ තොරතුරු පද්ධතියේ පවතින දෝෂ තත්ත්වයන් හේතුවෙන් සක්‍රීය හා අක්‍රීය දායකයන් හඳුනා ගැනීමට නොහැකි වී තිබුණි. මේ නිසා ඒ පිළිබඳ සංඛ්‍යා නිශ්චිතව ඉදිරිපත් කිරීමට මණ්ඩලයට නොහැකි වී තිබුණි.

ආබාධිත තැනැත්තන් සඳහා වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ඉදිකිරීම

ඉකුත් වර්ෂයේදී කොට්ටාව වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ඉදිකර අවසන් කිරීම සඳහා රු.මිලියන 25 ක් ඇස්තමේන්තු කර තිබුණද, ව්‍යාපෘතිය ආරම්භ කිරීම ප්‍රමාදවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදීද වාර්ෂික ඇස්තමේන්තුවෙන් රු.මිලියන 5 ක ප්‍රතිපාදන

සලසා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසන් වන මුළු වියදම රු.මිලියන 12.06 ක් වී තිබුණු අතර භෞතික ප්‍රගතිය සියයට 50 ක් පමණක් වී තිබුණි. මේ නිසා අපේක්ෂා කළ පරිදි ව්‍යාපෘතිය අවසන් කර වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි.

මඩකලපුව වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ඉදි කිරීම 2016 වර්ෂයේ ආරම්භ කර 2017 වර්ෂයේදී අවසන් කිරීමට නියමිතවී තිබුණි. එහි ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 100 ක් වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වනවිට ඉදිකිරීම සඳහා රු.මිලියන 64.74 ක් වැයකර තිබුණු නමුත් අපේක්ෂිත පරිදි පුහුණු මධ්‍යස්ථානය ආරම්භ කර නොතිබුණි.

උතුරු පළාත් තරුණ ප්‍රජාවගේ ආර්ථික සංවර්ධනය උදෙසා කිලිනොච්චිය වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය අදියර දෙකකින් ඉදිකිරීමට 2016 වර්ෂයේදී සැලසුම් කර තිබුණු අතර එහි ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 64.00 ක් වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් මාසයේදී මෙම ඉදිකිරීම අවසන් කළ යුතුව තිබුණත් සමාලෝචිත වර්ෂය අවසන් වනවිට රු.මිලියන 54.37 ක් වියදම් කර තිබූ අතර දෙවන අදියර නිම කර නොතිබුණි.

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ

සැලැසුම් කළ කර්යයන් ඉටු නොකිරීම

විධිමත් අනුමැතියක් රහිතව සේවකයින් බඳවා ගැනීම

විදේශ ශිෂ්‍යත්ව ගිවිසුම් කඩකළ නිලධාරීන්

ඌන උපයෝජිත වත්කම්

අනාර්ථික වියදම්

අත්‍යාවශ්‍ය නොවන භාණ්ඩ මිලදී ගැනීම්

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ

විද්‍යාත්මක පර්යේෂණවල නිරතවීමෙන් හා විද්‍යා තාක්ෂණය ප්‍රචලිත කිරීම හරහා විද්‍යාත්මකව හා තාක්ෂණකත්වයෙන් සංවර්ධනය වූ රටක් ඇති කිරීම, මෙම ක්ෂේත්‍රයෙන් අපේක්ෂා කරන ප්‍රතිඵලය වී තිබුණි. එම අපේක්ෂාව ලබා ගැනීම සඳහා විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය හා ඒ යටතේ වන ව්‍යවස්ථාපිත ආයතන 13 ක් විසින් පහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි.

- විද්‍යා, තාක්ෂණය හා පර්යේෂණ විෂයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
- විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රවල අන්තර්ජාතිකව සිදුවන නව අන්තර්ජාතිකව සිදුවන නව සොයාගැනීම් වලට අනුගත වන සේ දේශීය පර්යේෂණ හා සොයාගැනීම් සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.
- විද්‍යාත්මක, කාර්මික, සමාජ හා ආර්ථික පර්යේෂණ, සංවර්ධන කටයුතු පුළුල් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- පර්යේෂණ හා පර්යේෂණ ආයතනවලට පහසුකම් සැපයීම තුළින් පර්යේෂණ සැලසුම් කිරීම හා මෙහෙයවීම.
- නව සොයාගැනීම් සඳහා ප්‍රජාව යොමු කිරීම සහ පෙළඹවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම පිළිබඳව සිදු කරන ලද නියැදි විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

සැලැසුම් කළ කාර්යයන් ඉටු නොකිරීම

2018 වර්ෂයේදී ඉටු කිරීමට අපේක්ෂාවෙන් පහත සඳහන් කර ඇති කාර්යයන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම කාර්යයන් ඉටු කර නොතිබුණි.

- සෝලා පැනල් ව්‍යාපෘතිය සඳහා ගුරුවරුන් 100 දෙනෙකු කළාප වශයෙන් තෝරා ගෙන පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- සෝලා පැනල් ව්‍යාපෘතිය සඳහා කාර්මික විද්‍යාලවල සිසුන් 250 ක් ලියාපදිංචි කර වැඩසටහන පැවැත්වීම.
- 2018 වර්ෂයේ අවසන් කාර්තුවේ දී ජාතික විද්‍යා මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම හා එහි මූලික කටයුතු වූ සැලසුම් සැකසීම හා ඉඩම් මිල දී ගැනීමේ කටයුතු.
- ජාන විද්‍යාව පිළිබඳ විශිෂ්ටත්වයෙන් යුත් මධ්‍යස්ථානයක් පිහිටුවීම.
- සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 44 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණත්, යෝජිත ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සඳහා විද්‍යාගාරය ඉදිකිරීම
- සමාලෝචිත වර්ෂයේදී කාර්මික තාක්ෂණ ආයතනය විසින් රු.මිලියන 100 ක ප්‍රතිපාදන සලසා තිබුණු පෙට්‍රෝලියම් නිෂ්පාදන පරීක්ෂාව සඳහා පහසුකම් සැලසීමේ ව්‍යාපෘතිය
- සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 250 ක පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම මගින් ප්‍රතිපාදන සලසා ගෙන තිබුණු යන්ත්‍ර ඉලෙක්ට්‍රෝන විද්‍යාවෙන් සවිබල ගැන්වෙන ආර්ථික

සංවර්ධනය මූලාරම්භය (MEDI) හරහා නිෂ්පාදන සැලැසුම් ඉංජිනේරු විද්‍යාව (PDE) සඳහා සහය ලබා දීම ව්‍යාපෘතිය

- සමාලෝචිත වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 150 ක ප්‍රතිපාදන සලසා තිබුණු ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ව්‍යාපාර සම්පත් සැලැසුම් කිරීමේ (Enterprises Resource Planning) ව්‍යාපෘතිය.

විධිමත් අනුමැතිය රහිතව සේවකයින් බඳවා ගැනීම

2016 ජනවාරි 08 දිනැති අංක 1/2016 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව හා භාණ්ඩාගාර ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව කාර්යභාර පදනම මත සේවකයින් 19 දෙනෙකු කාර්මික තාක්ෂණ ආයතනය විසින් සේවයේ යොදවා ගෙන ඒ සඳහා රු.මිලියන 10.29 ක් වැය කර තිබුණි.

විදේශ ශිෂ්‍යත්ව ගිවිසුම් කඩ කළ නිළධාරීන්

කාර්මික තාක්ෂණ ආයතනය විසින් විදේශ ශිෂ්‍යත්ව ප්‍රදානය කළ නිලධාරීන් සමඟ එළඹ තිබුණු ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකළ නිලධාරීන් 18 දෙනෙකුගෙන් රු.මිලියන 7.61 ක් අය කර ගත යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම මුදල් අයකර ගැනීමට ආයතනය අපොහොසත් වී තිබුණි.

ඌන උපයෝජිත වත්කම්

ආහාරවල පලිබෝධනාශක අපද්‍රව්‍ය අඩංගුදැයි පරීක්ෂා කිරීමට Gas chromatograph mass spectrophotometer GC/MS-MS පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් රු.මිලියන 24.61 ක් වටිනා උපකරණ 03 ක් 2017 නොවැම්බර් 12 දින මිලදී ගෙන තිබුණි. එම උපකරණ 2019 මැයි මාසය වන විටත් භාවිතයෙන් තොරව නිෂ්ක්‍රියව පැවතුණි. එමෙන්ම එම පද්ධතිය ස්ථාපිත කිරීමට සුදුසු රසායනාගාරයක් 2019 මැයි මාසය වන විටත් සකස් කර නොතිබුණු අතර ඒ සඳහා කාර්ය මණ්ඩලයට අවශ්‍ය පුහුණුවද ලබාදී නොතිබුණි.

අනාර්ථික වියදම්

ශ්‍රී ලංකාව තුළ නවෝත්පාදන සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම හා ස්ථාපිත කිරීමට මාධ්‍ය ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා 2017 වර්ෂයේදී රු.මිලියන 1.68 වැය කර තිබුණි. 2019 අප්‍රේල් මාසය වන විටත් එම මාධ්‍ය ප්‍රතිපත්තිය ප්‍රායෝගිකව භාවිතයට ගෙන නොතිබුණි.

සහසක් නිමැවුම් 2018 ප්‍රදර්ශනයේ මුද්‍රිත හා ඉලෙක්ට්‍රොනික මාධ්‍ය ප්‍රචාරණ කටයුතු සඳහා පෞද්ගලික ආයතනයක් තෝරාගෙන තිබුණු අතර ඒ සඳහා රු.මිලියන 2.65 ක් වැය කර තිබුණි. දිනමිණ, තිනකරන්, ඩේලි නිවුස්, ලංකාදීප හා ඩේලි මිරර් යන පුවත්පත්වල දැන්වීම් පලකිරීම සඳහා ඉන් රු.මිලියන 1.25 ක් වැය කර තිබුණි. පුවත්පත්වල පල කිරීම සඳහා දැන්වීම නිර්මාණය කිරීම ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ කාර්ය මණ්ඩලය මඟින් සිදුකර තිබුණු බැවින් පුවත්පත් හි පල කිරීම සඳහා අතරමැදියෙකු වෙත රු.මිලියන 2.25 ක් ගෙවා තිබුණි.

අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ මිලදී ගැනීම

ආතර් සී ක්ලාක් මධ්‍යස්ථානය විසින් පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් රු.මිලියන 24.08 ක් වටිනා වත්කම් වර්ග 6 ක් මිලදී ගෙන තිබුණි. එසේ මිලදී ගෙන තිබුණු උපකරණ උපාංග හා පද්ධතීන් පරීක්ෂාවේදී එම වත්කම් භාවිතයෙන් තොරව නිශ්කාර්යව පැවතුණි.

සන්නිවේදනය

අන්තර්ජාල ග්‍රාහක සංඛ්‍යාව ජනග්‍රහනයට සාපේක්ෂව අඩුවීම

ADSL අන්තර්ජාල පහසුකම්වල ව්‍යාප්තිය ක්‍රියාත්මක කිරීම මන්දගාමීවීම

නෙළුම් කුළුණ ව්‍යාපෘතිය

සන්නිවේදනය

ඩිජිටල් තාක්ෂණයෙන් සවිබල වූ දැයක් ගොඩනැගීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය හා ඒ යටතේ ව්‍යවස්ථාපිත ආයතන 03 ක් ස්ථාපිත කර තිබුණි. එම ආයතනවලින් පහත සඳහන් කාර්යභාරයන් ඉටු කළ යුතුව තිබුණි.

- විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් විෂයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
- නවීන තාක්ෂණය යොදා ගනිමින් සැමට විදුලි සංදේශ පහසුකම් ලබාදීමට අවශ්‍ය පියවර ගැනීම.
- රාජ්‍ය අංශයේ සේවා සැපයීමේ ඵලදායිතාවය හා කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා උචිත තොරතුරු තාක්ෂණ විසඳුම් යොදා ගැනීමට සහය වීම.
- පරිගණක සාක්ෂරතාව ඉහළ නැංවීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කිරීම දිරි ගැන්වීම සඳහා ක්‍රමෝපායන් සැකසීම.

ඉහත සඳහන් කාර්යභාරයන් ඉටු කිරීම පිළිබඳව සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

අන්තර්ජාල ග්‍රාහක සංඛ්‍යාව ජනගහනයට සාපේක්ෂව අඩුවීම

2016 වර්ෂයේදී අන්තර්ජාල ග්‍රාහක සංඛ්‍යාව 4,921,000 ක් හා 2017 හා 2018 වර්ෂවලදී පිළිවෙලින් එම සංඛ්‍යාව 5,904,260 ක් හා 7,263,098 ක් වී තිබුණි. මෙම ග්‍රාහක සංඛ්‍යාවේ වර්ධනයක් පෙන්නුම් කළද එම ප්‍රමාණය ශ්‍රී ලංකාවේ ජනගහනය හා සමඟ සැසඳීමේදී ඉතා අඩු අගයක් ගෙන තිබුණි.

ADSL අන්තර්ජාල පහසුකම්වල ව්‍යාප්තිය පහළ අගයක් ගැනීම

2018 වර්ෂය අවසාන වන විට ADSL අන්තර් ජාල පහසුකම් 864,821 ක් ලබාගෙන තිබුණි. එයින් සියයට 49.88 ක් බස්නාහිර පළාතෙන් වූ අතර සියයට 0.48 ක සිට සියයට 5.04 ක් දක්වා පමණක් අනෙකුත් ප්‍රදේශ අතර ව්‍යාප්ත වී තිබුණි. ඒ අනුව ග්‍රාමීය ප්‍රදේශවල ADSL අන්තර් ජාල පහසුකම්වල ව්‍යාප්තිය ඉතා පහල මට්ටමක පැවැතුණි.

ආර්ථිකය ඩිජිටල්කරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මන්දගාමීවීම

2018 වර්ෂයේදී අමාත්‍යාංශය විසින් ආර්ථිකය ඩිජිටල්කරණ ව්‍යාපෘති සඳහා රු. මිලියන 1,731.85 ක ප්‍රතිපාදන සලසා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එයින් රු.මිලියන 637.96 ක් පමණක් උපයෝජනය කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.මිලියන 89.36 ක බිල්පත් ගෙවිය යුතුව තිබුණි. ඒ අනුව එහි මූල්‍ය ප්‍රගතිය සියයට 42 ක් වී තිබුණු අතර වර්ෂය තුළ නිම කළ යුතු ව්‍යාපෘති 14 කින් කිසිදු ව්‍යාපෘතියක් නිමකිරිමට අපොහොසත් වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී සැලැසුම් කළ පරිදි ඉලක්ක ලඟාකර ගැනීමට කටයුතු නොකිරීම හා සිදුකළ යුතු ප්‍රසම්පාදනයන් නියමිත දින වකවානු තුළදී සිදු නොකිරීම මෙම තත්ත්වයට විශේෂයෙන් බලපා තිබුණි.

නෙළුම් කුළුණ ව්‍යාපෘතිය

සන්නිවේදන ක්ෂේත්‍රය නියාමනය කිරීමේ ආයතනය වූ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන

කොමිෂන් සභාව ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ පැවති අතර වර්තමානය වන විට මෙම කොමිෂන් සභාව ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන යනු ලබයි. 2010 ඔක්තෝබර් 29 දින අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි නෙළුම් කුළුණ ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව චීන සමාගම් 02 ක් වෙත ප්‍රදානය කර තිබුණි. 2012 ජනවාරි 03 දින විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හා එම සමූහය, කොන්ත්‍රාත් ගිවිසුමට එළඹ තිබුණි. කොන්ත්‍රාත් වටිනාකම එ.ජ.ඩො 104,300,000 ක් වූ අතර ගිවිසුමට අනුව 2012 නොවැම්බර් 12 දින සිට 2015 මැයි 12 දින දක්වා දින 912 කින් මෙම කොන්ත්‍රාත්තුව නිම කළ යුතුව පැවතුණි. මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දක්වා ඇත.

- ව්‍යාපෘති වාර්තාවක් හා විධිමත් ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් පිළියෙල කර නොතිබුණ අතර ව්‍යාපෘතිය සඳහා අඩුපාඩු සහිතව මූල්‍ය ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් පමණක් සකස් කර තිබුණි.

- කුළුණ ඉදිකිරීමෙහි කොන්ත්‍රාත් කාලය අවසන් වීමෙන් පසු 2015 අගෝස්තු 28 දිනැති අංක 2K15.217.02(2) දරන කොමිෂන් සභා තීරණය අනුව කොන්ත්‍රාත් කාලය 2017 ඔක්තෝබර් දක්වා දීර්ඝ කිරීමට අනුමැතිය ලබා දී තිබුණද, 2019 මාර්තු 31 දින වන විටත් ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබුණි.

- ඉදිකිරීමේ ප්‍රමාදය හේතුවෙන් ගිවිසුම්ගත මුළු ණය ප්‍රමාණයම ලබාගැනීමට නොහැකි වීම හේතුවෙන් චීන ආනයන හා අපනයන (EXIM) බැංකුව විසින් නිදහස් කරන ලද ණය මුදල එ.ජ.ඩො. 67,259,754 කට සීමා කර තිබුණි. ආරම්භයේ සිටම එකඟතා ගාස්තු ගණනය කිරීම සඳහා සම්පූර්ණ ණය මුදල වූ එ.ජ.ඩො. 88,655,000 යොදා ගැනීම හේතුවෙන් රු.මිලියන 91.88 ක් (එ.ජ.ඩො. 636,508) ක එකඟතා ගාස්තු ප්‍රමාණයක් වැඩිපුර ගෙවා තිබුණි.

- නියමිත කාලය තුළදී ණය මුදල ලබාගැනීමට නොහැකි වීම නිසා 2016 අගෝස්තු 19 දින සිට 2017 ඔක්තෝබර් 27 දින දක්වා කාලය සඳහා උපයෝජනයට නොගත් ණය මුදල සඳහා ගෙවීමට සිදු වූ අමතර එකඟතා ගාස්තු ප්‍රමාණය රු.මිලියන 49.61 ක් හෙවත් එ.ජ.ඩො. 322,984 ක් වී තිබුණි.

- උපදේශන ගාස්තු ලෙස මොරටුව විශ්වවිද්‍යාලයට ගෙවීමට එකඟ වී තිබූ රු.මිලියන 198.69 ක් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර 2015 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතියෙන් සියයට 50.2 ක් පමණක් සම්පූර්ණ කර තිබියදී ගිවිසුමෙහි සැලැසුම්ගත සීමාවන් ඉක්මවමින් උපදේශන සේවා ගාස්තුවෙන් සියයට 75 ක් එනම් රු.මිලියන 150 ක් ගෙවා තිබුණි.

- උපදේශන ගාස්තු වාරික 12 ක් ගෙවීමෙන් පසු එම ගෙවීම් අත්හිටුවා උපදේශන ගාස්තු ගෙවීමේ ගිවිසුම් කොන්දේසි විධිවිධානවලට පරිබාහිරව කොන්ත්‍රාත් අධීක්ෂණය වෙනුවෙන් යැයි සඳහන් කර මාසයකට රු.මිලියන 3 ක් බැගින් 2015 නොවැම්බර් මාසයේ සිට උපදේශක ගාස්තු ගෙවමින් පැවැතුණි.
- 2014 දෙසැම්බර් 14 දින අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ඒ වන විට වැය කර තිබුණු පිරිවැය ගණනය කිරීමෙන් තොරව රු.බිලියන 11.7 ක්

නාගරික සංවර්ධන අධිකාරියට කොටස් වශයෙන් ගෙවීමේ පදනමින් ඉඩම පවරා දීමට සහ වෙන්කර දීමට 2012 ජනවාරි 23 දින දෙපාර්ශවය එකඟ වී තිබුණි.

- මෙසේ අමාත්‍ය මණ්ඩල තීරණවලට අනුකූල නොවී 2015 අප්‍රේල් 10 දින දක්වා රු. මිලියන 2,250 ක් නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවා තිබුණු අතර අමාත්‍ය මණ්ඩල තීරණය හෝ අවබෝධතා ගිවිසුම අනුව සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඉඩම පවරා ගෙන නොතිබුණි.

- කුළුණ ඉදිකිරීමෙන් පසු කාර්යයන් ඉටුකිරීම සඳහා මෙම කුළුණ දේපළ කලමනාකරණ සමාගමකට බදු දීම සඳහා වූ ක්‍රියාවලියක් ආරම්භ කර තිබුණ ද ඒ සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි.

උසස් අධ්‍යාපනය

අයවැය යෝජනා ක්‍රියාත්මක නොකිරීම

විදේශාධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය අඩුවීම

නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම

රුහුණු විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨ ගොඩනැගිල්ල ඉදිකිරීම

උසස් අධ්‍යාපනය

උසස් අධ්‍යාපන ආයතන පද්ධතියේ කාර්යක්ෂමතාවය සහ එහි ඵලදායීතාවය ඉහළ නැංවීමේ අරමුණින් අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් සහ දේශීය විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන ජාත්‍යන්තර මට්ටමට ගෙන ඒම තුළින් දැනුම පදනම් කර ගත් ආර්ථිකයක් කරා ළඟාවීමට හැකිවන අයුරින් උසස් අධ්‍යාපන අවස්ථා ඇති කරලීම මෙම ක්ෂේත්‍රයෙන් අපේක්ෂා කරන ප්‍රතිඵලය වී තිබුණි. එම ප්‍රතිඵලය ලඟා කර ගැනීම සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, ව්‍යවස්ථාපිත මණ්ඩල/ අයතන 36 ක් විසින් පහත සඳහන් කාර්යයන් ඉටුකළ යුතුව තිබුණි.

- ජාතික ප්‍රතිපත්තිය හා අනුකූලව විශ්වවිද්‍යාල අධ්‍යාපනය සැලැසුම් කිරීම සහ සම්බන්ධීකරණය කිරීම.
- උසස් අධ්‍යාපන ආයතනයන්හි අධ්‍යයන ප්‍රමිතීන් පවත්වා ගෙන යාම සහ එම ආයතනයන්හි පරිපාලනය නියාමනය කිරීම.
- විශ්වවිද්‍යාල සහ අනෙකුත් උසස් අධ්‍යාපන ආයතනවලට අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

ඉහත සඳහන් කාර්යභාර්යය ඉටුකිරීම සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂණයේදී අනාවරණය වූ වැදගත් විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනය වෙත බඳවාගනු ලබන සිසුන් ප්‍රමාණය වර්ධනය කිරීම

2017 වර්ෂයෙන් ආරම්භ කර 2020 වර්ෂය අවසාන වනවිට විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන වෙත බඳවා ගනු ලබන සිසුන් ප්‍රමාණය 27,000 ක සිට 40,000 ක් දක්වා වර්ධනය කිරීම 2018 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මේ ප්‍රධාන අරමුණක් වී තිබුණි. එසේ වුවද, 2016/2017 හා 2017/2018 යන ආසන්න වර්ෂ දෙක සැලකීමේදී බඳවා ගෙන තිබූ ශිෂ්‍ය සංඛ්‍යාව පිළිවෙළින් 30,660 ක් හා 30,550 ක් වූයෙන් සිසුන් 118 දෙනෙකුගේ අඩු වීමක් පෙන්නුම් කෙරුණි. එසේම 2017/2018 අධ්‍යයන වර්ෂය තුළ විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා සුදුසුකම් ලැබූ සිසුන්ගෙන් විශ්වවිද්‍යාල සඳහා තෝරාගත් ශිෂ්‍ය සංඛ්‍යාව සියයට 19 ක් වී තිබුණි.

නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම

නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය සඳහා වර්ග අඩි 351,898 ක ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීමට සැලැසුම් කර තිබූ අතර එය 2016 වර්ෂයේ ආරම්භ කර 2019 වර්ෂයේ අවසන් කළ යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 288.5 මූල්‍ය ප්‍රතිපාදන සලසා තිබුණ ද, ඉන් රු.මිලියන 31.3 ක් පමණක් වියදම් කර තිබුණි. එහි මූල්‍ය ප්‍රගතිය සියයට 10 ක් වී තිබුණු අතර, භෞතික ප්‍රගතිය සියයට 14 ක් වැනි පහළ මට්ටමක පැවතුණි. සමාලෝචිත වර්ෂය අවසානය වනවිට කොන්ත්‍රාත්තුව පිරිනැමීමේ ප්‍රසම්පාදන කටයුතු පමණක් සම්පූර්ණ කර තිබුණි.

රුහුණු විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨ ගොඩනැගිල්ල ඉදිකිරීම

රුහුණු විශ්වවිද්‍යාලයෙහි වර්ග අඩි 85,935 ක් වූ තට්ටු 08 කින් යුත් වෛද්‍ය පීඨ ගොඩනැගිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව 2017 වර්ෂයේ දී ආරම්භ කර 2020 වර්ෂයේ නිම කළ යුතුව තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 500 ක ප්‍රතිපාදන සලසා තිබූ අතර ඉන් රු.මිලියන 269.3 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස රු.මිලියන 200 ක් ලබා දී තිබුණ ද, වැඩ ආරම්භ කර වර්ෂයක් ගතවී තිබුණද, ගෙවා තිබූ අත්තිකාරම් මුදල පියවීමට ප්‍රමාණවත් වැඩ කොටසක් නිම කර නොතිබුණි. 2019 මැයි 02 දින වන විටත් නිම කළ වැඩවල මූල්‍ය ප්‍රගතිය රු.මිලියන 101 ක් පමණක් වී තිබුණි.

ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය

ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ සමාලෝචිත වර්ෂයේදී ශිෂ්‍යයන් 5000 කට ණය පහසුකම් සැලසීමට ඉලක්ක කර තිබුණි. මේ යටතේ වර්ෂය තුළ රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල 08 ක උපාධි පාඨමාලා 38 ක් හැදෑරීම සඳහා අයදුම්කරුවන් 1382 ක් පමණක් ලියාපදිංචි වී තිබුණි. ඒ අනුව සමස්ථ ඉලක්ක ගත සිසුන්ගෙන් සියයට 27 ක් පමණක් මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය පහසුකම් ලබාගෙන තිබුණි.

අයවැය යෝජනා ක්‍රියාත්මක නොකිරීම

අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීමේ අරමුණ ඇතිව භාණ්ඩාගාරය විසින් සමාලෝචිත වර්ෂයේදී යෝජනා ක්‍රම හා ව්‍යාපෘති 07 ක් සඳහා රු.මිලියන 663 ක ප්‍රතිපාදන සලසා තිබුණි. ඊට අදාළ සැලැසුම් සකස් කර එම යෝජනා ක්‍රියාවට නැංවීමේ වගකීම අමාත්‍යාංශය වෙත පැවැරී තිබුණ ද, අදාළ ඉලක්ක ලඟා කර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් සලසා තිබුණු මුළු ප්‍රතිපදනය උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි.

විදේශාධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය

- ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන උසස් අධ්‍යාපනය පුළුල් කිරීමේ සහ සංවර්ධනය කඩිනම් කිරීමේ ව්‍යාපෘතිය 2017 වර්ෂයේ ආරම්භ කර තිබුණු අතර එය 2023 වර්ෂයේදී නිම කළ යුතුව ඇත. සමාලෝචිත වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මිලියන 714.21 ක ප්‍රතිපාදන සලසා තිබුණ ද වර්ෂය අවසානයේ දී ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 5 ක් වැනි ඉතා පහළ මට්ටමක පැවතුණි.

- ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු.මිලියන 280 ක් වූ ශ්‍රී ලංකා රජයේ හා සෞදි රජයේ ආධාර ඇතිව ක්‍රියාත්මක වන වයඹ විශ්වවිද්‍යාලීය නගර සංවර්ධන ව්‍යාපෘතියෙහි හා ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු.මිලියන 1450 ක් වූ ශ්‍රී ලංකා රජය හා ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන කැලණිය, සබරගමුව, රජරට හා කොළඹ යන විශ්වවිද්‍යාල සඳහා තාක්ෂණ සම්පත් සංවර්ධන වැඩසටහනෙහි සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය ආරම්භ කිරීමේ ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය සියයට 02 ක් වැනි පහළ මට්ටමක පැවතුණි.
- ශ්‍රී ලංකා රජයේ හා කුවේට් රජයේ ආධාර ඇතිව 2017 වර්ෂයේදී ආරම්භ කර තිබූ සුනාමි විපතින් හානි වූ

ප්‍රදේශවල පිහිටි විශ්වවිද්‍යාල ප්‍රතිසංස්කරණය සහ නැවත ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 133.5 ක ප්‍රතිපාදන සලසා තිබුණි. 2019 වර්ෂයේදී මෙම ව්‍යාපෘතියේ වැඩ අවසන් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසන් වනවිට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 37 ක් හා මූල්‍ය ප්‍රගතිය සියයට 23 ක් වැනි පහළ මට්ටමක පැවැතුණි.

විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අන්තර්ජාලය හරහා අයදුම් කිරීම

2015/2016 අධ්‍යයන වර්ෂයේදී පළමුවරට අන්තර්ජාලය හරහා මෙන්ම සාමාන්‍ය ක්‍රමය යටතේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමට අවස්ථාව සලසා දී තිබුණි. 2017/2018 අධ්‍යයන වර්ෂයේදී මෙම මාර්ගගත පද්ධතිය වෙනුවෙන් වර්ෂය අවසානය වන විට රු.මිලියන 9.35 ක් හා සමාලෝචිත වර්ෂයේ සිට රු.මිලියන 0.70 ක නඩත්තු කිරීම සඳහා වැය කර තිබුණි. එසේ තිබියදී සාමාන්‍ය ක්‍රමය සහ මාර්ගගත පද්ධතිය යන ක්‍රම දෙකම ක්‍රියාත්මක වූ 2015/2016 අධ්‍යයන වර්ෂයේදී සිසුන් ලියාපදිංචි කිරීමේදී සිසුන්ගෙන් ඉදිරිපත්ව තිබූ ගැටළු සංඛ්‍යාව 1081 වී තිබුණි. මාර්ගගත පද්ධතිය පමණක් ක්‍රියාත්මක වූ 2018/2019 අධ්‍යයන වර්ෂයේදී ඉදිරිපත් වී තිබූ ගැටළු සංඛ්‍යාව 5602 දක්වා වැඩි වී තිබුණි.

සප්ත වාර්ෂික නිවාඩු

උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ පරිච්ඡේද 5 අංක 07 අනුව හා 2018 දෙසැම්බර් 17 දිනැති අංක 02/2018 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ ප්‍රකාරව විශ්වවිද්‍යාල අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලවල නිලධාරීන් සප්ත වාර්ෂික නිවාඩු ලබා වෙනත් ආයතනයක සේවයේ යෙදීමේදී හෝ අධ්‍යයන නිවාඩු ලබා විදේශ ගතවීමේදී හෝ නියමිත කාලය අවසානයේදී නැවත සේවයට පැමිණෙන බවට බැඳුම්කර ගිවිසුමකට එළඹිය යුතුව තිබුණි. එසේ වුවද, බැඳුම්කර ගිවිසුම් ප්‍රකාරව නැවත සේවයට නොපැමිණීම හේතුවෙන් විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන 17 කට අදාළව අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 350 දෙනෙකු ගෙන් රු.මිලියන 761.3 ක් අයවිය යුතුව පැවතුණත්, එම මුදල අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

ප්‍රාග්ධන ප්‍රදාන උපයෝජනය නොකිරීම

සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාල සඳහා භාණ්ඩාගාරය විසින් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස රු.මිලියන 14,098 ක් ලබා දී තිබුණි. එම ප්‍රාග්ධන ප්‍රදානවලින් රු.මිලියන 2,261.2 ක් ආදාළ කාර්යයන් සඳහා උපයෝජනය නොකර සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් රඳවා ගෙන තිබුණි.

විදුලිබල හා පුනර්ජනනීය බලශක්තිය

මෙ.වො.31 මොරගොල්ල ජල විදුලි බලාගාරය ඉදිකිරීම් නියමිත දිනයට ආරම්භ නොකිරීම නිසා (Commitment Charges) දණ්ඩන ගෙවීම

ව්‍යාපෘති නිම කිරීමේ ප්‍රමාදය

ගල් අඟුරු ආනයනයේදී නිවැරදි තොරතුරු ඉදිරිපත් නොකිරීම

වත්කම් පවරා නොගැනීම

ගල් අඟුරු අඩුවෙන් සැපයීම

විදුලිබල මණ්ඩලයේ සේවකයින් විසින් ගෙවිය යුතු උපයන විට බදු ගෙවීම් මණ්ඩලය විසින් ගෙවීම

කාර්ය මණ්ඩලයට දීමනා ගෙවීම

පාර්භෝගිකයින් ගෙන් ලබා ගත් තැන්පතු වෙනුවෙන් පොලි ගෙවා නොතිබීම

විදුලිබල හා පුනර්ජනනීය බලශක්තිය

පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර ආශ්‍රයෙන් විදුලිබල උත්පාදනය වැඩි කිරීම මඟින් බලශක්තියෙන් ස්වයංපෝෂිත ජාතියක් බවට පත්කිරිමේ අපේක්ෂාවෙන් විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය හා ව්‍යවස්ථාපිත මණ්ඩල/ආයතන 07 ක් විසින් පහත සඳහන් කාර්යභාරයයන් ඉටු කළ යුතුව තිබුණි.

- විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරිම, පසුවිපරම් කිරීම හා ඇගයීම
- විදුලිබල සම්පත් පාලනය, නියාමනය හා උපයෝගීකරණය උදෙසා උචිත විදුලිබල ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම
- ජලය, තාපය, ගල් අඟුරු සහ සුළං යන මූලාශ්‍රයන් මඟින් විදුලි බලශක්තිය නිපදවීම සම්බන්ධ කටයුතු ගවේෂණය, සැලැසුම්කරණය, අධීක්ෂණය සහ සංවර්ධනය
- ග්‍රාමීය විද්‍යුතය
- බලශක්ති කාර්යක්ෂමතාව ඇතිවන පරිදි ඉල්ලුම කළමනාකරණය කිරිම සහ පුනර්ජනනීය විදුලිබල සංවර්ධනය කිරිම
- පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය

ඉහත සඳහන් කාර්යභාරයන් අමාත්‍යාංශය හා ව්‍යවස්ථාපිත ආයතන විසින් ඉටු කිරීමේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

මෙ.වො. 31 මොරගොල්ල ජල විදුලි බලාගාරය ඉදිකිරීම

මෙගා වොට් 31 ක ධාරිතාවයක් ජාතික විදුලි ජාලය වෙත ලබාගැනීමේ අපේක්ෂාවෙන් මොරගොල්ල ජල විදුලි බලාගාරය ඉදිකිරීමට අදාළ ව්‍යාපෘතිය 2014 වර්ෂයේ ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණි. නමුත් වර්ෂ 3 ක ප්‍රමාදයකින් පසුව 2017 වර්ෂයේ දී එය ආරම්භ කර තිබුණි. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 16,780 ක් වන අතර, ඉන් රු.මිලියන 14,851 මුදලක් ආසියානු සංවර්ධන බැංකුවෙන් ලැබී තිබුණි. 2018 වර්ෂය අවසාන වන විට එහි භෞතික ප්‍රගතිය සියයට 17 ක් වී තිබුණි. ව්‍යාපෘතියේ උපදේශන සේවා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම ප්‍රමාදවීම හේතුවෙන් ව්‍යාපෘතිය නියමිත දිනට ආරම්භ නොකිරීම නිසා ලබාගත් ණය මුදල් වෙනුවෙන් රු.මිලියන 28 ක් හෙවත් එ.ජ.ඩො.177,931 ක් දණ්ඩන ලෙස (Commitment Charges) ගෙවීමට සිදුවී තිබුණි .

ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් ජාල සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතා සංවර්ධන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 23,720 ක මුදලක් ලැබී තිබුණ අතර ව්‍යාපෘතිය 2015 ජනවාරි ආරම්භ කර 2018 ජනවාරි නිම කිරීමට නියමිත විය. ඒ අනුව ව්‍යාපෘතිය 2015 ජනවාරි ආරම්භ කර තිබුණ අතර උපදේශනය සඳහා වූ විෂය පථය JICA ආයතනය සමඟ සාකච්ඡා කොට එකඟතාවයකට පැමිණීම ප්‍රමාද වීම, කොන්ත්‍රාත් කරුවන්ගේ පූර්ව සුදුසුකම් (PQ) සඳහා JICA අනුමැතිය ලබාගැනීම ප්‍රමාද වීම හා ප්‍රසම්පාදන ලේඛන සඳහා JICA අනුමැතිය ලබා ගැනීමට ප්‍රමාද වීම ආදී හේතු නිසා ව්‍යාපෘතිය 2018 ජනවාරි වන විට නිම

කිරීමට නොහැකි වී තිබුණ අතර 2018 දෙසැම්බර් වන විටද එහි නිම කිරීමේ ප්‍රගතිය සියයට 84 ක් පමණක් වී තිබුණි.

ව්‍යාපෘති නිම කිරීමේ ප්‍රමාදය

මෙ.වො.35 ක බ්‍රොඩ්ලන්ඩ්ස් ජලවිදුලි බලාගාරය ව්‍යාපෘතිය 2013 අගෝස්තු මාසයේදී ආරම්භ කර 2017 අගෝස්තු මාසයේදී නිම කළ යුතුව තිබුණි. ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 9,424 ක් ලැබී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 6,426 ක් වැය කර තිබුණු අතර එහි භෞතික ප්‍රගතිය සියයට 58 ක් වී තිබුණි. 2019 මැයි 31 දින වන විටත් එම ව්‍යාපෘතිය නිම කර නොතිබුණි.

මන්නාරම සම්ප්‍රේෂණ මාර්ගයේ යටිතල පහසුකම් ඉදිකිරීම ලොට් ඒ - වව්නියා ග්‍රිඩ් උපපොළ වැඩිදියුණු කිරීමේ හා මන්නාරම ග්‍රිඩ් උපපොළ ඉදිකිරීම සඳහා රු.මිලියන 4,149 ක් ලැබී තිබුණි. ව්‍යාපෘතිය 2015 වර්ෂයේදී ආරම්භ කර 2017 වර්ෂයේදී නිම කළ යුතුව තිබුණි. මන්නාරම ජාල උපපොළ ඉදිකිරීම සඳහා වූ පැකේජයේ විෂය පථය, ව්‍යාපෘති කාල සීමාව අතර තුර වෙනස්වීම හේතුවෙන් ව්‍යාපෘතිය නිම කිරීම ප්‍රමාද වී තිබුණි.

ගල් අඟුරු ආනයනයේදී නිවැරදි තොරතුරු ඉදිරිපත් නොකිරිම

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම විසින් 2016 සැප්තැම්බර් 19 දින සිට 2018 අප්‍රේල් 09 දින දක්වා කාලය තුළ ගල් අඟුරු ආනයනයේදී නිවැරදි ගනුදෙනු වටිනාකම ප්‍රකාශයට පත් නොකිරීම නිසා ශ්‍රී ලංකා රේගුව විසින් රු.මිලියන 205 ක දඩයක් පනවා තිබුණි.

වත්කම් පවරා නොගැනීම

සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම සහ සමූහය විසින් පුද්ගලික සමාගමක් සමඟ බද්ධ ව්‍යාපාරයක් ලෙස දූලි අළු (Fly ash) සහ බරින් වැඩි අළු (Bottom Slag) භාවිතා කරමින් සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදනයක් අලෙවි කිරීමේ කර්මාන්ත ශාලාවක් ඉදිකිරීම සඳහා රු.මිලියන 7.36 ක ආයෝජනයක් සිදුකර තිබුණි. කෙසේ වෙතත්, හවුල් ව්‍යාපාර ගිවිසුම අත්හිටුවා ඇති අතර ව්‍යාපාරික හවුල්කරුවෙකු නොමැතිවීම හේතුවෙන් වත්කම අක්‍රියව පැවතුණි. සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වත්කම ලංකා විදුලිබල මණ්ඩලයට භාර දීමට තීරණය කර 2016 නොවැම්බර් 10 දින සාමාන්‍යාධිකාරීවරයාට සන්නිවේදනය කර තිබුණත් එම වත්කම 2019 ජූලි 15 දින වන විටත් ලංකා විදුලිබල මණ්ඩලය විසින් පවරා ගෙන නොතිබුණි.

ගල් අඟුරු අඩුවෙන් සැපයීම

ගල් අඟුරු සැපයූ සමාගමකින් රු.මිලියන 539.19 ක හිඟ ශේෂයක් වර්ෂ හයක කාලයක සිට ලංකා ගල් අඟුරු සමාගම විසින් එකඟ වූ බේරුම්කරණ ක්‍රමයක් යටතේ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගෙන නොතිබුණි. එමෙන්ම ලංකා ගල් අඟුරු සමාගම විසින් විවෘත කරන ලද දින 90 ක වලංගු කාලය ඉක්මවූ ණයවර ලිපි පහක් වෙනුවෙන් රු.මිලියන 2.93 ක අමතර කොමිස් මුදලක් ගෙවිය යුතුව තිබුණි.

උපයන විට බදු ගෙවීම.

2007 දෙසැම්බර් 13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව 2009 වර්ෂයේ වැටුප් සංශෝධනය මගින් සේවකයින්ගෙන් අයකර ගත යුතු උපයන විට ගෙවීමේ බදු එසේ අයකිරීමකින් තොරව ලංකා විදුලිබල මණ්ඩලය විසින්ම ගෙවා තිබුණි. ඒ අනුව 2010 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ ලංකා විදුලිබල මණ්ඩලය විසින් රු.මිලියන 4,210 ක

අතිරේක වියදමක් කර තිබුණි.

කාර්ය මණ්ඩලයට දීමනා ගෙවීම

2007 නොවැම්බර් 14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට හා 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමණාකරණ සේවා චක්‍රලේඛයේ සඳහන් විධිවිධානවලට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත කාර්ය මණ්ඩලය වෙත රු.මිලියන 1,873 ක විවිධ දීමනා සමාලෝචිත වර්ෂයේ දී ගෙවා තිබුණි.

ලැබිය යුතු ගිණුම්

වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට හිඟහිටිව පැවැති රු.මිලියන 5,235 ක වෙළඳ ණයගැතියෝ හා අනිකුත් ලැබීම් ශේෂ අයකර ගැනීමට මණ්ඩලය විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

ආයෝජන අයකරගැනීමේ අවදානම

ලංකා විදුලිබල මණ්ඩලයේ විශ්‍රාම අරමුදල මගින් බැදුම්කරවල ආයෝජන කළ රු.මිලියන 404 ක් මූල්‍ය මෙවලමක් ලෙස නොපැවතීම නිසා, ඒ වෙනුවෙන් රු.මිලියන 16 ක ලැබිය යුතු පොලිය සහ එම මුදල නොලැබීමේ අවදානමක පැවතුනි. මේ සඳහා සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් හෝ වෙන්කිරීම් හෝ සිදුකර නොතිබුණි.

පාරිභෝගිකයන්ගෙන් තැන්පතු වෙනුවෙන් පොලී ගෙවීම

ලංකා විදුලිබල මණ්ඩලයේ පාරිභෝගිකයින් සතු තැන්පතු වෙනුවෙන් 2009 අංක 20 දරන ලංකා විදුලිබල පනතේ 28(3) උප වගන්තිය අනුව සමාලෝචිත වර්ෂයේදී ගෙවිය යුතු පොලිය රු.මිලියන 1,562 ක් වී තිබුණි.

විදුලිබල පනතට පටහැනිව මිලදී ගැනීම්

ලංකා විදුලිබල මණ්ඩලය විසින් 2013 අංක 31 දරන (සංශෝධිත) ශ්‍රී ලංකා විදුලිබල පනතේ 4 සී(ii) වන උප වගන්තියට පටහැනිව 2016 අප්‍රේල් මාසයේ සිට 2018 දෙසැම්බර් මාසය දක්වා කාලය තුළ ගි.වො පැය 1,398 ක විදුලිබලය ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව රු.මිලියන 34,326 ක හදිසි මිලදී ගැනීම් සිදු කර තිබුණි.

ඛනිජතෙල් සම්පත් සංවර්ධනය

ඛනිජතෙල් නීතිගත සංස්ථා පනත් සංශෝධනය පමාවිම

ජාතික වායු ප්‍රතිපත්තිය පිළියෙල කිරිම අවසන් කර නොතිබීම

තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීමට ක්‍රමවේදයන් හඳුන්වාදී නොතිබුණි.

ඉදිරි සුරකුම් ගනුදෙනු (හෙජින්) සම්බන්ධ නඩු විභාගය අවසන් වී නොතිබීම

තෙල් ප්‍රවාහන නල මාර්ග ජාලය

ඛනිජතෙල් සම්පත් සංවර්ධනය

දේශීය ඛනිජතෙල් හා ස්වභාවික වායු ප්‍රශස්ත නිෂ්පාදනය සමඟ ශ්‍රී ලංකාව බලශක්තියෙන් ස්වයංපෝෂිත ජාතියක් බවට පත්කිරීම අමාත්‍යාංශයේ අපේක්ෂිත ප්‍රතිඵලය වී තිබුණි. එම ප්‍රතිඵලය ළඟා කර ගැනීම සඳහා ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය, ව්‍යවස්ථාපිත මණ්ඩල/ආයතන 04 ක් විසින් පහත සඳහන් කාර්යභාරයන් ඉටු කළ යුතුව තිබුණි.

- ඛනිජතෙල් සම්පත් සංවර්ධනය පිළිබඳ විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩ සටහන් සහ ව්‍යාපෘති සම්පාදනය, පසු විපරම් කිරීම හා ඇගැයීම
- ඛනිජතෙල් ආශ්‍රිත නිෂ්පාදන ආනයනය කිරීම, පිරිපහදුව, ගබඩා කිරීම, බෙදාහැරීම සහ අලෙවි කිරීම
- ඛනිජතෙල් නිෂ්පාදනය සහ පිරිපහදුව සම්බන්ධ කටයුතු
- ඛනිජතෙල් ගවේශණය හා ඒ ආශ්‍රිත කටයුතු
- ඛනිජතෙල් නිෂ්පාදන ප්‍රභවයන්ගෙන් ගෑස් නිෂ්පාදනය හා බෙදා හැරීම
- ඉන්ධන සැපයීම හා බෙදාහැරීමට අදාළ වන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම
- ආයතනයන් අධීක්ෂණය කිරීම

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම පිළිබඳව සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂාවේ අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

ඛනිජතෙල් නීතිගත සංස්ථා පනත් සංශෝධනය කිරීම

2004 වර්ෂයේ සිට ඛනිජතෙල් කර්මාන්තය සම්බන්ධයෙන් නියාමන අධිකාරියක් නොමැති වීම නිසා ඛනිජතෙල් කර්මාන්තයද, 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත යටතේ නියාමනය වන කර්මාන්ත අතරට ඇතුළත් කිරීම සඳහා 2006 වර්ෂයේදී පාර්ලිමේන්තුවේ යෝජනාවක් සම්මත කර ගෙන තිබුණි. ඒ අනුව කර්මාන්තය නියාමනයට අවශ්‍ය මෙවලම් ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවට සපයා දීම සඳහා 2002 අංක 33 දරන ඛනිජතෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත සහ 1961 අංක 28 දරන ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථා පනත සංශෝධනය කිරීමට අදාළ මූලික කටයුතු 2006 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. 2018 දෙසැම්බර් 31 දින වන විටත් එය නිම කර නොතිබුණි.

ජාතික වායු ප්‍රතිපත්තිය සැකසීම

2015 සැප්තැම්බර් 21 දිනැති අතිවිශෙෂ ගැසට් පත්‍ර යේ පල කළ නිවේදනයක් මගින් ස්වාභාවික ගෑස් පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක් සැකසීම සඳහා ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය වෙත බලය ලබා දී තිබුණි .2018 ජූනි මාසය වන විට සකස්කර අවසන් කිරීමට සැලැසුම් කර තිබුණු මෙම ජාතික වායු ප්‍රතිපත්තිය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අවසන් කර නොතිබුණි.

ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය සංවර්ධනය හා පුනරුත්ථාපනය

භූගෝලීය පිහිටීම අනුව මුළු ලෝකයේම අවධානය යොමු වී ඇති ලෝකයේ දෙවන ගැඹුරුතම වරාය වන ත්‍රිකුණාමලය වරාය තුළ 1930 වර්ෂයේ සිට මෙම සංකීර්ණය ස්ථාපිත කර තිබුණි. තෙල් ටැංකි පද්ධතිය ඝන මීටර් 12,500 ක ධාරිතාවකින් යුත් ටැංකි 102 කින් හා අනෙකුත් ආශ්‍රිත පහසුකම්වලින් සමන්විත වේ. දැනට පවතින මුළු ටැංකි 99 කින් සංකීර්ණයේ පහළ කොටසේ ටැංකි 14 ක් ලංකා ඉන්දියානු තෙල් සමාගම භාවිතා කරනු ලැබේ. අතහැර දමා තිබෙන ඉතිරි ටැංකි

නවීකරණය සඳහා මූලික තීරණ ගැනීමේ කටයුතු 2015 අප්‍රේල් 29 දින ආරම්භ කර තිබුණද,ඒ පිළිබඳ අවසන් තීරණයකට එළඹ නොතිබුණු බැවින් නවීකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට 2018 දෙසැම්බර් 31 දින වන විටත් නොහැකි වී තිබුණි

තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂයට අදාළව අමාත්‍යාංශය විසින් තම විෂයපථය යටතට ගැනෙන කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි

අමාත්‍යාංශය විසින් තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සඳහා අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය මෙහෙයවීම සම්බන්ධයෙන් 2018 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු අභ්‍යන්තර චක්‍රලේඛයක් හෝ මඟපෙන්වීමක් නිකුත් කර නොතිබුණු අතර ඒ පිළිබඳව උනන්දුවක් දක්වන පාර්ශව වෙත දැනුවත් කිරීමේ වැඩසටහනක් හෝ ක්‍රියාත්මක කර නොතිබුණි.

අමාත්‍යාංශය විසින් තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟාවීමේදී ඒ පිළිබඳව දත්ත එක්රැස් කිරීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කර නොතිබුණු අතර ඒ සඳහා නිලධාරියෙකු යොදවා නොතිබුණි.

ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟාවීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන හඳුනාගෙන නොතිබුණු අතර අමාත්‍යාංශයේ දැනට පවතින භෞතික සම්පත් හා කාර්ය මණ්ඩලය ඒ සඳහා යොදවා ගැනීමේ ක්‍රමවේදයක් හා තිරසර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමට අදාළ කාර්යයන් නියාමනය සඳහා ක්‍රමවේදයක් හඳුනාගෙන නොතිබුණි.

දේශීය ඛනිජ තෙල් වෙළඳපොල

2018 වර්ෂයේදී දේශීය ඛනිජතෙල් වෙළඳපොලෙන් සියයට 87 ක සැපයුම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් සිදු කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී සමස්ථ ඛනිජතෙල් ආනයනය කිරීම සඳහා එ.ජ.ඩො.මිලියන 4,152 ක් වැය කර තිබුණි. සමස්ත ඛනිජතෙල් වෙළඳපොලේ වෙනස්වීම්වල ප්‍රතිඵලයක් ලෙස, 2018 වර්ෂයේදී බොරතෙල් බැරලයක සාමාන්‍ය මිල පෙර වර්ෂයේදී පැවති එ.ජ.ඩො.57.79 ක මිලට සාපේක්ෂව එ.ජ.ඩොලර් 76.25 ක් දක්වා සියයට 31.9 කින් වැඩි වී තිබුණි. ආනයනය කළ පිරිපහදු කළ ඛනිජතෙල් නිෂ්පාදිත මෙට්‍රික් ටොන් එකක් සඳහා සාමාන්‍ය මිල 2017 වර්ෂයේදී වාර්තා කළ එ.ජ.ඩො. 518.9 ට සාපේක්ෂව 2018 වර්ෂයේදී එ.ජ.ඩො. 650.02 ක් දක්වා සියයට 25.3 කින් වැඩි වී තිබුණි.

ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵල සහ ශුද්ධ වත්කම්වල තත්ත්වය

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව රු.මිලියන 105,028.6 ක බදු පෙර ශුද්ධ අලාභයක් වාර්තා කර තිබුණි. ඉකුත් වර්ෂයේදී රු.මිලියන 2,815.2 ක ලාභයක් උපයා තිබුණි. ශ්‍රී ලංකා මහ බැංකුවේ 2018 වාර්ෂික වාර්තාවට අනුව ජාත්‍යන්තර බොර තෙල් මිල ඉහළ යෑම, එ.ජ.ඩොලරය හමුවේ රුපියල අවප්‍රමාණය වීම (රුපියල අවප්‍රමාණය වීම මගින් රු.මිලියන 82,717.3 ක අලාභයක් වාර්තා කර තිබුණි) සහ ඛනිජ තෙල් නිෂ්පදිතවල දේශීය සිල්ලර මිල ගණන් සංශෝධනය වීම 2018 මැයි මාසය දක්වා ප්‍රමාද වීම වැනි කරුණු මත සංස්ථාව 2018 වර්ෂයේදී අලාභයක් වාර්තා කිරීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

විගණනයට ඉදිරිපත් කරන ලද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනට මුළු වෙළඳ ණයගැතියන්ගේ වටිනාකම රු.මිලියන 86,652.1 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ වෙළඳ ණයගැතියන්ගේ වටිනාකම වූ රු.මිලියන 77,005.4 ක වටිනාකමට සාපේක්ෂව සියයට 12.60 කින් වැඩි වී තිබුණි. මෙම ණයගැති ශේෂය රාජ්‍ය අංශයේ ණයගැතියන් රු.මිලියන 77,120.1 කින් හා පෞද්ගලික අංශයේ ණයගැතියන් රු.මිලියන 9,531.9 කින් සමන්විත විය. ඉන් ලංකා විදුලිබල මණ්ඩලය හා ශ්‍රී ලංකන් ගුවන් සමාගම වෙතින් සංස්ථාවට අයවිය යුතු හිඟ මුදල පිළිවෙලින් රු.මිලියන 46,813.1 ක් හා රු.මිලියන 29,005.3 ක් වී තිබුණි.

ඉකුත් වර්ෂයේ රු.මිලියන 176,991.9 ක්ව පැවති සංස්ථාවේ සෘණ ශුද්ධ වත්කම් ප්‍රමාණය සමාලෝචිත වර්ෂය අවසානයේදී රු.මිලියන 281,761.5 දක්වා රු.මිලියන 104,769.60 කින් තවදුරටත් වැඩි වී තිබුණි. විනිමය අනුපාතයේ සෘණාත්මක විචලතාවය සහ විදේශ මුදලින් ලබා ගන්නා ලද කෙටිකාලින හා දිගුකාලින ණය, මෙම සමුච්චිත අලාභය ඇතිවීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. එබැවින් රජයේ මූල්‍ය සහාය නොමැතිව සංස්ථාව අඛණ්ඩව පවත්වා ගැනීමට ඇති හැකියාව මතභේදයට තුඩු දී තිබුණි.

සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂ 5 ක සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵලය රූපසටහන 50 හි දැක්වේ.



රූපසටහන 50- සංස්ථාවේ ශුද්ධ ලාභය/(අලාභය)
මූලාශ්‍රය - සංස්ථාවේ විගණිත මූල්‍ය ප්රකාශන

ඉදිරි සුරැකුම් ගනුදෙනු (හෙජින්)

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඉදිරි සුරැකුම් ගනුදෙනුවලට අනුව වාණිජ බැංකු කීපයක් සමඟ එළඹ තිබුණු ඉදිරි සුරැකුම් ගිවිසුම් සම්බන්ධයෙන් බේරුම් කිරීමේ ක්‍රියාවලියේ පාර්ශවයක් වශයෙන් සංස්ථාව කැඳවා තිබුණි. පාර්ශව අතර එළඹ තිබූ බේරුම් කිරීමේ ඔප්පු යටතේ එ.ජ.ඩො. මිලියන 60 ක් (රු.මිලියන 7,613 ක්) ස්ටැන්ඩඩ් චාටර්ඩ් බැංකුවට (SCB) 2013 ජූනි 03 දින ගෙවා තිබුණි. එමෙන්ම එ.ජ.ඩො. මිලියන 27 ක් (රු. මිලියන 3,881ක්) ඩොයිෂ් බැංකුවට 2016 අගෝස්තු 04 දින ගෙවා තිබුණි. ලැබී තිබුණු තොරතුරුවලට අනුව 2018 දෙසැම්බර් 31 දින වන විට මෙම ගණුදෙනු හේතුවෙන් සංස්ථාව විසින් රු.මිලියන 13,641 ක පාඩුවක් ලබා තිබුණි. සංස්ථාවේ ඉදිරි සුරැකුම් ගනුදෙනුව (හෙජින්) සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නීති වියදම් වශයෙන් රු.මිලියන 941.2 ක් වැය කර තිබුණි. එයින් රු.මිලියන 370.6 ක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දරා තිබූ අතර රු.මිලියන 567 ක් 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුළ සංස්ථාව විසින් ශ්‍රී

ලංකා මහ බැංකුවට ප්‍රතිපූර්ණය කර නොතිබුණි. කෙසේ වෙතත්, රු.මිලියන 3.1 ක මුදලක් සංස්ථාව විසින් 2019 මැයි 30 දින වන විටත් ප්‍රතිපූර්ණය කර නොතිබුණි. තවද, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට එරෙහිව එ.ජ.ඩො. මිලියන 8.6 ක අයිතියක් සඳහා කොමර්ෂල් බැංකුව විසින් කොළඹ ඉහළ වාණිජ අධිකරණයේ නඩුවක් පවරා තිබෙන අතර එම නඩුව 2018 වර්ෂය අවසානය වන විටද විභාග වෙමින් පැවතුණි.

මුදල් කළමනාකරණය

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය අවසානයේදී ඇමෙරිකානු ඩොලර් මත පදනම් වූ දිගු කාලීන ණය සහ කෙටිකාලීන ණය පිළිවෙලින් රු.මිලියන 1,311.6 හෙවත් සියයට 493 කින් හා රු.මිලියන 115,021.1 හෙවත් සියයට 64 කින් වැඩිවී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂයේදී පොලී වියදම රු.මිලියන 12,053.30 ක හා විදේශීය විනිමය විචලනය මත සිදු වූ විනිමය අලාභය රු.මිලියන 82,717.3 ක් ලෙස එකතුව රු.මිලියන 94,770.60 ක පිරිවැයක් දරා තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය අවසානයේදී මූළු ආයෝජන වටිනාකම රු.මිලියන 83,180.3 කින් හෙවත් සියයට 176 කින් වැඩි වී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එමගින් ඉපයූ මූළු පොලී ආදායම රු.මිලියන 7,732.9 ක් පමණක් වී තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන මගින් නිරූපනය වන ආකාරයට සංස්ථාව විසින් 2018 වර්ෂයේදී විදේශ විනිමය පදනම්ව කෙටිකාලින හා දිගුකාලින ණය ලබා ගෙන ඒවා නැවත කෙටි කාලීනව ආයෝජනය කර ඇති බව නිරූපණය විය. ඒ අනුව, සංස්ථාව තුළ පැවති අරමුදල් උපයෝගී කොට ගෙන විදේශ විනිමය මත පදනම් වූ ණය පියවා දැමීම තුළින් සංස්ථාව දරා ඇති අධික ණය පොලී පිරිවැය සහ විනිමය අනුපාත විචලතාවයන්ගේ අවාසිය අවම කර ගැනීමට සංස්ථාව අසමත් වී තිබුණි. එය සංස්ථාවේ මූල්‍ය පතිඵලය කෙරෙහි දැඩිව බලපා තිබුණි.

තෙල් ප්‍රවාහනය නල මාර්ග ජාලය

දශක ගණනාවකට පෙර ස්ථාපිත කරන ලද නල මාර්ගයන් ඔස්සේ කොළඹ වරායේ සිට කොලොන්නාව තෙල් පර්යන්තය දක්වා ඛනිජ තෙල් නිෂ්පාදන ප්‍රවාහනය කරන අතර එම නල මාර්ග අලුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පැවතුණි. ඉන් නල මාර්ග කිහිපයක් අලුත්වැඩියා කිරීමට නොහැකි තත්ත්වයේ පැවැතීම හේතුවෙන් දැනටමත් අතහැර දමා තිබුණි. දැනට භාවිතයේ ඇති විශ්කම්භය අඟල් 10 සහ අඟල් 14 ඉන්ධන නල කිහිප වාරයක් කාන්දු වීම් වාර්තා වී තිබුණි. එබැවින් මෙම නල මාර්ග ප්‍රතිසංස්කරණය හෝ නවීකරණය කිරීම ඉතා හදිසි අවශ්‍යතාවයක් වි තිබුණි.

මේ අතර, මුතුරාජවෙල තෙල් පර්යන්තය සහ කොලොන්නාව තෙල් පර්යන්තය අතර කිසිදු අන්තර් සම්බන්ධයක් නොමැති අතර එම බාධකය හේතුවෙන් එම පර්යන්තවල ප්‍රශස්ත උපයෝජනයට බාධාකාරී වී තිබුණි. තවද, 2012 සැප්තැම්බර් 13 දින "රට හරහා නල ව්‍යාපෘතිය" ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලබා දී තිබුණද, එය ක්‍රියාත්මක කර නොතිබුණි.

දශක 05 කට පමණ පෙර කොළඹ වරාය (දකුණු ජැටිය) සිට කොලොන්නාව අතර ඉන්ධන ප්‍රවාහනය සඳහා ස්ථාපනය කර තිබුණු අඟල් 12 ක විශ්කම්භයකින් යුත් නලය දශකයකට ආසන්න කාලයක් වැඩ කරන තත්ත්වයේ නොපැවතුණි. මෙම ඉන්ධන නලය 2011 වර්ෂයේදී මහවත්ත ප්‍රදේශයේ මීටර් 300 පමණ ප්‍රමාණයක් නවීකරණය කර තිබුණද, සම්පූර්ණ ක්‍රියාකාරී මට්ටමට ගෙන නොතිබුණි. 2015 පෙබරවාරි 13 දින ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ (CPSTL) අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 09/137න් නල මාර්ග නවීකරණය කිරීම සඳහා රු.මිලියන 260 ප්‍රතිපාදන සලසා තිබුණි. ඒ අනුව 2015 වර්ෂයේදී රු.මිලියන 120 ක වියදමින් මීටර් 2,171 ක් සහ 2016 වර්ෂයේදී රු.මිලියන 153 ක වියදමින් මීටර් 2,573 ක් නිමකර තිබුණි. එසේ වුවද, ඉන්ධන නල

මාර්ගය ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒම සඳහා නවීකරණය කිරීමට ඉතිරිව ඇති දුර ප්‍රමාණය මීටර් 1000 ට වඩා අඩු වුවද, රට තුළ ඉන්ධන සැපයුම් ක්‍රියාවලිය අවහිර වීමට ඇති අවදානම වළක්වා ගැනීම සඳහා නල මාර්ගයේ නවීකරණ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම සඳහා වූ කඩිනම් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

නව ඉන්ධන තොග ගබඩාවක් උතුරු පළාතේ ස්ථාපනය කිරීම.

යුදමය වාතාවරණයෙන් පසු සීඝ්‍රයෙන් වර්ධනය වූ උතුරෙහි ජනතාවගේ හා ආරක්ෂක අංශවල ඉන්ධන අවශ්‍යතා ලංකා බනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් පවත්වාගෙන යන තෙල් තොග ගබඩාව මඟින් සපුරාලන ලදී. එම තොග ගබඩාව කන්කසන්තුරේ සිමෙන්ති සංස්ථාව පිහිටි භූමියේ පිහිටා තිබෙන අතර සිමෙන්ති සංස්ථාව විසින් මෙම තෙල් තොග ගබඩාව එම ස්ථානයෙන් ඉවත් කර ගන්නා ලෙස 2011 වර්ෂයේ දී ලංකා බනිජතෙල් තොග ගබඩා පර්යන්තය සමාගම වෙත දන්වා තිබුණි.

දැනට තෙල් තොග ගබඩාව පවතින සිමෙන්ති සංස්ථාවට අයත් භූමියේම අවශ්‍ය නවීකරණය හා පුළුල් කිරිම සිදුකර ඉන්ධන ගබඩාව පවත්වාගෙන යනු ලැබේ. 2016 ඔක්තෝබර් 19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ඉඩමේ අයිතිය නිරවුල් කර විධිමත් බදු ගිවිසුමකට එළඹ මෙම ගබඩාව පවත්වා ගෙන ඒමටත්, යම්කිසි හිඟ බදු මුදලක් වෙතොත් එය සිමෙන්ති සංස්ථාව වෙත ගෙවීමටත් තීරණය කර තිබුණද, එම තීරණයට අනුකූලව 2019 මැයි 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

අන්තර් සමාගම් ගණුදෙනු ශේෂයන් සහ ගිවිසුම්

රාජ්‍ය සංස්ථාවක් විසින් යම් නිශ්චිත අරමුණක් උදෙසා ස්ථාපිත කර ඇති උප සමාගම්වල කටයුතු විධිමත්ව අධීක්ෂණය කිරීමට සහ මග පෙන්වීම ඉතා අත්‍යාවශ්‍ය කටයුත්තක් වී තිබුණි. එසේ වුවද ලංකා බනිජතෙල් නීතිගත සංස්ථාව විසින් එහි පරිපාලිත සමගම වූ ලංකා බනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමගමෙහි කටයුතු විධිමත්ව සමාලෝචනය කර නොතිබුණි. 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.3 (ආ) ඡේදයට අනුව මව් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අර්ධ වර්ෂයකට වරක් හෝ උප සමාගම්වල කාර්යසාධනය සමාලෝචනය කර කාර්යසාධන වාර්තාවක් පිළියෙළ කර එය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතුව තිබුණත් එසේ කර නොතිබුණි. තවද එකී සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය මගින් ගනු ලබන තීරණ පිළිබඳව විධිමත් දැනුවත්භාවයක් සංස්ථාව සතුව නොතිබුණි. උදාහරණ ලෙස; සංස්ථාව මගින් සිදු කරනු ලබන ප්‍රධාන ව්‍යාපාරික කටයුත්තක් වන නැව් සඳහා ඉන්ධන සැපයීමේ ව්‍යාපාරය, එම උපසමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකට අනුව ක්‍රියාත්මක කර තිබුණද, ඒ පිළිබඳව සංස්ථාව කිසිදු දැනුවත් වීමක් සිදු වී නොතිබුණි. එමෙන්ම, අන්තර් සමාගම් ගනුදෙනු පිළිබඳ විධිමත් සම්බන්ධීකරණයක් ආයතන දෙක අතර නොතිබීම හේතුවෙන් දීර්ඝ කාලයක් තිස්සේ දෙපාර්ශවයේ ජංගම ගිණුම් අතර සැලකිය යුතු වෙනස්කම් පැවැතුණි. සමාලෝචිත වර්ෂය අවසානයේදී එය රු.මිලියන 2,475.80 ක වෙනසක් වී තිබුණි.

තවද ලංකා බනිජතෙල් නීතිගත සංස්ථාව, ලංකා ඉන්දියානු තෙල් සමාගම සහ ලංකා බනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම අතර පොදු පරිශීලක පහසුකම සඳහා වන කොටස්කරුවන්ගේ ගිවිසුම සහ කොටස් මිලදී ගැනීමේ ගිවිසුම්වල 2008 දෙසැම්බර් 31 වන දින කාලය ඉකුත්ව ගොස් තිබුණද, සියලු පාර්ශවයන්ගේ එකඟතාවයෙන් එකී ගිවිසුම් යාවත්කාලීන කර පවත්වා ගැනීමට අවශ්‍ය විධිමත් ක්‍රියාමාර්ග 2019 මැයි 30 දින වන විටත් ගෙන නොතිබුණි.

ග්‍රාමීය ආර්ථික කටයුතු

කිරි ගවයින් ආනයනය කිරිම

රටට අනාරක්ෂිත ලෙස සතුන් ආනයනය කිරිම

තිරසර සංවර්ධන අරමුණු ළඟා කර නොගැනීම

සත්ව ආහාර සඳහා පිරිවැය අධිකවීම

අඹේවෙල කර්මාන්ත ශාලාව නවීකරණය කිරිම

ග්‍රාමීය ආර්ථික කටයුතු

ශ්‍රී ලංකා ආර්ථිකයේ වැදගත් කාර්යභාරයක් ඉටුකරනු ලබන ග්‍රාමීය ජනතාවගේ ආර්ථික මට්ටම ඉහළ නැංවීම උදෙසා 2018 ජනවාරි මාසයේ සිට 2018 මැයි 11 දින දක්වා ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය ලෙසත්, 2018 මැයි 12 දින සිට 2018 දෙසැම්බර් 27 දින දක්වා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථික පිළිබඳ අමාත්‍යාංශය (ග්‍රාමීය ආරථික පිළිබඳ අංශය) ලෙසත් 2018 දෙසැම්බර් 28 දින සිට කෘෂිකර්ම ,ග්‍රාමීය ආර්ථික කටයුතු පශු සම්පත් සංවර්ධන වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය (ආරථික කටයුතු හා පශු සම්පත් සංවර්ධන අංශය) ලෙසත් පැවති අතර ඒ යටතේ දෙපාර්තමේන්තුවක් හා ව්‍යවස්ථාපිත ආයතන 5 කින් හා විශේෂ ආර්ථික මධ්‍යස්ථාන 13 කින් පහත සඳහන් කාර්යය භාරය ඉටු කළ යුතුව තිබුණි.

- ග්‍රාමීය ආර්ථිකය සංවර්ධනය කිරීම සඳහා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
- ග්‍රාමීය ආර්ථික කටයුතු සඳහා මූල්‍යාධාර සම්පාදනය කිරීම
- නවීන තාක්ෂණය යොදා ගනිමින් පශු සම්පත් සම්බන්ධ පර්යේෂණ අංශය පුළුල් කිරීම හා එහි ප්‍රතිඵල මත නිපැයුම් ක්ෂේත්‍රය ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව වර්ධනයක් ඇතිකිරීමට අවශ්‍ය සියලුම පියවර ගැනීමට ප්‍රධානතම කාර්යයන් වී තිබුණි.

අමාත්‍යාංශය හා ඒ යටතේ ස්ථාපිත කර ඇති ආයතන විසින් ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

කිරි ගවයින් ආනයනය කිරීම

ශ්‍රී ලංකා රජය සහ ඕස්ට්‍රේලියානු සහ නෙදර්ලන්ත සමඟ එළඹ තිබුණු ගිවිසුමක් යටතේ කිරිගවයින් 4,500 ක් ආනයනය කර තිබුණි. එම ආනයනික කිරි ගවයින් 4,500 දෙනෙකු පශු සම්පත් මණ්ඩලය වෙත ප්‍රතිණය ගිවිසුමක් යටතේ භාර දී තිබුණි. ප්‍රතිණය ගිවිසුම යටතේ විදේශීය සමාගම් දෙකට ගෙවිය යුතු ණය මුදල හා ඒ සඳහා පොලිය පශු සම්පත් මණ්ඩලය විසින් භාණ්ඩාගාරයට ගෙවිය යුතුව තිබුණි. 2017 දෙසැම්බර් 31 දින වන විට පශු සම්පත් මණ්ඩලය විසින් ගෙවිය යුතු මුදල හා හිඟහිටි පොලිය රු.මිලියන 5,374.17 ක් වී තිබුණි. 2012 වර්ෂයේ සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා වූ කාල පරිච්ඡේදය තුළ පශු සම්පත් මණ්ඩලය විසින් රු.මිලියන 28.26 ක් පොලී මුදලක් පමණක් භාණ්ඩාගාරයට ගෙවා තිබුණි.

පළමු වන හා දෙවන අදියර යටතේ ආනයනය කරන ලද සතුන් සඳහා විශාල මුදලක් වැය කිරීමට සිදුව ඇති බැවින්, මෙම වාරික මුදල මණ්ඩලයට ගෙවීම අපහසු බව 2017 දෙසැම්බර් 22 දින මණ්ඩලයේ සභාපති විසින් විගණනය වෙත දන්වා තිබුණි.

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය ලබා දී ඇති තොරතුරු අනුව පළමු අදියර යටතේ ගොවිපල වෙත ගෙන එන ලද සතුන් 2,143 දෙනෙකුගෙන් 2018 වර්ෂය වන විට එනම් වර්ෂ 5 ක් අවසන් වන විට සතුන් 883 දෙනෙකු හෙවත් ආනයනික සතුන්ගෙන් සියයට 41 ක් පමණක් ඉතිරිව පැවැතුණි. 2015 වර්ෂයේදී ගෙන්වන ලද

සතුන් 2,489 කින් 2018 වන විට එනම් වර්ෂ 3 කට පසු සතුන් 1,796 දෙනෙකු හෙවත් සියයට 72 ක ප්‍රමාණයක් ඉතිරිව පැවැතුණි.

පළමු අදියර යටතේ මේ සතුන් පැටවු දැමීමේ සාමාන්‍ය වර්ෂ 7 ක් තුළ සියයට 45 ක්ද, දෙවන අදියර යටතේ වර්ෂ 4 ක් තුළ සියයට 52.4 ක්ද වී තිබුණු අතර දෙවන පරම්පරාව පැටවු දැමීම පළමු අදියර යටතේ සියයට 21.4 ක්ද දෙවන අදියර යටතේ සියයට 7.17 ක් වැනි ඉතා අඩු අගයක් ද ගෙන තිබුණි.

කිරි ගවයන් 20,000 ක් ආනයනය කිරීම

ග්‍රාමීය ආර්ථිකය පිළිබද අමාත්‍යාංශය වෙත කිරි ගවයන් 20,000 ක් ආනයනය කිරිම සඳහා වූ යෝජනාව සම්බන්ධයෙන් මනා අධ්‍යයනයක් කර හෝ ශක්‍යතා අධ්‍යයනයක් කිරීමෙන් තොරව හා 2007 වර්ෂයේ ටෙන්ඩර් කැඳවීම මගින් තෝරාගත් කොන්ත්‍රාත්කරුටම ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනයෙන් තොරව අමාත්‍යාංශය හා පුද්ගලික සමාගමක් අතර 2014 ඔක්තෝබර් 14 දින එ.ජ.ඩො.මිලියන 73.95 කට ගිවිසුමකට එළඹ තිබුණි.

ව්‍යාපෘතිය අසාර්ථක බවට කරුණු හඳුනා ගෙන තිබුණු නමුත්, ගිවිසුමේ 3.01 හා 3.02 වගන්ති සංශෝධනය කර කිරි ගවයින් 20,000 ක් ආනයනය කිරීමටත් ඉන් 5,000 ක් පළමු අදියර යටතේ ආනයනය කිරීමටත්, එහි සාර්ථකත්වය මත ඉතිරි සතුන් 15,000 ක් දෙවන අදියර යටතේ ආනයනය කරන බවට 2016 නොවැම්බර් මාසයේදී සංශෝධිත ගිවිසුමක් යටතේ එකඟ වී තිබුණි. පසුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය අනුමත කර ගැනීමට අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර 2017 අප්‍රේල් 04 දින අමාත්‍යමණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි.

මෙම කිරි ගවයන් 20,000 ක් ආනයනය කිරිම සඳහා තීරණය කිරීමට ප්‍රථම පෙර ආනයනය කළ කිරි ගවයින් සිටින පශු සම්පත් මණ්ඩලයේ ගොවිපලවල් සම්බන්ධයෙන් විශේෂඥ දැනුම ඇති පුද්ගලයින් මගින් මනා අධ්‍යයනයක් කර නිවැරදි ශක්‍යතා අධ්‍යයනයක් කර නොතිබුණි. 2017 මැයි මාසයේදී හා දෙසැම්බර් මාසයේදී පිළිවෙලින් කිරි ගවයින් 1,994 දෙනෙක් හා කිරි ගවයින් 3024 දෙනෙක් වශයෙන් කිරි ගවයින් 5,011 දෙනෙක් ආනයන කර තිබුණි. ආනයනය කර තිබු එම ගවයින් සඳහා එන්නත්, පරීක්ෂණ ගාස්තු හා රේගු ගාස්තු ඇතුළත්ව ගවයින් 5,000 කට එ.ජ.ඩො.මිලියන 16.74 ක් වැය කර තිබුණි. එම ගවයින් සඳහා තාක්ෂණික කළමනාකරණය සහ ධාරිතා වර්ධනය සඳහා ඒ.ජ.ඩො.868,518.52 ක් හෙවත් රු.මිලියන 135.01 ක් වැය කර තිබුණි. නමුත් එම සතුන්ගේ කාර්යසාධනය ඉතා අඩුමට්ටමක පැවතුණ බව පහත කරුණු අනුව තහවුරු විය.

- ඉහත කිරි ගවයන් අතරින් දෙවන වර ආනයනය කළ දෙනුන් ගෙන් 858 දෙනෙකුගෙන් 803 ක් පළමු වර පැටවු බිහිකර තිබු අතර එයින් පිරිමි සතුන් 242 ක් එනම් සියයට 53 ක ප්‍රතිශතයක් විය. තවද බිහි කළ පැටවුන් 803 න් පැටවු 361 ක් එනම් සියයට 45 ක මිය ගොස් තිබුණි. 2019 පෙබරවාරි මස 28 දින වන විට ඉතිරි ආනයන මවු සතුන් ගණන 533 ක් වන අතර එම සතුන්ගෙන් ගැබ් ගත් සතුන් සංඛ්‍යාව 210 ක් පමණක් එනම් 39% ක් පමණ වන අතර දෙවන වර බිහිකළ පැටවුන් ගණන 116 ක් පමණක් බව නිරීක්ෂණය විය. ඒ අනුව ආනයනය කළ දෙනුන් 858 දෙනා ගෙන් දෙවන වර පැටවි

ලැබී ඇත්තේ සියයට 13 කට පමණි.

- 2017 මැයි 14 දින හා 2017 අගෝස්තු 02 දින ආනයනය කළ සතුන්ගෙන් තෝරාගත් සතුන් 902 ක නියැදියෙන් 2019 පෙබරවාරි 28 දිනට මව් සතුන් 656 ක් පමණක් ජීවත්ව සිටින අතර මිලදී ගත් සතුන් 902 ක ගෙන් පැටවු ලැබී දැනට ගොවිපල තුළ සතුන් 190 දෙනෙක් පමණක් ජීවත්ව සිටින බව තහවුරු විය.
- දෙවන අවස්ථාවේදී ආනයනය කළ සතුන් 3034 දෙනෙක්ගෙන් නියැදියක් වශයෙන් සතුන් 858 ක් තෝරා ගෙන සතුන් 858 කින් කිරි ගොවීන් 12 දෙනෙකු මාසිකව රු.25,240 ක සිට රු.5,200,000 ක් දක්වා පරාසයක ප්‍රමාණයන්ගෙන අලාභ ලබන බව වාර්තා කර තිබුණි.
- කිරි ගවයින් පිළිබඳව කාර්යසාධනය ඇගයීමට පත්කළ කමිටුව විසින් 2018 මාර්තු 20 දින කිරි ගවයන් 20,000 ක ව්‍යාපෘතියේ පළමු අදියර යටතේ මෙරට ගෙන්වූ කිරි ගවයින්ගේ කාර්යසාධනය සාර්ථක බව ප්‍රකාශ කර තිබුණි. පළමු අදියර සාර්ථක බව සඳහන් කරමින් ඉතිරි ගවයින් 15,000 දෙනෙකු ආනයනය කිරීම සුදුසු බව ප්‍රකාශ කර තිබුණි. මෙම කිරි ගවයින් ආනයනය කිරීම සඳහා 2018 වාර්ෂික අයවැය ලේඛනයෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණි. 2018, 2019 හා 2020 යන වර්ෂවලදී පිළිවෙලින් 2,500 ක් 7,500 ක් හා 5,000 ක් වශයෙන් කිරිගවයින් 15,000 ක් ආනයනය කිරීමට අපේක්ෂා කර තිබුණි. ඒ සඳහා 2018 මැයි 08 දින අත්තිකාරම් වශයෙන් පිළිවෙලින් රු.මිලියන 291.61 ක්, රු. මිලියන 874.83 ක් හා රු.මිලියන 5,83.22 ක් වශයෙන් එකතුව රු.මිලියන 1,749.67 ක් ගෙවා තිබුණි. මේ සඳහා පොලිය සහ විදේශ විනිමය අවප්‍රමාණය වීමේ අලාභයද එම සතුන් රට තුළට ගෙන ඒමට පෙර ශ්‍රී ලංකා රජය විසින් දැරීමට සිදුවන බව නිරීක්ෂණය විය. ව්‍යාපෘතියේ අසාර්ථකත්වය හේතුවෙන් 2018 වර්ෂයේ ආනයනයට නියමිත සතුන් 2500 හෝ 2019 සැප්තැම්බර් මාසය වන විටත් ආනයනය කර නොතිබුණි. ඒ අනුව ගෙවා තිබුණු අත්තිකාරම් ඵලදායක වී නොතිබුණි.

රටට අනාරක්ෂිත ලෙස සතුන් ආනයනය කිරීම

1992 අංක 59 දරන සත්ව රෝග පනතේ 28 කොන්දේසිය අනුව සෑම සතෙකුම නිරෝධායන පරීක්ෂාවට ලක් කළ යුතුව තිබුණි. නමුත් ව්‍යාපෘතියේ පළමු අදියර යටතේ මෙරට ගෙන්වූ කිරි ගවයින් පිළිබඳව නියැදියක් පමණක් පරීක්ෂා කර ප්‍රධාන සත්ව නිරෝධායන නිලධාරි සහ පශු වෛද්‍ය පර්යේෂණ අධ්‍යක්ෂ විසින් නිරෝධායන වාර්තාවක් ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව එම සතුන්ගෙන් නියැදියක් පරීක්ෂා කර සතුන් සතු රෝග කාරක දේශීය ගවයින් වෙත සහ මනුෂ්‍යයන් වෙතද බෝවීමේ අවධානමක් ඇති බව සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් වෙත 2018 පෙබරවාරි 28 දින ලිඛිතව දන්වා තිබුණි. තවද, එම වාර්තාවට අනුව නොපමාව ගත යුතු පියවරයන් නිර්ණය කර තිබූ අතර ඇතැම් සතුන් විනාශ කර දැමීමේ අවධානමක්ද අනාවරණය වී තිබුණි. නමුත් දෙවන අධියරට ආනයනය කළ සතුන්ද හුදෙකලා ප්‍රදේශයන් තුළ පශු වෛද්‍ය සුපරීක්ෂණය යටතේ දින 30 ක් තැබීම සිදු නොකර, සෘජුවම ගොවිපල

වෙත ලබා දී තිබුණි. ඒ අනුව ජීන්ටෙක් ආයතනය මගින් සිදු කරන ලද ආනයනික කිරිගව පශ්චාත් මරණ පරීක්ෂණයන් අනුව BVD වෛරසය ශරීර ගතව පැවත ඇති බවත්, ආනයනයේදී නිරෝධායනයන් මගින් එය අනාවරණය කර නොමැති බවත් නිරීක්ෂණය විය.

තිරසර සංවර්ධන අරමුණු ළඟා කර නොගැනීම

කිරි නිෂ්පාදනය වැඩි කිරීම මඟින් කිරිපිටි ආනයනය අඩු කිරීමට හා දියර කිරි පරිභෝජනය වැඩි කිරීමේ අපේක්ෂාවෙන් 2012 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ කිරි ගවයන් ආනයන ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 6,435 ක විදේශ ණය ලබා ගෙන කිරි ගවයින් 9,500 ක් ආනයනය කර තිබුණි. එම ආනයනික කිරි ගවයින් පශු සම්පත් මණ්ඩලයට හා අමාත්‍යාංශය යටතේ පෞද්ගලික ගොවීන් වෙත බෙදා හැර තිබුණි. කෙසේ වුවත්, 2011 වර්ෂයේදී ආනයනික කිරිපිටි ප්‍රමාණය මෙට්‍රික් ටොන් 84.02 ක් වී තිබුණත්, එය 2018 වර්ෂයේදී මෙට්‍රික් ටොන් 99.03ක් දක්වා වැඩිවී තිබුණි. ඒ අනුව කිරිපිටි ආනයනය සැලැසුම් කළ පරිදි අඩුවී නොතිබුණ අතර තිරසර සංවර්ධන අරමුණු ළඟා කර නොතිබුණි.

සත්ව ආහාර සඳහා පිරිවැය අධිකවීම

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, සි/ස මහවැලි සත්ව ව්‍යාපාරික සමාගම හා සි/ස ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන (පුද්ගලික) සමාගම යන සමාගම් තුනේ සත්ව නිෂ්පාදනය හා සත්ව නිෂ්පාදන අලෙවි කිරීම ප්‍රධාන මෙහෙයුම් ක්‍රියාවලිය වී තිබුණි. සත්ව ආහාර වියදම අධික වීම නිසා මෙම ආයතන දිගින් දිගටම පාඩු ලබා තිබුණි. සත්ව නිෂ්පාදන ගොවිපලවල නිෂ්කාර්යයව පවතින විශාල භූමි ප්‍රමාණයේ යටි වගාවන් ලෙස සෝගම්, බඩ ඉරිඟු නිෂ්පාදනය කිරීම හා නිෂ්කාර්යව පවතින ආහාර නිෂ්පාදන යන්ත්‍ර භාවිතා කරමින් ආහාර නිෂ්පාදනය කිරීම මගින් සත්ව ආහාර වියදම අඩු කර ගැනීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. ඉහත සඳහන් ආයතන විසින් විවෘත තරගකාරි ක්‍රමයෙන් බැහැරව සීමිත මිල ගණන් කැඳවා ආහාර මිලදී ගැනීම් සිදු කර තිබුණි.

- ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ගවයින් ඇති කරන ගොවිපලවල් අතරින් ආනයනික එළ ගවයන් ඇති කරනු ලබන ගොවිපොල 04 ක නියැදියක් පරීක්ෂා කරන ලදී. ඒ අනුව 2018 වර්ෂයේ සත්ව ආහාර ටොන් 14,385.21 ක් ආයතන 3 කින් මිලදී ගෙන ඒ සඳහා රු.මිලියන 735.99 ක් වැය කර තිබුණි. එම වියදම එක් එක් ගොවිපල කිරි ආදායමින් සියයට 63 ක සිට සියයට 89 ක් දක්වා වු ඉහළ ප්‍රතිශතයක් වි තිබුණි. එම ගොවිපල 4 හි 2018 වාර්ෂික අලාභයේ එකතුව රු.මිලියන 411.53 වී තිබුණි. නමුත් ජාතික පශු සම්පත් මණ්ඩලයේ ගොවිපොල 4 ක එක් පැයකට එකතුව ගව ආහාර ටොන් 3.75 ක් එනම් වර්ෂයකට එකතුව ටොන් 10,950 (3.75 * දිනකට පැය8 * දින 365) ක් නිෂ්පාදනය කළ හැකි යන්ත්‍ර 4 ක් නිෂ්කාර්යව පැවැතුණි.

- කුකුළු ව්‍යාපෘති ක්‍රියාත්මක ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ගොවිපොල 03 ක් ද, සි/ස මහවැලි සත්ව ව්‍යාපාරික සමාගම හා සි/ස ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන (පුද්ගලික) සමාගම යන ආයතනවලට අයත් ගොවිපොල 02 කට ද අදාළව 2018 වර්ෂයේ කුකුළු ආහාර ටොන් 4,553.33 ක් මිලදී ගෙන ඒ සඳහා රු.මිලියන

225.22 ක් වැය කර තිබුණි. එම පිරිවැය කුකුළු ආදායමින් කුකුළු පාලන සංවර්ධන සමාගමට සියයට 64 ක්ද මහවැලි සත්ව ව්‍යාපාරික සමාගමට සියයට 54 ක්ද, පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ගොවිපොල 03 සඳහා සියයට 36 ක්ද වී තිබුණි. ඒ හේතුවෙන් එම ගොවිපල 5 න් ගොවිපල 2 ක් ම 2018 වර්ෂයේ අලාභ ලබා තිබුණි. නමුත් ඉහත ආයතන තුනට අයත් ගොවිපොල 5 ක එකතුව එක් පැයකට කුකුළු ආහාර ටොන් 9 ක් එනම් වර්ෂයකට එකතුව ටොන් 26,280 ක් (9 * දිනකට පැය8 * දින 365) නිෂ්පාදනය කළ හැකි ඇඹරුම් හා මිශ්‍රණ යන්ත්‍ර කට්ටල 06 ක් ද නිෂ්කාර්යව පැවැතුණි.

අඹේවෙල කර්මාන්ත ශාලාව නවීකරණය කිරීම

මිල්කෝ ආයතනය විසින් අඹේවෙල හයිලන්ඩ් පිටිකිරි කර්මාන්ත ශාලාව නවීකරණය කිරීම සඳහා යුරෝ මිලියන 26.69 ක් හෙවත් රු.මිලියන 4,625.58 ක් වැය කර නව යන්ත්‍ර සවිකර 2017 අගෝස්තු මාසයේදී නිෂ්පාදනයන් ආරම්භ කර තිබුණි. කර්මාන්ත ශාලා ප්‍රගති වාර්තා අනුව 2017 වර්ෂයේදී පිටිකිරි නිෂ්පාදනය ටොන් 7,087 ක් වී තිබුණත්, එය 2018 වර්ෂයේදී ටොන්

නගර සැලසුම් හා ජල සම්පාදනය

නල ජල සහ නල මාලපවහන පහසුකම් ආවරණය

ව්‍යාපෘති නිම කිරීමේ ප්‍රමාදය

අඹතලේ බලශක්ති ඉතුරුම් ව්‍යාපෘතිය තාවකාලිකව අත්හිටුවා තිබීම

යාපනය - කිලිනොච්චිය ජලසම්පාදන ව්‍යාපෘතිය

කොළඹ දිස්ත්‍රික්කයේ නැගෙනහිර ජලසම්පාදන ව්‍යාපෘතිය

නැගෙනහිර පළාත් ජලසම්පාදන සංවර්ධන ව්‍යාපෘති

නගර සැලැසුම් හා ජල සම්පාදනය

වඩා යහපත් ජීවිතයක් සඳහා සැලැසුම්ගත නගර, සුරක්ෂිත පානීය ජලය සහ වැඩිදියුණු කළ සනීපාරක්ෂක පහසුකම් සැලසීම නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ සහ ඒ යටතේ ඇති ආයතනයන්ගෙන් අපේක්ෂා කරන ප්‍රතිඵලය වී තිබුණි. මෙම ප්‍රතිඵලය අත්පත් කර ගැනීම සඳහා අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව හා ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් පහත සඳහන් කාර්යයන් ඉටු කළ යුතුව තිබුණි.

- නගර සැලැසුම් සහ ජල සම්පාදන විෂයයන් හා සම්බන්ධ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සකස් කිරීම හා අදාළ දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂය පථය යටතට ගැනෙන ඒ හා සම්බන්ධ විෂයයන් අධීක්ෂණය සහ ඇගයීම
- විශේෂ නගර සැලැසුම් හා සංවර්ධන කාර්යයන්
- නාගරික සංවර්ධන කටයුතුවලදී ජාතික භෞතික සැලසුම් පදනම් කර ගෙන සියළු ඉදිකිරීම් කටයුතු මෙහෙයවීම හා නියාමනය කිරීම
- සියළු පුරවැසියන්ට පිරිසිදු පානීය ජලය සැපයීම තහවුරු කිරීම පිණිස ක්‍රියාමාර්ග ගැනීම
- ජල සැපයුම් සේවා, මලාපවහන ක්‍රම සහ සනීපාරක්ෂක පහසුකම් පිළිබඳව පරීක්ෂා කිරීම, සැලැසුම් කිරීම, සැලැසුම් සැකසීම, ඉදිකිරීම මෙහෙයවීම සහ නඩත්තු කිරීම
- ප්‍රජා ජල සම්පාදන සහ සනීපාරක්ෂක ව්‍යාපෘති කාර්යක්ෂමව සහ ක්‍රමානුකූලව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවරයන් ගැනීම

අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ඉහත ආයතන දෙක විසින් මෙම කාර්යභාර්යය ඉටුකිරීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය තර පහත සඳහන් කර ඇත.

නල ජල සහ නල මලාපවහන පහසුකම් ආවරණය

ජල සැපයුම හා සනීපාරක්ෂාව අරමුණු කරගනිමින් ජල සම්පාදන මණ්ඩලය විසින් අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ මහා පරිමාණ ජල සම්පාදන විදේශාධාර ව්‍යාපෘති 26 ක් ද, මහාපරිමාණ අපවහන විදේශාධාර ව්‍යාපෘති 07 ක්ද, දේශීය මූල්‍යන ජල සම්පාදන ව්‍යාපෘති 14 ක්ද, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘති 13 ක්ද, ජල ආංශික ප්‍රජා පහසුකම් සඳහා යෝජනා ක්‍රම 09 ක්ද සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාත්මක කර තිබුණි.

ජල සම්පාදන මණ්ඩලයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව 2018 වර්ෂය අවසානය වන විට නල ජල සහ නල මලාපවහන පහසුකම් ආවරණය පිළිවෙලින් සියයට 54.9 ක් සහ සියයට 2.7 ක් කරා ළඟා වීමට අපේක්ෂා කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ළඟා කර ගෙන තිබුණු ප්‍රගතිය පිළිවෙලින් සියයට 50.5 ක් හා සියයට 2.06 ක් පමණක් වී තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ දී ලබා දී තිබූ නව ජල සම්බන්ධතා සංඛ්‍යාව 109,462 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේදී ලබා දුන් 126,701 ක ජල සම්බන්ධතා සංඛ්‍යාව සමඟ සසඳන විට සියයට 14 කින් අඩුවී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට ලබා දී තිබූ මුළු ජල සම්බන්ධතා සංඛ්‍යාව 2,328,634 ක් වී තිබුණි. පසුගිය වර්ෂ 5 ක කාලය ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ජල සැපයුම් ආවරණය පිළිබඳ විස්තර රූපසටහන 51 හා 52 හි දැක්වේ.



රූප සටහන 51 - මුළු නල ජල සැපයුම් ගණන
මූලාශ්‍රය :- කාර්යසාධන වාර්තාව 2018



රූප සටහන 52 - ජල සම්බන්ධතා වර්ධනය
මූලාශ්‍රය :- කාර්යසාධන වාර්තාව 2018

ජල නිෂ්පාදනය හා පරිභෝජනය

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ පිරිපහදු කළ ජල නිෂ්පාදනය, පරිභෝජනය හා ආදායම් නොලබන ජලය පිළිබඳව පසුගිය වර්ෂ 05 තුළ දත්ත පහත රූපසටහන 53 හි දැක්වේ.



රූපසටහන 53 - පිරිපහදු නල ජල නිෂ්පාදනය, පාරිභෝජනය හා ආදායම් නොලබන ජලය
මූලාශ්‍රය :- කාර්යසාධන වාර්තාව 2018

ඉකුත් වර්ෂයේ සියයට 25.24 ක්ව තිබූ රට පුරා සමස්ත ආදායම් නොලබන ජල අනුපාතය සමාලෝචිත වර්ෂයේදී සියයට 24.93 දක්වා සියයට 1.05 කින් අඩුකර ගැනීමට මණ්ඩලය සමත් වී තිබුණි. ඉකුත් වර්ෂයේ සියයට 43.14 ක් ව පැවති කොළඹ නගරයේ ආදායම් නොලබන ජල අනුපාතය සමාලෝචිත වර්ෂයේදී ද සියයට 41.65 ක ප්‍රමාණයක ඉතා ඉහළ අගයක් ගෙන තිබුණි. කොළඹ නගරයේ ආදායම් නොලබන ජලය අවම කර ගැනීම ඉලක්ක කර ගත් මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ ආයෝජන වැඩසටහන යටතේ වන ව්‍යාපෘති 2 හි ප්‍රගතිය ඉතා පහළ මට්ටමක පැවතීමත්, එම ව්‍යාපෘති අපේක්ෂිත

කාලය තුළ නිම කර ගැනීමට නොහැකි වීමත්, යන කරුණු මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. තවද, දකුණ, ඌව හා සබරගමුව යන ප්‍රාදේශිකයන්හි ආදායම් නොලබන ජල අනුපාතය සමාලෝචිත වර්ෂයේදී සියයට 25 ක ප්‍රමාණයද ඉක්මවා තිබුණි. සමස්ත ආදායම් නොලබන ජල ප්‍රතිශතය සියයට 1 කින් අඩුකර ගැනීමට මණ්ඩලයට හැකියාව තිබුණේනම්, ආසන්න වශයෙන් සමාලෝචිත වර්ෂයේදි රු.මිලියන 270 ක පිරිවැය අවම කර ගැනීමට හැකියාව පැවැතුණි.

ව්‍යාපෘති නිම කිරීමේ ප්‍රමාදය

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කළ මහා පරිමාණ විදේශාධාර ව්‍යාපෘති 07 ක කටයුතු කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල කාර්යසාධනය, ඉඩම් නිරවුල් කර ගැනීමේ ප්‍රමාදය, පාරිසරික හා නැවත පදිංචි කිරීමේ ගැටළු පැවතීම, කොන්ත්‍රාත් ප්‍රදානයන් සිදු කිරීම ප්‍රමාද වීම සහ කොන්ත්‍රාත්කරුවන් විසින් අඩු ගුණත්වයකින් යුතුව නල සැපයීම යන හේතූන් නිසා එම ව්‍යාපෘති දින 349 ක සිට දින 2009 ක් දක්වා කාල ප්‍රමාදයන් සිදු කර තිබුණි.

අඹතලේ බලශක්ති ඉතුරුම් ව්‍යාපෘතිය

2018 දෙසැම්බර් 31 දින වන විට අඹතලේ බලශක්ති ඉතුරුම් ව්‍යාපෘතියේ මාස 63 කින් නිම කළ යුතුව තිබුණත් එම කාල පරිච්ඡේදයෙන් මාස 52 ක් හෙවත් සියයට 83 ක කාලයක් ගත වී තිබුණිත්, ව්‍යාපෘතියේ සමස්ථ භෞතික හා මූල්‍ය කාර්යසාධනය පිළිවෙලින් සියයට 10.84 ක් හා සියයට 11.67 ක් වී තිබුණි. එමෙන්ම ණය මුදලේ උපයෝජනය සියයට 15.5 ක අවම අගයක් ගෙන තිබුණු අතර, ක්‍රියාත්මක කළ යුතුව තිබුණු ව්‍යාපෘතියේ සංරචක 05 කින් සංරචක 03 ක කිසිදු ප්‍රගතියක් අත්කර ගෙන නොතිබුණි. මේ නිසා 2019 මාර්තු 31 දින වන විට එ.ජ.ඩො.මිලියන 1.5 කට සමාන රු.මිලියන 227.89 ක (ණය වටිනාකමින් සියයට 2.1ක්) බැදීම් ගාස්තු ගෙවීමට රජයට සිදු වී තිබුණි.

අඹතලේ ජල පවිත්‍රාගාරයේ සිට එලී හවුස් ජල ගබඩාව දක්වා කි.මී.9 ක් දුරට මි.මී.1,200 ප්‍රමාණයේ නල ඇතිරීම ඇතුළු ජල නල හා උපාංග සැපයීමේ කොන්ත්‍රාත්තුව (ICB 04) 2016 ජූලි මාසයේදී ආරම්භ කර 2018 මැයි 04 දින වන විට අවසන් කිරීමට නියමිතව පැවැතියද, කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය මත මීටර් 9000 කින් නල ඇතිරීම් ප්‍රමාණය මීටර් 1316 ක (සියයට 14.62) අඩු ප්‍රගතියක් ලබා ගෙන තිබුණි.

ප්‍රංශ නියෝජිත ආයතනය විසින් නව බැංකු ගිණුමක් විවෘත කරන තෙක් මාස 06 ක කාලයක් මුදල් ගෙවීම තාවකාලිකව අත්හිටවා තිබුණත්, කොන්ත්‍රාත්කරු විසින් 2018 ජූලි මාසයේ සිට 2019 ජූලි 31 දින දක්වා ව්‍යාපෘතියේ ඉදිකිරීම් නවතා තිබුණි.

යාපනය කිලිනොච්චි ජලසම්පාදන ව්‍යාපෘතිය

යාපනය කිලිනොච්චි ජලසම්පාදන ව්‍යාපෘතියේ එක් සංරචකයක් වූ ඉරණමඩු වැවෙන් යාපනයට ජලය ලබා දීමේ කාර්යයට මහජන විරෝධතාව නිසා එම ව්‍යාපෘතිය සඳහා ලබා දී තිබු රු.මිලියන 5,363 ණය මුදල අවලංගු කර තිබුණි. ඒ වන විට එම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වටිනාකමෙන් සියයට 2.3ක් හෙවත් රු.මිලියන 124.64 ක් වියදම් කර තිබුණි. ණය මුදල අවලංගු වීම නිසා ණය නියෝජිතායතනයට රු.මිලියන 11.95 ක හානි පූර්ණ වන්දියක්ද, රු. මිලියන 15.17 ක ඇගයීම් ගාස්තු ද, රු.මිලියන 57.83

ක බැදීම් ගාස්තු ද ඇතුළු එකතුව රු.මිලියන 84.95ක අමතර වියදමක් රජයට ගෙවීමට සිදු වී තිබුණි.

උක්ත ව්‍යාපෘතිය යටතේ රු.මිලියන 1,139 කට ප්‍රදානය කර තිබූ යාපනයේ ජල කුළුණු 18 ක ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව හා රු.මිලියන 5,536 කට ප්‍රදානය කළ පිරිපහදු කළ ජලසම්ප්‍රේෂණ නළ එළීමේ කොන්ත්‍රාත්තුව 2018 දෙසැම්බර් 31 දින වන විට අවසන් කර තිබුණ ද ව්‍යාපෘතිය සඳහා ජල මූලාශ්‍රයක් නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට සියලු ඉදිකිරීම් නිෂ්කාර්යව පැවතුණි.

කොළඹ දිස්ත්‍රික්කයේ නැගෙනහිර ජල සම්පාදන ව්‍යාපෘතිය

රජයේ වාණිජ බැංකුවක් විසින් මූල්‍යනය කරනු ලබන කොළඹ දිස්ත්‍රික්කයේ නැගෙනහිර ජල සම්පාදන ව්‍යාපෘතියේ පැකේජ අංක 1 කට අදාළ කොන්ත්‍රාත්තුව 2014 ජූලි 23 දින පෞද්ගලික ආයතනයක් වෙත රු.මිලියන 4,700 ක ලංසු වටිනාකමක් මත ප්‍රදානය කර තිබුණි. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වශයෙන් පාදුක්ක, සීතාවක, හොරණ හා හෝමාගම ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශ ආවරණය වන පරිදි කි.මී. 176 දුරකින් යුතු බෙදාහැරීමේ ජල පද්ධතියක් හා කි.මී.4 ක දුර ප්‍රමාණයකින් යුතු සම්ප්‍රේෂණ නල (Transmission) ඇතිරීම හා සේවා සම්බන්ධතා සැපයීම වශයෙන් දක්වා තිබුණි.

නමුත්, ව්‍යාපෘතිය සඳහා පයිප්ප හා උපාංග මිලදී ගැනීම සඳහා වැය කළ මුදල, ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ රේටයන් සමඟ සැසඳීමේදී රු.මිලියන 531 ක් වැඩිපුර ගෙවා තිබුණි. ව්‍යාපෘතිය යටතේ නල ඇතිරීමට අපේක්ෂා කළ දුර ප්‍රමාණය මීටර් 32,550 ක් වී තිබුණත් මීටර් 131,000 ක් දුරකට නල එළීම සහා බට ආනයන කර ඒ වෙනුවෙන් රු.මිලියන 77.7 ක් කොන්ත්‍රාත්කරු වෙත වැඩිපුර ගෙවා තිබුණි. තවද ව්‍යාපෘතිය සඳහා ජල මනු 4900 ක් මිලදී ගැනිම සඳහා වැය කළ මුදලත්, ඒවායේ සාමාන්‍ය වෙළෙඳපොළ වටිනාකමත් අතර සැසඳීමේදී රු.මිලියන 8.9 ක් වැඩිපුර ගෙවා තිබුණි.

නැගෙනහිර පළාත් ජලසම්පාදන සංවර්ධන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන පානම ජලසම්පාදන යෝජනා ක්‍රමය මගින් රු.මිලියන 253.83 ක් වැය කර ජල කුළුණක්, පොම්පාගාරයක්, සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ පද්ධතියක් ඉදිකර තිබුණි. ඒ සඳහා සුදුසු ජල මූලාශ්‍රයක් නොතිබීම නිසා එම ව්‍යාපෘතිය 2016 සැප්තැම්බර් 30 දින සිට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිෂ්කාර්යව පැවතුණි.

ධාර්මාර්ග හා ඵල සම්පත්

සේවක අර්ථසාධක අරමුදල් දායක රඳවා ගැනීම

ප්‍රතිසංස්කරණය කළ වැව්වලින් අපේක්ෂිත ප්‍රතිඵල නොලැබීම

මානව සම්පත් කළමනාකරණය

විධිමත්ව පවරා නොගත් වත්කම්

අනාර්ථික වියදම්

වාරිමාර්ග හා ජල සම්පත්

කෘෂිකාර්මික කාර්යයන් සඳහා අවශ්‍ය කෙරෙන වාරිජලය පැවතීම සහතික කිරීම මෙම අංශයෙන් අපේක්ෂා කරන ප්‍රතිඵලය වී තිබුණි. මෙම ප්‍රතිඵලය අත්කර ගැනීම සඳහා අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුවක් සහ ව්‍යවස්ථාපිත ආයතන දෙකක් විසින් පහත සඳහන් කාර්යභාරයන් ඉටු කළ යුතුව තිබුණි.

- වාරිමාර්ග, ජලාශ, ජල සම්පත් කළමනාකරණ විෂයයන්ට සහ අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ හා රාජ්‍ය ව්‍යාපාරයන්හි විෂය පථය යටතට එන සෑම විෂයයකටම අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සැකසීම හා ක්‍රියාත්මක කිරීම.
- වාරිමාර්ග යෝජනා ක්‍රම, ජල ප්‍රවාහනය සහ ගංවතුර ආරක්ෂණ යෝජනා ක්‍රම, ලවන ජලය ඉවත් කිරීමේ යොජනා ක්‍රම, ප්‍රවර්ධනය, ඉදිකිරීම, ක්‍රියාත්මක කිරීම, නඩත්තුව කිරීම, නැවත සංවර්ධනය කිරීම සහ කළමනාකරණය කිරීම.
- ගංඟා, ඇළ දොළ සහ අනෙකුත් ජල මූලාශ්‍ර දූෂණය වැලැක්වීම.
- වැසි ජලය රැස් කිරීම.
- ඉංජිනේරු උපදේශන සේවා සහ ඉදිකිරීම්.
- ජල සම්පත් මණ්ඩල පනත ක්‍රියාත්මක කිරීම.

ඉහත සඳහන් කාර්යභාරයන් අමාත්‍යාංශය හා ඒ යටතේ වන ආයතන විසින් ඉටු කිරීම පිළිබඳව සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේ දී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

සේවක අර්ථසාධක අරමුදල් දායකය රඳවා ගැනීම

කොත්මලේ වාරිමාර්ග හා ජල කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු ආයතනයේ සේවයේ නියුක්ත සේවකයන්ගෙන් 2017 හා 2018 යන වර්ෂවල වැටුපෙන් කපා ගන්නා ලද රු.927,580 ක් වූ රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදල් දායකය ප්‍රේෂණය නොකර තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

වැව් ප්‍රතිසංස්කරණය කළ වැව්වලින් අපේක්ෂිත ප්‍රතිඵල නොලැබීම

ප්‍රධාන සහ මධ්‍යම වාරිමාර්ග යෝජනා ක්‍රම ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා අමාත්‍යාංශය විසින් සලසා තිබුණු රු.මිලියන 54.83 ක් වැය කර ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සතු වැව් 03 ක් ප්‍රතිසංස්කරණය කර තිබුණි. එහෙත් ඉන් රු.මිලියන 3.71 ක් වැය කර ප්‍රතිසංස්කරණය කරන ලද මුදියන්නෑගම වැවෙන් වගා කරමින් තිබුණු කුඹුරු ඉඩම් අක්කර 15 කින් 14 ක්ම ගොඩකර ගොඩ ඉඩමක් බවට පත්කර තිබුණි. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් කුඩාගලේ වැව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 2016, 2017 සහ 2018 යන වර්ෂවලදී අමාත්‍යාංශයෙන් රු.මිලියන 6.19 ක් වැය කර තිබුණි. වැවේ සොරොව්ව කැඩී තිබුණු බැවින් වැවේ එකතුවන ජලය වගා කටයුතු සඳහා ප්‍රයෝජනයට ගැනීමට නොහැකි වී තිබුණි. වැවෙන් පෝෂණය වන කුඹුරු අක්කර 95 ක් වගා නොකිරීම වැය ප්‍රතිසංස්කරණය සඳහා වැය

කළ රු.මිලියන 6.19 ක වියදම නිෂ්ඵල වී තිබුණි.

මානව සම්පත් කළමනාකරණය

කොත්මලේ වාරිමාර්ග හා ජල කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු ආයතනය සඳහා තනතුරු 06 ක් අනුමත කර තිබුණි. එම අනුමත තනතුරු සංඛ්‍යාව ඉක්මවා 15 දෙනෙකු බඳවා ගෙන තිබුණි. අනුමත කම්කරු තනතුරු 04 කට බඳවා ගැනීම් සිදු නොකර කොන්ත්‍රාත් පදනම මත 28 දෙනෙකු බඳවා ගෙන වැටුප් හා දීමනා ලෙස සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 19.58 ක් ගෙවා තිබුණි. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව තනතුරු නාම 05 ක් සඳහා 06 දෙනෙකු ආයතනය විසින් බඳවා ගෙන තිබුණි. කළමනාකරණ සහකාර තනතුරක් අනුමත කර තිබුණ ද ඒ සඳහා 10 දෙනෙකු ද, අනියම් පදනම මත කම්කරුවන් 25 දෙනෙකුද බඳවා ගෙන තිබුණි.

කොත්මලේ වාරිමාර්ග හා ජල කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු ආයතනය සඳහා කථිකාචාර්ය තනතුරු 07 ක් අනුමත කර තිබුණ ද, එම කථිකාචාර්යවරුන් බඳවා ගැනීමට කටයුතු නොකර බාහිර දේශකයන් ඒ සඳහා යොදවා ගෙන තිබුණි. 2017 හා 2018 වර්ෂවලදී පිළිවෙලින් බාහිර දේශකයන් 25 දෙනෙකුට හා 11 දෙනෙකුට රු.මිලියන 1.10 ක් හා රු.මිලියන 0.70 ක් වශයෙන් එකතුව රු.මිලියන 1.80 ක් ගෙවා තිබුණි.

වත්කම් කළමනාකරණය

හිටපු අමාත්‍යවරයා වෙත 2017 වර්ෂයේදී ලබා දී තිබුණු රු.640,354 ක් වටිනා වත්කම් ආපසු පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. 2010 මැයි 10 දිනැති අංක CA/1/17/1 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛයේ 2.1 ඡේදයට පටහැනිව අමාත්‍යවරයාගේ පෞද්ගලික ආරක්ෂක නිලධාරින්ට, අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදනවලින් පිළිවෙලින් රු.මිලියන 2.20 ක් හා රු.මිලියන 0.92 ක් වශයෙන් එකතුව රු.මිලියන 3.12 ක දීමනා ගෙවා තිබුණි.

වෙනත් දෙපාර්තමේන්තු, අමාත්‍යාංශ හා ජල සම්පත් මණ්ඩලයට අමාත්‍යාංශය සතු වාහන 129 ක් ලබා දී තිබුණ ද එම ආයතනවලට අයිතිය පවරාදීමට කටයුතු කර නොතිබුණි. එම වාහනවල වටිනාකම ගණනය කර මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි.

විධිමත්ව පවරා නොගත් වත්කම්

වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත රාජ්‍ය ආයතන 07 කින් රු.මිලියන 332.95 ක් වටිනා වාහන වාහන 89 ක් හා රු.මිලියන 0.27 ක් වටිනා යතුරු පැදි 27 ක් පවරා ගැනීමකින් තොරව භාවිතා කර තිබුණි.

අනාර්ථික වියදම්

උස්ගල සියඹලාංගමුව වැවේ සිට මහගල්ගමුව වැව දක්වා පෝෂිත ඇළ ඉදිකිරීමේ දී යන්ත්‍ර සැපයුම්කරුවන් සමග එළඹ තිබුණු යන්ත්‍ර සැපයීමේ ගිවිසුම් කාලය අවසන්වීමට පෙර එම ගිවිසුම් අවලංගු කර තිබුණි. පසුව වැඩි මිල ගණන් යටතේ එම යන්ත්‍ර සැපයුම්කරුවන් සමඟම නව ගිවිසුම්වලට එළඹ තිබුණි. මේ නිසා රු.මිලියන 1.16 ක අනාර්ථික වියදමක් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් සිදු කර තිබුණි.

කෘෂිකර්මය

කාබනික පොහොර නිෂ්පාදනය වැඩිදියුණු කිරිම

රක්ෂණ වගකීම් වටිනාකම වැඩියෙන් තක්සේරු කිරිම

පර්යේෂණ වියදම්

ව්‍යාපෘති අතහැර දැමීම

නිෂ්ඵල වියදම්

ධිවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය

ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය

ගොවීන්ගේ භාර කාර අරමුදල

කෘෂිකර්මය

රටතුළ ආහාර සුරක්ෂිතතාවය හා ජාතික සමෘද්ධිය වෙනුවෙන් ආහාර නිෂ්පාදනය වැඩිකිරීම උදෙසා කාර්යක්ෂම, ඵලදායී හා ශක්තිමත් කෘෂිකාර්මික අංශයක් බිහි කිරීම මෙහි දැක්ම වේ.මෙම අරමුණු ඉටුකරගැනීම සඳහා පහත සඳහන් කාර්යභාරයන් ඉටු කළ යුතුව තිබුණි.

- කෘෂිකාර්මික අංශයේ සංවර්ධන කටයුතු උදෙසා ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සැකසීම හා පහසුකම් සැලසීම.
- දේශීය ආහාර සහ අතිරේක ආහාර සංචිත විධිමත්ව කළමනාකරණය මඟින් සුරක්ෂිතතාවය ඇති කිරීම.
- ආහාර නිෂ්පාදනයේදී රසායනික පොහොර හා පළිබෝධනාශක භාවිතය අවම කර, ඉවතලන අපද්‍රව්‍ය කළමනාකරණය තුළින් වස විසින් තොර, පරිසර හිතකාමී සහ සෞඛ්‍යාරක්ෂිත කෘෂි නිෂ්පාදන ජනතාව වෙත ලබාදීම. රසායනික පොහොර භාවිතය විධිමත් කිරීම.
- යාන්ත්‍රීකරණය, නවතාකරණය, කාර්යක්ෂම ජල කළමනාකරණය, බෝග විවිධාංගීකරණය පාංශු සංරක්ෂණ ක්‍රම හඳුන්වාදීම මඟින් බෝගවල නිෂ්පාදන ඵලදායීතාවය ඉහළ නැංවීම සහ නිෂ්පාදන පිරිවැය අවම කිරීම.
- ඉහළ ගුණාත්මයෙන් යුත් ස්වයං බීජ නිෂ්පාදනය, අගය එකතු කළ නිෂ්පාදන ක්‍රමවේද ගොවීන් අතර ප්‍රචලිත කිරීම, යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) සහ යහපත් නිෂ්පාදන පිළිවෙත් හඳුන්වාදීම මඟින් දේශීය සහ විදේශීය වෙළඳපල සඳහා ප්‍රමිතියෙන් යුතු උසස් කෘෂි නිෂ්පාදන සඳහා නිෂ්පාදකයින් යොමුකිරීම.
- සියළු කැඩීබිඳී ගිය වැව්, අමුණු සහ ඇළමාර්ග ප්‍රතිසංස්කරණය සහ පුරන් කුඹුරු අස්වැද්දීම මඟින් වී නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා දායකවීම.

කෘෂිකර්ම අමාත්‍යාංශය, දෙපාර්තමේන්තු 2 ක් ව්‍යවස්ථාපිත මණ්ඩල හා ආයතන 10 ක් විදේශ ව්‍යාපෘතියක් හා අරමුදල් 2 ක් මඟින් ඉහත සඳහන් කාර්යභාරය ඉටුකිරීම පිළිබඳව සිදුකළ නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

කාබනික පොහොර නිෂ්පාදනය වැඩිදියුණු කිරීම

කළුතර සහ මාතර දිස්ත්‍රික් කාර්යාලවලට කාබනික පොහොර නිෂ්පාදනය වැඩිදියුණු කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ලබාදුන් එකතුව රු.400,000 ක ප්‍රතිපාදන හා ගොවිජන සේවා මධ්‍යස්ථාන 03 ක් මගින් ගොවීන් තිදෙනෙකුට ලබාදුන් එකතුව රු.900,000 ක් වූ ණය මුදල් එම කාර්යයට යොදවා නොතිබුණි.

පර්යේෂණ ව්‍යාපෘති අවසන් නොකිරීම

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය මගින් 2015 හා 2016 වර්ෂවලදී පර්යේෂණ ව්‍යාපෘති 09 කට රු.මිලියන 6.2 ක් හා 2017 වර්ෂයේදී ව්‍යාපෘති 04 ක පර්යේෂණ කටයුතු සඳහා රු.මිලියන 3.4 ක් වශයෙන් එකතුව රු.මිලියන 9.6 ක් වැය කර තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම පර්යේෂණ අවසන් කර නොතිබුණි. මේ නිසා 2015 වර්ෂයේ සිට වියදම් කර තිබුණත්, එමගින් කිසිදු ප්‍රතිඵලයක් ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

රක්ෂණ වගකීම වටිනාකම වැඩියෙන් තක්සේරු කිරීම

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය විසින් 2018 අප්‍රේල් 01 දින සිට 2019 මාර්තු 31 දින දක්වා අනිවාර්ය බෝග වර්ග 6 වෙනුවෙන් රු.මිලියන 7,500.00 ක උපරිම රක්ෂණ වගකීම් ලබා දීම සඳහා නොමිලේ රක්ෂණය කිරීමට තීරණය කර තිබුණි. අතීත දත්ත අනුව රු.මිලියන 5,000.00 ක් පමණ විය හැකි රක්ෂණ වගකීම ප්‍රතිරක්ෂණ කිරීම සඳහා වටිනාකම රු.මිලියන 3,500.00 ක් වී තිබුණත්, මණ්ඩලය විසින් රු.මිලියන 5,315.00 ක ප්‍රතිරක්ෂණ වගකීමට එළඹ තිබුණි. මේ නිසා රු.මිලියන 1,815.00 ක් වැඩියෙන් තක්සේරු කර ප්‍රතිරක්ෂණය කර තිබුණි.

ඉහත සඳහන් ප්‍රතිරක්ෂණයට අදාළ ගිවිසුම අනුව රු.මිලියන 2,185.00 ක් දක්වා වන්දි වටිනාකම මණ්ඩලය විසින් දැරීමටද, රු.මිලියන 1,500.00 ක වන්දි මුදල් ජාතික රක්ෂණ භාර අරමුදලින් දැරීමෙන් පසු ප්‍රතිරක්ෂණයට යාමට හිමිකම තිබුණි. නමුත් ප්‍රතිරක්ෂණ වාරික වටිනාකම වූ රු.මිලියන 675.76 ක් මණ්ඩලය විසින් ගෙවා තිබුණි. 2019 අප්‍රේල් 30 දින වන විට 2018 යල හා 2018/19 මහ කන්න වෙනුවෙන් රු.මිලියන 412.62 ක් වන්දි වශයෙන් ගෙවා තිබුණි. විදේශීය ප්‍රතිරක්ෂණ වාරික ලෙස රු.මිලියන 473.03 ක මුදල නිෂ්කාර්ය වී තිබුණි.

පර්යේෂණ වියදම්

පසු අස්වනු කළමනාකරණ ආයතනයේ ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන යටතේ ආනයනික ආහාර වර්ග 07ක බැර ලෝහ වර්ග 04ක් අන්තර්ගතව තිබේද යන්න පරීක්ෂා කිරීම සඳහා 2017 වර්ෂයේ රු.මිලියන 1.96 ක් වැය කර තිබුණි. පර්යේෂණය සඳහා 500 කින් යුත් නියැදියක් පරීක්ෂා කර තිබුණු අතර ඇතැම් ආහාර ද්‍රව්‍යවල උපරිම ආරක්ෂක මට්ටම ඉක්මවා බැරලෝහ අන්තර්ගත බව තහවුරු කර ගෙන තිබුණි. ඒ සම්බන්ධව විධිමත් ක්‍රියාමාර්ග ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. මේ නිසා පර්යේෂණ සඳහා වැය කළ වියදම නිෂ්ඵල වී තිබුණි.

ව්‍යාපෘති අත්හැර දැමීම

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ එළවළු පළිබෝධකයින් පාලනය සඳහා ජෛව විද්‍යාත්මක පළිබෝධ පාලකයින් යොදා ගැනීමේ ව්‍යාපෘතියක් සඳහා සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 17 ක ප්‍රතිපාදන සලසා තිබුණි. ව්‍යාපෘතියේ පරිපාලන හා ක්ෂේත්‍ර පර්යේෂණ වියදම් වෙනුවෙන් රු.මිලියන 1.15 ක් වියදම් කිරීමෙන් පසු ව්‍යාපෘතිය අතහැර තිබුණි. මේ නිසා ව්‍යාපෘතිය වෙනුවෙන් සිදු කළ වියදම නිෂ්ඵල වී තිබුණි.

නිෂ්ඵල වියදම්

- කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතියේ ගොවි පුහුණුව හා ධාරිතා සංවර්ධනය සඳහා උපදේශකවරුන් විසින් සකසන ලද පුහුණු අත්පොත් සහ වැඩපොත් මුද්‍රණය කිරීමට 2018 වර්ෂයේදී රු.මිලියන 28.64 ක් වැය කර තිබුණි. 2019 මැයි 13 දින වන විටත් ගොවීන් සඳහා පුහුණු වැඩසටහන් ආරම්භ නොකිරීම නිසා වැය කළ මුදලේ ප්‍රතිඵල අත්කර ගැනීමට නොහැකි වී තිබුණි.
- කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය මඟින් දිස්ත්‍රික්ක 5 ක ගොවීන්ගේ අයදුම්පත් 281,250 ක් ස්කෑන් කර පරිගණක ගතකිරීමට 2017 අගෝස්තු මාසයේ සිට 2018 ජූලි මාසය දක්වා රු.මිලියන 2.76 ක් වැය කර තිබුණි. එම දත්ත වන්දි ගෙවීමේ ක්‍රියාවලියට උපයෝගී කර ගෙන නොතිබුණි.
- සීතාවක උද්භිද උද්‍යානයේ නැරඹුම් මැදිරිය ඉදිකිරීම සඳහා රු.මිලියන 1.34 ක් වැය

කර තිබුණි. එම ඉදිකිරීම් සඳහා කුඹුක් දැව යොදා ගෙන තිබුණි. එම ඉදිකිරීම් පිළිබඳව 2019 පෙබරවාරි 06 දින සිදු කළ භෞතික පරික්ෂාවේදී කොන්ත්‍රාත්තුව අවසන් කර වර්ෂ 03 ක පමණ කාලයක් ගත වී තිබුණත්, ඉදිකිරීම් සඳහා යොදා ගෙන තිබුණු කුඹුක් දැව විශාල ප්‍රමාණයක් පළුදු වී දිරාපත් වී තිබුණි. කුඹුක් දැව වර්ෂාව සඳහා ඔරොත්තු දෙන දැවයක් සේම දීර්ඝ කාලයක් භාවිතා කළ හැකි දැව වර්ගයක් වුවත් එම කොන්ත්‍රාත්තුව සඳහා ගුණාත්මක මට්ටමේ කුඹුක් දැව යොදා ගෙන නොතිබුණි.

ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය

1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත මඟින් මෙම යෝජනා ක්‍රමය ස්ථාපිත කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

- සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විට විශ්‍රාම වැටුප් වගකීම රු.මිලියන 3,590.89 ක් වූ අතර එය ඉකුත් වර්ෂයට වඩා සියයට 8.9 ක වැඩි වී තිබුණි. 2018 දෙසැම්බර් 31 දිනට සමුච්චිත අරමුදලෙහි රු.මිලියන 2,947.93 ක් දක්වා ඍණාත්මක වී තිබුණි. මෙම තත්ත්වය යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි. යෝජනා ක්‍රමය ප්‍රතිව්‍යුහගත කර මූල්‍ය ශක්‍යතාවයකින් යුතුව ක්‍රියාත්මක කිරීමට ආයතනය 2019 සැප්තැම්බර් 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

- 2017 ජනවාරි මාසයේ සිට ධීවරයන් 95 දෙනෙකුට විශ්‍රාම වැටුප් ගණනය කර ගෙවා තිබුණි. 2011 ජනවාරි මාසයේ සිට 2016 දෙසැම්බර් මාසය දක්වා කාලයට අදාළව විශ්‍රාමිකයන්ට රු.මිලියන 2.79 ක විශ්‍රාම වැටුප් ගෙවිය යුතුව තිබුණි. එම හිඟහිටි විශ්‍රාම වැටුප් 2019 සැප්තැම්බර් 30 දින වන විටත් නිරවුල් කිරීමට නොහැකි වී තිබුණි.

ගොවි විශ්‍රාම වැටුප් හා සාමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය

මෙම යෝජනා ක්‍රමය 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත මඟින් ස්ථාපිත කර තිබුණි. මෙම යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

- සක්‍රීය දායකයන් හා ගොවි විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් වගකීම සඳහා ආයු ගණක තක්සේරුව කාලානුරූපීව සිදු කළ යුතුව තිබුණි. මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු.මිලියන 66,508.21 ක විශ්‍රාම වැටුප් වගකීම සම්බන්ධයෙන් එසේ ආයු ගණක තක්සේරුවක් කර නොතිබුණි.

- 2014 මාර්තු 14 දිනැති අංක 1853/49 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද ගොවි විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ යෝජනා ක්‍රමය අනුව විශ්‍රාම වැටුප් දායක අයකර ගැනීම හා ගෙවීම් සිදු කළ යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 24.55 ක විශ්‍රාම වැටුප් දායකයන් අය කර ගෙන තිබුණු අතර, විශ්‍රාම වැටුප් වශයෙන් රු.මිලියන 3,059.37 ක් ගෙවා තිබුණි. විශ්‍රාම වැටුප් දායක අඩු වී ගෙවීම් වැඩිවීම නිසා රු.මිලියන 2,725.00 ක්

භාණ්ඩාගාරය වෙතින් ලබා ගැනීමට සිදු වී තිබුණි. අතිවිශේෂ ගැසට් පත්‍රය පල කළ නිවේදනයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව විශ්‍රාම වැටුප් දායක මුදල් අයකර ගැනීමට කටයුතු නොකිරීම නිසා තවදුරටත් විශ්‍රාම වැටුප් ගෙවීමට භාණ්ඩාගාරයේ දායකත්වය ලබා ගැනිමට සිදු වී තිබුණි.

- විශ්‍රාම ගිය ගොවීන් සඳහා 2017 අප්‍රේල් මාසයේ සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ ගොවීන් 19,283 කට හිමි විශ්‍රාම වැටුප් එකතුව රු.මිලියන 451.32ක්ද, 2012 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාළව ගොවීන් 90,573 කට හිමි රු.මිලියන 3,033.33 ක් වශයෙන් එකතුව රු.මිලියන 3,484.65 ක විශ්‍රාම වැටුප් ප්‍රමාණයක්ද 2019 සැප්තැම්බර් 30 දින වන විටත් ගෙවා නොතිබුණි.

ගොවීන්ගේ භාරකාර අරමුදල

2002 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල සංදේශයක් මඟින් පුළුල් කරන ලද කෘෂිකාර්මික සංවර්ධන හා ගොවි ජනතාවගේ සුබ සාධනය වැඩි දියුණු කිරීම, සුළු ගොවීන්ට කෘෂිකාර්මික ණය පහසුකම් වෙළඳපල ණය පහසුකම් සැපයීම, කෘෂිකාර්මික යෙදවුම් සම්පාදනය කිරීම, දැනුවත් කිරීමේ වැඩසටහන්, විශේෂ කෘෂිකාර්මික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, භෝග හා සත්ත්ව නිෂ්පාදන ක්‍රියාවලිය නිෂ්පාදන පිලි සැකසුම් සඳහා අනුග්‍රහයෙන් ලබා දීම යන අරමුණු වෙනුවෙන් අරමුදල පිහිටුවා ක්‍රියාත්මක කර තිබුණි. භාරකාර ඔප්පුවේ සඳහන් අරමුණු ඉටු කිරීම සඳහා අරමුදල ආරම්භ කර තිබුණත්, එහි මුදල් එම අරමුණු සඳහා ප්‍රමාණවත් ලෙස යොදා නොගෙන රු.මිලියව 835.00 ක් ස්ථාවර තැන්පතුවල ද, රු.මිලියන 93.04 ක් භාණ්ඩාගාර බිල්පත්වලද ආයෝජනය කර තිබුණි. ගොවිසෙත ලොතරැයි ආදායමින් ගොවි භාරකාර අරමුදල වෙත භාණ්ඩාගාරයෙන් ලැබිය යුතුව තිබුණු රු.මිලියන 3,542.06 ක මුදල ගොවීන්ට සෙත සැළසීමේ වැඩසටහන් සඳහා යෙදවීමට අරමුදලේ අවධානය යොමුකර නොතිබුණි.

සංස්කෘතික කටයුතු

සංස්කෘතික මධ්‍යස්ථාන පිහිටුවීම

එකතු කළ අගය මත බදු අය නොකිරීම

ඉදිකිරීම් කොන්ත්‍රාත්තු මත වැඩිපුර ගෙවීම්

සංස්කෘතික කටයුතු

රටේ සංස්කෘතික අංශයන් වැඩිදියුණු කිරීම මගින් තිරසාර සමාජ ආර්ථික සංවර්ධනය තහවුරු කිරීම මෙම අංශයේ අපේක්ෂිත ප්‍රතිඵලය වී තිබුණි. එම ප්‍රතිඵලය අත්පත් කර ගැනීම සඳහා අභ්‍යන්තර කටයුතු වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු දෙකක් විසින් පහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි.

- ශ්‍රී ලංකා ජාතික සංස්කෘතියේ සියළුම අංශයන් අභිවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
- විදේශීය රටවල් සමඟ සංස්කෘතික සබඳතා පවත්වා ගෙන යාම
- සංස්කෘතික හා පුරා විද්‍යා උරුමයන්ට හානි නොවන පරිදි සංස්කෘතිය පදනම්ව සංචාරක වැඩසටහන් වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීම
- සිංහල විශ්ව කෝෂය, සිහල ශබ්ද කෝෂය, මහා වංශය සම්පාදනය සඳහා අඛන්ඩව අවශ්‍ය පියවර ගැනීම
- ප්‍රජාවන් අතර සමගිය ස්ථාපිත කිරීම සඳහා සංස්කෘතික නැඹුරුතාවයන් හඳුනා ගැනීම

අමාත්‍යාංශය හා ඒයටතේ වන දෙපාර්තමේන්තු විසින් ඉහත සඳහන් කාර්යභාරයන් ඉටු කිරීම සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

සංස්කෘතික මධ්‍යස්ථාන පිහිටුවීම

සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකටම එක් සංස්කෘතික මධ්‍යස්ථානයක් පිහිටුවීමේ වැඩසටහන 2011 වර්ෂයේදී ක්‍රියාත්මක කරනු ලැබුවද, 2018 දෙසැම්බර් 31 දින වනවිට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 110 ක සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීමට අමාත්‍යාංශය අපොහොසත්ව තිබුණි.

සංස්කෘතික මධ්‍යස්ථාන 09 ක් ඉදිකිරීම වෙනුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 93.8 ක් වැයකර තිබූ අතර එම ඉදිකිරීම් ආරම්භ කර වර්ෂ 05 කට වැඩි කාලයක් ගතකර තිබුණත්, 2019 පෙබරවාරි මාසය වනවිටත් එම වැඩ අවසන් කර නොතිබුණි.

සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීමේදී භූමිය නායයෑම්, යුධමය තත්ත්ව වැනි හේතූන් මත මධ්‍යස්ථාන 03 ක් ඉදිකිරීම් ආරම්භ කර අතරමඟ නවතා තිබුණි. 2018 දෙසැම්බර් 31 දින වන විට එකතුව රු.මිලියන 4.26 ක් එම ඉදිකිරීම් වෙනුවෙන් වැය කර තිබුණු බැවින් එම වියදම නිෂ්ඵල වී තිබුණි.

එකතුකළ අගය මත බදු අයනොකිරීම

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් මිලදී ගැනීම් හා ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවලට අදාළව එකතු කළ අගය මත බදු (VAT) අදාළ ගෙවීම් වවුචර්වල වෙන් වශයෙන් හෙළිදරව් කර නොතිබුණි. එමෙන්ම එකතු කළ අගය මත බදු (VAT) ගෙවීම් පිළිබඳ මාසික වාර්තා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කිරිමට දිර්ඝ කාලයක සිට කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 5.35 ක් එකතු කළ අගය මත බදු වශයෙන් ගෙවා තිබුණි. නමුත් එම බදු ප්‍රමාණය නිවැරදිව රාජ්‍ය ආදායමට බැර වන පරිදි කටයුතු කිරීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

ඉදිකිරීම් කොන්ත්‍රාත්තු මත වැඩිපුර ගෙවීම්

2017 හා 2018 වර්ෂවලදී ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවට අදාළ ඉදිකිරීම් ව්‍යාපෘති 06 ක් සඳහා වන කොන්ත්‍රාත්තු ඇස්තමේන්තුගත වටිනාකම මත රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත පිරිනමා තිබුණි. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් ඉටු කළ කාර්යයන්වල වටිනාකමට වැඩියෙන් රු.මිලියන 2.2 ක් ගෙවා තිබුණි. එසේ වැඩිපුර ගෙවා තිබුණු මුදල සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ආපසු අයකර ගෙන නොතිබුණි.

බන්ධනාගාර ප්‍රතිසංස්කරණ

තොරතුරු කළමනාකරණ පද්ධතිය සමස්ථ බන්ධාගාරය තුළම ක්‍රියාත්මක කිරීමට අපොහොසත්වීම.

අනාර්ථික වියදම්

කාර්ය මණ්ඩල පුහුණුවීම් බොහෝ නිලධාරින්ට ලැබී නොතිබීම

දණ්ඩණ කුලී අයකර නොගැනීම

වාහන පාලනය

බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම

සුරක්ෂිත රැකවරණය සහ ඵලදායි නිවැරදි කිරීම තුළින් තෘප්තිමත් ප්‍රජාවක් බිහිකිරීම බන්ධනාගාර ප්‍රතිසංස්කරණ හා පුනරුත්ථාපන අංශයෙන් අපේක්ෂිත ප්‍රතිඵලය වී තිබුණි. එම අපේක්ෂාව ඉටු කර ගැනීම සඳහා අමාත්‍යාංශය හා තවත් දෙපාර්තමේන්තු 02 ක් හා අධිකාරියක් විසින් පහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි.

- ප්‍රජාපාදක විශෝධන ව්‍යාපෘති සම්බන්ධ කටයුතු කිරීම
- ගැටුම් හේතුවෙන් අවතැන්වූ, ශාරීරික හා මානසික ආබාධවලට ලක් වූ පුද්ගලයින් නැවත පදිංචි කිරීම හා පුනරුත්ථාපනය කිරීමට වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- යළි පදිංචි කරවීමේ කටයුතුවලදී රජය සහ ආධාර දෙන නියෝජිත ආයතනයන්, රාජ්‍ය නොවන සංවිධාන සහ සිවිල් සමාජය අතර කටයුතු සම්බන්ධීකරණය කිරීම
- අවතැන්වූවන් සඳහා අත්‍යාවශ්‍ය සේවාවන් සැපයීමට අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම
- ගැටුම්වලින් හානියට පත් දේපල හා තැනැත්තන් නැවත සමාජගත කිරීම සඳහා ක්‍රමෝපායයන් ක්‍රියාත්මක කිරීම
- සදාචාර සම්පන්න සමාජයක් ගොඩනැගීම සඳහා ආගමික වටිනාකම් ජනතාව අතර වර්ධනය කිරීම සඳහා ප්‍රතිපත්ති වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම.

අමාත්‍යාංශය, දෙපාර්තමේන්තු හා අධිකාරිය විසින් ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම පිළිබඳව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

බන්ධනාගාර තොරතුරු කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම

බන්ධනාගාර තොරතුරු කළමනාකරණ පද්ධතියක් සැකැසීමේ කාර්යය ආරම්භ කර 2018 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 07 ක කාලයක් ගත වී තිබුණි. ඒ සඳහා රු.මිලියන 101 කට ආසන්න වියදමක් කර තිබුණි. බන්ධනාගාර තොරතුරු කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2016 වර්ෂයේදී වැලිකඩ බන්ධනාගාරය ජාලගත කිරීම ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය වෙත භාර දී ඒ සඳහා රු.957,978 ක් වැය කර තිබුණි. බන්ධනාගාර ආයතන 12 ක් ජාලගත කිරීම සඳහා 2018 වර්ෂයේ දී රු.මිලියන 30.51 කට කොන්ත්‍රාත්තුව පෞද්ගලික ආයතනයක් වෙත භාරදී තිබුණි. තවත් ආයතන 16 ක් ඉදිරියේ දී ජාලගත කිරීමට නියමිතව පැවතුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම තොරතුරු පද්ධතිය සමස්ථ බන්ධනාගාර පද්ධතිය තුළ ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වී තිබුණි.

අනාර්ථික වියදම්

කාර්යමණ්ඩල පුරප්පාඩු 2138 ක් පැවතීම, දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම කෙරෙහි බාධාකාරී වී තිබුණි. නියාමක තනතුරට නිලධාරීන් 1,184 ක් බඳවා ගැනීමේ ක්‍රියාවලියේ දී රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිලධාරීන්, අමාත්‍යාංශ නිලධාරීන් හා බන්ධනාගාර නිලධාරීන් විසින් එකඟ වූ පරිදි බඳවා ගැනීමේ පටිපාටියේ වූ බඳවා ගැනීමේ ක්‍රමය යටතේ තරඟ විභාගයක් ඇතුළත් කිරීමට කටයුතු කර

නොතිබුණි. රේඩියෝ අමාත්‍යාංශයේ උපදෙස් මත සම්මුඛ පරීක්ෂණ මත නියාමක නිලධාරීන් බඳවාගැනීමට සැලැසුම් කර ඒ සඳහා රු.මිලියන 4.23 ක් වැය කර තිබුණි. විෂය භාර අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරමින් එම බඳවාගැනීම් අවලංගු කිරීම නිසා වැය කළ වියදම අනාර්ථික වී තිබුණි.

කාර්යමණ්ඩලය පුහුණු කිරීම

කාර්යමණ්ඩල පුහුණුව සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු.මිලියන 3.04 ක් උපයෝජනය කර තිබුණු නමුත් බන්ධනාගාර ආයතන 25 ක නිලධාරීන් 1831 දෙනෙකු සඳහා කිසිදු ආකාරයේ පුහුණුවක් ලබා දී නොතිබුණි. බන්ධනාගාර ආයතන 23 ක නිලධාරීන් සඳහා සේවා ආරම්භක පුහුණුවට අමතරව වෙනත් කිසිදු පුහුණු අවස්ථාවක් හිමිව නොතිබීම හා බොහෝ නිලධාරීන් හට අවම වශයෙන් ආසන්න වර්ෂ 05 ක කාලය තුළදී හෝ පුහුණු අවස්ථා හිමිව නොතිබුණි.

දණ්ඩන කුලී අයකර නොගැනීම

ස්ථාන මාරු වීම හා බඳු කාල සීමාව ඉක්මවීම යන හේතු මත රජයේ නිවාසයක පදිංචි වීම සඳහා ඇති සුදුසුකම අහෝසි වීමෙන් පසුව ද රජයේ නිවාස තුළ තවදුරටත් පදිංචිව සිටින නිලධාරීන් 13 දෙනෙකුගෙන් අය කළ යුතු රු.මිලියන 2.67 ක දණ්ඩන කුලී අයකර ගෙන නොතිබුණි.

වාහන පාලනය

දෙපාර්තමේන්තුව නමින් ලියාපදිංචි නොකළ ධාවනය කරනු ලබන වාහන 21 ක් හා ධාවන තත්ත්වයේ නොපවතින වාහන 32 ක් දෙපාර්තමේන්තු පරිශ්‍රයේ පැවැතුණි. 2019 ජනවාරි මාසය වන විට ක්‍රියා විරහිතව මාස 03 ක සිට වර්ෂ 09 දක්වා කාල පරාසයක සිට පැවැත එන වාහන 43 ක් සම්බන්ධයෙන් 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව එම වාහන අළුත්වැඩියා කර ධාවනයට එක් කිරීමට හෝ අපහරණය කිරීමට හෝ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. මේ නිසා එම වාහන ස්වභාවික උපද්‍රවයන්ට ලක්ව විනාශ වෙමින් පැවැතුණි. වර්ෂ 01 ක සිට වර්ෂ 03 ක් දක්වා කාල පරාසයක් තුළ අපහරණය කිරීම සුදුසුයැයි තීරණය කර තිබුණු වාහන 16 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. වාහන 53 ක් සඳහා වාහන ලියාපදිංචි සහතිකය, රක්ෂණ සහතිකය හා ආදායම් බලපත්‍රය නොතිබීම නිසා එම වාහන දෙපාර්තමේන්තුව නමින් පවරාගෙන ලියාපදිංචි කර නොතිබුණු අතර එම වාහන අතරින් වාහන 08 ක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර නොතිබුණි.

එමෙන්ම සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉකුත් වර්ෂවලට අදාළ බන්ධනාගාර දෙපාර්තමේන්තුවට අයත් වාහන අවස්ථා 180 කදී අනතුරට ලක් වී තිබුණි. එම අනතුරුවලින් සිදු වී තිබුණු අලාභහානිවල වටිනාකම රු.මිලියන 43.26 ක් වී තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 27 කදී සිදු වී තිබුණු වහාන අනතුරුවලින් රු.මිලියන 2.54 ක අලාභහානි සිදු වී තිබුණි. එම අලාභහානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර අලාභහානි අයකර ගැනීමට හෝ පොත්වලින් කපා හැරීමට හෝ බන්ධනාගාර දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

රජයේ සේවය සඳහා විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ

විශ්‍රාම වැටුප් වියදම ආර්ථිකයට සිදු කරන බලපෑම

අරමුදල් පරිපාලනය

විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම

මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

කළමනාකරණ අකාර්යක්ෂමතා

විශ්‍රාමිකයින් මියයාම කාලීනව දැනුම් දීම

තැන්පතු රඳවා ගැනීම

රජයේ සේවය සඳහා විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ

රාජ්‍ය සේවා විශ්‍රාමිකයින් හා ඔවුන්ගේ ප්‍රතිලාභීන් සඳහා තොරතුරු තාක්ෂණය හා තිරසාර කළමනාකරණ ක්‍රමවේද භාවිතයෙන්ද, පෞද්ගලික හා රාජ්‍ය අංශ මුහුවෙන් ඉහළ සේවාලාභී හා සේවාදායක තෘප්තිය තහවුරු කරමින් නෛතික ප්‍රතිලාභයන් පිළිගැන්වීම තුළින් ආර්ථික හා සමාජීය වශයෙන් තෘප්තිමත් විශ්රාමික ප්‍රජාවක් බිහිකිරීම, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර වේ.

1934 පෙබරවාරි 05 දින ස්ථාපිත වු විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් ගෙවීමද, 1898 අංක 01 දරන වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥා පනත හා 1983 අංක 24 දරන වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් පනත යටතේ වැන්දඹු පුරුෂ, අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීමද, 1942 අංක 18 දරන ආඥා පනත ප්‍රකාරව රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල පරිපාලනය හා ගෙවීම් ක්‍රියාවලිය නියාමනය කිරීමද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ වගකීම වේ.

විශ්‍රාම වැටුප් වියදම ආර්ථිකයට සිදුකරන බලපෑම

2018 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් සක්‍රිය විශ්‍රාමිකයින් 619,176 කට ප්‍රතිලාභ ලබා දී තිබුණු අතර 2018 වර්ෂයේ විශ්‍රාම වැටුප් වියදම රු.මිලියන 224,853 ක් වී තිබුණි. එය මුළු රජයේ පුනරාවර්තන වියදමෙන් සියයට 10.75 ක් වී තිබුණු අතර එය මුළු රජයේ ආදායමෙන් සියයට 11.71 ක් වී තිබුණි.

2012 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා විශ්‍රාමිකයින් 514,584 දෙනෙකුගේ සිට 619,176 දෙනෙකු දක්වා 104,792 දෙදෙනෙකුගෙන් එනම් සියයට 20 කින් හා විශ්‍රාම වැටුප් වියදම පිළිවෙලින් රු. මිලියන 126,461 ක් සිට රු. මිලියන 224,853 ක් දක්වා රු.මිලියන 98,392 කින් එනම් සියයට 78 කින් වර්ධනය වී තිබුණි.

රාජ්‍ය සේවාව ව්‍යාප්ත වීම, විශ්‍රාම ගැන්වීමේ නව විධිවිධාන, විශ්‍රාමිකයින්ටද ජීවන වියදම් දීමනා ගෙවීම. රාජ්‍ය සේවයේ වැටුප් වැඩිවීම හා ඒ මත විශ්‍රාම වැටුප් ගණනය, විශ්‍රාම වැටුප් විෂමතාව ඉවත් කිරීම, ජීවිත අපේක්ෂාව ඉහළයාම ආදී හේතුන් නිසා විශ්‍රාම වැටුප් වියදම අඛණ්ඩව වර්ධනය වී තිබුණි. එය ඉදිරියේදී ද අඛණ්ඩව වර්ධනයක් සිදුවිය හැකි බව අපේක්ෂා කර තිබුණි. ඒබැවින් ඉදිරි අනාගතයේදී රාජ්‍ය වියදමේ විශ්‍රාම වැටුප් වියදම සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ලබයි.

සමාලෝචිත වර්ෂය ඇතුළු ඉකුත් වරෂ 6 ක මුළු විශ්‍රාම වැටුප් වියදමේ වර්ධනය රූපසටහන 53 හා දැක්වෙ.



රූපසටහන 53 - විශ්‍රාම වැටුප් වියදම

මූලාශ්‍රය- විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය, මූල්‍ය තත්ව ප්‍රකාශය 2018

සමාලෝචිත වර්ෂයේදි සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදි අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

අරමුදල් පරිපාලනය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය සේවා විශ්‍රාම වැටුප් ගෙවීමට අමතරට විශ්‍රාම වැටුප් අරමුදල් 05 ක් පරිපාලනය කරනු ලබන අතර එයින් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල පමණක් ක්‍රියාකාරී මට්ටමක පැවතුණි. 1993 වර්ෂයේ පළාත් රාජ්‍ය සේවය ස්ථාපිත වීමත් සමඟ පළාත් රාජ්‍ය නිලධාරින්ට, රාජ්‍ය නිලධාරින්ට හිමි විශ්‍රාම වැටුප් හා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ හිමිවීම නිසා 1993 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල, පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල, පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් අරමුදල සඳහා නව සාමාජිකයින් එකතුවීමක් සිදු වී නොතිබුණි. එලෙස නව සාමාජික මුදල් නොලැබීම මත ගෙවීමට තරම් මුදල් අරමුදල්වල නොමැතිවීම හේතුවෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වැය ශීර්ෂය යටතේ අයවැය ප්‍රතිපාදන මගින් අරමුදල් සඳහා වියදම් කර තිබුණි.

මේ අතර, 1953 අංක 44 දරන පාඨශාලීය ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනත් නියෝග අංක 04 ප්‍රකාරව ගුරු වැන්දඹු අනත්දරු දායක මුදල් මගින් අරමුදලක් ගොඩනගා එමගින් ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම කළ යුතුය. එසේ වුවත්, දායක මුදල් රැස් කිරීම හා වියදම් දැරීම සඳහා අරමුදල වෙනුවෙන් බැංකු ගිණුමක් පවත්වා නොතිබුණු අතර දායක මුදල් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ වැන්දඹු අනත්දරු දායක මුදල් බැංකු ගිණුමට රැස්කර තිබිමත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ අයවැය ප්‍රතිපාදන මඟින් උක්ත වියදම් දැරීම හේතුවෙන් මෙම අරමුදල පිහිටුවීමේ අරමුණු ඉටු වී නොතිබුණි.

විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම්

සමාලෝචිත වර්ෂය අවසානයේ දී තවදුරටත් අයකර ගත යුතු විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් වටිනාකම රු.මිලියන 591 ක් ද වී තිබුණි. මෙම මුදල් වර්ෂ 10 කට වඩා වැඩි කාලයක සිට පැවත එමින් පැවැතුණු රු.මිලියන 8 ක්ද, වර්ෂ 5 ක සිට වර්ෂ 10 ක් දක්වා කාල පරාසයක සිට පැවත එන රු.මිලියන 37 ක්ද හා වර්ෂ 5 කට අඩු කාලයක සිට පැවත එන රු.මිලියන 546 කින් ද සමන්විත වි තිබුණි.

මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

සිවිල් හා වැන්දඹු ලෙස විශ්‍රාම වැටුප් 02 ක් ලබමින් සිට මිය ගිය විශ්‍රාමික නිලධාරිනියකට මිය ගොස් මාස 55 ක් දක්වා මිය යන විට ලබමින් සිටි විශ්‍රාම වැටුප බැංකු ගිණුමට බැර කර තිබුණි. එසේ බැර කරන ලද මුදලින් රු.මිලියන 2.70 ක් ATM කාඩ්පත භාවිතා කර මියගිය අයගේ පුතා විසින් ඉවත් කරගෙන තිබුණි. ඉන් රු.308,052 ක් ඔහු විසින් පසුව දෙපාර්තමේන්තුවට ගෙවා තිබුණත්, ඉතිරි රු.මිලියන 2.39 ක මුදල 2019 ජුනි 30 වන විටත් අයකර ගෙන නොතිබුණි.

ප්‍රාදේශිය ලේකම් කාර්යාල 2 ක් විසින් තාවකාලික හා ස්ථිර වශයෙන් විශ්‍රාම වැටුප් දෙකක් 1991 ජනවාරි මාසයේ සිට 2016 පෙබරවාරි මාසය දක්වා වර්ෂ 20 ක කාලයක් නිලධාරියෙකු වෙත ලබා දී තිබුණි. එක් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයක් මගින් රු.මිලියන 1.87 ක් වැඩිපුර ගෙවා තිබුණි. 2016 පෙබරවාරි 10 දින සිට විශ්‍රාම වැටුප් ගෙවීම නවතා තිබු නමුත් වැඩිපුර ගෙවා තිබු මුදල් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

විශ්‍රාම වැටුප් දත්ත පද්ධතියෙහි විශ්‍රාමිකයාගේ ජාතික හැඳුනුම්පත් අංකය වෙනුවට දියණියගේ ජාතික හැඳුනුම්පත් අංකය යොදා විශ්‍රාමිකයා මිය ගොස් මාස 86 ක කාලයක් ගතවන විටත් මියගිය මවගේ විශ්‍රාම වැටුප ලෙස රු.මිලියන 1.56 ක් දියණියක් විසින්

සාවද්‍ය ලෙස ලබාගෙන තිබුණි. මෙම වැඩිපුර ගෙවූ මුදල් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

කළමනාකරණ අකාර්යක්ෂමතා

මීගමුව, මීරිගම, ගම්පහ, අලව්ව, වරකාපොල හා වත්තල යන ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල, 2006 අප්‍රේල් 25 දිනැති අංක 6/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව විශ්‍රාම වැටුප් සංශෝධනය නොකළ ලිපිගොනු 669 ක් පැවැතුණි.

2011 අගෝස්තු 15 දිනැති අංක 1719/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පල කළ නිවේදනයේ සඳහන් පරිදි උපතින් පූර්ණ ආබාධිත නොවන තැනැත්තන් වර්ෂ 05 කට වරක් වෛද්‍ය මණ්ඩලයට යොමු කළ යුතු වුවත්, මීගමුව, මීරිගම, ගම්පහ, අලව්ව හා රඹුක්කන ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල උපතින් පූර්ණ ආබාධිත නොවන තැනැත්තන් කිසිවෙකුත් කිසිම දිනක වෛද්‍ය මණ්ඩලයකට යොමුකර නොතිබුණි.

විශ්‍රාම වැටුප් ගෙවනු ලබන සෑම විශ්‍රාමිකයකු සඳහාම විශ්‍රාම වැටුප් ගොනුවක් පවත්වාගෙන යායුතු වුවද, මීගමුව, මීරිගම,ගම්පහ, අලව්ව, වරකාපොල හා වත්තල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය 6 ක ලිපිගොනු නොමැතිව විශ්‍රාමිකයින් 512 කට විශ්‍රාම වැටුප් ගෙවමින් පැවතුණි.

විශ්‍රාමිකයින් මියයාම කාලිනව දැනුම් දීම

විශ්‍රාමිකයා මියගිය බව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය දැනුවත් නොවීම හේතුවෙන් මියගිය විශ්‍රාමිකයින් වෙත විශ්‍රාම වැටුප් ගෙවා තිබුණු අතර ගම්පහ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ 2016 වර්ෂයේ මියගිය විශ්‍රාමිකයන් 10 කුට රු.336,378 ක් වැඩිපුර ගෙවා තිබුණි. 2017 වර්ෂයේ මියගිය විශ්‍රාමිකයින් 7 දෙනෙකුගෙන් රු.750,390 ක් වූ සම්පූර්ණ මුදලම 2018 සැප්තැම්බර් මාසය වන විටත් අය කළ යුතුව තිබුණි.

තැන්පතු

දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු ක්ෂේත්‍රගත නිලධාරින් 05 දෙනෙකු වෙනත් සේවයකට යාම නිසා සංවර්ධන සේවයට හා ලේඛන සහකාර සේවයට ලබාදුන් යතුරු පැදි සඳහා අයකර ගන්නා ලද රු.696,500 ක මුදල් ජාතික අයවැය දෙපාර්තමේන්තුවට යැවීමකින් තොරව 2018 ඔක්තෝබර් මාසයේ සිට පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

ඒකාබද්ධ කරන ලද පළාත් සභා මූල්‍ය ප්‍රකාශන

පළාත් සභා පිළිබඳ හැඳින්වීම

පළාත් සභා සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

පළාත් සභා සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

පළාත් සභා ආදායම්

පළාත් සභා වියදම්

පළාත් සභා වත්කම්

පළාත් සභා පිළිබඳ හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන ව්‍යවස්ථා සංශෝධනයෙන් සමඟ සංයෝජිතව කියවිය යුතු 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන ප්‍රකාරව දිවයිනේ පළාත් නවය තුළ පළාත් සභාවයක් වශයෙන් පළාත් සභා නවයක් වර්තමානයේදී ක්‍රියාත්මක වේ. දහතුන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතුළත් සමගාමී ලැයිස්තුවේ සඳහන් කාර්යභාරයන් පළාත් සභා විසින් ඉටු කළ යුතුව ඇත. ඒ අනුව කෘෂිකර්මය, අධ්‍යාපන, සෞඛ්‍යය, නිවාස, පළාත් පාලනය හා සමාජ සේවා ආදි ක්ෂේත්‍රයන් ඇතුළු ක්ෂේත්‍ර රාශියක පළාත් මට්ටමේ බලතල මෙම පළාත් සභාවලට පවරා දෙන ලදී. පළාත් සභාවක් ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන ආණ්ඩුකාරවයාගේ පාලනය යටතේ පවතින අතර එහි ව්‍යවස්ථාදායකයෙහි ප්‍රධානියා ලෙස ප්‍රධාන අමාත්‍යවරයා කටයුතු කරනු ලැබේ. ප්‍රධාන අමාත්‍යවරයා ඇතුළුව අමාත්‍යවරුන් 04 දෙනෙකුගෙන් පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලය ප්‍රමුඛ විධායක සමන්විත වේ. ප්‍රධාන ලේකම්වරයෙකු පරිපාලන බලධාරියා ලෙස කටයුතු කරනු ලබන අතර ජනාධිපතිවරයා විසින් ඔහු පත් කරනු ලබයි. සෑම පළාත් සභාවක්ම පළාත් සභා අරමුදලින් හා හදිසි අවශ්‍යතා අරමුදලින් සමන්විත වේ. මධ්‍යම රජයෙහි ඒකාබද්ධ අරමුදල හා බෙහෙවින් සමාන වන මෙම පළාත් සභා අරමුදලට රජයේ ප්‍රදාන, බදු ඉපයීම හා අනෙකුත් මාර්ගයෙන් අරමුදල් ලැබෙන අතර අරමුදලින් පුනරාවර්ථන හා ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් දැරීමට සිදුවේ. අමාත්‍යාංශයක් යටතට නොගෙන පළාත් සභා ආයතන, පළාත් සභා අමාත්‍යාංශ හා අමාත්‍යාංශ යටතට ගැනෙන සියලුම දෙපාර්තමේන්තු විසර්ජන ගිණුම ඇතුළුව මූල්‍ය ප්‍රකාශන වාර්ෂිකව පිළියෙල කරනු ලබයි.

ඒ හැරුණ විට සෑම පළාත් සභාවක්ම සියලු ආදායම් වියදම්, වත්කම්, වගකීම් දක්වමින් මධ්‍යම රජයේ ජනරජ ගිණුම වැනි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලැබයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව හා 1987 අංක 42 දරන පළාත් සභා පනතෙහි 23 (1) වගන්තිය ප්‍රකාරව පළාත් සභා අරමුදලෙහි ගිණුම් විගණනය කිරීමේ බලතල විගණකාධිපතිට ලැබී ඇත.

ඒ අනුව බස්නාහිර, උතුරු මැද, සබරගමුව, වයඹ, මධ්‍යම,උතරු,නැගෙනහිර, මධ්‍යම සහ ඌව යන පළාත් 9 හි 2018 වර්ෂයෙහි විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන හා ඊට අනුකූලව 2017 වර්ෂයෙහි මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විශ්ලේෂණයක් මෙම පරිච්ඡේදයෙන් ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

පළාත් සභා සඳහා
2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

විස්තරය	2018	2017
	රු.දහස්	රු.දහස්
ආදායම		
රජයෙන් ලද ආදායම		
රජයේ ප්‍රදාන	200,841,189	198,792,188
බදු ආදායම	6,287,894	5,858,351
පළාත් ආදායම		
බදු ආදායම	75,096,438	71,193,811
බදු නොවන ආදායම	10,127,500	9,481,133
අනෙකුත් ආදායම	5,949,267	2,866,628
මුළු ආදායම	**298,302,288**	**288,192,111**
<u>වියදම</u>		
පෞද්ගලික පාර්ශ්‍රමික	198,203,699	187,724,905
අනෙකුත් සැපයුම් හා සේවා	17,165,910	14,545,706
ප්‍රධානයන්,මාරුකිරීම් හා අනෙකුත් පුනරාවර්තන වියදම්	50,231,703	49,406,673
මුළු පුනරාවර්තන වියදම	**265,601,312**	**251,677,284**
සංවර්ධන වියදම	31,868,875	31,876,011
මුළු වියදම	**297,470,187**	**283,553,295**
වියදම ඉක්ම වූ ආදායම	**832,101**	**4,638,816**

පළාත් සභා සඳහා
2018 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

විස්තරය	2018	2017
	රු.දහස්	රු.දහස්
වත්කම්		
ජංගම නොවන වත්කම්		
දේපල,පිරියත හා උපකරණ	172,688,283	85,191,431
ඇප තැන්පතු ආයෝජන	28,906	24,951
ආයෝජන	6,665,533	7,689,392
කෙරීගෙන යන වැඩ	95,874	-
අස්පෘශ්‍ය වත්කම්	8,715	-

මුළු ජංගම නොවන වත්කම්	**179,487,311**	**92,905,774**
ජංගම වත්කම්		
තොග	51,065	58,774
පළාත් රාජ්‍ය නිලධාරින්ට ණය	16,102,576	14,757,383
පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වල අග්‍රිම ගිණුම් ශේෂ	1,081,887	1,199,250
අනුමත අත්තිකාරම් ගිණුම් සඳහා අත්තිකාරම්	497,884	496,057
ස්ථාවර තැන්පතු හා කෙටිකාලීන ආයෝජන	3,075,655	2,234,018
අනිකුත් මූල්‍ය වත්කම්	1,914,208	1,737,818
පළාත් භාණ්ඩාගාරය සහ හදිසි අවස්ථා අරමුදල	26,887	514,340
පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සඳහා අත්තිකාරම්	2,465,894	2,770,141
පළාත් හදිසි අවස්ථා අරමුදල සඳහා අත්තිකාරම්	3,582	3,581
වාණිජ අත්තිකාරම්	94,735	80,482
කලින් ගෙවීම්	106,073	22,417
පළාත් ව්‍යාපාර සඳහා ප්‍රදාන	249	2,969
පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වලින් ලැබිය යුතු ශේෂ	43,896	350,079
අනෙකුත් ලැබිය යුතු ශේෂ	1,912,999	1,192,006
මුදල් , මුදලට සමාන දෑ	15,425,105	18,662,063
මුළු ජංගම වත්කම්	**42,802,695**	**44,081,378**
මුළු වත්කම්	**222,290,006**	**136,987,152**
ඒකාබද්ධ අරමුදල් හා සංචිත		
දායකත්ව ප්‍රාග්ධනය	195,894,215	107,553,674
අතිරික්තය/ඌණතාවය	(474,065)	108,520
හදිසි අවස්ථා අරමුදල	24,139	21,683
ක්ෂය සංචිත අරමුදල	141,785	108,520
ප්‍රඥප්ති ආයෝජන	839,554	-
සංචිත	10,455,659	5,994,077
ප්‍රාග්ධන වත්කම් අත්පත්කර ගැනීම් සඳහා ප්‍රදාන	1,458,266	-
	195,586,074	**117,205,741**
දිගුකාලීන වගකීම්		
මූල්‍ය කලබදු - වාහන	21,844	104,841
ඇපකරුවන්ගේ ඇප තැන්පතු	20,250	18,551
ඇප තැන්පතු මත පොළිය	8,656	6,401
අනිකුත් ගෙවිය යුතු දෑ	44	227

අනිකුත් වගකීම්	-	-
මූල්‍ය කල්බදු - වාහන	93,609	78,310
තැන්පතු ගිණුම්	6,760,477	5,938,918
අනෙකුත් ගෙවිය යුතු වියදම්	7,045,573	7,640,086
මුළු වගකීම්	**13,950,453**	**13,787,334**
මුළු අරමුදල් හා වගකීම්	**222,290,006**	**136,987,152**

පළාත් සභා ආදායම්

පළාත් සභාවක ආදායම රජයේ ප්‍රදාන, බදු හා බදු නොවන යන ආදායම් ප්‍රභවයන්ගෙන් සමන්විත වේ.

රජයේ ප්‍රදාන

2018 වර්ෂයේදී පළාත් සභා 09 ක් සඳහා ලබාදුන් රජයේ ප්‍රදානය රු.බිලියන 204 ක් වූ අතර එය 2017 වර්ෂයට සාපේක්ෂව රු.බිලියන 02 ක වර්ධනය වීමකි. 2018 වර්ෂයේදී ප්‍රදානයන්ගේ ඉහළම ප්‍රතිශතය එනම් සියයට 15 ක් මධ්‍යම පළාතට ලබාදී තිබුණු අතර එය රු.බිලියන 30 ක් වී තිබුණි. තවද, බස්නාහිර පළාතට අඩුම ප්‍රදානය ලබාදී තිබුණු අතර එය රු.බිලියන 17 ක් වූ අතර මුළු ප්‍රදානයනගේ ප්‍රතිශතයක් ලෙස සියයට 8 ක් වී තිබුණි. ඒ අනුව 2018 වර්ෂයේ රජයේ සමස්ථ වියදම වූ රු.බිලියන 2,734 කින් සියයට 7.4 ක් පමණ රු.බිලියන 204 ක් පළාත් සභා සඳහා රජයේ ප්‍රදාන වශයෙන් ලබා දී තිබුණි. විස්තර රූපසටහන 54 හි දැක්වේ.



රූපසටහන 54 – 2017 හා 2018 වර්ෂවලදී පළාත් සභාවන් වෙත ලබා දුන් රජයේ ප්‍රදාන

මූලාශ්‍රය – පළාත් සභාවල මූල්‍ය ප්‍රකාශන

බදු ආදායම

2018 වර්ෂයේ දී සියළුම පළාත් සභාවන්හි බදු ආදායම රු.බිලියන 75 ක් වූ අතර එය 2017 වර්ෂයට සාපේක්ෂව සියයට 5 ක පමණ වැඩිවීමකි. 2018 වර්ෂයේදී සියළුම පළාත් සභා විසින් රැස්කළ බදු ආදායම පළාත් සභා සමඟ සැසඳීමේදී වැඩිම බදු ආදායම වන

රු.බිලියන 43 ක් හෙවත් සියයට 57 ක් බස්නාහිර පළාත් සභාව විසින් රැස්කර තිබුණි. කෙසේවුවද 2018 වර්ෂයේ සමස්ථ රජයේ බදු ආදායම වන රු.බිලියන 1,784 ක් සමඟ සැසඳීමේදී පළාත් සභා විසින් සියයට 4 ක බදු ප්‍රමාණයක් පමණක් රැස්කර ගැනීමට හැකි වී තිබුණි. එක් එක් පළාත් සභාව විසින් 2017 හා 2018 වර්ෂවල රැස්කර තිබුණු ආදායම පිළිබඳ විස්තර රූපසටහන 55 හි දැක්වේ.



රූපසටහන 55 – 2017 හා 2018 වර්ෂවල පළාත් සභා විසින් රැස් කළ බදු ආදායම

මූලාශ්‍රය – පළාත් සභා විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන

බදු නොවන හා අනෙකුත් ආදායම

බදු නොවන හා අනෙකුත් මාර්ගයන්ගෙන් 2018 වර්ෂයේදී රු.බිලියන 22 ක් පළාත් සභා විසින් උපයාගෙන තිබුණි. මෙම ආදායම තුළ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලද රු.බිලියන 6 ක ආදායමද ඇතුළත් වේ. 2018 වර්ෂයේදී බස්නාහිර පළාත රු.බිලියන 4 ක බදු නොවන ආදායම් උපයා තිබුණි. කෙසේ වුවද පළාත් සභා සඳහා තිබූ සමස්ථ බදු නොවන ආදායම රජයේ සමස්ථ බදු නොවන ආදායමෙන් සියයට 4 ක් පමණක් වී තිබුණි.

රජයේ ප්‍රදාන හා පළාත් සභා ඉපයූ ආදායම

2018 වර්ෂයේදී රජය විසින් පළාත් සභා සඳහා රු.බිලියන 203 ක ප්‍රදානයන් ලබාදී තිබුණු අතර ඊට සාපේක්ෂව පළාත් සභා විසින් රු.බිලියන 97 ක ආදායමක් පමණක් උපයා ගෙන තිබුණි. ඒ අනුව පළාත් සභා පවත්වා ගෙන යාම සඳහා රජය විසින් පළාත් සභාවල සමස්ථ ආදායමෙන් සියයට 47 ක් පමණ ප්‍රමාණයකින් දායක වීමට සිදු වී තිබුණි. විස්තර රූපසටහන 56 හි දැක්වේ.



රූපසටහන 56. - පළාත් සභාවල ආදායම් සංයුතිය

මූලාශ්‍රය - පළාත් සභා විසින් ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන

පළාත් සභා වියදම්

සෑම පළාත් සභාවක් විසින්ම පෞද්ගලික පාරිශ්‍රමික, අනෙකුත් භාණ්ඩ හා සේවා, නඩත්තු වියදම් ඇතුළත්ව පුනරාවර්ථන වියදම්ද ප්‍රාග්ධන ස්වරූපයෙන් සංවර්ධන වියදම්ද වාර්ෂිකව දරනු ලබයි. ඒ අනුව 2018 වර්ෂයේ පළාත් සභා විසින් දරන ලද සමස්ථ වියදම රු. බිලියන 300 කි. එය රටේ සමස්ථ වියදමෙන් සියයට 10 කි.

පුනරාවර්තන වියදම

සමාලෝචිත වර්ෂයේ දී පළාත් සභා විසින් පුනරාවර්තන වියදම් වෙනුවෙන් රු.බිලියන 265 ක් වැය කර තිබුණු අතර පළාත් සභා විසින් රු.බිලියන 97 ක ආදායම් රැස්කර තිබුණි. ඒ අනුව පළාත් සභා විසින් රැස් කර තිබුණු ආදායම රු.බිලියන 168 කින් හෙවත් සියයට 273 කින් ඉක්මවා පුනරාවර්තන වියදම් කර තිබුණි. 2017 වර්ෂයේදී රු.බිලියන 251 ක පුනරාවර්තන වියදමක් සිදු කර තිබුණි. පළාත් සභා විසින් සිදු කර තිබුණු පුනරාවර්තන වියදම 2018 වර්ෂයේදී රජය විසින් කර තිබුණු පුනරාවර්තන වියදමෙන් සියයට 21 ක් වී තිබුණි. සෑම පළාත සභාවක් විසින් පුනරාවර්තන වියදම සිදු කිරීමට පළාත් සභා විසින් රැස්කර තිබුණු ආදායම ප්‍රමාණවත් වී නොතිබුණු අතර එය සියයට 659 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක ප්‍රතිශතයන් ගෙන තිබුණි. එමෙන්ම රජය විසින් ලබා දුන් රු.බිලියන 203 ක ප්‍රදානයන් කර තිබුණත්, පළාත් සභ කර තිබුණු පුනරාවර්තන වියදම පියවා ගැනීමටද එය ප්‍රමාණවත් වී නොතිබුණි. එය රු.බිලියන 63 ක සිට රු.බිලියන 266 ක් දක්වා පර උතුරු පළාත පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. විස්තර රූපසටහන 57 හි දැක්වේ.



රූපසටහන -57 - පළාත් සභා රැස්කළ ආදායම හා පුනරවර්තන වියදම - 2018

මූලාශ්‍රය - පළාත් සභ විසින් ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන - 2018

පෞද්ගලික පාරිශ්‍රමිකය

2018 වර්ෂයේදී පෞද්ගලික පාරිශ්‍රමිකය ලෙස රු.බිලියන 198 ක් පළාත් සභා විසින් වැය කර තිබුණු අතර 2017 වර්ෂයේදී ඒ සඳහා රු.බිලියන 188 ක් වැය කර තිබුණි. සෑම පළාත් සභවක් විසින් ඉකුත් වර්ෂයට වඩා සමාලෝචිත වර්ෂයේදී ඒ සඳහා වැය කර තිබුණි. විස්තර රූපසටහන 58 හි දැක්වේ.



රූපසටහන 58 – පළාත් සභා විසින් වැය කළ පෞද්ගලික පාරිශ්‍රමික 2017 හා 2018

මූලාශ්‍රය – පළාත් සභා විසින් ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන

සංවර්ධන වියදම්

සමාලෝචිත වර්ෂයේදී පළාත් සභා 09 විසින් සංවර්ධන වියදම් ලෙස රු.බිලියන 34.8 ක් වැය කර තිබුණි. ඉකුත් වර්ෂයේදී එම වියදම රු.බිලියන 34.3 ක් වී තිබුණි. පළාත් සභා සංවර්ධන වියදමට සාපේක්ෂව රජයේ ආයෝජන රු.බිලියන 625 ක් වි තිබුණි. බස්නාහිර පළාත් සභාව විසින් රු.බිලියන 12.6 ක ඉහළම සංවර්ධන වියදම් කර තිබුණු අතර නැගෙනහිර පළාත් සභාව විසින් රු.බිලියන 0.5 ක අඩුම සංවර්ධන වියදම සිදු කර තිබුණි. 2018 වර්ෂයේදී පළාත් සභා 9 ක් විසින් සිදු කර තිබුණු සංවර්ධන වියදම හා පුනරාවර්තන වියදම සැසඳීමේදී මුළු පුනරාවර්තන වියදමෙන් සංවර්ධන වියදම සියයට 13 ක් පමණක් වි තිබුණි. පළාත් සභා විසින් සිදු කර තිබුණු සංවර්ධන වියදම හා පුනරාවර්තන වියදම සසඳා රූපසටහන 59 හි දක්වා ඇත.



රූපසටහන 59 – පළාත් සභාවල පුනරාවර්තන හා සංවර්ධන වියදම -2018

මූලාශ්‍රය – පළාත් සභා විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන

පළාත් සභාවල වත්කම්

2017 වර්ෂයේදී රු.බිලියන 136 ක් ලෙස හඳුනාගත් පළාත් සභා මුළු වත්කම් ප්‍රමාණය 2018 වර්ෂයේ දී රු.බිලියන 222 ක් ලෙස හඳුනාගෙන තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 63 ක වර්ධනයක් අත් කර ගෙන තිබුණි. රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2018 වර්ෂයෙහි පැවැති මුළු වත්කම් ප්‍රමාණය රු.බිලියන 2,133 ක් වි තිබුණි. ඒ අනුව රජයේ හා පළාත් සභාවල 2018 වරශයේ පැවැති මුළු වත්කම් ප්‍රමාණය රු.බිලියන 2,355 ක් වී තිබුණි.

ජංගම නොවන වත්කම්

2017 වර්ෂයේ පළාත් සභාවල පැවැති මුළු ජංගම නොවන වත්කම්වල වටිනාකම රු.බිලියන 93 ක් වී තිබුණි. එය සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.බිලියන 86 කින් වැඩි වී රු.බිලියන 179 ක් වි තිබුණි. මෙම ජංගම නොවන වත්කම් තුළ පළාත් සභා 08 ක තක්සේරු කරන ලද දේපළ, පිරියත හා උපකරණ රු.බිලියන 172.6 ක් හා ආයෝජන රු.බිලියන 7.7 ක්ද ඇතුළත් වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ රජයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු.බිලියන 1,087 ක ජංගම නොවන වත්කම් ප්‍රමාණයද සමඟ පළාත් සභාවල හා රජයේ මුළු ජංගම නොවන වත්කම් ප්‍රමාණය රු.බිලියන 1,266 ක් වී තිබුණි.

බස්නාහිර පළාත් සභාව

බස්නාහිර පළාත් සභාව විසින් 2018 වර්ෂය සඳහා රු.මිලියන 25,218 ක් රජයේ ප්‍රදාන මගින්ද, අභ්‍යන්තර මාර්ගවලින් රු.මිලියන 51,766 ක්ද, වශයෙන් එකතුව රු.මිලියන 76,984 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණි. 2018 වර්ෂයේදී පුනරාවර්තන වියදම් සඳහා රු.මිලියන 61,119 ක්ද, මූලධන වියදම් සඳහා රු.මිලියන 15,865 ක්ද, වශයෙන් එකතුව රු.මිලියන 76,984 ක් උපයෝජනය කිරීමට ඇස්තමේන්තු කර තිබුණි. ඒ අනුව 2018 වර්ෂයේදී රජයේ ප්‍රදාන මගින් රු.මිලියන 21,023 ක්ද, අභ්‍යන්තර මාර්ග මගින් රු.මිලියන 47,109 ක්ද වශයෙන් එකතුව රු.මිලියන 68,132 ක ආදායම් රැස්කර තිබුණි. 2018 වර්ෂයේදී පුනරාවර්තන වියදම රු.මිලියන 56,805 ක් හා මූලධන වියදම රු.මිලියන 12,649 ක් වශයෙන් රු.මිලියන 69,454 ක් උපයෝජනය කර තිබුණි.

මේ සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි විගණනයේදී ආවරණය වූ ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

අරමුණුවලින් බැහැර ක්‍රියාකාරකම්

බප/ජය/මාලඹේ ශ්‍රී රාහුල බාලිකා මහා විද්‍යාලයේ 2015 වෙළඳපොල ව්‍යාපෘතිය මගින් රු.මිලියන 1.87 ක්, 2016 වෙළඳපල ව්‍යාපෘතියෙන් රු.මිලියන 1.43 ක් වශයෙන් එකතුව රු.මිලියන 3.25 ක් අදායම් ගෘහස්ථ ක්‍රිඩාගාරය ඉදිකිරිම වෙනුවෙන් රැස්කර ගෙන තිබුණි. එම මුදලින් ගෘහස්ථ ක්‍රීඩාගාරය ඉදිකිරිම් කටයුතු සිදු කර නොතිබුණු අතර වෙළඳපල ව්‍යාපෘතිය මගින් උපයාගන්නා ලද රු.මිලියන 3.30 ක මුදල වැය කිරිම පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

වත්කම් කළමනාකරණය

2017 ජුනි 27 දින පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක කාර්යාලය මඟින් රුධිර කාන්දු කරන ඒකකය සඳහා Dialysis Machine 04 ක්, Ro Plant 01ක්, Dialysis Bed 02 ක් ලැබී තිබුණි. නමුත් එම උපකරණ ලබා ගැනිමට ප්‍රථම ඒ සඳහා යටිතල පහසුකම් සැකසීම සිදු කළ යුතුව තිබුණත්, 2018 සැප්තැම්බර් 14 දින වන විටත් එසේ කර නොතිබුණි. රෝහලේ ඉල්ලීමකින් තොරව ලැබී තිබුණු මෙම උපකරණ සහිත පෙට්ටි නව ගොඩනැගිල්ලේ 6 වන මහලේ කොරිඩෝවේ අනාරක්ෂිත ලෙස තබා තිබුණි. ඇසුරුම කඩා නොතිබුණ මෙම උපකරණවල වගකීම් කාලය භාවිතා කිරීමකින් තොරව අවසන්වී තිබුණි. එමෙන්ම ඒකකයේ කටයුතු කිරීම සඳහා වෛද්‍ය නිලධාරීන් තිදෙනෙක්ද, හෙද නිලධාරීන් 2 දෙදෙනෙක් හා කනිෂ්ඨ කාර්ය මණ්ඩලයේ එක් කෙනෙකුද පුහුණු කර තිබුණි.

මිනුවන්ගොඩ මූලික රෝහලේ අවශ්‍ය අනෙකුත් පහසුකම් ස්ථාපිත නොකිරීම නිසා 2015 වර්ෂයේදී රසායනාගාරය වෙත ලැබී ඇති 3 Part Ha matology එකක් , Semi – Auto mated Biochemistry Analyzer එකක් සහ 1000 VA Isolation Transformer එකක් භවිතයට ගැනිමට නොහැකිව ඇසුරුම් තුළම තබා තිබුණු අතර ඒවායේ වගකීම් කාලයද ඇසුරුම් තුළදීම අවසන් වි තිබුණි.

නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පළාත් නිශ්චිත ප්‍රදාන යටතේ 2016 වර්ෂයේදී ජනතාවගේ තාක්ෂණික දැනුම ඉහළ නැංවීම හා ගුණාත්මක තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණින් ක්‍රියාත්මක වූ ව්‍යාපෘතියක කෘෂි උපදේශකවරුන් වෙත ලබාදුන් ටැබ් යන්ත්‍ර 45 ක් සඳහා රු.මිලියන 1.32 ක් වැය කර තිබුණි. 2017 ඔක්තෝබර් මාසය වන විටත් එම දත්ත සම්බන්ධතාවය ලබාගැනීම සඳහා රු.156,078 ක් වැය කර තිබුණි. 2018 ඔක්තෝබර් 02 දිනැති අංක WP/AG/PD/3/1/2-2018 දරන ලිපිය මඟින් සියළු ටැබ් යන්ත්‍ර පවරා ගැනීමක් සිදුකර තිබුණි. 2019 ජනවාරි 30 දින වනවිට සියළුම ටැබ් යන්ත්‍ර ආපසු ලබාගෙන තිබූ අතර බැටරි ආරෝපණය නිෂ්ක්‍රීයව පැවතුණි.

කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

2017 ජුනි 14 දින ගිවිසුම්ගත වටිනාකමින් සියයට 30 ක් වශයෙන් රු.මිලියන 6.59 ක අත්තිකාරම් ගෙවා ගම්පහ දිස්ත්‍රික් මහා රෝහලේ මෘත ශරීරාගාර ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ඉදිකිරීම් ආයතනයක් වෙත පවරාදී තිබුණි. ගොඩනැගිල්ලේ ඉදිකිරීම් අවසන් කිරීමට නියමිත කාලය ඉකුත්වී වර්ෂයකට ආසන්න කාලයක් ගතවී තිබුණද, අත්තිවාරම පමණක් දමා ඉදිරිකිරීම් කටයුතු අතරමග නතර කර තිබුණි. 2016 දෙසැම්බර් 16 දිනැති ඇප බැඳුම්කරය මුදල් කර ගැනීමට නොහැකිවීම නිසා කළ වැඩ වටිනාකම වූ රු.මිලියන 2.67 ක් අඩුකිරීමෙන් පසු රු.මිලියන 3.92 ක ඉතිරි මුදල අයකර ගැනීමට නොහැකිවී තිබුණි.

කළමනාකරණ අකාර්යක්ෂමතා

පාසල්වල පංති කාමර ගොඩනැගිලි අවශ්‍යතාවයන් ගැන සැලකිල්ලට නොගෙන වෙනත් ගොඩනැගිලි ඉදිකර තිබුණි. යටියන කණිෂ්ඨ විද්‍යාලයේ සහ බදුරලිය මහා විද්‍යාලයේ සිසුන් තාවකාලිකව ඉදිකළ පන්ති කාමරවල අධ්‍යාපනය ලබද්දී එම පාසල්වල රු.මිලියන 42.38 ක විදුහල්පති හා ගුරු නිල නිවාස සහ කැෆටේරියා ගොඩනැගිලි ඉදිකර තිබුණි.

අධිභාර කිරීම සඳහා

විධායක ශ්‍රේණියේ නිලධාරීන් 11 දෙනෙකුට ආණ්ඩුකාරවරයාගේන් ලබාගත් අනුමැතිය මත නිල නිවාස කුලී වශයෙන් මාසිකව රු.30,000 ක් බැගින් 2017 නොවැම්බර් මාසයේ සිට 2019 අප්‍රේල් මාසය දක්වා රු.මිලියන 5.34 ක් ගෙවා තිබුණි. මෙම නිලධාරීන්ගෙන් 10 දෙනෙකු බස්නාහිර පළාත තුළ පදිංචි අය වූ අතර ඉන් 08 දෙනෙකු ස්ථිර නිවාස ලිපිනයෙහි පදිංචි අය වූහ.

ප්‍රසම්පාදනය

ශ්‍රම සවිය වැඩසටහන යටතේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2018 අගෝස්තු 15 දින අනුමත කර තිබූ රු.මිලියන 7.50 ක ප්‍රතිපාදනවලින් 2018 වර්ෂයේ අයවැය යෝජනාවලට ඇතුළත් කර නොතිබුණු කෘෂි කාර්මික භාණ්ඩ මිලදී ගැනීම ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව සිදුකර රු.මිලියන 7.44 ක් ගෙවා තිබුණි. එම මිලදී ගැනීම තුළ රු.596,625 ක් වටිනා තණකොළ කපන යන්ත්‍ර 35 ක් ඇතුළත්ව තිබුණි. එසේම 2019 ජනවාරි 11 දින නැවතත් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව තණකොළ කපන යන්ත්‍ර 85 ක් රු.මිලියන 1.71 කට මිලදීගෙන තිබුණු අතර මිලදීගෙන තිබූ තණකොළ කපන යන්ත්‍ර 100 ක් "සිතමු" ව්‍යාපෘතිය යටතේ සභාපති විසින් තෝරාගන්නා ලද පිරිසකට බෙදාහැර තිබුණි.

මධ්‍යම පළාත් සභාව

මධ්‍යම පළාත් සභාව විසින් 2018 වර්ෂය සඳහා රු.මිලියන 8,741 ක් රජයේ ප්‍රදාන මඟින් ද, අභ්‍යන්තර මාර්ගවලින් රු.මිලියන 8,442 ක් ද වශයෙන් එකතුව රු.මිලියන 17,183 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණි. 2018 වර්ෂයේ පුනරාවර්තන වියදම් වශයෙන් රු.මිලියන 34,176 ක් ද, මූලධන වියදම් වශයෙන් රු.මිලියන 8,741 ක් ද වශයෙන් එකතුව රු.මිලියන 42,917 ක් උපයෝජනය කිරීමට ඇස්තමේන්තු කර තිබුණි. ඒ අනුව 2018 වර්ෂයේ දී රජයේ ප්‍රදාන මඟින් රු.මිලියන 4,663 ක් ද, අභ්‍යන්තර මාර්ග මඟින් රු.මිලියන 7,967 ක් ද වශයෙන් එකතුව රු.මිලියන 12,630 ක ආදායමක් රැස්කර තිබුණි. 2018 වර්ෂයේ දී පුනරාවර්තන වියදම රු.මිලියන 32,278 ක් හා මූලධන වියදම රු.මිලියන 4,663 ක් වශයෙන් රු.මිලියන 36,941 ක් උපයෝජනය කර තිබුණි.

මධ්‍යම පළාත් සභාවට අදාළව 2018 වර්ෂයේ සිදු කරනු ලැබූ විගණනයේ දී අනාවරණය වූ වැදගත් විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

අරමුදල් උපයෝජනය නොකර ආයෝජනය කිරීම

මධ්‍යම පළාත් සභාව විසින් 2018 වර්ෂය අවසන් වන විට රු.මිලියන 1,782.40 ක් පළාත් සංවර්ධනය වෙනුවෙන් උපයෝජනය කළ යුතුව තිබුණත්, එසේ නොකර එම මුදල ස්ථාවර තැන්පතුවල අයෝජනය කර තිබුණි. ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 163.21 ක පොලී ආදායම් ලබාගෙන තිබුණි. පළාත් සභාව විසින් පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම් දෙකක 2018 දෙසැම්බර් 31 දින වන විට එකතුව රු.මිලියන 413.38 ක ශේෂයක් රඳවාගෙන තිබුණි. රජය සියයට 27 ක පොලියක් යටතේ අයිරා පහසුකම් ලබා ගෙන පළාත් සභාව වෙත රු.මිලියන 4,663 ක රජයේ ප්‍රදානයක් ලබා දී තිබුණත්, පළාත් සභාව විසින් රු.මිලියන 1,782.40 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 318.03 ක අමතර මූල්‍ය පිරිවැයක් රජයට දැරීමට සිදු වී තිබුණි.

අධිකාරි බලය නොලත් ගෙවීම්

මහනුවර සීතාදේවී බාලිකා විදුහලට ඉඩම් අත්කර ගැනීමට අදාළ වන්දි හා පොලී මුදල් ගෙවීමේ දී ඉඩම් අමාත්‍යාංශයේ හා නීතිපති දෙපාර්තමේන්තුවේ නියෝග වූ 17 තීරණයේ නම සඳහන් අයට පමණක් වන්දි සහ පොලී ගෙවිය යුතු බවට දක්වා තිබුණි. නමුත් එම තීරණයේ නම සඳහන් නොවූ පාර්ශවයකට වන්දි වශයෙන් රු.මිලියන 1.47 ක් හා පොලී වශයෙන් රු.මිලියන1.13 ක් ද වශයෙන් එකතුව රු.මිලියන 2.60 ක් මහනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් බල රහිතව ගෙවීම් කර තිබුණි.

ජල හැරවුම් බදු

දොළුව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පෞද්ගලික ආයතනයක් විසින් ඩෙල්ටාවත්තේ සහ ස්ටෙලන්බර්ග් වත්තේ පිහිටුවා ඇති කුඩා ජල විදුලි බලාගාර දෙකෙහි 2016 වර්ෂයේ විදුලිය නිෂ්පාදනය පිළිවෙලින් කිලෝවොට් 5,222,056 ක් හා කිලෝ වොට් 2,931,126 ක් වී තිබුණි. නමුත් ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ 2010 මාර්තු 11 දිනැති අංක 2010/2 චක්‍රලේඛයට අනුව

වර්ෂයකට කිලෝවොට් 1 කට රු.100 බැගින් ගෙවිය යුතු ජල හැරවුම් බදු ගෙවා නොතිබුණි.

නිෂ්කාර්ය සම්පත්

- හඟුරන්කෙත ගෝනගන්තැන්න ප්‍රාදේශීය රෝහලේ මාතෘ හා ළමා සායන මධ්‍යස්ථානය 2004 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුළදී අදියර 03 කින් ඉදිකර තිබුණි. නමුත් 2019 අගෝස්තු මාසය වන විටත් භාවිතයට නොගෙන වල් වැදී තිබුණි. මෙසේ වර්ග අඩි 2000 ක පමණ වන බිම් මහල 2003 වර්ෂයේ දී රු.මිලියන 2 ක් වැයකර ඉදිකර 2004 පෙබරවාරි 15 දින විවෘත කර තිබුණු නමුත් සායන ආරම්භ කර නොතිබුණි. පසුව 2016 සහ 2017 වර්ෂවල දී රු.මිලියන 6.92 ක් වැයකර පළමු මහල ඉදිකර වහල සවි කර වැඩ නිමකර තිබුණි.

- හඟුරන්කෙත නගරයේ නව දෙමහල් ආයුර්වේද රෝහලක් ඉදිකිරීම සඳහා 2005 වර්ෂයේ දී සැලැසුම් සකස් කර රු.මිලියන 2.5 ක් පමණ වැයකර වර්ග අඩි 1500 ක් පමණ වන බිම් මහල පමණක් ඉදිකර කොන්ක්‍රීට් තට්ටුව දමා තිබුණි. නමුත් ඉතිරි වැඩ නිම නොකර සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අභාවිතව තිබුණි.

අනාර්ථික ගනුදෙනු

- මොරගහකන්ද කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ බලපෑමට ලක්වන රජයේ ආයතනයක් ලෙස දැනුවත්ව තිබූ කෝන්ගහවෙල ප්‍රාදේශීය රෝහල 2016 වර්ෂයේදී රු.මිලියන 2.74 ක් වැයකර හදිසි අනතුරු ඒකකයක් ඉදිකර තිබුණි. එම රෝහල මොරගහකන්ද කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතියට යටවූ බැවින් එම ඉදිකිරීම සඳහා වැය වූ මුදල නිෂ්ඵල වී තිබුණි.

- පල්ලේපොල ප්‍රාදේශීය රෝහලේ 2004 වර්ෂයේ දී රු.මිලියන 5 ක් වැය කර ඉදිකළ නව සායන ගොඩනැගිල්ල ගිලා බැසීමට ලක්ව තිබෙන බැවින් එම ගොඩනැගිල්ල විවෘත කිරීමට නොහැකිව පැවතුණි.

පාසල් ගොඩනැගිලිවල ඉදිකිරීම් අවිච්ඡේදවීම

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ පාසල් ගොඩනැගිලි 07 ක් ඉදිකිරීම සඳහා 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වර්ෂයන්වලදී සලසා තිබුණු ප්‍රතිපාදන පිළිවෙළින් රු.මිලියන 45.58 ක්, රු.මිලියන 31.11 ක් හා රු.මිලියන 37.71 ක් අවිච්ඡේද වී තිබුණි. එම ව්‍යාපෘති පටන්ගෙන අතරමඟ නතරවීම නිසා එම ප්‍රතිපාදන වෙනත් කාර්යයන් සඳහා යෙදවීමටද නොහැකි වී තිබුණි.

සායනය මධ්‍යස්ථානය වසා දැමීම

විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 1200 කට වැඩි වකුගඩු රෝගීන් සංඛ්‍යාවක් සිටින බවත්, එම තත්ත්වය වළක්වා ගැනීම සඳහා සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් රු.මිලියන 41.46 ක ප්‍රතිපාදන ලබාදී නවීන පහසුකම්වලින් සමන්විත සායන මධ්‍යස්ථානයක් ඉදිකර 2017 මාර්තු 13 දින මහජන අයිතියට පත් කර තිබුණි. එම වෛද්‍ය ඒකකය මධ්‍යම පළාත් සභාවට පවරා තිබුණත්, 2019 ජූනි 30 දින වන විට අදාළ වෛද්‍යවරුන්

නොමැතිකමින් මෙම ගොඩනැගිල්ල කිසිදු ප්‍රයෝජනයකට නොගෙන වසා දමා තිබුණි.

පාඩු හා හානි

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන අනුව වැඩසටහන් 03 කට අදාළව සිද්ධි 181 කට අදාළ රු.මිලියන 18.51 ක් වූ හානි හා පාඩු පැවැතුණි. එම හානිවලින් සිද්ධීන් 68 ක අදාළ රු.මිලියන 6.08 ක පාඩු හා හානි වර්ෂ 05 කට වැඩි වර්ෂ 10 ක් දක්වා වූ කාලය සිට පැවැත එමින් තිබුණි. සිද්ධීන් 53 කට අදාළ එකතුව රු.මිලියන 3.57 ක් පාඩු හා හානි වර්ෂ 10 කට වැඩි කාලය සිට පැවැත එමින් තිබුණි. දීර්ඝ කාලයක සිට පැවැත එන මෙම හානි හා පාඩු මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර අයකර ගැනීමට හෝ කපාහැරීමට කටයුතු කර නොතිබුණි.

අවිධිමත් ණය ප්‍රදානය

මධ්‍යම පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ, සමූපකාර අරමුදලින් අවිධිමත් ලෙස ණය නිකුත් කිරීම නිසා 2018 දෙසැම්බර් 15 දිනට වර්ෂ 01 ක සිට වර්ෂ 27 ක් දක්වා වූ කාල පරාසයක සිට පැවැත එන එකතුව රු.මිලියන 17.12 ක් වූ ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගෙන නොතිබුණි. ඒ තුළ වූ අවස්ථා 09 කදී ලබා දී තිබුණු එකතුව රු.මිලියන 2.27 ක් වූ ණය ශේෂ මුළුමණින්ම අය කර ගෙන නොතිබුණි.

ශුද්ධ අතිරික්තය පළාත් සභා අරමුදලට බැර නොකිරීම

පළාත් සභාවේ මූල්‍ය රීති 378(2) ප්‍රකාරව අත්තිකාරම් ගිණුම් කටයුත්තක ශුද්ධ අතිරික්තය පළාත් සභා අරමුදලට බැර කළ යුතු වුවත්, පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ඖෂධ අත්තිකාරම් ගිණුම් කටයුත්තේ සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂවලට අදාළ එකතුව රු.මිලියන 13.99 ක් වූ සමුච්චිත අතිරික්තය පළාත් සභා ආදායම් ශීර්ෂයට බැරකර නොතිබුණි.

බදුකුලිය අයකර නොගැනීම

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂයේදී ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 1.23 ක් වටිනා කිරි ශීත කිරීමේ උපකරණ පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණි. දෙපාර්තමේන්තුව විසින් උඩදුම්බර පශු වෛද්‍ය කාර්යාලයට අයත් ගොඩනැගිල්ල හා කිරි ශීත කිරීමේ උපකරණ, සුභසාධක සංගමයකට 2015 මාර්තු 25 දින ආරක්ෂිත තැන්පතුවකින් තොරව ගිවිසුම්ගතව පවරා දී තිබුණි. එම සංගමය විසින් වෙනත් බාහිර පාර්ශවයකට මාසිකව රු.6,000 ක බදු කුලියක් මත වර්ෂ 02 ක ගිවිසුමක් මත බදු දී තිබුණි. එසේ බදු දී ඇති බව පශු වෛද්‍ය කාර්යාලය දැනුවත්වීමට වර්ෂ 3 ½ කට ආසන්න කාලයක් ගතවී තිබුණි. එම දේපළ සුභසාධක සංගමයට පවරා ගැනීමට කටයුතු කර තිබුණු බව තහවුරු කිරීමට සාක්ෂි ඉදිරිපත් නොකළ අතර, එම දේපළ පැවරූ දින සිට විගණිත දිනවූ 2018 දෙසැම්බර් 06 දින දක්වා රජයට හිමිවිය යුතු එකතුව රු.264,000 ක් අය කර ගෙන නොතිබුණි.

දකුණු පළාත් සභාව

දකුණු පළාත් සභාව විසින් 2018 වර්ෂය සඳහා රු.මිලියන 25,653 ක් රජයේ ප්‍රදාන මඟින් හා අභ්‍යන්තර මාර්ගවලින් රු.මිලියන 8,258 ක්ද, වශයෙන් එකතුව රු.මිලියන 33,911 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණි. එම ආදායමෙන් රු.මිලියන 28,950 ක් පුනරාවර්තන වියදම් වශයෙන්ද, රු.මිලියන 4,761 ක් මූලධන වියදම් වශයෙන් එකතුව රු.මිලියන 33,711 ක් උපයෝජනය කිරීමට ඇස්තමේන්තු කර තිබුණි. ඒ අනුව 2018 වර්ෂයේදී රජයේ ප්‍රදාන මඟින් රු.මිලියන 26,889 ක්ද, අභ්‍යන්තර මාර්ග මඟින් රු.මිලියන 9,172 ක්ද වශයෙන් එකතුව රු.මිලියන 36,061 ක ආදායමක් රැස්කර තිබුණි. 2018 වර්ෂයේදී පුනරාවර්තන වියදම රු.මිලියන 30,147 ක් හා මූලධන වියදම රු.මිලියන 5,328 ක් වශයෙන් එකතුව රු.මිලියන 35,475 ක් උපයෝජනය කර තිබුණි. මේ අනුව වියදම ඉක්ම වූ ආදායම රු. මිලියන 586 ක් වී තිබුණි.

දකුණු පළාත් සභාවට අදාළව 2018 වර්ෂයේදී සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ වැදගත් නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දැක්වේ.

විදුලි පහසුකම් ලබාදීම

හම්බන්තොට දිස්ත්‍රික්කයේ මිද්දෙණියේ නැවුරල් පාක් නැමති පෞද්ගලික වෙන්දේසි ඉඩමට 2015 ඔක්තෝබර් 20 දිනැති අනුබෙදීම් බලපත්‍ර අයදුම්පත්‍රය අනුව විදුලිය පහසුකම් සහිතව පැවතුණු බව සහතික කර තිබුණි. නමුත් දකුණු පළාත් ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන, පරිසර කටයුතු, ග්‍රාමීය කර්මාන්ත, විදුලිබල සහ ග්‍රාමීය වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය විසින් 2018 ජුනි 21 දින එම ඉඩමට විදුලිය ලබා ගැනීම සඳහා රු.මිලියන 1.67 ක් ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවා තිබුණි.

වැඩිපුර ගෙවීම්

දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන, ප්‍රවාහන, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, සංචාරක සහ ඉංජිනේරු සේවා අමාත්‍යාංශය විසින් දිළිඳු බව අවම කිරීම හා විශේෂ ජාතික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යටතේ පළාත් පාලන ආයතන වෙත ලබාදීම සඳහා ජල බවුසර් 04 ක් මිලදී ගෙන තිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ නොසලකා ප්‍රසම්පාදන කමිටුව විසින් අදාළ මිලදී ගැනීම සිදු කිරීම නිසා රු.මිලියන 9.63 ක් වැඩිපුර ගෙවා තිබුණි.

ප්‍රසම්පාදන මාර්ගොපදේශවලට පටහැනිවීම්

දකුණු පළාත් අධ්‍යාපන ,ඉඩම් හා ඉඩම් සංවර්ධන මහාමාර්ග සහ ප්‍රවෘත්ති අමත්‍යාංශය විසින් පාසල් 659 ක් සඳහා ක්‍රීඩා උපකරණ මිලදී ගැනීම සඳහා රු.මිලියන 3.00 ක් වැය කර තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගොපදේශ සංග්‍රහයේ 3.4 මාර්ගෝපදේශයට අනුකූල නොවී කටයුතු කිරීම නිසා රු.මිලියන 1.06 ක මූල්‍යමය අලාභයක් සිදු කර තිබුණි.

අලාභයන් අයකර නොගැනීම

දකුණු පළාත් අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන, මහාමාර්ග සහ ප්‍රවෘත්ති අමාත්‍යාංශයට අයත්, වාහනයක් සමාලෝචිත වර්ෂයේ දී අනතුරට ලක් වී තිබුණි. එම අනතුර නිසා වාහනයට සිදු වී තිබුණු මුළු අලාභහානියේ වටිනාකම රු.මිලියන 1.63 ක් ලෙස තක්සේරු කර තිබුණි. පළාත් අමාත්‍යාංශයේ ලේකම් විසින් 2019 මාර්තු 22 දිනැති ලිපියෙන් එම අලාභය අදාළ වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකළ යුතු බව දන්වා තිබුණි. නමුත් එම අලාභය අයකර ගැනීමට

2019 මැයි 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

පාසල් සංවර්ධන සමිතියක මුදල් අවිධිමත් ලෙස පරිහරණය කිරීම

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගාල්ල කළාප අධ්‍යාපන කාර්යාලයට අයත් පාසලක සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා පාසල් සංවර්ධන සමිති ගිණුමට බැර කළ යුතු මුදලට වඩා රු.846,000 ක් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් වැඩිපුර බැර කර තිබුණි. එම මුදල හා දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පාසල් අධ්‍යාපනය දැනුමේ කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ පාසලට ලබා දුන් රු.මිලියයක් ඇතුළුව පාසල් සංවර්ධන සමිති ගිණුමේ තිබූ එකතුව රු.මිලියන 2.96 ක් පාසල් විදුහල්පතිවරයා විසින් අවිධිමත් ලෙස භාවිතා කර තිබුණි.

අවිධිමත් ගෙවීම්

දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ ගරු හිටපු ආණ්ඩුකාරතුමියගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට අනුයුක්තව 2006 නොවැම්බර් 01 දින සිට සේවය කළ නිලධාරිනියකට 2012 අප්‍රේල් 24 දින සිට ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ, කෞතුකාගාර සහායකවරියක වශයෙන් තනතුරක් ලැබ සේවය කර තිබුණි. එකම කාල පරිච්ඡේදය තුළ එනම් 2012 අප්‍රේල් 24 දින සිට 2015 ජනවාරි මාසය දක්වා දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලයෙන් හා ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ සේවය කිරීම වෙනුවෙන් වැටුප් වශයෙන් පිළිවෙලින් රු.760,368 ක් සහ රු.733,267 ක් ලබාගෙන තිබුණි.

උතුරු පළාත් සභාව

උතුරු පළාත් සභාව විසින් 2018 වර්ෂය සඳහා රු.මිලියන 26,669 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබූ අතර, එය රු.මිලියන 23,169 ක් රජයේ ප්‍රදානවලින් හා රු.මිලියන 3,500 ක් වෙනත් අභ්‍යන්තර ආදායම් මාර්ගවලින් සමන්විත විය. එම ඇස්තමේන්තුගත ආදායමෙන් පුනරාවර්තන වියදම් සඳහා රු.මිලියන 23,323 ක් හා ප්‍රාග්ධන වියදම් සඳහා රු.මිලියන 4,966 ක් වශයෙන් එකතුව රු.මිලියන 28,289 ක් වැය කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද, 2018 වර්ෂය සඳහා රජයේ ප්‍රදානවලින් රු.මිලියන 21,788 ක් හා වෙනත් අභ්‍යන්තර ආදායම් මාර්ගවලින් රු.මිලියන 4,956 ක් වශයෙන් ලැබී තිබුණු එකතුව රු.මිලියන 26,744 ක් වූ ආදායම්වලින් පුනරාවර්තන වියදම් සඳහා රු.මිලියන 22,109 ක් හා මූලධන වියදම් සඳහා රු.මිලියන 3,463 ක් වශයෙන් එකතුව රු.මිලියන 25,572 ක් 2018 වර්ෂය තුළ වැය කර තිබුණි.

පළාත් සභාවේ කාර්යභාරයන් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ වැදගත් හා ප්‍රමාණාත්මක නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

අවිධිමත් පත්වීම්

2015 වර්ෂය තුළදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව විදුලි සෝපාන ක්‍රියාකරුවෙකු පත්කර තිබූ අතර, 2005 දෙසැම්බර් 31 දින සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා වැටුප් වශයෙන් රු.මිලියන 3.1 ක් ගෙවා තිබුණි. කෙසේ වුවද, එම කාල සීමාව තුළ එම ගොඩනැගිල්ලේ කිසිඳු විදුලි සෝපානයක් ඉදිකර නොතිබුණි.

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව කාර්ය මණ්ඩල වර්ග 10 ක් යටතේ නිලධාරීන් 16 දෙනෙකු යාපනයේ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට බඳවා ගෙන තිබුණි.

කෝකියෙකු, විදුලි සෝපාන ක්‍රියාකරුවෙකු, කම්කරුවෙකු, සාත්තු සේවකයෙකු සහ සහකාර සෞඛ්‍ය සේවකයින් තිදෙනෙකු ඇතුළු සේවකයින් 7 දෙනෙකු ඔවුන්ගේ රාජකාරි ලැයිස්තුවලට පටහැනිව රියදුරු සහ එන්නත් කිරීමේ රාජකාරි සඳහා අනුයුක්ත කර තිබුණි.

2014 වර්ෂයේදී නිසි අනුමැතියකින් තොරව ඉංජිනේරුවරයෙකු හා පශු වෛද්‍යවරයෙකු මහ නගර සභාවට පත්කර තිබුණු අතර, 2014 සහ 2015 වර්ෂවලදී වැටුප් හා ගමන් වියදම් ලෙස රු.1,135,309 ක් ගෙවා තිබුණි.

රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් 2007 ජූලි 31 දින පෙර සේවයෙන් ඉවත් කරන ලද ගුරුවරියකට පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් අක්‍රමවත් පත්වීමක් ලබාදී තිබූ අතර, 2014 වර්ෂය තුළදී රු. 428,482 ක් වැටුප් ලෙස ලබාදී තිබුණි.

2017 සැප්තැම්බර් 07 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී, මෙම ගැටළුව අධ්‍යයනය කිරීම සඳහා සහ මෙම පත්වීමේ වලංගුභාවය පිළිබඳ නිර්දේශ ලබා ගැනීම සඳහා කමිටුවක් පත් කරන ලෙස ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරී වෙත නියෝග කරන ලදී. එම නම් කරන ලද කමිටුව විසින් ඉහත සඳහන් පත්වීම විධිමත් නොවන බව නිර්දේශ කර තිබුණි. ඒ අනුව, එසේ ගෙවන ලද වැටුප් හා

වෙනත් දීමනා රජයට සිදුවූ මූල්‍යමය අලාභයක් ලෙස නිරීක්ෂණය විය.

තවද, පළාත් රාජ්‍ය සේවයේ එම පත්වීම ලබා දීම සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හිටපු ලේකම්වරයා තනිකරම වගකිව යුතු බැවින් ඔහුට එරෙහිව විනය පරීක්ෂණයක් පැවැත්වීමට පත්කරන ලද කමිටුව නිර්දේශ කර තිබුණි.

එසේම, ලේඛන වාසිදායක ලෙස වෙනස්කර ආණ්ඩුකාරවරයා වෙත ඉදිරිපත් කිරීම හේතුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාට එරෙහිව රජයේ නිලධාරීන්ගෙන් සැදුම්ලත් සුදුසු කොමිෂන් සභාවක් හරහා වැඩිදුර පරීක්ෂණ පැවැත්වීමට ද පත් කරන ලද කමිටුව නිර්දේශ කර තිබුණි.

වංචනික ගනුදෙනු

2015 වර්ෂයේදී රු.2,934,429 ක වංචාවක් සිදුවී තිබූ අතර, කළමනාකරණ සහායකයකු එම වංචාවට සම්බන්ධ බව අනාවරණය විය. කෙසේ වුවද, එම පුද්ගලයාගෙන් රු.320,000 ක මුදලක් අයකර ගෙන ඇති අතර, රු.2,614,429 ක් වූ ඉතිරි වංචා මුදල එම චූදිත කළමනාකරණ සහායකයකගෙන් අයකර ගෙන නඩුව අවසන් කිරීම සඳහා පිළියම් යෙදීමකින් තොරව වර්ෂ දෙකකට අධික කාලයක් මුළුල්ලේ පරීක්ෂණ පවත්වා තිබුණි.

2019 මැයි 30 සිදුකරන ලද විගණන පරීක්ෂණයකට අනුව, 2018 ජනවාරි මාසයේ සිට 2019 මැයි මාසය දක්වා කාලය තුළ සංවර්ධන නිලධාරියෙකු විසින් සිදු කරන ලද මුදල් වංචා හේතුවෙන් රු.592,750 ක අලාභයක් සිදුවී තිබුණි. ආදායම් එකතු කිරීම පිළිබඳව නිසි අභ්‍යන්තර පාලනයක් නොමැති වීම හේතුවෙන් එවැනි මුදල් වංචාවක් කිරීමට අවස්ථාව ලැබී තිබුණි. එනම්, මුදල් එකතු කිරීම සහ බැංකුවේ තැන්පත් කිරීම යන සියලු ක්‍රියාකාරකම් එක් පුද්ගලයෙකු විසින් සිදු කර තිබුණි.

දූෂ්‍ය අක්‍රමිකතා

මන්නාරම කළාප අධ්‍යාපන කාර්යාලයට අනුයුක්ත පාසල් විදුහල්පතිවරුන් 2 දෙනෙක්, ගුරුවරු 151 දෙනෙක් හා කාර්යාල සේවකයින් 17 දෙනෙක් වයඹ පළාතේ (පුත්තලම දිසිත්‍රික්කය) පාසල් 6 ක සේවය සඳහා යොදවා තිබුණි. 2017 හා 2018 වර්ෂවලදී වැටුප් හා වෙනත් දීමනා වශයෙන් රු.මිලියන 160.09 ක් උතුරු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබුණි. කෙසේ වුවද, 2019 ජූනි 28 දින වන විටත් එම මුදල් වයඹ පළාත් සභාවෙන් ප්‍රතිපූරණය කර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. ඒ අනුව, මන්නාරම කළාප අධ්‍යාපන කාර්යාලය විසින් වැය කරන ලද මුදල් සඳහා උතුරු පළාත් සභාවට වටිනාකමක් ලැබී නොතිබුණු බව නිරීක්ෂණය විය.

භාවිතයට නොගත් වත්කම්

NELSIP, ENREP සහ PSDG ව්‍යාපෘතිවල අරමුදල් භාවිතා කරමින් රු.මිලියන 259.18 ක පිරිවැයකින් ඉදිකරන ලද සාප්පු සංකීර්ණ, සතිපතා වෙළඳපල, ළමා උද්‍යාන, ප්‍රධාන නිල නිවාස සහ සංචාරක ගොඩනැගිලි ආදී සංවර්ධන කාර්යයන් 18 ක් අපේක්ෂිත අරමුණු සඳහා යොදවා නොතිබුණි.

ආදායම් කළමනාකරණය

එක් මහ නගර සභාවකින්, නගර සභා 5 කින් සහ ප්‍රාදේශීය සභා 28 කින් ලැබිය යුතු මුද්දර බදු රු.මිලියන 774.02 ක්, උසාවි දඩ මුදල් රු. මිලියන 220.98 ක්, ගාස්තු රු.මිලියන 238.78 ක් සහ අනෙකුත් හිඟ ආදායම් රු.මිලියන 118.3 ක් වශයෙන් හිඟ ආදායම් එකතුව රු.මිලියන 1,352.08 ක් 2018 දෙසැම්බර් 31 දිනට නිරවුල් කර නොතිබුණි.

කොන්ත්‍රාත් පරිපාලනය

ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘති (එන්එස්බීඑස්) වැඩ 54 ක් කොන්ත්‍රාත් ගිවිසුමේ 6.4 වගන්තිය ප්‍රකාරව නිශ්චිත කාල සීමාව තුළ සම්පූර්ණ කර නොතිබුණි. ඒ අනුව, විගණනය සිදු කරන ලද 2018 ජුනි 21 දිනට ප්‍රමාද වීමේ කාල සීමාව දින 30 ක සිට දින 559 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. කෙසේ වුවද, ඇස්තමේන්තුගත ද්‍රවශීලතා හානිය වූ රු. මිලියන 53.13 ක මුදල ඉල්ලුම් කර නොතිබුණි.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට පෙර එම ප්‍රදේශයේ අවශ්‍යතා පිළිබඳව සමීක්ෂණයක් සිදු නොකර රු.මිලියන 5 ක ඇස්තමේන්තුගත පිරිවැයකින් වව්නියාව දිස්ත්‍රික්කයේ කබඩි ක්‍රීඩාංගනයක් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණි. පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව විසින් රු.3,014,206 ක් වටිනාකමැති චෙක්පත් 03 ක් ප්‍රාදේශීය සභාව වෙත නිකුත් කර තිබුණි. කෙසේ වුවද, එකඟ වූ කාල සීමාව තුළ වැඩ නිමකර නොතිබුණි. ඉන් රු.3,014,206 ක් වටිනා එක් චෙක්පතක් 2016 සැප්තැම්බර් 14 දින දෙපාර්තමේන්තුවේ ආදායම් ගිණුමට බැර කර තිබූ අතර, රු.1,984,824 ක් වටිනාකමැති අනෙක් චෙක්පත් දෙක දෙපාර්තමේන්තුවේ පොදු තැන්පත් ගිණුමට බැර කර තිබුණි.

අතහැර දැමූ ව්‍යාපෘති

ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘති (එන්එස්බීඑස්) යටතේ රු.මිලියන 31.7 ක් වටිනාකමැති වැඩ තුනක් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ආරම්භ නොකර සම්පූර්ණයෙන්ම අතහැර දමා තිබුණි.

සේවක මණ්ඩල පරිපාලනය

2009 මාර්තු 25 දිනැති අංක එන්පී/02/2009(7) දරන පළාත් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව, එක් ආයතනයක නිලධාරියෙකුගේ උපරිම සේවා කාලය අවුරුදු 05කට සීමා කර තිබුණි. එසේ වුවද, යාපනයේ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ සේවකයින් 27 දෙනෙකු එකම ආයතනයේ වර්ෂ 07 ක සිට වර්ෂ 34 ක් දක්වා කාලයක් සේවය කර තිබුණි.

අනුමත වෛද්‍ය නිලධාරීන් 864 දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් අනුමත කර තිබුණත්, වෛද්‍ය නිලධාරීන් 644 ක් පමණක් සේවයේ යොදවා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස වෛද්‍ය නිලධාරීන්ගේ උපදෙස් නොමැතිව පර්යන්ත රෝහල් කිහිපයක් ක්‍රියාත්මක කර තිබුණි.

උතුරු පළාතේ දන්ත ශල්‍ය වෛද්‍යවරුන් සඳහා අනුමත 97 දෙනාගෙන් 2018 වර්ෂය අවසන් වන විට දන්ත ශල්‍ය වෛද්‍යවරුන් 90 දෙනෙකු පමණක් සේවයේ යොදවා තිබුණි. ඒ අනුව, පළාතේ දන්ත ශල්‍ය වෛද්‍යවරුන්ගේ පුරප්පාඩු 07 ක් පැවතුණි.

ප්‍රධාන රෝහල්වල හෙද නිලධාරීන්ගේ හිඟයන් කිහිප අවස්ථාවක නිරීක්ෂණය වූ

අතර, ඒ අනුව, හෙද නිලධාරීන් සඳහා අනුමත **1,119** දෙනාගෙන් **889** දෙනෙක් පමණක් පළාතේ සේවය කරන බව නිරීක්ෂණය විය.

වයඹ පළාත් සභාව

වයඹ පළාත් සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 30,937.3 ක් රජයේ ප්‍රදාන මඟින්ද, අභ්‍යන්තර මාර්ගවලින් රු.මිලියන 9,290 ක් ද වශයෙන් එකතුව රු.මිලියන 40,227.3 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණි. 2018 වර්ෂයේ දී පුනරාවර්තන හා මූලධන වියදම් ලෙස පිළිවෙලින් රු.මිලියන 32,058.5 ක් හා රු.මිලියන 8,168.8 ක් ද වශයෙන් එකතුව රු.මිලියන 40,227.3 ක වියදම් ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී රජයේ ප්‍රදාන මඟින් රු.මිලියන 24,077.3 ක් ද, අභ්‍යන්තර මාර්ග මඟින් රු.මිලියන 8,591.9 ක් ද වශයෙන් එකතුව රු.මිලියන 32,669.3 ක ආදායම් රැස්කර තිබුණි. පුනරාවර්ථන වියදම රු.මිලියන 30,710.2 ක් හා මූලධන වියදම රු.මිලියන 2,233.5 ක් වශයෙන් රු.මිලියන 32,943.7 ක් උපයෝජනය කර තිබුණි.

වයඹ පළාත් සභාව විසින් සමාලෝචිත වර්ෂයේ දී ඉටු කළ කාර්යභාරයන් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ වැදගත් විගණන නිරීක්ෂණයන් සම්පිණ්ඩනය කර පහත දැක්වේ.

ස්ථාවර තැන්පතුවල මුදල් ආයෝජනය කිරීම

ප්‍රධාන අමාත්‍යාංශය යටතේ පළාත් සභාව විසින් ප්‍රඥප්ති මඟින් ස්ථාපිත කර ඇති ආයතනවලට ලබාදුන් ප්‍රතිපාදන හා රැස්කළ ආදායමෙන් මහජන යහපත වෙනුවෙන් ඉටු කළ යුතු කාර්යභාරයන් ඉටු නොකර රු.මිලියන 196.99 ක් බැංකුවල ස්ථාවර තැන්පත් ගිණුම්වල ආයෝජනය කර තිබුණි.

වෙනත් සේවාවන් සඳහා ගුරුභවතුන් මුදාහැරීම

ආයතන සංග්‍රහයේ V පරිච්ඡේදයේ 2.5.1 වගන්තිය අනුව රජයේ සේවයේ තනතුරක් දරන නිලධාරියෙකු වෙනත් සේවයකට අවුරුදු 02 කට වැඩි කාලයකට මුදා නොහැරිය යුතු වුවත්, වයඹ පළාතේ අධ්‍යාපන කළාප 04 කට අදාළ ගුරුභවතුන් 24 ක් ත්‍රිවිධ හමුදාවේ ස්වේච්ඡා බලකායන්හි සක්‍රීය සේවය සඳහා මුදා හැර වර්ෂ 02 ක කාලය අවසන්ව තිබුණි. නමුත් නැවත ගුරු සේවයට වාර්තා කර නොතිබුණි. තවද, 1993 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා මෙම ගුරුභවතුන් 24 සඳහා වෙත එකතුව රු.මිලියන 61.14 ක වැටුප් වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබුණි.

මුද්දර ගාස්තු සහ උසාවි දඩ

සමාලෝචිත වර්ෂය අවසන් වන විට පළාත් පාලන ආයතන 31 කට අදාළව පළාත් සභාව වෙත ලැබී තිබුණු මුද්දර ගාස්තු සහ උසාවි දඩ පිළිවෙලින් රු.මිලියන 323.23 ක් හා රු.මිලියන 150.90 ක්, එම පළාත් පාලන ආයතන වෙත ප්‍රේෂණය නොකර ප්‍රධාන ලේකම් කාර්යාලයේ රඳවා ගෙන තිබුණි.

හිඟ ආදායම් සහ එළදා බදු

ප්‍රධාන ලේකම් කාර්යාලය, පළාත් ආදායම් දෙපාර්තමේන්තුව සහ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් 2018 දෙසැම්බර් 31 දිනට ආදායම් සංකේත 07 ක් සඳහා අයකර ගත යුතු එකතුව රු.මිලියන 236.21 ක් වූ හිඟ ආදායම් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 කින් 2018 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු එකුතව රු.මිලියන 65.49 ක හිඟ එළදා බදු සහ ඉඩම් බදු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

නිෂ්කාර්ය වත්කම්

නිසි ශක්‍යතා අධ්‍යනයක් හා සැලැසුම්කරණයක් නොමැතිව රු.මිලියන 12.62 ක් වැය කර නිම කරන ලද මදුරන්කුලිය සංචාරක තොරතුරු හා පහසුකම් මධ්‍යස්ථානය වර්ෂ දෙකකට නොවැඩි කාලයක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ ජනසළු මධ්‍යස්ථානයන්හි භාවිතයට නොගන්නා විවිධ මානයන්ගෙන් යුත් එකතුව රු.මිලියන 1.14 ක් වටිනා නූල් තොග පැවතුණි.

අසාර්ථක ව්‍යාපෘති

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ගැබිණි එළදෙනුන් සුලභ කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 7.6 ක් ලබාදී තිබූ අතර, 2018 වර්ෂය වන විට ඉන් රු.මිලියන 6.61ක් වියදම් කර තිබුණි. සැලැසුම් කළ පරිදි සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ගවගාල් ඉදිකර නොතිබූ අතර අලෙවි කිරීම සඳහා එක් සතෙකු හෝ සූදානම් කර නොතිබුණි.

කල් ඉකුත් වූ ඖෂධ හා තත්ත්වයෙන් අසමත් ඖෂධ

කුරුණෑගල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් ආයතන 48 ක 2018 දෙසැම්බර් 31 දිනය වන විට රු.මිලියන 9.69 ක් වටිනා කල් ඉකුත් වූ ඖෂධ ඒකක 439 ක් හා රු.මිලියන 2.60 ක් වටිනා තත්ත්වයෙන් අසමත් ඖෂධ ඒකක 124 ක් පැවතුණි.

කළමනාකරණ අකාර්යක්ෂමතා

2017 වර්ෂයේ දී ආරම්භ කර තිබුණු වයඹ පළාත් රණවිරු ස්මාරකය ඉදිකිරීම වෙනුවෙන් රු.මිලියන 18.69 ක් වැය කර තිබුණු අතර, 2018 මැයි 11 දින පැවති විවෘත කිරීම වෙනුවෙන් ද උපමාන පාදක සංවර්ධන ප්‍රදාන යටතේ රු.මිලියන 7.09 ක් වැය කර තිබුණි. රණවිරු ස්මාර්කය විවෘත කිරීම සඳහා වූ වියදම එය ඉදිකිරීම සඳහා වැය කළ වියදමෙන් සියයට 38 ක් වී තිබුණි.

උතුරු මැද පළාත් සභාව

උතුරු මැද පළාත් සභාව විසින් 2018 වර්ෂය සඳහා රු.මිලියන 18,199.92 ක් රජයේ ප්‍රදාන මගින් හා අභ්‍යන්තර මාර්ගවලින් රු.මිලියන 4,240 ක්ද, වශයෙන් එකතුව රු.මිලියන 22,439.92 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණි.එම ආදායමෙන් රු.මිලියන 18,314.91 ක් පුනරාවර්තන වියදම් වශයෙන්ද, රු.මිලියන 3,921.31 ක් මූලධන වියදම් වශයෙන් එකතුව රු.මිලියන 22,236.22 ක් උපයෝජනය කිරිමට ඇස්තමේන්තු කර තිබුණි. ඒ අනුව 2018 වර්ෂයේදී රජයේ ප්‍රදාන මගින් රු.මිලියන 14,013.10 ක්ද, අභ්‍යන්තර මාර්ග මගින් රු.මිලියන 3,961.30 ක්ද, වශයෙන් එකතුව රු.මිලියන 22,974.44 ක ආදායම් රැස්කර තිබුණි. 2018 වර්ෂයේදී පුනරාවර්තන වියදම රු.මිලියන 18,635.37 ක් හා මූලධන වියදම් රු.මිලියන 9,764.70 ක් වශයෙන් එකතුව රු.මිලියන 28,400.70 ක් උපයෝජනය කර තිබුණි. මේ අනුව ආදායම ඉක්මවූ රු.මිලියන 5,426.30 ක් වී තිබුණි.

උතුරු මැද පළාත් සභාවට අදාළව 2018 වර්ෂයේදී සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ වැදගත් නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දැක්වේ.

විගණනය සඳහා සාක්ෂි ඉදිරිපත් නොවීම

2018 දෙසැම්බර් 31 දිනට පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 05 ක් විසින් නිරවුල් නොකළ අග්‍රිම හර ශේෂ එකතුව රු.මිලියන 29.03 ක් වූ අතර පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් නිරවුල් නොකළ අග්‍රිම බැර ශේෂය රු.මිලියන 3.33 ක් වී තිබුණි. එයින් පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 04 කට අදාළව වර්ෂ 4 කට වැඩි කායක සිට නොපියවා පැවැත එන රු.මිලියන 27.86 ක ශේෂවල නිරවද්‍යතාවය තහවුරු කර ගැනිමට ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

පළාත් පාලන ආයතන වෙත නිරවුල් කළ යුතු ආදායම්

පළාත් සභාව විසින් 2018 වර්ෂයේදී රු.මිලියන 288.06 ක උසාවි දඩ ආදායම් රැස්කර ගෙන තිබුණත්, එයින් පළාත් පාලන ආයතන වෙත රු.මිලියන 190.02 ක් පියවා තිබුණි. ඒ අනුව රැස්කර තිබුණු ආදායමෙන් රු.මිලියන 98.04 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පළාත් පාලන ආයතන 26 ක් වෙත පියවා නොතිබුණි.

තවද, පළාත් සභාව විසින් 2018 වර්ෂයේදී රැස්කර ගෙන තිබූ මුද්දර ගාස්තු ආදායම රු.මිලියන 149.74 ක් වූ අතර එයින් පළාත් පාලන ආයතන වෙත රු.මිලියන 114.51 ක් ගෙවා තිබුණි. ඒ අනුව පළාත් පාලන ආයතන වෙත මුද්දර ගාස්තු ආදායම් ලෙස රු.මිලියන 35.23 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පියවා නොතිබුණි.

පළාත් ප්‍රධාන අමාත්‍ය අරමුදල

1992 අංක 05 දරන ප්‍රධාන අමාත්‍ය අරමුදල ප්‍රඥප්තියේ 3(1) වගන්තිය මඟින් අරමුදලේ කළමනාකරණය හා පරිපාලනය එහි පාලක මණ්ඩලය වෙත පවරා තිබුණි. එහි පාලක මණ්ඩලය ප්‍රධාන අමාත්‍යවරයා හා විපක්ෂයේ මන්ත්‍රීවරුන් දෙදෙනෙකු ඇතුළු 06 දෙනෙකුගෙන් සමන්විත වූ අතර පළාත් සභාව විසුරුවා හැරීමෙන් පසුව, අරමුදල පවත්වාගෙන යායුතු ක්‍රමවේදය ප්‍රඥප්තියේ දක්වා නොතිබුණු බැවින්, පළාත් සභාව විසුරුවා හරින ලද දින සිට අරමුදල අක්‍රිය වී තිබුණි.

හිඟහිටි මුද්දර ගාස්තු

1990 අංක 13 දරන උතුරු මැද පළාතේ මුදල් ප්‍රඥප්තියේ XII වන පරිච්ඡේදයේ 40(2) වගන්තිය ප්‍රකාරව නිශ්චල දේපල විකිණීමට හෝ පැවරීමකට අදාල සාධන පත්‍රයක් සඳහා ගෙවිය යුතු මුද්දර ගාස්තු එකී සාධන පත්‍රය අත්සන් කරන අස්ථාවේදීම ගෙවා අවසන් කළ යුතුව තිබුණි. 2018 වර්ෂයේදී නොතාරිස්වරුන් දෙදෙනෙකු විසින් අත්සන් කර තිබුණු සාධන පත්‍ර 32 ක් වෙනුවෙන් රු.728,250 ක් වූ මුද්දර ගාස්තු හිඟහිට පැවතුණි. 2019 අප්‍රේල් මාසය අවසන් වන විටද එම මුද්දර ගාස්තු ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

නිම නොකළ ව්‍යාපෘති

උතුරු මැද පළාතේ සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා තාක්ෂණික ප්‍රමිතියෙන් යුතු වාර්තාමය වීඩියෝ වැඩසටහනක් සකස් කිරීම, ආකර්ෂණීය පින්තූර සහිත ප්‍රමිතියෙන් යුතු පොතක් නිර්මාණය කිරීම සහ විධිමත් තොරතුරු සහිත වෙබ් අඩවියක් නිර්මාණය කිරීම වෙනුවෙන් ප්‍රධාන ලේකම් විසින් සැපයුම්කරුවෙකු සමඟ රු.මිලියන 15.80 කට 2016 මාර්තු 23 දින ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුම්ගත මුදලින් සියයට 77 ක් වූ රු.මිලියන 12.14 ක්, 2016 දෙසැම්බර් 26 දින වන විටත් ගෙවා අවසන් කර තිබුණි. නමුත් 2019 සැප්තැම්බර් 10 දින වන විටත් ව්‍යාපෘතිය අවසන් කර පළාත් සභාව වෙත භාරදී නොතිබුණි. ව්‍යාපෘතියේ ප්‍රධාන අංගයක් වන සංචාරක ආකර්ෂණයකින් යුතු වෙබ් අඩවියක් නිර්මාණය කිරීම සඳහා සැපයුම්කරුට ඇති සුදුසුකම් හා සැපයුම්කරු මීට ප්‍රථමයෙන් නිර්මාණය කරන ලද වෙබ් අඩවිවල විස්තර ලබා නොගෙන විවෘත ලංසු කැඳවීමෙන් තොරව සැපයුම්කරුවා තෝරාගෙන තිබුණි. ව්‍යාපෘතිය අවසන් කළ යුතු දිනය සඳහන් කර නොතිබීම, ගිවිසුමේ කොන්දේසි ඉදිරියෙන් දෙපාර්ශවය අත්සන් කර නොතිබීම, ඇතුළු විවිධ අඩුපාඩු ගිවිසුමේ පැවතීම නිසා සැපයුම්කරුට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමටද නොහැකි වී තිබුණි.

රුධිර කාන්දුකරණ පෙරන යන්ත්‍ර නිෂ්ක්‍රීයව පැවැතීම

කැබිතිගොල්ලෑව මූලික රෝහලේ රුධිර කාන්දු කරන ඒකකයක් ඉදිකිරීම වෙනුවෙන් 2016 වර්ෂයේදී රු.මිලියන 1.37 ක් පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් ද, එකී ඒකකය සඳහා රුධිර කාන්දුකරණ පෙරන යන්ත්‍ර 04 ක්, ඇඳන් 04 ක් සහ RO ජල පෙරන පද්ධතියක් ඇතුළු උපාංග වෙනුවෙන් රු.මිලියන 10 කට අධික මුදලක් සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් වැය කර තිබුණි එසේම රුධිර කාන්දුකරණ යන්ත්‍ර ආරක්ෂා කිරීම සහ රුධිර කාන්දුකරණ ඒකකය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා අධිබලැති විදුලි උත්පාදන යන්ත්‍රයක්ද ලබාදී තිබුණි. එසේ වුවද විශේෂඥ වෛද්‍ය වරයෙකු ඇතුළු කාර්ය මණ්ඩලයක් ලබාදී නොතිබීම නිසා රුධිර කාන්දුකරණ ඒකකය නිෂ්ක්‍රීයව පැවතුණි. දිනකට වකුගඩු රෝගීන් 16 දෙනෙකුගේ රුධිරකාන්දුකරණය කිරීමට හැකි මෙම යන්ත්‍රය නිෂ්ක්‍රීයව පැවති වර්ෂ 02 ක කාලය තුළ වකුගඩු රෝගීන් සඳහා වාර 11680 ක් රුධිර කාන්දුකරණය (Dialysis) කිරීමේ හැකියාව අහිමි වී තිබුණි.

නිෂ්කාර්ය වියදම්

රෝගීන්ගේ දත්ත පරිගණක ගතකිරීම, ඖෂධ නිකුත් කිරීමේ අඩුපාඩු අවමකර ගැනීම, කාර්යක්ෂමතාවය සහ ඵලදායිතාවය වැඩිකර ගැනීම සහ ප්‍රතිකාර සඳහා පැමිණෙන රෝගීන්ට කෙටි වේලාවකින් ප්‍රතිකාර ගැනීමට හැකිවීම යන වාසි ලබාගත හැකිවන ලෙස සෞඛ්‍ය සේවාව කාර්යක්ෂමව ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ තෝරාගත් රෝහල් 03 ක බාහිර රෝගී අංශ ජාලගත කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. ඒ අනුව 2012 සහ 2017 වර්ෂවලදී ශක්‍යතා අධ්‍යනයකින් සහ නිලධාරීන් පුහුණු කිරීමකින් තොරව උක්ත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 12.35 ක

පරිගණක මෘදුකාංග හා අමතර කොටස් ලබාදී තිබුණි. නමුත්, ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී නොතිබුණි. මිලදී ගෙන තිබුණු පරිගණක මෘදුකාංග හා අමතර කොටස්වලින් රු.මිලියන 9.68 ක් වූ ප්‍රමාණයක් තාක්ෂණික වශයෙන් යල් පැන ගොස් තිබුණු අතර අපේක්ෂිත අරමුණ ඉටුනොවීමෙන් වියදම නිෂ්කාර්ය වී තිබුණි.

අත්හැර දැමූ ව්‍යාපෘති

උතුරු මැද පළාතේ පළාත් අමාත්‍යාංශ හා පළාත් දෙපාර්තමේන්තුවල ඉංජිනේරුමය කාර්යයන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපාති 473 ක් වෙනුවෙන් ව්‍යාපෘති සැලැසුම් සැකැසීම, ඉංජිනේරු ඇස්තමේන්තු සැකැසීම ඇතුළු ඉංජිනේරු උපදේශක සේවාවලට අදාළ මූලික කටයුතු සිදු කර ඒ සඳහා රු.මිලියන 1,777 ක් වැය කර තිබුණි. එසේ වුවත් ඉන් රු.මිලියන 977 ක්වූ ව්‍යාපෘති 192 ක් අතහැර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 800 ක් වූ ව්‍යාපෘති 281 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

ඌව පළාත් සභාව

ඌව පළාත් සභාව විසින් 2018 වර්ෂය සඳහා එකතුව රු. මිලියන 23,887 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණි. එයින් රු.මිලියන 19,567 ක් රජයේ ප්‍රදාන මගින් ලබාගැනීමට හා රු.මිලියන 4,320 ක් අභ්‍යන්තර මාර්ග මගින් රැස්කිරීමටද, ඇස්තමේන්තු කර තිබුණි. ඉන් රු.මිලියන 20,031 ක් පුනරාවර්තන වියදම් සඳහා හා රු.මිලියන 3,855 ක් මූලධන වියදම් සඳහා උපයෝජනය කිරීමට අපේක්ෂා කර තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේදී රජයේ ප්‍රදාන මගින් රු.මිලියන 19,053 ක් ලැබී තිබුණු අතර රු.මිලියන 3,708 ක් අභ්‍යන්තර මාර්ග මගින් රැස්කර තිබුණි. තවද පුනරාවර්තන වියදම් සඳහා රු.මිලියන 20,307 ක් හා මූලධන වියදම් සඳහා රු.මිලියන 2,937 ක් වැය කර තිබුණි.

ඌව පළාත් සභාව සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ වැදගත් විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

ආදායම් කළමනාකරණය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පළාත් සභාවලට පැවරී ඇති කර්යභාරයන්ට අයත් ආදායම් සංකේත 13 ක් සම්බන්ධයෙන් ඌව පළාත් සභාව විසින් ප්‍රඥප්ති සම්මත කරගෙන නොතිබුණි.

පළාත් සභාව විසින් සම්මත කර තිබුණු මුදල් ප්‍රඥප්ති අනුව ආදායම් සංකේත 05 ක් වෙනුවෙන් එකතුව රු.මිලියන 147.88 ක ආදායම් හිඟහිටව පැවතුණි. එම හිඟහිටි ආදායම් වර්ෂ 22 ක සිට වර්ෂ 01 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

මෙහෙයුම් අකාර්යක්ෂමතා

උපමානපාදක ප්‍රතිපාදන උපයෝගීකර ගෙන පළාත් සභා මන්ත්‍රීවරුන් විසින් යෝජනා කරන සංවර්ධන ව්‍යාපෘති 05 ක් ක්‍රියාත්මක කර තිබුණි. එම ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන උපයෝජනය කිරීමේදී 2015 දෙසැම්බර් 30 දිනැති අංක 2016/01 දරන මුදල් කොමිෂන් සභා චක්‍රලේඛයේ ප්‍රකාරව ලබා දී තිබුණු උපමානපාදක ප්‍රතිපාදනවලින් සියයට 30 ක ප්‍රමාණයක ප්‍රතිපාදන උපයෝජනය කළ හැකිව තිබුණු ව්‍යාපෘතියට එම සීමාව ඉක්මවා සියයට 46 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. තවත් ව්‍යාපෘතියක වියදම් කළ හැකි සීමාව මුළු උපමානපාදක ප්‍රතිපාදනයෙන් සියයට 10 ක් වී තිබුණත්, එම සීමාව ඉක්මවා සියයට 19 ක් වියදම් කර තිබුණි. ඒ අනුව එම ව්‍යාපෘති දෙක සඳහා වියදම් කළ හැකි සීමාව රු.මිලියන 41.77 කින් ඉක්මවා ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණු අතර, එම ඉක්මවීම ඉතිරි ව්‍යාපෘති 03 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයේ ඉතිරියෙන් ආවරණය කර ගෙන තිබුණි.

කළමනාකරණ අකාර්යක්ෂමතා

2001 අංක 01 දරන ඌව පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරිය පිළිබඳ ප්‍රඥප්තිය ප්‍රකාරව ඌව පළාත ඇතුළත මගී ප්‍රවාහන සේවාවන්ද, ඌව පළාතට අදාළ වන ප්‍රමාණයට ඌව පළාත හා සම්බන්ධ වන අන්තර් පළාත් මගී ප්‍රවාහන සේවාවන්ද විධිමත් කළ යුතුව තිබුණි. එම කාර්යයට අනුශංගික වන අනෙකුත් කාර්යයන් විධිමත් කිරීම උදෙසා ඌව පළාත් සභාවේ මගී ප්‍රවාහන සේවා අධිකාරී ප්‍රඥප්තිය සඳහා වූ රෙගුලාසි 2018 පෙබරවාරි 28 දින වන විටත් පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණි.

ඌව පළාත් ක්‍රීඩා හා යෞවන කටයුතු, සංචාරක, ප්‍රවාහන, සංස්කෘතික සහ පේෂකර්ම හා කුඩා කර්මාන්ත අමාත්‍යාංශය විසින් 2017 වර්ෂයේදී පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ඇල්ල නගරයේ උමගෙහි ඉහළ කොටසේ භූමිය සකසා මල් පැළ සිටුවා අලංකරණ කටයුතු සිදුකිරීම වෙනුවෙන් රු.700,200 ක් වැය කර තිබුණි. එහෙත්, විධිමත් පරිදි නඩත්තු නොකිරීම නිසා 2018 නොවැම්බර් 13 දින වන විටත් සිටුවා තිබුණු මල් පැළ විශාල ප්‍රමාණයක් විනාශ වී තිබුණි.

කිරි ගවයින් මියයාම

ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය විසින් රු.මිලියන 48.00 කට ගර්භණීය කිරි ගවයින් 100 දෙනෙකු 2017 දෙසැම්බර් 24 දින බොරලන්ද සත්ත්ව ගොවිපලට ලබාදී තිබුණි. සෞඛ්‍යාරක්ෂිත ලෙස රඳවා තැබීමට සුදුසු ගවගාලක් ගොවිපලෙහි නොමැතිවීම නිසා රු.මිලියන 3.84 ක් වැය කර මිලදී ගෙන තිබුණු කිරි ගවයින් 08 දෙනෙකු මියගොස් තිබුණි.

එසේම, 2018 නොවැම්බර් 30 දින වනවිට සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේදයකට පැටවුන් රැකබලා නොගැනීම නිසා රෝගීවීම හේතුවෙන් ආනයනික කිරි ගවයින් බිහිකළ පැටවුන් 89 දෙනෙකුගෙන් පැටව් 45 දෙනෙකු මිය ගොස් තිබුණි.

නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

2016 වර්ෂයේදී රු.264,548 ක් වැය කර වැඩ නිමකර තිබුණු බණ්ඩාරවෙල දිසා රෝහලේ ජීව වායු ඒකකය 2018 ඔක්තෝබර් 11 දින වන විටත් ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. මො/කොවුල්ආරගම විදුහලේ පරිගණක පුහුණු ඒකක 2ක තිබුණු පරිගණක 50 ක් අක්‍රීයව පැවති අතර ගුරු නිවාස 04 ක් අළුත්වැඩියා නොකර ඌන උපයෝජිතව පැවැතුණි.

ව්‍යාපෘති නිම නොකිරීම

උඩමුල්ල ඇල සංවර්ධනය කිරීම

2018 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ කොස්ලන්ද උඩමුල්ල ඇල සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ ඉදිකිරීම් පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂවරයා විසින් රු.මිලියන 1.10 කට කොන්ත්‍රාත්තුව 2018 ඔක්තෝබර් 03 දින ගොවි සංවිධානයකට ප්‍රදානය කර තිබුණි. 2019 ජනවාරි මාසය වන විටත් එම කර්මාන්තයේ කිසිදු සංවර්ධන කටයුත්තක් ආරම්භ කර නොතිබුණු අතර 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රගති වාර්තාවේ අදාළ වැඩ කටයුතු කරගෙන යනු ලබන බව හා භෞතික ප්‍රගතිය සියයට 15 ක් ලෙස දක්වා තිබුණි.

බුත්තලගස් ආර වැව ප්‍රතිසංස්කරණය

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රතිපාදන යටතේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් 2018 වර්ෂයේදී ඉදිකිරීමට සැලැසුම් කර තිබුණු බුත්තලගස් ආර වැව ප්‍රතිසංස්කරණය කිරීමේ රු.මිලියන 4.23 ක කොන්ත්‍රාත්තුව 2018 ජුලි 24 දින පෞද්ගලික ආයතනයකට ප්‍රදානය කර තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුම අනුව එම කර්මාන්තයේ වැඩ 2018 ඔක්තෝබර් 24 දින අවසන් කළ යුතුව තිබුණද, 2019 ජනවාරි මාසය වන විටත් එම කර්මාන්තයේ කිසිදු ප්‍රතිසංස්කරණ කටයුත්තක් ආරම්භ කර නොතිබුණි.

ස්ප්‍රිංවැලි රෝහලේ ඉදිකිරීම

සෞඛ්‍ය අමාත්‍යාංශයේ වතු රෝහල් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ස්ප්‍රිංවැලි රෝහලේ, රු.මිලියන 16.99 ක් වූ ඉදිකිරීමේ විෂයයන් 06 ක කොන්ත්‍රාත්තුව, 2017 මාර්තු 17 දින පෞද්ගලික ඉදිකිරීම් ආයතනයකට ප්‍රදානය කර තිබුණි. එහෙත් ඉන්

කාර්යයන් 04 ක් අත්හැර තිබුණු අතර ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණු කාර්යයන් 02 ක් 2017 ජූලි 08 දින වන විට නිමකළ යුතුව තිබුණත්, 2018 ඔක්තෝබර් 04 දින වන විටත් එම කොන්ත්‍රාත්තුව නිමකර නොතිබුණි.

අත්හැර දැමූ ව්‍යාපෘති

වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ගොවි සංවිධාන 02 ක් සමඟ ගිවිසුම් ගතවී තිබුණු වාරි ව්‍යාපෘති 02 ක ඉදිකිරීම් කටයුතු ඉටු නොකිරීම සම්බන්ධයෙන් එම ගොවි සංවිධානවලට එරෙහිව කටයුතු කර නොතිබුණු අතර, වෙනත් ගොවි සංවිධාන වෙත එම ඉදිකිරීම් පැවරීමටද කටයුතු කර නොතිබුණි. මේ නිසා රු.මිලියන 3.89 ක මුල්‍ය ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම හේතුවෙන් එම ව්‍යාපෘතිවලින් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි.

අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

ඌව පළාත් කෘෂිකර්ම, වාරිමාර්ග, සත්ත්ව නිෂ්පාදන හා මිරිදිය ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විසින් 2017 වර්ෂයේදී කෘෂි මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ රඹුක්පොත ඇල කෘෂි මාර්ගයේ සංවර්ධන කටයුතු සිදුකර තිබුණි. එම සංවර්ධන කටයුතුවල නිමි වැඩ වටිනාකම රු.මිලියන 1.82 ක් වී තිබුණි. එම නිමි වැඩ වටිනාකම මත කොන්ත්‍රාත්කරුට රු.මිලියන 1.17 ක් ගෙවා තිබුණි. එහෙත් ඇස්තමේන්තුවේ සඳහන් පැති බැම්ම ඇලවී ගොස් නැවත ආධාරක යොදා සකස් කර තිබුණු අතර බදුල්ල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුවරයා ප්‍රමුඛ කමිටුව විසින් එම මාර්ගය වාහන ගමනාගමනයට සුදුසු පාරක් නොවන බවට නිර්දේශ කර තිබුණි. එමෙන්ම මාර්ගයේ මැද පිහිටි විදුලි කණු 03 ක් 2018 සැප්තැම්බර් 05 දින වන විටත් ඉවත් කර නොතිබුණි.

සබරගමුව පළාත් සභාව

සබරගමුව පළාත් සභාව විසින් 2018 වර්ෂය සඳහා රු.මිලියන 24,641 ක් රජයේ ප්‍රදාන මගින්ද, අභ්‍යන්තර මාර්ගවලින් රු.මිලියන 4,995 ක් ද, වශයෙන් එකතුව රු.මිලියන 29,636 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණි. 2018 වර්ෂයේ පුනරාවර්තන වියදම් වශයෙන් රු.මිලියන 26,436 ක් ද මූලධන වියදම් වශයෙන් රු.මිලියන 3,200 ක් ද වශයෙන් එකතුව රු.මිලියන 29,636 ක් උපයෝජනය කිරීමට ඇස්තමේන්තු කර තිබුණි. ඒ අනුව 2018 වර්ෂයේදී රජයේ ප්‍රදාන මගින් රු.මිලියන 23,772 ක් ද, අභ්‍යන්තර මාර්ග මගින් රු.මිලියන 4,002 ක් ද, වශයෙන් එකතුව රු.මිලියන 27,774 ක ආදායම් රැස්කර තිබුණි. 2018 වර්ෂයේදී පුනරාවර්තන වියදම රු.මිලියන 24,098 ක් හා මූලධන වියදම රු.මිලියන 1,964 ක් වශයෙන් එකතුව රු.මිලියන 26,062 ක් උපයෝජනය කර තිබුණි.

සබරගමුව පළාත් සභාවට අදාළව 2018 වර්ෂයේ සිදුකරන ලද නියැදි විගණනයේ දී අනාවරණය වූ වැදගත් විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

චක්‍රලේඛ විධිවිධාන නොසලකා වැටුප් හා දීමනා ගෙවීම

- සබරගමුව පළාත් රාජ්‍ය සේවයෙහි ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය සඳහා වන ව්‍යවස්ථා සංග්‍රහයේ 02 ඡේදය ප්‍රකාරව යථෝක්ත සේවා ගණයේ තනතුරු සඳහා පත්කිරීමේ බලධාරියා සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විය. නමුත් සබරගමුව පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ කම්කරු II ශ්‍රේණියේ තනතුරු 02ක් සඳහා අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2014 ඔක්තෝබර් 24 දින පත්වීම් ප්‍රදානය කර, සේවය ස්ථිර කර එදින සිට 2018 දෙසැම්බර් 31 දක්වා එම නිලධාරින් වෙනුවෙන් එකතුව රු. මිලියන 3.1 ක වැටුප් ගෙවා තිබුණි.

- 2007 මැයි 11 දිනැති අංක 09/2007, 2017 ඔක්තෝබර් 13 දිනැති අංක 27/2017 හා 2018 පෙබරවාරි 20 දිනැති අංක 03/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවලට පටහැනිව 2014 මැයි 02 දින සිට 2018 ඔක්තෝබර් 02 දින දක්වා සබරගමුව පළාත් සභාවේ අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත ගණකාධිකාරී විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු බඳවා ගෙන තිබුණු අතර ඔහු වෙත එකතුව රු.652,662 ක වෘත්තීය දීමනා, අන්තර් දීමනා සහ හිඟ වැටුප් ගෙවා තිබුණි.

රෝහල්වල ආපනශාලා ආදායම

පළාත් රෝහල් 05 කට අදාළව එකතු කරන ලද මාසික ආපනශාලා ආදායම් පළාත් සභා ආදායමට බැර කිරීමට කටයුතු නොකර රෝහල්වල වෙනම ගිණුමක තැන්පත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 7.7 ක් වී තිබුණි. ඇඹිලිපිටිය මූලික රෝහල විසින් එම ආදායමවලින් රු.840,605 ක් විනෝද චාරිකා, සංග්‍රහ කටයුතු, දුරකථන බිල දී ගැනීම් හා ගමන් වියදම් සඳහා අනුමැතියකින් තොරව වියදම් කර තිබුණි.

ප්‍රඥප්ති මගින් පිහිටවූ අරමුදල් සඳහා රීති මාලාවක් පිළියෙල නොකිරීම

- සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු යටතේ පිහිටුවා ඇති 2007 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 42(ආ) වගන්තිය අනුව සමුපකාර අරමුදල, ඇවර සහ තීරක අරමුදල් පාලනය කිරීම සඳහා රීති මගින් විධි විධාන සැලැස්විය යුතු වුවද, එවැනි රීති මාලාවක් පිළියෙල කර අනුමත කරගෙන නොතිබුණි.

- 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 20(3) වගන්තියට අනුව ආණ්ඩුකාර කාර්යාලයේ හදිසි අවස්ථා අරමුදලට මුදල් ලබා ගැනීම, අරමුදලින් මුදල් ඉවත්කර ගැනීම හා ඊට අදාළ සියලු කරුණු විධිමත් කිරීම සඳහා ආණ්ඩුකාරවරයා විසින් රීති සෑදිය යුතුව තිබුණත් එසේ කටයුතු කර නොතිබුණි.

හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් අයකර ගත යුතු ඉඩම් බදු ප්‍රමාණය රු.මිලියන 13.4 ක් වී තිබුණත්, එම හිඟ මුදල් අයකර ගැනීමට පළාත් දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

ශ්‍රවණ උපකරණ මිල දී ගැනීම හා බෙදාහැරීම

සමාජ සුභසාධන අමාත්‍යාංශය විසින් අවශ්‍යතාවය හඳුනාගැනීමකින් තොරව සමාජ සේවා අරමුදල යටතේ ශ්‍රවණාබාධිත පුද්ගලයින්ට බෙදා හැරීම සඳහා ගිවිසුමකට එළඹීමකින්ද තොරව රු.මිලියන 5.8 ක් වැය කර ශ්‍රවණ උපකරණ 400 ක් මිලදී ගෙන තිබුණි. එම උපකරණ ගබඩාවට ලැබුණු දිනම සමාජ සේවා දෙපාර්තමේන්තුව වෙත නිකුත් කළ බව තොග ලේඛනය අනුව සනාථ විය. එසේ වුවද, 2019 මැයි 14 දින සිදුකළ තොග භෞතික පරීක්ෂාවට අනුව රු.411,700 ක් වටිනා අධිබලැති ශ්‍රවණ උපකරණ 23 ක් කාර්යාලයේ ගබඩාවේ හා රු.මිලියන 1.1 ක් වටිනා මධ්‍යම බලැති ශ්‍රවණ උපකරණ 85 ක් සැපයුම් ආයතනයේ තිබුණි. එම උපකරණ විගණනයෙන් පෙන්වා දීමෙන් පසුව බෙදාහැර තිබුණ අතර, උපකරණ 43 ක වගකීම් කාලයද ඉක්මවීමෙන් පසුව බෙදා හැර තිබුණි.

නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් වර්ෂ 5 ක සිට අක්‍රීයව පැවැත එන රු.මිලියන 5.3 ක් වටිනා පේෂකර්ම මධ්‍යස්ථාන 5 ක අයත් ඉඩම් හා ගොඩනැගිලිද, වර්ෂ 12 කට වැඩි කාලයක සිට අක්‍රීයව පැවැත එන රු.මිලියන 0.55 ක වටිනා සියඹලාපිටිය අත්සළු ආයතනය සතු ඉඩම් හා ගොඩනැගිලිද, වර්ෂ 10 කට වැඩි කාලයක සිට පැවැත එන රු.මිලියන 2.7 ක් වටිනා යන්ත්‍ර උපකරණද සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

පළාතේ රෝහල් 5 කට අයත් රු.මිලියන 1.4 ක් වටිනා දන්ත X කිරණ යන්ත්‍ර 03 ක්ද, රු.මිලියන 19.4 ක් වටිනා Auto clave යන්ත්‍ර 2 ක්ද, රු.මිලියන 12.1 ක් වටිනා රසායනාගාර වෛද්‍ය උපකරණ 2 ක් හා රු.මිලියන 4.8 ක් වටිනා විදුලි ජනක යන්ත්‍රයක්ද මාස 4 ක සිට වර්ෂ 2 ක් දක්වා කාල පරාසයක සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

අරමුණට පටහැනිව වියදම් කිරීම

ප්‍රධාන අමාත්‍යාංශය විසින් අඩු ආදායම්ලාභීන්ට නිවසක් ඉදිකර ගැනීම සඳහා මූල්‍ය ආධාර සැපයීමේ අරමුණින් සරණ සෙවන නිවාස සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කර තිබුණි. එම අරමුණට පටහැනිව එම වැඩසටහන යටතේ ඉඩමක් මිල දී ගැනීමට, අංග සම්පූර්ණ නිවසක ආලින්දය සකස් කර ගැනීමට, මහල් දෙකකින් යුත් නිවසක් ඉදිකිරීමට හා ජීවත්විය හැකි මට්ටමේ අඩක් නිම කර ඇති නිවසක කපරාරු කිරීමට සහ දොර ජනෙල් යෙදීමට අඩු ආදායම් ලාභී නොවන පුද්ගලයන්ට මූල්‍ය ආධාර ලබා දී තිබුණි.

සැලසුම් කළ පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම

- කරවනැල්ල මූලික රෝහලේ පස්මහල් ගොඩනැගිල්ල මාස 18 ක් ඇතුළත ඉදිකර නිම කිරීමේ කොන්දේසිය මත 2015 ඔක්තෝබර් 16 දින රු.මිලියන 105.6 ක කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණි. එම ගොඩනැගිල්ල 2018 දෙසැම්බර් 31 දින වන විටත් නිම කර භාර දී නොතිබුණි.

- ඇඹිලිපිටිය දිස්ත්‍රික් රෝහලේ ඖෂධ ගබඩාව නවීකරණය කිරීම සඳහා 2018 අගෝස්තු 01 දින රු.මිලියන 4.1 ක වටිනාකමකට සබරගමුව පළාත් සභාවේ සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුම ප්‍රකාරව කර්මාන්තයේ වැඩ 2019 ජනවාරි 30 දින වන විට අවසන් කළයුතු වුවත්, සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් පළමු බිල්පත් වන රු.මිලියන 1.78 ක් සඳහා ගෙවීම් කර නොතිබීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු විසින් ඉදි කිරීම් කටයුතු නවතා තිබුණි.

- සමාලෝචිත වර්ෂයේදී වැඩ ආරම්භ කරන ලද ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 37.7 ක් වූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් කරපිංච කෘෂි පුහුණු මධ්‍යස්ථානයේ පාංශු රසායනාගාරය ඉදිකිරීම, පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයේ නාන කාමරය, කෑම කාමරය හා උඩුමහල ඉදිකිරීම සහ රුවන්වැල්ල කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයේ ඉදිකිරීම් කටයුතු කොන්ත්‍රාත්කරුවන් විසින් නිසිපරිදි කටයුතු නොකිරීම හේතුවෙන් ප්‍රමාදවී තිබුණි.

- පළාත් මාර්ග අමාත්‍යාංශයේ සමාලෝචිත වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීම සඳහා සැලැසුම් කර තිබූ ඇස්තමේන්තු ගත වියදම රු.මිලියන 34.6 ක් වූ භූමි අලංකරණ සහ මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති 2 ක් ලංසුකරුවන් තෝරා ගැනීමේ අපහසුතාවය හේතුවෙන් ආරම්භකර නොතිබුණි.

- පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 35.9 ක් වූ කරපිංච කෘෂි පුහුණු මධ්‍යස්ථානයේ යෝජිත නේවාසිකාගාර ගොඩනැගිල්ල ඉදිකිරීමේ 1 අදියර ව්‍යාපෘතිය 2017 ජූනි 07 දින ආරම්භ කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඒ සඳහා රු.මිලියන 22.2 ක් කොන්ත්‍රාත්කරුවකු වෙත ගෙවා තිබුණි. මෙම ගොඩනැගිල්ලෙහි 2 අදියරේ වැඩ කටයුතු සඳහා රු.මිලියන 74.3 ක වැඩ ඇස්තමේන්තුවක් පිළියෙල කර 2018 ඔක්තෝබර් 01 දින සංවර්ධන නිර්මාණ යන්ත්‍රෝපකරණ අධිකාරිය වෙත යවා තිබුණි. නමුත් කොන්ත්‍රාත්කරුවන් නිසි

පරිදි ඉදිකිරීම් සිදු නොකිරිමෙන් ගිවිසුම අවලංගු කර තිබුණි. මෙහි පළමු අදියර යටතේ ඉදිකර තිබු කොටසද 2019 මැයි 31 දින වන විටත් භාවිතයට ගෙන නොතිබීම හේතුවෙන් වැය කළ මුදල නිශ්කාර්ය වී තිබුණි. මේ අනුව ව්‍යාපෘතිය මඟින් අපේක්ෂිත අරමුණු 2019 මැයි 31 දින වන විටත් ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි.

- කුරුවිට හල්පේ සමගි මාවතට පානීය ජලය ලබා දිමේ ව්‍යාපෘතිය සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව සමෘද්ධි සමිතියක් වෙත රු.මිලියන 1.7 ක් වටිනා සෘජු කොන්ත්‍රාත්තුවක් කුරුවිට ප්‍රාදේශිය සභාව විසින් ප්‍රදානය කර තිබුණි. 2017 ඔක්තෝබර් 05 දින ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබුණද, ජලය ලබා ගැනිමට සවිකර තිබුණු ජල මෝටරය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රමාණවත් විදුලි ධාරිතාවයක් ප්‍රදේශයේ නොමැති වීමෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ නොහැකි වී තිබුණි.

වැඩිපුර ගෙවීම්

- පළාත් මාර්ග අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කර තිබු ක්‍රීඩාපිටි සහ මාර්ග සංවර්ධන ව්‍යාපෘති 08 ක ඉටු නොකරන ලද වැඩ කොටස් වෙනුවෙන් එකතුව රු.මිලියන 1.1 ක් වැඩිපුර ගෙවා තිබුණි. එසේම කොළොන්න ප්‍රාදේශිය සභාවේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කර තිබු ක්‍රීඩා පිටි සංවර්ධන ව්‍යාපෘති 21 ක ගෙවීම් කරන ලද වැඩ විෂයයක් මඟින් ආවරණය වී තිබු වැඩ විෂයයක් අතිරේක වැඩ විෂයයක් ලෙස බිල්පතට ඇතුළත් කර පස් ඝණ මීටර් 38,872 ක් වෙනුවෙන් එකතුව රු.මිලියන.5.9 ක් වැඩිපුර ගෙවා තිබුණි.

- පළාත් මාර්ග අමාත්‍යාංශය විසින් කුරුවිට ප්‍රාදේශිය සභාවේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කර 2016 දෙසැම්බර් 31 දින අවලංගු කර තිබු පරකඩුව වටප්පිටිය අරුනළු වොලිබෝල් ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2018 අප්‍රේල් 02 දින රු.මිලියන 1.3 ක් ගෙවා තිබුණි.

- ප්‍රධාන අමාත්‍යාංශය විසින් බලංගොඩ විධායක ඉංජිනේරු කාර්යාලයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කරන ලද බලංගොඩ මුලික රෝහලේ පස් මහල් ගොඩනැගිල්ල ඉදිකිරිමට අදාළව භෞතික පරික්ෂාවේදී ලබාගත් මිණුම් සමඟ ගෙවීම් බිල්පත් සැසඳීමේදි වැඩ විෂයයන් 09 ක් සඳහා රු.මිලියන 3.6 ක් වැඩිපුර ගෙවා තිබුණි.

- 2017 වර්ෂයේ සබරගමුව පළාත් මාර්ග අමාත්‍යාංශයේ මුළු ප්‍රතිපාදනය රු.මිලියන 1535.42 කින් රු.මිලියන 566.34 ක් හෙවත් සියයට 37 ක ප්‍රතිපාදන ඇඹිලිපිටිය ප්‍රාදේශිය සභාව වෙත කර්මාන්ත 380 ක් ක්‍රියාත්මක කිරීම සඳහා ලබා දී තිබුණි. සභා බල ප්‍රදේශය තුළ සංවර්ධනය කළ යුතු ක්ෂේත්‍රයන් සම්බන්ධව විශේෂ හඳුනාගැනීමකින් තොරව එම ප්‍රතිපාදන ලබා දී තිබුණි. ඇස්තමේන්තුගත වියදම රු.මිලියන 112.09 ක් වු ව්‍යාපෘති 57 කින්, ව්‍යාපෘති 30 ක ඇස්තමේන්තුගත වැඩ විෂයයන් ඉටු නොකර රු.මිලියන 17.92 ක් ගෙවා තිබුණි. ව්‍යාපෘති 03 ක් සඳහා වැය කර තිබුණු රු.මිලියන 4.16 ක් නිෂ්කාර්ය වී තිබුණි.

ප්‍රමාද ගාස්තු අය නොකිරිම

පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ළමා ලොකු පුටු 3,000 ක් මිල දී ගැනීම සඳහා රු.මිලියන 5.7 ක ප්‍රතිපාදන සලසා තිබුණි.

2016 වර්ෂයේ පෞද්ගලික ආයතනය සමග ළමා ලොකු පුටු 3000 ක් රු.මිලියන 5.7 කට සැපයීම සඳහා ගිවිසුමකට එළඹ තිබුණි. භාණ්ඩ භාර දිය යුතු අවසාන දිනය ගිවිසුමට ඇතුළත් කර නොතිබුණු නමුත් ලංසු කැඳවීමේ ලේඛන තුළ ඇතුළත් භාණ්ඩ පිරිවිතර ලේඛනයට අනුව 2017 පෙබරවාරි 15 දිනට පෙර එම භාණ්ඩ භාර දිය යුතුව තිබුණි. සති 27 ක ප්‍රමාදයකින් පසු භාණ්ඩ භාර දීම 2017 ජුලි 14 ආරම්භකර තිබුණු අතර භාණ්ඩ සැපයීමේ ප්‍රමාදවීම නිසා අදාළ ප්‍රමාද ගාස්තුව වූ රු.මිලියන 1.1 ක් කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

පාරිසරික හා සමාජ වගකීම් ඉටු නොකිරීම

කිරිඇල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ මහජන සෞඛ්‍ය පරික්ෂකගේ මාසික වාර්තාවන්ට අනුව 2018 ඔක්තෝබර් මාසය වන විට අනාරක්ෂිත ළිං පාවිච්චි කරන නිවාස සංඛ්‍යාව 1972 ක් සහ සනිපාරක්ෂක වැසිකිළි රහිත නිවාස 07 ක් පැවතිය ද, ඔවුන් සඳහා සනීපාරක්ෂක පහසුකම් ලබාදීමට පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් පියවර ගෙන නොතිබුණි.

ඇලපාත මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාශ 02 කට අයත් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ මාසික වාර්තා පරීක්ෂා කිරීමේ දී 2018 වර්ෂයේ දෙවන කාර්තුව අවසන්වන විට වැසිකිළි නොමැති නිවාස 55 ක් ද, සනිපාරක්ෂක නොවන වැසිකිළි භාවිතාවන නිවාස සංඛ්‍යාව 48 ක් ද, අනාරක්ෂිත ළිං පාවිච්චි කරන නිවාස සංඛ්‍යාව 364 ක්ද පැවැතුණි. ඔවුන් සඳහා සනීපාරක්ෂක පහසුකම් ලබා දීමට පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් පියවර ගෙන නොතිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දි මෙම තත්ත්වය පිළිවෙලින් සියයට 139 කින්, සියයට 50 කින් හා සියයට 14 කින් වර්ධනය වි තිබුණි.

තිරසර සංවර්ධන අරමුණු ඉටු නොවීම

සබරගමුව පළාත් සභාවේ වාර්ෂික සංවර්ධන සැලැස්ම යටතේ 2018 වර්ෂයේ පළාත් කාර්ය නිශ්චිත සංවර්ධන ප්‍රදාන සඳහා රු.මිලියන 2,746 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එම ප්‍රතිපාදන තිරසාර සංවර්ධන අරමුණ ඉටුකර ගැනීමට සලසා තිබුණ ද, ඉන් එක් අරමුණක් වන දේශගුණික විපර්යාස හා එහි බලපෑම්වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක වීම සම්බන්ධ අරමුණ පළාත් සභාව විසින් හඳුනාගෙන නොතිබුණි. හඳුනා ගෙන තිබූ අරමුණ 16 හි වැදගත් ඉලක්ක කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. 2018 වර්ෂයේ ප්‍රගති වාර්තා අනුව 2018 වාර්ෂික සංවර්ධන සැලැස්ම යටතේ තිරසාර සංවර්ධන ඉලක්කයන් ඉටුකර නොතිබුණි.

නැගෙනහිර පළාත් සභාව

නැගෙනහිර පළාත් සභාව විසින් 2018 වර්ෂය සඳහා රු.මිලියන24,752 ක් රජයේ ප්‍රදාන මඟින්ද අභ්‍යන්තර මාර්ග වලින් රු.මිලියන 4,270 ක්ද වශයෙන් එකතුව රු.මිලියන 29,022 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණි. 2018 වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රු.මිලියන 24,752 ක් හා මූලධන වියදම් සඳහා රු.මිලියන 3,603 ක් ද වශයෙන් එකතුව රු.මිලියන 28,355 ක් උපයෝජනය කිරීමට ඇස්තමේන්තු කර තිබුණි. ඒ අනුව, 2018 වර්ෂයේ රජයේ ප්‍රදාන මගින් රු.මිලියන 20,482 ක්ද, අභ්‍යන්තර මාර්ග වලින් රු.මිලියන 3,838 ක්ද වශයෙන් රු.මිලියන 24,320 ක ආදායම් රැස්කර තිබුණි. 2018 වර්ෂයේදී පුනරාවර්තන වියදම රු.මිලියන 24,586 ක් හා මූලධන වියදම රු.මිලියන 2,557 ක් වශයෙන් එකතුව රු.මිලියන 27,143 ක් උපයෝජනය කර තිබුණි.

නැගෙනහිර පළාත් සභාවට අදාළව 2018 වර්ෂයේදී සිදුකරනු ලැබූ නියැදි විගණනයේදී අනාවරණය වූ ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණයන් පහත දැක්වේ.

පළාත් ආදායම් කොමසාරිස් පත් නොකිරීම

2008 අංක 01 දරන මුදල් ප්‍රඥප්තියේ 2 වගන්තිවයට අනුව පළාත් ආදායම් කොමසාරිස් පත් කළ යුතුවේ. එසේ වුවත්, පළාත් ආදායම් කොමසාරිස් තනතුර 2011 දෙසැම්බර් 18 දින සිට පුරප්පාඩු වී තිබුණු අතර නැගෙනහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුව සඳහා අනුමත වූ සේවා ව්‍යවස්ථාවේ 3.2 වගන්තිය හා බඳවාගැනීමේ යෝජනා ක්‍රමය ප්‍රකාරව මෙම තනතුර පිරවීම සඳහා පළාත් සභාව විසින් කටයුතු කර නොතිබුණි. පළාත් ආදායම් කොමසාරිස් වර්ෂ 07 ක් සඳහාම පත් නොකිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් නැගෙනහිර පළාතේ ප්‍රාදේශීය ආදායම් එකතු කිරීම් හා පරිපාලන කටයුතු වලට මුදල් ප්‍රඥප්තියේ නියම කර ඇති පරිදි විශාල ප්‍රමාණයකින් බලපා තිබුණි.

ආදායම් එකතු කිරිම දුර්වලවීම.

වෙනම දෙපාර්තමේන්තුවක් වශයෙන් කාර්ය මණ්ඩලය 54 දෙනෙකුගෙන් යුක්තව පළාත් ආදායම් දෙපාර්තමේන්තුව 2008 නොවැම්බර් 18 දින පිහිටුවා තිබුණත් 2013 වර්ෂයේදී හදිසියේ පළාත් සභාව විසින් දෙපාර්තමේන්තුව අහෝසි කර තිබුණු අතර කාර්ය මණ්ඩලයේ පළාත් ආදායම් සේවයේ ප්‍රධාන තනතුරු වන නියෝජ්‍ය කොමසාරිස් 01, බදු තක්සේරු 07 ක් හා බදු නිළධාරින් 19 ක් වශයෙන් කාර්යමණ්ඩලය 54 සිට 23 දක්වා අඩුකර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් පළාතේ ආදායම් එකතු කිරීමට හා බදු පරිපාලනයට සැලකිය යුතු බාධාවක් වී තිබුණි. මේ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කර ගැනීම සඳහා කාර්ය මණ්ඩලය වැඩිකර ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

ආදායම් එකතු කර ගැනීමට ව්‍යවස්ථා පැනවීමට අසමත් වීම

පළාත් ආදායම් දෙපාර්තමේන්තුව පිහිටුවා වර්ෂ 10 ක් පසුව වුවත් නැගෙනහිර පළාත තුල ක්‍රියාත්මක වන උකස් මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීමට හා මේ සම්බන්ධව වාර්ෂිකව බලපත්‍ර නිකුත් කිරීමට ව්‍යවස්ථාවක් පනවා නොතිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස සැලකිය යුතු ආදායමක් පළාත් සභාවට අහිමි වී තිබුණි.

මුද්දර බදු එකතු කිරීම

පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් මුද්දර බදු එකතු කිරීම සම්බන්ධයෙන් 2017 හා 2018 වර්ෂවල පැවැත්වූ ජංගම සේවය අනුව නැගෙනහිර පළාතේ ඉඩම් කාර්යාලයේ ලියාපදිංචි කළ ඉඩම්වලින් ඉඩම් හිමියන් 794 දෙනෙකු විසින් ඔවුන්ගේ ඉඩම්වලට අඩු

වටිනාකමක් ප්‍රකාශකර තිබුණේ මුද්දර බදු වශයෙන් අඩු මුදලක් ගෙවීම සඳහා වූ බව අනාවරණය විය. එම නිසා අඩුවෙන් වටිනාකම් කළ දේපල සඳහා එකතුව රු.මිලියන 14 ක අමතර මුද්දර බද්දක් පනවා තිබුණි. කෙසේ වුවත්, ඉඩම් හිමියන්ට පනවා තිබුණු රු.මිලියන 4.8 ක හිඟ හිටි බදු අයකර ගැනීම සඳහා 2018 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

ඔප්පු තක්සේරු කිරීමට අසමත් වීම

2012 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලය සඳහා නැගෙනහිර පළාතේ ලියාපදිංචි කළ ඔප්පු 7,616 ක් පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් අඩුවෙන් තක්සේරු කර තිබුණු නිසා අමතර මුද්දර බදු තහවුරු කර ගෙන මුද්දර බදු පැනවීමට නොහැකිව තිබුණි.

ඉඩම්වලින් බදු ආදායම් හිඟ හිටීම

ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 කට අදාලව රජයේ ඉඩම්වලින් එකතුව රු.මිලියන 208 ක බදු ආදායම් 1991 වර්ෂයේ සිට හිඟ හිටව පැවතුණි. කෙසේ නමුත් හිඟ හිටි ආදායම් අයකර ගැනීම සඳහා ඉක්මන් ක්‍රියාමාර්ග 2019 අප්‍රේල් 30 දින දක්වා ගෙන නොතිබුණි.

නිෂ්ඵල වියදම්

නැගෙනහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් කල්මුනේ නගර සභා බල ප්‍රදේශය තුල පිහිට ඉඩමක කල්මුනේ බස් නැවතුම්පළ සඳහා අධිකාරියේ අරමුදල්වලින් රු.මිලියන 2.4 ක පිරිවැයකින් 2011 වර්ෂය තුලදී අධිකාරියේ කාර්යාලයට සපයාදීම සඳහා ඉදිකර තිබුණි. කෙසේ නමුත්, කල්මුනේ නගර සභාව ගොඩනැගිල්ලේ හිමිකාරීත්වය ඉල්ලා තිබුණු අතර එය පුද්ගලික බැංකුවකට කුලියට දී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස අධිකාරිය විසින් මෙම ගොඩනැගිල්ල භාවිතයට ගෙන නොතිබුණි.

නිවාස සංවර්ධන සැලසුම් ප්‍රකාරව නිවාස ඉදිකිරීම

නැගෙනහිර පළාත් නිවාස අධිකාරිය විසින් පිළියෙල කරන ලද නිවාස සංවර්ධන සැලසුම (2015-2019) අනුව නිවාස නොමැති පවුල් සඳහා රු.මිලියන 3,225 ක මුළු ඇස්තමේන්තුගත පිරිවැයකින් නිවාස 6,600 ක් ඉදිකිරීමට සමාලෝචිත වර්ෂයේදී බලාපොරොත්තු විය. කෙසේ නමුත්, පනස් දෙනෙකුගෙන් යුත් ප්‍රතිලාභීන්ට උපමාන පාදක ආධාර යටතේ රු.මිලියන 10.6 ක නිවාස ආධාර සැපයීම හා රු.මිලියන 7.5 ක මූල්‍ය ආධාර මත වර්ෂය තුලදී වැසිකිලි 300 ක් ඉදිකිරීම හැර නිවාස ඉදිකර නොතිබුණි.

ස්වකීය අරමුදල් උත්පාදනය කිරීමට අසමත් වීම

නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවරයාගේ ලේකම් විසින් නිකුත් කළ 2014 ජුනි 20 දිනැති අංක G/EPC/B/14/R/H දරන ලිපිය පරිදි ඒකාබද්ධ අරමුදල් මත රැඳී නොසිට 2014 වර්ෂය තුලදී වැටුප් හා වෙනත් වියදම් සඳහා අරමුදල්, පළාත් නිවාස අධිකාරිය විසින් තමාගේ අරමුදල් මගින් උපයාගත යුතු විය. කෙසේ නමුත් අධිකාරිය ආරම්භ කර වසර 04 ක් ගෙවී තිබුණත් වියදම් සඳහා යෙදවීමට ස්වකීය අරමුදල් උත්පාදනය කර ගැනීමට කිසිම ව්‍යාපාර කටයුත්තක් ආරම්භ කිරීමට අසමත් වී තිබුණි.

විශේෂ අධ්‍යාපනය සඳහා ගුරුවරුන් යෙදවීම

අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංක 42/2012 හා 2015 දෙසැම්බර් 07 දිනැති චක්‍රලේඛ ලිපි අංක ED/9/18/8/2/6 අනුව ගුරුවරුන් විශේෂ අධ්‍යාපන විෂයයන් ඉගැන්වීම සඳහා විශේෂඥයකු වේ නම් ඔවුන් එම විශේෂ අධ්‍යාපන විෂයයන් ඉගැන්වීම සඳහා පමණක් යෙදවිය යුතු වේ. කෙසේ නමුත්, නැගෙනහිර පළාතේ අධ්‍යාපන කලාප 13 ක ගුරුවරුන් පස්දෙනෙකු විශේෂ

අධ්‍යාපන විෂයයන් ඉගැන්වීම සඳහා පුහුණුවක් ලබාගත්තද ඔවුන් එම විශේෂ අධ්‍යාපන විෂයයන් ඉගැන්වීම සඳහා නොයොදවා විශේෂ නොවූ අධ්‍යාපන විෂයයන් සඳහා 2018 දෙසැම්බර් 31 දින වන විටත් යොදවා තිබුණි.

ඇල මාර්ගයක් හරහා පාසැල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම

ප්‍රාථමික අධ්‍යාපන ශිෂ්‍යයින් 459 දෙනෙකුට ඉඩ පහසුකම් සැලසීම සඳහා මඩකලපුව මධ්‍යම කලාපයේ කාන්තාන්කුඩි පාසැලක ඇල මාර්ගයක් හරහා රු.මිලියන 11 ක පිරිවැයකින් දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණේ ඇල මාර්ගයෙහි වතුර අවහිර වීම වැනි පාරිසරික බලපෑම් නොසලකා හා නාගරික සංවර්ධන අධිකාරියෙන් හා මධ්‍යම පරිසර අධිකාරියෙන් පූර්ව අනුමැතිය ලබාගැනීමකින් තොරව විය. ඇල මාර්ගයෙහි ජලය ගලායෑම අවහිර වී වතුර නොගලායාම නිසා එහි ප්‍රතිඵලයක් වශයෙන් මදුරුවන් බෝවන ස්ථානයක් බවට පත්ව තිබුණි.

පෙර පාසැල් අධ්‍යාපනය

උපමාන පාදක ප්‍රදාන යටතේ 2017 වර්ෂයේදී නැගෙනහිර පළාතේ පෙර පාසැල් 21 කට ලී බඩු, ක්‍රීඩා උපකරණ වැනි භාණ්ඩ රු.608,000 කට මිලදී ගෙන තිබුණු අතර 2019 මාර්තු 31 දිනය වන විටත් එම භාණ්ඩ අදාල පෙර පාසැල්වලට සපයා නොතිබුණි. කෙසේ නමුත්, එම භාණ්ඩ සඳහා 2017 වර්ෂයේදී පෙර පාසැල් අධ්‍යාපන කාර්යාංශය විසින් සැපයුම්කරුට ගෙවීම් කර තිබුණේ භාණ්ඩ ලබාගැනීමෙන් තොරව විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් රජයේ මුදල් අවභාවිතා කර තිබුණි.

නිෂ්ක්‍රීය වත්කම්

නින්දවූර් හා වාලච්චේනෙයි මූලික රෝහල්වල බොහෝ කල් පැවති වකුගඩු රෝගීන් වාර්තාවීමේ හිඟකම නිසා රුධිර කාන්දු පෙරන ඒකක නොතිබුණි. කෙසේ නමුත් පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් අවශ්‍යතාවය නොසලකා රුධිර කාන්දු පෙරන උපකරණ රු.මිලියන 18.6 ක පිරිවැයකට මිලදී ගෙන තිබුණු අතර මෙම රෝහල් සඳහා රු.මිලියන 6.15 ක් වටිනා ඖෂධ මිලදී ගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් මෙම උපකරණ 2017 මාර්තු 22 දින සිට මේ දක්වා නිකරුණේ පැවතුණි.

නැගෙනහිර පළාතේ තෝරාගත් මූලික රෝහල් 05 ක් සඳහා එකතුව රු.මිලියන 12.32 ක් Digital Health Project මගින් 2017 වර්ෂයේදී වියදම් කර තිබුණි. කෙසේ නමුත්, රු.මිලියන 12.32 ක් වටිනා ලැප්ටොප්, ප්‍රින්ටර්ස්, HD කැමරා, බාකෝඩ් රීඩර්ස් හා සර්වර්ස් වැනි උපකරණ 2018 නොවැම්බර් 30 දින වන විටත් බලාපොරොත්තු වූ කාර්යයන් සඳහා භාවිතා කර නොතිබුණි.

ආදර්ශ කාබනික උයන් පිහිටු වීම

නැගෙනහිර පළාතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් අම්පාර හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවල තෝරාගත් පාසැල් 23 ක පාසැල් ළමුන්ගේ කෘෂිකාර්මික දැනුම වර්ධනය කිරීම සඳහා ආදර්ශ කාබනික උයන් පිහිටුවීමට තීරණය කර 2017 වර්ෂයේදී රු.මිලියන 4.2 ක පිරිවැයක් ඒ සඳහා දරා තිබුණි. කෙසේ නමුත්, රු.මිලියන 1.99 ක් වටිනා උපකරණ හා යන්ත්‍ර සූත්‍ර බලාපොරොත්තු වූ පරමාර්ථ සඳහා භාවිතා කිරීමකින් තොරව 2019 මාර්තු 31 දින වන විටත් නිකරුණේ පැවතුණි.

කුඩා කර්මාන්ත උද්‍යාන පොකුරු පිහිටුවීම

කුඩා කර්මාන්ත උද්‍යාන පොකුරු පිහිටුවීම සඳහා ව්‍යාපෘති යෝජනාවක් 2014 වර්ෂයේදී බලාපොරොත්තුවෙන් සිටි අතර නැගෙනහිර පළාතේ ග්‍රාමීය කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් පුද්ගලික හවුල්කරුවන්ගේ සහයෝගය සමඟ රාජ්‍ය පෞද්ගලික සහභාගීත්වයෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. ව්‍යාපෘති යෝජනාව අනුව නැගෙනහිර පළාතේ මුළු

දිස්ත්‍රික්ක තුනෙහි කුඩා කර්මාන්ත උද්‍යාන පොකුරු 06 ක් පිහිටුවීමට බලාපොරොත්තුවක් තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

- ගිවිසුමේ 1.4 වගන්තියට අනුව මෙම ගිවිසුමේ කාලපරිච්ඡේදය තුල නිෂ්පාදන ඒකකයක් සඳහා ගාස්තුව රු.3.00 ක් විය. කෙසේ නමුත් පුද්ගලික ඇදුම් කර්මාන්ත ශාලාවක් විසින් එක් ඒකකයක් සඳහා රු.2.00 ක් ගෙවා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සැලකිය යුතු ආදායමක් පළාත් සභාවට අහිමි වී තිබුණි.

- ගිවිසුමේ 1.6 වගන්තියට අනුව පළාත් සභාවට පුද්ගලික ඇඳුම් කර්මාන්ත ශාලාවෙන් ලැබුණු ගාස්තුවෙන් සියයට 0.25 කට සමාන මුදලක් සෑම කාර්තුවක් අවසානයේදී ප්‍රජා අරමුදලට දායකවීම සඳහා ප්‍රජා පාදක සංවිධානයක් පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුව හරහා පිහිටුවා තිබුණි. කෙසේ නමුත් ප්‍රජා පාදක සංවිධානයට දායකවීම සඳහා වැඩ පිළිවෙලක් නොතිබුණි.